වාර්ෂික වාර්තාව 2021

II වන වෙළුම

ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2021
වර්ෂය සඳහා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්
ගරු මුදල් ඇමති වෙත ඉදිරිපත්
කරනු ලබන

වාර්ෂික වාර්තාව
(II වන වෙළුම)

පිටපතක මිල (වෙළුම් දෙකම සඳහා)

මහ බැංකු කවුන්ටරයෙන් මිලදී ගැනීමේ දී	-	පිටපතක මිල රුපියල් 600 යි.
සාමාන්‍ය තැපෑලෙන් එවීමට	-	පිටපතක මිල රුපියල් 850 යි.
ලියාපදිංචි තැපෑලෙන් එවීමට	-	පිටපතක මිල රුපියල් 875 යි.

එතෙර මිල

ගුවන් තැපෑලෙන් (පළමුවැනි පන්තිය) එවීමට	-	පිටපතක මිල එ.ජ.ඩොලර් 40 යි (ලි.ප.තැ.)
ගුවන් තැපෑලෙන් (දෙවැනි පන්තිය) එවීමට	-	පිටපතක මිල එ.ජ.ඩොලර් 35 යි (ලි.ප.තැ.)
මුහුදු තැපෑලෙන්	-	පිටපතක මිල එ.ජ.ඩොලර් 25 යි (ලි.ප.තැ.)

ISBN 978-624-5917-10-5
ISSN 1391-359X

කොළඹ 12, සාන්ත බස්තියම කන්ද, අංක 20 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම විසින් මුද්‍රණය කරන ලදුව, කොළඹ 01 ජනාධිපති මාවතේ, අංක 30 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කරන ලදි.

පටුන

II වන වෙළුම

දෙවැනි කොටස

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු 1-155

තුන්වැනි කොටස

මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන 1-415

හතරවැනි කොටස

2021 වසරේ දී සම්මත කරන ලද මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ ප්‍රධාන නීති අණපනත් 1-144

දෙවැනි කොටස

දෙවැනි කොටස
ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු

		පිටුව
1.	ගිණුම්කරණ සහ මූල්‍ය	1
2.	බැංකු අධීක්ෂණ	85
3.	බැංකු විදු පියෙස	89
4.	සන්නිවේදන	89
5.	ව්‍යවහාර මුදල්	91
6.	දේශීය මෙහෙයුම් කටයුතු	93
7.	ආර්ථික පර්යේෂණ	96
8.	සේවක අර්ථසාධක අරමුදල	100
9.	පහසුකම් කළමනාකරණ	103
10.	මූල්‍ය කටයුතු	104
11.	මූල්‍ය පාරිභෝගික සබඳතා	105
12.	මූල්‍ය බුද්ධි ඒකකය	106
13.	විදේශ විනිමය	108
14.	විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීම්	112
15.	අධිපති ලේකම්	113
16.	මානව සම්පත්	114
17.	තොරතුරු තාක්ෂණ	120
18.	අභ්‍යන්තර විගණන	123
19.	ජාත්‍යන්තර මෙහෙයුම්	123
20.	නීති හා අනුකූලතා	126
21.	සාර්ව විචක්ෂණතා අධ්‍යයන	127
22.	ගෙවීම් සහ පියවීම්	129
23.	ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ	131
24.	රාජ්‍ය ණය	132
25.	ප්‍රාදේශීය සංවර්ධන	136
26.	නිරාකරණ හා බලගැන්වීම්	141
27.	අවදානම් කළමනාකරණ	142
28.	ලේකම් දෙපාර්තමේන්තුව	144
29.	ආරක්ෂක සේවා	145
30.	කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ	145
31.	සංඛ්‍යාන	146
32.	බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය	150

1. ගිණුම්කරණ සහ මූල්‍ය

2021 මූල්‍ය වර්ෂය තුළ සහ ඊට අදාළ, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ක්‍රියාකාරී වාර්තාව

1. හැඳින්වීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩල අනු කමිටුවකි. මෙම කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන්, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණු වලට අදාල ප්‍රතිපත්ති පිළිබඳව මුදල් මණ්ඩලයට උපදේශන ලබා දීම සිදු කරයි. කමිටුවේ නිර්දේශ මුදල් මණ්ඩලයට නිතිපතා වාර්තා කරනු ලබයි.

2. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපතිත්වය මුදල් මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු විසින් දරනු ලබන අතර, සෙසු සාමාජිකයන් ලෙස විගණන වෘත්තීයවේදීහු දෙදෙනෙකු කටයුතු කරති.

2021 වර්ෂය තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

i) ආචාර්ය රාණි ජයමහ - සභාපතිනිය

ii) එච්. එම්. ඒ. ජයසිංහ මහතා - සාමාජික (2021.09.30 දක්වා)

iii) ඒ. අයි. මොහොට්ටි මහත්මිය - සාමාජිකා

iv) ඒ. අයි. ප්‍රනාන්දු මහතා - සාමාජික (2021.12.22 සිට බල පැවැත්වෙන පරිදි)

මුදල් මණ්ඩලයේ ලේකම්, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ධූරය දරනු ලබන අතර, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, කමිටුවේ සහකාර ලේකම් ධූරය දරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සපයයි. මූල්‍ය දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුකූලතා නිලධාරී, ප්‍රධාන ගණකාධිකාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරී මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු මෙහෙයවන ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී, නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී වෙති. කමිටුව විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සාකච්ඡා සඳහා සහ විගණන විමසුම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍යතා පරිදි රැස්වීම් වලට ආරාධනා කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීමේ දී විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණනය සඳහා පත් කළ විගණන ආයතනයේ හවුල්කරු ද ආරාධිතව කමිටු රැස්වීම් වලට සහභාගී වේ.

කමිටුව අවම වශයෙන් වර්ෂයකට හය (06) වරක් රැස්විය යුතු ය. කමිටුවේ ලේකම් විසින් සභාපතිනියගේ අනුමැතිය සහිතව මුදල් මණ්ඩලයේ, බාහිර විගණකයන්ගේ හෝ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ ඉල්ලීම පරිදි කමිටු රැස්වීම් කැඳවනු ලබයි. රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය වනුයේ සභාපතිනිය ඇතුලුව සාමාජිකයින් දෙදෙනෙකි.

3. 2021 වසර තුළ සහ 2021 මූල්‍ය වර්ෂයට අදාළව ක්‍රියාත්මක කළ කාර්යයන්

කමිටුව 2021 වර්ෂය තුළ රැස්වීම් දහහතරක් (14) පවත්වන ලදී. වර්ෂය තුළ සහ ඊට අදාලව කමිටුව විසින් ඉටු කළ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

(අ) මූල්‍ය වාර්තාකරණය සහ බාහිර විගණනය

කමිටුව විසින්,

i) 2020.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය මත KPMG ආයතනය විසින් ඉදිරිපත් කළ අතුරු කළමනාකාරීත්ව ලිපිය, අවසන් කළමනාකාරීත්ව ලිපිය සහ ඒ සඳහා වූ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර,

ii) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන,

iii) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවට අනුකූලව විගනකාධිපතිගේ වාර්තාව සහ ඒ සඳහා වූ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර,

iv) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ සේවක අර්ථ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

v) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා සේවක අර්ථ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වාර්තාව,

vi) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම අරමුදල් පහක (05) (විශ්‍රාම අරමුදල, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල, නව විශ්‍රාම අරමුදල, නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල) මූල්‍ය ප්‍රකාශන,

vii) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

viii) ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් KPMG ආයතනයේ විගණන සැලැස්ම,

ix) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා KPMG ආයතනය විසින් නිකුත් කළ අතුරු කළමනාකාරීත්ව ලිපිය,

x) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා සේවක අර්ථ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

xi) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන,

සමාලෝචනය කරන ලදී.

(ආ) අභ්‍යන්තර පාලනයන්

කමිටුව විසින්,

i) කමිටුව වෙත වාර්තා කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාවලීන් සමාලෝචනය කර අවශ්‍ය උපදේශයන් සපයන ලදී.

ii) අදාල පාර්ශවකරුවන් විසින් කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

(ඇ) අභ්‍යන්තර විගණනය

කමිටුව විසින්,

i) අභ්‍යන්තර විගණන නිරීක්ෂණයන් සහ නිර්දේශයන්,

ii) නව සංචිත කලමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන නිරීක්ෂණයන්,

iii) ක්‍රියාවලි හිමිකරුවන් විසින් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය,

iv) 2022 - 2024 කාලපරිච්ඡේදය සඳහා වන උපාය මාර්ගික විගණන සැලසුම සහ 2022 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලසුම,

සමාලෝචනය කරන ලදී.

2021 මූල්‍ය වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ක්‍රියාකාරකම් වාර්තාව

1. හැඳින්වීම

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee) යනු මුදල් මණ්ඩලය (Monetary Board) විසින් පත් කරන ලද අනුකමිටුවකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් සඳහා පුළුල් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සතු වන අතර, එය බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම සහතික කිරීමට මුදල් මණ්ඩලයට සහාය වේ.

2. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ මුලසුන හොබවන්නේ, මුදල් මණ්ඩලය විසින් නම් කරන ලද ස්වාධීන මුදල් මණ්ඩල සාමාජිකයෙකු විසිනි. එහි සාමාජිකත්වය, මෙම කමිටුවට පත්වීමට පෙර අවම වශයෙන් වසරක කාලයක් මූල්‍ය සේවා අංශයට සම්බන්ධ නොවී සිටියා වුත්, අදාළ විශේෂිත දැනුම් සහ කුසලතාවලින් යුක්ත වුත්, ස්වාධීන බාහිර විශේෂඥයින් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

2021 වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) සංජීව ජයවර්ධන මහතා, ජනාධිපති නීතිඥ - මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජික (සභාපති)

ii) නයෝමාල් ගුණවර්ධන මහතා (ස්වාධීන බාහිර සාමාජික)

iii) සුසන්ත රත්නායක මහතා (ස්වාධීන බාහිර සාමාජික 01.01.2021 සිට 09.08.2021 දක්වා)

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ලේකම් තනතුර මුදල් මණ්ඩල ලේකම් විසින් හොබවන අතර, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරී) මෙහි සහකාර ලේකම් තනතුර දරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (Risk Management Department) මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවට ලේකම් පහසුකම් සපයයි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති සහ සියලුම නියෝජ්‍ය අධිපතිවරුන්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් කමිටුවේ (Business Continuity Planning Committee) සභාපති, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අනුකූලතා නිලධාරී) සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙම කමිටුවේ නිරීක්ෂකයින් ලෙස සහභාගී වේ.

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි හෝ මුදල් මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි, අවම වශයෙන් සෑම කාර්තුවකට වරක් හෝ ඊට වැඩි වාර ගණනක් කමිටු රැස්වීම් පැවැත්වේ. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ රැස්වීම් කමිටුවේ ලේකම් විසින් කැඳවනු ලැබේ. රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකු වන අතර එයට අනිවාර්යෙන්ම සභාපති ඇතුළත් විය යුතුය.

3. 2021 මුදල් වර්ෂය තුළ ක්‍රියාකාරකම්

2021 වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වූ අතර සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

i) දෙපාර්තමේන්තු අවදානම් ලේඛන සමාලෝචනය කර මෙහෙයුම් අවදානම් අවම කිරීම කඩිනම් කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ii) වසංගත ආශ්‍රිත අවදානම නිසා මතු විය හැකි ව්‍යාපාර අඛණ්ඩතා අවදානම, සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ අවදානම ඇතුළු අවදානම් අවම කර ගනිමින් බැංකුවේ සේවා අඛණ්ඩතාවය පවත්වා ගැනීම සඳහා ක්‍රියාකාරීව නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

iii) සංශෝධනය කරන ලද මෙහෙයුම් අවදානම් වර්ගීකරණය (Operational Risk Taxonomy) සමාලෝචනය කර, එය බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශයට (Operational Risk Management Guidelines) ඇතුළත් කිරීම සඳහා අනුමත කරන ලදී.

iv) ආයතනගත අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කරන ලද නිරීක්ෂණ සමාලෝචනය කර, අදාළ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

v) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල්වල (ජාත්‍යන්තර සංචිත, අභ්‍යන්තර ආයෝජන අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල) අවදානම් සමාලෝචනය කර තක්සේරු කරන ලද අතර, අදාළ ආයෝජන නිර්දේශිත පරාමිතීන් තුළ පවතින බව සහතික කරන ලදී.

vi) අභ්‍යන්තර ආයෝජන අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල සඳහා වන ආයෝජන මාර්ගෝපදේශ, සේවක අර්ථසාධක අරමුදල සඳහා වන ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය අවදානම් කළමනාකරණ දෘෂ්ටි කෝණයකින්, සමාලෝචනය කර සංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

vii) ජාත්‍යන්තර සංචිත සඳහා උපාය මාර්ගික වත්කම් වෙන් කිරීම සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව

2021 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය

ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික සහ මිල ස්ථායිතා හා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා කේපීඑම්ජී වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } බීඒඑන්/ජී/සීබීඑස්එල්/1/21/1 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මාර්තු 29 දින

ගරු මුදල් අමාත්‍යතුමා,

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 sg@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අදාළ වන පරිදි අනාවරණය කිරීම ද මුදල් මණ්ඩලයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් කරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මුදල් මණ්ඩලය යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර, අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් වැදගත් විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරනු ලබන පාර්ශවයන් මම දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලු ප්‍රමාණාත්මක නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් දෑ ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධව ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව;

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ :

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා මහ බැංකුව

2021 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන	2021 රු. 000	2020 රු. 000
වත්කම්			
විදේශීය මූල්‍ය වත්කම්			
මුදල් සහ මුදල් සමානයන්	8	**512,762,452**	403,307,304
ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	9	**-**	40,564,323
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	9	**8,818,244**	703,435,463
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	10	**54,022,836**	3,370,353
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්	11	**188,045,837**	158,958,185
අනිකුත් ලැබිය යුතු දෑ		**-**	1,702,247
මුළු විදේශීය මූල්‍ය වත්කම්		**763,649,369**	1,311,337,875
දේශීය මූල්‍ය වත්කම්			
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	12	**1,377,820,347**	714,531,527
ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්	13	**567,532,312**	2,728,412
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	14	**150,128,800**	153,061,900
මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	15	**1,671,218**	1,615,356
බැංකු සඳහා දෙන ලද ණය	16	**90,572,746**	111,487,526
අනෙකුත් වත්කම්	17	**34,063,770**	23,097,189
මුළු දේශීය මූල්‍ය වත්කම්		**2,221,789,193**	1,006,521,910
මුළු මූල්‍ය වත්කම්		**2,985,438,562**	2,317,859,785
විදේශීය මූල්‍ය නොවන වත්කම්			
රන්	18	**35,151,981**	76,220,055
මූල්‍ය නොවන වත්කම්			
තොගය	19	**4,928,533**	6,301,819
අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම්		**961,456**	651,804
දේපල පිරියත සහ උපකරණ	20	**19,235,994**	20,455,452
අස්පෘශ්‍ය වත්කම්	21	**561,632**	108,252
මුළු මූල්‍ය නොවන වත්කම්		**60,839,596**	103,737,382
මුළු වත්කම්		**3,046,278,158**	2,421,597,167
බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය			
විදේශීය මූල්‍ය බැරකම්			
බැංකු සහ මූල්‍ය ආයතන	22	**13,701**	208,337,221
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	10	**1,139,323**	574,182
ආසියානු නිශ්කාෂණ සංගමය	23	**104,764,616**	63,864,652
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)	24	**670,065,243**	509,925,278
අනිකුත්	25	**357,295,676**	74,870,325
මුළු විදේශීය මූල්‍ය බැරකම්		**1,133,278,559**	857,571,658
දේශීය මූල්‍ය බැරකම්			
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු	26	**300,704,162**	129,601,521
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු	27	**1,392,301**	1,460,512
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්	28	**101,062,880**	209,507,898
සංසරණයෙහි පවතින මුදල්	29	**1,005,099,066**	834,807,859
අනිකුත් ගෙවිය යුතු දෑ	30	**19,163,882**	14,742,792
මුළු දේශීය මූල්‍ය බැරකම්		**1,427,422,291**	1,190,120,582
මුළු මූල්‍ය බැරකම්		**2,560,700,850**	2,047,692,240
අනිකුත් බැරකම්			
විලම්භිත ප්‍රදාන	31	**1,178**	789
විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්	32	**17,929,737**	25,385,193
විවිධ බැරකම් සහ උපචිතයන්	33	**4,027,349**	1,353,373
මුළු අනිකුත් බැරකම්		**21,958,264**	26,739,355
මුළු බැරකම්		**2,582,659,114**	2,074,431,595
හිමිකරු ප්‍රාග්ධනය			
ප්‍රාග්ධන අරමුදල		**50,000,000**	50,000,000
අනෙකුත් සංචිත	34	**315,128,226**	282,012,023
රඳවාගත් ලාභ		**98,490,818**	15,153,549
මුළු හිමිකරු ප්‍රාග්ධනය		**463,619,044**	347,165,572
මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය		**3,046,278,158**	2,421,597,167

පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2022 මාර්තු 23 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

අජිත් නිවාඩ් කබ්රාල් - අධිපති

ඩී.එස්.එල්. සිරිමාන්න - ප්‍රධාන ගණකාධිකාරී

ශ්‍රී ලංකා මහ බැංකුව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදයම් ප්‍රකාශය

	සටහන	2021 රු. 000	2020 රු. 000
මෙහෙයුම් ආදායම:			
විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම			
පොළී ආදායම	36	**11,815,701**	26,254,216
උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය	37	**41,859,703**	23,524,861
මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය		**14,855,788**	6,524,368
විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම		**68,531,192**	56,303,445
විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්			
පොළී වියදම	38	**(5,609,176)**	(5,293,852)
විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්)	39	**2,282,695**	(2,046,205)
විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම		**(3,326,481)**	(7,340,057)
ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය		**34,041,805**	7,123,733
විදේශීය මූල්‍ය ආයෝජන ආදායම		**99,246,516**	56,087,121
ශුද්ධ දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම			
පොළී ආදායම	36	**68,612,928**	25,342,029
මිල වෙනස්කම් මත උපලබ්ධි ලාභය/ (පාඩුව)		**(387,202)**	197,559
පොළී වියදම	38	**(8,469,897)**	(8,320,294)
දේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ අයකිරීම්	39	**(808,696)**	(259,194)
දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම		**58,947,133**	16,960,100
අනිකුත් ආදායම්	40	**16,280,370**	1,589,329
මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම		**174,474,019**	74,636,550
මෙහෙයුම් වියදම් :			
සේවක මණ්ඩල වියදම් :	41		
- වැටුප් සහ වේතන		**(7,116,223)**	(5,298,938)
- නිශ්චිත දායක සැලසුම් පිරිවැය		**(1,717,811)**	(707,129)
- පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය		**(1,891,272)**	(851,435)
		(10,725,306)	(6,857,502)
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය		**(526,675)**	(452,353)
තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය)		**(2,780,250)**	(2,396,894)
පරිපාලන සහ අනිකුත් වියදම්	42	**(2,279,122)**	(1,497,040)
මුළු මෙහෙයුම් වියදම්		**(16,311,353)**	(11,203,789)
බදු වලට පෙර ලාභය		**158,162,666**	63,432,761
බදු	43	**-**	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		**158,162,666**	63,432,761

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.
පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

		2021 රු. 000	2020 රු. 000
වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය		**158,162,666**	63,432,761
අනෙකුත් විස්තීරණ ආදායම්			
පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය වන හෝ විය හැකි අයිතම			
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව)	34	**(16,108,192)**	9,910,943
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන රජයේ සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව)	34	**(11,641,542)**	3,547,766
		(27,749,734)	13,458,709
පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොවන අයිතම			
දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණය මත වූ ශුද්ධ ලැබීම්		**-**	3,671,689
අනෙකුත් විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්(වියදම)/ආදායම	32	**1,293,721**	(13,394,058)
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන මත වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය	34	**55,862**	108,379
		1,349,583	(9,613,990)
අනෙකුත් විස්තීරණ ආදායම/(වියදම)		**(26,400,151)**	3,844,719
මුළු විස්තීරණ ආදායම		**131,762,515**	67,277,480

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.
පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

	දායක ප්‍රාග්ධනය රු. 000	අනිකුත් සංචිත රු. 000	රඳවාගත් ලාභ රු. 000	එකතුව රු. 000
2020 ජනවාරි 1 දිනට ශේෂය	50,000,000	212,493,432	41,691,960	304,185,392
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	63,432,761	63,432,761
තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම	-	418,783	(422,163)	(3,380)
අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය	-	-	(13,394,058)	(13,394,058)
ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR)	-	7,123,733	(7,123,733)	-
ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම	-	-	(284,802)	(284,802)
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය	-	9,910,943	-	9,910,943
රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම	-	43,356,467	(43,356,467)	-
පොදු සංචිතයට අරමුදල් මාරු කිරීම	-	638,355	(638,355)	-
2019 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම	-	-	(24,008,977)	(24,008,977)
ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම	-	-	(141)	(141)
පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම	-	742,476	(742,476)	-
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද ප්‍රාග්ධන ආයෝජනවල වෙළඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය	-	108,379	-	108,379
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත්වල වෙළඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය	-	3,547,766	-	3,547,766
දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන ලාභ	-	3,671,689	-	3,671,689
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	50,000,000	282,012,023	15,153,549	347,165,572
2021 ජනවාරි 1 දිනට ශේෂය	**50,000,000**	**282,012,023**	**15,153,549**	**347,165,572**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	**-**	**-**	**158,162,666**	**158,162,666**
තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම	**-**	**369,008**	**(369,008)**	**-**
අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය	**-**	**-**	**1,293,721**	**1,293,721**
ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR)	**-**	**34,041,805**	**(34,041,805)**	**-**
ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම	**-**	**-**	**(291,870)**	**(291,870)**
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ගණනය කරන ලද සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ අලාභය	**-**	**(16,108,192)**	**-**	**(16,108,192)**
රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම	**-**	**23,574,367**	**(23,574,367)**	**-**
පොදු සංචිතයට අරමුදල් මාරු කිරීම්	**-**	**2,859,208**	**(2,859,208)**	**-**
2020 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම	**-**	**-**	**(15,016,745)**	**(15,016,745)**
ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම	**-**	**-**	**(72)**	**(72)**
පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම	**-**	**757,613**	**(757,613)**	**-**
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල ප්‍රාග්ධන ආයෝජන වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය	-	**55,862**	**-**	**55,862**
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල රජයේ සුරැකුම්පත් වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ අලාභය	**-**	**(11,641,542)**	**-**	**(11,641,542)**
බැහැර කිරීම් මත උපලබ්ධි වූ ප්‍රත්‍යාගණන ලාභ	**-**	**(791,926)**	**791,570**	**(356)**
2021 දෙසැම්බර් 31 දිනට	**50,000,000**	**315,128,226**	**98,490,818**	**463,619,044**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.
පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2021 රු. 000	2020 රු. 000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්			
ලැබීම්:			
ලැබුණු පොළිය - විදේශීය මුදල්		**16,510,461**	29,058,738
ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත්		**2,433,655**	1,448,144
ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම්		**14,468,586**	6,721,927
උපලබ්ධි වූ විනිමය අලාභය		**(13,003,097)**	(10,303,437)
ලැබුණු අනිකුත් ආදායම්		**1,572,512**	1,445,544
		21,982,117	28,370,916
විය පැහැදම්:			
ගෙවන ලද පොළිය - විදේශීය මුදල්		**5,841,243**	5,574,007
ගෙවන ලද පොළිය - දේශීය මුදල්		**6,571,438**	6,863,137
සේවකයින්ට ගෙවීම්		**8,295,030**	6,476,946
සැපයුම්කරුවන්ට ගෙවීම්		**498,361**	2,631,670
		21,206,072	21,545,760
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	44	**776,045**	(6,825,156)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්			
ලැබීම් :			
අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම		**(3,542,041)**	(3,068,543)
අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම්		**5,534**	5,767
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම		**338,246**	134
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම		**(108,445,017)**	166,209,573
		(111,643,278)	163,146,931
විය පැහැදම් :			
විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ අඩුවීම		**(755,979,008)**	(57,023,608)
අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**22,242,111**	(901,434)
අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම		**218,313,967**	(202,532,008)
අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම		**489**	(1,590)
දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු)		**686,469**	348,150
අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම්		**72,928**	126
කල්බදු වත්කම් මිලදී ගැනීම්		**9,113**	4,838
රන් සංචිතයේ ශුද්ධ අඩුවීම		**(38,743,707)**	(121,876,566)
මූල්‍ය සහ අනෙකුත් ආයතනවල ආයෝජන		**-**	6,489
අනෙකුත් ආයතන වෙත ලබා දුන්/ (අයකරගත්) ණය හා අත්තිකාරම්		**(30,118,054)**	111,353,276
		(583,515,692)	(270,622,327)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**471,872,414**	433,769,258
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්			
ලැබීම් :			
සංසරණ මුදල් නිකුතුව		**390,975,631**	697,310,625
සංසරණ මුදල් ආපසු ගැනීම්		**(220,684,424)**	(540,469,916)
සංසරණ මුදල් ශුද්ධ නිකුතුව		**170,291,207**	156,840,709
විය පැහැදම් :			
රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතු	45	**1,172,364,801**	479,681,618
බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/ (ආපසු ගැනීම්)	46	**(171,102,641)**	124,980,099
සංසරණ මුදල් ශුද්ධ නිකුතු		**1,001,262,160**	604,661,717
සංසරණ මුදල් ශුද්ධ අඩුවීම		**(830,970,953)**	(447,821,008)
විය පැහැදම් :			
විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම		**(145,925,443)**	2,658,806
අනිකුත් අරමුදල් සඳහා ගෙවීම		**72**	141
විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම		**7,547,179**	329,689
රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම		**15,000,000**	24,000,000
		(123,378,192)	26,988,636
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(707,592,761)**	(474,809,644)
මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**(234,944,302)**	(34,215,230)
මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම		**28,871,146**	16,861,445
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන්		**403,577,642**	420,931,427
දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්	8	**197,504,486**	403,577,642

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරි විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2022 මාර්තු 23 වැනි දින අනුමත කරන ලදී.

1.1 ප්‍රාථමික ක්‍රියාකාරකම්

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවැරෙන අතර, බැංකුවේ කළමණාකාරීත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- නිල විදේශ සංචිතය කළමනාකරණය කිරීම.
- මූල්‍ය පද්ධතිය අධීක්ෂණය කිරීම.
- බැංකු හා තෝරාගත් බැංකු නොවන මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය සහ අධීක්ෂණය.
- පියවීම් පහසුකම් සඳහා ප්‍රතිපාදන හා ගෙවීම් පද්ධතිය නියාමනය කිරීම.
- ආර්ථික දත්ත සම්පාදනය, බෙදාහැරීම සහ විශ්ලේෂණය.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතන වලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජයේ හා එහි නියෝජිතයන් හෝ බැංකුකරු ලෙස කටයුතු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ වාණිජ බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන්ට ජංගම ගිණුම් පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සපුරාගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාලව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

2. මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ පදනම

2.1. අනුකූලතා ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ.

2.2 මිනුම් කිරීමේ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලබයි.

- රන්, ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම.
- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, ලාභ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මිණුම් කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිනුම් කිරීම.
- අත්පත් කර ගැනීමේදී පිරිවැයට මිනුම් කරන එහෙත් අනතුරුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වටිනාකමින් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන වෙන්කිරීම් අඩුකරන ලද වටිනාකමට මිණුම් කරන ඉඩම් හා ගොඩනැගිලි.
- සේවා නියුක්තිකයන්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, අදාළ නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගයෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල වත්කම්හි සාධාරණ අගය අඩුකර මිනුම් ගත කිරීම.

2.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙළට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 7 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

2.4 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකයද වේ. වාර්තා කර ඇති සියලු අගයන් ආසන්නතම දහස් සංඛ්‍යාවට දක්වා ඇති අතර බැංකුවේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකයන්හි කිසිදු වෙනසක් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සිදුවී නැත.

2.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර එක් එක් ප්‍රමාණාත්මක කාණ්ඩයන්හි සමාන අයිතම හා අසමාන ස්වභාවයක් හා කාර්‍යයන් සහිත අයිතමයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

2.6 හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කළ හැක්කේ බැංකුවට හඳුනාගත් අගයන් හිලව් කිරීමට නෛතික අයිතියක් හා ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට සමගාමීව වගකීම් නිරවුල් කිරීමට අපේක්ෂා කරයි නම් පමණි.

2.7 සංසන්දනාත්මක තොරතුරු

අවශ්‍ය විටක වර්තමාන කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලබයි.

3. ගිණුම් විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

3.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා හානිකරණය

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල ව්‍යාපාර ආකෘතිය හා ඒවාහි ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි. තවද, බැංකුව විසින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්නායකයන් ස්ථාපිත කිරීමේදී හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා වූ ආකෘති (Model) තෝරා ගැනීමේ හා අනුමත කිරීමේදී ද විනිශ්චයන් භාවිතා කරයි. බැංකුවේ ණය අලාභ ගණනය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු හා විනිශ්චයන් වලට කොවිඩ්-19 නිසා ඇති වූ බලපෑම සටහන් අංක 3.4 මගින් විස්තර කර ඇත.

3.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 32 හි දැක්වේ.

3.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. විනිශ්චයන්වලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත. ණය යෝජනා ක්‍රමයන් සාධාරණ අගයට ගණනය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු හා විනිශ්චයන් වලට කොවිඩ්-19 නිසා ඇති වූ බලපෑම සටහන් අංක 3.4 මගින් විස්තර කර ඇත.

3.4 කොවිඩ්-19 පොදු බලපෑම

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී බැංකුව විසින් කොවිඩ්-19න් ඇති වූ බලපෑම සැලකිල්ලට ගනු ලැබීය. විනිශ්චයන් සඳහා යොදා ගනු ලබන විශේෂ අයිතමයන් නොවෙනස්ව පැවතුන ද, කොවිඩ්-19 හි බලපෑම හේතුවෙන් අතිරේක විනිශ්චයන් හා ඇස්තමේන්තු යොදා ගැනීමට සිදුවිය.

ඒ අනුව මූලික වශයෙන් බැංකු සඳහා දෙන ලද ණය ශේෂය සහ අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේදී මෙකී අතිරේක විනිශ්චයන් හා ඇස්තමේන්තු බැංකුව විසින් යොදා ගනු ලැබීය.

කොවිඩ්-19 පැතිරයාම හේතුවෙන් අහිතකර බලපෑමට ලක්වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පුළුල් පරාසයක විහිදුණු සහන හා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇති වඩාත් වැදගත් සහන ක්‍රියාමාර්ගය ලෙස ක්‍රියාත්මක කළ නව ණය යෝජනා ක්‍රම හැඳින්විය හැක. ඒ අනුව බැංකුව විසින් සෞභාග්‍ය කොවිඩ්-19 පුනුරුද අදියර I, II, III හා ඉදිකිරීම් අංශය සඳහා ද්‍රවශීලතා පහසුකම මැයෙන් වන ප්‍රතිමූල්‍ය හා ණය යෝජනා ක්‍රම සහනදායි පොළී අනුපාත යටතේ මාස 6ක් වසර 2ක් අතර වන කල් පිරීම් කාල සීමාවක් සහිතව වසංගත තත්වය හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා ණය ලබා දීමේ කොන්දේසියට යටත්ව බලපත්‍රලාභී වානිජ හා බලපත්‍රලාභී විශේෂිත බැංකු තුළින් ක්‍රියාත්මක කරන ලදී.

තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රම හා තක්සේරු යෙදවුම් අදාළ හා සුදුසු බවට විශේෂයෙන් තහවුරු කිරීම සඳහා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් හා විනිශ්චයන් තක්සේරු ශිල්පීය ක්‍රම තුළ යොදා ගනු ලැබේ. එවන් තක්සේරු ශිල්පක්‍රම භාවිතයෙන් වත්කමක සාධාරණ අගය මිනුම් කරනු ලබයි. ඒ අනුව ඉහත සඳහන් කළ ණය යෝජනා ක්‍රම වල මූලික

හඳුනාගැනීමේ සාධාරණ අගය ගණනය කිරීමේදී ණය ආපසු ගෙවීම් කොන්දේසි හා වෙළඳපොළ පොලී අනුපාත යනාදී තීරණාත්මක උපකල්පනයන් හා විනිශ්චය යොදා ගන්නා ලදී.

පෙර කාලපරිච්ඡේද වල යොදාගත් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රියාවලිය හා බැඳුණු මූලික අපේක්ෂිත ණය අලාභ ආකෘතිය, ක්‍රම හා ක්‍රමවේදය ස්ථාවර හා නොවෙනස්ව පැවතිය ද බැංකුව විසින් කොවිඩ්-19 බලපෑම, අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රියාවලියේ යෙදවුම්, උපකල්පනයන් හා ඉදිරි දැක්මක් පවතින සාර්ව ආර්ථික විචල්‍යයන් තුළින් හඳුනාගෙන ඇත. ඊට අමතරව කොවිඩ්-19 ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික විචල්‍යයන්හි සිදුවූ චලනයන් හේතුවෙන් ඒවා යෙදවුම් ලෙස යොදා ගන්නා අපේක්ෂිත ණය අලාභ ආකෘතියේ ඇතිවන්නා වූ අනපේක්ෂිත සංඛ්‍යානමය වෙනස්වීම් අවම කර ගැනීම සඳහා බැංකුව විසින් සාමාන්‍යකරණය කරන ලද ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික විචල්‍යයන් භාවිතා කරන ලදී.

කෙසේ වෙතත් බැංකු තක්සේරුවට අනුව මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයට කොවිඩ්-19 මඟින් බලපෑමක් ඇතිවී නොමැති අතර එම වත්කම් සුදුසු වටිනාකමට 2021 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශ වල තක්සේරු කර ඇත.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම

මෙම මූල්‍ය වර්ෂය තුළ" ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පැවති අතර ඒවා පූර්ව කාලපරිච්ඡේදයේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ස්ථාවරව පවතී.

5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

5.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වාර්තා කරන දිනට වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

මුදල් වර්ගය	2021 රු.	2020 රු.
ඕස්ට්‍රේලියානු ඩොලර් 1	**145.5851**	143.4225
කැනේඩියානු ඩොලර් 1	**158.6150**	146.4840
යුරෝ 1	**227.8832**	227.7256
ජපන් යෙන් 1	**1.7417**	1.8055
විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1	**280.9312**	272.6200
ස්ටර්ලින් පවුම් 1	**271.2270**	254.8200
ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1	**200.4338**	186.4082
චීන යුවාන් 1 (අක්වෙරළ)	**31.5294**	28.6661

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

5.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 50 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදාගනු ලබන උපකල්පනයක් මත පදනම්ව වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී එම වත්කම වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධුරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධූරාවලි මට්ටම් අතර මාරුවීම් සිදු වී ඇත්දැයි, යන්න වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම් තුළින් (සාධාරණ අගයට මිණුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

5.3 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

5.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම

සියළු මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳාම් දිනයේදී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

5.3.2 වර්ගීකරණය

මූල්‍ය වත්කම්

මූලික මිනුම් හඳුනාගැනීමේදී බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණ මූල්‍ය වත්කම්
- ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිණුම්කරණ මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව යන ලාභ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි වලට අනුකූල නම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ග කළ නොහැකි නම් එම මූල්‍ය වත්කම් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය කළ හැක.

- යම් කිසි මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

වෙළඳාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජන වල සාධාරණ අගයෙන් පසුව සිදුවන වෙනස්වීම් විස්තීරණ ආදායම තුළින් හඳුනාගැනීමේ අවලංගු කළ නොහැකි තෝරා ගැනීමක් එම ආයෝජනය මූලික හඳුනාගැනීමේදී බැංකුවට කළ හැකිය. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම සඳහා වර්ගීකරණය කොට ඇත.

ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම

බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණු තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් අන්තර්ගත වන ආයෝජන කළඹ අරමුණු කොට එය සිදු කරනු ලබයි. ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරීත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය වීම එයට හේතුවයි.

එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනය සහ ව්‍යාපාරික අකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම් අගය කිරීම හා ප්‍රධාන කළමණාකාරීත්වයට වාර්ථා කරන ආකාරය
- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.
- පූර්ව කාලපරිච්ඡේදයේ විකුණුම්වල වාර ගණන, වටිනාකම්, එම විකුණුම්වල කාල නිර්ණය විකිණීමට බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් මගින්ම ව්‍යාපාරික ආකෘතිය නිර්ණය නොවන බැවින් එය හුදෙකලාව සැලකිල්ලට ගත නොහැක. ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළඳාම සඳහා තබාගත් හෝ සාධාරණ අගය වෙනස්වීම මත පදනම්ව කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPI) පමණක්දැයි විමසීම පිළිබඳව වන තක්සේරුව.

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂය තුළ, ගෙවීමට ඇති කල්බදු හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් හා නැවත ලබාදිය යුතු ටෙන්ඩර් තැන්පතු අන්තර්ගතය.

	2021 රු. 000	2020 රු. 000
කල්බදු වගකීම (සටහන 33.1.4)	**61,144**	52,038
ණය ඇපකර සඳහා වෙන් කිරීම් (සටහන 33.2)	**1,117,492**	162,628
අනෙකුත් වගකීම්	**2,848,713**	1,138,707
	4,027,349	1,353,373

33.1 කල්බදු

බැංකුව විසින් ඉඩම් හා ගොඩනැගිලි කිහිපයක් කල්බදු පදනම මත ලබාගෙන ඇති අතර එවැනි කල්බදු කාල පරාසය වසර 2ත් 30ත් අතර වේ. අදාළ කාල සීමාවෙන් පසු ගිවිසුම් නැවත අලුත් කිරීමේ විකල්ප මින් ගිවිසුම් කිහිපයක ඇතුළත්ය. වෙළෙඳපොළ මිල ගණන්වල වෙනස්වීම් වලට අනුරූපව වසර 05කට වරක් කල්බදු වාරිකය නැවත සලකාබැලීම ඉහත කල්බදු කිහිපයක් සඳහා සිදුකරනු ලබයි. බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු වන කල්බදු සම්බන්ධ තොරතුරු පහත ඉදිරිපත් කර ඇත.

33.1.1 වත්කම් භාවිතා කිරීමේ හිමිකම

වත්කම් භාවිතා කිරීමේ හිමිකම, දේපළ, පිරියත හා උපකරණ (සටහන 20) යටතේ දක්වා ඇති කල්බදු පදනම මත ලබාගත් ඉඩම් හා ගොඩනැගිලි අදාළ වේ.

33.1.2 ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් ප්‍රමාණය

	2021 රු. 000	2020 රු. 000
කල්බදු වගකීම් මත පොළිය	**5,482**	6,311
වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ක්‍රමක්ෂය	**6,501**	6,643

33.1.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ හඳුනාගත් ප්‍රමාණය

	2021 රු. 000	2020 රු. 000
කල්බදු මත මුළු මුදල් පිටතට ගලා යෑම්	**5,489**	8,049

33.1.4 කල්බදු වගකීම්

	2021 රු. 000	2020 රු. 000
ජනවාරි 01 දිනට ශේෂය	**52,038**	48,938
වර්ෂය තුළදී එකතුවීම්	**-**	9,114
වර්ෂය තුළදී නැවත මැනීම්	**-**	4,838
වර්ෂය තුළ පොළී වියදම	**5,481**	6,311
වර්ෂය තුළ කල්බදු වාරික ගෙවීම්	**(5,489)**	(8,049)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**61,144**	52,038

33.1.5 කල්බදු වගකීම් කල්පිරීම් විශ්ලේෂණය

	2021 රු. 000	2020 රු. 000
දිගුකාලීන	**58,815**	49,460
කෙටිකාලීන	**2,329**	2,578
දෙසැම්බර් 31 දිනට ශේෂය	**61,144**	52,038

33.1.6 වට්ටම් නොකළ ගිවිසුම් ගත කල්බදු මුදල් ප්‍රවාහ මත පදනම් වූ කල්පිරීම් විශ්ලේෂණය

	2021 රු. 000	2020 රු. 000
වර්ෂ 1 ට අඩු	**8,359**	7,990
වර්ෂ 1 සිට 5 දක්වා	**20,836**	14,580
වර්ෂ 5 ට වැඩි	**130,157**	135,219
මුළු වට්ටම් නොකළ කල්බදු වගකීම්	**159,352**	157,789

33.2 ණය ඇපකර සඳහා වෙන් කිරීම්

	2021 රු. 000	2020 රු. 000
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මෙහෙයවන ණය ඇපකර මත විලම්භිත ආදායම	105,760	162,628
ණය ඇපකර මත අපේක්ෂිත ණය අලාභ (සටහන 33.2.1)	1,011,732	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	1,117,492	162,628

33.2.1 ණය ඇපකර මත අපේක්ෂිත ණය අලාභවල වෙනස්වීම්

	2021 අදියර 1 රු. 000	2020 අදියර 1 රු. 000
ජනවාරි 01 දිනට ශේෂය	-	-
වර්ෂය තුළදී අය කිරීම්	1,011,732	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	1,011,732	-

34. හිමිකරු ප්‍රාග්ධනය

හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය

34.1 ප්‍රාග්ධන අරමුදල්

දායක ප්‍රාග්ධනය - මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි. 2014 අංක 15 දරණ මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වන වගන්තියට අනුව බැංකුවේ දායක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50.00 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව බැංකුව විසින් මුදල් ඇමතිගේ එකඟතාවය ඇතිව 2014 සැප්තැම්බර් මස බැංකුවේ සංචිත ප්‍රාග්ධනිත කරමින් දායක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50.00 තෙක් වැඩි කරන ලදී.

34.2 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය

ජා.ගි.ප්‍ර 16 - දේපළ පිරියත හා උපකරණ අනුව දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අධිභාරයන්ගේ එකතුවෙන් මෙම සංචිතය නිර්මාණය වී ඇත.

34.3 අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ;

i. ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය **(IRR)** : ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයකි. මෙම වගන්තිය ප්‍රකාර, රන් හෝ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

ii. වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය **(MRR)** : ජාත්‍යන්තර වෙළඳපල තුළ සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස්වීම්වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වෙළඳපල මිල මත ඇගැයීමේ ලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය පිහිටුවන ලදී. මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

තවද, 2016 පෙබරවාරි 29 වන දින MB/DG(W)/7/1/2016 දරන මුදල් මණ්ඩලයේ යෝජිත සංශෝධිත බැංකුවේ ලාභ බෙදා දීමේ ප්‍රතිපත්තියට අනුව, මුදල් මණ්ඩලයට අවශ්‍යයැයි සලකන ඕනෑම අවස්ථාවකදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නා වූ පාඩු වැඩිවීම නිසා රඳවාගත් ලාභයන් ඍණ අගයක් ගන්නා අවස්ථාවකදී වෙළෙඳපොල ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත හුවමාරු කිරීමක් සිදු කල හැක.

2019 දී වාර්තා වුණු පසුකාලීන වෙළඳපල ප්‍රත්‍යාගණන ලාභ සැලකිල්ලට ගෙන 2020 පෙබරවාරි 26 දිනැති BP/MB/F/6/28/2020 දරන මුදල් මණ්ඩල තීරණය පරිදි රු. බිලියන 43.36 ක් රඳවාගත් ලාභයෙන් වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරන ලදී.

iii. අනෙකුත් සංචිත : පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුළ ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

iv. **අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන සුරැකුම්පත් මත ශුද්ධ සාධාරණ ලාභය/(පාඩුව)** : අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

v. **තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල** : තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල ගොඩනගා ඇත.

vi. **විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය** : මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3.00 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බාහිර අවදානම් තත්ත්වයන් යටතේ බැංකුවේ ආදායම් ඉපැයීමේ ධාරිතාවයේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා යොදාගැනීමට අපේක්ෂා කෙරේ. 2011 ලාභවලින් තවත් රුපියල් බිලියන 1.00 ක් මෙම සංචිතයට මාරු කරන ලදී. MB/HR/11/12/2015 දරණ මුදල් මණ්ඩල පත්‍රිකාව අනුව නව විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූනි මාසය තුළදී විශ්‍රාම ප්‍රතිලාභ සංචිතයෙන් රුපියල් බිලියන 2.00ක් නව විශ්‍රාම ගිණුමට මාරු කරන ලදී.

vii. **තාක්ෂණික අභිවර්ධන සංචිතය** : මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර එය මහ බැංකුවේ දැනට භාවිතා කරන තොරතුරු තාක්ෂණ පද්ධති වන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හා නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු නවීකරණ කටයුතු හෝ

වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. 2018 මාර්තු මසදී 2017 වර්ෂයේ ලාභයෙන් රු. බිලියන 2.00 ක අමතර මුදලක් මෙම සංචිතයට මාරු කරන ලදී.

viii. පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල : 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.90 ක අරමුදලක් ගොඩනඟා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රදානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය. පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල සම්පූර්ණ කිරීම නිසා 2019 අප්‍රේල් මාසය තුළදී රු. බිලියන 2.90 ක ශේෂයක් මධ්‍යම හා දිගුකාලීන ණය සංචිතයට මාරුකරන ලදී.

ix. විශේෂිත ණය ඇප ක්‍රම සංචිතය : මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදලින් රුපියල් බිලියන 2.00 ක් මාරු කිරීමෙන් 2014 දී මෙම අරමුදල පිහිටුවන ලද අතර ඉන් රුපියල් බිලියන 1.00 ක් බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සෞභාග්‍ය ණය ක්‍රමය, පිබිදෙන උතුර (අදියර II), නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිස්ථාපනය කිරීම (අදියර II) සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම යන ණය ක්‍රමයන් ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා වෙන්කර ඇත. අනෙක් රුපියල් බිලියන 1.00 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට ණය දීම සඳහා වාණිජ බැංකු මගින් විශේෂිත ණය ඇප ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට වෙන් කර ඇත.

x. පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වූ සංචිතය : 2016 දෙසැම්බර් 16 දිනැති මුදල් මණ්ඩල තීරණ MB/F/39/20/2016 ට අනුව ප්‍රමාණවත් බෙදාහැරිය හැකි ලාභ පවතින්නේනම් යම් වසරක (2016 න් ආරම්භ වන) ආයුගණනයේ ප්‍රතිලාභ වියදමින් සියයට 50 ක් වෙනම සංචිතයකට මාරු කිරීමට යෝජනා කර ඇත. මෙය ආයුගණනයේ අලාභ හා ප්‍රතිලාභ වියදම්වලින් බැංකුවේ ප්‍රාග්ධනය මත වන අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණ ඇතිව සිදු කරයි. 2020 වර්ෂයේ දී බැංකුවේ බෙදාහැරිය හැකි ලාභවලින් රු. මිලියන 757.61ක් 2021 මාර්තු මාසයේදී මෙම සංචිතයට මාරු කරන ලදී.

xi. මධ්‍යම හා දිගු කාලීන ණය සංචිතය : 2020 අප්‍රේල් 15 දිනැති මුදල් මණ්ඩල තීරණ MB/FD/11/14/2020 සහ 2020 ජූනි 11 දිනැති මුදල් මණ්ඩල තීරණ MB/RD/19/28/2020 වලට අනුව, කෝවිඩ් 19 වසංගතයෙන් ඇති වූ බලපෑම මැඩපැවැත්වීම සඳහා බැංකුව විසින් දියත් කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය මූල්‍යනය කිරීම සඳහා පොදු සංචිතයෙන් සහ ගොඩනැගිලි සංචිතයෙන් රු. බිලියන 15.46ක් ද, විශේෂිත ණය ඇප ක්‍රම සංචිතයෙන් රු. බිලියන 1.96ක් ද තාක්ෂණික අභිවර්ධන සංචිතයෙන් රු. බිලියන 3.00 ක්ද පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වූ සංචිතයෙන් රු. බිලියන 4.33ක් ද 2020 වර්ෂය තුළදී මධ්‍ය හා දිගු කාලීන ණය සංචිතයට මාරු කරන ලදී.

අනෙකුත් සංචිතවල වෙනස් වීම පහත පරිදි වේ.

	මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිතය	වෙළෙඳපල ප්‍රත්‍යාගණන සංචිතය	අනෙකුත් සංචිත	විශේෂිත ණය ඇප ක්‍රම සංචිතය	තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල	ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය	ප්‍රත්‍යාගණන සංචිතය	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය/(අලාභය)	විශ්‍රාම අරමුදල් සංචිතය	තාක්ෂණික අභිවර්ධන සංචිතය	පශ්චාත් සේවක ප්‍රතිලාභ සැළසුම් මූල්‍යනය සඳහා වූ සංචිතය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2021 ජනවාරි 01 දිනට	29,577,739	63,463,145	1,142,018	40,000	2,870,918	147,994,227	12,694,596	21,483,407	2,000,000	-	745,973	282,012,023
තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදලට මාරු කිරීම	-	-	-	-	369,008	-	-	-	-	-	-	369,008
ලාභයන් පොදු සංචිතයට මාරු කිරීම	-	-	2,859,208	-	-	-	-	-	-	-	-	2,859,208
විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභ මාරු කිරීම	-	-	-	-	-	34,041,805	-	-	-	-	-	34,041,805
අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්වල ශුද්ධ අලාභය	-	-	-	-	-	-	-	(16,108,192)	-	-	-	(16,108,192)
වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම	-	23,574,367	-	-	-	-	-	-	-	-	-	23,574,367
පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වන සංචිතයට මාරු කිරීම	-	-	-	-	-	-	-	-	-	-	757,613	757,613
වෙළඳපොල ඇගයීම් සංචිතය . අනෙකුත් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගයට ඇති රජයේ සුරැකුම්පත්	-	-	-	-	-	-	-	(11,641,542)	-	-	-	(11,641,542)
වෙළඳපොල ඇගයීම් සංචිතය . අනෙකුත් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගයට ඇති ස්තන්ධ ආයෝජන	-	-	-	-	-	-	-	55,862	-	-	-	55,862
බැහැර කිරීම් මත උපලබ්ධි වූ ප්‍රත්‍යාගණන ලාභ	-	-	-	-	-	-	(791,926)	-	-	-	-	(791,926)
2021 දෙසැම්බර් 31 දිනට	29,577,739	87,037,512	4,001,226	40,000	3,239,926	182,036,032	11,902,670	(6,210,465)	2,000,000	-	1,503,586	315,128,226

35. ලාභ බෙදාහැරීම

මුදල් නීති පනතට අනුව සහ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව, (2018 වසරේ සිට බලපැවැත්වෙන පරිදි) බෙදිය හැකි ලාභය ගණනය කිරීමේදී වසර සඳහා වන ශුද්ධ ලාභය සඳහා පහත දැක්වෙන ගැලපීම් කරනු ලැබේ.

(අ) විදේශ විනිමය ලාභ ඉවත්කරනු ලැබේ. විදේශ විනිමය අලාභ, සමුච්චිත ලාභයන්ගෙන් අවශෝෂණය කිරීමට ප්‍රමාණවත් වන තෙක් පමණක් ඉවත් කෙරේ. ඉතිරි විදේශ විනිමය අලාභය ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව)

(ආ) විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ පාඩු ගලපනු ලබන අතර උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ වාසි ඉවත් කෙරේ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව).

(ඇ) මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි මුදල් නීති පනතේ වගන්ති අංක 38 අනුව සංචිතයන්ට සිදු කරනු ලබන වෙනත් ඕනෑම මාරු කිරීමක් සහ මුදල් නීති පනතේ වගන්ති අංක 39 අනුව කළ යුතු ගැලපුම් කරනු ලැබේ.

තවද ගිණුම්කරණ ප්‍රමිති සහ කළමණාකාරීත්වයේ තීරණ අනුව කළ යුතු ගැලපුම් ද බෙදිය හැකි ලාභය ගණනය කිරීමේ දී ගලපනු ලැබේ.

ඉහත සඳහන් ගැලපුම් වලට අනුව ගණනය කරන ලද 2021 දෙසැම්බර් 31 දිනට බෙදිය හැකි ලාභය පහත පරිදි වේ.

අයිතමය	2021 රු. 000
වර්ෂයේ ලාභය	158,162,666
එකතුකළා :	
ඉවත් කිරීම් මත ප්‍රත්‍යාගණන ලාභ	791,570
අඩුකළා :	
විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම. (මුදල් නීති පනත ප්‍රකාරව)	34,041,805
විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නා වූ ලාභ වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම	49,638,590
අනෙකුත් ගිණුම්කරණ ගැලපුම්	660,938
මුදල් නීති පනතට, බැංකුවේ ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට සහ අනෙකුත් ගැලපීම්වලට අනුකූලව බෙදිය හැකි ලාභය - උපලබ්ධි ලාභය	**74,612,903**
අඩුකළා : සංචිතවලට මාරුකිරීම් (මුදල් නීති පනතේ 38 වන වගන්තියට අනුව)	
ප්‍රා.ස. දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් සඳහා මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිතයට මාරු කිරීම්	15,000,000
-පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වූ සංචිතයට මාරු කිරීම්	1,051,039
-පොදු සංචිතවලට මාරු කිරීම්	27,526,076
-රජයෙන්, ශ්‍රී.ලං.ම.බැ. වෙත ලැබිය යුතු බැඳීම් පියවා ගැනීම (මුදල් නීති පනතේ 39 වන වගන්තියට අනුව)	1,035,788
ඒකාබද්ධ අරමුදලට බැරකළ අගය (මුදල් නීති පනතේ 39 වන වගන්තියට අනුව)	**30,000,000**

36. මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම

	2021 රු. 000	2020 රු. 000
විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම		
මුදල් හා කෙටිකාලීන තැන්පතු	**274,786**	454,878
මූල්‍ය වත්කම්	**4,104,262**	13,771,910
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**7,436,653**	12,027,428
විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම	**11,815,701**	26,254,216
දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම		
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**55,718,603**	20,969,883
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්	**8,806,814**	1,685,965
අනිකුත් ණය සහ අත්තිකාරම්	**4,087,511**	2,686,181
දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු පොළී ආදායම	**68,612,928**	25,342,029
මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම	**80,428,629**	51,596,245

2021 වසර තුළදී සඵල පොළී අනුපාත ක්‍රමය යටතේ ගණනය කරන ලද මුළු පොළී ආදායම රු. මිලියන 58,662.72 (2020 - රු. මිලියන 34,714.14)

37. උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද ලාභ

	2021 රු. 000	2020 රු. 000
විදේශ සුරැකුම්පත්	**(302,953)**	(30,440)
රන්	**(7,475,934)**	21,785,511
විදේශ විනිමය සහ මුදල් හුවමාරු	**49,638,590**	1,725,932
විනිමය විකල්පයන්	**-**	43,858
උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද සම්පූර්ණ ලාභය	**41,859,703**	23,524,861

38. මූල්‍ය බැරකම් මත පොළී වියදම

	2021 රු. 000	2020 රු. 000
විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම		
ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල	**78,207**	269,910
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම්	**2,946,797**	3,245,651
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**1,974,648**	912,259
අනෙකුත් ගෙවිය යුතු මුදල් - විදේශීය	**609,524**	866,032
විදේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම	**5,609,176**	5,293,852

දේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම		
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අලෙවිකරණ ලද සුරැකුම්පත්	**890,946**	114,379
නිත්‍ය තැන්පතු පහසුකම	**5,668,475**	6,766,330
අත්හල දේපල	**623,593**	600,757
විවිධ පොළී වියදම්	**1,286, 883**	838,828
දේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම	**8,469,897**	8,320,294
මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොළී වියදම	**14,079,073**	13,614,146

බැංකුව විසින් මුදල් වෙළෙඳපොල තුළ ඇති වූ අතිරික්ත ද්‍රවශීලීතාවය උකහාගැනීම වෙනුවෙන් රු.මි. 3,050.59 ක ශුද්ධ නිවාරණ ලාභයක් 2021 වර්ෂය තුළදී දරා ඇත (2020 පිරිවැය රු.මි. 1,126.15 කි). පහත විස්තර කර ඇති පරිදි මෙම නිවාරණ පිරිවැය, ප්‍රති මිලදීගැනුම් ගිවිසුම් යටතේ සුරැකුම්පත් විකිණීම මත වූ පොළී වියදම, බැඳුම්කර ණයට ගැනීම මත වූ පොළී වියදම, නිත්‍ය තැන්පතු පහසුකම් මත පොළී වියදමින් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද පොළී ආදායමෙහි අඩංගු නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්වලින් ලද පොළී ආදායම විදේශ මූල්‍ය වත්කම් මත වූ පොළී ආදායමෙහි අඩංගු ඇ.එ.ජ. ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ලාභයන්ගේ ශුද්ධ අගයෙන් සහ ඇ.එ.ජ.ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත මිල වෙනස්වීම්වලින් ලද උපලබ්ධි ලාභ/(පාඩුව) ගැලපීමෙන් ලබා ගනී.

	2021 රු. 000	2020 රු. 000
ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් මත විකුණූ සුරැකුම්පත් වෙනුවෙන් දරණ ලද පොළී වියදම්	**890,946**	114,379
නිත්‍ය තැන්පතු පහසුකම මත පොළී වියදම	**5,668,475**	6,766,330
අඩු කළා :		
ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් වෙනුවෙන් ලද පොළී ආදායම	**8,806,814**	1,685,965
ඇ.එ.ජ.ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල ලාභය	**803,202**	4,068,592
	3,050,595	(1,126,152)

39. මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (අය කිරීම්) /හැරවුම්

	2021 රු. 000	2020 රු. 000
විදේශීය මූල්‍ය වත්කම්		
ක්‍රමක්ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම්		
මුදල් සහ මුදල් සමානයන් (සටහන 8.2)	**184,970**	(48,380)
ජා.මු.අ. සම්බන්ධ වත්කම් (සටහන 11.4)	**(1)**	2
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් (සටහන 9.2)	**2,097,726**	(1,997,827)
විදේශීය මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ (අය කිරීම්)/හැරවුම්	**2,282,695**	(2,046,205)
දේශීය මූල්‍ය වත්කම්		
ක්‍රමක්ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම්		
බැංකු සඳහා දෙන ලද ණය (සටහන 16.2)	**123,745**	(154,333)
අභ්‍යන්තර අරමුදල් මගින් කල ආයෝජන (සටහන 17.1)	**79,291**	(63,939)
අනෙකුත් ලැබිය යුතු දෑ (සටහන 17.2)	**-**	(8,001)
ණය ඇපකර සඳහා වෙන්කිරීම් (සටහන 33.2)	**(1,011,732)**	-
අනෙකුත් ලැබිය යුතු දෑ සහ කලින් ගෙවීම්	**-**	(32,921)
දේශීය මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ අය කිරීම්	**(808,696)**	(259,194)
මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ (අය කිරීම්)/හැරවුම්	**1, 477,999**	(2,305,399)

බැංකු සඳහා දෙන ලද ණය හා අභ්‍යන්තර අරමුදල් මගින් කළ ආයෝජන හා සම්බන්ධ අපේක්ෂිත ණය අලාභ ශේෂයන් ඒවා මූල්‍ය තත්ව ප්‍රකාශයේ සටහන් කර ඇති අගයන් සමගින් වෙනස්වන අතර මේ සඳහා සටහන 40 හි දක්වා ඇති පරිදි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වෙත අවශෝෂණය කිරීම බලපාන ලදී.

40. අනෙකුත් ආදායම්

	2021 රු. 000	2020 රු. 000
ලාභාංශ ආදායම		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**153,987**	154,381
විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම	**28**	1
මූල්‍ය ආයතනයන්ට අදාල බලපත්‍ර ගාස්තු	**609,050**	620,902
කුලී ආදායම්	**282,174**	321,821
තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සහභාගීකරුවන්ගෙන් අයකරන ලද ගාස්තු	**54,237**	99,585
ප්‍රා.සං.දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් අවශෝෂණයේදී ලද වෙනත් ආදායම් (සටහන 40.1)	**14,705,875**	-
විවිධ ආදායම්	**475,019**	250,249
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයෙන් ලද ශුද්ධ ලාභ	**-**	142,390
මුළු අනිකුත් ආදායම්	**16,280,370**	1,589,329

40.1 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද ව්‍යාපෘති හා සම්බන්ධ ශුද්ධ වත්කම් අවශෝෂණය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද ප්‍රති මූල්‍ය ණය හා ණය ඇපකර යෝජනා ක්‍රම හා සම්බන්ධ ශේෂයන්, 2021 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය සමග, ශ්‍රී ලංකා

මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වෙත අවශෝෂණය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මෙම ශේෂයන් 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වල සටහන් කරන ලද්දේ එම ශේෂයන්හි හිමිකාරීත්වය තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීමෙන් පසුව පමණි.

තවද, බැංකුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අතර වූ සාකච්ඡා මත පදනම්ව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලද ඉහත ණය යෝජනා ක්‍රම හා සම්බන්ධ වත්කම් හා වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ තුළ 2021 දෙසැම්බර් 31 දිනට හඳුනා ගැනීම සඳහා එකඟතාවය පළ කරන ලදී.

41. සේවක මණ්ඩල වියදම්

	2021 රු. 000	2020 රු. 000
වේතන සහ වැටුප්	**7,116,223**	5,298,938
නිශ්චිත දායක සැලසුම් පිරිවැය	**1,717,811**	707,129
පශ්චාත් සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	**1,891,272**	851,435
මුළු සේවක මණ්ඩල වියදම්	**10,725,306**	6,857,502

42. පරිපාලන හා අනිකුත් වියදම්

	2021 රු. 000	2020 රු. 000
අලුත්වැඩියා සහ නඩත්තු	**879,065**	823,229
දේපළ, පිරියත උපකරණ ඉවත් කිරීම් මත අලාභ	**669,923**	-
රොයිටර්, බ්ලූම්බර්ග්, SWIFT ආදිය වෙනුවෙන් මෙහෙයුම් වියදම්	**205,041**	213,666
ගමනාගමන වියදම්	**22,008**	9,581
මුද්‍රණ වියදම්	**41,699**	59,306
විගණන ගාස්තු	**9, 225**	9, 225
මුදල් මණ්ඩලයේ/ අනුකමිටු සාමාජිකයිනට පාරිශ්‍රමිකය	**3,975**	4,325
ප්‍රචාරණ වියදම්	**48,796**	28,248
උපදේශාත්මක, සන්නිවේදන සහ වෘත්තිමය ගාස්තු	**210,337**	118,744
කල්බදු වගකීම් සඳහා පොළී වියදම්	**5,482**	6,311
විවිධ වියදම්	**183,571**	224,405
මුළු පරිපාලන හා අනිකුත් වියදම්	**2,279,122**	1,497,040

43. බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ වගන්ති 9 (i) ප්‍රකාරව හා 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනතේ සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවට ආදයම් බදු ගෙවීම සඳහා වගකීමක් නොමැත.

2021 වසර තුළදී බැංකුව කිසිදු බදු මුදලක් ගෙවා නොමැත. (2020 වසරේදී ද කිසිදු බදු මුදලක් ගෙවා නැත.)

44. මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම

	2021 රු. 000	2020 රු. 000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වාර්තා කෙරුණු ශුද්ධ ලාභය	**158,162,666**	63,432,761
මුදල් නොවන අයිතමයන් එකතුකළා/(අඩුකළා)		
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය	**526,675**	452,353
දේශීය මුදල් ආයෝජන කළඹ මගින් ලැබිය යුතු පොලිය	**(64,504,574)**	(22,657,914)
නිශ්චිත සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා වන ශුද්ධ වෙන්කිරීම්	**2,290,446**	211,855
උපලබ්ධි නොවූ දළ විදේශ විනිමය ලාභය	**(43,638,970)**	(16,414,833)
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද (ලාභය)/අලාභය	**669,924**	(5)
වෙන් කිරීම් හා උපචිතයන්	**3,144, 366**	1,862,265
මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ වෙන් කිරීම	**(1,473, 999)**	2,272,478
විලම්භිත ප්‍රදාන	**389**	785
ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභ	**-**	(142,390)
PRGF තැන්පතු ක්‍රමක්ෂය	**(2,372)**	(2,174)
නොනිමි ඉදිකිරීම් ලියාහැරීම්	**(356)**	-
ස්ථාවර ආදායම් සුරැකුම්පත් ක්‍රමක්ෂය වියදම්	**877,761**	2,246,629
ප්‍රා.සං.දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් අවශෝෂණයෙන් ලද අනෙකුත් ආදායම්	**(14,705,875)**	-
එකතුකළා / (අඩුකළා) අනෙකුත් කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම්		
තොගවල අඩුවීම	**1,373,286**	996,573
ලැබිය යුතු පොලිය අඩුවීම	**3,593,983**	338,516
විවිධ බැරකම්වල වැඩිවීම	**1,539,342**	811,504
ගෙවිය යුතු පොලිය වැඩිවීම	**425,395**	392,801
අනෙකුත් ලැබීම් වැඩිවීම	**(2,236,407)**	(2,438,850)
එකතුකළා/(අඩුකළා) ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම්		
ශුද්ධ උපලබ්ධි නොවූ වෙළෙඳපොළ අගය වෙනස්වීම	**(45,265,635)**	(24,537,198)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**776,045**	6,825,156

45. රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුත්/ (ආපසු ගැනීම්)

	2021 රු. 000	2020 රු. 000
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම	**1,218,291,655**	581,555,020
ලැබුණු පොලිය - දේශීය මුදල් - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**(43,061,965)**	(17,365,458)
ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් අඩුවීම	**(2,933,100)**	(83,547,071)
රජය සහ රජයේ ආයතන සමග ශේෂ (වැඩිවීම)/අඩුවීම	**68,211**	(960,873)
	1,172,364,801	479,681,618

46. බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්)

	2021 රු. 000	2020 රු. 000
බැංකු හා මූල්‍ය ආයතනයන්ගේ තැන්පතු අඩුවීම/(වැඩිවීම)	**(171,102,641)**	124,980,099
	(171,102,641)	124,980,099

47. අරමුදල්කරණයේ සංකේන්ද්‍රණය වීම

වර්ෂ අවසානයට බැංකුවේ අරමුදල්කරණයේ සැලකිය යුතු සංකේන්ද්‍රණය වීම පහත පරිදිය.

	ශ්‍රී ලංකා රජය	ශ්‍රී ලංකා මහජනයා	ශ්‍රී ලංකා වාණිජ බැංකු	අධි ජාතික මූල්‍ය ආයතන	අනිකුත්	එකතුව
47.1 2021 දෙසැම්බර් 31 දිනට	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය බැරකම්						
බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල්	-	-	-	-	13,701	**13,701**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	1,139,323	-	-	**1,139,323**
ආසියානු නිශ්කාෂණ සංගමය	-	-	-	104,764,616	-	**104,764,616**
ජා.මූ.අ.	-	-	-	670,065,243	-	**670,065,243**
අනිකුත්	1,501,522	-	-	178,312	355,615,842	**357,295,676**
මුළු විදේශීය මූල්‍ය බැරකම්	1,501,522	-	1,139,323	775,008,171	355,629,543	**1,133,278,559**
දේශීය මූල්‍ය බැරකම්						
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු	-	-	289,396,174	-	11,307,988	**300,704,162**
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු	1,392,104	197	-	-	-	**1,392,301**
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවි කළ සුරැකුම්පත්	-	-	99,426,206	-	1,636,674	**101,062,880**
සංසරණයේ ඇති මුදල්	-	1,005,099,066	-	-	-	**1,005,099,066**
අනෙකුත් ගෙවිය යුතු දෑ	26,525	-	8,947,739	-	10,189,618	**19,163,882**
මුළු දේශීය මූල්‍ය බැරකම්	1,418,629	1,005,099,263	397,770,119	-	23,134,280	**1,427,422,291**
මුළු මූල්‍ය බැරකම්	2,920,151	1,005,099,263	398,909,442	775,008,171	378,763,823	**2,560,700,850**
අනිකුත් බැරකම්						
විලම්භිත ප්‍රදානයන්	-	-	-	-	1,178	**1,178**
විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්	-	-	-	-	17,929,737	**17,929,737**
විවිධ බැරකම් සහ උපචිතයන්	-	-	-	-	4,027,349	**4,027,349**
මුළු අනිකුත් බැරකම්	-	-	-	-	21,958,264	**21,958,264**
මුළු බැරකම්	2,920,151	1,005,099,263	398,909,442	775,008,171	400,722,087	**2,582,659,114**

2020 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පහත පරිදිය.

	ශ්‍රී ලංකා රජය	ශ්‍රී ලංකා මහජනයා	ශ්‍රී ලංකා වාණිජ බැංකු	අධි ජාතික මූල්‍ය ආයතන	අනිකුත්	එකතුව
47.2 2020 දෙසැම්බර් 31 දිනට	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය බැරකම්						
බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල්	-	-	-	-	208,337,221	208,337,221
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	124,237	-	449,945	574,182
ආසියානු නිශ්කාෂණ සංගමය	-	-	-	63,864,652	-	63,864,652
ජා.මූ.අ.	-	-	-	509,925,278	-	509,925,278
අනිකුත්	15,529	-	-	48,468	74,806,328	74,870,325
මුළු විදේශීය මූල්‍ය බැරකම්	15,529	-	124,237	573,838,398	283,593,494	857,571,658
දේශීය මූල්‍ය බැරකම්						
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු	-	-	118,686,595	-	10,914,926	129,601,521
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු	1,460,338	174	-	-	-	1,460,512
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවි කළ සුරැකුම්පත්	-	-	196,901,340	-	12,606,558	209,507,898
සංසරණයේ ඇති මුදල්	-	834,807,859	-	-	-	834,807,859
අනෙකුත් ගෙවිය යුතු දෑ	25,474	-	2,905,314	-	11,812,004	14,742,792
මුළු දේශීය මූල්‍ය බැරකම්	1,485,812	834,808,033	318,493,249	-	35,333,488	1,190,120,582
මුළු මූල්‍ය බැරකම්	1,501,341	834,808,033	318,617,486	573,838,398	318,926,982	2,047,692,240
අනිකුත් බැරකම්						
විලම්භිත ප්‍රදානයන්	-	-	-	-	789	789
විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්	-	-	-	-	25,385,193	25,385,193
විවිධ බැරකම් සහ උපචිතයන්	-	-	-	-	1,353,373	1,353,373
මුළු අනිකුත් බැරකම්	-	-	-	-	26,739,355	26,739,355
මුළු බැරකම්	1,501,341	834,808,033	318,617,486	573,838,398	345,666,337	2,074,431,595

48. අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති අරමුණ කර ළඟා වීමේ දී විවිධාකාර වූ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් රැසකට මුහුණ දෙනු ලබයි. මෙම අවදානම් වලින් ඇතිවිය හැකි බරපතල වූ හානිකර බලපෑම් පාලනය කරනු වස් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ නිසි පරිදි සැලසුම් කළ අවදානම් කළමණාකරණ රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මුහුණ දෙන අවදානම් නිසි පරිදි කළමණාකරණය කිරීම සඳහා බැංකුව විසින්, ආයතනික අවදානම් කළමණාකරණ රාමුවක් (Enterprise -wide Risk Management Framework) ස්ථාපිත කරන ලදි.

මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් යහපාලන රාමුව, අවදානම් යහපාලනය හා අවදානම් කළමනාකරණය ව්‍යුහයන්ගෙන් සමන්විත වන අතර බැංකුව විසින් මුහුණ දෙනු ලබන මූල්‍යමය හා මූල්‍යමය නොවන අවදානම් මෙමගින් ආවරණය වේ. අවදානම් යහපාලන ව්‍යුහය, මුදල් මණ්ඩලයෙන්ද මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව යන අනුකමිටු වලින් ද සමන්විත වේ. මුදල් මණ්ඩලය විසින් බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකත්වය ද අවසාන වගකීමද දරනු ලැබේ.

මුදල් මණ්ඩලය විසින් සිදුකළ විධිමත් බලය පැවරීමකට අනුව, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව, ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් අධීක්ෂණය කිරීම සහ බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අනුකූලතා කාර්යය සඳහා පුළුල් උපායමාර්ග සහ ප්‍රතිපත්තීන් සකස් කිරීම සිදු කරනු ලබයි. බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අනුකූලතාවය තහවුරු කිරීම වෙනුවෙන් මුදල් මණ්ඩලයට සහාය ලබා දීමද මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව විසින් සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ රාමුව, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව, ආයෝජන අධීක්ෂණ කමිටු සහ සියලු දෙපාර්මේන්තුවලින් සමන්විත වේ. ශ්‍රී ලංකා මහ බැංකුව අවදානම් කළමනාකරණය කිරීමේදී තෙවැදෑරුම් ආරක්ෂණ පිළිවෙතක් (Three lines of defense) අනුගමනය කරනු ලබයි. මෙහි ප්‍රථම පෙළ ආරක්ෂණ කටයුතු සඳහා සියලු දෙපාර්මේන්තු විසින් වගකීම දරනු ලබයි. ඒ අනුව මෙහෙයුම් දෙපාර්තමේන්තු විසින් බැංකුවේ අවදානම් කළමනාකරණ ව්‍යුහයට අනුකූලව ඔවුන්ගේ කාර්යයන් හා සබැඳි මූල්‍ය සහ /හෝ මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම, විශ්ලේෂණය, ඇගයීම, පිළියම් යෙදීම, අධීක්ෂණය, සමාලෝචනය හා ඒවා තම වාර්තාකරණ ධුරාවලිය හරහා වාර්තා කිරීමේ වගකීමෙන් බැඳී

සිටියි. දෙවන පෙළ ආරක්ෂක වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලබන අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, අවදානම් කළමනාකරණය හා බැඳි කාර්යයන් සම්බන්ධීකරණය, මග පෙන්වීම හා උපදේශනය තුළින් බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් අවදානම්වලට අදාළ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට පහසුකම් සැපයීමේ වගකීම දරනු ලබයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව හරහා මෙහෙයුම් අවදානම් මුදල් මණ්ඩල අධීක්ෂණ කාරක සභාව වෙතද මූල්‍ය අවදානම් සෘජුවම මුදල් මණ්ඩල අධීක්ෂණ කාරක සභාවටද නිශ්චිත කාලසීමාවකදී වාර්තා කරනු ලබයි. තෙවන පෙළ ආරක්ෂක ක්‍රමවේදය ලෙස ක්‍රියාකරන අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වගකීම වන්නේ, ස්වාධීන තහවුරු කිරීමේ හා නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් අගය වැඩිකිරීම් සහ බැංකුවේ මෙහෙයුම් කටයුතු විගණනයෙන් ඒ හා බැඳි අභ්‍යන්තර පාලන පරිසරය වැඩි දියුණු කිරීම වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කාර්තුවකට වරක් සිය විගණන කටයුතුවල ප්‍රගතිය හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද විගණන වාර්තාවල තොරතුරු ද මුදල් මණ්ඩයට සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

ආයතනික අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස්කොට ඇති අතර සමස්ත බැංකුව තුළ අවදානම් කළමනාකරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන ප්‍රතිපත්ති එහි ඇතුළත් වේ. මෙම ක්‍රියාවලිය තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුව සිය අවදානම් කළමනාකරණය සඳහා පිළිගත් ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ අනුගමනය කරන අතරතුර අවදානම් හිමිකාරිත්වය හා කළමනාකරණය විවිධ පාර්ශවයන් වෙත පැහැදිලි වගවීමක් සහිතව පවරා දීමක් සිදුකරනු ලබයි.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර සංචිත, අභ්‍යන්තර ආයෝජන අරමුදල් සහ රජය සඳහා නියෝජිතායතන කාර්යයක් ලෙස සිදු කරනු ලබන සේවක අර්ථ සාධක අරමුදලේ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වල මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීමට පහසුකම් සැපයීම සඳහා වගකියනු ලැබේ.

ඒ අනුව, ඉහත අරමුදල් තුනම කළමනාකාරණය කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය, උපාය මාර්ගික වත්කම් විභජනය හා ආයෝජන මාර්ගෝපදේශය සකස්කොට ඇති අතර ඒවාට අදාළ වෙනස්කම් ඇතුළත් කිරීම සඳහා ඒවා නිතිපතා සමාලෝචනයට ලක් කරයි. තවද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඉහත අරමුදල් කළමනාකරණ කාර්යයන් හා සබැඳි වෙළඳපල හා ණය අවදානම් ස්වාධීනව නිරීක්ෂණය කරන අතර එමගින් මෙම ආයෝජන මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික වත්කම් විභජනය, ආයෝජනය ප්‍රතිපත්ති ප්‍රකාශය හා ආයෝජන මාර්ගෝපදේශවල නියම කර ඇති ආයෝජන සීමාවන් තුළ පවතින්නේ ද යන්න තහවුරු කරනු ලබන අතර එම තොරතුරු අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව සහ මුදල් මණ්ඩලය වෙත නිශ්චිත කාලසීමාවන් වලදී වාර්තා කරනු ලබයි.

අවදානම් කළමනාකරණය සඳහා පහසුකම් සලසනු වස්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් අවදානම් වර්ගීකරණය වාර්ෂිකව සමාලෝචනය කරන අතර එයට අවදානම් වර්ග ඇතුළත් කිරීම / ඉවත් කිරීම හා පවතින අවදානම් පරිසරයට ගැලපෙන අනෙකුත් වෙනස්කම් සිදු කිරීම මගින් යාවත්කාලීන කරනු ලැබේ. බැංකුව තුළ අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව බැංකුවේ සේවකයන් සඳහා අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් විවිධ අවස්ථාවලදී වර්ෂය පුරා පවත්වන ලදි. ඊට අමතරව, පවතින මෙහෙයුම් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ දැනුවත්භාවය තීරණය කරනු වස්, ද්විවාර්ෂික සංජනන සමීක්ෂණයක් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල ඉදිරි දැනුවත් කිරීමේ වැඩසටහන් සුදුසු පරිදි සැලසුම් කිරීමටත් එමගින් මහ බැංකුව තුළ අවදානම් සංස්කෘතිය වැඩි දියුණු වීමත් දැනට පවතින මෙහෙයුම් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය දියුණු කිරීමටත් ඉවහල් වනු ඇත.

තවද, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සමග වැඩ කරමින් අවදානම් ලේඛනය පිළියෙල කිරීම සමග spreadsheet පදනම් කරගත් අවදානම් ලේඛන ආකෘතිය අදියර වශයෙන් විධිමත් කිරීම සඳහා පහසුකම් සලසනු ලබයි. මෙම දෙපාර්තමේන්තු අවදානම් ලේඛනය යොදා ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් ගොනුව (risk profile) පිළියෙල කරන අතර එමගින් මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩි දියුණු වේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්, සිදුවීම් වාර්තා කරන පද්ධතිය ඔස්සේ වාර්තාවන සිද්ධීන් අධීක්ෂණය කිරීම තවදුරටත් සිදුකළ අතර, එමගින් කේන්ද්‍රගත සිදුවීම් දත්ත ගබඩාවක් ගොඩනැඟීම සහ අනුගමනය කළ නිවැරදි කිරීමේ ක්‍රියා පටිපාටියේ ප්‍රගතිය මැන බැලීම සිදු කරන ලදි. මෙම පද්ධතිය ඔස්සේ ලබා ගත් තොරතුරු ඇතිවිය හැකි අවදානම් ප්‍රවණතා හඳුනා ගැනීම, අවදානම් සහගත කලාප හඳුනා ගැනීම සහ අවදානම් අවම කිරීමේ පියවර වැඩි දියුණු කිරීම යන කරුණු සඳහා උපකාරී වේ.

48.1 ණය අවදානම

(අ) භූගෝලීය ප්‍රදේශ අනුව ණය සංකේන්ද්‍රණය

බැංකුවේ වර්ෂය අවසානයේ දී සැලකිය යුතු ණය සංකේන්ද්‍රණයන් භූගෝලීය ප්‍රදේශ අනුව (ආයතනයේ අයිතිකාරත්ව රටවල් පදනම් කරගෙන) පහත දැක්වේ.

	2021 රු. 000	2020 රු. 000
ශ්‍රී ලංකාව	**2,275,756,176**	1,009,892,263
ඇමෙරිකා එක්සත් ජනපදය	**130,712,211**	457,822,320
ජපානය	**9,457,390**	85,262,633
බ්‍රිතාන්‍යය	**1,008,405**	6,492,727
යුරෝපය	**1,582,664**	110,462,895
අධි ජාතික මූල්‍ය ආයතන	**190,963,416**	477,101,616
වෙනත්	**375,958,300**	170,825,331
මුළු මූල්‍ය වත්කම්	**2,985,438,562**	2,317,859,785

(ආ) ආයතනය අනුව ණය සංකේන්ද්‍රණය

බැංකුවේ වර්ෂය අවසානයට වන සැලකිය යුතු ණය සංකේන්ද්‍රණය වීම ආයතන වර්ගයන් අනුව පහත දැක්වේ.

	2021 රු. 000	2020 රු. 000
රජයන්	**2,014,470,178**	1,554,039,564
අධි ජාතික මූල්‍ය ආයතන	**227,180,460**	477,101,616
විදේශීය බැංකු සහ මූල්‍ය ආයතන	**15,187,326**	147,194,059
ශ්‍රී ලංකා බැංකු හා මූල්‍ය ආයතන	**718,635,801**	118,372,002
අනිකුත්	**9,964,797**	21,152,544
මුළු මූල්‍ය වත්කම්	**2,985,438,562**	2,317,859,785

(ඇ) ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම

ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් සහ ෆිච් රේටින්ග්ස් සමාගමට අනුව ණය ශ්‍රේණිගත කිරීම සිදුකළ බැංකුවේ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් නිකුතුකරුවන් පහත වගුවෙන් දැක්වේ. ස්ටැන්ඩර්ඩ් සහ පුවර්ස් සහ ෆිච් රේටින් සමාගමේ ශ්‍රේණිගත කිරීම් අනුව AAA සංකේතය ඉතා ඉහළම ශ්‍රේණිගත කිරීම හා අවම අපේක්ෂිත ණය අවදානම පෙන්නුම් කරන අතර, යම්කිසි ආයතනයකට පොළිය සහ මුල් මුදල් ගෙවීමට හැකි ශක්තිමත් තත්වයක් තිබෙන බව දක්වයි. AA සංකේතයෙන් ඉතා ඉහළ ශ්‍රේණිගත කිරීමක් හා ඉතා අඩු අපේක්ෂිත ණය අවදානමක් දැක්වෙන අතර, ශක්තිමත් තත්වයක් දක්වයි. A සංකේතයෙන් ඉහළ මධ්‍යම ශ්‍රේණියන් දක්වන අතර ශක්තිමත් තත්ත්වයක් හා ණය අවදානමේ පහළ තත්වයක් දක්වයි. BBB සංකේතයෙන් පහළ ම ආයෝජන ශ්‍රේණිගත කිරීම හා පහළ මට්ටමේ ණය අවදානමක් බවතින බව දක්වන අතර, ප්‍රමාණවත් ආරක්ෂක පරාමිති පෙන්නුම් කරයි. AAA සංකේතයට පහළ ශ්‍රේණි ප්‍රධාන ප්‍රභේදයන් අතර පවත්නා තත්ත්වය දැක්වීම පිණිස + හෝ - ලකුණු මගින් කාණ්ඩකරණය කළ හැකිය. ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් හා ෆිච් රේටින්ග් සමාගම් විසින් ණය ශ්‍රේණිගත නොකළ බව NR සංකේතයෙන් දැක්වේ.

ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම	ණය ශ්‍රේණිය	2021 රු. 000	%	2020 රු. 000	%
විදේශීය මූල්‍ය වත්කම්					
මුදල් හා මුදල් සමානයන්					
ෆෙඩරල් රිසර්ව් බැන්ක් - ඇ.එ.ජ./ රිසර්ව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා /බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරිග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසර්ව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ්/රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්දියා/පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා		**497,630,980**	**16.67%**	320,842,614	13.84%
	AAA	**4,009,562**	**0.13%**	17,985,741	0.78%
	AA-	**2,004,771**	**0.07%**	31,186,235	1.34%
	A+	**8,094,146**	**0.27%**	29,920,960	1.29%
	A	**-**	**0.00%**	2,789,210	0.12%
	A-	**768,180**	**0.03%**	140,847	0.01%
	BBB+	**-**	**0.00%**	172,614	0.01%
	BBB	**40,255**	**0.00%**	40,470	0.00%
	NR	**214,558**	**0.01%**	228,613	0.01%
		512,762,452	**17.18%**	403,307,304	17.40%
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්					
	AAA	**2,830,756**	**0.09%**	189,785,053	8.19%
	AA+	**5,987,488**	**0.20%**	437,986,572	18.90%
	AA	**-**	**0.00%**	15,360,081	0.66%
	AA-	**-**	**0.00%**	27,998,253	1.21%
	A+	**-**	**0.00%**	32,305,504	1.39%
		8,818,244	**0.29%**	703,435,463	30.35%
ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්					
	AAA	**-**	**0.00%**	30,034,475	1.29%
	AA+	**-**	**0.00%**	4,785,108	0.21%
	AA	**-**	**0.00%**	5,140,913	0.22%
	AA-	**-**	**0.00%**	603,827	0.03%
		-	**0.00%**	40,564,323	1.75%
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ					
	A	**55,853**	**0.00%**	-	0.00%
දේශීය ශ්‍රේණිගත කිරීම	AA+	**-**	**0.00%**	1,423,629	0.06%
	AA-	**34,088,798**	**1.14%**	1,360,976	0.06%
	A+	**19,788,494**	**0.67%**	46,825	0.00%
	A	**33,378**	**0.00%**	62,960	0.00%
	BBB-	**2**	**0.00%**	33	0.00%
	BB+	**56,311**	**0.00%**	65,189	0.01%
	NR	**-**	**0.00%**	410,741	0.02%
		54,022,836	**1.81%**	3,370,353	0.15%
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්		**188,045,837**	**6.30%**	158,958,185	6.86%
		188,045,837	**6.30%**	158,958,185	6.86%
අනෙකුත් ලැබිය යුතු දෑ	AAA	**-**	**0.00%**	1,702,247	0.07%
		-	**0.00%**	1,702,247	0.07%
මූළු විදේශීය මූල්‍ය වත්කම්		**763,649,369**	**25.58%**	1,311,337,875	56.58%

දේශීය මූල්‍ය වත්කම්					
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	CCC+	**1,377,820,347**	**46.15%**	714,531,527	30.83%
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත්	AA-	**557,856,718**	**18.69%**	-	0.00%
	A+	**-**	**0.00%**	318,048	0.01%
	A	**5,656,932**	**0.19%**	-	0.00%
	BBB-	**-**	**0.00%**	2,410,364	0.11%
	NR	**4,018,662**	**0.14%**	-	0.00%
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	CCC+	**150,128,800**	**5.03%**	153,061,900	6.60%
මූල්‍ය සහ අනෙකුත් ආයතනවල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	NR	**1,671,218**	**0.06%**	1,615,356	0.07%
බැංකු සඳහා ලබාදුන් ණය	AAA	**24,917**	**0.00%**	147,319	0.01%
	AA+	**-**	**0.00%**	61,475,682	2.65%
	AA-	**51,999,491**	**1.74%**	9,094,883	0.39%
	A+	**16,372,930**	**0.55%**	19,966,369	0.86%
	A	**9,977,843**	**0.33%**	13,458,641	0.58%
	A-	**-**	**0.00%**	937,978	0.05%
	BBB+	**6,201,554**	**0.21%**	105,757	0.00%
	BBB-	**2,933,926**	**0.10%**	3,092,924	0.13%
	BB+	**2,688,669**	**0.09%**	2,599,883	0.11%
	NR	**373,416**	**0.01%**	608,090	0.03%
අනෙකුත් වත්කම්	AAA	**325,579**	**0.01%**	137,785	0.00%
	AA+	**-**	**0.00%**	709,281	0.03%
	AA-	**5,699,123**	**0.19%**	-	0.00%
	A+	**727,308**	**0.02%**	190,126	0.01%
	A	**-**	**0.00%**	19,752	0.00%
	A-	**-**	**0.00%**	98,293	0.00%
	CCC+	**19,206,430**	**0.64%**	12,680,416	0.55%
	NR	**8,105,330**	**0.27%**	9,261,536	0.40%
මුළු දේශීය මූල්‍ය වත්කම්		**2,221,789,193**	**74.42%**	1,006,521,910	43.42%
මුළු මූල්‍ය වත්කම්		**2,985,438,562**	**100.00%**	2,317,859,785	100.00%

(ඇ) ප්‍රධාන ණය ශ්‍රේණිවල සාරාංශය	ණය ශ්‍රේණිය	2021 රු. 000	%	2020 රු. 000	%
විදේශීය මූල්‍ය වත්කම්					
ෆෙඩරල් රිසර්ව් බැන්ක් - ඇ.එ.ජ./රිසර්ව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා/බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉංග්ලන්ඩ්/ සෙවරීග්ස් රික්ස් බැන්ක්/ බැන්ක් ඔෆ් කැනඩා/රිසර්ව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ්/රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්දියා/පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා		**497,630,980**	**16.67%**	320,842,614	13.84%
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්		**188,045,837**	**6.30%**	158,958,185	6.86%
	AAA	**6,840,318**	**0.22%**	239,507,516	10.33%
	AA+/-	**7,992,259**	**0.27%**	523,060,989	22.57%
	A+/-	**8,918,179**	**0.30%**	65,156,521	2.81%
	BBB+/-	**40,255**	**0.00%**	213,084	0.01%
	NR	**214,558**	**0.01%**	228,613	0.01%
දේශීය ශ්‍රේණිගත කිරීම	AA+/-	**34,088,798**	**1.14%**	2,784,605	0.12%
	A+/-	**19,821,872**	**0.67%**	109,785	0.01%
	BBB+	**2**	**0.00%**	33	0.00%
	BB+	**56,311**	**0.00%**	65,189	0.00%
	NR	**-**	**0.00%**	410,741	0.02%
මුළු විදේශීය මූල්‍ය වත්කම්		**763,649,369**	**25.58%**	1,311,337,875	56.58%
දේශීය මූල්‍ය වත්කම්	AAA	**350,496**	**0.01%**	285,104	0.01%
	AA+/-	**615,555,332**	**20.62%**	71,279,846	3.07%
	A+/-	**32,735,013**	**1.09%**	34,989,207	1.51%
	BBB+/-	**9,135,480**	**0.31%**	5,609,045	0.24%
	BB+/-	**2,688,669**	**0.09%**	2,599,883	0.11%
	CCC+	**1,547,155,577**	**51.82%**	880,273,843	37.99%
	NR	**14,168,626**	**0.48%**	11,484,982	0.49%
මුළු දේශීය මූල්‍ය වත්කම්		**2,221,789,193**	**74.42%**	1,006,521,910	43.42%
මුළු මූල්‍ය වත්කම්		**2,985,438,562**	**100.00%**	2,317,859,785	100.00%

ඉ) ණය තත්ව විශ්ලේෂණය

ණය අවදානම් උපරිම නිරාවරණය ණය ශ්‍රේණිගත කිරීම අනුව දැක්වීම

ක්‍රමක්ෂය පිරිවැයට සහ අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් වල ණය තත්වය පහත වගුවෙන් දැක්වේ.

		අපේක්ෂිත ණය අලාභ සඳහා යටත් නොවන	මාස 12ක් සඳහා අපේක්ෂිත ණය අලාභ	ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභ		2021
			අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
		රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමානයන්						
ෆෙඩරල් රිසර්ව් බැන්ක් - ඇ.එ.ජ./රිසර්ව් බැන්ක් ඔෆ් ඔස්ට්‍රේලියා/බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/ බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරිග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසර්ව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ්/රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා/පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා		-	487,881,870	9,805,548	-	**497,687,418**
	AAA	-	4,009,618	-	-	**4,009,618**
	AA-	-	2,004,789	-	-	**2,004,789**
	A+	-	8,094,153	-	-	**8,094,153**
	A-	-	768,194	-	-	**768,194**
	BBB	-	40,261	-	-	**40,261**
	NR	-	-	243,387	-	**243,387**
දළ ධාරණ අගය		-	502,798,885	10,048,935	-	**512,847,820**
හානිකරණ අලාභ		-	(52,009)	(33,359)	-	**(85,368)**
ධාරණ අගය		-	502,746,876	10,015,576	-	**512,762,452**
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්						
	AAA	-	2,830,756	-	-	**2,830,756**
	AA+	-	5,987,488	-	-	**5,987,488**
		-	8,818,244	-	-	**8,818,244**
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	NR	-	188,045,840	-	-	**188,045,840**
දළ ධාරණ අගය		-	188,045,840	-	-	**188,045,840**
හානිකරණ අලාභ		-	(3)	-	-	**(3)**
ධාරණ අගය		-	188,045,837	-	-	**188,045,837**
දේශීය මූල්‍ය වත්කම්						
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	රජයේ සුරැකුම්පත් (අවදානම් රහිත ආයෝජන)	1,377,820,347	-	-	-	**1,377,820,347**
		1,377,820,347	-	-	-	**1,377,820,347**
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්	අනෙකුත් අවදානම් රහිත ආයෝජන	567,532,312	-	-	-	**567,532,312**
		567,532,312	-	-	-	**567,532,312**
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	රජයෙන් ලැබිය යුතු දෑ (අවදානම් රහිත ආයෝජන)	150,128,800	-	-	-	**150,128,800**
		150,128,800	-	-	-	**150,128,800**
බැංකු සඳහා දෙන ලද ණය	AAA	-	24,917	-	-	**24,917**
	AA-	-	46,591,702	5,408,477	-	**52,000,179**
	A+	-	16,374,633	-	-	**16,374,633**
	A	-	9,979,661	-	-	**9,979,661**
	BBB+	-	6,205,432	-	-	**6,205,432**
	BBB-	-	2,939,496	-	-	**2,939,496**

	BB+	-	390,018	2,320,747	-	**2,710,765**
	NR	-	373,575	-	-	**373,575**
	ශ්‍රී.ලං.මි.බැ. ණය ඇපකර යෝජනා ක්‍රමය	-	-	-	13,016	**13,016**
දළ ධාරණ අගය		-	82,879,434	7,729,224	13,016	**90,621,674**
හානිකරන අලාභ		-	(14,435)	(21,477)	(13,016)	**(48,928)**
ධාරණ අගය		-	82,864,999	7,707,747	-	**90,572,746**
අනෙකුත් වත්කම්	රජයේ සුරැකුම්පත් (අවදානම් රහිත ආයෝජන)	15,118,446	-	-	-	**15,118,446**
	රජයෙන් ලැබිය යුතු දෑ (අවදානම් රහිත ආයෝජන)	4,087,983	-	-	-	**4,087,983**
	අනෙකුත් අවදානම් රහිත ලැබිය යුතු දෑ	8,105,330	-	-	-	**8,105,330**
දේශීය ශ්‍රේණිගත කිරීම	AAA	-	325,580	-	-	**325,580**
	AA-	-	5,681,858	17,393	-	**5,699,251**
	A+	-	600,404	127,206	-	**727,610**
	NR	-	-	-	2,226,887	**2,226,887**
දළ ධාරණ අගය		27,311,759	6,607,842	144,599	2,226,887	**36,291,087**
හානිකරන අලාභ		-	(189)	(241)	(2,226,887)	**(2,227,317)**
ධාරණ අගය		27,311,759	6,607,653	144,358	-	**34,063,770**

2020 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක අගයන් පහත පරිදි වේ.

		අපේක්ෂිත ණය අලාභ සඳහා යටත් නොවන	මාස 12ක් සඳහා අපේක්ෂිත ණය අලාභ	ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභ		2020
			අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
		රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමානයන්						
ෆෙඩරල් රිසර්ව් බැන්ක් - ඇ.එ.ජ./රිසර්ව් බැන්ක් ඔෆ් ඔස්ට්‍රේලියා/බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙටිල්මන්ට්ස්/ බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරිග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසර්ව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ්/රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා/පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා		-	229,314,631	91,779,044	-	321,093,675
	AAA	-	17,985,875	-	-	17,985,875
	AA-	-	31,190,936	-	-	31,190,936
	A+	-	29,928,070	-	-	29,928,070
	A	-	2,796,148	-	-	2,796,148
	A-	-	-	140,916	-	140,916
	BBB+	-	172,614	-	-	172,614
	BBB	-	766	39,977	-	40,743
	NR	-	228,665	-	-	228,665
දළ ධාරණ අගය		-	311,617,705	91,959,937	-	403,577,642
හානිකරණ අලාභ		-	(90,277)	(180,061)	-	(270,338)
ධාරණ අගය		-	311,527,428	91,779,876	-	403,307,304
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්						
	AAA	-	142,264,212	47,520,841	-	189,785,053
	AA+	-	49,760,356	388,226,216	-	437,986,572
	AA	-	1,118,782	14,241,299	-	15,360,081
	AA-	-	6,112,997	21,885,256	-	27,998,253
	A+	-	27,284,633	5,020,871	-	32,305,504
		-	226,540,980	476,894,483	-	703,435,463

ජා.මු.අ. සම්බන්ධ වත්කම්	NR	-	158,958,187	-	-	158,958,187
දළ ධාරණ අගය		-	158,958,187	-	-	158,958,187
හානිකරණ අලාභ		-	(2)	-	-	(2)
ධාරණ අගය		-	158,958,185	-	-	158,958,185
දේශීය මූල්‍ය වත්කම්						
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	රජයේ සුරැකුම්පත් (අවදානම් රහිත ආයෝජන)	714,531,527	-	-	-	714,531,527
		714,531,527	-	-	-	714,531,527
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්	අනෙකුත් අවදානම් රහිත ආයෝජන	2,728,412	-	-	-	2,728,412
		2,728,412	-	-	-	2,728,412
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	රජයෙන් ලැබිය යුතු (අවදානම් රහිත ආයෝජන)	153,061,900	-	-	-	153,061,900
		153,061,900	-	-	-	153,061,900
බැංකු සඳහා දෙන ලද ණය						
	AAA	-	147,319	-	-	147,319
	AA+	-	61,475,776	-	-	61,475,776
	AA-	-	9,094,989	-	-	9,094,989
	A+	-	19,967,361	-	-	19,967,361
	A	-	13,459,930	-	-	13,459,930
	A-	-	938,151	-	-	938,151
	BBB+	-	94,935	10,864	-	105,799
	BBB-	-	3,096,013	-	-	3,096,013
	BB+	-	-	2,612,025	-	2,612,025
	NR	-	608,531	136,000	-	744,531
දළ ධාරණ අගය		-	108,883,005	2,758,889	-	111,641,894
හානිකරණ අලාභ		-	(6,215)	(148,153)	-	(154,368)
ධාරණ අගය		-	108,876,790	2,610,736	-	111,487,526
අනෙකුත් වත්කම්						
	රජයේ සුරැකුම්පත් (අවදානම් රහිත ආයෝජන)	12,082,642	-	-	-	12,082,642
	රජයෙන් ලැබිය යුතු දෑ (අවදානම් රහිත ආයෝජන)	597,774	-	-	-	597,774
	අනෙකුත් අවදානම් රහිත ලැබිය යුතු දෑ	9,259,535	-	-	-	9,259,535
දේශීය ශ්‍රේණිගත කිරීම	AAA	-	137,785	-	-	137,785
	AA+	-	709,287	-	-	709,287
	A+	-	190,146	-	-	190,146
	A	-	19,756	-	-	19,756
	A-	-	98,311	-	-	98,311
	NR	-	-	81,525	183,276	264,801
දළ ධාරණ අගය		21,939,951	1,155,285	81,525	183,276	23,360,037
හානිකරන අලාභ		-	(48)	(79,524)	(183,276)	(262,848)
ධාරණ අගය		21,939,951	1,155,237	2,001	-	23,097,189

(ඊ) ණය අනාවරණයෙහි විචලනය - අපේක්ෂිත ණය අලාභයේ අදියර අනුව

මූල්‍ය උපකරණ වර්ග මගින් හානිකරණය සඳහා වෙන් කිරීම ආරම්භක ශේෂයේ සිට අවසාන ශේෂය දක්වා සැසඳුමක් ලෙස පහත සටහන මගින් ඉදිරිපත්කර ඇත.

	2021				2020			
	අදියර 1 රු. 000	අදියර 2 රු. 000	අදියර 3 රු. 000	එකතුව රු. 000	අදියර 1 රු. 000	අදියර 2 රු. 000	අදියර 3 රු. 000	එකතුව රු. 000
මුදල් හා මුදල් සමානයන්								
ජනවාරි 1 දිනට ශේෂය	90,277	180,061	-	270,338	219,331	2,627	-	221,958
අදියර 01ට මාරු කිරීම	1,164	(1,164)	-	-	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	(52)	52	-	-	(182,822)	182,822	-	-
අදියර 03ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	(39,380)	(145,590)	-	(184,970)	53,768	(5,388)	-	48,380
දෙසැම්බර් 31 දිනට ශේෂය	52,009	33,359	-	85,368	90,277	180,061	-	270,338
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්								
ජනවාරි 1 දිනට ශේෂය	36,546	2,062,175	-	2,098,721	81,259	19,635	-	100,894
අදියර 01ට මාරු කිරීම	-	-	-	-	6,380	(6,380)	-	-
අදියර 02ට මාරු කිරීම	-	-	-	-	(24,507)	24,507	-	-
අදියර 03ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	(35,551)	(2,062,175)	-	(2,097,726)	(26,586)	2,024,413	-	1,997,827
දෙසැම්බර් 31 දිනට ශේෂය	995	-	-	995	36,546	2,062,175	-	2,098,721
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්								
ජනවාරි 1 දිනට ශේෂය	2	-	-	2	4	-	-	4
අදියර 01ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	1	-	-	1	(2)	-	-	(2)
දෙසැම්බර් 31 දිනට ශේෂය	3	-	-	3	2	-	-	2
බැංකු සඳහා ලබාදුන් ණය								
ජනවාරි 1 දිනට ශේෂය	6,215	148,153	-	154,368	-	35	-	35
අදියර 01ට මාරු කිරීම	140,773	(140,773)	-	-	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	(37)	37	-	-	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	(132,516)	14,060	-	(118,456)	6,215	148,118	-	154,333
දෙසැම්බර් 31 දිනට ශේෂය	14,435	21,477	-	35,912	6,215	148,153	-	154,368
ණය ඇපකර යටතේ ගෙවන ලද මුදල්								
ජනවාරි 1 දිනට ශේෂය	-	-	-	-	-	-	-	-
අදියර 01ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	-	-	13,016	13,016	-	-	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	13,016	13,016	-	-	-	-
අනෙකුත් වත්කම්								
ජනවාරි 1 දිනට ශේෂය	48	79,524	183,276	262,848	15,618	15	175,275	190,908
අදියර 01ට මාරු කිරීම	-	-	-	-	15	(15)	-	-
අදියර 02ට මාරු කිරීම	(1)	1	-	-	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	142	(79,284)	2,043,611	1,964,469	(15,585)	79,524	8,001	71,940
දෙසැම්බර් 31 දිනට ශේෂය	189	241	2,226,887	2,227, 317	48	79,524	183,276	262,848
ණය ඇපකර								
ජනවාරි 1 දිනට ශේෂය	-	-	-	-	-	-	-	-
අදියර 01ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	-	-	-	-	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	1,011,732	-	-	1,011,732	-	-	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	1,011,732		-	1,011,732	-	-	-	-

(උ) රඳවාගත් ඇපකර සහ වෙනත් ණය වැඩිදියුණු කිරීම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි සමහරක් ණය අනාවරණයන්ට එරෙහිව ඇපකර සහ වෙනත් ණය වැඩිදියුණු කිරීම් රඳවාගෙන තිබේ. විවිධ මූල්‍ය වත්කම්වලට එරෙහිව රඳවාගත් ප්‍රධාන ඇපකර පිළිබඳව පහත සටහනින් දැක්වේ.

ණය අනාවරණයේ ආකාරය

	ඇපකරයක අවශ්‍යතාවයට යටත්වන අනාවරණයේ ප්‍රතිශතය		
	2021	**2020**	**රඳවාගත් ප්‍රධාන ඇපකරය/ඇපකරයන්**
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්	100	100	අලෙවිකල හැකි රජයේ සුරැකුම්පත්
බැංකු සඳහා ලබාදුන් ණය			
ඉදිකිරීම් අංශය සඳහා ද්‍රවශීලතා පහසුකම්	-	100	අලෙවිකල හැකි රජයේ සුරැකුම්පත්
සෞභාග්‍යා කෝවිඩ්-19 පුනරුද පහසුකම්	100	100	අලෙවිකල හැකි රජයේ සුරැකුම්පත් සහ ලැබිය යුතු ණය
සෞභාග්‍යා ණය පහසුකම	100	-	ලබාදුන් ණය
උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන	100	-	ලබාදුන් ණය

(ඌ) අපේක්ෂිත ණය අලාභයේ සිදුවූ සැළකිය යුතු වෙනස්වීම්

සලකා බැලූ කාලපරිච්ඡේදය තුළදී, මූල්‍ය උපකරණ වල දළ ධාරණ අගයේ සිදුවූ සැළකිය යුතු වෙනස්වීම්, හානිකරණ අගයේ වෙනස්වීමට දායකවූ ආකාරය පහත සටහන් මගින් විස්තරාත්මකව දක්වා ඇත.

	2021 බලපෑම: වැඩිවීම /(අඩුවීම)		
	අදියර 01	අදියර 02	අදියර 03
	රු. 000	රු. 000	රු. 000
මුදල් සහ මුදල් සමානයන්	(38,267)	(146,702)	-
වැඩිදියුණු වූ ණය ශ්‍රේණියක් සහිත ප්‍රතිපාර්ශවයන් සමඟ මුදල් ශේෂයේ වැඩිවීම			
අනෙකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	(35,551)	(2,062,174)	-
වර්ෂය තුළදී ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹෙන් කොටසක් බැහැර කිරීම			
බැංකු සඳහා ලබාදුන් ණය			
- **මෙතෙක් පැවති ශේෂයන්**			
වර්ෂය තුළදී ගෙවන ලද ණය හේතුවෙන් අඩුවී ඇත.	-	(140,425)	-
බැංකු වලට ගෙවන ලද ණය ඇපකර හිමිකම් හේතුවෙන් වැඩිවී ඇත.	-	-	13,016
- **අවශෝෂණය කරන ලද ශේෂයන්**			
ප්‍රා.සං.දෙ. යටතේ තිබූ ණය ශේෂයන් ශ්‍රී.ලං.ම. බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වලට අවශෝෂණය කිරීම නිසා වැඩිවී ඇත.	4,555	13,749	-
අභ්‍යන්තර අරමුදල්			
- **මෙතෙක් පැවති ශේෂයන්**			
ශ්‍රේණිගත නොකළ ප්‍රතිපාර්ශවයන් සමඟ සිදුවූ අවම අනාවරණය නිසා අඩුවී ඇත.	-	(79,282)	-
- **අවශෝෂණය කරන ලද ශේෂයන්**			
ප්‍රා.සං.දෙ. යටතේ තිබූ ආයෝජන ශේෂයන් ශ්‍රී.ලං.ම. බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වලට අවශෝෂණය කිරීම නිසා වැඩිවී ඇත.	151	-	-
ණය ඇපකර			
අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, උප ණය ගැනුම්කරුවන්ගේ අක්‍රිය ණය අනුපාතයන් සලකා බැලීම නිසා වැඩි වී ඇත.	1,011,732	-	-
	942,620	(2,414,834)	13,016

	2020 බලපෑම: වැඩිවීම /(අඩුවීම)		
	අදියර 01	අදියර 02	අදියර 03
	රු. 000	රු. 000	රු. 000
අනෙකුත් විස්තීරණ ආදායම මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත්			
කොවිඩ් - 19 බලපෑම නිසා මෙම අනාවරණය සැළකිය යුතු ලෙස අවම ණය තත්වයක් යටතේ සුළු වශයෙන් අඩු වී ඇත.	-	2,042,540	-
බැංකු සඳහා ලබාදුන් ණය			
නව ණය පහසුකම් ලබාදීම නිසා මෙම අනාවරණය වැඩිවී ඇත.	-	148,119	-
අභ්‍යන්තර අරමුදල්			
ශ්‍රේණිගත නොකළ ප්‍රතිපාර්ශවයන් සමඟ අනාවරණය ඉහළ ගොස් ඇත.	-	79,508	-
	-	2,270,166	-

(එ) **ක්‍රමක්ෂය පිරිවැයට ණය හානිකරණය කරන ලද වත්කම් වල දළ ධාරණ අගයේ වෙනස්වීම**
ක්‍රමක්ෂය පිරිවැයට ණය හානිකරණය කරන ලද වත්කම් වල දළ ධාරණ අගයේ වෙනස්වීම සංසන්දනාත්මකව පහත සටහනෙන් දැක්වේ.

	2021 රු. 000	2020 රු. 000
ජනවාරි 01 දිනට ක්‍රමක්ෂය පිරිවැයට ණය හානිකරණය කරන ලද වත්කම්	-	-
වසර තුළදී ණය හානිකරණ වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද ප්‍රමාණය	**13, 016**	183,277
ප්‍රා.සං.දෙ. යටතේ තිබූ වත්කම් අවශෝෂණයේ දී අවශෝෂණය කරගත් ණය හානිකරණ වත්කම්	**2,043,610**	-
අපේක්ෂිත ණය අලාභ දීමනාවේ වෙනස	**(2,056,626)**	(183,277)
දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය පිරිවැයට ණය හානිකරණය කරන ලද වත්කම්	-	-

(ඒ) **ණය අවදානම් සඳහා කොවිඩ් - 19 හි බලපෑම**
අපේක්ෂිත ණය අලාභ ගණනයේ දී යොදාගන්නා බර තබන ලද පැහැර හැරීමේ සම්භාවිතාව ගණනය කිරීමේදී, බැංකුව විසින්, කොවිඩ්-19 න් ඇති වූ බලපෑම වඩාත් හොඳින් පෙන්වීම සඳහා වඩාත්ම අවාසි සහගත තත්ත්වයට වැඩි බර තැබීමක් සිදුකරන ලදී.

48.2 පොළී අනුපාතික අවදානම

(අ) විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය

පොළී අනුපාත අවදානම යනු පොළී අනුපාතයේ වෙනස්වීම නිසා ඇතිවන පාඩු විඳීමේ අවදානමයි.

සංචිත කළමණාකරන සහ උපදේශක වැඩසටහනෙහි (RAMP) ආයෝජන හැර අනෙකුත් ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි පොළී අනුපාත සංවේදීතාවය, පොළී අනුපාතය පදනම් අංක 10 කින් වෙනස්වීමෙන් විය හැකි ලාභය/ පාඩුව මගින් මනිනු ලැබේ. සංචිත කළමනාකරණය සහ උපදේශක වැඩසටහනෙහි පොළී අනුපාත සංවේදීතාවය, පොළී අනුපාතය පදනම් අංක 1 කින් වෙනස්වීමේදී සිදුවිය හැකි ලාභය හෝ පාඩුව මගින් මනිනු ලැබේ. බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් ආයෝජන කළඹෙහි අවදානම් නිරාවරණ සංවේදීතාවය පහත දැක්වේ.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ	විය හැකි පාඩුව (ඇ.එ.ජ. ඩොලර් මිලියන)	
	2021	2020
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන	**0.16**	7.94
RAMP	-	0.03

අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ වත්කම් ආයෝජන කළඹෙහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීම සඳහා පහත දැක්වෙන උපාය මාර්ගයන් අනුගමනය කරනු ලැබේ.

(i) පොළී අනුපාත වෙනස්වීම මත විදේශ වත්කම් ආයෝජන කළඹට ඇතිවන බලපෑම පොළී අනුපාත සංවේදීතාවය මගින් මනිනු ලබන අතරම පොළී අනුපාතය මෙන්ම ආයෝජනයේ කාල සීමාව සැලකිල්ලට ගනු ලබන විකරිත කාලච්ඡේදය පොළී අනුපාත අවදානම මැනීම සඳහා බැංකුව විසින් යොදා ගනු ලැබේ. විකරිත කාලච්ඡේදය මගින් 1% ක පොළී අනුපාත (ඵලදාව) වෙනස්වීම් මත සුරැකුම්පත්වල මිල වෙනස්වීම් මනිනු ලැබේ. ඉහළ විකරිත කාලච්ඡේදයක් මගින් ඉහළ අවදානමක් පෙන්නුම් කෙරේ. එමනිසා මූල්‍ය වෙළෙඳපොලවල් තුළ ඇති වන සංවර්ධනයන්, ආයෝජන කළඹේ ඇති සංලක්ෂණයන් හා බැඳුම්කර ආයෝජන කළඹේ ඇති අවදානම් අභිරුචිය යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව මහ බැංකුව විසින් උචිත විකරිත කාලච්ඡේදයන් කලින් කලට සකස් කරනු ලැබේ. විදේශ වත්කම් ආයෝජන කළඹේ විකරිත කාලච්ඡේදය පහත ආකාර වේ.

ආයෝජන බණ්ඩය	විකරිත කාලච්ඡේදය	
	2021	2020
ප්‍රාග්ධන වෙළෙඳපොළ (ස්ථාවර ආදායම් සුරැකුම්පත්)	**3.69**	2.11
RAMP	-	1.46

(ii) විකරිත කාලච්ඡේදය මගින් විශාල වශයෙන් වන මිල වෙනස්වීම් ගණනය නොවන නිසා, විදේශ සංචිත ආයෝජන කළඹේ පොළී අනුපාත අවදානම මැනීම සඳහා භාවිතා කරන තවත් මිනුමක් ලෙස උත්තලතාවය (convexity) දැක්විය හැකිය. උත්තලතාවය මගින් බැඳුම්කර මිල ඵලදා වක්‍රය සරල රේඛීය සඵල කාල පරිච්ඡේදයට සාපේක්ෂව වෙනස්වීම මනිනු ලබයි. මෙමගින් ස්ථාවර සුරැකුම්පත් මිල, පොළී අනුපාතයට දක්වන සංවේදීතාවය තවදුරටත් නියමිත අගයට ආසන්න කිරීමට ඉඩකඩ ලබාදේ. කාලච්ඡේදයේ වෙනස සඳහා ඵලදා අනුපාතයේ වෙනස උත්තලතාවයයි. ඉන් විකරිත කාලච්ඡේදයේ පුරෝකතනය කළ දෝෂය මනිනු ලබයි. මෙය ඵලදා අනුපාතය සම්බන්ධයෙන් සුරැකුම්පත්වල මිලෙහි දෙවන අවකලනයයි.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹේ උත්තලතාවය

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ	විය හැකි පාඩුව (ඇ.එ.ජ.ඩොලර් මිලියන)	
	2021	2020
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන	**0.18**	0.08
RAMP	-	0.04

(iii) අවදානම් වටිනාකම **(Value at Risk)**

සාමාන්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ මූල්‍ය වෙළෙඳපොළ චලනයන් මගින් ආයෝජන කළඹක අයහපත් දිසාවට අවදානම තනි අගයකට සාරාංශ කිරීමක් අවදානම් වටිනාකම මගින් සිදුකරයි. එම නිසා අවදානම් වටිනාකම ඉලක්ක කාල සීමාව පුරාවට වන උපරිම අලාභය වන අතර එහි දී සත්‍ය අලාභය ඉහළ වීමේ සම්භාවිතාව පහළ හා කලින් සඳහන් මට්ටමේ විය හැක. අවදානම් වටිනාකම මගින්, අවදානම සහ තත්ත්වය හරහා සමාහාරය කළ හැකි මුදලින් ප්‍රකාශ කරනු ලබන සංඛ්‍යාවක් ලබා දේ.

සංචිත කළමනාකරණ සහ උපදේශක වැඩසටහනෙහි (RAMP) ආයෝජන හැර අනෙකුත් ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි අවදානම් වටිනාකම, 99% ක විශ්‍රම්භ ප්‍රාන්තරයක් හා දින 10 ක කාල සීමාවක් උපයෝගී කරගනිමින් මොන්ටෙ කාර්ලෝ (Monte Carlo) ක්‍රමය ඔස්සේ තක්සේරු කරනු ලබන අතර, RAMP ආයෝජනවල අවදානම් වටිනාකම 99% ක විශ්‍රම්භ ප්‍රාන්තරයක් හා මාසයක කාල සීමාවක් උපයෝගී කරගෙන තක්සේරු කරනු ලැබේ.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ	අවදානම් වටිනාකම	
	2021	2020
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන	**0.48**	26.72
RAMP	-	1.04

(iv) වෙළෙඳ හා විවෘත තත්ත්වයන් **(Open Positions)** හි සීමා

බැංකුව විසින් අන්තර් දින කටයුතු සඳහා නිශ්චිත ගණුදෙනුකරු සීමා (Specific Dealer Limit) ද එක්දින තත්ත්ව සීමා (Overnight Position Limit) ද බැංකුවේ ගණුදෙනුකරුවන් (Dealers) සඳහා පනවනු ලබයි.

විදේශීය සංචිත කළමනාකරණ කමිටුවට අඛණ්ඩ ව වාර්තා කිරීම පිණිස පොළී අනුපාතික අවදානම, සංචිත කළමනාකරණය හා උපදේශක වැඩසටහනෙහි ආයෝජනවලට අදාළව මනිනු ලැබේ.

(ආ) දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේශීය භාණ්ඩාගාර බිල්පත් කළඹ, ජා.මු.වා.ප්‍ර. 9 යෙහි ඇති ව්‍යාපාරික ආකෘතික තක්සේරුව පරිදි අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට, මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි වාර්තා කරනු ලබයි. බැංකුව පොළී ආදායම ඉපැයීම අරමුණු කර නොගෙන රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සිදු කරන හෙයින් රජයේ සුරැකුම්පත් කළඹ, ආයෝජන කළඹක් ලෙස නොසැලකේ. බැංකුවේ මූලික අරමුණුවලින් එකක් වන, ආර්ථික හා මිල ස්ථායිතාවය රැකීම සම්බන්ධ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය වෙළෙඳපොළට ද්‍රවශීලතාවය විදීමට හෝ දේශීය වෙළෙඳපොළින් ද්‍රවශීලතාවය උකහා ගැනීමට බැංකුව රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම හෝ විකිණීම සිදු කරනු ලබයි. එහෙයින් බැංකු ආයෝජන කළඹෙහි රජයේ සුරැකුම්පත්වල ප්‍රමාණය, එහි මූල්‍ය ප්‍රතිපත්තිය විසින් තීරණය කරනු ලැබේ. ඊට අමතරව, රුපියල් වෙළෙඳපොළේ මූලික පොළී අනුපාත එනම්, ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතය හා ප්‍රතිවිකුණුම් අනුපාත, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබයි. වැඩිදුරටත්, රුපියල් ද්‍රවශීලතාවය විදීම් හෝ වෙළෙඳපොළින් රුපියල් ද්‍රවශීලතාවය උකහා ගැනීම් සඳහා වූ බැංකුවේ ක්‍රියාමාර්ග පොදු රුපියල් වෙළෙඳපොළේ පොළී අනුපාතයන් කෙරෙහි බලපානු ලබයි. ඒ අනුව රජයේ සුරැකුම්පත් කළඹ මගින් උද්ගත වන පොළී ආදායමේ වෙනස්වීම් කෙරෙහි ආයෝජන තීරණවලට වඩා බැංකුවෙහි රජයේ සුරැකුම්පත් කළඹෙහි ප්‍රමාණය මෙන් ම මූලික වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බලපානු ලබයි. එම නිසා බැංකුව දේශීය මූල්‍ය වත්කම්වල පොළියේ වන සංවේදීතාවය ගැන නොසලකනු ලැබේ.

(ඇ) වත්කම් සහ වගකීම් කල් පිරීම හෝ ප්‍රතිමිල කිරීම පහත සඳහන් කාලච්ඡේදවලදී සිදුවේ.

විදේශ මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය:	හරිත සාමාන්‍ය පොළී අනුපාතය	2021 එකතුව	හය මසක් හෝ අඩු	මාස 6 සිට 12 දක්වා	වර්ෂ 1 සිට 2 දක්වා	වර්ෂ 2 සිට 5 දක්වා	වර්ෂ 5 ට වැඩි
	%	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	0.3942	**512,762,452**	512,762,452	-	-	-	-
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	1.0799	**8,818,244**	44,216	-	2,798,126	5,975,902	-
ජා. මූ. අ. සම්බන්ධ වත්කම්	0.0770	**38,244,608**	38,244,608	-	-	-	-
මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්		**559,825,304**	551,051,276	-	2,798,126	5,975,902	-
පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්							
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්		**149,801,229**	549	-	-	216,785	149,583,895
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		**54,022,836**	396,731	981,508	1, 980,676	33, 823,817	16,840,104
මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්		**203,824,065**	397,280	981,508	1, 980,676	34,040,602	166,423,999
මුළු විදේශීය මූල්‍ය වත්කම්		**763,649,369**	551,448,556	981,508	4,778,802	40,016,504	166,423,999
විදේශ මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය:							
පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්							
ජා.මූ.අ.	1.0770	**253,476,994**	12,582,348	16,744,203	-	200,569,216	23,581,227
ආසියානු නිශ්කාෂණ සංගමය	0.0900	**104,764,616**	104,764,616	-	-	-	-
මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්		**358,241,610**	117,346,964	16,744,203	-	200,569,216	23,581,227
පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්							
බැංකු හා මූල්‍ය ආයතන		**13,701**	13,701	-	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		**1,139,323**	909,548	229,775	-	-	-
ජා.මූ.අ.		**416,588,249**	-	-	-	-	416,588,249
අනෙකුත් විදේශ වගකීම්		**357,295,676**	40,161,167	317, 134, 509	-	-	-
මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්		**775,036,949**	41,084,416	317,364, 284	-	-	416,,588,249
මුළු විදේශීය මූල්‍ය වගකීම්		**1,133,278,559**	158,431,380	334,108,487	-	200,569,216	440,169,476
විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය		**201,583,694**	433,704,312	(16,744,203)	2,798,126	(194,593,314)	(23,581,227)
දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය :							
පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්							
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	5.1119	**1,377,820,347**	1,018,529,204	336,001,028	482,143	22,807,972	-
ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	7.2022	**567,532,312**	567,532,312	-	-	-	-
බැංකුවලට දෙන ලද ණය	1.0007	**90,572,746**	70,896,466	18,461,922	1,206,709	7,649	-
අනිකුත් වත්කම් - සේවක ණය	3.3012	**8,073,335**	437,218	263,936	539,529	1,723,015	5,109,637
- අනෙකුත්	9.9582	**21,870,406**	6,509,990	488,099	3,196,792	5,483,148	6,192,377
මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්		**2,065,869,146**	1,663,905,190	355,214,985	5,425,173	30,021,784	11,302,014
පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්							
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්		**150,128,800**	150,128,800	-	-	-	-
අනෙකුත් වත්කම් - අනෙකුත්		**4,120,029**	4,120,029	-	-	-	-

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ප්‍රාග්ධන ආයෝජන		**1,671,218**	-	-	-	-	1,671,218
මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්		**155,920,047**	154,248,829	-	-	-	1,671,218
මූළු දේශීය මූල්‍ය වත්කම්		**2,221,789,193**	1,818,154,019	355,214,985	5,425,173	30,021,784	12,973,232
පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්							
නිත්‍ය තැන්පතු පහසුකම	5.0000	**101,062,880**	101,062,880	-	-	-	-
මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්		**101,062,880**	101,062,880	-	-	-	-
පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්							
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු		**300,704,162**	300,704,162	-	-	-	-
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු		**1, 392,301**	1, 392,301	-	-	-	-
සංසරණයේ පවතින මුදල්		**1,005,099,066**	1,005,099,066	-	-	-	-
අනිකුත් ගෙවිය යුතු දෑ		**19,163,882**	19,163,882	-	-	-	-
මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්		**1,326,359,411**	1,326,359,411	-	-	-	-
මුළු දේශීය මූල්‍ය වගකීම්		**1,427,422,291**	1,427,422,291	-	-	-	-
දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය		**1,964,806,266**	1,562,842,310	355,214,985	5,425,173	30,021,784	11,302,014

2020 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පහත පරිදි වේ.

විදේශ මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය:	**භරිත සාමාන්‍ය පොළී අනුපාතය %**	**2020 එකතුව**	**හය මසක් හෝ අඩු**	**මාස 6 සිට 12 දක්වා**	**වර්ෂ 1 සිට 2 දක්වා**	**වර්ෂ 2 සිට 5 දක්වා**	**වර්ෂ 5 ට වැඩි**
		රු. 000	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**
පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	0.1097	403,307,304	403,307,304	-	-	-	-
ලාභ/අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	1.6238	40,564,323	40,564,323	-	-	-	-
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	0.3192	703,435,463	70,627,159	85,620,480	201,448,022	340,760,944	4,978,858
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	0.0800	13,538,182	13,538,182	-	-	-	-
මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්		1,160,845,272	528,036,968	85,620,480	201,448,022	340,760,944	4,978,858
පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්							
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්		145,420,003	911	-	-	208,077	145,211,015
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		3,370,353	3,370,353	-	-	-	-
අනෙකුත් ලැබිය යුතු දෑ		1,702,247	1,702,247	-	-	-	-
මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්		150,492,603	5,073,511	-	-	208,077	145,211,015
මූළු විදේශීය මූල්‍ය වත්කම්		1,311,337,875	533,110,479	85,620,480	201,448,022	340,969,021	150,189,873
පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්							
ජා.මූ.අ.	1.0800	256,873,113	5,447,583	5,447,583	-	190,723,378	55,254,569
ආසියානු නිශ්කාෂණ සංගමය	0.1500	63,864,652	63,864,652	-	-	-	-
මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්		320,737,765	69,312,235	5,447,583	-	190,723,378	55,254,569
පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්							
බැංකු සහ මූල්‍ය ආයතන		208,337,221	208,337,221	-	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		574,182	574,182	-	-	-	-
ජා.මූ.අ.		253,052,165	-	-	-	-	253,052,165
අනෙකුත් විදේශීය වගකීම්		74,870,325	74,870,325	-	-	-	-
මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්		536,833,893	283,781,728	-	-	-	253,052,165
මුළු විදේශීය මූල්‍ය වගකීම්		857,571,658	353,093,963	5,447,583	-	190,723,378	308,306,734
විදේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය		840,107,507	458,724,733	80,172,897	201,448,022	150,037,566	(50,275,711)

දේශීය මුදල් පොලී අනුපාත සංවේදිතා අන්තරය :	හරිත සාමාන්‍ය පොලී අනුපාතය	2020 එකතුව	හය මසක් හෝ අඩු	මාස 6 සිට 12 දක්වා	වර්ෂ 1 සිට 2 දක්වා	වර්ෂ 2 සිට 5 දක්වා	වර්ෂ 5 ට වැඩි
	%	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
පොලී සංවේදී දේශීය මූල්‍ය වත්කම්							
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	7.6560	714,531,527	294,107,401	391,555,731	3,319,009	25,188,854	360,532
ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිළදී ගත් සුරැකුම්පත්	5.5000	2,728,412	2,728,412	-	-	-	-
බැංකුවලට දෙන ලද ණය	1.0001	111,487,525	95,631,866	7,783,932	8,067,216	4,511	-
අනිකුත් වත්කම් - සේවක ණය	3.3375	7,793,272	228,390	184,529	379,014	1,221,587	5,779,752
- අනෙකුත්	9.8666	13,056,605	2,078,654	163,050	319,407	4,460,297	6,035,197
මුළු පොලී සංවේදී දේශීය මූල්‍ය වත්කම්		849,597,341	394,774,723	399,687,242	12,084,646	30,875,249	12,175,481
පොලී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්							
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්		153,061,900	153,061,900	-	-	-	-
අනෙකුත් වත්කම් - අනෙකුත්		2,247,313	2,247,313	-	-	-	-
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති ප්‍රාග්ධන ආයෝජන		1,615,356	-	-	-	-	1,615,356
මුළු පොලී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්		156,924,569	155,309,213	-	-	-	1,615,356
මූළු දේශීය මූල්‍ය වත්කම්		1,006,521,910	550,083,936	399,687,242	12,084,646	30,875,249	13,790,837
පොලී සංවේදී දේශීය මූල්‍ය වගකීම්							
නිත්‍ය තැන්පතු පහසුකම්	4.5000	209,507,898	209,507,898	-	-	-	-
මුළු පොලී සංවේදී දේශීය මූල්‍ය වගකීම්		209,507,898	209,507,898	-	-	-	-
පොලී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්							
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු		129,601,521	129,601,521	-	-	-	-
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු		1,460,512	1,460,512	-	-	-	-
සංසරණයෙහි පවතින මුදල්		834,807,859	834,807,859	-	-	-	-
අනිකුත් ගෙවිය යුතු දෑ		14,742,792	14,742,792	-	-	-	-
මුළු පොලී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්		980,612,684	980,612,684	-	-	-	-
මුළු දේශීය මූල්‍ය වගකීම්		1,190,120,582	1,190,120,582	-	-	-	-
දේශීය මුදල් පොලී අනුපාත සංවේදිතා අන්තරය		640,089,443	185,266,825	399,687,242	12,084,646	30,875,249	12,175,481

(ඇ) විචල්‍ය අනුපාතික මූල්‍ය උපකරණ සඳහා මුදල් ප්‍රවාහ සංවේදිතා විශ්ලේෂණය

වාර්තාකරණ දිනයේ දී පොලී අනුපාතවල සිදුවිය හැකි පදනම් අංක 100 ක පමණ වෙනස්වීමක් නිසා ස්කන්ධයේ සහ ලාභයේ හෝ අලාභයේ පහත සඳහන් අගයන් වලින් වැඩිවීමක්/ (අඩුවීමක්) සිදුවිය හැකිය. මෙම විශ්ලේෂණයේදී, අනෙකුත් සියළුම විචල්‍යයන් කිසියම් විදේශ විනිමය අගයකදී නියතව පවතින බවට උපකල්පනය කරනු ලැබ ඇත.

	ලාභය හෝ අලාභය		ස්කන්ධය (බදු අඩුකළ)	
	පදනම් අංක 100කින් වැඩිකළ විට	පදනම් අංක 100කින් අලුත්කළ විට	පදනම් අංක 100කින් වැඩිකළ විට	පදනම් අංක 100කින් අලුත්කළ විට
2021 දෙසැම්බර් 31 දිනට,				
විචල්‍ය අනුපාතික මූල්‍ය උපකරණ	-	-	-	-
මුදල් ප්‍රවාහ සංවේදීතාවය (දළ අගය)	-	-	-	-
2020 දෙසැම්බර් 31 දිනට,				
විචල්‍ය අනුපාතික මූල්‍ය උපකරණ	94,371	(92,502)	94,371	(92,502)
මුදල් ප්‍රවාහ සංවේදීතාවය (දළ අගය)	94,371	(92,502)	94,371	(92,502)

48.3 විදේශීය මුදල් අවදානම

බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යය යටතේ දරන්නා වූ විදේශීය වත්කම් තුළින් බැංකුවෙහි විදේශ මුදල් කටයුතු නිරූපණය වේ. විදේශ විනිමය වෙළෙඳපොළේ වෙනස්වීම හේතුවෙන් බැංකුව, විනිමය අවදානමට විවෘත වේ. මුදල් මණ්ඩලය සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ ජාත්‍යන්තර සංචිතයෙහි විවිධ මුදල් වර්ගවලින් දැරිය යුතු ප්‍රතිශත ප්‍රමාණයක් නියම කර තිබේ. මුදල් වෙන්කිරීම පිළිබඳව තීරණය කිරීමේ දී රාජ්‍ය ණය ආපසු ගෙවීමේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනු ලැබේ. එබැවින් බැංකුව විසින් ප්‍රධාන මුදල් වර්ග බොහොමයක්, එනම් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ස්ටර්ලිං පවුම්, ජපන් යෙන්, යුරෝ, ඕස්ට්‍රේලියන් ඩොලර් හා නවසීලන්ත ඩොලර් රඳවා ගනු ලබයි. විදේශීය මුදල් මත පනවා ඇති සීමාවන්ට අනුකූලවීම සුපරීක්ෂණයට භාජනය වේ.

විදේශ මුදල් සඳහා ශුද්ධ නිරාවරණය

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ නිරාවරණය පහත පරිදි වේ.

	මුදල් වර්ගය									
2021 දෙසැම්බර් 31 දිනට	ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්	යුරෝ	ජපන් යෙන්	ස්ටර්ලිං පවුම්	විගැහි	ඕස්ට්‍රේලියානු ඩොලර්	කැනේඩියානු ඩොලර්	නවසීලන්ත ඩොලර්	අනිකුත් මුදල්	සියළුම මුදල් වර්ගවල එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්										
මුදල් හා මුදල් සමානයන්	138,000,677	568,045	9,461,477	1,996,158	-	650,773	31,353	11,271	362,128,066	**512,847,820**
ලාභ/අලාභ තුළින් සාධාරණ මිලට ඇති හා අනිකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	8,818,244	-	-	-	-	-	-	-	-	**8,818,244**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	55,853	-	-	-	-	-	-	-	53,966,983	**54,022,836**
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	-	-	-	-	188,045,840	-	-	-	-	**188,045,840**
මුළු විදේශීය මූල්‍ය වත්කම්	146,874,774	568,045	9,461,477	1,996,158	188,045,840	650,773	31,353	11,271	416,095,049	**763,734,740**
සමානුපාතය	19.23%	0.08%	1.24%	0.26%	24.62%	0.09%	0.00%	0.00%	54.48%	**100.00%**
විදේශීය මූල්‍ය බැරකම්										
බැංකු හා මූල්‍ය ආයතන	13,641	-	-	-	-	-	-	-	60	**13,701**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-	-	-	-	-	1,139,323	**1,139,323**
ආසියානු නිශ්කාෂණ සංගමය	104,764,616	-	-	-	-	-	-	-	-	**104,764,616**
ජා.මූ.අ.	480,115	-	-	-	669,585,128	-	-	-	-	**670,065,243**
අනෙකුත්	41,662,689	-	-	-	-	-	-	-	315,632,987	**357,295,676**
මුළු විදේශීය මූල්‍ය බැරකම්	146,921,061	-	-	-	669,585,128	-	-	-	316,772,370	**1,133,278,559**
සමානුපාතය	12.97%	0.00%	0.00%	0.00%	59.08%	0.00%	0.00%	0.00%	27.95%	**100.00%**
ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය	(46,287)	568,045	9,461,477	1,996,158	(481,539,288)	650,773	31,353	11,271	99,322,679	**(369,543,819)**

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

2021 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා රුපියල්	ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්	ජපන් යෙන්
	රු. 000	රු. 000	රු. 000
මිලදී ගැනුම්	145,161,075	50,073,176	-
විකුණුම්	(45,145,128)	(147,228,648)	(4,876,735)
ඉදිරි ප්‍රති ගිණුම	2,016,260	-	-

2020 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ නිරාවරණය පහත පරිදි වේ.

2020 දෙසැම්බර් 31 දිනට	ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්	යුරෝ	ජපන් යෙන්	ස්ටර්ලිං පවුම්	විගැහි	ඕස්ට්‍රේලියානු ඩොලර්	කැනේඩියානු ඩොලර්	නවසීලන්ත ඩොලර්	අනිකුත් මුදල්	සියළුම මුදල් වර්ගවල එකතුව
	මුදල් වර්ගය									
විදේශීය මූල්‍ය වත්කම්	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
මුදල් හා මුදල් සමානයන්	309,734,328	11,676,634	80,232,700	528,305	-	150,537	26,322	806,941	421,875	403,577,642
ලාභ/අලාභ තුළින් සාධාරණ මිලට ඇති හා අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	663,466,506	-	5,194,267	2,276,997	-	38,564,143	-	20,120,199	14,377,674	743,999,786
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-	-	-	-	-	3,370,353	3,370,353
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	-	-	-	-	158,958,187	-	-	-	-	158,958,187
අනෙකුත් ලැබිය යුතු දෑ	1,702,247	-	-	-	-	-	-	-	-	1,702,247
මුළු විදේශීය මූල්‍ය වත්කම්	974,903,081	11,676,634	85,426,967	2,805,302	158,958,187	38,714,680	26,322	20,927,140	18,169,902	1,311,608,215
සමානුපාතය	74.33%	0.89%	6.51%	0.21%	12.12%	2.95%	0.00%	1.60%	1.39%	100.00%
විදේශීය මූල්‍ය බැරකම්										
බැංකු හා මූල්‍ය ආයතන	208,337,021	15	-	-	-	185	-	-	-	208,337,221
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	449,945	-	-	-	-	-	-	-	124,237	574,182
ආසියානු නිශ්කාෂණ සංගමය	63,864,652	-	-	-	-	-	-	-	-	63,864,652
ජා.මූ.අ.	-	-	-	-	509,925,278	-	-	-	-	509,925,278
අනෙකුත්	74,819,182	-	-	-	-	-	-	-	51,143	74,870,325
මුළු විදේශීය මූල්‍ය බැරකම්	347,470,800	15	-	-	509,925,278	185	-	-	175,380	857,571,658
සමානුපාතය	40.52%	0.00%	0.00%	0.00%	59.46%	0.00%	0.00%	0.00%	0.02%	100.00%
ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය	627,432,281	11,676,619	85,426,967	2,805,302	(350,967,091)	38,714,495	26,322	20,927,140	17,994,522	454,036,557

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

2020 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා රුපියල්	ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්	ජපන් යෙන්
	රු. 000	රු. 000	රු. 000
මිලදී ගැනුම්	185,933,135	98,373,989	-
විකුණුම්	(38,620,260)	(183,891,689)	(60,050,721)
ඉදිරි ප්‍රති ගිණුම	(1,744,454)	-	-

පහත සඳහන් විනිමය අනුපාතිකයන් බැංකුව විසින් යොදාගන්නා ලදී.

මුදල් වර්ගය	සාමාන්‍ය අනුපාතය 2021	සාමාන්‍ය අනුපාතය 2020	වර්ෂ අවසාන එතැන් අනුපාතය 2021	වර්ෂ අවසාන එතැන් අනුපාතය 2020
	රු.	රු.	රු.	රු.
ඇ.එ.ජ. ඩොලර් 1	200.1553	185.8584	200.4338	186.4082
යූරෝ 1	236.2532	213.1154	227.8832	227.7256
ජපන් යෙන් 1	1.8137	1.7488	1.7417	1.8055
ස්ටර්ලින් පවුම් 1	275.2172	239.9567	271.2270	254.8200
වි.ගැ.හි. 1	285.0534	259.7846	280.9312	272.6200
ඕස්ට්‍රේලියානු ඩොලර් 1	149.8331	128.8643	145.5851	143.4225

සංවේදිතා විශ්ලේෂණය

වාර්තාකරණ දිනය ප්‍රකාරව ඉහත සඳහන් මුදල් වර්ගයක් ශ්‍රී ලංකා රුපියලට එරෙහිව සාධාරණ ලෙස ශක්තිමත් වීම/(දුර්වල වීම), විදේශීය මුදල් වලින් මූල්‍ය උපකරණ මිනුම් කිරීම මත බලපෑමක් ඇති කරනු ලැබූ අතර, ලාභය හෝ අලාභය කෙරෙහි පහත පෙන්වන පරිදි බලපා ඇත.

	ලාභයන් හෝ අලාභය	
	ශක්තිමත් වීම	දුර්වල වීම
2021 දෙසැම්බර් 31	රු. 000	රු. 000
ඇ.එ.ජ. ඩොලර් (5% විචලනය)	(2,314)	2,314
යූරෝ (5% විචලනය)	28,402	(28,402)
ජපන් යෙන් (5% විචලනය)	473,074	(473,074)
ස්ටර්ලින් පවුම් (5% විචලනය)	99,808	(99,808)
වි.ගැ.හි. (5% විචලනය)	(24,076,964)	24,076,964
ඕස්ට්‍රේලියානු ඩොලර් (5% විචලනය)	32,539	(32,539)

	ලාභයන් හෝ අලාභය	
	ශක්තිමත් වීම	දුර්වල වීම
2020 දෙසැම්බර් 31	රු. 000	රු. 000
ඇ.එ.ජ. ඩොලර් (5% විචලනය)	31,371,614	(31,371,614)
යූරෝ (5% විචලනය)	583,831	(583,831)
ජපන් යෙන් (5% විචලනය)	4,271,348	(4,271,348)
ස්ටර්ලින් පවුම් (5% විචලනය)	140,265	(140,265)
වි.ගැ.හි. (5% විචලනය)	(17,548,355)	17,548,355
ඕස්ට්‍රේලියානු ඩොලර් (5% විචලනය)	1,935,725	(1,935,725)

48.4 මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම්

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

2021 දෙසැම්බර් 31 දිනට	මාස 6ට අඩු රු. 000	මාස 6 සිට වර්ෂ 1 දක්වා රු. 000	වර්ෂ 1 සිට 2 දක්වා රු. 000	වර්ෂ 2 සිට 5 දක්වා රු. 000	වර්ෂ 5 ට වැඩි රු. 000	එකතුව රු. 000
විදේශීය මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමානයන්	512,762,452	-	-	-	-	**512,762,452**
අනිකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	72,720	72,720	2,851,296	6,215,953	-	**9,212,689**
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	38,245,157	-	-	216,785	149,583,895	**188,045,837**
මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්	551,080,329	72,720	2,851,296	6,432,738	149,583,895	**710,020,978**
දේශීය මූල්‍ය වත්කම්						
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	1,039,925,021	356,959,017	2,731,167	24,517,061	-	**1,424,132,266**
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	567,532,312	-	-	-	-	**567,532,312**
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	150,128,800	-	-	-	-	**150,128,800**
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	-	-	1,671,218	**1,671,218**
බැංකු සඳහා දෙන ලද ණය	79,700,303	4,111,486	4,107,462	3,432,763	-	**91,352,014**
අනෙකුත් වත්කම්	13,862,510	1,675,011	5,311,071	10,164,003	15,569,723	**46,582,318**
මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්	1,851,148,946	362,745,514	12,149,700	38,113,827	17,240,941	**2,281,398,928**
මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්	2,402,229,275	362,818,234	15,000,996	44,546,565	166,824,836	**2,991,419,906**
විදේශීය මූල්‍ය වගකීම්						
බැංකු සහ මූල්‍ය ආයතන	13,701	-	-	-	-	**13,701**
ආසියානු නිෂ්කාශන සංගමය	104,764,616	-	-	-	-	**104,764,616**
ජා.මූ.අ.	16,817,583	15,339,852	38,786,708	135,825,841	475,810,517	**682,580,501**
අනෙකුත්	40,161,167	317,134,509	-	-	-	**357,295,676**
මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්	161,757,067	332,474,361	38,786,708	135,825,841	475,810,517	**1,144,654,494**
දේශීය මූල්‍ය වගකීම්						
බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු	300,704,162	-	-	-	-	**300,704,162**
රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු	1,392,301	-	-	-	-	**1,392,301**
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්	101,062,880	-	-	-	-	**101,062,880**
සංසරණයේ පවත්නා මුදල්	1,005,099,066	-	-	-	-	**1,005,099,066**
අනෙකුත් ගෙවිය යුතු දෑ	19,163,882	-	-	-	-	**19,163,882**
මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්	1,427,422,291	-	-	-	-	**1,427,422,291**
මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්	1,589,179,358	332,474,361	38,786,708	135,825,841	475,810,517	**2,572,076,785**
ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම්/(වගකීම්)	813,049,917	30,343,873	(23,785,712)	(91,279,276)	(308,985,681)	**419,343,121**

	මාස 6ට අඩු	මාස 6 සිට වර්ෂ 1 දක්වා	වර්ෂ 1 සිට 2 දක්වා	වර්ෂ 2 සිට 5 දක්වා	වර්ෂ 5ට වැඩි දක්වා	එකතුව
2021 දෙසැම්බර් 31 දිනට	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	17,388,862	14,913,000	5,154,573	45,842,140	16,748,562	100,047,137
ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	16,884,671	15,032,535	5,260,986	46,097,369	16,698,942	99,974,503

විදේශීය මුදල් පරිවර්තනය

විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වලට සම්බන්ධ සියළුම අනාගත මූල්‍ය ප්‍රවාහ, වාර්තාගතකරණ මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත්තේ, වාර්තාකරණ දිනයට අදාළ විනිමය අනුපාතිකයටයි.

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

2020 දෙසැම්බර් 31 දිනට	මාස 6ට අඩු **රු. 000**	මාස 6 සිට වර්ෂ 1 දක්වා **රු. 000**	වර්ෂ 1 සිට 2 දක්වා **රු. 000**	වර්ෂ 2 සිට 5 දක්වා **රු. 000**	වර්ෂ 5 ට වැඩි **රු. 000**	එකතුව **රු. 000**
විදේශීය මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමානයන්	403,307,304	-	-	-	-	403,307,304
ලාභ/අලාභ මගින් සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත්	7,669,197	7,624,371	20,303,019	11,393,477	-	46,990,064
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	73,114,024	90,062,578	201,465,928	338,787,647	4,807,787	708,237,964
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	13,539,094	-	-	208,076	145,211,015	158,958,185
අනිකුත් ලැබිය යුතු දෑ	1,702,247	-	-	-	-	1,702,247
මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්	499,331,866	97,686,949	221,768,947	350,389,200	150,018,802	1,319,195,764
දේශීය මූල්‍ය වත්කම්						
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	463,313,921	405,150,819	5,524,792	26,202,317	317,849	900,509,698
නැවත විකිණීමේ ගිවිසුම මත මිලදීගත් සුරැකුම්පත්	2,728,412	-	-	-	-	2,728,412
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	153,061,900	-	-	-	-	153,061,900
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	-	-	1,615,356	1,615,356
බැංකු සඳහා දෙන ලද ණය	96,083,289	7,331,102	8,150,872	-	-	111,565,263
අනෙකුත් වත්කම්	4,948,189	1,395,674	2,255,604	9,040,665	14,669,924	32,310,056
මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්	720,135,711	413,877,595	15,931,268	35,242,982	16,603,129	1,201,790,685
මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්	1,219,467,577	511,564,544	237,700,215	385,632,182	166,621,931	2,520,986,449
විදේශීය මූල්‍ය වගකීම්						
බැංකු සහ මූල්‍ය ආයතන	208,337,221	-	-	-	-	208,337,221
ආසියානු නිශ්කාෂන සංගමය	63,864,652	-	-	-	-	63,864,652
ජා.මූ.අ.	6,883,538	6,864,314	31,133,271	127,514,224	350,966,277	523,361,624
අනෙකුත්	74,870,325	-	-	-	-	74,870,325
මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්	353,955,736	6,864,314	31,133,271	127,514,224	350,966,277	870,433,822
දේශීය මූල්‍ය වගකීම්						
බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු	129,601,521	-	-	-	-	129,601,521
රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු	1,460,512	-	-	-	-	1,460,512
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවි කළ සුරැකුම්පත්	209,507,898	-	-	-	-	209,507,898
සංසරණයෙහි පවත්නා මුදල්	834,807,859	-	-	-	-	834,807,859
අනෙකුත් ගෙවිය යුතු දෑ	14,742,792	-	-	-	-	14,742,792
මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්	1,190,120,582	-	-	-	-	1,190,120,582
මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්	1,544,076,318	6,864,314	31,133,271	127,514,224	350,966,277	2,060,554,404
ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම් / (වගකීම්)	(324,608,741)	504,700,230	206,566,944	258,117,958	(184,344,346)	460,432,045

	මාස 6ට අඩු **රු. 000**	මාස 6 සිට වර්ෂ 1 දක්වා **රු. 000**
2020 දෙසැම්බර් 31 දිනට		
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	117,285,065	30,027,810
ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	115,556,701	30,011,720

48.5 ද්‍රවශීලතා අවදානම

මූල්‍ය ලියවිලි ආශ්‍රිත බැඳීම් සපුරාලීමට අවශ්‍යවන අරමුදල් කෙටි දැනුම්දීමක දී සපයා ගැනීම සඳහා ඒකකයක් විසින් මුහුණපානු ලබන දුෂ්කරතා, ද්‍රවශීලතා අවදානම වේ. ඒකකයකට තම මූල්‍ය වත්කම් ඉක්මණින්, සාධාරණ අගයට වඩා ඉතා අඩු මිලකට විකිණීමට සිදුවීම ද ද්‍රවශීලතා අවදානමකි.

(අ) බැංකුවේ විදේශීය මුදල් වත්කම් සංයුතිය නිශ්චය කිරීමේදී ද ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ ද්‍රවශීලතාවය සම්බන්ධයෙනි. අවශ්‍ය අවස්ථාවන්හි දී මැදිහත්වීමේ කාර්යයන් ද රාජ්‍ය ණය සහ ජා.මූ.අ. ණය ආපසු ගෙවීම වැනි වූ බැඳීම් බේරුම් කිරීම සඳහා ද විදේශීය සංචිත ඈවර කිරීමේ විභව අවශ්‍යතාවය මෙයින් ගම්‍ය වේ. අරමුදල්වලට ඉක්මණින් ප්‍රවේශවීම තහවුරු කර ගැනීම සඳහා බැංකුව පහත සඳහන් මිනුම් යොදා ගනී.

- රඳවාගෙන ඇති සුරැකුම්පත්වල ද්‍රවශීලතා ලක්ෂණයන් පදනම් කළ ද්‍රවශීලතා වත්කම් අනුපාත.
- එක් එක් මුදල් වර්ගයෙන් සහ එක් එක් ප්‍රතිපාර්ශ්වය සමග රඳවා ගත හැකි සංචිතවල උපරිම සංකලනය වන සීමාවන්.

(ආ) විවට වෙළෙඳපොල කටයුතු වැනි දේශීය මුදල් ඒකකයන් භාවිතා කරමින් කරන කටයුතුවල ද්‍රවශීලතා අවදානම අඩු කිරීම සඳහා ඉතා ද්‍රවශීලී වෙළෙඳපොළ උපකරණ වන භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර, ඇප සුරැකුම් ලෙස භාවිතා කර ඇත. මහ බැංකු සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම්/විකිණීම් හා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මත ශ්‍රී ලංකා රුපියල් හුවමාරු වැනි උපකරණ භාවිතයෙන්, විදීම් හා උකහා ගැනීම් ඔස්සේ බැංකු පද්ධතියේ දෛනික ද්‍රවශීලතා තත්වය කළමනාකරණය කරනු ලබයි.

(ඇ) අනාගත මූල්‍යනයට සහාය වීම සඳහා පවතින මූල්‍ය වත්කම්

අනාගත මූල්‍යනයට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතු මූල්‍ය වත්කම් පහත සටහනින් දැක්වේ.

2021 දෙසැම්බර් 31 දිනට	යටත් වූ ඇපකරයක් ලෙස ඔඩපන කල රු. 000	යටත් වූ ඇපකරයක් ලෙස යොදාගත හැකි රු. 000	එකතුව රු. 000
විදේශීය මූල්‍ය වත්කම්			
මුදල් හා මුදල් සමානයන්	-	512,762,452	**512,762,452**
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	2,830,756	5,987,488	**8,818,244**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	54,022,836	**54,022,836**
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	-	188,045,837	**188,045,837**
දේශීය මූල්‍ය වත්කම්			
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	-	1,377,820,347	**1,377,820,347**
නැවත විකිණීමේ එකඟතාවය මත මිලදී ගත් සුරැකුම්පත්	-	567,532,312	**567,532,312**
රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම්	-	150,128,800	**150,128,800**
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	1,671,218	**1,671,218**
බැංකු සඳහා දෙන ලද ණය	-	90,572,746	**90,572,746**
අනෙකුත් වත්කම්	-	34,063,770	**34,063,770**
මුළු වත්කම්	2,830,756	2,982,607,806	**2,985,438,562**

2020 දෙසැම්බර් 31 දිනට	යටත් වූ ඇපකරයක් ලෙස ඔඩපන කල රු. 000	යටත් නොවූ ඇපකරයක් ලෙස යොදාගත හැකි රු. 000	එකතුව රු. 000
විදේශීය මූල්‍ය වත්කම්			
මුදල් හා මුදල් සමානයන්	-	403,307,304	403,307,304
ලාභ/අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	-	40,564,323	40,564,323
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	201,461,348	501,974,115	703,435,463
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	3,370,353	3,370,353
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	-	158,958,185	158,958,185
අනෙකුත් ලැබිය යුතු දෑ	-	1,702,247	1,702,247
දේශීය මූල්‍ය වත්කම්			
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	-	714,531,527	714,531,527
නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත්	-	2,728,412	2,728,412
රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම්	-	153,061,900	153,061,900
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	1,615,356	1,615,356
බැංකු සඳහා දෙන ලද ණය	-	111,487,526	111,487,526
අනෙකුත් වත්කම්	-	23,097,189	23,097,189
මුළු වත්කම්	201,461,348	2,116,398,437	2,317,859,785

49. මූල්‍ය වත්කම් හා වගකීම්

49.1 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පේළි අයිතම සහ මූල්‍ය උපකරණ කාණ්ඩයන් අතර සැසඳුමක් පහත සටහනින් සපයයි.

2021 දෙසැම්බර් 31 දිනට	ලාභ/අලාභ මගින් සාධාරණ අගය	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ණය උපකරණ	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ස්කන්ධ උපකරණ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්					
මුදල් හා මුදල් සමානයන්	-	-	-	512,762,452	**512,762,452**
අනිකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	-	8,818,244	-	-	**8,818,244**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	54,022,836	-	-	-	**54,022,836**
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්	162,603,548	-	-	188,045,837	**350,649,385**
මුළු විදේශීය මූල්‍ය වත්කම්	216,626,384	8,818,244	-	700,808,289	**926,252,917**
දේශීය මූල්‍ය වත්කම්					
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	-	1,377,820,347	-	-	**1,377,820,347**
නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත්	-	-	-	567,532,312	**567,532,312**
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	-	-	-	150,128,800	**150,128,800**
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	1,671,218	-	**1,671,218**
බැංකු සඳහා දෙන ලද ණය	-	-	-	90,572,746	**90,572,746**
අනිකුත් වත්කම්	-	-	-	34,063,770	**34,063,770**
මුළු දේශීය මූල්‍ය වත්කම්	-	1,377,820,347	1,671,218	842,297,628	**2,221,789,193**
විදේශීය මූල්‍ය බැරකම්					
බැංකු සහ මූල්‍ය ආයතන	-	-	-	13,701	**13,701**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,139,323	-	-	-	**1,139,323**
ආසියානු නිශ්කාශන සංගමය	-	-	-	104,764,616	**104,764,616**
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)	-	-	-	670,065,243	**670,065,243**
අනිකුත්	-	-	-	357,295,676	**357,295,676**
මුළු විදේශීය මූල්‍ය බැරකම්	1,139,323	-	-	1,132,139,236	**1,133,278,559**
දේශීය මූල්‍ය බැරකම්					
බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු	-	-	-	300,704,162	**300,704,162**
රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු	-	-	-	1,392,301	**1,392,301**
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්	-	-	-	101,062,880	**101,062,880**
සංසරණයේ පවත්නා මුදල්	-	-	-	1,005,099,066	**1,005,099,066**
අනෙකුත් ගෙවිය යුතු දෑ	-	-	-	19,163,882	**19,163,882**
මුළු දේශීය මූල්‍ය බැරකම්	-	-	-	1,427,422,291	**1,427,422,291**

2020 දෙසැම්බර් 31 දිනට	ලාභ/අලාභ මගින් සාධාරණ අගය	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ණය උපකරණ	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ස්කන්ධ උපකරණ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්					
මුදල් හා මුදල් සමානයන්	-	-	-	403,307,304	403,307,304
ලාභ/අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	40,564,323	-	-	-	40,564,323
අනිකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	-	703,435,463	-	-	703,435,463
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	3,370,353	-	-	-	3,370,353
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්	157,793,346	-	-	1,164,839	158,958,185
අනිකුත් ලැබිය යුතු දෑ	-	-	-	1,702,247	1,702,247
මුළු විදේශීය මූල්‍ය වත්කම්	201,728,022	703,435,463	-	406,174,390	1,311,337,875
දේශීය මූල්‍ය වත්කම්					
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	-	714,531,527	-	-	714,531,527
නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත්	-	-	-	2,728,412	2,728,412
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	-	-	-	153,061,900	153,061,900
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	1,615,356	-	1,615,356
බැංකු සඳහා දෙන ලද ණය	-	-	-	111,487,526	111,487,526
අනෙකුත් වත්කම්	-	-	-	23,097,189	23,097,189
මුළු දේශීය මූල්‍ය වත්කම්	-	714,531,527	1,615,356	290,375,027	1,006,521,910
විදේශීය මූල්‍ය බැරකම්					
බැංකු සහ මූල්‍ය ආයතන	-	-	-	208,337,221	208,337,221
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	574,182	-	-	-	574,182
ආසියානු නිශ්කාශන සංගමය	-	-	-	63,864,652	63,864,652
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)	-	-	-	509,925,278	509,925,278
අනෙකුත්	-	-	-	74,870,325	74,870,325
මුළු විදේශීය මූල්‍ය බැරකම්	574,182	-	-	856,997,476	857,571,658
දේශීය මූල්‍ය බැරකම්					
බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු	-	-	-	129,601,521	129,601,521
රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු	-	-	-	1,460,512	1,460,512
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්	-	-	-	209,507,898	209,507,898
සංසරණයේ පවත්නා මුදල්	-	-	-	834,807,859	834,807,859
අනෙකුත් ගෙවිය යුතු දෑ	-	-	-	14,742,792	14,742,792
මුළු දේශීය මූල්‍ය බැරකම්	-	-	-	1,190,120,582	1,190,120,582

50. සාධාරණ අගය පිළිබඳ හෙළිදරව් කිරීම්

50.1 වත්කම් හා වගකීම් වල සාධාරණ අගය

සාධාරණ අගය යනු වෙළඳපල ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම් ගත කරනු ලබන දිනයට, ප්‍රධාන වෙළඳපොළෙහි දී හෝ එවැනි ප්‍රධාන වෙළඳපොළක් නොමැති අවස්ථාවක දී එම දිනයේ දී ලඟා විය හැකි වඩාත් වාසි සහගත වෙළඳපොළෙහි දී, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදලයි. වගකීමක සාධාරණ අගය මගින් එම වගකීම ඉටු නොවීමේ අවදානම පිළිඹිබු වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 5.2 හි විස්තර කර ඇති පරිදි නිරීක්ෂණය කල හැකි වෙළඳපොළ මිල ගණන් නොමැති අවස්ථාවක දී මූල්‍ය වත්කම් හා වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීම සඳහා තක්සේරු ශිල්පයම භාවිතා කරයි.

නිරන්තර වෙළඳාම් සිදු නොවන සහ ඉතා අඩු මිල විනිවිදභාවයක් සහිත මූල්‍ය උපකරණ ඒවාහි නිවැරදි සාධාරණ අගය නිරූපණය නොකරයි. ඒවාහි සාධාරණ අගය මිණුම් කිරීමේදී, ද්‍රවශීලතාවය, සංකේන්ද්‍රය, වෙළඳපොළ සාධකයන්හි අවිනිශ්චිත බව, මිල උපකල්පන හා විශේෂිත උපකරණයන්ට බලපාන අනෙකුත් අවදානම් මත පදනම් වූ විවිධ මට්ටම්වල විනිශ්චයන් යොදාගනු ලැබේ.

මූල්‍ය උපකරණ සඳහා වූ සාධාරණ අගය ධූරාවලිය පහත දැක්වේ

පළමුවන මට්ටම : අනන්‍ය වත්කම හෝ වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොගලපන ලද) මිල ගණන් භාවිතයෙන් සාධාරණ අගය මැනීම;

දෙවන මට්ටම : පළමුවන මට්ටමේ සඳහන් ප්‍රකාශිත මිල ගණන් නොවන, එහෙත් සෘජුව (උදා:- මිල ගණන්) හෝ වක්‍රව (උදා:- මිල ඔස්සේ තීරණය වුණු) වත්කම් හා වගකීම් සඳහා නිරීක්ෂිත යෙදවුම් භාවිතයෙන් සාධාරණ අගය මැනීම, සහ

තෙවන මට්ටම : නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ (උදා:- නිරීක්ෂණය කළ නොහැකි) යෙදවුම් භාවිතයෙන් වත්කම් හා වගකීම්හි සාධාරණ අගය මැනීම.

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද වත්කම් හා වගකීම්වල විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

2021 දෙසැම්බර් 31 දිනට	පළමුවන මට්ටම	දෙවන මට්ටම	තෙවන මට්ටම	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000
මූල්‍ය වත්කම්				
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්	8,818,244	-	-	**8,818,244**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	54,022,836	-	**54,022,836**
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	162,603,548	-	-	**162,603,548**
	171,421,792	54,022,836	-	**225,444,628**
මූල්‍ය නොවන විදේශ වත්කම්				
රන්	35,151,981	-	-	**35,151,981**
	35,151,981	-	-	**35,151,981**
දේශීය මූල්‍ය වත්කම්				
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	1,377,820,347	-	-	**1,377,820,347**
මූල්‍ය සහ රජයේ ආයතනයන්හි ස්කන්ධ ආයෝජන	-	-	1,671,218	**1,671,218**
	1,377,820,347	-	1,671,218	**1,379,491,565**
අනෙකුත් මූල්‍ය නොවන වත්කම්				
ඉඩම්	-	-	10,855,725	**10,855,725**
ගොඩනැගිලි	-	-	7,099,239	**7,099,239**
	-	-	17,954,964	**17,954,964**
මූල්‍ය වගකීම්				
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	1,139,323	-	**1,139,323**
	-	1,139,323	-	**1,139,323**

2020 දෙසැම්බර් 31 දිනට	පළමුවන මට්ටම	දෙවන මට්ටම	තෙවන මට්ටම	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000
මූල්‍ය වත්කම්				
ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	40,564,323	-	-	40,564,323
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්	703,435,463	-	-	703,435,463
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	3,370,353	-	3,370,353
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	157,793,346	-	-	157,793,346
	901,793,132	3,370,353	-	905,163,485
මූල්‍ය නොවන විදේශ වත්කම්				
රන්	76,220,055	-	-	76,220,055
	76,220,055	-	-	76,220,055
දේශීය මූල්‍ය වත්කම්				
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	714,531,527	-	-	714,531,527
මූල්‍ය සහ අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන	-	-	1,615,356	1,615,356
	714,531,527	-	1,615,356	716,146,883
අනෙකුත් මූල්‍ය නොවන වත්කම්				
ඉඩම්	-	-	11,334,725	11,334,725
ගොඩනැගිලි	-	-	7,832,238	7,832,238
	-	-	19,166,963	19,166,963
මූල්‍ය වගකීම්				
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	574,182	-	574,182
	-	574,182	-	574,182

මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන

කොටසක ශුද්ධ වත්කම් තක්සේරු ශිල්ප ක්‍රමය භාවිතයෙන්, ස්කන්ධ ආයෝජනයන්හි සාධාරණ අගය ගණනය කරන ලදී.

නිරීක්ෂණය කළ නොහැකි සුවිශේෂී යෙදවුම්

කොටසක ශුද්ධ වත්කම් අගය

සංවේදීතා විශ්ලේෂණය

කොටසක ශුද්ධ වත්කම් අගයේ 10% ක වැඩිවීම හේතුවෙන් සාධාරණ අගය 10% කින් ඉහල යයි.

	2021	2020
	රු. 000	රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**1,615,356**	1,500,487
වර්ෂය තුළ එකතු කිරීම	**-**	6,490
අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් සාධාරණ මිලට වූ ලාභය	**55,862**	108,379
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,671,218**	1,615,356

ඉඩම් හා ගොඩනැගිලි

අගය කිරීමේ ක්‍රමය

ඍජු සන්සන්දනාත්මක ක්‍රමය සමඟ වෙළඳපොල ප්‍රවේශය භාවිතා කරමින් ඉඩම් අගය කරනු ලබන අතර එහිදී වත්කම නුදුරේදී සිදුකරන ලද සමාන වත්කමක විකුණුම් අගය සමඟ සංසන්දනය කොට එකී අගයට එකතු කළ හෝ නාමිකව එකතු කළ වැඩිදියුණු අගයක් ගැලපුම් කිරීමකින් තොරව ස්ථානීය වෙනස්වීම් (Points of Difference) සඳහා පමණක් ගැලපුම් කිරීමෙන් සාධාරණ අගය ගණනය කරනු ලබයි.

පොදු මහජනතාවට සේවා සපයන රාජ්‍ය අංශ ඒකකයන් විසින් පාලනය කරනු ලබන වත්කම්, විවෘත ද්‍රවශීල වෙළඳපොලෙහි හුවමාරු නොවන බැවින් සෙන්ට්‍රල් පොයින්ට් සහ වයිට් අවේස්, ගොඩනැගිලි හැර අනෙකුත් සියළුම ගොඩනැගිලි ක්ෂය කරන ලද ප්‍රවර්තන ප්‍රතිස්ථාපන පිරිවැය (DRC) ක්‍රමයට තක්සේරු කර ඇත.

අනෙකුත් ගොඩනැගිලි අගය කිරීම සඳහා, තනි වර්තමාන අගයකට හැර වූ (වට්ටම් කල) ඇස්තමේන්තුගත අනාගත ආදායම, ලාභය හෝ මුදල් ප්‍රවාහයන් මත පදනම්ව දේපල අගය කරනු ලබන ආදායම් ප්‍රවේශය යොදා ගන්නා ලදී.

පහත සඳහන් දෑ හේතුවෙන් වෙළඳපොල ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- පර්චසයක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- වර්ග අඩියක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- ගොඩනැගිලි සඳහා වන ක්ෂය අනුපාතය අඩුවීම/(වැඩිවීම)

පහත සඳහන් දෑ හේතුවෙන් ආදායම් ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- දළ වාර්ෂික කුලිය වැඩිවීම/(අඩුවීම)
- වසර මිලදී ගැනීම (years purchase) වැඩිවීම/(අඩුවීම)

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

ව්‍යුත්පන්න උපකරණ අගය කිරීමේ අගය ආකෘතින් යෙදවුම් ලෙස ඉදිරි මිල ගණන් (වෙළඳපොළෙහි ඇති ඉදිරි ලකුණු forward points පදනම් කරගනිමින් සකස් කරන ලද) හා අගය කරන දිනට අදාළ එක් එක් මුදල් වර්ගයන්හි ශූන්‍ය පොලී ඵලදා වක්‍ර මත පදනම්ව ගණනය කළ වට්ටම් අනුපාත යොදා ගැනේ. අගය කරන ලද උපකරණයේ ආන්තිකයක් අඩංගු වේ නම්, ආන්තික අනුපාතයන් හි බලපෑම ඉදිරිපත් කිරීමටත් ඉදිරි මිල ගණන්වලට හා/හෝ පොළී අනුපාතයන්වලට ගැලපීම සිදුකරනු ලබයි.

50.2 ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2021 දෙසැම්බර් 31 දිනට නිත්‍ය තැන්පතු පහසුකම රු.මි. 101,062.88 හා (2020 - රු.මි. 209,507.90) 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රු.මි. 567,532.31 (2020 - රු.මි. 2,728,41) ක් වේ. 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ වන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් ශේෂයක් නොමැත. (2020-ශේෂයක් නොමැත).

50.3 සංසරණයේ ඇති මුදල්

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

50.4 තැන්පතු වටිනාකම

ඉල්ලූ විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

50.5 සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ

සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ පහත වගුවෙන් දැක්වේ.

	ධාරණ වටිනාකම්		සාධාරණ වටිනාකම්	
	2021 රු. 000	2020 රු. 000	2021 රු. 000	2020 රු. 000
විදේශීය මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් සමානයන්	**512,762,452**	403,307,304	**512,762,452**	403,307,304
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	**188,045,837**	1,164,839	**188,050,305**	1,171,285
අනෙකුත් ලැබිය යුතු දෑ	**-**	1,702,247	**-**	1,702,247
දේශීය මූල්‍ය වත්කම්				
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත්	**567,532,312**	2,728,412	**567,532,312**	2,728,412
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	**150,128,800**	153,061,900	**150,128,800**	153,061,900
බැංකු සඳහා දෙන ලද ණය	**90,572,746**	111,487,525	**88,468,648**	108,722,785
අනිකුත් වත්කම්	**34,063,770**	23,097,190	**33,614,096**	21,334,664
විදේශීය මූල්‍ය වගකීම්				
බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන	**13,701**	208,337,221	**13,701**	208,337,221
ආසියානු නිශ්කාෂන සංගමය	**104,764,616**	63,864,652	**104,764,616**	63,864,652
ජා.මු.අ.	**670,065,243**	509,925,278	**670,065,243**	509,925,278
අනෙකුත්	**357,295,676**	74,870,325	**357,295,676**	74,870,325
දේශීය මූල්‍ය වගකීම්				
බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු	**300,704,162**	129,601,521	**300,704,162**	129,601,521
රජයේ සහ රජයේ ආයතනවල තැන්පතු	**1,392,301**	1,460,512	**1,392,301**	1,460,512
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවිකල සුරැකුම්පත්	**101,062,880**	209,507,898	**101,062,880**	209,507,898
සංසරණයේ පවතින මුදල්	**1,005,099,066**	834,807,859	**1,005,099,066**	834,807,859
අනෙකුත් ගෙවිය යුතු දෑ	**19,163,882**	14,742,792	**19,163,882**	14,742,792

ජා.මු.අ. සම්බන්ධ වත්කම්, බැංකු වෙත ලබා දී ඇති ණය හා අභ්‍යන්තර අරමුදල්වලින් කරන ලද ආයෝජනවල සාධාරණ වටිනාකම ඒවායේ ධාරණ වටිනාකමෙන් වෙනස් වේ.

විදේශ මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති මුදල් හා මුදල් සමානයන් හා අනෙකුත් ලැබිය යුතු දෑ, දේශීය මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් හා රජයට දෙන ලද කාලීන අත්තිකාරම්, විදේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන, ආසියානු නිෂ්කාශන සංගමය, ජා.මු.අ. සහ අනෙකුත් විදේශීය මූල්‍ය වගකීම් සහ දේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු, රජය හා රජයේ ආයතනවල තැන්පතු, ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්, සංසරණයේ පවත්නා මුදල් හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි සාධාරණ වටිනාකම හා ඒවායෙහි ධාරණ වටිනාකම් සමාන වේ.

51. සන්සන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල සඳහා පහත සංසන්දනාත්මක අගයන් නැවත වර්ගීකරණය කරන ලදී.

51.1 ස්ථාවර වත්කම් ලෙස හඳුනාගැනීමට නියමිත පරිගණක මෘදුකාංග, දේපළ පිරියත සහ උපකරණ වලින් අස්පෘශ්‍ය වත්කම් වෙත නැවත වර්ගීකරණය කිරීම.

	පෙරාතුව ඉදිරිත් කළ ආකාරයට	ගැළපීම්	නැවත වර්ගීකරණය කරන ලද
	රු.000	රු.000	රු.000
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත සහ උපකරණ	20,539,377	(83,925)	20,455,452
අස්පෘශ වත්කම්	24,327	83,925	108,252

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා, 2020 වර්ෂයේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේපළ පිරියත සහ උපකරණ යටතේ දක්වන ලද රු. මිලියන 83.93ක් වූ නොනිමි අස්පෘශය වත්කම් අගය, මේ වර්ෂයේදී අස්පෘශ්‍ය වත්කම් යටතේ අනාවරණය කරන ලදී.

52. සම්බන්ධිත පාර්ශවයන්

52.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගණුදෙනුවලට පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සම්බන්ධිත පාර්ශ්වයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන, රජය සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සමඟ එළැඹි ගණුදෙනු සහ විධිවිධානයන් පහත පරිදි වේ.

ගනුදෙනු වල ස්වභාවය	2021 රු. 000	2020 රු. 000
ගනුදෙනු:		
මිලදී ගත් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	-	14,044,912
විකුණන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**980,906**	-
ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**68,218,243,292**	19,598,940,269
ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සඳහා පොලී ආදායම් හෝ වියදම්	**8,378,432**	4,569,328
රජය වෙනුවෙන් ලද අරමුදල්	**365,111,003**	441,954,041
රජය වෙනුවෙන් දරන ලද විය පැහැදම්	**362,223,823**	35,987,068
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (සටහන 52.1.3)	**1,086,655**	1,195,295
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ, සේවා සහ බදු සඳහා ගෙවීම් (සටහන 52.1.4)	**1,129,790**	270,783
වර්ෂය තුළදී දළ විදේශ විනිමය ගනුදෙනු (සටහන 52.1.6)		
- විකුණුම්	**225,597,381**	17,749,013
- මිලට ගැනීම්	**61,515,180**	57,158,110
- ඇ.එ.ජ.ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**651,697,925**	448,596,460
වර්ෂය තුළදී අත්හල දේපල වෙනුවෙන් ලද අරමුදල්	**914,309**	1,073,398
කුලී ආදායම්	**282,173**	321,821
ලාභාංශ ආදායම්	**115,786**	154,381
අනෙකුත් ගනුදෙනු (සටහන 52.1.9)	**1,088,948**	1,076,897
ශේෂයන් :		
ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරීත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (සටහන 52.1.7)	**1,377,820,347**	714,531,527
රජයට දෙන ලද කාලීන අත්තිකාරම් (සටහන 14)	**150,128,800**	153,061,900

කොවිඩ් -19 පුනරුද ණය පහසුකම යටතේ ලබාදුන් ණය	**11,817,950**	23,059,946
නිශ්චිත අරමුණු සඳහා මිලදීගත් රජයේ සුරැකුම්පත්	**15,938,729**	12,914,495
බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) ශේෂයන් (සටහන 26)	**221,738,927**	81,586,946
ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රො ගිණුමේ ශේෂය	**243,388**	228,665
භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙතින් ලැබිය යුතු දෑ	**4,087,983**	597,774
භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙත කළ යුතු ගෙවීම් (සටහන 25)	**1,484,824**	-
දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතන සමග ජංගම ගිණුම් ශේෂයන්	**(1,107,407)**	(1,215,313)
අත්හල දේපල වල ශේෂයන්	**5,998,940**	5,057,128
අනෙකුත් ශේෂයන් (සටහන 52.1.9)	**292,917**	175,813

52.1.1 මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු නියාමනය හා සුපරීක්ෂණය කරනු ලබයි. 2021 දෙසැම්බර් 31 දිනට රජය මගින් අරමුදල් සැපයූ හෝ රජයේ සුවිශේෂ බලපෑමක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 07 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 01 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇති අතර ඒවා බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව වේ.

බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි බැංකු නොවන, මූල්‍ය සමාගම්වල නියාමනය සහ සුපරීක්ෂණය කරගෙන යනු ලබයි. ඒ අනුව, රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතට පැවරේ.

52.1.2 මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා සහ දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

52.1.3 මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

52.1.4 බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ සුවිශේෂ බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමඟ ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

52.1.5 සටහන් අංක 55 හි පැහැදිලි කර ඇති පරිදි බැංකුව භාරකරු සහ අනෙකුත් විශ්වාසතා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

52.1.6 මුදල් නීති පනතට යටත්ව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය, විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල එක් දින විවෘත විදේශ විනිමය තත්ත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි මෙම අංශ දෙකෙහි ම නියැලෙන්නේය. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම සුපරීක්ෂණයේ ප්‍රතිඵල නියෝජනය කෙරේ.

52.1.7 දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2021 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් අංක 12 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 36 සටහනෙහි දැක්වේ.

52.1.8 රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුනි.

52.1.9 තනි වශයෙන් ගත්කල සුවිශේෂී නොවන, රජය, රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය වන ආයතන සමග බැංකුව විසින් සිදුකල ගනුදෙනුවල ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් හි ඇතුලත් වේ.

52.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමග ගණුදෙනු

අධිපති ඇතුළු මුදල් මණ්ඩලයේ සාමාජිකයන්, නියෝජ්‍ය අධිපතිවරුන් සහ සහකාර අධිපතිවරුන් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය බැංකුව සමග සිදුකරන ලද ගනුදෙනු පහත පරිදි වේ.

52.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත කළ ගෙවීම්

	2021 රු. 000	2020 රු. 000
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	**180,218**	204,508

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම්වලට යටත්ව මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

52.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමග වූ වෙනත් ගණුදෙනු

	2021 රු. 000	2020 රු. 000
කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් හට දුන් ණය ශේෂය	**98,648**	90,847
වසර තුළදී ප්‍රදානය කළ ණය	**6,699**	10,000
වසර තුළදී අය කරගත් ණය	**10,038**	31,758

මෙම ණය සඳහා අදාළ වන වාර්ෂික පොළී අනුපාතයන් සියයට 2 සිට සියයට 7 දක්වා පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

52.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගණුදෙනු

	2021 රු. 000	2020 රු. 000
ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය	**73,517**	73,173

සටහන් අංක 32 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම් සඳහා විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර රු.මි. 717.59 ක් (2020 - රු.මි. 709.46) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් සඳහා බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 30.2 සටහනෙහි දක්වා ඇත.

53. අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

53.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2021 දෙසැම්බර් 31 දිනට එවැනි ඇප කිසිවක් නොවීය.

53.2 ණය ඇපකර

බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යයන් වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ණය මත සහභාගී මූල්‍ය ආයතන වෙත ණය ඇපවීම් නිකුත් කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා පශ්චාත් ණය සුපරීක්ෂණය කිරීම සහ ණය ඇපකරු අරමුදල් පරිපාලනය කිරීමයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට සිදුවිය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ණය ඇපකර පහසුකම් සැපයීම ප්‍රා.සං.දෙ. විසින් සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය ණය පැහැර හැරීමේ ප්‍රමාණය මත වන ආවරණයක් නොවන අතර සහභාගී වන මූල්‍ය ආයතන මගින් ණය ලබාදුන් පාර්ශ්වයන්ගෙන් ණය ආපසු අයකර ගැනිමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු, ඉතිරිවන පාඩු සඳහා වන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි වූ මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

දේශීය වාණිජ බැංකු වෙත ලබා දුන් ණය ඇපකර :

	නොපියවා පැවැති ඇප ප්‍රමාණය 2021 රු. 000	2020 රු. 000
සම්බන්ධිත පාර්ශ්වයන්	**21,742,330**	20,898,328
අනෙකුත්	**526,405**	539,315
මුළු ණය ඇප ප්‍රමාණය	**22,268,735**	21,437,643

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය ඇපකර මත හඳුනාගත් අපේක්ෂිත ණය අලාභය, සටහන 39 හි වාර්තා කොට ඇත.

53.3 විශ්වස්ත ක්‍රියාකාරකම්

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා අරමුදල් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

53.4 නෛතික හිමිකම්

බැංකුවට එරෙහිව නීති කෘත්‍යන් ගණනාවක් 2021 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණු අතර මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

53.5 බැඳීම්

(අ) 2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම හා මුදල් අච්චු ගැසීම වෙනුවෙන් රු.මි. 309.17 ක ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

	2021 000	2020 000
ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු		
ඉදිරි විනිමය විකුණුම්		
- ඇ.එ.ජ. ඩොලර්	**734,550**	986,500
- ජපන් යෙන්	**2,800,000**	33,260,000
ඉදිරි විනිමය මිලදී ගැනීම්		
- ඇ.එ.ජ. ඩොලර්	**225,145**	208,000

54. මූල්‍ය වත්කම් මාරු කිරීම්

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, මූලිකව දේශීය හා විදේශීය යන දෙවර්ගයෙන්ම පවත්නා ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් බැංකුව විසින් ගණුදෙනු වලට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් මාරුවීමක් සිදු විය හැක. සටහන් 5.3.3. හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, එසේ මාරුකරන ලද මූල්‍ය වත්කම් පෙර හඳුනාගත් ලෙසම පවත්වාගැනීම හෝ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පවත්වාගැනීම හෝ සම්පූර්ණයෙන් හඳුනා නොගෙන සිටීමට සිදුවිය හැක.

සම්පූර්ණයෙන් ඉවත් නොකරන ලද හෝ පහත ගණුදෙනු තුළින් මූලිකව බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමක් පවතී නම් මූල්‍ය වත්කම් මාරුකිරීමක් සිදු කරයි.

- ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්
- සුරැකුම්පත් ණයට දීම
- සුරැකුම්පත් ඔඩපන කිරීම

54.1 සම්පූර්ණයෙන් ඉවත් නොකල නමුත් මාරුකල මූල්‍ය වත්කම්

(අ) ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්

බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වල කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ගණුදෙනුවල නිරතවන අතර හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුව පැවතීම හේතුවෙන්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ "ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්' යටතේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන් හඳුනාගෙන තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ඒ මත ගෙවිය යුතු මුදල් ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළිය, මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වගකීම්හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ලෙස හඳුනාගෙන ඇත.

(ආ) සුරැකුම්පත් ණයට දීම

සුරැකුම්පත් ණය, ස්ථාපිත වෙළඳපල පුරුදු විස්තර කරන අතර එමගින්, ගාස්තුවකට යටත්ව, සුරැකුම්පත් එක් පාර්ශවයකගෙන් (ණය දීමනාකරු - ශ්‍රී ලංකා මහ බැංකුව), තවත් පාර්ශ්වයකට (ණය ගන්නා) තාවකාලිකව හුවමාරු වීම සිදුවේ. ණයගන්නා ඉල්ලූ විටදී හෝ යම් එකඟ වූ කාලසීමාව අවසානයේදී ඒවා නැවත ලබා දීමට බැඳේ. මේ වන විට අධිජාතික බැඳුම්කර සහ විවිධ නිකුත්කරන්නන් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා භාරකරු ලෙස තෝරාගත් නිශ්කාශණ ආයතනයක් කටයුතු කරයි.

නිශ්කාශණ ආයතනයේ කැමැත්ත පරිදි එම බැඳුම්කර සඳහා වන ඉල්ලුම මත පදනම්ව ණය දීමට බලය පැවරෙන පරිදි ගිවිසුමක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය දීමට සම්බන්ධ නොවන බැවින් හා නිශ්කාශන ආයතන, ණයකරුවන්ට සෘජුවම ණයදෙන බැවින්, මෙම ක්‍රියාවලිය "ස්වයං බැඳුම්කර ණය දීම" ලෙස හඳුන්වයි. ස්වයං බැඳුම්කර ණය දීමේ වැඩසටහන යටතේ බැඳුම්කර සඳහා යම් ණයදීමක් සිදුකර ඇත්නම්, එක් එක් මාසය අවසානයේ භාරකරු විසින් ස්වයං බැඳුම්කර ණයදීම සඳහා ගාස්තු ශ්‍රී ලංකා මහ බැංකුවට එවනු ලබයි. හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතු වීම හේතුවෙන් බැංකුව විසින් එම සුරැකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගැනීම තවදුරටත් සිදු කරයි. මෙම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

(ඇ) සුරැකුම්පත් ඔඩපන කිරීම්

සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 ක සුරැකුම්පත් යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ. වර්තමානයේදී යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කරන ලද සුරැකුම්පත්වල වටිනාකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.5 කි. ඩොලර් මිලියන 30 ක ණය පහසුකම් ලබාගන්නා ලදී. වර්තමානයේදී යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කරන ලද සුරැකුම්පත්වල වටිනාකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.5 කි. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර්හි වෙනම ගිණුමක රඳවා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්වල ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීමෙන් හා යූරෝ ක්ලියර් පද්ධතියට සහභාගී වන පාර්ශ්වයන්ට ණය දීර්ඝ කිරීම් හැසිරවීමේ පොදු කොන්දේසි අදාලත්වය සලකා බැලීමෙන් අනතුරුව, 2017.01.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය පහසුකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 20 දක්වා අඩුකරන ලදී.

''යූරෝ ක්ලියර් පද්ධතියට සහභාගීවන පාර්ශවයන්ට ණය දීර්ඝ කිරීම් හැසිරවීමේ පොදු කොන්දේසි'' යන මාර්ගෝපදේශයන්ට අනුකූලව යුරෝ ක්ලියර් බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී තිබූ ඉහත ණය පහසුකම් 2018 නොවැම්බර් 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත.

ඉහත අත්හිටවූ ණය පහසුකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අවශ්‍යවන ක්‍රියාමාර්ග බැංකුව විසින් දැනටමත් ක්‍රියාත්මක කොට ඇති නමුත් මේ සම්බන්ධයෙන් යූරෝ ක්ලියර් බැංකුවේ ප්‍රතිචාරය 2020 අගෝස්තු 12වන දින සිටම ලැබී නොමැත.

2020 දෙසැම්බර් 31 දිනට ඇ.එ.ජ.ඩො. මිලියන 1,013.10 ක වටිනාකමින් යුත් ස්ථාවර ආදායම් සුරැකුම්පත් ඇමරිකානු ෆෙඩරල් රිසර්ව් බැංකුවට ඔඩපන කොට, 2020 සැප්තැම්බර් 28 වන දින බැංකුව විසින් PIMA ප්‍රතිමිලදී ගැනීමේ පහසුකම යටතේ ඇ.එ.ජ.ඩො. මිලියන 1000 ක මුදලක් රැස්කර ගන්නා ලදී. 2021 මාර්තු මස අවසන් වන විට මෙය ණය පහසුකමෙන් බැංකුව ඉවත් වී ඇත.

	2021	2020
	අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්	අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්
	රු. 000	රු. 000
වත්කම්		
සුරැකුම්පත් ණයදීම	-	430,965
යූරෝ ක්ලියර් බැංකුව වෙත	2,830,756	5,258,986
ඔඩපන කරන ලද සුරැකුම්පත ෆෙඩරල් රිසර්ව් බැංකුව වෙත	-	196,202,w362
ඔඩපන කරන ලද සුරැකුම්පත්		
වත්කම් වල ධාරණ අගය	2,830,756	201,892,313

55. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අනෙකුත් විශ්වාසතා තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

55.1 විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි ණය මුදාහැරීම සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

55.2 බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

55.3 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දා තම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

55.4 2010 සැප්තැම්බර් 28 දිනැති වූ 1673/11 අංක දරණ (සංශෝධිත) ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" සහ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදී.

තවද අංක 2239/52 දරණ ගැසට් පත්‍රය අනුව 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 01 දරණ ආරම්භ රෙගුලාසිය අවලංගු කරමින් 2021 අගෝස්තු 06 දිනැති නව රෙගුලාදි අංක 2, ශ්‍රී ලංකා තැම්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය ලෙස නිකුත්කොට ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 69 කි. ඉහත ගැසට් පත්‍රයේ 5.1 වගන්තියට අනුව සාමාජික ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් 2010 හා 2011 වර්ෂවල කරන ලද මුදල් මණ්ඩලයේ මගපෙන්වීම් අනුව 2012 ජනවාරි 1 දිනට පෙර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත සැලසුම්වලට අනුව ස්කන්ධය බවට පරිවර්තනය වූ අතීතයේ තැන්පත්කරුවන් වූ දැනට කොටස් හිමියන්ගේ කොටස් රක්ෂණය කෙරෙන අතර ඉහත ගැසට් පත්‍රයේ වගන්ති 5.2 ට අනුව වන තැම්පතු වගකීම් හා සියලු ණය උපකරණ රක්ෂණයෙන් ඉවත් කරනු ලැබේ.

රු.මි. 350.20 ක් වූ ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. 2021 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ප්‍රමාණය රු. මිලියන 67.887.33 ක් (විගණනය නොකළ) වන අතර, දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු.ලක්ෂ 11 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර තැන්පත් අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය තැන්පත් අරමුදලේ අවසරලත් ණය සහ එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති, පවත්නා මුදල් ප්‍රමාණයට සීමා විය යුතුය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමණාකරණ කටයුතු නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ පිහිටා ඇති තැන්පත් රක්ෂණ ඒකකය මගින් මූල්‍ය මණ්ඩලය මගින් අනුමත වූ රෙගුලාසි හා ප්‍රතිපත්තීන් වලට අනුව නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගේ අධීක්ෂණය හා උපදෙස් අනුව සිදු කෙරෙන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් වෙන් වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

55.5 ලියාපදිංචි මූල්‍ය සමාගම් නියාමනය කිරීම හා සුපරීක්ෂණ කටයුතු, මුදල් මණ්ඩලය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව, බැංකුව විසින් සිදුකරයි. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

55.6 ශ්‍රී. ලං.ම.බැ. මුදල් මණ්ඩලය වෙනුවෙන් රජය හා විදේශ විසින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් රජයේ අති විශේෂ නියෝජිතයා ලෙස ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

I ශ්‍රී ලංකා රජය හෝ අනුග්‍රාහකයෙකු විසින් මූල්‍යනය කළ ව්‍යාපෘති

(i) නිමකර අවසන් ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම / ණය යෝජනා ක්‍රමය	මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන)		ණය මුදලේ අරමුණ	සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන)
තේ සංවර්ධන ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	24.50	කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය	2,550.90
දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය	වි. ගැ. හි.	11.56	බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය	1,453.11
වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	40.00	ශ්‍රී ලංකාවේ භෝග කර්මාන්තයේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරගකාරී වාසිය පවත්වා ගැනීම	5,200.00
කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන	රුපියල්	2,656.00	සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම	2,663.40
කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන - චක්‍රීය අරමුදල	රුපියල්	150.00	සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම	122.72
හැකියා සංවර්ධන ව්‍යාපෘතිය	රුපියල්	94.31	ගුණත්වයෙන් අනුන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණත්වය වැඩි දියුණු කිරීම හා හැකියා නොගැලපීම් ආමන්ත්‍රණය කිරීම	94.59
නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	4.00	නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම	369.15
අඩු ආදායම් නිවාස සෙවණ ණය ඇපකර ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	25.00	රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන පුළුල් කිරීමට ආධාර කිරීම.	1,362.00
නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	වි.ගැ.හි	15.10	අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා නිවාස සංවර්ධනයට ආධාර කිරීම	1,915.76
වයඹ පළාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	1.80	වයඹ පළාත් වාසීන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ සුබ සාධනය වැඩි දියුණු කිරීම.	102.76
මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	වි.ගැ.හි	2.00	කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් තිරසාර වර්ධනය	249.06
රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය	වි. ගැ. හි.	11.56	රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම	642.00
කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය.	වි. ගැ. හි.	17.05	සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පුද්ගලයන් හා දේපල නැවත නගා සිටුවීම	843.00
කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති	ඇ.එ.ජ. ඩොලර්	12.60	කුඩා තේ වතු අංශය සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම	645.93
දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය	ජපන් යෙන්	1,368.00	ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම	1,402.45
ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	17.40	අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් අවම පිරිවැයක් සහිත තිරසාර ක්ෂුද්‍ර ණය බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම	345.69
කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය	වි. ගැ. හි.	1.50	ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම	148.00
දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය	වි. ගැ. හි.	27.90	දකුණු පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම	564.00
EIB ගිවිසුම් B	යූරෝ	10.00	සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත සේවා අංශ ද ඇතුළත්ව සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම	1,553.27

දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති - චක්‍රීය අරමුදල	රුපියල්	1,200.00	රට තුළ බහුවාර්ෂික භෝග අංශය නගා සිටුවීමට ණය පහසුකම් සපයා දීම	1,199.82
මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ - චක්‍රීය අරමුදල	රුපියල්	77.00	ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය	77.00
සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල	රුපියල්	100.00	සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා පවතින ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම	100.00
ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	යූරෝ	9.00	පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රියව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම	1,399.73
සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II	රුපියල්	70.00	සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම	70.00
දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී)	ජපන් යෙන්	2,381.00	ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රුපියල් 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම	3,213.20
ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය	රුපියල්	250.00	රටතුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම	232.39
වියලි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන	රුපියල්	252.95	අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල කෘෂිකර්මාන්තය ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් හරහා වැඩි ආදායමක් ඉපැයීමට අවස්ථාවක් සැලසීම	252.95
ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන	ඇ.එ.ජ. ඩොලර්	32.90	වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන් සඳහා අරමුදල් හා පුහුණුව සපයා දීම	113.13
කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	වි.ගැ.හි	2.60	නුවර එළිය, මහනුවර, කෑගැල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම	487.66
ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන (NADeP)	රුපියල්	1,049.84	තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ආදායම් සහ සමාජ තත්ත්වය වර්ධනය කිරීම	1,049.84
NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය	රුපියල්	135.69	කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම	135.69
NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන සෘතුමය කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය	රුපියල්	302.04	කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් තවදුරටත් වැඩි කිරීම	302.04
"තරුණ දිරිය" NADeP තරුණයින් බලගැන්වීමේ හා රැකියා යෝජනා ක්‍රමය	රුපියල්	288.48	කුඩා ව්‍යාපාර සහ අනෙකුත් ආකාරයේ ව්‍යවසායකත්ව ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැපයීම තුළින් ග්‍රාමීය මට්ටමේ දිළිඳු යෞවනයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා උපකාරී වීම.	288.48
වියලි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල	රුපියල්	252.90	අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම	252.89
සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල	රුපියල්	345.69	සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වේගය වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් ස්ථාපනය කිරීම	1,564.75
දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී)	රුපියල්	2,764.84	ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම මගින් දිළිඳු පවුල්වල ආදායම් තත්වය වැඩි දියුණු කිරීම	7,016.86
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Capital	ඇ.එ.ජ. ඩොලර්	30.29	වාණිජමය නැඹුරුවක් ඇති නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රියාවලියක නිරත 57,500 ක් පමණ වන කුඩා ව්‍යාපාර හිමියන්ගේ දිළිඳුකම අවම කිරීම, තරඟකාරීත්වය, ආදායම හා ලබාගන්නා ආහාර වේලේ ගුණාත්මක බව වර්ධනයට දායක වීම. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා නිෂ්පාදිත කන්ඩායම්වල ධාරිතාවය ගොඩනැගීම හා වැඩිදියුණු කිරීමත්, පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයෙන් සබඳතා ජාලය ශක්තිමත් කිරීමත් යන ක්‍රියාවලිය තුළින් අත්පත් කර ගනී	125.85
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Seasonal				854.05
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Youth				14.45
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Income Generation				106.42

(ii) දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම / ණය යෝජනා ක්‍රමය	මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන)		ණය මුදලේ අරමුණ	සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන)
තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල	රුපියල්	1,100.00	තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම	964.87
ස්වශක්ති ණය යෝජනා ක්‍රමය	රුපියල්	4,000.00	නව හා වත්මන් ව්‍යවසායකයින්ට මූල්‍ය සහනාධාර සැපයීම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම	4,273.60
''අත්වැල'' ස්වාභාවික ව්‍යසන මගින් හානිවූ ආර්ථික කටයුතු නැවත නඟා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ)	රුපියල්	2,000.00	රජය මගින් දැනුම් දී ඇති පරිදි ස්වභාවික ව්‍යසනයන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා සුදුසුකම් ලත් ණය ගැතියන්ට මූල්‍ය සහනාධාර සැපයීම	1,687.52
දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී)	රුපියල්	1,031.00	විධිමත් මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශ වීමට අපහසු ග්‍රාමීය දිළිඳු පවුල් සඳහා ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම්වලට ණය සැපයීම පිණිස ඵලදායී ණය ප්‍රදාන යාන්ත්‍රණයක් ස්තාපිත කිරීම	5,449.54
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Agribusiness	ඇ.එ.ජ. ඩොලර්	30.29	කෘෂි නිෂ්පාදනවල නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණාත්මක බව හා අගය එකතු කිරීම, වැඩි දියුණු කිරීම	419.48
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Youth				359.31
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Youth				132.26
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Agribusiness				11.98
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Income Generation				38.19
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P FI Bulk Loan.				58.85
කුඩා කෘෂි ව්‍යාපාර, හවුල්කාර වැඩසටහන RFFI Bulk Loan.				-
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Promoter Bulk Loan.				-
ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය - අදියර II (SEPI II)	රුපියල්	950.00	ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කළ යෞවනයන් සඳහා නව ව්‍යාපාරයන් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාරයන් වැඩි දියුණු කිරීමට සහාය දීම	491.13
සැපයුම් දාමය නැවත පණ ගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රමය (SCREL)	රුපියල්	500.00	ලියාපදිංචි තේ නිෂ්පාදනය කරන්නන්ගේ ප්‍රතිව්‍යුහගත ණය සැලසුම් අවසන් කිරීම සඳහා පවතින ව්‍යාපාරයන් නඟා සිටුවීම සහ සැපයුම් දාමය නැවත පණගැන්වීම සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවීමට නියමිත හිඟමුදල් පියවීම	201.75

56. වාර්තාකරණ දිනට පසු ඇතිවූ සිදුවීම්

පහත දැක්වෙන අයිතමය හැර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් වාර්තා කරන දිනට පසු ඇති නොවීය.

සටහන 48.3 හි හෙළිදරව් කර ඇති අන්දමට, විදේශ මුදල් වලින් වූ බැංකුවේ වත්කම් හා වගකීම් වර්ෂය අවසානයේ ඇති විනිමය අනුපාතිකය ප්‍රකාරව පරිවර්තනය කොට ඇත. මූල්‍ය ප්‍රකාශවල සටහන 48.3 හි දක්වා ඇති විනිමය අනුපාතිකයන්, වාර්තාකරණ දිනට පසු රුපියලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ශක්තිමත් වී ඇති අතර, එය විදේශ මුදලින් ඇති වත්කම් හා වගකීම් පසුව රුපියලට පරිවර්තනය කරන විට දී එම වත්කම් හා වගකීම් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තාකර ඇති අගයන් සමග සැසඳීමේදී වෙනස්වනු ඇත.

2. බැංකු අධීක්ෂණ

මෙරට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) අඛණ්ඩ අධීක්ෂණය, කාලීන පරීක්ෂා කිරීම සහ බැංකු පනතේ සහ මුදල් නීති පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රලාභී බැංකු සඳහා නියාමන නිකුත් කිරීම සඳහා විශේෂිත බලතල සහිතව, මුදල් නීති පනතේ 28 වගන්තිය යටතේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ සවිමත්භාවය තහවුරු කිරීම සහ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වේ.

එකී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු නියාමනය සහ අධීක්ෂණය සිදු කිරීම, බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, විචක්ෂණශීලී නියාමන සකස් කිරීම සහ නිකුත් කිරීම, බලපත්‍රලාභී බැංකු වල අඛණ්ඩ අධීක්ෂණය සහ කාලීන ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්, සහ ප්‍රධාන විධායක කාර්යයන් හි නිරත වන නිලධාරීන්ගේ යථා යෝග්‍යතාවය තක්සේරු කිරීම සහ අනුමත කිරීම, නියාමන අනුමැතීන් ලබා දීම, අවශ්‍ය තැන්හි දී මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති පරිදි නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ දැනුම්වත් කිරීම් සිදු කිරීම සහ ශක්‍යතා වර්ධනය යන ආදිය සිදු කරනු ලබයි.

2021 වසර අවසානය වන විට මෙරට බැංකු ක්ෂේත්‍රය බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය. මෙයට අමතරව, විදේශීය බැංකු වල නියෝජිත කාර්යාල 3ක් ද ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. තවද, ඉන්දියාවේ අයි සී අයි සී අයි බෑන්ක් ලිමිටඩ් හට ශ්‍රී ලංකාව තුළ නියෝජිත කාර්යාලයක් පිහිටුවීම සඳහා මුදල් මණ්ඩලය විසින් 2021 මාර්තු මස දී අනුමැතිය ලබා දෙන ලද අතර, එකී නියෝජිත කාර්යාලයේ මෙහෙයුම් කටයුතු 2022 ජනවාරි මාසයේ දී ආරම්භ කරන ලදී. මෙරට ක්‍රියාත්මක බලපත්‍රලාභී බැංකු සහ නියෝජිත කාර්යාලයන්ගේ නාමලේඛනය ඇමුණුම II-1 හි දක්වා ඇත.

2021 වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්ගේ සාරාංශයක් පහත දක්වා ඇත.

2.1. විචක්ෂණශීලී නියාමනයන් නිකුත් කිරීම

බලපත්‍රලාභී බැංකු විසින් කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් සහන නොනවත්වා ලබා දෙන අතරම, බැංකු ක්ෂේත්‍රයේ ස්ථායීතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පූර්වෝපායික විචක්ෂණශීලී නියාමන නිකුත් කිරීමට කටයුතු කරන ලදී. 2021 වසරේ දී හඳුන්වා දුන් ප්‍රධාන විචක්ෂණශීලී නියාමන ක්‍රියාමාර්ගයන් කිහිපයක් ලුහුඬින් පහත දක්වා ඇත. මෙකී නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසෙහි දක්වා ඇත.

(අ) බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම පිළිබඳ නියාමනයන්

(ආ) බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව

(ඇ) බලපත්‍රලාභී බැංකුවල ප්‍රතිසාධන සැලසුම් පිළිබඳ නියාමනයන්

(ඈ) බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයන් වෙත ප්‍රමුඛතා පදනමින් ණය ලබා දීමේ ඉලක්ක නියම කිරීම

(ඉ) බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කිරීම

(ඊ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විදේශ විනිමය ඉදිරි විකුණුම් හා මිලට ගැනීම් සීමා කිරීම

(උ) බලපත්‍රලාභී බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි සිදු කරන ආයෝජන සීමා කිරීම

(ඌ) උකස්කර මත ලබා ගන්නා නිවාස ණය සඳහා අයකළ හැකි උපරිම පොලී අනුපාත සහ බලපත්‍රලාභී බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාත පිළිබඳ නියාමනයන්

(එ) සංචාරක ක්ෂේත්‍රය සඳහා සහ කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත ලබා දුන් සහනයන් දීර්ඝ කිරීම

(ඒ) කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ බැංකු සේවා පවත්වාගෙන යාම

(ඔ) ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ් ආයතනය පිළිගත් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස නම් කිරීම

(ඕ) බලපත්‍රලාභී බැංකු වල වාර්ෂික බලපත්‍ර ගාස්තු

2.2 නව බැංකු පනත කෙටුම්පත් කිරීම

බලපත්‍රලාභී බැංකුවල නෛතික සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නව බැංකු පනතක් හඳුන්වා දීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට කටයුතු සිදු කරමින් පවතී. යෝජිත නව බැංකු පනතට සමානුපාතිකත්වය සඳහා විභේදිත නියාමන රාමුවක් හඳුන්වා දීම, ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම, ඒකාබද්ධ අධීක්ෂණය, බලපත්‍රලාභී බැංකුවල නිරාකරණ, මූල්‍යමය දණ්ඩනයන්/දඩ පැනවීම, සංස්පර්ෂිත අවදානම අවම කිරීම සඳහා බැංකුවලට සීමා නිර්ණ පැනවීම, අත්පත්කර ගැනීම්, මිලට ගැනීම් සහ ඒකාබද්ධ කිරීම් සඳහා ප්‍රතිපාදන ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන ඇතුළත් වේ. මෙම නව පනත 2022 වසර අවසන් වන විට ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කර සිටී.

2.3 මුදල් මණ්ඩලය සහ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ලබා දුන් අනුමැතීන්

(අ) බලපත්‍රලාභී බැංකු ඒකාබද්ධ කිරීම, අත්පත් කර ගැනීම් හා වසා දැමීම්

2018 වසරේ දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC) සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB) යන බැංකු ද්විත්වය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට අදාළ කටයුතු 2021 වසරේදීත් පවත්වාගෙන යන ලදී.

(ආ) බලපත්‍රලාභී බැංකු ශාඛා හා වෙනත් බැංකු ඒකක

2021 වර්ෂය අවසන් වන විට දී බැංකු ශාඛා සහ වෙනත් බැංකු ඒකක සඳහා වන ඉල්ලීම් 586ක් සලකා බැලූ අතර ඉන් 484ක් සඳහා අනුමැතීන් ලබා දී ඇත. විචක්ෂණශීලී හේතුන් මත ඉන් ඉල්ලීම් 102ක් ප්‍රතික්ෂේප කරන ලදී. (සංඛ්‍යා සටහන II-1). ඒ අනුව 2021 දෙසැම්බර් මස වන විට බැංකු ශාඛා 3,621ක්, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,783ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 6,342ක් ක්‍රියාත්මක විය.

II-1 සංඛ්‍යා සටහන

බැංකු ශාඛා හා වෙනත් බැංකු ඒකක සඳහා ලබා දුන් අනුමැතීන්

අනුමැතියේ ස්වභාවය	අනුමැතීන් සංඛ්‍යාව	
	ඉල්ලීම්	අනුමැතීන්
විවෘත කිරීම් සහ ස්ථාපනය කිරීම්	**428**	**366**
ශාඛාවන්	32	13
ස්වයංක්‍රීය සේවා සපයන යන්ත්‍ර	205	166
ශිෂ්‍ය ඉතුරුම් ඒකක	0	0
ජංගම බැංකුකරණ ඒකක සහ ජංගම රථ	0	0
වෙනත් බැංකුකරණ ඒකක	35	35
බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන්	156	152
ප්‍රතිස්ථාපන කිරීම්	**111**	**80**
ශාඛාවන්	94	67
ස්වයංක්‍රීය සේවා සපයන යන්ත්‍ර	12	8
වෙනත්	5	5
ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම හෝ ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම් සහ අත්හිටුවීම්	7	5
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හා අනෙකුත් ස්වයංක්‍රීය යන්ත්‍ර ස්ථාපනය සඳහා ලබා දුන් අනුමැතීන් අවලංගු කිරීම හා අත්හිටුවීම	7	5
බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන් සඳහා ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම් සහ අත්හිටුවීම්	33	28
මුළු එකතුව	**586**	**484**

(ඇ) වෙනත් නියාමන අනුමත කිරීම්

2021 වසර තුළ දී වෙනත් නියාමන අනුමැතීන් 502ක් ලබා දී ඇත. (සංඛ්‍යා සටහන II-2)

(ඈ) නියාමන ක්‍රියාමාර්ග

2021 වර්ෂයේ දී බලපත්‍රලාභී බැංකු විසින් බැංකු පනත හා එම පනත යටතේ නිකුත් කළ නියාමනයන්ට අනුකූල නොවන අවස්ථා 18ක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අදාළ බැංකුවලට නියම කරන ලදී.

II-2 සංඛ්‍යා සටහන

වෙනත් නියාමන අනුමත කිරීම්

අනුමැතියේ ස්වභාවය	අනුමැතීන් සංඛ්‍යාව
අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත් කිරීම හා ධූරයේ අඛණ්ඩව රැඳී සිටීම හා විදේශ විනිමය ව්‍යාපාර කටයුතුවල නිරත වන පුද්ගලයන්ගේ යථා යෝග්‍යතාව පරීක්ෂා කිරීම	268
සේවා බාහිරින් ලබා ගැනීමේ කටයුතු	32
වෙළඳපළ වටිනාකමට වඩා අඩු වටිනාකමකට දේපළ බැහැර කිරීම	18
දෙවන පෙළ ප්‍රාග්ධනයෙහි ණයකර ඇතුළත් කිරීම	8
උපරිම ණය අත්තිකාරම් සීමා ප්‍රමාණය ඉක්මවා යාම	5
අතහැර දැමූ දේපල ප්‍රතිපූරණයන්	1
කොටස් හිමිකම සඳහා ප්‍රමාණාත්මක අයිතිය ලබා ගැනීම	1
විදේශික සේවකයන් සඳහා නව වීසා බලපත්‍ර ලබා ගැනීම/වීසා බලපත්‍ර අළුත් කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම	20
වෙනත් අනුමත කිරීම්	149
මුළු එකතුව	**502**

2.4 අඛණ්ඩ අධීක්ෂණයන් සිදු කිරීම

(අ) බැංකු පද්ධතියේ දිගුකාලීන පැවැත්ම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා අවදානම් කලින් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ලෙස හා තැන්පත්කරුවන්ගේ අරමුදල්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් එක් එක් බැංකුවේ කටයුතු පිළිබඳව නිරන්තර අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය, අඛණ්ඩ අධීක්ෂණය යනුවෙන් හඳුන්වනු ලැබේ.

(ආ) බැංකු විසින් ජාලගත මාධ්‍ය පාදක කරගත් FinNet පද්ධතිය ඔස්සේ සතිපතා/මාසිකව/කාර්තුමය/වාර්ෂිකව, සපයන්නා වූ කාලීන මූල්‍ය හා විචක්ෂණශීලී තොරතුරු පදනම්ව නිරන්තර අධීක්ෂණයන් සිදු කරනු ලබයි. දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, නව ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 - මූල්‍ය උපකරණ හා නව වර්ගීකරණ විධාන අනුව නියාමන අවශ්‍යතා (2021 අංක 13 සහ 14 දරන බැංකු පනත් විධාන) හඳුන්වාදීම සම්බන්ධයෙන් ද සලකා බලමින්, මූල්‍ය දත්ත තාර්කික කිරීම සහ ඒකාබද්ධ කිරීම අරමුණු කරගනිමින්, දැනට පවතින ජාලගත මාධ්‍ය පාදක කරගත් අඛණ්ඩ සුපරීක්ෂණ වාර්තා කිරීමේ පද්ධතිය සමාලෝචනය කරමින් පවතී. ඒ අනුව FinNet පද්ධතිය හරහා නව වාර්තා 2ක් හඳුන්වා දුන් අතර තවත් වාර්තා 2ක් සංශෝධනය කරන ලදී.

(ඇ) විදේශ විනිමය අරමුදල් රැස්කිරීම/ලබා ගත් ණය දීර්ඝ කිරීම් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් මුහුණ දුන් අභියෝග හා ණය සහන මගින් ඇති වූ ද්‍රවශීලතා ආතතීන් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට විශේෂ වාර්තා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හා වාර්තා සැකසීම සඳහා අවශ්‍ය බැංකු

ක්ෂේත්‍රයේ සමුච්චිත දත්ත ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන සමඟ බෙදා ගැනීම ද සිදු කරන ලදී. තවද කාර්තුමය පදනමින් බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය පිළිබඳව මුදල් මණ්ඩලය දැනුම්වත් කරන ලද අතර බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය පිළිබඳ ඉදිරිපත් කිරීම් 13ක් ද විවිධ රැස්වීම්/සමුළු සඳහා සකස් කරන ලදී.

(ඈ) බැංකුවල කාර්යමණ්ඩලය/බාහිර පාර්ශවයන් විසින් කරන ලද වංචා, බැංකුවල කාර්යමණ්ඩලයේ විෂමාචාර ක්‍රියා වැනි කරුණු සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන්/මහජනතාව හෝ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු සිදු කරන ලදී. තවද 2021 වර්ෂය තුළ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආසන්න වශයෙන් 2012 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතට අදාළ ඉල්ලීම් 22ක් සම්බන්ධයෙන් කටයුතු සිදු කරන ලදී.

(ඉ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ විශේෂ පොලී යෝජනා ක්‍රමයට අදාළව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු රැස්කිරීම හා කාර්තුමය වශයෙන් මුදල් අමාත්‍යංශය වෙත එම තොරතුරු ලබාදීම සඳහා පහසුකම් සලසන ලදී. තවද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ විශේෂ පොලී යෝජනා ක්‍රමයට අදාළ අක්‍රමිකතා හඳුනා ගැනීම සඳහා විශේෂ දුරස්ථ පරීක්ෂණ 2ක් සිදු කරන ලද අතර එම අක්‍රමිකතා නිවැරදි කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබාදෙන ලදී.

(ඊ) බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණවල දී හඳුනාගන්නා ලද නියාමන ගැටලු නියමිත කාලරාමු තුළ දී විසඳාගැනීමේ ප්‍රගතිය කාර්තුමය පදනමින් අධීක්ෂණය කිරීම ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

2.5 කාලීන පරීක්ෂණ පැවැත්වීම

(අ) 2021 වසර තුළ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ විෂය පථය ආවරණය වන පරීක්ෂණ සහ පසු විපරම් පරීක්ෂණ ඇතුළුව ව්‍යවස්ථාපිත පරීක්ෂණයන් 22ක් පවත්වන ලදී. මේ අතරින් 2021 අප්‍රේල් මස සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ සිදු කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 12ක්, කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල රට තුළ පැතිරීම හේතුවෙන් බැංකු වෙත යෑමට ඇති සීමා සැලකිල්ලට ගනිමින් දුරස්ථ පදනමින් පවත්වන ලදී.

(ආ) ඉහත කරුණු වලට අමතරව, අපනයන ආදායම් සහ විදෙස් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ, විදේශ මුදල් ගනුදෙනු, ටෙලිග්‍රැෆික් පැවරුම්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් සිදු කරන ලද මුදල් ආපසු ගැනීමේ ගනුදෙනු සහ කොවිඩ්-19 සහන යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සහන කාලය තුළ දී බැංකු විසින් සිදු කරන ලද ණය සහ අත්තිකාරම් ගිණුම් වර්ගීකරණයට අදාළ කරුණු තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු කිහිපයක සීමිත විෂය පථයක් සහිත ස්ථානීය පරීක්ෂණ 11ක් පවත්වන ලදී. මෙම ස්ථානීය පරීක්ෂණවල සොයාගැනීම් මත පදනම්ව, අවශ්‍ය පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට/අධිපති/ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත වාර්තා ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු හෝ මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු වෙත දැනුම් දෙන ලදී. 2020 වර්ෂයේ දී බැංකු 4ක පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ පිළිබඳ වාර්තා 2021 දී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ අනුව 2020 වසරේ පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ පිළිබඳ සියලු වාර්තා 2021 වසරේ පළමු මාස 3 තුළ සම්පූර්ණ කරන ලදී. ඊට අමතරව, 2021 වසරේ දී, බැංකු 3ක පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 3ක අතුරු වාර්තා සහ දුරස්ථ පදනමින් බැංකු 5ක පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා 5ක් ද ඇතුළුව බැංකු 11ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා 14ක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර මෙම වසරට අදාළ අනෙකුත් ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා මේ වන විට නිම කෙරෙමින් පවතී.

(ඇ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ අවදානම මත පදනම් වූ ව්‍යවස්ථාපිත පරීක්ෂණ 4ක් පවත්වන ලද අතර, එහි දී පරීක්ෂණ විෂය පථය බැංකු සමූහ තුළ පවතින ආයතන දක්වා ව්‍යාප්ත කරන ලදී. ඒ අනුව ඒකාබද්ධ පදනමින් කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයක පරීක්ෂණ වාර්තාව 2021 වසරේ දී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, අනෙකුත් පරීක්ෂණ වාර්තා 3 මේ වන විට නිම කෙරෙමින් පවතී.

(ඈ) 2021 වර්ෂය තුළ දී, බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ දර්ශකය පදනම් කර ගනිමින්, අභ්‍යන්තර අරමුණු සඳහා පමණක් බලපත්‍රලාභී බැංකු 30ක ශ්‍රේණිගත කිරීම් සිදු කරන ලද අතර, මෙහි දී බැංකුවල කාර්යක්ෂමතාව, තිරසාරත්වය සහ සමස්ත තක්සේරුව පෙන්නුම් කරන ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සංරචකයන්ගේ එකතුවක් යොදා ගන්නා ලදී. ඒ අනුව බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ දර්ශකය පදනම් කර ගනිමින්, ඒ ඒ බලපත්‍රලාභී බැංකු සඳහා ලබා දුන් ශ්‍රේණිගත කිරීම් සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය පිළිබඳව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන කාලීන වාර්තාව සමඟ ඉදිරිපත් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නියෝග ප්‍රකාරව 2021.10.01 සිට බලපත්‍රලාභී බැංකුවල සිදු කරන ව්‍යවස්ථාපිත පරීක්ෂණ බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ දර්ශක රාමුව අනුව සිදු කිරීම ආරම්භ කරන ලදී. එසේම සියලු බලපත්‍රලාභී බැංකු සඳහා ලබා දුන් ශ්‍රේණිගත කිරීම් ප්‍රමාණාත්මක සංරචක පදනම් කර ගනිමින් කාර්තුමය වශයෙන් නැවත ඇගයීම සිදු කරන ලදී.

2.6 බැංකු අංශයේ දැනුම්වත්භාවය හා ධාරිතා වර්ධනය

(අ) ධාරිතා වර්ධනය

බැංකු අංශයේ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සැපයීම මෙන්ම, තම කාර්යමණ්ඩලය සඳහා පුහුණු හා සංවර්ධන අවස්ථා සැලසීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2021 වසරේදීත් අඛණ්ඩව කටයුතු කරන ලදී. මෙම වැඩසටහන් බහුතරයක් අතථ්‍ය (virtual) ක්‍රම යොදා ගනිමින් පැවැත්වූ අතර, බැංකුකරණය සහ මූල්‍ය, නියාමන අනුකූලතාව, අවදානම් කළමණාකරණය, තාක්ෂණික/සයිබර් ආරක්ෂණ අවදානම, දේශගුණික විපර්යාස අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර මූල්‍ය වැනි ක්ෂේත්‍ර මෙමඟින් ආවරණය විය. තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම වසරේදීත් විවිධ කමිටු රැසක සාමාජිකත්වය දරමින් අඛණ්ඩව සේවය සැපයීමට කටයුතු කර ඇත.

(ආ) බැංකු සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම

මහ බැංකු අධිපතිතුමා මුලසුන දරමින් ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනය, බැංකු ක්ෂේත්‍රය, රෙගුලාසි හා අධීක්ෂණ රාමුව යන කාරණා මහ බැංකුව හා බැංකු ක්ෂේත්‍රය අතර නිරන්තර සාකච්ඡාවට ලක් කිරීමේ අරමුණින් මාසිකව පවත්වනු ලබන බැංකු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීම් පැවැත්වීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ලේකම් කටයුතු සිදු කරන ලදී. ඒ අනුව, 2021දී මාසික රැස්වීම් 11ක් සහ විශේෂ රැස්වීම් 2ක් භෞතිකව/අතථ්‍ය ක්‍රම යොදා ගනිමින් පවත්වන ලදී. මීට අමතරව, බැංකු අංශයේ කාර්යසාධනය, ආර්ථිකයේ මෙන්ම දේශීය සහ ගෝලීය නියාමන රාමුවන් හි ඇති වූ වර්ධනයන් සහ මෙකී සුවිශේෂී තත්ත්වයන් හමුවේ නියාමකයින්ගේ අපේක්ෂාවන් පිළිබඳ අවබෝධයක් ඇති කිරීමේ අරමුණින්, බැංකු සභාපතිවරුන්ගේ රැස්වීමක් ද සංවිධාන කෙරිණි.

බැංකු අංශයේ තිරසාර බව සහතික කර ගැනීම හා නිසි අධීක්ෂණය හා කාලීන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින් ඒ ඒ බැංකුවලට විශේෂිත වූ ගැටලු සාකච්ඡා කිරීම උදෙසා අදාළ බලපත්‍රලාභී බැංකුවල ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩල, කමිටු සඳහා නිරන්තර රැස්වීම් පැවැත්විණි. මීට අමතරව, බැංකුවල විගණනයන් හිදී විශේෂයෙන් සැලකිය යුතු කරුණු හා කොවිඩ්-19 පැතිරීම මධ්‍යයේ ගිණුම්කරණ ප්‍රමිතීන් ඒකාකාරීව යොදාගැනීම සම්බන්ධව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකුවල බාහිර විගණන ආයතන හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සමඟ සාකච්ඡා පවත්වා ඇත.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාව, සුරක්ෂිතතාව සහ සවිමත්භාවය තහවුරු කිරීම සඳහා සහ සාමාජික ආයතන අතර සහයෝගීතාවයට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය අංශ නියාමකයින්ගේ ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් මූල්‍ය පද්ධති අධීක්ෂණ සභාවේ (Financial System Oversight Council - FSOC) රැස්වීම් දෙකක් සංවිධානය කරන ලදී.

ඇමුණුම II-1

2021.12.31 දිනට බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය

බලපත්‍රලාභී වාණිජ බැංකු

1. අමානා බැන්ක් පී එල් සී
2. ලංකා බැංකුව
3. බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
4. කාගිල්ස් බැන්ක් ලිමිටඩ්
5. සිටි බැන්ක් එන් ඒ
6. කොමර්ෂල් බැන්ක් ඔෆ් සීලෝන් පී එල් සී
7. ඩොයිචේ බැන්ක් ඒ ජී
8. ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී
9. හබීබ් බැන්ක් ලිමිටඩ්
10. හැටන් නැෂනල් බැන්ක් පී එල් සී
11. ඉන්දියන් බැන්ක්
12. ඉන්දියන් ඕවර්සීස් බැන්ක්
13. එම් සී බී බැන්ක් ලිමිටඩ්
14. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
15. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී
16. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී
17. මහජන බැංකුව
18. පබ්ලික් බැන්ක් බර්හාඩ්
19. සම්පත් බැන්ක් පී එල් සී
20. සෙලාන් බැන්ක් පී එල් සී
21. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක්
22. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
23. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
24. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී

බලපත්‍රලාභී විශේෂිත බැංකු

1. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
2. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
5. ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්
6. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

විදේශ බැංකු වල නියෝජිත කාර්යාල

1. දෝහා බැන්ක් කිව් පී එස් සී
2. ජේ පී මෝගන් චේස් බැන්ක් එන් ඒ
3. එම් යූ එෆ් ජී බැන්ක් ලිමිටඩ්

3. බැංකු විදු පියෙස

1981 සැප්තැම්බර් 15 දින පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කේන්ද්‍රය වන බැංකු විදු පියෙස මූල්‍ය සේවා අංශයේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේ උපායමාර්ගික කාර්යභාරය අඛණ්ඩව ඉටු කරමින් 2021 වර්ෂයේ දී සිය 40 වන වසරට පියමං කළේය. කොවිඩ්-19 වසංගතය අඛණ්ඩව ව්‍යාප්තවීම හේතුවෙන් ඇති වූ අභියෝග මධ්‍යයේ වුවද මූල්‍ය අංශයේ ඉල්ලීම් සපුරාලීම සඳහා වසර තුළ දී පැවැත්වීමට සැලසුම් කළ පුහුණු වැඩසටහන් සහ අනෙකුත් වැඩසටහන් සියල්ලම උසස් තත්ත්වයෙන් යුතුව පැවැත්වීම කෙරෙහි 2021 වර්ෂයේ දී බැංකු විදු පියෙසෙහි විශේෂ අවධානය යොමු විය.

වෘත්තීයවේදීන්ගේ තාක්ෂණික හා මෘදු කුසලතා වර්ධනය සහතික කිරීම සඳහා බැංකු හා මූල්‍ය අංශයට අදාළව පුළුල් පරාසයක ක්ෂේත්‍ර ආවරණය වන පරිදි බැංකු විදු පියෙස විසින් පුහුණු වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී. අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ (SEACEN) පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය සහ ජර්මනියේ මහ බැංකුව වන Deutsche Bundesbank ඇතුළු පිළිගත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහයෝගිත්වයෙන් සිදු කළ වැඩසටහන් ද මේ අතර වේ. තවද, ප්‍රමිතිගත සහතික පත්‍ර පාඨමාලා ව්‍යාප්ත කිරීමේ අරමුණින් "මූල්‍ය වෙළඳපොළ" පිළිබඳ නව සහතිකපත්‍ර පාඨමාලාවක් ද බැංකු විදු පියෙස විසින් පවත්වන ලදී. 2021 වර්ෂයේ දී, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහාය ඇතිව ශ්‍රී ලංකාව තුළ තිරසර මූල්‍යනය (Sustainable Finance) ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී කුසලතා සංවර්ධන හවුල්කරුවකු ලෙසද බැංකු විදු පියෙස කටයුතු කළේය. බැංකු විදු පියෙස විසින් 2021 වර්ෂය තුළ දී පැවැත්වීමට සැලසුම් කළ පුහුණු වැඩසටහන් 48ක්, බාහිර පාර්ශ්ව ඉල්ලීම් මත සකස් කළ විශේෂ වැඩසටහන් 27ක් හා විශ්වවිද්‍යාල හා පාසල් සිසුන්ට මෙන්ම වර්තමාන ආර්ථික ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ මාතෘකා පිළිබඳව මහජනතාවට විවෘත වූ වැඩසටහන් 43ක් ලෙස වැඩසටහන් 118ක් පවත්වන ලදී. බැංකු විදු පියෙසෙහි සම්බන්ධීකරණයෙන් මංගත ක්‍රමවේදයන් ඔස්සේ පැවැත්වූ පුහුණු වැඩසටහන් සඳහා වර්ෂය තුළ දී පුද්ගලයන් 4,741ක් සහභාගි වූ අතර මහජනතාවට විවෘත වූ වැඩසටහන් සඳහා පුද්ගලයන් 6,802ක් සහභාගි විය. මීට අමතරව ආර්ථික විද්‍යාව හදාරන උසස් පෙළ සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් "තක්ෂිලාව" හා "අරිවූට්රු" නම් රූපවාහිනී වැඩසටහන් මාලා දෙකක් ද බැංකු විදු පියෙස විසින් සම්බන්ධීකරණය කරන ලදී.

බැංකු විදු පියෙස සිය 40 වන සංවත්සරය නිමිත්තෙන් 2021 වසරේ දී විශේෂ වැඩසටහන් කිහිපයක් සංවිධානය කළේය. "දැනුම පරතරය පියවීම හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයේ විශ්වාසය රැකගැනීම" යන මාතෘකාව යටතේ පැවැත්වූ සාංවත්සරික දේශනය හා "ඩිජිටල් මූල්‍ය පරිවර්තනය" පිළිබඳ විශේෂයෙන් සැලසුම් කරන ලද දේශනය එවැනි වැඩසටහන් දෙකක් වන අතර මෙම වැඩසටහන් බොහෝ දෙනෙකුගේ ප්‍රසාදය දිනාගනිමින් ඒ ක්ෂේත්‍රය හා සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ මෙන්ම මහජනතාවගේ ද සැලකිය යුතු අවධානයකට ලක් විය. 2021 වසරේ දී ප්‍රථම වරට බැංකු විදු පියෙස විසින් විද්වත් මණ්ඩල කතිකාවක් (Expert Panel Discussion) හඳුන්වා දෙනු ලැබූ අතර එහි පළමු කතිකාව ලෙස 2022 වසර සඳහා රජයේ අයවැය ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ සම්බන්ධව සංවිධානය කරන ලද අයවැය පිළිබඳ සම්මන්ත්‍රණය පැවැත්වීය. මෙහි විශේෂත්වය වනුයේ මහ බැංකුවේ සම්බන්ධීකරණය යටතේ පැවැත්වූ අභිනව අයවැය සම්මන්ත්‍රණය වීමයි. මීට අමතරව සිය 40 වන සංවත්සරය හා සමගාමීව නවීන විශේෂාංග ඇතුළත් කරමින් නවීකරණය කරන ලද බැංකු විදු පියෙසේ වෙබ් අඩවිය ද එළි දක්වන ලදී (www.cbs.cbsl.lk). මෙම තාක්ෂණික වැඩිදියුණු කිරීම්වලට සමගාමීව බැංකු විදු පියෙසෙහි වෙබ් අඩවිය 2022 වසරේ මුල් කාලයේ දී ආයතනික කළමනාකරණ පද්ධතිය සමඟ ද සම්බන්ධ වනු ඇති අතර එමගින් බැංකු විදු පියෙසට මෙතෙක් පුද්ගල මැදිහත් වීමක් අවැසි ක්‍රියාදාමය, ස්වයංක්‍රීයව, ආරක්ෂිතව හා පහසුවෙන් සිදු කළ හැකි වනු ඇත.

බැංකු විදු පියෙස විසින් එහි පවත්වනු ලබන වැඩසටහන්වල අන්තර්ගතය, දේශන පවත්වන ආකාරය හා අනිකුත් සේවාවන් වර්ධනය කිරීමේ අරමුණෙන් සිදු කරන පසු ඇගයුම් ක්‍රියාවලිය එම අරමුණ ඉටු කරගැනීම සඳහා විද්‍යාත්මකව උපයෝගී කර ගන්නා ලදී. අනාගත පුහුණු වැඩසටහන් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මූල්‍ය අංශයේ ප්‍රවීණයින්ගෙන් සමන්විතව පිහිට වූ පීඨ උපදේශන කමිටුවේ (Faculty Advisory Committee) සහාය අඛණ්ඩව ලබා ගනිමින් පුළුල් උපදේශන හුවමාරු ක්‍රියාවලියක් සිදුකරන ලදී. එමෙන්ම බැංකු විදු පියෙස මූල්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා සොයාබැලීම් හා විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය නවීකරණය කිරීම අරමුණු කරගනිමින් සකස් කරන ලද පුහුණු අවශ්‍යතා සමීක්ෂණයක් මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සහ මානව සම්පත් වෘත්තිකයින් ආවරණය වන පරිදි පුළුල් ලෙස සිදු කරන ලදී. එම ක්‍රියාවලිය තුළින් ලබාගත් තොරතුරු සහ සමීක්ෂණයේ ප්‍රතිඵල මත 2022 වසර සඳහා වූ වැඩසටහන් නාමාවලිය සකස් කෙරුණි. ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ අඛණ්ඩව හා ඵලදායීව සම්බන්ධ වීමේ ප්‍රතිඵලයක් ලෙස, බැංකු විදු පියෙස විසින් මූල්‍ය අංශයෙන් ඔබ්බට ගොස් ආර්ථිකයේ අනෙකුත් ක්ෂේත්‍ර ගණනාවක් වෙත සිය පුහුණු වැඩසටහන් ප්‍රසාරණය කිරීම සඳහා අඩිතාලම ද, 2021 වසරේ දී සකස් කරන ලදී.

4. සන්නිවේදන

2021 වර්ෂය වෙත ද බලපෑම් ඇති කළ කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ පනවන ලද සංචරණ සහ වෙනත් සීමා හමුවේ උද්ගත වූ අභියෝගාත්මක තත්ත්වයන් යටතේ, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය හමු සම්බන්ධීකරණය, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යනාදිය මගින් සිය පාර්ශ්වකරුවන් වෙත කලට වේලාවට තොරතුරු බෙදා හැරීම මගින් මහ බැංකුවේ ප්‍රධාන සහ අනෙකුත් අරමුණු සඳහා අඛණ්ඩ සහයෝගය ලබා දුණි.

4.1 ප්‍රධාන කාර්යයන්

සමස්තයක් ලෙස, සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළෙඳපොළ කටයුතුවලට අදාළව මුදල් මණ්ඩලය ගත් තීරණ විස්තර

කරමින් මාධ්‍ය නිවේදන 1961ක් ජාතික භාෂා ප්‍රතිපත්තියට අනුගත වෙමින්, භාෂාත්‍රයෙන් ම නිකුත් කෙරිණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතුවල විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා භාවිත කෙරෙන එක් ප්‍රධාන මෙවලමක් වන්නේ මාධ්‍ය බැවින් මහ බැංකුව විසින් කෙරෙන්නේ කුමක්ද සහ එසේ කරන්නේ ඇයි ද යන්න පිළිබඳව මහජනතාව වෙත සන්නිවේදනය කිරීමේ අරමුණින් මාධ්‍ය හමු 14ක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ඉදිරි ගමන්මඟ සන්නිවේදනය කිරීමට 2021 ජනවාරි සහ ඔක්තෝබර් මස පවත්වන ලද "පෙර දැක්ම: 2021 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති" සහ ඉදිරි දින දර්ශනයට අනුව සංවිධානය කරන ලද, අඩකටත් වඩා ප්‍රමාණයක් මංගතව පවත්වනු ලැබූ මාධ්‍ය සාකච්ඡා 8ක් ද මීට ඇතුළත් විය.දේශීය පර්යේෂණායතන විසින් පුවත්පත්වල පළ කෙරෙන ප්‍රතිපත්තිමය අනුපාත පිළිබඳ අනාවැකි පුරෝකථන සහ ඒ පිළිබඳ ඔවුන්ගේ මතය සාරාංශගත කොට මුදල් මණ්ඩල රැස්වීම්වලට පෙර ඉදිරිපත් කිරීම සන්නිවේදන දෙපාර්තමේන්තුවේ සහභාගීත්වයෙන් අඛණ්ඩ ව සිදු විය. එසේ ම මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය කොතරම් දුරට මහජනයා විසින් ග්‍රහණය කර ගන්නවා ද සහ මහජන අපේක්ෂාවන් කෙතෙක් දුරට එමගින් ඉටු වනවා ද යන්න මැන ගැනීමට ද එය ඉවහල් වේ. මුදල් ප්‍රතිපත්ති නිවේදනය කෙරෙන සෑම මාධ්‍ය හමුවකින් ම සතියකට පසු ඉදිරිපත් කෙරෙන මුදල් ප්‍රතිපත්ති සමීපතා වාර්තාව මගින් මුදල් ප්‍රතිපත්ති විවරණයෙන් ප්‍රකාශිත මූලික පණිවුඩ සන්නිවේදනය වීමේ ඵලදායිතාව මැන ගැනීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණ කෙරෙහි මාධ්‍ය දක්වන ප්‍රතිචාර නිසි ලෙස තක්සේරු කිරීම බලාපොරොත්තු වේ.නිවැරදි මුදල් ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රයත්නයට සන්නිවේදන දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම මෙම කටයුතුවල අරමුණ වේ. නොසැලකිලිමත්කම නිසා හෝ සිතාමතා හෝ ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් පළ වන සාවද්‍ය මාධ්‍ය වාර්තා නිවැරදි කිරීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අවස්ථාවන්හි නිසි පියවර ගනු ලැබිණි. එමෙන්ම, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීමට සහ වෙළෙඳපොළ අපේක්ෂාවන්ට මඟ පෙන්වීමේ අරමුණින් මුදල් ප්‍රතිපත්ති විවරණය නිවේදනය කිරීමෙන් සතියක් පමණ ඇතුළත කාර්තුමය පදනමක් මත ආර්ථික පර්යේෂණ, ප්‍රාදේශීය සංවර්ධන සහ බැංකු විදු පියස යන දෙපාර්තමේන්තුවල සහයෝගයෙන් ප්‍රාදේශීය මට්ටමින් මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මංගත දැනුවත් කිරීමේ වැඩසටහන් ද පැවැත්වීමට කටයුතු කරන ලදී. 2021 වසරේ දී මාතර, ත්‍රිකුණාමලය, අනුරාධපුර සහ කිළිනොච්චි යන ප්‍රාදේශීය කාර්යාලවල දී එවැනි වැඩසටහන් හතරක් පැවැත්විණි.

සමාජ මාධ්‍ය අධීක්ෂණ ඒකකය පිහිටු වීම ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුව සමාජ මාධ්‍ය තුළ පෙනී සිටීම ශක්තිමත් කළ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරෙන සියලු සමාජ මාධ්‍ය ගැටලු සඳහා පිළියම් යෙදීමේ ක්‍රියාවලිය සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් වඩාත් විධිමත් කෙරිණි. එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා දෙන පණිවුඩ ජනගහණයේ නූතන තාක්ෂණය හා බැඳී සිටින ප්‍රජාව කරා ගෙන යාම වර්ධනය කිරීමට 2021 වසරේ දී සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රචාරණ වේදිකා මංගත පුවත් වෙබ් අඩවි දක්වා වර්ධනය කරන ලදී. තවද, මූල්‍ය ආයතන සම්බන්ධව මහ ජනතාවගේ පැමිණිලි යොමු කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවියේ ඒ කාර්යය සඳහා වෙනම වෙබ් පිටුවක් හඳුන්වා දීමට ද සන්නිවේදන දෙපාර්තමේන්තුව කටයුතු කළේය.

4.2 වෙනත්

විදේශීය ප්‍රේෂණ, ඩිජිටල් ආර්ථිකය වැනි පුළුල් පරාසයක පවතින මාතෘකා ගණනාවක් ආවරණය කරමින් අමතර මාධ්‍ය හමු කිහිපයක් ද පැවැත්වීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. තවද, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ප්‍රචාරණ දැන්වීම් ඇතුළුව පුවත්පත් දැන්වීම් නිකුත් කරනු ලැබූ අතර, 2021 වසර තුළ දී, කලින් කලට, අනෙකුත් දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවන්ට අනුව ගැසට් නිවේදන නිකුත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී. විදුලි පැවරුම් (විනිමය) අනුපාතික, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ (SLIBOR) අනුපාතික සහ ප්‍රතිපත්ති අනුපාතිකවලට අදාළව කෙටි පණිවුඩ සේවාව හරහා තත්කාලීන දැනුම් දීම් ද සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. තවද මෙම දෙපාර්තමේන්තුව විසින් විවිධ ඉලක්ක ප්‍රේක්ෂක ප්‍රජාව වෙත තම පණිවුඩය රැගෙන යාමට ප්‍රචාරණයේ ක්‍රමවේද වැඩිදියුණු කරන ලදී. වාණිජ බැංකු ඔස්සේ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සඳහා පුවත්පත් ප්‍රචාරණ දැන්වීම් සහ අවිධිමත් මාර්ගවලින් කෙරෙන විදේශීය ප්‍රේෂණවලින් වැළකී සිටින මෙන් මහජනතාවගෙන් ඉල්ලීම් කෙරෙන පුවත්පත් දැන්වීම්වලට අමතරව, විකල්ප මංගත පුවත් වෙබ් අඩවි සහ ගුවන් විදුලි කෙටි දැන්වීම් මගින් ද ඒවා ප්‍රචාරණය කරමින් සන්නිවේදන දෙපාර්තමේන්තුව තම කාර්යයන් සමුදාය ප්‍රසාරණය කළේය.

අධික ණයගැතිභාවය මැඩපැවැත්වීමේ අරමුණින් ගෘහ අංශයේ මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව, ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ බැංකු විදු පියස ඒකාබද්ධව පුළුල් ලෙස, මාධ්‍ය භාවිත කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන්වල විෂය පථය වැඩි දියුණු කළේය. මෙම කර්තව්‍යයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ද සහයෝගයෙන් සජීවී ගුවන් විදුලි සාකච්ඡාවක් සහ කෙටි දැන්වීම් මාලාවක් ඇතුළු ගුවන් විදුලි වැඩසටහන් පවත්වා ගෙන යන ලදී. ඊට අමතරව, රූපවාහිනී සාකච්ඡා, අත්පත්‍රිකා වැඩසටහනක්, පෝස්ටර සහ ස්ටිකර් වැඩසටහනක්, පුවත්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකු වාර සඟරාවල ලිපි පළ කිරීම, මෙම කාර්යය සඳහා ම වෙන් කළ සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් සහ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා මාධ්‍ය නිවේදන නිකුත් කිරීම ද මූල්‍ය සාක්ෂරතා දැනුවත්භාවය ඇති කිරීමේ වැඩසටහනෙහි කොටසක් විය. එමෙන්ම, සන්නිවේදන දෙපාර්තමේන්තුව මහ බැංකු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ලේඛන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා භාෂා ත්‍රිත්වයෙන් ම වැඩසටහන් පවත්වන ලදී.

සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් "ව්‍යවහාර මුදල් නිකුතුව සහ කළමනාකරණයේ සැත්තෑ වසරක ගමන්මඟ"

යන මැයෙන් ව්‍යවහාර මුදල් පිළිබඳ විශේෂ ග්‍රන්ථයක් පළ කරනු ලැබූ අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂිකා (විශ්‍රාමික) ශෙලෝමි එච්. ගුණවර්ධන මෙනෙවිය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරු (විශ්‍රාමික) ඩබ්. එම්. කේ. වීරකෝන් මහතාගේ සම කර්තෘත්වයෙන් එළි දුටුවේය. මෙම ග්‍රන්ථය මහ බැංකුවෙහි ආර්ථික ඉතිහාස කෞතුකාගාරයේ අලෙවි කවුළුව, රාජගිරියේ පිහිටි බැංකු විදු පියසෙහි අලෙවි සැල සහ ප්‍රාදේශීය කාර්යාලවල අලෙවි කවුළු මගින් අලෙවි කරන ලදී. වසංගත කාලය තුළ ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා සහ රට වසා දැමීමේ තත්ත්වයන් හේතුවෙන් ප්‍රකාශන අලෙවි කවුළු වරින් වර වසා දමනු ලැබුව ද, 2020 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව ඇතුළුව, ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන තොග අලෙවි සිදු කිරීම සඳහා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය ඔස්සේ පොත් අලෙවි සැල් වෙත පහසුකම් සලසා දෙනු ලැබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රට වසා දැමීමේ තත්ත්වයන් හමුවේ වුව ද මහජනතාවට කාලීනව මෙම ප්‍රකාශන වෙත පිවිසීමට හැකියාව ලැබුණි. කාර්යක්ෂම ගනුදෙනු තහවුරු කිරීමට සහ මුදල් භෞතික වශයෙන් හැසිරවීම අවම කිරීම සඳහා ණයපත්, හරපත් සහ QR කේත ගෙවීම් වැනි විකල්ප ගෙවීම් ක්‍රම ආර්ථික ඉතිහාස කෞතුකාගාර අලෙවි කවුළුව වෙත හඳුන්වා දෙනු ලැබිණි. එසේම, උසස් පෙළ සඳහා ආර්ථික විද්‍යාව ඉගැන්වෙන පාසල්වලට සහ රට පුරා ඇති මහජන පුස්තකාලවලට විවිධ මහ බැංකු ප්‍රකාශනවල පිටපත් නොමිලේ බෙදා දීම ද සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් සිදු විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහාය ඇතිව උසස් පෙළ ආර්ථික විද්‍යාව ඉගැන්වෙන පාසල් අතර 2020 වාර්ෂික වාර්තාව ද බෙදා හැරිණි.

වසංගතයෙන් එල්ල වූ අභියෝග හමුවේ වුව ද, සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ඡායාරූප සහ වීඩියෝ ඒකකය මගින් 2021 වසරේ දී මහ බැංකුවේ සියලු අවස්ථා නොකඩවා ආවරණය කෙරුණු අතර, එවැනි අවස්ථාවල වීඩියෝ පටිගත කිරීම් කලට වේලාවට මහ බැංකුවේ ආයතනික වෙබ් අඩවිය සහ YouTube වෙත ඇතුළත් කිරීම ඇතුළුව, සියලු ආශ්‍රිත සේවා සැපයිණි. 2020 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව, සටහන, නිව්ස් සර්වේ සහ වයිප්පහම් වැනි වාර සඟරා, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාන-2021, ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2021 ඇතුළුව, මහ බැංකුවේ සියලු මුද්‍රණ අවශ්‍යතා සඳහා මහ බැංකුවේ ප්‍රසම්පාදන අංශයෙන් පහසුකම් සැලසුණු අතර, 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු මුද්‍රණ වැඩ කටයුතු බාහිර මුද්‍රණකරුවන් ගෙන් සපයා ගැනුණි.

4.3 අභ්‍යන්තර සන්නිවේදනය

මහ බැංකු නිලධාරීන් මුදල් සහ මූල්‍ය අංශයේ වත්මන් කටයුතු සම්බන්ධව මෙන්ම, දේශීය සහ ජාත්‍යන්තර වේදිකා තුළ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ අනෙකුත් අංශ සම්බන්ධව ද මනා දැනුවත්භාවයකින් සිටින බව තහවුරු කිරීමට අභ්‍යන්තර සන්නිවේදනය ශක්තිමත් කෙරිණි. භාෂාත්‍රයෙන් ම පළ වූ ජාතික පුවත්පත්වලින් උපුටා ගත් ලිපි සහ මහජන මතයන් මාසික පදනමක් මත ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා සාරාංශගත කෙරිණි. එසේ ම මංගත ව පළ කෙරෙන මහ බැංකුවට අදාළ ප්‍රවෘත්තිවල සාරාංශයක් ද විද්‍යුත් තැපෑල මගින් දිනපතා ඉහළ කළමනාකාරීත්වය වෙත යැවීම ද සිදු විය. නිල අභ්‍යන්තර ප්‍රවෘත්ති ප්‍රකාශනය වන "කවුළුව" ඩිජිටල්මය ආකාරයෙන් ප්‍රකාශයට පත් කෙරුණු අතර, මහ බැංකු කාර්යමණ්ඩලයේ අභ්‍යන්තර වෙබ් අඩවිය වෙත ද එය ඇතුළත් කෙරිණි.

ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ ආර්ථික පරිසරය තුළ නව සමාජ ආර්ථික ප්‍රවණතා පිළිබඳ සිය දැනුම සහ වෘත්තීමය තත්ත්වය වර්ධනය කර ගැනීම සඳහා මහ බැංකු නිලධාරීන්ට අවශ්‍ය සහාය ලබා දීම පිණිස අවශ්‍ය දැනුම අත්පත් කර ගෙන ඒවා බෙදා හැරීම සඳහා පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ආර්ථික විද්‍යාව, කළමනාකරණය සහ මූල්‍යය යන විෂයයන්ට අදාළ මාතෘකා මත පළ වූ ප්‍රකාශනවල පුළුල් පරාසයක් කරා ප්‍රවේශය සපයන පොත්පත්, වාර්තා, ජර්නල සහ විවිධ මංගත දත්ත පද්ධතිවලින් සමන්විත එහි සංචිතය ඉහළ දැමුවේය. ඊට අමතරව, පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් කාර්ය මණ්ඩලයට මහ බැංකු කටයුතු හා සම්බන්ධ විෂයයන්ට අදාළ මංගත තොරතුරුවලට ළඟා වීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් මංගත මූලාශ්‍ර කිහිපයක (නිද. www.centralbanking.com, www.economist.com) දායකත්වය ලබා ගෙන තිබුණි. පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය Fortune Magazine, Time Magazine, South Asia Economic Journal, The Economist වැනි ජාත්‍යන්තර ජර්නලවල දායකත්වය මුද්‍රිත ස්වරූපයෙන් ද, Asia Monitor, Payment Cards and Mobiles Payment, Journal of Financial Crimes, Financial Regulation and Compliance, Money Laundering Control, Journal of Human Resources යනාදියෙහි දායකත්වය මුද්‍රිත සහ විද්‍යුත් ස්වරූප යන දෙයාකාරයෙන් ම ද ලබා ගෙන ඇත. Current Contents, News from the Local Press, Central Banking.com, News Desk යනාදී විද්‍යුත් නිවේදන සකස් කිරීම ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් අඛණ්ඩව සිදු කෙරිණි. එමෙන්ම, ආර්ථික විද්‍යාව, බැංකු කටයුතු සහ මූල්‍ය කටයුතු හා සම්බන්ධ සටහන් සහ වාර්තා අභ්‍යන්තර ජාලය ඔස්සේ කාර්ය මණ්ඩලය වෙත ලබා දුන් අතර, පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ලේඛනාරක්ෂක කටයුතු සඳහා ද දෛනික පුවත්පත් සියල්ලෙහි වාර්තාවක් සකස් කරයි.

5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 49 වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය හා අධිකාරිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ මෙම ව්‍යවස්ථාපිත බැඳීමට අදාළ කාර්යයන් හැසිරවීමේ වගකීම මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. 2021 වර්ෂය තුළ දී, කොවිඩ්-19 හේතුවෙන් හටගත් අභියෝග මධ්‍යයේ වුව ද, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් රට තුළ පැවති මුදල් ඉල්ලුමට සරිලන පරිදි ගුණාත්මකභාවයෙන් යුතු ව්‍යවහාර මුදල් අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් පවත්වා ගන්නා අතරම ව්‍යාජ මුදල් මුද්‍රණය වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ද අනුගමනය කරමින් රටෙහි මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීමට සිය දායකත්වය අඛණ්ඩව ලබා දුනි.

5.1 ව්‍යවහාර මුදල් කළමනාකරණය

ගුණාත්මක තත්වයේ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සංසරණයට නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම සහ භාවිතයට නුසුදුසු (සේවා අනිසි) ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සංසරණයෙන් ඉවත් කිරීම ව්‍යවහාර මුදල් කළමනාකරණයට අයත් ප්‍රධාන කාර්යයන් වේ. ඵලදායී ව්‍යවහාර මුදල් කළමනාකරණයක් සහතික කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය තුළ පහත කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

(අ) ව්‍යවහාර මුදල් මුද්‍රණය හා ටංකනය

2021 වසර සඳහා වන ඉල්ලුම සපුරාලීමට සහ ප්‍රමාණවත් තොග පවත්වා ගැනීමට රුපියල් බිලියන 262.4ක් වටිනා නව මුදල් නෝට්ටු මිලියන 185ක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ඇණවුම් කරන ලදී. 2021 වසරේදී සංසරණය සඳහා වන කාසි ඇණවුම් නොකරන ලදී.

(ආ) ව්‍යවහාර මුදල් නිකුත් කිරීම

රට තුළ කොවිඩ්-19 පැතිරීම මධ්‍යයේ ඇති වූ මුදල් සඳහා වූ අනපේක්ෂිත ඉල්ලුමට විසඳුම් ලබා දෙමින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව නව සාමාන්‍ය තත්ත්වයට සාර්ථකව අනුගත වීමට සමත් විය.

2021 වසරේ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු අතර භාවිතයට සුදුසු (සේවා නිසි) ව්‍යවහාර මුදල් නෝට්ටු සෘජුවම හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම සිදු කරන ලද අතර එමගින් පෙර වසරට සාපේක්ෂව ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම අඩු විය. ඒ අනුව ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2021 දී රුපියල් බිලියන 390.9ක වටිනාකමකින් යුත් මුදල් සංසරණයට නිකුත් කරනු ලැබූ අතර, එහි රුපියල් බිලියන 172.7ක වටිනාකමක් ඇති භාවිතයට සුදුසු (සේවා නිසි) නෝට්ටු ද, රුපියල් බිලියන 217.3ක වටිනාකමකින් යුත් නව මුදල් නෝට්ටු ද, රුපියල් බිලියන 0.9ක වටිනාකමකින් යුතු කාසි ද ඇතුළත් විය.

II-3 සංඛ්‍යා සටහන

ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි නිකුතුව

අයිතමය	වටිනාකම (රුපියල් බිලියන)				
	2017	2018	2019	2020	2021
භාවිතයට සුදුසු නෝට්ටු	504.6	467.0	526.5	467.1	172.7
නව නෝට්ටු	123.3	328.4	248.7	229.5	217.3
කාසි (අ)	1.4	1.1	1.0	0.7	0.9
එකතුව	**629.3**	**796.5**	**776.2**	**697.3**	**390.9**

(අ) සමරු කාසි අන්තර්ගත නොවේ.

(ඇ) ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ව්‍යවස්ථාපිත සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය මූලික කරගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් සිදු කරනු ලබන ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම සිදු කරනු ලබයි. එමෙන්ම, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් නෝට්ටුවල ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීම සඳහා හානි වූ ව්‍යවහාර මුදල් නෝට්ටු ඇතුළු භාවිතයට නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් භාර ගෙන සංසරණයෙන් ඉවත් කිරීම ද සිදු කරනු ලබයි.

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සාපේක්ෂව පහළ අගයක පවත්වා ගැනීම හා සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු වාණිජ බැංකු අතර සෘජුව හුවමාරු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම හේතු කොට ගෙන වාණිජ බැංකු මගින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කරනු ලබන භාවිතයට සුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය, පෙර වසර හා සසඳන විට 2021 වර්ෂයේ දී පහළ අගයක් වාර්තා කළේය.

II-4 සංඛ්‍යා සටහන

ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු

අයිතමය	වටිනාකම (රු. බිලියන)				
	2017	2018	2019	2020	2021
භාවිතයට සුදුසු නෝට්ටු	464.2	524.1	606.9	445.0	144.6
භාවිතයට නුසුදුසු නෝට්ටු	119.9	229.6	132.1	95.4	76.1
එකතුව	**584.1**	**753.7**	**739.0**	**540.4**	**220.7**

සටහන : බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කරන ලද කාසිවල වටිනාකම සැලකිය යුතු අගයක් නොවේ.

(ඈ) සේවා අනිසි (භාවිතයට නුසුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇති සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීමේ ව්‍යවස්ථාපිත බලය ක්‍රියාවට නංවමින්, 2021 වර්ෂය තුළ රුපියල් බිලියන 44.3ක් වටිනා භාවිතයට නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 108.2ක් (II-5 සංඛ්‍යා සටහන) ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් විනාශ කරන ලදී.

II-5 සංඛ්‍යා සටහන

සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම

නෝට්ටු	2017	2018	2019	2020	2021
නෝට්ටු ගණන (මිලියන)	177.1	343.8	235.0	127.3	108.2
වටිනාකම (රු. බිලියන)	94.2	252.2	139.8	62.2	44.3

5.2 අනෙකුත් කටයුතු

(අ) ව්‍යවහාර මුදල් කවුළු මෙහෙයවීම

2021 වර්ෂය තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මුදල් කවුළු හරහා හානි වූ මුදල් නෝට්ටු රුපියල් මිලියන 93ක් හුවමාරු කිරීම මගින් මහජනතාව වෙත තම සේවාව සපයන ලදී. මීට අමතරව, මහජනතාව සඳහා ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි පිහිටුවා ඇති විශේෂ හුවමාරු කවුළුව හරහා රුපියල් මිලියන 655ක වටිනාකමින් යුත් ව්‍යවහාර

මුදල් නෝට්ටු හා රුපියල් මිලියන 39.1ක වටිනාකමින් යුත් කාසි නිකුත් කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පහසුකම් සලසන ලදී.

(ආ) ආර්ථික ඉතිහාස කෞතුකාගාරය මෙහෙයවීම

රටේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන්, ආර්ථික ඉතිහාස කෞතුකාගාරය හරහා පෙර වර්ෂවල දී මෙන් මහජනතාව වෙත සාමාන්‍ය පරිදි සිය සේවාවන් සැපයීම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවට අසීරු විය. එසේ වුවද, ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි පිළිබඳ පුළුල් දැනුම්වත්භාවයක් ලබා දීම තුළින් ද, සමරු මුදල් නෝට්ටු, කාසි හා අනෙකුත් සංග්‍රාහක අයිතම අලෙවි කිරීමෙන් ද, ඒ හා සබැඳි ඉදිරිපත් කිරීම් මගින් ද, 2021 වර්ෂය තුළ දී ආර්ථික ඉතිහාස කෞතුකාගාරය හරහා පුද්ගලයින් 3,663 දෙනෙක් වෙත සිය සේවය සලසන ලදී.

(ඇ) ව්‍යවහාර මුදල් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ශන කාර්යාංශයේ සහයෝගය ඇතිව ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ සිදුවීම් අවම කිරීම සහ ව්‍යවහාර මුදල් පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම උදෙසා අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ අනාවරණය කර ගන්නා ලද ව්‍යාජ මුදල් නෝට්ටු 1,065ක් සහතික කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. අනාවරණය කර ගන්නා ලද ව්‍යාජ මුදල් නෝට්ටු අනුපාතිකය, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියනයකට ව්‍යාජ මුදල් නෝට්ටු 0.8ක් වූ අතර එය අනෙකුත් බොහෝ රටවල ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ වාර්තා සමඟ සසඳන විට අවම මට්ටමක පවතී. අධිකරණමය නඩු විභාගයන් සඳහා පහසුකම් සලසමින් ව්‍යවහාර මුදල් නෝට්ටු අනුකරණය සම්බන්ධව තීරණාත්මක සාක්ෂි වශයෙන් මුදල් නීති පනතේ 59 වන වගන්තිය ප්‍රකාරව, සහතික 63ක් නිකුත් කරන ලද අතර ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ අධිකරණමය නඩු විභාග 3ක් සඳහා එම වර්ෂය තුළ දී සහභාගී වන ලදී.

(ඈ) සමරු කාසි නිකුත් කිරීම

ශ්‍රී ලංකාව සහ මහජන චීන සමූහාණ්ඩුව අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 65 වැනි සංවත්සරය සහ චීන කොමියුනිස්ට් පක්ෂයේ 100 වැනි සංවත්සරය නිමිත්තෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේ දී රුපියල් 1000 මුහුණත වටිනාකමින් යුත් රත්‍රන් සහ රිදී සමරු කාසි දෙකක් නිකුත් කරන ලදී.

(ඉ) ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනය සඳහා අවසර ලබා දීම

ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියට අනුව, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය තුළ දී ප්‍රතිනිෂ්පාදන ඉල්ලීම් 2ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

5.3 වැඩිදියුණු කිරීම් සහ නව ව්‍යාපෘති

(අ) මුදල් මෙහෙයුම් ප්‍රතිසංස්කරණය කිරීම

ව්‍යවහාර මුදල් මෙහෙයුම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ප්‍රසම්පාදනයේ පළමු අදියර අවසන් වීමත් සමඟ මේ සම්බන්ධයෙන් උනන්දු වූ පාර්ශ්ව විසින් ඉදිරිපත් කළ යෝජනා ඇගයීම නිමා කර, දෙවන අදියර ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය හරහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ව්‍යවහාර මුදල් නෝට්ටු සැකසීමේ ධාරිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම ඇතුළු මෙහෙයුම් ගැටලු කිහිපයක් විසඳීමට අපේක්ෂා කරනු ලැබේ.

6. දේශීය මෙහෙයුම් කටයුතු

6.1 දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මුදල් නීති පනතෙහි දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අදාළ වන ප්‍රධාන කාර්යයන් කිහිපයක වගකීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඒ අනුව, 2021 වසරේ දී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන කාර්යයන් අතරට විවිට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යෑම හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යස්ථාපිත සංචිත නියාමනය කිරීම, රජය, රාජ්‍ය නියෝජිත ආයතන සහ අනෙකුත් නියෝජිත ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතු භාරය ලෙස ක්‍රියාකිරීම, තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ඍජු අලෙවි සහභාගිකරුවන් වෙත දවස ඇතුළත පියවීමේ පදනමින්, දවස ඇතුළත ද්‍රවශීලතා ණය පහසුකම් ලබා දීම සහ බලයලත් මුදල් තැරුව්කරුවන් නියාමනය කිරීම ඇතුළත් වේ.

6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

6.2.1 විවට වෙළඳපොළ කටයුතු

දැනට ක්‍රියාත්මක වන නමාශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස සැලකෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) අඩු විචල්‍යතාවකින් අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමේ අරමුණින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විවිට වෙළඳපොළ කටයුතු සිදු කරන ලදී.

(අ) මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව පුරෝකථනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, සුදුසු විවට වෙළඳපොළ කටයුතු හරහා වෙළඳපොළ සහභාගිත්ව ආයතනයන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගනිමින් සාධක ගණනාවක් මත පදනම්ව දෛනිකව දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ඇස්තමේන්තු කරයි. දේශීය මුදල් වෙළඳපොළෙහි දෛනික ද්‍රවශීලතාව ඇස්තමේන්තු කිරීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තියට අදාළව ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ඇති බලපෑම මෙන්ම, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කරන විදේශ විනිමය සම්බන්ධ

ගනුදෙනු, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු සංචිතවල සිදු වන වෙනස්වීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව රජය සමඟ සිදු කරන ගනුදෙනු වැනි ද්‍රවශීලතාව කෙරෙහි බලපාන ස්වායත්ත සාධක ද සැලකිල්ලට ගනු ලබයි.

(ආ) වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත නිර්දේශ ලබා දීම

මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත ලබා දෙනු ලබයි. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් දේශීය මුදල් වෙළෙඳපොළෙහි සහ විදේශ විනිමය වෙළෙඳපොළෙහි දෛනිකව සිදු වන වෙනස්වීම් සහ ඇස්තමේන්තුගත ද්‍රවශීලතා මට්ටම, මෙහෙයුම් ඉලක්කයෙහි යෝග්‍ය මට්ටම, මුදල් වෙළඳපොළ සහභාගිත්ව ආයතන අතර පවත්නා ද්‍රවශීලතා ව්‍යාප්තිය, වෙළඳපොළට සුදුසු සංඥාවන් ලබා දීමේ අවශ්‍යතාව යනාදී සාධක සැලකිල්ලට ගනිමින් මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව කළමණාකරණය කිරීමට, වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ දී සලකා බැලිය යුතු ක්‍රියාමාර්ග යෝජනා කරන ලදී.

(ඇ) විවට වෙළඳපොළ වෙන්දේසි පැවැත්වීම

සමස්ත ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් සඳහා උපකාර කිරීමට, අවශ්‍යතාව අනුව ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම මෙන්ම ද්‍රවශීලතාව වෙළඳපොළට සැපයීම සඳහා වෙන්දේසි පැවැත්වීය. එවැනි වෙන්දේසි, මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමට උපකාරී වේ.

(i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

2021 අගෝස්තු මස මැදදී එතෙක් පැවති ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ සිදු කරන ලද වෙනස් වීමත් සමඟ දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා එක්දින, කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පැවැත්වීය. ඒ අනුව, එක් දිනකට ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා එක් දින ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි, සතියක කාලසීමාවක් දක්වා ද්‍රවශීලතාව අවශෝෂණය කිරීමට කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පවත්වන ලද අතර මෙම වෙන්දේසිවල පියවීම් කටයුතු ද එදිනම සිදු කළේය. සැලකිය යුතු කාලසීමාවකට ද්‍රවශීලතාව අතිරික්තව පවතින බව පෙනීගිය අවස්ථාවල දී එම අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ අරමුණු සහිතව දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි ඊළඟ ව්‍යාපාර දිනයේ දී පියවීමේ පදනම මත පැවැත්වීය.

(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි

ඇතැම් වාණිජ බැංකුවල පැවති සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය සැලකිල්ලට ගනිමින් වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම සඳහා දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීය.

(iii) ස්ථිර පදනම මත වන වෙන්දේසි

2021 වසරේ දී මුදල් වෙළඳපොළහි පැවති අතිරික්ත ද්‍රවශීලතාව ස්ථිර පදනමින් අවශෝෂණය කිරීම සඳහා ස්ථිර පදනම මත සහභාගීත්ව ආයතනයන්ට භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසි පවත්වන ලදී.

II-6 සංඛ්‍යා සටහන

2021 වසරේ දී පවත්වන ලද විවට වෙළඳපොළ වෙන්දේසි

වෙන්දේසි වර්ගය	පැවැත්වූ වෙන්දේසි සංඛ්‍යාව	රු. බිලියන	
		ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය	පිළිගත් මුළු ලංසු ප්‍රමාණය
ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි			
එක් දින	46	1,594.0	1,182.7
කෙටි කාලීන	47	870.0	423.0
දිගු කාලීන	11	180.0	60.0
ප්‍රතිවිකුණුම් වෙන්දේසි			
දිගු කාලීන - වාණිජ බැංකු සඳහා	2	250.0	203.5
ස්ථිර පදනම මත වන වෙන්දේසි			
ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම	5	55.0	14.4

(ඈ) නිත්‍ය පහසුකම් සැපයීම

මුදල් වෙළඳපොළ සහ විවට වෙළඳ කටයුතු හරහා දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා පූර්ණ වශයෙන් සපුරා ගැනීමට අපොහොසත් වූ සහභාගීත්ව ආයතන සඳහා තමන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට නිත්‍ය පහසුකම් සැපයීය. ඒ අනුව, සහභාගීත්ව ආයතන සතු අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කළ අතර, දිනය අවසානයේ ද්‍රවශීලතා හිඟයක් සපුරා ගැනීමට එම ආයතනවලට දෛනික පදනමින් නිත්‍ය ණය පහසුකම ලබා දෙන ලදී. 2021 වසර තුළ දී, එලෙස නිත්‍ය තැන්පතු පහසුකම් වශයෙන් රු. බිලියන 29,450.3ක් තැන්පත් කර ඇති අතර නිත්‍ය ණය පහසුකම් වශයෙන් රු. බිලියන 30,095.2ක් ලබා දී ඇත.

II-7 සංඛ්‍යා සටහන

2021 දී නිත්‍ය පහසුකම් සැපයීම

රු. බිලියන

නිත්‍ය පහසුකම	අවමය	උපරිමය	සාමාන්‍යය	මුළු වටිනාකම
නිත්‍ය තැන්පතු පහසුකම	59.3	266.6	122.2	29,450.3
නිත්‍ය ණය පහසුකම	0.01	534.6	124.9	30,095.2

6.2.2 ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පවත්වාගෙන යෑම හා අධීක්ෂණය කිරීම

මුදල් නීති පනතේ දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුකූලව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අනුව සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම සිය මුළු රුපියල් තැන්පතු වගකීම් මත මහ බැංකුවේ ඊට අදාළ පියවීම් ගිණුමෙහි පවත්වා ගත යුතු අවම සංචිත ප්‍රමාණය තීරණය කෙරේ. ව්‍යවස්ථාපිත සංචිත

අනුපාතයට අනුව සංචිත පවත්වාගෙන යෑම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඊට දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම ද දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමකි. මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව, 2021 සැප්තැම්බර් 01 දිනෙන් ආරම්භ වූ සංචිත පවත්වාගෙන යෑමේ කාල පරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය එවකට පැවති සියයට 2.00 සිට සියයට 4.0 දක්වා ප්‍රතිශතාංක දෙකකින් ඉහළ නංවමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත 2021 අගෝස්තු 19 දින මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

6.2.3 බැංකු අනුපාතය

මුදල් නීති පනතේ 86 සහ 87 වන වගන්ති ප්‍රකාරව බැංකු ආයතන වෙත "අවසන් ණය ලබා දෙන්නා" ලෙස මහ බැංකුව විසින් හදිසි අවශ්‍යතා සඳහා ණය නිකුත් කිරීමේ අනුපාතය බැංකු අනුපාතයයි. බැංකු අනුපාතය, නීත්‍ය ණය පහසුකම් අනුපාතයට අනුකූලව ඊට පදනම් අංක 300ක ඉහළ ආන්තිකයක් ගන්නා පරිදි ස්වයංක්‍රීය ලෙස ගලපා ඇත. 2021 අගෝස්තු මැද භාගයේ දී හඳුන්වා දුන් දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමත් සමඟ 2021 අගෝස්තු 19 සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු අනුපාතය සියයට 9.00 දක්වා ඉහළ නංවන ලදී. කෙසේවුවද, 2021 වර්ෂය තුළ දී බැංකු ආයතන සඳහා බැංකු අනුපාතය යටතේ හදිසි ණය මුදල් සපයා නොමැත.

6.3 වාණිජ බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් සහ රජය සඳහා වන කාර්යයන්

6.3.1 මූල්‍ය ආයතනවල ගිණුම්

මහ බැංකුවේ පවත්නා පියවීම් ගිණුම් හරහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් මූල්‍ය පද්ධතිය හා සම්බන්ධ වී පවතී. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ පවතින පොදු ලෙජර් ගිණුම් මගින් ගෙවීම් හා පියවීම් මෙන්ම තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් අතර නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවල ගෙවීම් හා පියවීම් නිරවුල්තාවය සඳහා පහසුකම් සැපයීමත් සිදු වේ. තවද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සංචිත පවත්වාගෙන යෑම සඳහා ද මෙම ගිණුම් භාවිතා කෙරේ. 2021 වසර අවසානයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක් සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 8 දෙනෙකු වෙනුවෙන් තත්කාලීන දළ පියවීම් පද්ධතියට අදාළව පොදු ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලැබීය.

6.3.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු ලෙස මහ බැංකුවේ කාර්යයන් ඉටු කිරීමේ දී රජය වෙනුවෙන් රාජ්‍ය දෙපාර්තමේන්තු, රජයේ ආයතන, නියෝජිතායතන සහ ඇතැම් විදේශීය ආයතන සඳහා බැංකු පහසුකම් සැපයීම ද දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු වන අතර, ඊට අදාළව ගිණුම් 49ක් පවත්වාගෙන යනු ලැබීය. 2021 වර්ෂයේ දී එම ගිණුම් හරහා සිදු වූ සමස්ත ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 87ක්ම අයත් වූයේ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම් සඳහාය.

මුදල් නීති පනතේ 89 වන වගන්තිය ප්‍රකාරව මහ බැංකුව විසින් අදාළ මුදල් වර්ෂය සඳහා වන රජයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10කට නොවැඩි මුදලක් රජයට තාවකාලික අත්තිකාරම් ලෙස සපයනු ලැබේ. සය මසකට නොවැඩි කාල සීමාවක් තුළ නැවත ගෙවිය යුතු වන චක්‍රීය ණය පහසුකමක් ලෙස මෙම අත්තිකාරම් රජය විසින් භාවිතා කෙරේ. 2021 වසර සඳහා වන රජයේ ඇස්තමේන්තුගත ආදායම හා පදනම්ව 2021 වසර ආරම්භයේ දී රුපියල් බිලියන 198.44ක් දක්වා රුපියල් බිලියන 43.72කින් තාවකාලික අත්තිකාරමේ භාවිතා කළ හැකි උපරිම ප්‍රමාණය ඉහළ නංවන ලදී. කෙසේ වුවද, 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද එම වසර සඳහා වන සංශෝධිත රජයේ අයවැය ලේඛනයට අනුව මෙම තාවකාලික අත්තිකාරමේ භාවිතා කළ හැකි උපරිම ප්‍රමාණය රුපියල් බිලියන 152.04ක් දක්වා පහත හෙළමින් සංශෝධනය විය. ඒ අනුව 2020 වසර අවසානයේ දී පැවැති තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය වූ රුපියල් බිලියන 154.72ට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී පැවති තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 152.04ක් විය. 2022 වසර සඳහා වූ රජයේ අයවැය ලේඛනය අනුව 2022 වසර සඳහා තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 225.05ක් වූ අතර, ඒ අනුව 2022 වසර ආරම්භයේ දී රුපියල් බිලියන 73.01ක අතිරේක මුදල් ප්‍රමාණයක් රජය වෙත ලබා දෙන ලදී.

6.4 දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම

තත්කාලීන දළ පියවුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යෑම සඳහා දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඍජු සහභාගීත්ව අලෙවිකරුවන් සඳහා ලබා දෙන ලදී. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් ගාස්තුවකින් තොරව මෙම පහසුකම් සැපයෙන අතර, අදාළ දිනය තුළ දී සුරැකුම්පත්වල වර්තමාන වෙළඳපොළ මිල ගණන් වෙනස් වීමෙන් අදාළ සුරැකුම්පත්හි මිලෙහි විය හැකි උච්ඡාවචනයකින් ඇති විය හැකි අලාභය අවම කිරීම සඳහා යම් ගැළපීමක් (haircut) අන්තර්ගත කරමින් අදාළ සුරැකුම්පතෙහි නිල මිල ගණන් තීරණය කරයි.

2021 වසර තුළ දී දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 50,777.0ක් සහ එහි දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 215.2ක් විය. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් භාවිතය පෙර වසරේ පැවති සමස්ත වටිනාකම වූ රුපියල් බිලියන 15,843.0ක් සහ දෛනික සාමාන්‍යය වූ රුපියල් බිලියන 66.9ක් හා සැසඳීමේ දී ඉහළ යෑමක් පෙන්නුම් කරයි.

6.5 බලයලත් මුදල් තැරුව්කරුවන් අධීක්ෂණය

මුදල් තැරුව්කරුවන් විසින් මුදල්, විදේශ විනිමය සහ රජයේ සුරැකුම්පත් යන වෙළඳපොළවල අතරමැදිකරණ කාර්යයන් සිදු කරනු ලබයි. දේශීය මුදල් වෙළඳපොළ තුළ මුදල් තැරුව්කරුවන්ගේ වෘත්තීමය ක්‍රියාකාරීත්වය සහතික කිරීම පිණිස ශ්‍රී ලංකාවේ බලයලත් මුදල් තැරුව්කරුවන් නියාමනය කිරීමේ බලය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත පවරමින් මුදල් නීති පනතේ 10 (සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2013 සහ 2016 යන වසරවල දී නිකුත් කළ මුදල් තැරුව්කරන රෙගුලාසි අවලංගු කරමින්, 2018 අංක 1 දරන මුදල් රෙගුලාසි නිකුත් කර ඇත. ඉහත රෙගුලාසි යටතේ 2021 වසර අවසානය වන විට සමාගම් 9 ක් සඳහා "බලය පැවරීමේ සහතික" නිකුත් කර ඇති අතර, එම සමාගම් "බලයලත් මුදල් තැරුව්කරුවන්" ලෙස නම් කර ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් බලයලත් මුදල් තැරුව්කරුවන් සඳහා වන වාර්ෂික අධීක්ෂණ කටයුතු 2021 වසර තුළ දී දුරස්ථව සිදු කළේය.

7. ආර්ථික පර්යේෂණ

මුදල් මණ්ඩලයට සහ මහ බැංකුවෙහි අධිපතිට ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම පිණිස මෙන්ම මහජනතාව වෙත මුදල් හා බැංකු සහ පොදු උනන්දුවක් දක්වන වෙනත් ආර්ථික විෂයන් සම්බන්ධයෙන් තොරතුරු සැපයීම සඳහා, දත්ත සම්පාදනය කිරීමේ සහ ආර්ථික පර්යේෂණ සිදු කිරීමේ කාර්යභාරය 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 25 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. කොවිඩ්-19 වසංගතය මගින් ඇති කරන ලද අභියෝග මධ්‍යයේ වුව ද, කාලීන ආර්ථික ගැටලු පිළිබඳව පර්යේෂණ සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ සිදු කරමින් සාර්ව ආර්ථික ස්ථායීතාව ස්ථාපිත කිරීමේ අරමුණින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ මුදල් මණ්ඩලය වෙත පූර්වෝපායික සහ විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය නිර්දේශ ලබා දෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව 2021 වසරේ දී සිය කාර්යයන් අඛණ්ඩව සිදු කළේය. තවද, ආර්ථික හා මූල්‍ය කටයුතු පිළිබඳ රජයේ උපදේශක ලෙස මහ බැංකුවේ කාර්යභාරය ඉටු කිරීමේදී, රජය වෙත ඉදිරිපත් කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත අඛණ්ඩව පූර්වෝපායික ප්‍රතිපත්තිමය උපදේශන ලබා දෙන ලදී. ඒ අනුව, පවතින සාර්ව ආර්ථික ප්‍රවණතා සහ ගැටලු පිළිබඳව මහ බැංකුව විසින් අඛණ්ඩව රජය දැනුවත් කළ අතර ආර්ථිකයේ ඇතැම් අංශ ශක්තිමත් කිරීම මෙන්ම සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශ රජයට ඉදිරිපත් කරන ලදී. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව නියමිත කාලය තුළ ව්‍යවස්ථාපිත ප්‍රකාශන අඛණ්ඩව ප්‍රකාශයට පත් කළ අතර, මහජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් වෙත සංඛ්‍යාලේඛන සහ අනෙකුත් සාර්ව ආර්ථික තොරතුරු සපයමින් පුළුල් පිරිසක් සමඟ දැනුම බෙදා ගැනීමේ වැඩසටහන්වල නිරත විය. තවද, පර්යේෂණ කටයුතු වැඩිදියුණු කිරීම සහ කාලීන වැදගත්කමක් ඇති විෂයන් පිළිබඳ දැනුම බෙදාගැනීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් තම දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව තුළ පර්යේෂණවල නිරත වීම ප්‍රවර්ධනය කිරීමේ කාර්යය අඛණ්ඩව සිදු කළේය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විදේශීය මහ බැංකු සහ ජාත්‍යන්තර ආයතන සමඟ සමීප සහයෝගීතාවයක් ඇති කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන භූමිකාවක් ඉටු කරන ලදී.

7.1 ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීම

ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ ව්‍යවස්ථාපිත අරමුණ පෙරදැරිව, පූර්වෝපායික සහ කාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ වෙත එළඹීම උදෙසා මුදල් මණ්ඩලයට සහාය වීම සඳහා ප්‍රක්ෂේපන සහ පුරෝකථන සිදුකරමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දේශීය ආර්ථිකයේ, මුදල්, විදේශීය, මූර්ත සහ රාජ්‍ය මූල්‍ය යන අංශවල මෙන්ම ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතාවලට අදාළ දත්ත සම්පාදනය, අධීක්ෂණය හා විශ්ලේෂණය අඛණ්ඩව සිදු කරන ලදී. වසර තුළදී, මුදල් ප්‍රතිපත්ති කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආකෘති මත පදනම් වූ සාර්ව ආර්ථික පුරෝකථනවල සහාය ඇතිව ආර්ථික සහ මුදල් තත්ත්වය පිළිබඳ ඉදිරි දැක්මකින් යුතු විස්තරාත්මක වාර්තා ඉදිරිපත් කරමින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට වඩාත් දැනුම්වත් තීරණ ගැනීමට සහ මුදල් මණ්ඩලය වෙත මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ සුදුසු තීරණ ගැනීමට අදාළ නිර්දේශ ලබා දීමට හැකි වන පරිදි පූර්ව දින දර්ශනයෙහි ඇතුළත් වූ මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් 8ක් සහ විශේෂ මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් කළ *'සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම'* සම්පාදනය කිරීම සම්බන්ධීකරණය කළ අතර, එමගින් මහ බැංකුව සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම සඳහා අවශ්‍ය වන කෙටි කාලීන ක්‍රියාමාර්ග ඉදිරිපත් කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රජය සහ මහ බැංකුව මගින් යෝජනා කරනු ලැබූ විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අඛණ්ඩව විශ්ලේෂණය කර ඒවායේ ආර්ථික බලපෑම්, විශේෂයෙන්ම මුදල් අංශය මත ඇතිවිය හැකි බලපෑම්, ඉස්මතු කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විවිධ ආර්ථික ගැටලු සහ සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීමට අවශ්‍ය සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත විශ්ලේෂණ සහ වාර්තා සැපයුවේය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින්, වසර තුළ දී මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටු රැස්වීම් අටක් සම්බන්ධීකරණය කරමින් කීර්තිමත් වෘත්තිකයන්, විද්වතුන් සහ පෞද්ගලික අංශය නියෝජනය කරන්නන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව සඳහා අඛණ්ඩව පහසුකම් සපයන ලදී. තවද, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ සහ සන්නිවේදන ක්‍රියාවලිය අඛණ්ඩව වැඩිදියුණු කිරීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ආකෘති මත පදනම් වූ

පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය විධිමත් කිරීම මගින් සිය ආකෘතිකරණ සහ පුරෝකථන හැකියාව අඛණ්ඩව ඉහළ නංවා ගැනීමට කටයුතු කරන ලදී. උද්ධමන අපේක්ෂා මැදි කාලීනව අපේක්ෂිත උද්ධමන පරාසය තුළ පාලනය කර ගැනීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් බාහිර පාර්ශ්වයන් වෙත කෙරෙන සන්නිවේදනය වැඩිදියුණු කිරීම සහ මහජනතාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක්ම ගන්නා ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව මුදල් මණ්ඩල තීරණ මහජනතාව වෙත දැනුම් දීමේ පුවත්පත් නිවේදන 8ක් නිකුත් කළ අතර, මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය සාකච්ඡා සඳහා පහසුකම් සැලසීය. මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය තත්කාලීනව පුළුල් පරාසයක් වෙත ළඟා කරවීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කළ මෙම මාධ්‍ය සාකච්ඡා, මංගත ක්‍රමවේද සහ සමාජ මාධ්‍ය ඔස්සේ සජීවීව විකාශය කරන ලදී. තවද, වැඩි පිරිසක් වෙත ළඟා වීම සඳහා මුදල් ප්‍රතිපත්ති නිවේදනයෙන් පසුව මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් සම්බන්ධීකරණය කරන වත්මන් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව පවත්වනු ලබන මංගත සැසි, විශේෂයෙන්ම සිංහල සහ දෙමළ මාධ්‍යයෙන්, පැවැත්වීම සඳහා පහසුකම් සැලසීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සම්පත්දායකත්වය ලබා දෙන ලදී. මේ අතර, වසර තුළදී මුදල් සහ පොලී අනුපාතික සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම සහ බෙදා හැරීම තවදුරටත් වැඩිදියුණු කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව, දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරමින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පිළිබඳ මාසික සමීක්ෂණය, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පිළිබඳ මාසික සමීක්ෂණ 2021 වසරේ දී සිදු කරන ලදී.

7.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

අභියෝගාත්මක සහ අවදානම් ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ, විශේෂයෙන්ම විදේශීය අංශය සම්බන්ධයෙන් සැලකීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර වෙළඳාම, විදේශ මූල්‍ය, විනිමය අනුපාතික සහ දළ නිල සංචිත සම්බන්ධ සංඛ්‍යා දත්ත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ මුදල් මණ්ඩලයට විදේශීය අංශය පිළිබඳ සුදුසු සහ කාලෝචිත ප්‍රතිපත්ති උපදෙස් සහ නිර්දේශ අඛණ්ඩව ලබා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විනිමය අනුපාතිකය මත ඇති වන පීඩන නිතිපතා ඇගයීමට ලක් කරන ලද අතර, විදේශීය අංශයේ දුර්වලතා මගහරවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළු විදේශීය අංශයේ ප්‍රවණතා සහ ගැටලු පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ මුදල් මණ්ඩලයට අඛණ්ඩව ඉදිරිපත් කිරීම් සහ දත්ත ලබා දීම් සිදු කරන ලදී. මුදල් නීති පනතේ 114 වන වගන්තිය අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉල්ලීම පරිදි, යෝජිත විදේශ ණය ලබා ගැනීමට පෙර, එම ණය මගින් මුදල් තත්ත්වය මත ඇතිවන බලපෑම අඛණ්ඩව විශ්ලේෂණය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන ලේඛනයේ 6වන සංස්කරණ (BPM6) ආකෘතිය අනුව ගෙවුම් තුලන හා ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත කාර්තුමය පදනම මත ද, ජාත්‍යන්තර සංචිත දත්ත සටහන මාසික පදනම මත ද ප්‍රකාශයට පත් කළ අතර, කාර්තුමය විදේශ ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ලෝක බැංකුව වෙත ද, වාර්ෂික පදනම මත ඍජු ආයෝජන දත්ත, විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය වෙත ද කාලානුරූපීව ඉදිරිපත් කරන ලදී. විදේශීය අංශයේ දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට සහ වඩාත් කාලීන තොරතුරු ලබා ගැනීම තහවුරු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සම්බන්ධයෙන් වූ මාසික සමීක්ෂණ, පෞද්ගලික අංශයේ විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන වාර්ෂික අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ සමීක්ෂණය සහ නේවාසික හා අනේවාසික ගුවන් සමාගම්, නාවික සමාගම්, විදුලි සංදේශ, ඉදිකිරීම් සහ රක්ෂණ ආදී අංශ රැසක් ආවරණය කෙරෙන සේවා වෙළඳාම පිළිබඳ වූ සමීක්ෂණ ඇතුළු සමීක්ෂණ රැසක් සිදු කරන ලදී. වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, බැංකු පද්ධතිය හරහා කුඩා මට්ටමින් සිදු වන විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් වන අන්තර්ජාතික ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතිය (ITRS) ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. අන්තර්ජාතික ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධති ව්‍යාපෘතිය 2022 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. තවද, රට වෙතට ගලා එන විදේශ විනිමය ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් විදේශ විනිමය ලැබීම් වර්ධනය කිරීම සඳහා පිහිටුවන ලද විදේශ විනිමය ගලා ඒම් ශක්තිමත් කිරීමේ කාර්ය සාධක බලකායේ ලේකම් කාර්යාලය වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා කළ අතර ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත එහි ප්‍රගතිය යාවත්කාලීන කිරීමට පහසුකම් සැලසීම සඳහා එම කාර්ය සාධක බලකායන් සම්බන්ධීකරණය කරන ලදී.

7.3 පූර්වෝපායික ප්‍රතිපත්තිමය උපදේශන

මුදල් ප්‍රතිපත්තිය, විනිමය අනුපාතික ප්‍රතිපත්තිය, ජාත්‍යන්තර වෙළඳාම සහ රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ ගැටලු සම්බන්ධයෙන්, මුදල් මණ්ඩලය, රජය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීමේ කාර්යභාරය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඉටු කරන ලදී. විශේෂයෙන්ම, වසංගතයෙන් බාධා ඇති වූ ආර්ථිකය ශක්තිමත් කිරීමට සහ ස්ථාවර කිරීමට බලධාරීන්ට සහාය වීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය නිර්දේශ පූර්වෝපායිකව සකස් කළේය. මුදල් නීති පනතේ 64 සහ 68 වගන්ති යටතේ වන ව්‍යවස්ථාපිත භූමිකාවට අනුකූලව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, පිළිවෙළින්, මුදල් හා විදේශීය අංශ සම්බන්ධයෙන් දැනට පවතින සහ අපේක්ෂිත තත්ත්වයන් හා අවදානම් පිළිබඳව ගරු මුදල් අමාත්‍යවරයා වෙත රහස්‍ය වාර්තා ඉදිරිපත් කළ අතර දේශීය හා විදේශීය අංශයේ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා ගත යුතු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රජයට යෝජනා කළේය. මුදල් නීති

පනතේ 116(1) වගන්තිය අනුව ආර්ථිකයේ ප්‍රවණතා සහ මතු විය හැකි අවදානම් ඇතුළත් *සැප්තැම්බර් 15 රහස්‍ය වාර්තාව* ද ප්‍රතිපත්ති යෝජනා සමඟ, ව්‍යවස්ථාපිතව දක්වා ඇති දිනය වන විට මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථික අවහිරතාවලට හේතු, සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවට එවැනි අවහිරතාවන්ගෙන් විය හැකි බලපෑම් සහ ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා රජය වෙත නිර්දේශ කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳ විශ්ලේෂණ ඇතුළත් රහස්‍ය වාර්තා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, මුදල් ප්‍රතිපත්ති කමිටුව මෙන්ම, මුදල් මණ්ඩල විදේශ ණය අධීක්ෂණ කමිටුව, වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, මූල්‍ය අංශ ස්ථායීතා කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩල, පුහුණු කටයුතු කමිටුව සහ පුස්තකාල උපදේශන කමිටුව ඇතුළු අභ්‍යන්තර කමිටු ගණනාවක සාමාජිකත්වය දරමින් අවශ්‍ය ප්‍රතිපත්තිමය උපදේශන අඛණ්ඩව ලබා දුන්නේය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි සහ ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි නිරීක්ෂකයෙකු ලෙස ද අඛණ්ඩව කටයුතු කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අවශ්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණ ලබා දීමේ අරමුණින් මුදල් මණ්ඩල රැස්වීම්වලට නිරන්තරයෙන් සහභාගි වූ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ සහාය ඇතිව, සාර්ව ආර්ථික ප්‍රවණතා, ගැටලු සහ කාලීනව වැදගත් වන විෂයන් පිළිබඳව විශ්ලේෂණය කිරීම් සිදු කරමින් වෙනත් නිත්‍ය සහ විශේෂ සැසිවාර මෙන්ම අභ්‍යන්තර කමිටු රැස්වීම් සහ මූල්‍ය ආයතනවල සභාපතිවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීම් සඳහා සහභාගි විය. තවද, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය සහ අතිගරු ජනාධිපතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු ඇතුළු කමිටු සහ මණ්ඩල ගණනාවක මහ බැංකුව නියෝජනය කරමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෝ සිය සේවය බාහිර ආයතන වෙත ලබා දුන්හ. විශේෂයෙන්ම, අලිමංකඩ ලුණු ලේවායේ උතුරු කොටස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන ව්‍යාපෘති කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය වර්ගීකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරී කමිටුව, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා දත්ත සම්බන්ධීකරණය කිරීමේ කමිටුව, තීරුබදු නිර්ණය කිරීමේ කමිටුව, අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ ප්‍රවර්ධන හා තොරතුරු පිළිබඳ උපදේශන කමිටුව, සමාජ ආර්ථික සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ ජාතික කමිටුව, පොහොර මිල තීරණය කිරීමේ කමිටුව, ගෑස් සහ තිරිඟු පිටි සඳහා මිල සූත්‍රය හඳුන්වා දීමේ කමිටු, වසංගත තත්ත්වයෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීම සඳහා වන විශේෂ කමිටු, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තෙල් ප්‍රසම්පාදනය හා සම්බන්ධ ණය පිරිවැය පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදු කිරීම සඳහා වන කමිටුව, වසර 13ක අධ්‍යාපනය සහතික කිරීමේ වැඩසටහන පිළිබඳ උපදේශන කමිටුව සහ ජීවන වියදම පාලනය කිරීම සඳහා වන කමිටුව යනාදී කමිටු ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් නියෝජනය කරන ලදී. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීහු, සාර්ථක වීමේ විභවයක් ඇති කර්මාන්ත (Winning industries), ඉන්ධන මිලකරණ යාන්ත්‍රණ, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන්හි හැසිරීම සහ ප්‍රතිපත්ති නියම කිරීම්, කාබනික කෘෂිකර්මාන්තය වෙත යොමු වීමේදී වන ආර්ථිකමය බලපෑම්, කංසා වගාව නීතිගත කිරීම සහ බලශක්ති ක්ෂේත්‍රයේ අවශ්‍යතා ඇතුළු කාලීන අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණ ක්‍රියාකාරීව සිදු කළහ. තවද, කොළඹ වරාය නගරය ඉදි කිරීමෙන් වන ආර්ථිකමය බලපෑම් සහ එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍රීය නෞකාවෙන් සිදු වූ ව්‍යසනයේ බලපෑම ඇතුළු විවිධ කරුණු සම්බන්ධයෙන් තාක්ෂණික විශේෂඥ වාර්තා සැපයීම මගින් බාහිර පාර්ශ්ව වෙත සහය ලබා දෙන ලදී.

7.4 ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ දත්ත හා තොරතුරු බෙදා හැරීම

මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල දායකත්වය ද ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් නීති පනත යටතේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් වන, එහි ප්‍රමුඛතම ප්‍රකාශනය, 2020 සඳහා වන මහ බැංකු වාර්ෂික වාර්තාව නිල භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී. නැවත ඉහළ ගිය වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ මෙහෙයුම් දුෂ්කරතා සහ අභියෝග මධ්‍යයේ වුව ද, 2021 වසරේ අප්‍රේල් මස අවසානයේදී වාර්ෂික වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද අතර, එය මහජනතාව වෙත ද ඉදිරිපත් කරන ලදී. 2021 වසරේ ඔක්තෝබර් මාසයේදී අනෙකුත් දෙපාර්තමේන්තුවල සහයෝගයද ඇතිව *මෑතකාලීන ආර්ථික ප්‍රවණතා - 2021 සුවිශේෂ සිදුවීම් සහ 2022 අපේක්ෂා* නමැති මහ බැංකුවේ අනෙක් ප්‍රධාන වාර්ෂික ප්‍රකාශනය ද සම්පාදනය කර එළිදක්වන ලදී. 2021 වසරේ ඔක්තෝබර් 01 වන දින මහ බැංකු අධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද *සය මාසික පෙර දැක්ම* ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, විශේෂයෙන්ම ආර්ථික ක්‍රියාකාරකම්වලට අවහිරතා ඇති වන විට විවිධ බාහිර පාර්ශ්වයන්ගෙන් එල්ල විය හැකි සෘණාත්මක සමපේක්ෂණ සඳහා ප්‍රතිචාර දැක්වීමට සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ක්‍රමවේද හරහා සාමාන්‍ය ජනතාවට කාලානුරූපීව නිවැරදි ආර්ථික, මූල්‍ය සහ ප්‍රතිපත්තිමය තොරතුරු බෙදා හැරීමට කැපවිය. මෙම ක්‍රියාවලියේ දී, මහ බැංකුවේ මංගත පුස්තකාලය තුළ දෛනික, සතිපතා සහ මාසික සංඛ්‍යාන දත්ත යාවත්කාලීන කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ අතර, මුදල් ප්‍රතිපත්ති විවරණ සහ විදේශීය අංශයේ ප්‍රවණතා පිළිබඳ මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරන ලදී. ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සම්පාදිත සංඛ්‍යාන දත්ත මුද්‍රා හරින ලද අතර, සාමාජික රටක විනිවිදභාවය සහ විවෘතභාවය වැඩි දියුණු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සඳහන් කර ඇති විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයන්ට අනුගතව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

නිරන්තරයෙන්ම කටයුතු කරන ලදී. තවද, වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය සහ නිල විදේශ සංචිතවල විනිමය සංයුතිය යන දත්ත ගබඩා සඳහා දත්ත සම්පාදනය කරන ලදී.

7.5 ප්‍රතිපත්ති පර්යේෂණවල නිරත වීම සහ දැනුම බෙදා හැරීම

මහ බැංකුවේ පර්යේෂණ අංශය ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව තුළ පර්යේෂණ පසුබිමක් අඛණ්ඩව ප්‍රවර්ධනය කළ අතර, එමගින් කාලීන වැදගත්කමක් සහිත විෂයයන් පිළිබඳ පර්යේෂණ සහ විශ්ලේෂණ කටයුතු පවත්වාගෙන ගියේය. පර්යේෂණ ආශ්‍රිත කාර්යයන් සඳහා වගකීම දරන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර කමිටුවක් ලෙස කටයුතු කරන පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් වසර පුරා දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන් සිදු කරමින් පර්යේෂකයන්ට මග පෙන්වීම ඇතුළු පර්යේෂණ කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගි විය. 2021 වසරේ අප්‍රේල් මාසයේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි පර්යේෂකයන් විසින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ අතථ්‍ය සම්මන්ත්‍රණයේදී අප රටෙහි අත්දැකීම් ඇසුරින් *"Economic Modelling and Forecasting - Practices in Central Banks"* යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. 2021 වසරේ ජූනි මාසයේදී පවත්වන ලද දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ පර්යේෂණ සමුළුවේදී *"The COVID-19 Pandemic in the SAARC Countries: Policy Responses and its Impact"* යන මැයෙන් තවත් පර්යේෂණ පත්‍රිකාවක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරියෙකු විසින් ඉදිරිපත් කරන ලදී. අඛණ්ඩව දෙවන වසරටත් ආසියානු සංවර්ධන බැංකු ආයතනය සහ ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ සහයෝගීතාව ඇතිව 2021 වසරේ සැප්තැම්බර් මාසයේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් *"Emerging Issues for Macroeconomic Stability"* යන තේමාව යටතේ ඒකාබද්ධ වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ පාර්ශ්වකරුවන් සමඟ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන් සිය ඒකාබද්ධ පර්යේෂණ කාර්යයන් මංගත සම්මන්ත්‍රණයෙහිදී ඉදිරිපත් කළ අතර, එම පර්යේෂණ පත්‍රිකා දැනටමත් පාර්ශ්වකරුවන් විසින් සමාලෝචනය කළ පිළිගත් ජාත්‍යන්තර සඟරාවල ප්‍රකාශයට පත්කර හෝ ප්‍රකාශයට පත් කිරීමට සලකා බලමින් හෝ සිටිනු ලැබේ. තවද, 2021 වසරේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී පවත්වන ලද ආසියානු සංවර්ධන බැංකු ආයතනය විසින් සත්කාරකත්වය දරන ලද අතථ්‍ය සම්මන්ත්‍රණවලදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය දේශීය හා ජාත්‍යන්තර සමුළුවල ඔවුන්ගේ පර්යේෂණ ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කළේය. මේ අතර, 2021 වසරේදී පර්යේෂණ උපදේශක මණ්ඩලයේ මගපෙන්වීම යටතේ මහ බැංකුවේ ප්‍රධාන පර්යේෂණ සඟරාව වන *මාණ්ඩලික පත්‍රිකාවේ* වෙළුම් දෙකක් ප්‍රකාශයට පත් කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී. පර්යේෂණ උපදේශක මණ්ඩලයේ සාමාජිකයින් විසින් විශ්වවිද්‍යාල පද්ධතියේ පශ්චාත් උපාධි සිසුන් සඳහා අධීක්ෂණ සේවා සපයන ලද අතර, මහ බැංකුවේ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයේ අවශ්‍යතා සපුරාලීම සඳහා පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ පත්‍රිකා අඛණ්ඩව ඇගයීමට ලක් කරන ලදී.

වසර තුළදී, සන්නිවේදන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියෙස සහ මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහාය ඇතිව, මහ බැංකුව තුළදීත් ඉන් පිටතදීත්, උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ ආර්ථික විද්‍යා දැනුම වැඩිදියුණු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය ප්‍රවීණතා හුවමාරු කර ගැනීම අඛණ්ඩව සිදු කළේය. එවැනි සහයෝගීතා තුළින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් අතර පාසල් හා විශ්වවිද්‍යාල සිසුන් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල නිලධාරීන් ද විය. මහ බැංකු වාර්තාව ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පැවැත්වූ ප්‍රධාන ප්‍රසිද්ධ දේශනයක් වූයේ *2020 වසරේ වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹු වන ශ්‍රී ලංකා ආර්ථිකයේ තත්ත්වය, අභියෝග සහ ඉදිරි දැක්ම* යන මැයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම මංගත ක්‍රමවේද ඔස්සේ පවත්වන ලද දේශනයයි. පුද්ගල සහභාගීත්වයකින් යුතු දැනුම්වත් කිරීමේ වැඩසටහන්වලට අමතරව, මහ බැංකුවේ අරමුණු සහ කාර්යයන්, මුදල් ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, විදේශීය අංශයේ ප්‍රතිපත්ති සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා සම්බන්ධයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මංගත ක්‍රමවේද ඔස්සේ අධ්‍යාපන වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. එමෙන්ම, අ.පො.ස. උසස් පෙළ ආර්ථික විද්‍යා සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ අභිවෘද්ධිය පිණිස බැංකු විදු පියෙස විසින් සංවිධානය කරන ලද, පිළිවෙළින්, සිංහල සහ දෙමළ භාෂාවලින් විකාශය වූ *තක්ෂිලාව* සහ *අරිවුටෝ* යන වාර්ෂික රූපවාහිනී අධ්‍යාපනික දේශන මාලාව සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩලයේ දායකත්වය ලබා දෙන ලදී.

7.6 ජාත්‍යන්තර සම්බන්ධතා

බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධාන සමඟ සම්බන්ධතා පවත්වා ගන්නා මූලික ආයතනය ලෙස, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රජය සහ මහ බැංකුව වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය සහ අග්නිදිග ආසියානු මහ බැංකු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණ කටයුතු සඳහා පහසුකම් සැලසීය. විශේෂයෙන්ම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, IV වන වගන්තිය යටතේ වන උපදේශනය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත මෙහෙයුම සහ 2021 ජූලි මාසයේ මංගත ක්‍රම ඔස්සේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යමණ්ඩල හා සම්බන්ධ වීම මෙන්ම දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ අධිපතිවරුන්ගේ 41වන සහ 42වන මංගත කණ්ඩායම් රැස්වීම් සඳහා පහසුකම් සැලසූ අතර අග්නිදිග ආසියානු මහ බැංකු විධායක කමිටුවේ

සහ මහ බැංකු අධිපතිවරුන්ගේ වාර්ෂික රැස්වීම්වලට සහභාගී විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ තොරතුරු ලබා දෙමින් සහ අදහස් හුවමාරු කර ගනිමින්, රජය සහ ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව වැනි ප්‍රධාන බහුපාර්ශ්වික සංවර්ධන බැංකු අතර සම්බන්ධීකරණ කටයුතු සඳහා සහාය විය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් එක්සත් ජාතීන්ගේ ආසියා ශාන්තිකර ආර්ථික හා සමාජීය කොමිසමේ 77වන සැසිවාරය සහ එක්සත් ජාතීන්ගේ වෙළඳ හා සංවර්ධන කටයුතු පිළිබඳ සමුළුවේ අමාත්‍ය මණ්ඩල සමුළුවේ 15වන සැසිවාරය සඳහා විදේශ අමාත්‍යවරයා විසින් පත් කරන ලද නියෝජිත කණ්ඩායම නියෝජනය කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් වසර තුළ දී මංගත ක්‍රමවේද ඔස්සේ පැවති ආයෝජක රැස්වීම්වලදී අවශ්‍ය කෙරෙන තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දුන් අතර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ඇතුලු ආර්ථිකයේ බාහිර පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩ සාකච්ඡා පවත්වා ගෙන යන ලදී.

8. සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව (සේ.අ.අ. දෙපාර්තමේන්තුව) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ (සේ.අ.අ. පනතේ) ප්‍රතිපාදන යටතේ මුදල් මණ්ඩලයට එහි බලතල ක්‍රියාත්මක කිරීමට, රාජකාරීන් ඉටුකිරීමට සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ලබයි. සේ.අ.අ. පනතේ විධිවිධානවලට අනුව, පනතේ සාමාන්‍ය පරිපාලනය කම්කරු කොමසාරිස්වරයා වෙත පැවරී ඇති අතර, අරමුදල් කළමනාකරණය සඳහා වූ සියලු බලතල, කාර්යයන් සහ වගකීම් අරමුදලේ භාරකරු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත.

සේ.අ.අ. පනත යටතේ ගෙවන ලද සියලුම දායක මුදල්, අධිභාර සහ ගාස්තු සහ අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම එක්රැස් කිරීම, අරමුදලෙහි මුදල්වල භාරය දැරීම, එක් එක් සාමාජිකයා වෙනුවෙන් වෙන වෙනම ගිණුම් පවත්වා ගැනීම, කම්කරු කොමසාරිස් විසින් සහතික කරනු ලැබූ තැනැත්තන් හට පනත යටතේ හිමි ප්‍රතිලාභ ගෙවීම, පනතෙහි කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන මුදල් ආයෝජනය කිරීම, අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සැකසීම, එහි පිටපතක් කම්කරු විෂය සම්බන්ධ ඇමතිතුමා වෙත ලබා දීම සහ එය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම යන කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

2021 වසරේ දී ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව, සේ.අ.අ. පනතේ ප්‍රතිපාදනයන්ට අනුගත වෙමින් ඉහත කාර්යයන් ඉටු කළ අතර, කම්කරු කොමසාරිස්වරයා සමඟ ද සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී. සමාලෝචිත වර්ෂය තුළ සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් වල සාරාංශයක් පහත දැක්වේ.

(අ) දායක මුදල් ලැබීම් සහ හිමිකම් ඇති අයට ප්‍රතිලාභ ගෙවීම්

2021 වසරේ දායක මුදල් ලැබීම් රු.බිලියන 150.7 සිට පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 165.7 දක්වා සියයට 9.9කින් ඉහළ ගිය අතර, අරමුදලේ සාමාජිකයන් සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ගෙවූ ප්‍රතිලාභ ද රු.බිලියන 118.2ක් දක්වා වැඩි වූ අතර, එය 2020 වසරට සාපේක්ෂව සියයට 7.7ක වැඩි වීමකි (සංඛ්‍යා සටහන II-8). ඒ අනුව, 2021 වසරේ දී ශුද්ධ දායක මුදල් ලැබීම් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු), 2020 වසරේ පැවති රු.බිලියන 41.0 හා සැසඳීමේ දී රු.බිලියන 47.5 ක් ලෙස දැක්විණි.

(ආ) අරමුදලේ පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

2021 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම රු.බිලියන 3,166.1ක් වූ අතර, එය 2020 වසර අවසානයේ වූ රු.බිලියන 2,824.3 හා සසඳන විට සියයට 12.1ක වර්ධනයක් විය. ආයෝජන තුළින් ඉපැයූ ආදායම් සහ සාමාජික ශුද්ධ දායක මුදල් ලැබීම් අරමුදලේ වර්ධනයට හේතු විය. 2020 වසරේ රුපියල් බිලියන 2,767.8ක්ව පැවති අරමුදලේ සාමාජිකයන්ගේ මුළු වගකීම (සාමාජික ශේෂ) 2021 අවසන් වනවිට රු.බිලියන 3,066.9 දක්වා සියයට 10.8කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-8).

II-8 සංඛ්‍යා සටහන

අරමුදල පිළිබඳ තෝරා ගත් මූලික දත්ත

අයිතමය	2020	2021(අ)	වෙනස(%)
අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන)	2,824.3	3,166.1	12.1
සාමාජිකයන් සඳහා වන සමස්ත වගකීම (රුපියල් බිලියන)	2,767.8	3,066.9	10.8
මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන)	19.8	19.8	-
දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් සංඛ්‍යාව (මිලියන)	2.6	2.3	(11.5)
දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් සංඛ්‍යාව (මිලියන)	17.2	17.5	1.7
මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන)	150.7	165.7	9.9
මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන)	109.7	118.2	7.7
ශුද්ධ දායක මුදල් (රුපියල් බිලියන)	41.0	47.5	15.9
ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව	197,401	179,681	(9.0)

(අ) තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(ඇ) අරමුදලෙහි ආයෝජන කටයුතු

සේ.අ. අරමුදලෙහි අරමුදල් කළමනාකරණ කටයුතු සම්බන්ධ තීරණ සේ.අ.අ. ආයෝජන කමිටුව විසින් ගනු ලබයි. මෙම කමිටුව මගින් දෛනිකව අරමුදලේ මුදල් ප්‍රවාහය සැලකිල්ලට ගනිමින් ද්‍රවශීලතා මට්ටම තක්සේරු කිරීම හා ආයෝජන අවස්ථා ඇගයීම සිදු කරනු ලබයි. සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව විසින් මාසිකව ආයෝජන කටයුතු

අධීක්ෂණය කරනු ලබන අතර මුදල් මණ්ඩලය අනුමත කරන ලද, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ මූලික කර ගනිමින් උපායමාර්ගික සහ ප්‍රතිපත්තිමය මග පෙන්වීම් සපයනු ලබයි. තවද, සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් අරමුදල් ආයෝජන සම්බන්ධ ගනුදෙනු සහ ආයෝජන කළඹ පිළිබඳව මුදල් මණ්ඩලය මාසිකව දැනුම්වත් කරනු ලබන අතර, එමගින් ආයෝජන කටයුතුවල අධීක්ෂණය ශක්තිමත් කරනු ලබයි.

යථෝක්ත වර්ෂයේ දී, ඉතා අඩු පොලී අනුපාතිකයක් සහ කොවිඩ්-19 වසංගතය මගින් ඇති වූ අස්ථාවරභාවයන් මධ්‍යයේ අරමුදලෙහි ආයෝජන කටයුතු පවත්වාගෙන යන ලදී. එහිදී, අරමුදලෙහි උපායමාර්ගික අරමුදල් වෙන් කිරීමට අනුකූල වෙමින්, සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් එහි අරමුදල්වලින් බහුතර ප්‍රමාණයක් රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය කරන ලදී. අඩු පොලී අනුපාතිකයන් මගින් සමස්ත ආයෝජන කළඹ මත ඇති වන බලපෑම සමනය කරනු පිණිස, සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් කෙටි හා මධ්‍ය කාලීන රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කරන ලද අතරම, අඩු පොලී අනුපාත තත්ත්වයක් තුළ සාමාජිකයන්ට සාධාරණ පොලී අනුපාතිකයක් ලබා දීමේ අවශ්‍යතාවය සලකා බලා දිගු කාලීන රාජ්‍ය සුරැකුම්පත් වලද (වසර 5ට වඩා වැඩි) ආයෝජනය කරන ලදී. එමෙන්ම, දේශීය කොටස් වෙළෙඳපොළ තුළ පැවති ධනාත්මක තත්ත්වයන්හි වාසිය ලබා ගනිමින් තෝරාගත් කොටස් විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ උපයා ගැනීමට ද පියවර ගන්නා ලදී. පැවති අඩු පොලී අනුපාත තත්ත්වය මෙන්ම, අරමුදලෙහි ණය අවදානම අඩු කිරීම සඳහා ඉහළ ණය ශ්‍රේණිගත කිරීම් සහිත සමාගම්හි ආයෝජනය කිරීමේ වැදගත්කම ද සැලකිල්ලට ගත යුතු වූ බැවින් මෙම කාලය තුළ දී පැවති සාංගමික ණයකරවල ආයෝජන අවස්ථා සීමාසහිත විය.

ඒ අනුව, 2021 වසර අවසාන වනවිට පැවති ආයෝජන කළඹ රුපියල් බිලියන 3,173.3ක් වූ අතර, එහි සංයුතිය සියයට 93.2ක් රාජ්‍ය සුරැකුම්පත් ද, සියයට 3.8ක් සමාගම් කොටස් ද, සියයට 0.8ක් සාංගමික ණයකර ද, සියයට 1.8ක් ස්ථාවර තැන්පතු සහ ඉතිරි සියයට 0.4 ප්‍රති විකුණුම් ගිවිසුම්වලින් ද සමන්විත විය.

(ඇ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

සේ.අ.අ. දෙපාර්තමේන්තුව 2021 අවසානයේ පැවති සාමාජික ශේෂයන් මත සියයට 9.00ක පොලී අනුපාතයක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, පසුගිය වසර 10 තුළ දී මෙන්ම, සේ.අ. අරමුදලට, එහි සාමාජිකයින් වෙත ඉහළ පොලියක් ගෙවීමට හැකි විය.

(ඉ) සාමාජික සේවාවන්හි නිරත වීම

(i) සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම

සක්‍රීය සාමාජිකයින්ට අරමුදලෙහි ලියාපදිංචි වී ඇති ඔවුන්ගේ සේවායෝජකයන් හරහා වසරකට දෙවරක් සාමාජික ගිණුම් ප්‍රකාශ බෙදා හරිනු ලැබේ. ඒ අනුව, 2020 වසරේ පළමු භාගයට සහ දෙවන භාගයට අදාළ සාමාජික ගිණුම් ප්‍රකාශ 2021 වසරේ දී බෙදා හරින ලදී (සංඛ්‍යා සටහන II-9).

II-9 සංඛ්‍යා සටහන

නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශ

කාලපරිච්ඡේදය	සේවායෝජකයින් සංඛ්‍යාව	ප්‍රකාශ සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්)
2020 පළමු අර්ධ වර්ෂය	69,998	1,999,486
2020 දෙවන අර්ධ වර්ෂය	77,912	2,451,346

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(ii) නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ට ණය සුරැකුම් සහතිකපත් නිකුත් කිරීම

2021 වසර තුළ දී සේ.අ. අරමුදලෙහි නිවාස ණය සුරැකුම් ක්‍රමය යටතේ රුපියල් මිලියන 5,423ක ප්‍රමාණයකින් යුතු වූ නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ගේ ගිණුම් ශේෂ මත ණය සුරැකුම්පත් 9,068ක ප්‍රමාණයක් සහභාගීවන ණය ලබා දෙන ආයතන වෙත නිකුත් කරන ලදී (සංඛ්‍යා සටහන II-10). තවද, 2020 වසර තුළ සාමාජිකයන් විසින් නොගෙවූ ණය පියවීම සඳහා රුපියල් මිලියන 3,573කට ආසන්න මුදලක් 2021 වසරේ දී අදාළ සාමාජික ගිණුම් වලින් අඩු කොට, සහභාගීවන ණය දෙන ආයතනවලට ප්‍රේෂණය කරන ලදී.

II-10 සංඛ්‍යා සටහන

නිවාස ණය සුරැකුම් පහසුකම්

වසර	සහතිකපත් නිකුත් කරන ලද ගණන	අනුමත කරන ලද නිවාස ණය මුදල (රුපියල් මිලියන)	සහභාගීවන ණය දෙන ආයතන වෙත කළ ප්‍රේෂණයන් (රුපියල් මිලියන)
2017	10,998	4,946	2,485
2018	10,036	4,974	2,759
2019	10,022	5,097	3,164
2020	8,537	4,497	3,321
2021	9,068	5,423	3,573

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(iii) පූර්ව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය

2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද රෙගුලාසී අනුව, පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමයක්, හඳුන්වා දෙන ලදී. ඒ අනුව, සාමාජික ගිණුම් ශේෂ රු.300,000ට වැඩි සහ සේවා කාලය වසර 10කට වැඩි කාලයක් සේ.අ. අරමුදලට දායක මුදල් ගෙවනු ලබන සක්‍රීය සාමාජිකයන් හට තම ගිණුමේ ඇති ශේෂයෙන් රු. මිලියන 2ක උපරිමයකට යටත්ව, සියයට 30ක මුදලක් නිවාස ඉදිකිරීම් හෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා ලබා ගැනීමේ හිමිකම 2015 වසරේ සිට ලබා දී ඇත. මෙම ක්‍රමය සඳහා සාමාජිකයින්ගෙන් ඉහළ ඉල්ලුමක් පවතී. මෙම ක්‍රමය යටතේ 2021 වසර තුළ දී ප්‍රතිලාභීන් 16,554 ක් වෙත රුපියල් බිලියන 8.8 ක්

නිදහස් කර ඇති අතර, 2021 වසර අග වනවිට රුපියල් බිලියන 107.1 ක මුදලක් ප්‍රතිලාභ ලාභීන් 197,057ක් වෙත ගෙවා ඇත.

(iv) සේ.අ.අ. ජංගම සේවාවන්

සේ.අ.අ. දෙපාර්තමේන්තුවට පැමිණීමෙන් සාමාජිකයෙකු හට ලබාගත හැකි සේවාවන් සියල්ලක්ම පාහේ ලබා දෙමින් 2021 වසරේ දී ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් ජංගම සේවා වැඩසටහනක් පවත්වන ලදී. සේ.අ.අ. ශේෂ ප්‍රකාශ නිකුත් කිරීම, සේ.අ.අ. සාමාජික දත්ත සංශෝධනය, අවිනිශ්චිත ගිණුම්හි පැවති ශේෂ නිරවුල් කිරීම, සේ.අ.අ. ගිණුම් තොරතුරු සංශෝධනය, කෙටි පණිවිඩ හා අන්තර්ජාලය හරහා සාමාජික ශේෂ පිරික්සුම පිළිබඳ දැනුම්වත් කිරීම යන සේවාවන් මෙහිදී සපයන ලදී. තවද, විද්‍යුත් මාධ්‍ය හා ඍජු හර කිරීම භාවිතයෙන් දායක මුදල් බැර කිරීමේ ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම, සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම හා සමස්ත සේ.අ.අ. ක්‍රියාපටිපාටි පිළිබඳ උපදේශනයන් ද සිදු කරන ලදී. කෙසේවෙතත්, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි සේ.අ.අ. ජංගම සේවා පැවැත්වීම සීමා කරන ලදී.

(v) විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් රැස්කිරීම

2021 වසර සේ.අ.අ. දෙපාර්තමේන්තුව සඳහා කැපී පෙනෙන වසරක් වූයේ, පවතින විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ සහ විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් දායක මුදල් ගෙවීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා නවීකරණය කරන ලද නිල වෙබ් අඩවිය හරහා නව යාන්ත්‍රණයක් හඳුන්වා දුන් බැවිනි. එමගින් සේවායෝජකයින්ට සේ.අ.අ. නිල වෙබ් අඩවිය හරහා ඔවුන්ගේ විද්‍යුත් දත්ත වාර්තා ඉදිරිපත් කිරීමට සහ 'LankaPay Online Payment Platform (LPOPP) හරහා නියෝජිත වාණිජ බැංකු හරහා මාර්ගගතව ගෙවීමට හෝ චෙක්පතක් මගින් හෝ ඍජු හර ක්‍රමය යටතේ ඊට අදාළ දායක මුදල් ගෙවීමට හැකියාව ලබා දී ඇත. 2021 වර්ෂය අග වන විට ලංකා බැංකුව, මහජන බැංකුව සහ කොමර්ෂල් බැංකුව මෙකී පහසුකම සම්බන්ධයෙන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වූ බලපත්‍රලාභී වාණිජ බැංකු වේ. නව ක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ නිවැරදි ලෙස දායක මුදල් ගෙවා පැය 24ක් ඇතුළත සාමාජික ගිණුම් යාවත්කාලීන වීමයි. තවද, මෙම ක්‍රමය යටතේ සේවායෝජකයන් හට තමන් සේ.අ.අ. වෙත යොමු කරන දායකත්ව විස්තර වාර්තාවේ දත්ත, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ දත්ත සමඟ ස්වයංකෘතව සන්සන්දනය වීමෙන් එහි නිරවද්‍යතාවය සහතික වීමේ පහසුකම ද ලැබී ඇත. මෙම ක්‍රමය තුළින් නිරවද්‍ය සේ.අ.අ. දත්ත සමුදායක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියෙහි සැලකිය යුතු දියුණුවක් වනු ඇති අතර එමගින් අනාගතයේ දී අදාළ සේවායෝජකයින්ට සිය සාමාජිකයින්ගේ තොරතුරු සංශෝධන සඳහා වන අවශ්‍යතාවයක් මතු නොවනු හෝ අවම වනු ඇත.

2021 වසර අවසාන වනවිට, ආසන්න වශයෙන් සක්‍රීය සාමාජිකත්වයෙන් සියයට 88ක ප්‍රමාණයක් නියෝජනය කරමින් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 10,069 සිට 11,260 දක්වා වැඩි වූ අතර, අදාළ ගෙවීම් මාසික සමස්ත දායක මුදලෙන් සියයට 88ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි. මීට අමතරව, ප්‍රමාදයකින් තොරව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම සඳහා සාමාජිකයන්ගේ තොරතුරුවල ඇති විෂමතාවයන් නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම පිළිබඳව සේවායෝජකයින් දැනුම්වත් කිරීම, විද්‍යුත් ක්‍රමය මගින් දායක මුදල් ගෙවීම සහ ඒ තුළින් සේ.අ.අ. පාර්ශ්වකරුවන් හට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ තවදුරටත් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

(vi) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම

2021 වසර තුළ රට තුළ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ බාධා වීම් හමුවේ සුළු පසුබෑමක් ඇති වුව ද, සාමාජිකයින් 18,758ක් ඒකීය හඳුනාගැනීමේ අංකය ලෙස භාවිතා කරන ජාතික හැඳුනුම්පත් අංකය සහ එහි විස්තර අනුව නැවත ලියාපදිංචි කරන ලදී. ඒ අනුව, 2021 වසර අවසන් වනවිට අරමුදලේ නැවත ලියාපදිංචි වූ මුළු සාමාජිකයන් සංඛ්‍යාව 1,656,019කි.

තවද, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ (පු.ලි.දෙ.) දත්ත ගබඩාවට ලබා ගත් ප්‍රවේශය මත පදනම්ව, 2022 දී ක්‍රියාකාරී සාමාජිකයින් වැඩි සංඛ්‍යාවක් ආවරණය වන පරිදි සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා 2021 වසරේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර කිහිපයක් ගන්නා ලදී.

(vii) සාමාජිකයින්ට ලබා දෙන වෙනත් සේවා

2021 වසරේ දී පැවති, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන්, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් අංශයට එහි කටයුතු සිදු කර ගැනීම වඩාත් අභියෝගාත්මක විය. වසර තුළ දී, සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත සාමාජික/සේවායෝජක පැමිණීම් 96,561 ක් වාර්තා වූ අතර, දුරකථන ඇමතුම් හරහා පුද්ගලයින් 50,071 දෙනෙක් ද ඊමේල් හරහා සාමාජිකයින් 11,059 දෙනෙක් ද විමසීම් සිදු කර ඇත. තවද, සාමාජිකයින්, සේවායෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් දෙපාර්තමේන්තුව වෙත එවන ලද ලිපි ප්‍රමාණය 76,759ක් විය.

2021 වර්ෂයේ දී, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ වාර්තා සංශෝධන අංශය සාමාජිකයින්ගේ නම සහ ජාතික හැඳුනුම්පත් විස්තර නොගැළපීම්, ගිණුම් අංක නිවැරදි කිරීම සහ අදාළ සාමාජිකයින්ගේ නිවැරදි ගිණුම් ශේෂයන් යාවත්කාලීන කිරීම සඳහා වාර්තා සංශෝධන 33,400ක් සිදු කර ඇත. පු.ලි.දෙ. හි දත්ත ගබඩාවට ප්‍රවේශය ලැබීමත් සමඟ, විශේෂයෙන් සාමාජිකයින්ගේ අනන්‍යතා සත්‍යාපන කිරීමේ වාර්තා සංශෝධන අදියරේ දී, තම සාමාජිකයින්ට කඩිනමින් සේවයක් සැපයීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුවට හැකි විය.

(ඊ) ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ ධාරිතා සංවර්ධනය

සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ හා ධාරිතා සංවර්ධන අංශය සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිය නවීකරණය සඳහා ලෝක බැංකුව විසින් යෝජිත මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතියේ මෙහෙයවන්නා ලෙස කටයුතු කිරීමට සහ දැනට සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වෙමින් පවතින ඕනෑම නව්‍යතා සම්පාදනයක් වෙනුවෙන් අවශ්‍ය සහාය දැක්වීමේ අරමුණින් 2021 අප්‍රේල් මස ස්ථාපනය කරන ලදී.

2021 වර්ෂයේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය එහි සාමාජිකයින්ට මාර්ගගතව දායක මුදල් ගෙවීමේ වේදිකාවක් ද සමගින් සාර්ථකව නැවත දියත් කිරීමට සමත් විය. 2022 වසර තුළ ජංගම දුරකථන පදනම් කරගත් ගෙවීම් ද්වාරයකින් සාමාජිකයින්ට පහසුකම් සපයනු ලැබීම සඳහා මෙම වේදිකාව තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදු කරමින් පවතී.

2021 අවසාන කාර්තු දෙක තුළ සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිය ව්‍යාපෘති කළමනාකරු වශයෙන් කටයුතු කිරීම සඳහා තෝරා ගනු ලැබූ ඉන්දියාවේ ප්‍රයිස්වෝටර් හවුස් කූපර්ස් ආයතනය සමඟ ගිවිසුම්ගත වීමේ කටයුතු අවසන් කිරීම සඳහා ක්‍රියා කරන ලදී. සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ පවතින ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම, නවෝත්පාදන හඳුන්වා දීම සහ අවසානයේ දී වැඩිදියුණු කළ සාමාජික සේවා අන්තර්ගත නවීනතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුමක් හඳුන්වාදීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට මෙම උපදේශන වැඩපිළිවෙළ සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

9. පහසුකම් කළමනාකරණ

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු කාර්යාල පරිශ්‍රයන් නිසි පරිදි පවත්වාගැනීම සහ අලුත්වැඩියාවන් සිදු කිරීම මගින් වඩා යහපත් වූ කාර්යාල වටපිටාවක් නිර්මාණය කිරීමේ සිය මූලික වගකීම සමාජය තුළ පැතිර පැවති වසංගත තත්වය හමුවේ පවා ගෙවීගිය 2021 වසර තුළ තවදුරටත් ඉටු කරන ලදී. එම අරමුණු තවදුරටත් සාක්ෂාත් කරගනුවස්, සිය දිවියේ තෙවන දශකය පසුකරන මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිල්ල තුළ පිහිටි වැසිකිලි පද්ධතීන් නවීකරණය කිරීමත් පැන්ට්‍රි ඒකක ප්‍රතිස්ථාපනය කිරීම, හඳුනාගත් ස්ථානවල දියවරනය කිරීම, හඳුනාගත් යාන්ත්‍රික සහ විදුලි පද්ධතීන් ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු කඩිනමින් ඉටුකිරීමේ වැඩ පිළිවෙලක් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළ දී දියත්කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව සතු වටිනා සම්පතක්වන ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව සතුව ඇති සන්නිවේදන පද්ධතිය නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත වඩාත් ස්ථායි සේවයක් සපයන පද්ධතියක් බවට පර්වර්තනය කිරීම මෙම වසර තුළ සම්පූර්ණ කිරීමට හැකි විය. ගෙවී ගිය වසර තුළ අභිනවයෙන් හඳුන්වාදුන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නව දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය ඉඩපහසුකම් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සැපයීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිය මූලික කාර්යක් ලෙස සලකා ඉටු කිරීමට පියවර ගන්නා ලදී. දෙපාර්තමේන්තුව යටතේ දැනට පවතින සියලු රථ වාහන අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ පවතින සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් හැකි උපරිම අයුරින්, එහි ප්‍රධාන ගොඩනැගිල්ල තුළින් ලබා දීමට හැකි වීම සාධනීය ඉදිරි පියවරක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ තීරණයකට අනුව යමින්, මහ බැංකුව සතුව පැවති ලොයිඩ් ගොඩනැගිල්ල, අමාත්‍ය මණ්ඩල කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා රජය වෙත පවරා දීම මෙම වසර තුළ සිදුවිය. එම ගොඩනැගිල්ල තුළ පවත්වාගෙන ගිය සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අංශයන් කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව සතු වයිට්එවේස් ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කිරීම එම ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගෙන සිටි පාර්ශ්වය ඉන් අර්ධ වශයෙන් ඉවත් වීමත් සමඟ සිදු කරන ලදී.

රාජගිරියේ පිහිටි බැංකු අධ්‍යයන කේන්ද්‍රය තුළ ඉදිකරන ලද සවරින් අධ්‍යයන කේන්ද්‍ර ගොඩනැගිල්ල සඳහා ආරක්ෂණ කැමරා පද්ධතියක් සහ පිවිසුම් පාලන පද්ධතියක් ස්ථාපනය කිරීම 2021 වසර තුළ නිම කරන ලදී. කාලීන අවශ්‍යතා හඳුනාගෙන, නවීන අභ්‍යන්තර ස්වයංක්‍රීය දුරකථන හුවමාරු පද්ධතියක් මාතර පිහිටි මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාපනය කිරීම සිදු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය සේවක සුභසාධනය අරමුණු කොටගෙන පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතනයන්හි අලුත්වැඩියා සහ නවීකරණ කටයුතු නොකඩවා සිදුකරගෙන ගිය අතර නුවරඑළිය නිවාඩු නිකේතනයේ පැවති පැන්ට්‍රි ඒකක ප්‍රතිස්ථාපනය පසුගිය වසර තුළ සිදු විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාකාරිත්වය ප්‍රාදේශීය මට්ටමින් වඩාත් ශක්තිමත් කරමින් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් එහි ප්‍රවාහන අවශ්‍යතා සඳහා බාහිර ප්‍රවාහන සැපයුම්කරුවන් (රියදුරු සහිත වාහන) සපයාදීම සිදු විය. ඊට සමගාමීව, නැවත නව වාහන මිලදී ගැනීම සිදුවනතෙක්, දැනට මහ බැංකුව සතුව පවතින සියලු රථවාහන අවශ්‍ය අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සිදු කිරීම මගින් ඉහළ ධාවන තත්වයකට උසස්කිරීම සිදු කරන ලදී. තව ද, මහ බැංකුවේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තු මගින් නම්කරන ලද සේවකයින් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කළ අතර ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින් සඳහා ම වෙන් වූ කාර්යාල ප්‍රවාහන පහසුකම් ක්‍රියාත්මක කිරීම මගින් වඩා ආරක්ෂාකාරී වටපිටාවක් හා සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමට කටයුතු කරන ලදී.

ගෙවී ගිය වසර පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉතා අභියෝගකාරි වසරක් වූයේ වසංගත තත්ත්වය නිසා ගමනාගමනය සීමා කිරීම සහ සමාජ දුරස්ථභාවය පවත්වා

ගැනීමට සිදු වීම හේතුවෙනි. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහ එහි පැමිණෙන අමුත්තන් සඳහා කොවිඩ්-19 ආශ්‍රිත විශේෂ සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී.

තව ද, සිරිත් පරිදි, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩ ව සිදු කර ගෙන යනු ලබන අත්‍යවශ්‍ය සේවාවන්, ප්‍රවාහන සේවාවන් සහ සන්නිවේදන පහසුකම් උක්ත කාල පරාසය තුළ සාර්ථක ලෙස සැපයීම සිදු විය.

10. මූල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. 2002 වර්ෂයේ සිට මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ රාමුව අදාළ කර ගන්නා ලදී. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම, දායක අරමුදල් මුදාහැරීම සහ රාජ්‍ය විදේශීය ණය ආපසු ගෙවීම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වාගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 17 හි ආයෝජන කළඹ කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුලත් වේ.

10.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය** : 1949 අංක 58 දරන මුදල් නීති පනතේ විධි විධාන ප්‍රකාරව, 2020 වසරේ දෙසැම්බර් මාසය හා 2021 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම උදෙසා පිළියෙල කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා** : ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ප්‍රගතිය සහ මූල්‍ය තත්ත්වය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** : මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම උදෙසා අවශ්‍ය වන අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූල වීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කර ඇත. 2021 වර්ෂයේ දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ 11 වන කොටස ආරම්භයේ දී ඉදිරිපත් කර ඇත.

10.2 වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම් යටතේ ඇති කාර්ය සැලසුම්වලට අනුකූලව "පරිසණකගත අයවැය සැකසුම් පද්ධතියක්" මගින් පිළියෙල කරන ලදී. 2022 වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2021 දෙසැම්බර් මස ලබා ගන්නා ලද අතර, එය 2022 වසරේ වැඩ කරන මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2021 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා, ඵලදායී අයවැය පාලනය සඳහා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

10.3 අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම

(අ) 2021 වසර තුළ දී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභ්‍යන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය සිදු කරන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2021 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 5,730 ක් සිදු කරන ලද අතර, ඉන් 5,540ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 190ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) ආසන්න වශයෙන්, 2021 වසර තුළ දී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහ රු. බිලියන 617.94ක වටිනාකමකින් යුත් ණය අරමුදල් නිදහස් කිරීම් 3,412ක් සහ රු. බිලියන 1,396.55ක වටිනාකමකින් යුත් විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 631ක් සිදු කර ඇත. මීට අමතරව විදේශීය වශයෙන් ලැබුණු ණයක් සහ අනුග්‍රාහකයෙකු විසින් මූල්‍යනය කළ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් විදේශීය බැංකු දෙකක් සමග බැංකු එකඟතා ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදී.

10.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

(අ) මුදල් මණ්ඩල තීරණයකට අනුව මහ බැංකුවේ අභ්‍යන්තර අරමුදල් (සේවක අර්ථ සාධක අරමුදල හැර) මධ්‍යගත ලෙස කළමණාකරණය කිරීම සඳහා 2016 මාර්තු මස සිට මෙහෙයුම් ඇරඹූ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලද වෙන්වූ ඒකකය මගින් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන බැංකුවෙහි කාර්ය මණ්ඩලයේ සහ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 8ක් සහ වෙනත් අරමුදල් 4ක්, නිරාකරණය හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ශ්‍රී ලංකා තැන්පතු සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල, කාර්ය මණ්ඩල කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අරමුදල් 3ක් හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ව්‍යාපෘති අරමුදල් ඇතුළත් අභ්‍යන්තර අරමුදල් 17ක් කළමණාකරණය කරන ලදී.

මෙම සියලු අරමුදල් පොදු ආයෝජන ප්‍රතිපත්තියක් යටතේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කෙරෙන අතර, අදාළ අරමුදල් හිමිකාර දෙපාර්තමේන්තු ඒවායේ පරිපාලක ලෙස කටයුතු කරයි. මෙම අරමුදල් කළමණාකරන ක්‍රියාවලිය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය/ක්‍රියාපටිපාටීන් සහ ක්‍රමෝපායිකව වත්කම් ආයෝජනයන් සඳහා වෙන්කිරීම් වෙනුවෙන් වූ ක්‍රියාපටිපාටීන් මඟින් පාලනය වේ. තවද, මෙම ක්‍රියාවලිය ස්වාධීනව කටයුතු කරන ඉදිරි කාර්යාලය හා පසු කාර්යාලයකින් සමන්විත වන අතර මූල්‍ය අංශය නියාමනය හා අධීක්ෂණ කටයුතු භාර නියෝජ්‍ය අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර ආයෝජන පිළිබඳ අධීක්ෂණ කමිටුව මගින් මෙම ආයෝජන කාර්යයන් අධීක්ෂණය කෙරේ. අරමුදල් ආයෝජන උපදෙස් දීම සහ නිරීක්ෂණය කිරීම සඳහා වන මෙම කමිටුව 2021 වසර තුළ 12 වතාවක් රැස් විය. මෙම අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන්හි කාර්ය සාධන වාර්තා මාසික වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

(ආ) මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, ස්ථාවර තැන්පතුවල, ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකරවල හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කෙරේ. විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 6ක 2020 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීති රීති වලට අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2021 වසර අග වන විට මෙම මුළු අරමුදල රු. බිලියන 151.7 දක්වා වර්ධනය විය.

II-11 සංඛ්‍යා සටහන

ආයෝජන කළඹ තත්ත්වය - (රු. බිලියන)

දෙපාර්තමේන්තුව	2021 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය)	2020 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය)
මූල්‍ය	75.3	64.9
නිරාකරණ හා බලගැන්වීම්	70.9	60.4
ප්‍රාදේශීය සංවර්ධන	5.4	6.3
කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා	0.06	0.06
එකතුව	151.7	131.7

10.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් මොඩියුලය යටතේ වන ස්ථාවර වත්කම් ලේඛනය තුළ මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වාගෙන යනු ලබයි. මේ හා සම්බන්ධ සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම්, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2021 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තා කර ඇත. ඒ අනුව, අයිතමයන් අත්පත් කර ගැනීම් 741ක් සහ බැහැර කිරීම් 346ක් සමඟින් 2021 වසර තුළ දී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

10.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩ ලෙස යාවත්කාලීනව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමණාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2021 වසර තුළ දී පහසුකම් සපයන ලදී. ඒ අනුව, 2021 වසර තුළ දී රු. බිලියන 1.14ක වටිනාකමකින් යුත් 1,000ක ණය සංඛ්‍යාවක් සේවකයන් සඳහා පිරිනමා ඇත.

10.7 අනෙකුත් කාර්යයන් - මිලදී ගැනීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති රීති වලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව බැංකුවෙහි භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු, ටෙන්ඩර් මණ්ඩල සහ ස්ථාවර වත්කම් බැහැර කිරීම් සඳහා වන සමීක්ෂණ මණ්ඩල නියෝජනය කරයි. ඒ අනුව, 2021 වසර තුළ දී මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එවැනි මිලදී ගැනීම් හා සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩල 152ක්, සහ තාක්ෂණික ඇගයීම් කමිටු 75ක්, නියෝජනය කර ඇත.

II. මූල්‍ය පාරිභෝගික සබඳතා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනයන්ගේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් 2020 අගෝස්තු මස දී මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන පිළිබඳව මහජනයා විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි/දුක්ගැනවිලි සහ විමසීම් සම්බන්ධව කටයුතු සිදු කරන අතරතුර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් නව රෙගුලාසි හඳුන්වාදීම සඳහා කටයුතු 2021 දී ආරම්භ කරන ලදී. මසකට පැමිණිලි 500ක සාමාන්‍යයක් සහිතව 2021 වසර තුළ දී මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි/දුක්ගැනවිලි 6,186ක ප්‍රමාණයක් ලැබී ඇත. මෙම පැමිණිලි අතුරින් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාමාර්ග ගත යුතු බවට නිර්ණය කළ පැමිණිලිවලින් සියයට 94ක් අදාළ මූල්‍ය ආයතනය හෝ අධීක්ෂණ දෙපාර්තමේන්තුව/කාර්යාංශය වෙත ඉදිරිපත් කර ඇත. තවද, මෙම පැමිණිලි/දුක්ගැනවිලි අතුරින් බොහොමයක් කොවිඩ්-19 වසංගතය නිසා කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලයින් හට සිදු වූ බලපෑම හේතුවෙන් ඉල්ලුම් කළ ණය සහන, ණය ප්‍රතිලේඛන ගත කිරීම, ඉහළ පොලී අනුපාතික, පිළිගත නොහැකි/සදාචාරාත්මක නොවන ක්‍රියාවන් සහ ණය පහසුකම් කලින් පියවීම සම්බන්ධයෙන් විය. මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් 2021 අගෝස්තු මාසයේදී පැමිණිලි ඉදිරිපත් කිරීමේ සරල

ආකෘති පත්‍රයක් හඳුන්වා දුන් අතර මෙමගින් පැමිණිලි/ දුක්ගැනවිලිවල සම්පූර්ණත්වය තහවුරු කරන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය ද කාර්යක්ෂම කරනු ඇත. තවද, මෙමගින් මූල්‍ය පාරිභෝගිකයින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලිවල තොරතුරු ස්වයංක්‍රීයව වාර්තා වීමට ඉඩ සැලසෙන අතර එය ප්‍රතිපත්තිමය තීරණ සඳහා අවශ්‍ය කරනු ලබන දත්ත විශ්ලේෂණය කිරීමට ද ප්‍රයෝජනවත් වනු ඇත.

මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙනත් අදාළ දෙපාර්තමේන්තුවල සහය ද ඇතිව 2021 මැයි මාසයේ දී බාහිරින් ලබා ගත් කාර්ය මණ්ඩලයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ සබඳතා මධ්‍යස්ථානය (Contact Center) පිහිටුවන ලදී. මෙම නව සබඳතා මධ්‍යස්ථානය, නවීන තාක්ෂණයකින් යුක්ත ඇමතුම් මධ්‍යස්ථානයක මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය උපාංගවලින් සමන්විත වේ. ඒ අනුව, මෙම සබඳතා මධ්‍යස්ථානය වෙතින් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජකාරී කාලය තුළ භාෂා ත්‍රිත්වයෙන්ම සේවා ලබා ගත හැකි වන අතර එම මධ්‍යස්ථානයට ලැබෙන සියලුම දුරකථන සංවාද පටිගත වීමේ පහසුකම් ද සහිත වේ. තවද, මහජනයා හට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පහසුවෙන් සහ කාර්යක්ෂමව දුරකතනයෙන් සම්බන්ධ වීමේ හැකියාව ලබා දීමේ අරමුණින් ක්ෂණික ඇමතුම් අංක 1935 හඳුන්වා දුන් අතර එමගින් ශ්‍රී ලංකාවේ ඕනෑම දුරකතන ජාලයකින් ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධ විය හැක. ශ්‍රී ලංකා මහ බැංකුවේ සබඳතා මධ්‍යස්ථානය මගින් මාසිකව දුරකථන ඇමතුම් 5,000 කට අධික ප්‍රමාණයකට පිළිතුරු සපයනු ලැබේ. තවද, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ දැනුම සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම් ඉස්මතු කරමින් අන්තර්ජාල පෝස්ටරයක් (Web Poster) ප්‍රකාශයට පත් කරන ලද අතර සම්මන්ත්‍රණ, වෙබිනාර් (webinar) සහ සම්මුඛ පරීක්ෂණ ඇතුළු පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

12. මූල්‍ය බුද්ධි ඒකකය

කොවිඩ්-19 ගෝලීය වසංගතයත් සමග පැන නැඟුණු අභියෝග රාශියක් මධ්‍යයේ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය එහි දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ එක්ව, ශ්‍රී ලංකාව තුළ ඵලදායී මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීමේ යාන්ත්‍රණය ප්‍රධාන නීති තුනක් මත ගොඩනගා ඇත. එනම්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීමේ සම්මුති පනත සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත වේ. අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවා ඇති අතර එම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම දරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි රටේ ප්‍රමුඛ නියාමකයා ලෙස මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි පාලන තන්ත්‍රය යටතේ බොහෝ මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් වෙත ළඟා වී මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ (මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළක්වීමේ සහ න්‍යෂ්ටික අවි මූල්‍යකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්) වලට අනුකූල වීම සඳහා ක්‍රියාකර ඇත.

මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කර්තව්‍යයන් අතරට වර්තමාන වෙළඳපල වර්ධනයන් සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූලව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි වීම සඳහා අදාළ පනත්, රෙගුලාසි සහ රීති සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම; උපායමාර්ගික සහ මෙහෙයුම් විශ්ලේෂණ පැවැත්වීම හරහා සුදුසු නීති බලාත්මක කිරීමේ ආයතන සහ අධීක්ෂණ අධිකාරීන් වෙත මූල්‍ය බුද්ධි තොරතුරු බෙදා හැරීම; ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම සඳහා මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් තුළ අවදානම් මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම; සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන්හි ඉලක්කගත මූල්‍ය සම්බාධකවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

12.1 මූල්‍ය බුද්ධි කළමනාකරණය

ගනුදෙනු වාර්තා කිරීමේ සීමාවට යටත් වූ වාර්තාකරණ සහ අනෙකුත් වාර්තාකරණ අවශ්‍යතා සපුරාලීමට සහාය වීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති වෙබ් පාදක පද්ධතියක් වන 'LankaFin' හරහා වාර්තාකරණ ආයතන විසින් අනිවාර්ය අවශ්‍යතා අනුව, 2021 වර්ෂය තුළ සැක කටයුතු ගනුදෙනු ඇතුළු මූල්‍ය ගනුදෙනු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම අඛණ්ඩව සිදු කර ඇත.

බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම්, කොටස් තැරැව්කරුවන් සහ මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන් විසින් දේශීය හා විදේශීය වශයෙන් රු. මිලියන 1.0 සහ ඊට වැඩි හෝ විදේශ මුදල් වලින් එයට සමාන වන මුදල් සහ ඉලෙක්ට්‍රොනික අරමුදල් මාරු කිරීම් පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත දිගින් දිගටම වාර්තා කරන ලදී.

2021 වසර තුළ, වාර්තාකරණ ආයතන විසින් මුදල් ගනුදෙනු වාර්තා මිලියන 5.7ක් සහ ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු වාර්තා මිලියන 9.2ක් වාර්තා කර ඇත. මීට අමතරව, වාර්තාකරණ ආයතන විසින් මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 7 වැනි වගන්තිය අනුව මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක සහිත ගනුදෙනු වාර්තා 4,696ක් ඉදිරිපත් කරන ලදී. ලැබුණු සැක සහිත ගනුදෙනු වාර්තා වල ක්‍රියාකාරී සහ උපායමාර්ගික විශ්ලේෂණයන්ගෙන් පසුව, වැඩිදුර විමර්ශන සඳහා ඉන් 1,830ක් නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී. සැක සහිත

ගනුදෙනු වාර්තා 2,220ක් අඛණ්ඩව අවේක්ෂණ ක්‍රියාවලිය යටතේ තබා ඇති අතර, 641ක් මූලික විශ්ලේෂණය සහ වැඩිදුර අධ්‍යයනය සඳහා තබා ඇත. ඉතිරි සැක සහිත ගනුදෙනු වාර්තා විශ්ලේෂණ ක්‍රියාවලියේ දී සැක කටයුතු ගනුදෙනු තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු හෙළි නොවූ බැවින්, වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලදී.

විශ්ලේෂණ සහ බෙදාහැරීමේ කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතන වෙත 'goAML' මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීමේ වාර්තාකරණ සහ විශ්ලේෂණ පද්ධතිය හඳුන්වා දෙන ලදී. 2021 දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් පද්ධතිය හැඩගස්වන ලද අතර පද්ධතියේ ප්‍රධාන වාර්තාකරණ කාර්යයන් ආරම්භ කරන ලදී. 'goAML' හි ගනුදෙනු වාර්තා කිරීමේ සීමාවට යටත් වූ සහ සැක සහිත ගනුදෙනු වාර්තාකරණයෙහි සජීවී මෙහෙයුම් 2022 පෙබරවාරි මාසයේ දී ආරම්භ කෙරේ.

12.2 නීතිමය රාමුව සහ ආයතනික අනුකූලතාවය

රටේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීමේ පාලන තන්ත්‍රයේ සඵලතාවය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සඳහා ව්‍යවස්ථාදායක සංශෝධන ආරම්භ කරන ලද අතර 2021 තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපවත්වීමේ සම්මුති පනතට සංශෝධන සිදු කිරීමට සහාය විය. මෙම සංශෝධන 2022 අවසන් වන විට බලාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 15 (2) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව, 2021 වර්ෂය තුළ දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ සැකයන් මත පුද්ගලයන් 28 දෙනෙකුගේ ගිණුම් 163ක සහ සිද්ධීන්/නඩු 17කට අදාළ ආයතන 8ක ගනුදෙනු අත්හිටුවීමට පියවර ගන්නා ලදී. ඒ අනුව රු. මිලියන 77.0 (බැර ශේෂයන්), රු. මිලියන 0.9 (අති අයිරා) සහ එක්සත් ජනපද ඩොලර් 12,200 වසර තුළ අත්හිටුවන ලදී. මීට අමතරව, නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් විසින් පරීක්ෂණ පැවැත්වීමට තවදුරටත් කල් ඉල්ලා සිටි බැවින්, පසුගිය වසරවල අත්හිටවූ නඩු 64 කට සම්බන්ධ ගිණුම් 1,000 කට ආසන්නව මාස දෙකක කාල පරතරයකින් දීර්ඝ කරන ලදී.

මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2021 වර්ෂයේ දී මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි අධීක්ෂණ ක්‍රියාවලිය සහ ආයතනික අනුකූලතාවය ශක්තිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ කිහිපයක් නිකුත් කරන ලදී. මෙම මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ III කොටසෙහි අන්තර් ගත වේ. තවද, ඵලදායී අධීක්ෂණ සහ බලාත්මක කිරීම, ස්ථානීය සහ පිටත නිරීක්ෂණ සහ අනුකූලතා සමාලෝචන රැස්වීම් පැවැත්වීම මගින් වාර්තාකරණ ආයතනයන්හි අනුකූලතාවය වැඩි දියුණු කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩ පියවර ගන්නා ලදී. රට තුළ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් අවදානම් පාදක කරගත් එතැන් පරීක්ෂණ පැවැත්වීමේ සීමාවන් තිබියදීත්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතනවල මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා අවදානම් මත පදනම් වූ ස්ථානීය පරීක්ෂණ 2ක්, අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ ස්ථානීය පරීක්ෂණ 7ක්, එතැන් පරීක්ෂණ 7ක් සහ පසු විපරම් විතැන් පරීක්ෂණ 4ක් පවත්වන ලදී. මීට අමතරව, වාර්තාකරණ ආයතනවල මෙන්ම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් තෝරාගත් අවදානම් සංරචක මත තේමාත්මක සමාලෝචන 7ක් පවත්වන ලදී. එසේම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි අනුකූලතාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අදිටනින්, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය හා සම්බන්ධව කටයුතු කරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සංඛ්‍යාව වැඩි කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

දඩ පැනවීම, අනතුරු ඇඟවීමේ ලිපි සහ හේතු පැහැදිලි කිරීමේ ලිපි නිකුත් කිරීම, කාලානුරූපී ක්‍රියාකාරී සැලසුම් නිකුත් කිරීම සහ පසු විපරම් රැස්වීම් පැවැත්වීම වැනි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි නොගැලපීම් සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනෙකුත් නියාමන ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදු කරන ලදී. එපමණක් නොව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2021 වසර සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු හතරක් සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් පහක් සඳහා රුපියල් මිලියන 10.5ක මූල්‍ය දණ්ඩන නියම කරන ලදී. මෙම දණ්ඩන පනවන ලද්දේ එක්සත් ජාතීන්ගේ සම්බාධක සම්බන්ධව අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග, ගනුදෙනුකරු හඳුනාගැනීම තහවුරු කර ගැනීම, සැකකටයුතු ගනුදෙනු වාර්තා කිරීම සහ අවදානම් පාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම හා බැඳුනු ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙනි.

12.3 මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ජාතික අවදානම් තක්සේරුව

මූල්‍ය කාර්ය සාධන බලකායේ නිර්දේශවල නිර්දේශ අංක 1ට අනුකූල වීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2021 දී ලෝක බැංකුවේ සහය ඇතිව සහ පුද්ගලික සහ රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ නියෝජිතායතන 66ක සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ දෙවන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම් තක්සේරුව පැවැත්වීම ආරම්භ කරන ලදී. මාර්ග ගත Webex වේදිකාව භාවිතා කරමින් ශ්‍රී ලංකා ජාතික අවදානම් තක්සේරුවෙහි නිල ආරම්භය සනිටුහන් කරමින් ලෝක බැංකුව සිය හඳුන්වාදීමේ සැසිය 2021 ජූලි 15 වන දින පවත්වන ලදී. ඉන් අනතුරුව ක්‍රියාකාරී කණ්ඩායම් සඳහා වැඩමුළු 13ක් පවත්වන ලදී.

12.4 දේශීය හා ජාත්‍යන්තර සහයෝගිතාව

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත අනුව, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය හට දේශීය හෝ විදේශීය රාජ්‍යයක මූල්‍ය බුද්ධි ඒකකයක් හෝ නියෝජිතායතනයක් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් වලට එළඹිය හැක. ඒ අනුව, 2021 දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් දේශීය නියෝජිතායතන කිහිපයක් සහ විදේශීය මූල්‍ය බුද්ධි ඒකක සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම ආරම්භ කරන ලදී.

මූල්‍ය කාර්ය සාධන බලකාය විසින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් සමූහය සමඟ ඒකාබද්ධව අපරාධ තුළ පවත්නා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා වූ ක්‍රමවේදය අධීක්ෂණයට ලක් කරයි. වසංගතය හේතුවෙන්, ආසියා පැසිෆික් සමූහය විසින් 2021 ජූලි මාසයේ දී එහි වාර්ෂික සැසිය මාර්ගගතව පවත්වන ලද අතර 2021 නොවැම්බර් මාසයේ දී විශේෂ සැසියක් මාර්ගගතව පැවැත්විණි. තවද, අන්‍යෝන්‍ය ඇගයීම් කමිටු රැස්වීම් 2021 ජූනි, ජූලි, සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල දී පවත්වන ලදී. ශ්‍රී ලංකාව පිළිබඳ 6 වැනි පසු විපරම් අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාව 2021 සැප්තැම්බර් මාසයේ පැවති මාර්ගගත අන්‍යෝන්‍ය ඇගයීම් කමිටු රැස්වීම්හි දී සාකච්ඡා කරන ලදී. මෙම ප්‍රගති වාර්තාවේ දී ශ්‍රී ලංකාව 2015 දී අර්ධ වශයෙන් අනුකූල ලෙස ශ්‍රේණිගත කරන ලද 'මුදල් කුරියර්' පිළිබඳ නිර්දේශ 32 සහ 'අනෙකුත් ජාත්‍යන්තර සහයෝගීතා ආකෘති' පිළිබඳ නිර්දේශ අංක 40, එම තත්වයෙන් උසස් කරන ලෙස ඉල්ලා ඇත. නිර්දේශ අංක 32හි ශ්‍රේණිගත කිරීම 'අර්ධ වශයෙන් අනුකූල'සිට 'විශාල ලෙස අනුකූල' දක්වා උසස් කිරීමට සාමාජිකත්වය එකඟ වූ අතර නිර්දේශ අංක 40හි ශ්‍රේණිගත කිරීම එලෙසම පවතී. මේ අනුව, මූල්‍ය කාර්ය සාධන බලකාය විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ 40න්, 2021 අවසානය වන විට, ශ්‍රී ලංකාවට අදාළව නිර්දේශ 7ක් අනුකූල ලෙසද, 25ක් විශාල වශයෙන් අනුකූල ලෙසද, 7ක් අර්ධ වශයෙන් අනුකූල ලෙස ද එක් නිර්දේශයක් අනුකූල නොවන ලෙස ද ඇගයීමට ලක් වී ඇත.

මූල්‍ය බුද්ධි ඒකකය විසින් එග්මන්ට් (Egmont) කණ්ඩායමෙහි සාමාජිකයින්ගෙන්, එනම් සාමාජිකයින් 166 දෙනෙකුගෙන් සමන්විත ගෝලීය මූල්‍ය බුද්ධි ඒකක සංගමයෙන්, විමර්ශන සිදු කිරීමට සහ ඔවුන්ගේ විමර්ශන පිළිබඳ බුද්ධි තොරතුරු රැස් කිරීමට සාමාජික රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සහාය ලබා ගනී. 2021 වසර තුළදී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් සාමාජික මූල්‍ය බුද්ධි ඒකක වෙතින් කරන ලද ඉල්ලීම් 33කට ප්‍රතිචාර දක්වා ඇති අතර, සිදුවෙමින් පවතින විමර්ශනවලට අදාළ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සාමාජික මූල්‍ය බුද්ධි ඒකක වෙත ඉල්ලීම් 22ක් ඉදිරිපත් කරන ලදී. 2021 එග්මන්ට් සැසිය නියමිත පරිදි පැවැත්වුණේ නැත. කෙසේ වෙතත්, ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්, මූල්‍ය බුද්ධි ඒකකයන්හි ප්‍රධානීන්ගේ රැස්වීම සහ ප්‍රාදේශීය රැස්වීම් මාර්ගගතව පැවැත්වුණු අතර මූල්‍ය බුද්ධි ඒකකයෙහි නිලධාරීන් මෙම රැස්වීම්වලට සහභාගී විය.

12.5 ආයතනික ධාරිතා ගොඩනැගීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීම පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට දරන ප්‍රයත්නයන් අඛණ්ඩව කරගෙන යමින්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2021 වර්ෂය තුළ දැනුවත් කිරීම්/පුහුණු වැඩසටහන් 50ක් සඳහා සම්පත් ආධාර ලබා දුන් අතර, මූල්‍ය ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්, නීති බලාත්මක කිරීමේ ආයතන සහ අධීක්ෂණ අධිකාරීන් වෙතින් සහභාගිවන්නන් 3,000කට වැඩි පිරිසකට පහසුකම් සපයා ඇත. මෙම වැඩසටහන් මුහුණට මුහුණ මෙන්ම මාර්ගගත ක්‍රමවේද හරහා ද පවත්වන ලදී. තවද, මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවිධිමත් මුදල් සම්ප්‍රේෂණ ක්‍රම හා බැඳුනු අවදානම සම්බන්ධව පුවත්පත් රැසක සහ විවිධ සමාජ මාධ්‍ය ජාලා හි දැන්වීම් රාශියක් පළ කරන ලදී.

13. විදේශ විනිමය

විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීමේ හා නියාමනය කිරීමේ අරමුණ පෙරදැරිව, 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා, ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව 2017 නොවැම්බර් 20 වන දින ස්ථාපනය කරන ලදී. විදේශ විනිමය දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති, ප්‍රාග්ධන ගනුදෙනු, මෙහෙයුම් හා විමර්ශන යන අංශ හතරකින් සමන්විත වේ.

විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

(අ) විදේශ විනිමය පනත යටතේ මුදල් ඇමතිවරයා නියම කර ඇති පරිදි විදේශ විනිමය ගනුදෙනු සඳහා පරිසීමිත වෙළෙඳුන් හා වෙනත් පුද්ගලයින් පත් කිරීම.

(ආ) විදේශ විනිමය පනත යටතේ බලයලත් වෙළඳුන් හට නියමයන් නිකුත් කිරීම හා බලයලත් වෙළඳුන් එකී නියම, රෙගුලාසි හා විධාන වලට අනුගත වීම පිළිබඳ අධීක්ෂණය කිරීම.

(ඇ) විදේශ විනිමය කටයුතු හා විදේශ විනිමය ගණුදෙනු පවත්වාගෙන යාම සඳහා රෙගුලාසි හා විධාන සකස් කිරීම හා නියමයන් නිකුත් කිරීම මගින් විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(ඈ) විදේශ විනිමය පනත යටතේ පොදු අවසරයන් ප්‍රදානය කර නොමැති විශේෂ අරමුණු සඳහා අවසර ලබා දීම.

(ඉ) පවත්නා විදේශ විනිමය ප්‍රතිපත්ති වල ඵලදායීතාවය නිර්ණය කිරීම හා විදේශ විනිමය වෙළෙඳපොලේ සිදුවන වර්ධනයන් හා සමගාමීව නව ප්‍රතිපත්තිවල අවශ්‍යතාවය හඳුනා ගැනීම හා එම ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.

(ඊ) විදේශ විනිමය පනතේ විධිවිධානවලට අනුකූල නොවන අවස්ථාවන්ට අදාළව විමර්ශන කටයුතු සිදු කිරීම.

(එ) විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ වැඩිදුර පැහැදිලි කර ගැනීම සඳහා ලැබෙන ඉල්ලීම්වලට පිළිතුරු ලබා දීම හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශයන් සඳහා විදේශ විනිමය රෙගුලාසි සහ ප්‍රතිපත්ති වලට අදාළ කොටස් සකස් කිරීම.

කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් පසුව නිර්මාණය වූ අභියෝගාත්මක පරිසරය හමුවේ විදේශ විනිමය මෙරටට ගලා ඒම ආකර්ෂණය කර ගැනීමේ සහ හදිසි විදේශ විනිමය ගලා යාම් සීමා කිරීමේ වැදගත්කම හඳුනාගෙන දේශීය, විදේශ විනිමය වෙළෙඳපලේ පීඩනය ලිහිල් කිරීම සඳහා පිළියම් ලෙස 2021 වර්ෂය තුළ දී ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. 2021 වර්ෂය තුළ දී ගත් එම ක්‍රියාමාර්ගවල සාරාංශය පහතින් දැක්වේ.

13.1 නව නියෝග, නියම සහ විධාන නිකුත් කිරීම සඳහා පහසුකම් සැපයීම

විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති නියෝග, නියම හා විධාන පිළිබඳව පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන ප්‍රතිචාර විමර්ශනය කොට, විදේශ විනිමය ප්‍රතිපාදන තවදුරටත් සරල හා පැහැදිලි වන අයුරින් 2021 වසරේ මුල් භාගයේ දී සංශෝධිත නියෝග, නියම හා විධාන නිකුත් කරන ලදී. ඒ අනුව, නව ආමුඛ ප්‍රේෂණ දිරි ගැන්වීමේ අරමුණ සහිතව, විදේශ විනිමය පනත යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නියෝග නවයක් නිකුත් කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව පහසුකම් සලසනු ලැබීය.

තවද, කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති විය හැකි අහිතකර බලපෑම හා විනිමය අනුපාතයට ඇති වී ඇති පීඩනය අවම කිරීමේ අරමුණින්, අමාත්‍යවරයා විසින් නියමයන් හයක් නිකුත් කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී.

තව දුරටත්, එකී නියෝගයන් හා නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා බලයලත් වෙළඳුන් හට විධානයන් විසි නවයක් නිකුත් කරන ලදී. එකී නියම, නියෝග හා විධාන මෙම වාර්තාවේ III වන කොටසේ දක්වා ඇත.

13.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා අවසර ලබා දීම

විශේෂ අවසර පත්‍ර පිළිබඳ තොරතුරු II-12 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-12 සංඛ්‍යා සටහන

විදේශ විනිමය පනත යටතේ ලබාදුන් විශේෂ අවසර

අරමුණ	අවසර ගණන	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන
නේවාසික සමාගම් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා	2	23.5
නේවාසික සමාගම් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වෙනුවෙන් නිකුත් කරනු ලබන බැංකු/සමාගම් ඇපකර සඳහා	3	54.38
බලයලත් වෙළෙඳුන්/නේවාසික සමාගම් හට විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද පොදු අවසරයන්ගෙන් ආවරණය නොවන විවිධ විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා	4	අ/නො

අ/නො - අදාළ නොවේ

(ඇ) **මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ යෙදීම සඳහා පරිසීමිත වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ එම මෙහෙයුම් කටයුතු නවතා දැමීම.**

i. 2021 වසර තුළ දී විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා සීමිත සමාගම් සඳහා නව බලපත්‍ර දෙකක් නිකුත් කරන ලදී.

ii. මුදල් හුවමාරු කරන්නන් තිදෙනෙකුගේ මෙහෙයුම් කටයුතු 2021 වසර තුළ දී නවතා දමන ලදී.

iii. එක් එක් පරිසීමිත වෙළෙන්දා වෙත මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතවීම සඳහා බලපත්‍ර නිකුත් කර ඇති ආකාරය පිළිබඳ විස්තර II-13 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-13 සංඛ්‍යා සටහන

2021.12.31 වන විට මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා බලයලත් පරිසීමිත වෙළෙඳුන්

ආයතන කාණ්ඩය	අවසරලත් ව්‍යාපාරික කටයුතු	නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව
මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ අඛණ්ඩව නියැලෙන සීමිත සමාගම් (මුදල් හුවමාරු කරන්නන්)	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම	65*
	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම	
බලපත්‍රලාභී මූල්‍ය සමාගම්	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම	08
සංචාරක හෝටල්	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම	03
එකතුව		**76**

* මුදල් මාරු කිරීමෙහි නියැලෙන ව්‍යාපාරික ස්ථාන/ශාඛා 76 ක් ඇතුළුව සමාගම් 65ක් වෙත බලපත්‍ර නිකුත් කරන ලදී. එම ව්‍යාපාරික ස්ථාන 76න්, 63ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීමට අවසර ලබා දී ඇති අතර, ඉතිරි ව්‍යාපාරික ස්ථාන 13ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

එපරිදි, 2021 දෙසැම්බර් 31 වන විට, බලයලත් වෙළෙඳුන් 26ක් සහ පරිසීමිත වෙළෙඳුන් 76ක් (පරිසීමිත වෙළෙඳුන්ගේ ප්‍රධාන ශාඛා පමණක්) මෙහෙයුම් කටයුතුවල නිරත වී ඇත. අනුමත විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමට අවසරලත් බලයලත් වෙළෙඳුන් (එනම් බලපත්‍රලාභී වාණිජ බැංකු) සහ අදාළ අවසරදීමේ සඳහන් කර ඇති අරමුණු සඳහා අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ පරිසීමිත වෙළෙඳුන් පිළිවෙළින් ඇමුණුම II-2 සහ ඇමුණුම II-3 හි සඳහන් වේ.

(ආ) සංක්‍රමණිකයින්ගේ අරමුදල් මාරු කිරීම

ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ විගාමික දීමනාව නිදහස් කිරීමේ අරමුණ සඳහා සහ විගාමිකයන්ට උරුම වූ මුදල් ප්‍රතිමුඛ ප්‍රේෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා වසර තුළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් 787ක් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර දෙන ලදී. කෙසේ වෙතත් 2022 ජූලි මස 01 දක්වා ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු අත්හිටුවමින් විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගය හේතුවෙන් මෙම ගිණුම හරහා මුදල් මාරු වීම සීමා විය.

13.3 නේවාසික ආයෝජකයන් උදෙසා නිෂ්කාශන ලිපි නිකුත් කිරීම

අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති රෙගුලාසිවලට අනුව, ප්‍රතිමුඛ ආයෝජන සිදු කිරීම සඳහා විදේශ විනිමය පනත යටතේ සිදු කරමින් පවතින විමර්ශන නොමැති බවට තහවුරු කරමින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නේවාසිකව ආයෝජකයන් වෙත නිෂ්කාශන ලිපි 13ක් වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

13.4 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය

i. සියලුම බලයලත් වෙළෙඳුන් ඔවුන් විසින් පවත්වාගෙන යන විදේශ මුදල් ගිණුම්වලට අදාළ තොරතුරු, එකී විදේශ මුදල් ගිණුම්වලට අදාළව නිකුත් කර ඇති විධානයන්ට අනුකූල වෙමින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් මෙම තොරතුරු කළමනාකරණය වෙත ඉදිරිපත් කරන අතර, අවශ්‍ය වූ විටෙක විශේලේෂණයක් ද සහිතව ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවසථාපිත ප්‍රකාශන සඳහා ලබා දෙනු ලැබේ. තවද, බලයලත් වෙළෙඳුන් විසින් සපයන ලද තොරතුරුවලින් යම් යම් අනුකූල නොවන අවස්ථා අනාවරණය වූයේ නම්, එවැනි අවස්ථා විදේශ විනිමය පනතේ නියමයන් ප්‍රකාරව වැඩිදුර විමර්ශන සඳහා යොමු කෙරේ.

ii. විදේශ විනිමය අධීක්ෂණ පද්ධතිය හරහා පෝරම 1හි වාර්තා කර ඇති විදේශීය මුදල් විකුණුම් සහ පෝරම 2හි වාර්තා කර ඇති විදේශීය මුදල් මිලදී ගැණුම් ආශ්‍රිතව උත්පාදනය කරන ලද වාර්තා නිසි විශ්ලේෂණයක් සහිතව කළමනාකරණය වෙත යොමු කරනු ලැබේ.

iii. ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු කාඩ්පත් (EFTCs) පිළිබඳ ගනුදෙනු මාර්ගගත වාර්තාකරණ පද්ධතිය හරහා අධීක්ෂණය කරනු ලබන අතර, කිසියම් සැක කටයුතු ගනුදෙනු අනාවරණය වුවහොත් වැඩිදුර විමර්ශන සඳහා යොමු කෙරේ.

iv. 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති වලට අනුව ශ්‍රී ලංකාවට අපනයන ඉපැයීම් ලැබීම සහ පරිවර්තනය කිරීම, මෙම දෙපාර්තමේන්තුව විසින් දැඩිව අධීක්ෂණය කරනු ලැබේ. එවැනි කාර්යයක් සඳහා, අපනයන ඉපැයීම්වලට අදාළ දත්ත මාසික පදනමින් බලයලත් වෙළෙන්දුන්ගෙන් රැස් කරන අතර, තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කරන තෙක් අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කරනු ලැබේ. තවද, මෙම රීතින්ට අනුකූල වීමට අපොහොසත් වූ අපනයනකරුවන්ගේ විස්තර ද බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරනු ලබන අතර එවැනි අනුකූල නොවීම් වලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැඩිදුර විස්තර රැස් කරනු ලැබේ.

v. විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි, උපදෙස් සහ නියෝග යටතේ වන අනුකූල නොවීම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන්, පරිසීමිත වෙළෙඳුන් සහ අනෙකුත් පුද්ගලයින් සම්බන්ධයෙන් නව විමර්ශන තිස් අටක් (38) ආරම්භ කරන ලදී.

vi. තවද, (2021 ට පෙර ආරම්භ කරන ලද විමර්ශන 15ක් සහ 2021 දී ආරම්භ කරන ලද විමර්ශන 2ක් ඇතුළුව) විමර්ශන 17ක් විදේශ විනිමය පනතෙහි දක්වා ඇති විමර්ශන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන වර්ෂය තුළ දී අවසන් කරන ලදී.

vii. එලෙසම, විදේශ විනිමය පනතෙහි විධිවිධානයන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ දත්ත/සාක්ෂි ලබා දීමෙන් නීති බලාත්මක කිරීමේ බලධාරීන්ට, නඩු පැවරීම් සහ නීතිමය කටයුතු සඳහා සහාය විය.

13.5 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් ආරම්භ කිරීම.

බලයලත් වෙළෙඳුන්ගෙන් දත්ත ග්‍රහණය කර ගැනීමේ අරමුණින් විස්තීර්ණ දේශ සීමා සහ විදේශ මුදල් ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් (එනම් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතියක්) හඳුන්වා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගිතාවයෙන් 2021 වර්ෂය තුළ දී අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙම යෝජිත යාන්ත්‍රණය මගින්, විදේශ විනිමය විකුණුම්/මිලදී ගැනීම් සහ රට තුළට විදේශ විනිමය ගලාඒම්/පිටතට ගලායෑම් පිළිබඳ සියලුම දත්ත ග්‍රහණය කර ගැනීම තුළින්, විදේශ විනිමය ගනුදෙනු අඛණ්ඩව අධීක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ. තවදුරටත්, අපනයන දත්ත එලදායී ලෙස ග්‍රහණය කර ගැනීමේ අරමුණෙන්, තොරතුරු තාක්ෂණය මත පදනම් වූ අපනයන ඉපැයුම් අධීක්ෂණ පද්ධතියක් ගොඩනගා ඇත. අපනයන නැව්ගත තොග පිළිබඳව ශ්‍රී ලංකා රේගුව සතු තොරතුරු, බලයලත් වෙළෙඳුන් සතුව පවතින අපනයන ආදායම් ලැබීම් පිළිබඳ තොරතුරු හා සම්බන්ධ කිරීමේ අරමුණෙන් එම පද්ධතිය සැලසුම් කර ඇත.

13.6 විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම

විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන සහ නව විදේශ විනිමය රෙගුලාසි සම්බන්ධව වසර තුළ දී දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පවත්වන ලදී. තවද, විදේශ විනිමය නියෝග, නියම

හා විධාන සම්බන්ධව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා පුවත්පත් දැන්වීම් 07ක් සහ මහජන දැන්වීම් 04ක් නිකුත් කරන ලදී. තවද, නව විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dfe.lk) නිසි පරිදි යාවත්කාලීන කිරීම සිදු කෙරුණු අතර විදේශ විනිමය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කෙරුණු විමසීම් වලට නොකඩවා පිළිතුරු ලබාදීම ද සිදු කරන ලදී.

ඇමුණුම II-2

2021 දෙසැම්බර් 31 දිනට බලයලත් වෙළෙඳුන්ගේ ලැයිස්තුව

බලපතුලාභී වාණිජ බැංකු	
1	අමානා බැන්ක් පී.එල්.සී.
2	ලංකා බැංකුව
3	බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
4	කාගිල්ස් බැන්ක් ලිමිටඩ්
5	සිටි බැන්ක්
6	කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
7	ඩොයිෂ් බැන්ක් ඒ.ජී.
8	ඩී එෆ් සී සී බැන්ක් ලිමිටඩ්
9	හබිබ් බැන්ක් ලිමිටඩ්
10	හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.
11	ඉන්දියන් බැන්ක්
12	ඉන්දියන් ඔවර්සීස් බැන්ක්
13	එම්.සී.බී. බැන්ක් ලිමිටඩ්
14	නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
15	නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.
16	පෑන් ඒෂියා බැන්කින් කොපරේෂන් පී.එල්.සී.
17	මහජන බැංකුව
18	පබ්ලික් බැන්ක් බර්හාඩ්
19	සම්පත් බැන්ක් පී.එල්.සී.
20	සෙලාන් බැන්ක් පී.එල්.සී.
21	ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක්
22	ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
23	ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කොපරේෂන් ලිමිටඩ්
24	යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී.
බලපතුලාභී විශේෂිත බැංකු	
25	ජාතික ඉතිරිකිරීමේ බැංකුව
26	සණස සංවර්ධන බැංකුව

ඇමුණුම II-3

2021 දෙසැම්බර් 31 දිනට පරිසීමිත වෙළෙඳුන්ගේ ලැයිස්තුව විදේශ විනිමය ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීමට බලයලත් පරිසීමිත වෙළඳුන්

මුදල් හුවමාරුකරුවන්	
1	ඒ. එච්. එම් ට්‍රේඩින් (පුද්) සමාගම
2	ඒ. ඕ ලක්ෂ්මි ජුවලර්ස් (පුද්) සමාගම
3	ආබිඩින් මනි චේන්ජර්ස් (පුද්) සමාගම
4	අබිලාශ් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
5	ආරියවංශ එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම
6	අරුණ ෆොරෙක්ස් (පුද්) සමාගම
7	ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
8	බ්‍රිමියා ග්‍රාමීන් (පුද්) සමාගම
9	බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
10	කැපිටල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
11	කාර්ලෝ ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම
12	සෙන්ට්‍රල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
13	කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01
14	කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
15	දැඩිගම ගෘප් (පුද්) සමාගම
16	ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම
17	දයා ඕතොරයිස්ඩ් මනි චේන්ජර් (පුද්) සමාගම
18	ඩෙල්ටා සරත් හොල්ඩින්ග්ස් (පුද්) සමාගම
19	ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - ගාල්ල
20	ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - ගාලු කොටුව
21	ජෝර්ජ් මයිකල් හොල්ඩින්ග්ස් (පුද්) සමාගම
22	ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
23	ගොල්ඩන් මනි චේන්ජර්ස් (පුද්) සමාගම
24	ගෝල්ඩ් ලංකා ජුවලරි (පුද්) සමාගම
25	හයිෆා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පුද්) සමාගම
26	ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
27	ජයස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
28	ජෙයා ෆොරෙක්ස් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
29	කමල් එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම
30	කේසර් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
31	කුඩාමඩු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
32	එම්. පී මනි චේන්ජර් (පුද්) සමාගම
33	මරුති මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - යාපනය
34	මයුරි මනි චේන්ජර්ස් (පුද්) සමාගම
35	මීඩිනා මිනි මාර්කට් (පුද්) සමාගම
36	මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
37	නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්) සමාගම - යාපනය
38	නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්) සමාගම - කිලිනොච්චි
39	නිව් ලංකා ගෝල්ඩ් හවුස් (පුද්) සමාගම
40	නිව් නටාෂා (පුද්) සමාගම
41	නිව් රීගල්ස් මනි චේන්ජර් (පුද්) සමාගම
42	පර්ල් එක්සි (පුද්) සමාගම
43	රෆීක්ස් ජෙම්ස් (පුද්) සමාගම
44	රිමිහා ජුවෙලරි (පුද්) සමාගම
45	රිවිඳු එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම
46	රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01
47	රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
48	රෝයල් මනි මාර්ට් (පුද්) සමාගම - අලුත්ගම
49	රෝයල් මනි මාර්ට් (පුද්) සමාගම - කොළඹ 01
50	සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම
51	සාරාංගා මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
52	ෂිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම

53	සෝතම් ෆොරෙක්ස් (පුද්) සමාගම
54	ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01
55	ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
56	තමාෂා ෆොරෙක්ස් (පුද්) සමාගම
57	තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - කොළඹ 02 - කොළොම්බු සිටි සෙන්ටර්
58	තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - කොළඹ 02 - වන් ගෝල් ෆේස් මෝල්
59	තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - නුවර
60	යුනික් ෆොරෙක්ස් (පුද්) සමාගම
61	වසන්තාස් ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
62	වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
63	විින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම

විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, හුවමාරු කිරීම හා විකිණීමට අවසර ඇති පරිසීමිත වෙළඳුන්

මුදල් හුවමාරුකරුවන්	
64.	අරුජිනා ජුවෙලරි (පුද්) සමාගම
65.	සිටි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
66.	කුවුන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
67.	දේවි ෆොරෙක්ස් (පුද්) සමාගම
68.	ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
69.	මරුති මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
70.	මෙට්ට්‍රො ෆොරෙක්ස් (පුද්) සමාගම
71.	ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01
72.	ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
73.	පුෂ්පා මනි චේන්ජර් (පුද්) සමාගම
74.	රවි ෆොරෙක්ස් (පුද්) සමාගම
75.	තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල
76.	යුනිවර්සල් මනි චේන්ජර්ස් (පුද්) සමාගම
බලපත්‍රලාභී මූල්‍ය සමාගම්	
77.	ඒෂියා ඇසට් ෆයිනෑන්ස් පී. එල්. සී
78.	බිම්පුත් ෆයිනෑන්ස් පී. එල්. සී
79.	සිටිසන් ඩිවලොප්මන්ට්ස් බිස්නස් ෆයිනෑන්ස් පී. එල්. සී
80.	ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆයිනෑන්ස් පී. එල්. සී
81.	එල්. බී ෆයිනෑන්ස් පී. එල්. සී
82.	සෙන්කඩගල ෆයිනෑන්ස් පී. එල්. සී
83.	සිංහපුත්‍ර ෆයිනෑන්ස් පී. එල්. සී
84.	සිංගර් ෆයිනෑන්ස් (ලංකා) පී. එල්. සී
ව්‍යවහාර විදේශ මුදල් මිලදී ගැනීමට, අවසර ඇති පරිසීමිත වෙළඳුන්	
සංචාරක හෝටල්	
85.	පර්ල් සිටි හොටෙල්
86.	ෂැන්ග්‍රිලා හොටෙල්- කොළඹ
87.	ෂැන්ග්‍රිලා හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා
අනෙකුත් ආයතන	
88.	එම්.එම්. බී. එල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්) සමාගම
89.	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

14. විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීම්

විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව 1949 අංක 58 දරණ මුදල් නීති පනතෙහි විධිවිධාන යටතේ 2021.11.03 දින පිහිටුවන ලදී. අලුතින් පිහිටුවන ලද මෙම දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන අරමුණ වන්නේ, විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රට තුළට ගලා ඒම පහසු කිරීම සහ එය වඩා විධිමත් කිරීමයි.

2021 සහ 2022 වසරේ මුල් කාලය තුළ විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විසින් විදේශ රැකියා සඳහා යන ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ ප්‍රේෂණවල ළඟාකර ගතහැකි උපරිම මට්ටම සහතික කරගැනීම සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වෙමින් කටයුතු කරන ලදී.

14.1 සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා දිරිදීමනා ක්‍රම හඳුන්වා දීම

(අ) 2021 වසරේ අයවැය යෝජනා මගින් ලබා දුන් එ.ජ. ඩොලරයක් සඳහා රුපියල් 2.00ක් වූ දිරිදීමනාවට අමතරව, 2021 දෙසැම්බර් මස සිට විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් මෙරටට ප්‍රේෂණය කර ශ්‍රී ලංකා රුපියල්වලට මාරු කරනු ලබන සෑම එ.ජ. ඩොලරයකට ම රුපියල් 8.00ක අමතර දිරිදීමනාවක් මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, මහ බැංකුව විසින් විනිමය අනුපාතකයෙහි ඉහළ නම්‍යශීලීභාවයක් සඳහා ඉඩ හැරීමත් සමඟ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවරිතනය කිරීමේදී එ.ජ.ඩොලරයක් සඳහා ලබාදුන් රුපියල් 8.00ක දිරි දීමනාව 2022 මාර්තු මාසයේ සිට අත්හිටුවන ලදී.

(ආ) විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් විසින් ශ්‍රී ලංකාවට මුදල් ප්‍රේෂණය කිරීමේ දී සහ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ දී දරනු ලබන ගනුදෙනු පිරිවැය වෙනුවෙන් රුපියල් 20,000ට වැඩි එක් ගනුදෙනුවකට රුපියල් 1,000ක් දක්වා වූ මුදලක් ප්‍රතිපූරණය කිරීම සඳහා වන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

14.2 බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා විදේශගතවන සේවා නියුක්තිකයින් දිරිමත් කිරීම

මීට අදාළව, බත්තරමුල්ලේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කුඩා බැංකු ශාඛා පහක් විවෘත කිරීමට පහසුකම් සලසන ලදී. විදේශ විනිමය පුද්ගලික ගිණුම් සඳහා ප්‍රමුඛතාව ලබාදෙන සහ සීමිත මූල්‍ය සේවාවන් සහිත මෙම 'කුඩා බැංකු ශාඛා' විශේෂයෙන්ම ඉදිරියේ දී විදේශ රැකියා සඳහා යන සේවකයන්ගේ පහසුව සඳහා ස්ථාපිත කරන ලදී. විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයන් පිටත්ව යාමට පෙර ඔවුන්ගේ සියලු ම බැංකු අවශ්‍යතා සපුරාලීමට මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් විධිමත් බැංකු මාර්ග ඔස්සේ ඔවුන්ගේ ප්‍රේෂණ රට තුළට ගලා ඒමට පහසුකම් සැලසෙනු ඇත.

14.3 දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

අ) විදේශ රැකියා සඳහා යොමුවන ශ්‍රමිකයින් ඉලක්ක කරගත් දිරිදීමනා ක්‍රම සහ විධිමත් ක්‍රම ඔස්සේ මුදල් හුවමාරු කිරීමේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පුවත්පත්, ගුවන්විදුලි වැඩසටහන්, සම්මන්ත්‍රණ, සමාජ මාධ්‍ය සහ ප්‍රවෘත්ති වෙබ් අඩවි වැනි විවිධ ක්‍රම හරහා පවත්වන ලදී.

ආ) විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් සඳහා හඳුන්වා දී ඇති දිරිදීමනා ක්‍රම පිළිබඳව මැදපෙරදිග වෙසෙන විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ විනිමය හුවමාරු මධ්‍යස්ථාන නියෝජිතයින් දැනුම්වත් කිරීමට මෙන්ම මෙම ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමටත් අදාළ දැනුම්වත් කිරීම්වල දී ලැබෙන ප්‍රතිචාරවලට අනුව විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් සඳහා දැනට පවත්නා හා යෝජිත දිරිදීමනා ක්‍රම විධිමත් කිරීමත් අරමුණු කරගෙන දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ අන්තර් ක්‍රියාකාරී සැසි භෞතිකව හා මාර්ගගත ක්‍රම ඔස්සේ පවත්වන ලදී.

14.4 අදාළ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධීකරණ කටයුතුවල නියැලීම

අ) විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම, විදේශිකයන් සඳහා වන දිගුකාලීන නේවාසික වීසා කාණ්ඩවල නිර්ණායක සංශෝධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග අඛණ්ඩව කටයුතු කරමින් සිටියි.

ආ) ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයින් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුව කම්කරු අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් සිටියි.

ඇ) තවද, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විදේශ මුදල් රට තුළට ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්, පැමිණිලි සහ දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ කටයුතුවලද නිරත වී ඇත.

ඉදිරියට ද, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව අනෙකුත් අදාළ බලධාරීන් සමග සහයෝගීතාවයෙන් යුතුව විදේශ සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය වැඩි දියුණු කිරීම සඳහා නව යෝජනා ක්‍රම හඳුන්වාදීමේ ක්‍රියාවලියට පුළුල් ලෙස සම්බන්ධ වනු ඇත. මේ සම්බන්ධයෙන්, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව, කම්කරු අමාත්‍යාංශය, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, බැංකු අංශය සහ අනෙකුත් විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වැනි අදාළ පාර්ශ්වයන් සමග අඛණ්ඩව කටයුතු කරනු ඇත. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීමට අමතරව, අඩු පොලී ණය වැනි බැංකු පහසුකම් සහ ඉහළ තීරුබදු සහන මෙම දිරිදීමනා ක්‍රමවලට ඇතුළත් වේ.

15. අධිපති ලේකම්

නිරතුරුවම වෙනස් වන මූල්‍ය හා ආර්ථික වාතාවරණයන් මධ්‍යයේ, මෑත ඉතිහාසයේ මුහුණ දීමට සිදුවූ කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වයන් හා මතුවූ ආර්ථික අභියෝග ජයගැනීම කෙරෙහි නිරන්තර අවධානය යොමු කිරීම හා විශේෂිත ක්‍රමවේදයන් යෙදවීම සඳහා මහ බැංකු අධිපතිතුමා වෙත අවශ්‍ය කෙරෙන මෙහෙයුම් හා තාක්ෂණික සහායයන් ලබා දීමේ අරමුණින්, 2015 පෙබරවාරි 9 වැනි දිනෙන් පසුව "අධිපති ලේකම් කාර්යාලය" වශයෙන් ලේකම් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ අධිපති කාර්යාලයේ කටයුතු, 2021 සැප්තැම්බර් 24 වැනි දින සිට "අධිපති ලේකම් දෙපාර්තමේන්තුව" නමින් නැවත දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලදී.

මෙසේ පිහිටුවනු ලැබූ අධිපති ලේකම් දෙපාර්තමේන්තුව, දේශීය ආර්ථිකය කෙරෙහි කොවිඩ්-19 වසංගතයේ බලපෑම අවම කිරීම වැනි අභියෝගාත්මක ආර්ථික ඉලක්ක සපුරා ගැනීම උදෙසා නැඹුරු වූ අධිපතිතුමාගේ කාර්යයන් පහසුවෙන් කරලීම සඳහා අවශ්‍ය ඉහළ මට්ටමේ ලේකම් කටයුතු හා සහායක සේවාවන්, ආයතනික සහ සන්ධාන සේවාවන් මෙන්ම අධිපතිතුමා විසින් අනෙකුත් දෙපාර්තමේන්තු වෙත පවරන ලද කාර්යයන්හි පසු විපරම් කටයුතු මෙන්ම බැංකු, අනෙකුත් ආයතන මෙන්ම මහජනතාව සමග සම්බන්ධතාව එලදායී හා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම වැනි කාර්යයන් ඉතා කාර්යක්ෂම ලෙස ඉටුකරන ලදී.

රාජකාරී කටයුතු සඳහා අධිපතිතුමා හමුවීමට පැමිණෙන නිලධාරීන් හා අමුත්තන් සඳහා සහ අධිපතිතුමාගේ රැස්වීම් සඳහා කාල වේලාවන් වෙන් කිරීම හා ඒවා කාලානුරූපීව කළමනාකරණය කිරීමත් ඒ සඳහා අවශ්‍ය ලිපිගොනු සකස් කිරීමත්, අනෙකුත් දෙපාර්තමේන්තුවල කාර්යයන් නිරන්තරයෙන් අධිපතිතුමාගේ අවධානයට යොමුකිරීම, පවරන ලද කාර්යයන්හි පසු විපරම් කටයුතු සිදු කිරීම යනාදිය අධිපති ලේකම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යයන්ය. ලෝකයේ අනෙකුත් මහ බැංකු අධිපතිවරුන්, අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ශ්‍රී ලංකාවේ වෙසෙන රාජ්‍ය තාන්ත්‍රික නිළධාරීන්, බැංකු හා මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන්, මාධ්‍ය ආයතන ප්‍රධානීන්, ඉහළ පෙළේ ව්‍යාපාරිකයින්, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල නියෝජිතයින් සහ අනෙකුත් විදේශීය නියෝජිතයින් සමග මහ බැංකු අධිපතිතුමා විසින් හමුවීම් ගණනාවක් පවත්වන ලදී. එවැනි සියලුම හමුවීම් සම්බන්ධව සංවිධාන කටයුතු හා ඊට අදාළ ප්‍රතිඵලයන්, අදාළ පාර්ශ්වයන්ට සන්නිවේදනය කොට ඒවා අධිපතිතුමාගේ නියමයන්ට අනුකූල ලෙස සිදුවන්නේ දැයි

පසු විපරම් කිරීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබීය.

අධිපති ලේකම් දෙපාර්තමේන්තුවට එහි කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය කාරණයක් ලෙස බැංකු, මූල්‍ය හා ආර්ථික යන ක්ෂේත්‍රවල දේශීය මෙන්ම විදේශීය ක්‍රියාකාරීන් සමඟ සබඳතා ඇති කර ගැනීම හා එම සබඳතා මනාව පවත්වාගෙන යනු ලැබීය. විශේෂයෙන්, නැගී එන ආර්ථිකයක් ඇති රටක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය වෙමින් පවත්නා කාලවකවානුවක, ගෝලීය හවුල්කරුවන් සමඟ පවත්නා සම්බන්ධතාවයන් කළමනාකරණය සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබීය. ඒ සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් ගෝලීය ආයෝජකයින් සමඟ මනා සම්බන්ධතා පවත්වාගෙන යමින්, ඔවුන්ට නිවැරදි තොරතුරු සැපයීම හා අධිපතිතුමා සමඟ රැස්වීම් සංවිධානය කිරීම ද සිදු කරන ලදී. එහිදී, දුරකථන හා විද්‍යුත් සම්මන්ත්‍රණ, විද්‍යුත් සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාලය හරහා ගෝලීය ආයෝජකයන් සමඟ සිදු කෙරෙන සාකච්ඡා ආදිය පවතින වසංගත තත්ත්වය ද සැලකිල්ලට ගනිමින් නවීන සන්නිවේදන ක්‍රමවේදයන් ඔස්සේ සිදු කරනු ලැබීය.

අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් අධිපතිතුමාට මෙන්ම එතුමාගේ විශේෂිත අමුත්තන්ට සහ මහ බැංකුවේ විශේෂ ආරාධිත අමුත්තන්ට සන්ධාන සේවාවන් ලබා දීම ද සිදු කරනු ලැබීය. මෙම කාලපරිච්ඡේදය තුළ දී , අධිපතිතුමාගේ දේශීය හා විදේශීය නිල සංචාරයන්ට අදාළ සියලුම කටයුතු අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබීය. මෙයට අමතරව, අධිපතිතුමන් සහභාගී වූ විදේශීය ආයෝජන ප්‍රවර්ධන රැස්වීම් ද ඇතුළත්ව අධිපතිතුමා විසින් ප්‍රධාන ආරාධිතයා ලෙස හෝ ප්‍රධාන දේශකයා වශයෙන් සහභාගී වූ ජාත්‍යන්තර නිල සංචාරයන් සියල්ලක්ම ද දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලැබීය. අධිපතිතුමාගේ මෙම විදේශ නිල සංචාර සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සන්ධාන පහසුකම් සපයනු ලැබූ අතරම, එම විදේශ රැස්වීම් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා දීම ද, ඒ සඳහා අවශ්‍ය වූ විද්‍යුත් මාධ්‍ය ඉදිරිපත් කිරීම් සකස් කර දීම ද සිදු කරනු ලැබීය. දේශීය මුදල් වෙළඳපොළේ සහ විදේශ විනිමය වෙළඳපොළේ තොරතුරු එසැනින් වඩාත් යාවත්කාලීනව, දිනපතා මෙන්ම විදේශවල සිටින විට දී ද අධිපතිතුමාගේ අවධානයට ලක් කිරීම අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙයට අමතරව අධිපතිතුමා සහ නියෝජ්‍ය අධිපතිවරුන් විසින් දායකත්වය සපයන නිල උත්සව සංවිධානය කිරීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

නව බැංකු පනත සහ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතට වන සංශෝධනයන් ද ඇතුළුව මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන ප්‍රධාන ව්‍යවස්ථාවන් සමාලෝචනය කිරීම සහ හඳුන්වාදීමෙහි ලා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් දායකත්වය සපයන ලදී. මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ රාමුව සඳහා වඩාත් ශක්තිමත් නෛතික පදනමක් සැපයීම සඳහා එවැනි ප්‍රතිසංස්කරණ අත්‍යන්තයෙන්ම අවශ්‍ය වේ. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව යෝජිත බැංකු පනතේ ප්‍රතිපාදන තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා සිදුකෙරුණු දෙවන සාකච්ඡා වටය පසුගිය වසරේ දී නිමාවට පත්විය. මුදල් ව්‍යාපාර පනතට යෝජිත සංශෝධන මගින් මහ බැංකුවේ නිරාකරණ කිරීමේ බලාධිකාරය ඇතුළුව බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධයෙන් මහ බැංකුව සතු නියාමන සහ අධීක්ෂණ බලතල වැඩි දියුණු කිරීම සිදු වනු ඇත.

ඉහත සඳහන් කළ ප්‍රධාන ව්‍යවස්ථාවන්ට අමතරව, වෙළඳ, නිෂ්කාශනය සහ පියවීම් පිළිබඳ පනත, මූල්‍ය වත්කම් කළමනාකරණ නියෝජිතායතන පනත සහ ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත යන නව නීති සම්පාදනය කිරීමට ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විශාල වශයෙන් සිය දායකත්වය සපයන ලදී. ඌණ ක්‍රියාකාරී වත්කම් හේතුවෙන් නියාමනය කරන ලද මූල්‍ය ආයතනවල ශේෂ පත්‍රයන් හි පවතින වගකීම්භාරය යම්තාක් දුරකට හෝ ලිහිල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පිහිටුවීම සඳහා සංකල්ප මත පදනම් වූ නීතිමය රාමුවක් හඳුන්වාදීම මූල්‍ය වත්කම් කළමනාකරණ නියෝජිතායතන පනතේ අරමුණ විය. නව ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත කෙටුම්පත් කරන ලදුයේ මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරය නියාමනය සහ අධීක්ෂණය සඳහා වෙන්වූ නියාමන අධිකාරියක් පිහිටුවීම සහ අදාළ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී පාරිභෝගිකයාගේ ආරක්ෂාව සහතික කිරීම යන කාරණා මූලික කොට ගෙන ය. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව පසුගිය වසර තුළ ඉහත ක්‍රියාවලියේ අඛණ්ඩව නිරත විය.

මහ බැංකුව විසින් සිදු කරන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන ව්‍යාපෘතියට පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකාව සඳහා නව වෙළෙඳ, නිෂ්කාශන සහ පියවීම් පිළිබඳ පනතක් හඳුන්වා දීමට පියවර ගන්නා ලදී. එහි මූලික අරමුණ වන්නේ රජයේ සුරැකුම්පත් සහ විදේශ විනිමය වෙළෙඳපොළවල් සඳහා නවීන පශ්චාත් වෙළඳාම් නිෂ්කාශනය, මධ්‍යම ප්‍රතිපක්ෂ පද්ධති, බහු ව්‍යවහාර මුදල් තථ්‍ය කාලීන දළ පියවීම් පද්ධතිය ආදිය මගින් සහය දක්වන ආරක්ෂිත, නවීන, තරඟකාරී සහ සාධාරණ වෙළඳපොළවල් බවට පරිවර්තනය කිරීම සඳහා ඇවැසි පුළුල් නෛතික හා තාක්ෂණික යටිතල පහසුකම් හඳුන්වාදීම වේ. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව පසුගිය වසර පුරා මෙම ව්‍යාපෘතියේ නිරත විය. ඊට සමගාමීව, 1937 අංක 7 දරන ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනතට සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව ශක්තිමත් කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ පිළිබඳ මහජන විශ්වාසය යළි ස්ථාපිත කිරීම සඳහා ඒ යටතේ නිකුත් කර තිබූ අනුනීති සඳහා සංශෝධන ද යෝජනා කරන ලදී.

ඊට අමතරව, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් වෙනත් පාර්ශ්වයන් විසින් කෙටුම්පත් කරන ලද මහ බැංකුවට සහ මූල්‍ය අංශයට අදාළ ව්‍යවස්ථාවන් කිහිපයක් එනම්, කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත, කොරෝනා වෛරස් රෝගය 2019 (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත, මුදල් පනත් කෙටුම්පත, දත්ත සුරැකීමේ පනත් කෙටුම්පත මෙන්ම විදේශ විනිමය පනත, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ ලංකා බැංකු ආඥාපනත ආදිය සඳහා යෝජිත සංශෝධනයන් ද සමාලෝචනය කරන ලදී. එහි දී එම ව්‍යවස්ථා හඳුන්වා දීමෙහි ලා බැඳුණු ජාතික වැදගත්කම මෙන්ම මහ බැංකුවේ පවත්නා නියාමන සහ අධීක්ෂණ රාමුවට සහ එවැනි පනත්/සංශෝධනවල ඇති බලපෑම ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සළකා බලන ලදී.

2021 වසර තුළ දී, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ යහපාලනය සඳහා වූ ප්‍රතිපත්ති, එනම් දුෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය, මහ බැංකු කාර්ය මණ්ඩලය සහ මුදල් මණ්ඩලයේ සාමාජිකයින් සඳහා අදාළ වන චර්යාධර්ම සංග්‍රහයන් සමාලෝචනය කිරීමට කටයුතු කරන ලදී. මේ අතර, මහ බැංකුවේ අනුකූලතා කාර්යයේ කේන්ද්‍රස්ථානය ලෙස නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කටයුතුවල නිරත වීමේදී එහි අනුකූලතාව සහතික කිරීම සඳහා, මහ බැංකුවේ විදේශීය සමපාර්ශවයන්ගේ අනුකූලතා අවශ්‍යතා ඉටුකිරීම සඳහා යුහුසුළුව කටයුතු කළ අතර එකී විදේශ සමපාර්ශවයන්ට අදාළ වන ගනුදෙනුකරු හඳුනාගැනීම/ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීම පිළිබඳ වාර්ෂික ඇගයීම් පැවැත්වීමට කටයුතු කරන ලදී.

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව පොදු අධිකාරියක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම ඉටුකිරීම් වස් නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ පිහිටුවන ලද තොරතුරු දැනගැනීමේ ඒකකය මගින් 2021 වසර තුළ මහ බැංකුවට

සම්බන්ධ තොරතුරු දැනගැනීම සඳහා වූ ඉල්ලීම් 144ක් සහ අභියාචනා 13ක් සම්බන්ධයෙන් කටයුතු කොට ඇත. තවද, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරියේ මහ බැංකුවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ද කටයුතු කරන ලදී. කොවිඩ්-19 වසංගතයේ අභියෝගාත්මක බලපෑම් වූ නිරන්තරයෙන් සිදු වූ රට වසා දැමීම්, සංචරණය සීමා කිරීම් සහ නිවසේ සිට රාජකාරි කිරීමට සිදු වීම සහ තවත් බලපෑම් නොතකා, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි ස්ථාපිත තොරතුරු දැනගැනීමේ ඒකකය, පුරවැසියන්ගෙන් සහ ආයතනවලින් ලැබෙන තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන් කඩිනම් ආකාරයකින් කටයුතු කරන ලදී.

කොවිඩ්-19 වසංගතයෙහි හි බලපෑම අවම කිරීම උදෙසා මහ බැංකුව විසින් ගන්නා ලද ඇතැම් ප්‍රතිපත්තිමය මුලපිරීම් වලට එරෙහිව තෙවන පාර්ශ්වයන් විසින් නීති කෘත්‍යයන් රැසක් ආරම්භ කරන ලද බැවින්, 2021 වර්ෂය ශ්‍රී ලංකා මහ බැංකුවට තීරණාත්මක වර්ෂයක් විය. ආර්ථිකයේ බලපෑමට ලක්වූ අංශයන් වෙත ලබා දෙන ලද ණය සහනයන්, අපනයන ආදායම මෙරටට ගෙන්වා ගැනීම ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද රීති සහ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කරන ලද මූල්‍ය ආයතනයන් ඈවර කිරීම යනාදිය, 2021 වර්ෂය තුළ දී අධිකරණයන් ඉදිරියේ අභියෝගයට ලක්වූ එවැනි මුලපිරීම් ලෙස දැක්විය හැකිය. අදාළ අධිකාරීන් සමඟ සම්බන්ධ වෙමින් මෙම සියලු නීති කෘත්‍යයන් සාර්ථක අයුරින් මෙහෙයවීමට නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

එමෙන්ම, නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් අනුබද්ධිත දෙපාර්තමේන්තුවල මෙහෙයුම් කටයුතු සඳහා අදාළ වන විධානයන්, රෙගුලාසි, මාර්ගෝපදේශයන්, නියෝග, රීති යනාදී අනු නීති සම්පාදනය වෙනුවෙන් ද සිය සහයෝගය දැක්වීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම සඳහා පවත්වනු ලබන දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විශාල වශයෙන් දායක වී ඇත. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි සම්පත් දායකත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ නෛතික හා නියාමන රාමුව, තහනම් යෝජනා ක්‍රම, අනවසර මුදල් ව්‍යාපාර, මූල්‍ය කල්බදු සම්බන්ධ ගැටළු, කුලී සින්නක්කර පහසුකම් සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව යනාදී කරුණු කෙරෙහි කේන්ද්‍රගත විය. තවද, නව තථ්‍ය කාලීන දළ පියවීම් පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ මෙහෙයුම් සහ තාක්ෂණික ඇගයීම් කමිටුව, ශ්‍රී ලංකාව සඳහා ජාතික මූල්‍ය අන්තර්ගත උපාය මාර්ගයක් සකස් කිරීම සඳහා පිහිටුවන ලද කමිටුව ආදී මහ බැංකුවේ සහ මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම්වලට අදාළ විවිධ විෂය කරුණු සඳහා පිහිටුවන ලද විශේෂ කමිටු රැසකට ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විසින් 2021 වසරේ දී සිය දායකත්වය සපයන ලදී.

ඉහත කරුණු සලකා බැලීමේ දී, මහ බැංකුවේ ප්‍රධාන සහායක සහ ආරක්ෂණ දෙපාර්තමේන්තුවක් වශයෙන් නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව, 2021 වසර තුළ මහ බැංකුවේ සහ මහජනතාවගේ බැඳියාවන් ආරක්ෂා කිරීමේ අරමුණින් ඉතා සාර්ථක සහ සනාථනීය අයුරින් සිය රාජකාරි කටයුතු ඉටු කර ඇති බව අවධාරණය කළ යුතුව ඇත.

21. සාර්ව විචක්ෂණතා අධ්‍යයන

මහ බැංකුවේ මූලික ව්‍යවස්ථාපිත අරමුණුවලින් එකක් වන මූල්‍ය පද්ධති ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ක්ෂේත්‍රයට බලපෑම් කළ හැකි පද්ධතිමය අවදානම් පිළිබඳ පුළුල් විශ්ලේෂණ මාලාවක් සිදු කරනු ලබයි. එවැනි විශ්ලේෂණ ක්ෂුද්‍ර විචක්ෂණ නියාමනයට සහ අධීක්ෂණයට අනුපූරක වන අතර, එය මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමේ දී මහ බැංකු විසින් අනුගමනය කරන ප්‍රවේශයකි. මෙම ක්‍රියාවලියේ දී, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ආයතන මගින් සපයනු ලබන දත්ත සහ අවශ්‍ය විට දී වෙනත් මූලාශ්‍ර ගණනාවකින් රැස් කරනු ලබන දත්ත භාවිතා කරමින් පද්ධතිමය අවදානම් විශ්ලේෂණය සිදු කරනු ලබයි. මීට අමතරව, ඕනෑම අහිතකර කම්පනයකට එරෙහිව මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සත්‍යානුරූපී අහිතකර අවස්ථා යටතේ ආතති පරීක්ෂාවන් සිදු කරනු ලබයි. මෙම විශ්ලේෂණයන් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා පද්ධතිමය අවදානම අවම කිරීම සහ/හෝ වළක්වා ගැනීම සඳහා මහ බැංකුවේ ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට දායක වේ. 2021 වසර තුළ දී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

(අ) සාර්ව විචක්ෂණතා අධ්‍යයන

නියාමනය කරන ලද මූල්‍ය ආයතන විසින් වාර්තා කරන ලද දත්ත සහ වෙනත් මූලාශ්‍ර වලින් රැස් කරන ලද දත්ත භාවිතා කරමින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ගෝලීය සහ දේශීය සාර්ව ආර්ථික වර්ධනයන්, මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළඳපොළවල් වලින් පැන නගින අවදානම් පිළිබඳව විශ්ලේෂණයන් සිදු කරන ලදී. ගෘහස්ත සහ ආයතනික අංශවලින් මූල්‍ය අංශයට සිදුවන බලපෑම හඳුනාගැනීම සඳහා එම අංශවල ණය විචලනයන්ට අදාළ දත්ත විශ්ලේෂණය කිරීම ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මීට අමතරව, දේශීය මූල්‍ය පද්ධතියේ විවිධ උප අංශවල ස්ථායීතාවය සහ ශක්තිමත්භාවය මත පදනම්ව සංයුක්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශක ගණනාවක් අඛණ්ඩව සම්පාදනය කරන ලද අතර මෙම දර්ශක වල විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමට ද පියවර ගන්නා ලදී. එවැනි විශ්ලේෂණවල ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ඇති විය හැකි තර්ජන සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පිළිබඳ අනෙකුත් සමකාලීන කරුණු ප්‍රතිපත්ති නිර්දේශ සහිතව අවදානම් තක්සේරු ඇතුළත් කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා ඇතුළු මණ්ඩල පත්‍රිකා ගණනාවක් 2021 වසර තුළ දී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

(ආ) ආතති පරීක්ෂණ රාමුව

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් තාක්ෂණික සහාය ද ඇතිව ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණතා අධ්‍යයන රාමුව පුළුල් කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කළේය. එම තාක්ෂණික සහාය ඇතිව, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් බැංකු සඳහා නව ගතික නුබුන්වත් ආතති පරීක්ෂණ රාමුවක් (Dynamic Solvency Stress Testing Framework) සකස් කරන ලද අතර එමගින් පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා ක්‍රියාශීලී ප්‍රතිපත්ති සැකසීම පිණිස නිගමන සපයනු ලබයි. මෙම, නව බැංකු නුබුන්වත් ආතති පරීක්ෂණ ආකෘතිය මගින් උපකල්පිත අවස්ථා යටතේ, සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීමෙන් සාර්ව විචක්ෂණතා දෘෂ්ටිකෝණයක් සපයනු ලබයි. ප්‍රධාන අවදානම් මූලාශ්‍ර, සම්ප්‍රේෂණ යාන්ත්‍රණ සහ බැංකු පද්ධතියේ ඇති දුර්වලතා මූර්ත ආර්ථිකයට සම්බන්ධ කරමින් පද්ධතිමය දැක්මක් මෙම සාර්ව විචක්ෂණතා දෘෂ්ටිකෝණය මගින් අවධාරණය කරනු ලබයි. මේ අනුව, මෙම රාමුව තනි ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන අධීක්ෂණ ආතති පරීක්ෂණවලින් වෙනස් වේ. බැංකු නුබුන්වත් ආතති පරීක්ෂණ මහ බැංකුවල සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තියේ අනිවාර්ය අංගයක් ලෙස සැලකේ. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දත්ත එකතු කිරීම සහ දත්ත යටිතල ව්‍යුහය නඩත්තු කිරීම, ව්‍යවහාරික මෙවලම් කට්ටලය භාවිතා කරමින් ආතති පරීක්ෂණ අවස්ථා ජනනය කිරීම සහ බැංකු ශේෂ පත්‍රවලට අපේක්ෂා කරන කම්පන සහ ඒවාට ඔරොත්තු දීමේ හැකියාව සහිත සම්ප්‍රේෂණ යාන්ත්‍රණයන් ඇතුළත් අවදානම් මොඩියුල අන්තර්ගතවන ප්‍රමාණාත්මක මෙවලම් කට්ටලය ක්‍රියාත්මක කිරීමට දායක විය. දත්ත රැස් කිරීම පහසු කිරීම සඳහා බැංකු අංශයේ හැකියාවන් ගොඩනැගීමේ අදහසින්, විස්තරාත්මක පරිශීලක මාර්ගෝපදේශයක් සකස් කර ඇති අතර අතථ්‍ය පුහුණු සැසි කිහිපයක් ද පවත්වන ලදී.

බැංකු අංශය සඳහා ද්‍රවශීලතා ආතති පරීක්ෂණ රාමුවක් පිහිටුවීම ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් තාක්ෂණික සහාය ඇතිව සිදු කළ අතර එමගින් ද්‍රවශීලතා කම්පන සඳහා බැංකු පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කෙරේ. දත්ත හිඟතාවයන් මග හරවා ගැනීමට සහ ද්‍රවශීලතා ආතති පරීක්ෂණ සිදු කිරීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ද සාකච්ඡා කරමින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් කල් පිරීමේ ඉනිමං ආකෘතිය (Maturity Ladder Template) සංවර්ධනය කරන ලදී. ප්‍රධාන වාර්තාකරණ මුදල් වර්ග වලින් නාමනය කරන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සහ ඒවායේ අදාල කල්පිරීම්වල ප්‍රති තුලනය කිරීමේ හැකියාව සහ මුදල් ගලා ඒම් සහ යෑම් වල නොගැළපීම් ද මෙම රාමුව මගින් හඳුනා ගනී. 2021 වසර තුළ දී, ද්‍රවශීලතා ආතති පරීක්ෂාව තාක්ෂණික ලෙස ක්‍රියාවට නැංවීම අවසන් කර ඇති අතර, නියමු දත්ත රැස්කිරීමක් මෙන්ම විධිමත් දත්ත රැස්කිරීමේ පළමු වටය ද සිදු කරන ලදී. නියමු ද්‍රවශීලතා ආතති පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල 2022 මුල් භාගයේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

(ඇ) සමීක්ෂණ සහ දත්ත රැස් කිරීම

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් වසර තුළ අර්ධ වාර්ෂික මූල්‍ය පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලදී. මූල්‍ය පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය යනු මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ඇති විය හැකි අවදානම සහ දැඩි බලපෑමක් ඇති කළ හැකි සිදුවීම්වල වියහැකියාව පිළිබඳ වෙළඳපොළ සහභාගිවන්නන්ගේ ආකල්ප හඳුනාගැනීමට පවත්වන ඉදිරි දැක්මක් සහිත සමීක්ෂණයකි. මෙම අවදානම් යථාර්ථයක් බවට පත්වුවහොත් මූල්‍ය අතරමැදිකරණ ක්‍රියාවලියට බාධා එල්ල විය හැකි අතර මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ මහජන විශ්වාසයට ද බලාපානු ඇත. තවද, මූල්‍ය පද්ධතියේ දුර්වලතා පිළිබඳ සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවහි අභ්‍යන්තර තක්සේරු වලංගු කිරීම සඳහා ද මූල්‍ය පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය උපකාරී වේ.

(ඈ) මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා සහ අනෙකුත් ප්‍රකාශන සඳහා දායක වීම

මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය: ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය මුහුණ දෙන අවදානම් සහ දුර්වලතා පිළිබඳ ස්වාධීන ඇගයීමක් ඉදිරිපත් කිරීමට සහ අනුගමනය කර ඇති අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීමට, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය ප්‍රකාශයට පත් කරයි. "සාර්ව මූල්‍ය තත්වයන්", "මූල්‍ය වෙළෙඳපොළ","මූල්‍ය ආයතන","ගෘහස්ථ අංශය සහ ආයතනික අංශය" සහ "මූල්‍ය පද්ධති යටිතල පහසුකම්" වශයෙන් මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය පරිච්ඡේද 5කින් සමන්විත විය. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය -2021 කෙටුම්පත් කර ඇති අතර එය 2022 වසර මුල දී ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

ව්‍යවස්ථාපිත ප්‍රකාශන: 2020 මහ බැංකු වාර්ෂික වාර්තාවේ සහ "මෑත කාලීන ආර්ථික ප්‍රවණතා 2021"හි "මූල්‍ය අංශයේ සංවර්ධන සහ ස්ථායීතාව" යන පරිච්ඡේදය සම්බන්ධීකරණය කිරීම සහ සම්පාදනය කිරීම හරහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මහ බැංකුවේ ප්‍රධාන ප්‍රකාශන සඳහා අඛණ්ඩව දායක විය. තවද, මුදල් භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද රහස්‍ය වාර්තාවක් වන සැප්තැම්බර් 15 වාර්තාවේ මූල්‍ය පද්ධතියට අදාළ පරිච්ඡේදය සැකසීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දායක විය. මීට අමතරව, මූල්‍ය අංශයේ දත්ත සම්පාදනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ උප අංශ පිළිබඳ විශ්ලේෂණ සැපයීම මගින් මහ බැංකුවේ අනෙකුත් ප්‍රකාශන සඳහා ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දායක විය.

(ඉ) ආයතනික අංශය සහ ගෘහස්ථ අංශය විශ්ලේෂණය කිරීම

කොළඹ කොටස් වෙළෙඳපොළේ මූල්‍ය නොවන ලැයිස්තුගත සමාගම්වලින් එකතු කරන ලද දත්ත මත පදනම්ව ආයතනික අංශයේ කාර්යසාධනය සහ අවදානම් තක්සේරු කිරීම සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබීය. සාර්ව ආර්ථික හා මූල්‍ය අංශයේ වර්ධනයන් ආයතනික

අංශයේ කාර්ය සාධනය සහ ශේෂ පත්‍ර කෙරෙහි බලපෑමක් ඇති කරන බැවින් ආර්ථික පසුබෑම සහ මූල්‍ය දුර්වලතා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක ලෙස සැලකෙන ආයතනික අංශයේ විචලනයන් තක්සේරු කිරීම කෙරෙහි මෙම විශ්ලේෂණය මගින් අවධානය යොමු කෙරේ. මෙමගින්, ආයතනික ශේෂ පත්‍ර මගින් මූල්‍ය ආයතන මත ඇති කරන බලපෑම් හඳුනා ගැනීම සඳහා ආයතනික නුබුන්වත්භාවය තක්සේරු කිරීම සිදු කරන ලදී.

මූල්‍ය පද්ධතිය තුළ ගොඩනැගිය හැකි පද්ධතිමය අවදානම හඳුනා ගැනීම සඳහා ගෘහ හා ආයතනික අංශයේ ණය පිළිබඳ ආවේක්ෂණය කිරීම සාර්ව විචක්ෂණතා නිරීක්ෂණ ක්ෂේත්‍රයේ වැදගත් අංගයකි. ණය තොරතුරු කාර්යාංශයෙන් ලබාගත් දත්ත භාවිතා කරමින් ආයතනික හා රාජ්‍ය අංශවල සහ ගෘහස්ථ අංශයේ මූල්‍යමය ගැටලු තක්සේරු කිරීම මෙම විශ්ලේෂණය මගින් සිදු කරනු ලබයි. මෙම විශ්ලේෂණය සඳහා ණය තොරතුරු කාර්යාංශය මගින් සමස්ත පදනම මත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ අංශයේ ණය පිළිබඳ කාර්තුමය දත්ත සපයයි.

(ඊ) මූල්‍ය පද්ධති ස්ථායීතාවය පිළිබඳ කමිටු සම්බන්ධීකරණය කිරීම

මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව (Financial System Stability Committee): මූල්‍ය අංශයට බලපාන අවදානම් හඳුනා ගැනීම සහ අවදානම් අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීමට පහසුකම් සැලසීම සඳහා මෙන්ම මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමට දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය සඳහා පිහිටුවා ඇති මහ බැංකුවේ අන්තර් දෙපාර්තමේන්තු සංසදයක් වන මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවෙහි ලේකම් කටයුතු සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. 2021 වර්ෂය තුළ මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටු රැස්වීම් අටක් පවත්වන ලදී. සාමාජිකයින්ගේ අදහස් ලබා ගැනීම සඳහා මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටු රැස්වීම්වල දී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් එහි කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා ඉදිරිපත් කරන ලද අතර මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටු සාමාජිකයින් විසින් අනුමත කරන ලද සහ යෝජනා කරන ලද නිර්දේශ සමඟින් කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව (Financial System Stability Consultative Committee): ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ හවුල්කරු ආයතනවල ප්‍රධානීන්ගෙන් සමන්විත මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුවේ ලේකම් කටයුතු සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව ප්‍රතිසංවිධානය කරන ලද අතර එහි දී නව සාමාජිකයින් පත් කිරීම සහ පෙර සිටි ඇතැම් සාමාජිකයින් කමිටුවෙන් ඉවත් කිරීම සිදු කරන ලදී. වසර තුළ මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටු රැස්වීම් හයක් පවත්වන ලදී. මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව විසින් සපයනු ලබන ප්‍රතිපත්ති යෝජනා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලයට දැනුම් දෙනු ලැබීය.

මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලය (Financial System Oversight Council): බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අන්තර් නියාමන කමිටුවක් වන මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලයෙහි යොමු කිරීම් අනුදේශ (Terms of Reference) සඳහා සාර්ව විචක්ෂණශීලී අංග ඇතුළත් කරමින් සංශෝධනය කරන ලද බැවින් 2021 වසරේ අග භාගයේ දී මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලයෙහි ලේකම් කටයුතු සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව වෙත පැවරිණි. ඒ අනුව ඉදිරියේ දී මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලය සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ලේකම් කාර්යාල සේවා සපයනු ඇත.

(උ) ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය

සාර්ව විචක්ෂණතා සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා කාණ්ඩයේ සම්බන්ධීකරණ දෙපාර්තමේන්තුව ලෙස සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කටයුතු කරන ලදී. තවද, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව තිරසාර මූල්‍ය මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC), ලෝක බැංකු තිරසාර බැංකු ජාලය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ තිරසාර මූල්‍ය වර්ගීකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීමේ මූලික ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කරන ලදී. 2021 වසර තුළ දී පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් සංවිධානය කිරීම සහ හරිත මූල්‍ය ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර ලබා ගැනීම හරහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව පාර්ශ්වකරුවන්, තිරසාර සංවර්ධන මූල්‍ය විශේෂඥයින් සහ තිරසාර මූල්‍ය වර්ගීකරණ ක්‍රමවේද පිළිබඳ තාක්ෂණික විශේෂඥයන් සම්බන්ධීකරණය කිරීම සඳහා පහසුකම් සැලසුවේය.

22. ගෙවීම් සහ පියවීම්

මුදල් නීති පනතේ 62අ වගන්තිය යටතේ අරමුදල් හුවමාරු කිරීම සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීමට, ගෙවීම සඳහා වන වගකීම් පියවීමට සහ සහභාගීත්ව ආයතනවලට පද්ධති රීති නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය, කාර්යක්ෂමතාවය, තරගකාරීත්වය සහ ස්ථායීතාවය ඇති කිරීමේ අරමුණ ඇතිව ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය කිරීමට සහ ජාතික ගෙවීම් පද්ධති ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කිරීම ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව හරහා සිදු කරන ලදී.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT) හරහා සිදු කරන සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම,

ගෙවීම් යටිතල පහසුකම් සංවර්ධනයට පහසුකම් සැලසීම සහ ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සිදු කළ ප්‍රධාන කාර්යයන් වේ. 2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල සාරාංශයන් පහත දැක්වේ.

22.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගීත්ව ආයතන අතර කාල සංවේදී සහ අන්තර් සාමාජිකයින්ගේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ විශාල වටිනාකම් සහිත ගෙවීම් තත්කාලීන දළ පියවීම් පදනම මත සිදු කරන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු තවදුරටත් සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අතිරේක අරමුදල් සඳහා ඉල්ලීම් සිදු කරන සහභාගීත්ව ආයතන වෙත එක් දින ද්‍රවශීලතා පහසුකම් ලබා දීමට පහසුකම් සැලසීම සහ අධීක්ෂණය කිරීම සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතන වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු 24, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 7, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතු පද්ධතියයි.

2021 වර්ෂය තුළ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් රුපියල් බිලියන 294,602ක වටිනාකමින් යුතු ගනුදෙනු 449,828ක පියවීම් කටයුතු සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවීම් සිදු කරන ලද දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙළින් 1,867ක් සහ රුපියල් බිලියන 1,222ක් විය. සහභාගීත්ව ආයතන වෙත දෛනිකව ලබා දෙන එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි සාමාන්‍යය රුපියල් බිලියන 208.5ක් විය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙන් සහ ලංකාසෙක්‍යු පද්ධතියෙන් සමන්විත ලංකාසෙට්ල් පද්ධතියෙහි උපයෝගීතාවය වර්ෂය තුළ දී සාමාන්‍ය වශයෙන් සියයට 99.9ක ඉහළ තත්ත්වයකින් පවත්වාගෙන යනු ලැබීය.

22.2 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා සැපයීම

(අ) විදේශ විනිමය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා

2021 වර්ෂය තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය අලෙවි සහ මූල්‍යන, මුදල් වෙළෙඳපොළ, ස්ථාවර ආදායම් සුරැකුම්පත්, රන් වෙළඳපොළ ආශ්‍රිත කටයුතු, ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනුම්/විකුණුම් ගනුදෙනු 9,712කට අදාළ පියවීම් සිදු කරන ලද අතර, එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් බිලියන 163.05ක් විය.

(ආ) විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා

වෙළඳපොළ ද්‍රවශීලතා කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ විවට වෙළඳපොළ මෙහෙයුම් ආශ්‍රිත ගනුදෙනු පියවීම සිදු කරන ලදී. ඒ අනුව, වර්ෂය තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 1,576.8ක් වටිනා ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 387ක්ද, රුපියල් බිලියන 29,297.06ක් වටිනා ප්‍රතිවිකුණුම් 1,797ක් ද රුපියල් බිලියන 14.35ක් වටිනා ස්ථිර පදනම මත මිලදී ගැනීම් ගනුදෙනු 14ක් ද සිදු කිරීම සහ පහසුකම් සැලසීමද සිදු විය.

22.3 ස්විෆ්ට් සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සියලුම පරිශීලකයින් වෙනුවෙන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ස්විෆ්ට් සන්නිවේදන පද්ධතිය කළමනාකරණය කරනු ලබන අතර පාලන විධිවිධාන, ක්‍රියාපටිපාටීන්, අවදානම් කළමනාකරණ ක්‍රියාදාමයන් සහ පාලනයන් සම්බන්ධයෙන් ස්විෆ්ට් ජාලය විසින් නියම කර ඇති ක්‍රියාදාමයන්ට අනුකූලව එම පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යෑම සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ස්විෆ්ට් නෙට් පද්ධතිය සඳහා සම්බන්ධතාවය ලංකා මූල්‍ය සේවා කාර්යාංශ සමාගම හරහා ලබා ගෙන ඇත. 2021 වර්ෂය තුළ දී, ස්විෆ්ට් සේවය භාවිතා කරන්නන් හට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වඩාත් ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම සේවාවක් සැලසීම සඳහා ස්විෆ්ට් සේවාව ශක්තිමත් කිරීම සඳහා වාර්ෂිකව සහ කාර්තුමය වශයෙන් නව අනිවාර්ය යාවත්කාලීන කිරීම් සිදු කරන ලදී. තවද, ස්විෆ්ට් පද්ධතිය MT සිට MX කාණ්ඩය දක්වා පණිවිඩ ආකෘතිය සඳහා වන ISO20022 අනිවාර්ය අවශ්‍යතා ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

22.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදු කරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

2021 වර්ෂයේ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල් අතර සුදුසුකම් ලද වෙළඳ සහ වෙළඳ ආශ්‍රිත ගනුදෙනු, බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් පදනම මත එක්සත් ජනපද ඩොලර් මගින් පියවීම සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී.

ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය හරහා, රුපියල් බිලියන 714.4ක වටිනාකමින් යුතු ගනුදෙනු 6,307ක් සිදු කරන ලදී. ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය යටතේ සිදු කරන ලද ශුද්ධ පියවීම් වල වටිනාකම රුපියල් බිලියන 581.9ක් විය. ආසියානු නිෂ්කාශන සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 49 වන රැස්වීම සහ නිත්‍ය තාක්ෂණික කමිටු රැස්වීම ඉන්දියානු සංචිත බැංකුවෙහි සංවිධානත්වයෙන් 2021 වර්ෂයේ මැයි මාසයේ දී මංගත ක්‍රමයට පැවැත්විණි.

22.5 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව නව ගෙවීම් තාක්ෂණයන් හඳුන්වා දීම සඳහා පහසුකම් සලසන ලද අතර විද්‍යුත් ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම සඳහා නියාමන සහ අවේක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2021 වර්ෂය තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී.

(අ) සුළු පරිමාණ ගෙවීම් සඳහා LANKAQR ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අනුග්‍රහය දැක්වීමට 2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස 25 වන දින එහි ජනගතකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව LANKAQR භාවිතය ප්‍රචලිත කිරීම සඳහා මූල්‍ය ආයතන විසින් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා සහභාගී විය. LANKAQR සඳහා වෙළෙඳ ආයතනවල සහභාගීත්වය උනන්දු කිරීමේ අවශ්‍යතාවය සලකා බලා ඒ සඳහා අදාළ උපරිම වෙළෙඳ වට්ටම් අනුපාතය ලෙස සියයට 0.5ක අඩු කරන ලද අනුපාතය 2021 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා දීර්ඝ කරන ලදී.

(ආ) 2021 වර්ෂයේ පෙබරවාරි මස 01 වන දින සිට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන අඩු වටිනාකම් සහිත ගෙවීම් සඳහා ජංගම යෙදුම් පදනම් කරගත් ගෙවීම් ක්‍රමවේදයක් වන ජස්ට්පේ (JustPay) ගනුදෙනුවක උපරිම වටිනාකම රු. 50,000 දක්වා වැඩි කරන ලදී.

(ඇ) 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ මූල්‍ය ආයතන මගින් ඉදිරිපත් කළ අයදුම්පත් ඇගයීමෙන් අනතුරුව ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ලෙස හරපත් නිකුත් කිරීමට මූල්‍ය ආයතන දෙකකට බලපත්‍ර ලබා දෙන ලදී. මීට අමතරව, ජංගම දුරකතන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් විසින් ඉදිරිපත් කරන ලද සේවා වැඩිදියුණු කිරීම්වලට අනුමැතිය ලබා දෙන ලදී.

(ඈ) ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේදයට අදාළ බ්ලොක්චේන් මත පදනම් වූ ක්‍රමවේදය සඳහා සංකල්ප සාධනය නිර්මාණය කරන ලද අතර එම සංකල්ප සාධනය පරීක්ෂා කිරීමට කැමැත්ත පල කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ සම්බන්ධ වී සංකල්ප සාධනය පරීක්ෂා කිරීම සාර්ථකව නිම කරන ලදී. 2021 ඔක්තෝම්බර් මාසයේ දී එහි අවසාන වාර්තාව අධිපතිතුමා වෙත පිළිගන්වන ලදී.

(ඉ) ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව තුළ ඩිජිටල් බැංකුකරණය, කෘතිම බුද්ධිය (Artificial Intelligence) සහ මහ බැංකු ඩිජිටල් මුදල් පිළිබඳව අධ්‍යයනය කිරීමට පත් කරන ලද අභ්‍යන්තර කමිටු තම අධ්‍යයනයන් අවසන් කරන ලද අතර ඒවාට අදාළ වාර්තා අධිපතිතුමා වෙත භාර දෙන ලදී.

(ඊ) මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සැපයුම්කරුවන් නියාමනය සහ අධීක්ෂණය සඳහා නියෝග කෙටුම්පත් කරන ලද අතර මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝග අමාත්‍යවරයාගේ අත්සන ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

(උ) මූල්‍යමය වෙළෙඳපොළ යටිතල පහසුකම් සඳහා වන මූලධර්මවලට තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි අනුකූලතාවය පරීක්ෂා කිරීම සඳහා ස්වයං ඇගයීමක් සිදු කරන ලද අතර එය ස්වාධීන ඇගයීමක් සඳහා ලෝක බැංකුව වෙත ඉදිරිපත් කරන ලදී.

(ඌ) හදිසි අවස්ථාවක දී තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා වන සූදානම තහවුරු කර ගැනීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සාමාජිකයින් සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට ලක් කරන ලදී.

22.6 ජාතික ගෙවීම් කවුන්සිලය

ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශන සහ නිරීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය රැස්වීම් චාර 6ක් 2021 වර්ෂය තුළ දී පැවැත් වූ අතර ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව එහි ලේකම් කටයුතු සිදු කරන ලදී. 2021 වර්ෂයේ දී, 2020-2022 සඳහා වන පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ඩිජිටල් ගෙවීම් වේදිකාව, අතත්‍ය මුදල් සහ විවෘත බැංකුකරණය වැනි නව තාක්ෂණයන් සහ සංකල්පයන්, සහ ඩිජිටල් වර්ෂය වැඩසටහන පිළිබඳ තීරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට පත් කරන ලද කමිටුවල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී. අතත්‍ය මුදල් සහ විවෘත බැංකුකරණය සඳහා පත් කරන ලද කමිටුවල වාර්තා ජාතික ගෙවීම් කවුන්සිලය වෙත භාර දෙන ලදී. ඩිජිටල් ගෙවීම් අවකාශය තුළ මූල්‍ය සමාගම්වල වැඩිවන දායකත්වය සැලකිල්ලට ගනිමින් බැංකු නොවන මූල්‍ය අංශය ජාතික ගෙවීම් කවුන්සිලය තුළ නියෝජනය කිරීම සඳහා බලපත්‍රලාභී මූල්‍ය සමාගම් දෙකකට සාමාජිකත්වය ලබා දෙන ලදී. මීට අමතරව, බැංකු නොවන මූල්‍ය අංශය නියාමනය කරන්නා ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ජාතික ගෙවීම් කවුන්සිලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

22.7 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන 'කාර්තුමය විවරණිකාව' ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව, අවශ්‍යතාව මත පදනම්ව, ගෙවීම් ක්‍රම සහ වෙනත් ආශ්‍රිත කරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාව සහ බැංකු කාර්යමණ්ඩල දැනුම්වත් කිරීමේ අදහසින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

23. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා දෙපාර්තමේන්තුවල කටයුතු පෙළ ගස්වමින් ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියට අදාළ කටයුතු සිදු කරයි. ඒ අනුව, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරි වසර සඳහා වන දෙපාර්තමේන්තුමය ක්‍රියාමාර්ගික සැලසුම් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන අතර, අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ දැනුවත්භාවය උදෙසා විද්‍යුත් ප්‍රකාශනයක් ලෙස නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලසුම පිළියෙල කරයි. වාර්ෂික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීම සඳහා කාලීන සමාලෝචනයන් ද සිදු කරනු ලබයි. මේ සඳහා වාර්ෂික උපායමාර්ගික කතිකාවත හා දෙපාර්තමේන්තුවල ක්‍රියාමාර්ගික සැලසුම් සඳහා කාලීන ප්‍රගති සමාලෝචන

රැස්වීම් පවත්වනු ලබයි. දෙපාර්තමේන්තුවල ක්‍රියාමාර්ගික සැලසුම්හි ප්‍රගතිය ආයතන කළමනාකාරිත්ව කමිටුවේ සමාලෝචනයට ද ඉන් අනතුරුව අවශ්‍ය මාර්ගෝපදේශන සඳහා මුදල් මණ්ඩලයට ද වාර්තා කරනු ලබයි.

තව ද තත්කාලීන ගැටලු සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්ට සම්බන්ධව කළමනාකාරිත්වය විසින් නිර්දේශ කරනු ලබන ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ඵලදායිතාව ස්වාධීනව අධ්‍යයනය කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයනයන්/සමීක්ෂණයන් ද සිදු කරනු ලබයි.

23.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 උපාය මාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලසුම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 සඳහා වන උපාය මාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලසුම 2021 වර්ෂය සඳහා වන ඉලක්කයන්ගෙන් සමන්විත වූ අතර එය 2021 ජනවාරි 01 දින පැවැත් වූ නව වසර සඳහා වැඩ ඇරඹීමේ උත්සවයේ දී දියත් කරන ලදි.

23.2 ප්‍රගති නිරීක්ෂණය හා සමාලෝචනය

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව එක් එක් ප්‍රධාන කාර්යසාධන දර්ශක යටතේ, ඒවාට අදාළ සැලසුම්ගත ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ මට්ටම අනුව දෙපාර්තමේන්තුමය ක්‍රියාමාර්ගික සැලසුම්හි ප්‍රගතිය ඇගයීම සඳහා කාර්තුමය පදනමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විය. එම ප්‍රගතිය කළමනාකාරිත්වයට සහ මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී.

23.3 ප්‍රතිපත්ති සමාලෝචනය

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව කොවිඩ්-19 වසංගත කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තියේ ඵලදායීතාව සහ මධ්‍යගත දැනුම් කේන්ද්‍රයක් වශයෙන් පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානයේ ඵලදායීතාව මැනීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයනයන් දෙකක් (2) වර්ෂය තුළ දී සිදු කරන ලදී.

23.4 "අභියෝගාත්මක කාලවලදී මහ බැංකුකරණය" - මාර්ගගත විද්වත් සාකච්ඡාව

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව "අභියෝගාත්මක කාලවලදී මහ බැංකුකරණය" යන තේමාව යටතේ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් කීර්තිමත් වෘත්තීමය විද්වතුන් තිදෙනෙකුගේ සහභාගීත්වයෙන් මාර්ගගත විද්වත් සාකච්ඡාවක් පවත්වන ලදී. වසංගත කාල වකවානුවේ දී තම රටේ ආර්ථික කටයුතු සහ රජයේ වියදම් මූල්‍යනය කිරීමේ මහ බැංකු කාර්යභාරය සහ එහි සීමාවන්, සාර්ථක මූල්‍ය අන්තර්ගතභාවයක අවශ්‍යතාව, වේගවත් ලෙස නව තාක්ෂණය කරා නැඹුරුවීම සහ වසංගත කාල තුළ දී අන්තර්ජාතික මූල්‍ය සංවිධානවල කාර්යභාරය යනාදි කාලීන හා මහ බැංකුවල අවධානයට යොමු වුණු තේමාවන් මෙහි දී සාකච්ඡා කෙරුණි. තවද විනිමය අනුපාතය සහ බාහිර සංචිත ස්ථාවරව පවත්වාගැනීම, අඩු පොලී අනුපාතිකයක් සහ අඩු උද්ධමන මට්ටමක් පවත්වා ගැනීමේ වැදගත්කම ද පුළුල් ලෙස සාකච්ඡා කෙරුණි.

23.5 ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ වන තිරසාර සංවර්ධන ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා කටයුතු කිරීම

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ විෂය පථයට අදාළ වන තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීමේ දී තිරසාර සංවර්ධන ඉලක්කයන් නිරීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර ව පත් කරන ලද සම්බන්ධීකරණ හා නිරීක්ෂණ කමිටුව වෙත අවශ්‍ය සහය ලබා දුනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ විෂය ක්ෂේත්‍රයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්කයන් පිළිබඳ තොරතුරු තිරසාර සංවර්ධන සභාව වෙත යොමු කිරීම ද සිදු කරන ලදී. එමෙන්ම, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම පිළිබඳ දෙවන ස්වේච්ඡා ජාතික සමාලෝචනයේ උපදේශන වැඩමුළුව සඳහා 2021 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් සම්බන්ධ විය.

24. රාජ්‍ය ණය

රජයේ නියෝජිතයා වශයෙන්, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, මුදල් නීති පනතේ 113 වන වගන්තිය ප්‍රකාරව මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම් ඉටුකරයි. ඒ අනුව, 1950 අගෝස්තු මස 28 වන දින මහ බැංකුව ආරම්භ කිරීමත් සමඟම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ද පිහිටුවන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙහි උපායමාර්ගික ප්‍රමුඛතාවය වනුයේ, විචක්ෂණශීලී අවදානම් මට්ටමක් පවත්වා ගනිමින් මැදි කාලයේ සිට දිගු කාලීනව අවම පිරිවැයක් යටතේ, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළේ පවතින ප්‍රශස්ත ප්‍රමිතීන්ට අනුකූලව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහතික කිරීමයි.

මෙම උපායමාර්ගික ප්‍රමුඛතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන අතර, දෙපාර්තමේන්තුවේ කටයුතු එම කාර්යයන්ට පමණක් සීමා නොවේ;

(i) වඩා යහපත් රාජ්‍ය ණය ව්‍යුහයක් ඇති කිරීම සඳහා විධිමත් ණය කළමනාකරණ උපාය මාර්ගයක් සකස් කර ක්‍රියාත්මක කිරීම;

(ii) විසර්ජන පනත හෝ වෙනත් අදාළ නීති රීති/බලතල යටතේ රජයේ දළ ණය ගැනීමේ අවශ්‍යතාවයට අනුකූලව දේශීය වෙළඳපොළ සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ යන දෙකටම ප්‍රවේශ වෙමින්, හිතකර වෙළඳපොළ තත්ත්වයන් සහ මුදල් අමාත්‍යාංශයේ එකඟතාව මත සුරැකුම්පත් නිකුත් කිරීම තුළින් අරමුදල් රැස් කිරීම;

(iii) මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි, නිවැරදිව හා නියමිත වේලාවට රජයේ ණය සේවාකරණය සිදු කිරීම.

(iv) රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම හරහා රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය කිරීම සහ එමගින් රජයේ සුරැකුම්පත් සඳහා ඇති ඉල්ලුම වැඩි කිරීම;

(v) රජයේ සුරැකුම්පත්වල වෙළඳපොළ ගනුදෙනු පියවීම සුමටව සිදුකිරීමට පහසුකම් සලසනු ලබන රාජ්‍ය සුරැකුම්පත්වල හිමිකම් ලේඛනය කළමනාකරණය සිදු කරනු ලබන ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය පවත්වාගෙන යාම;

(vi) මධ්‍යම රජයේ ණය කළඹේ අවදානම් කළමනාකරණය කිරීම සඳහා ණය කළඹෙහි හැසිරීම පිළිබඳ විශ්ලේෂණ සිදු කොට අදාළ පාර්ශ්වකරුවන්ට නිසි ලෙස සන්නිවේදනය කිරීම.

24.1 රජයේ දළ ණය ගැනීමේ අවශ්‍යතාව සපුරාලීම සඳහා අරමුදල් රැස් කිරීම

(අ) 2021 වර්ෂයේ දී, රජයේ අරමුදල් අවශ්‍යතාව මූල්‍යනය කිරීම මූලික වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව මගින් සිදු කෙරිණි.

(ආ) කෙටිකාලීන සුරැකුම්පත් කෙරෙහි ආයෝජකයින් වැඩි වශයෙන් නැඹුරු වීම සහ රාජ්‍ය මුදල් ප්‍රවාහ විචලනයන් පවතින අවස්ථාවල දී රජයට සහය වීම නිසා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ සාපේක්ෂව කෙටිකාලීන භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම් හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව ණය උපකරණ තුනෙහිම පරිණතවීමේ සාමාන්‍ය කාලය සුළු වශයෙන් පහත වැටුණි.

(ඇ) 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම් දෙගුණ කිරීමත් එමගින් විදේශ ණයවලින් කොටසක් අඩුකර ගැනීමටත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සමත් විය.

(ඈ) අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්වයන් පැවතියද, විශාල වශයෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම නිසා ඇති වූ බලපෑම සමනය කර ගැනීමට, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රජයේ මූල්‍ය අවශ්‍යතාව සපුරාගැනීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළ අතර, එමගින් 2021 වර්ෂයේ දී, රාජ්‍ය ණය කළඹෙහි පරිණතවීමේ සාමාන්‍ය කාලය ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගත හැකි විය.

(ඉ) එක් එක් අරමුදල් ප්‍රභවය යටතේ සංක්ෂිප්ත ක්‍රියාකාරකම් 11-16 සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

24.2 රජයේ ණය සේවාකරණය

2021 වර්ෂය තුළ දී, රුපියල් බිලියන 2,375.6ක දේශීය ණය සේවාකරණ ගෙවීම් සහ රුපියල් බිලියන 1,590.1ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඇතුළුව, රුපියල් බිලියන 785.5ක සමස්ත රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීමට පහසුකම් සලසන ලදී.

2021 වසරේ දී දේශීය ව්‍යවහාර මුදල් ණය සඳහා පොලී සහ කල් පිරීමේ වටිනාකම් ගෙවීමේ දී ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක 224ක් සඳහා ණය සේවාකරණය කරන ලද අතර විදේශ ණය 1,836ක් සේවාකරණය කරන ලදී. එම අගයන් පිළිවෙළින් 2020 වසරේ දී ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක 215ක් සහ විදේශ ණය 1,894ක් විය.

II-16 සංඛ්‍යා සටහන

2020 සහ 2021 වසරේ ණය උපකරණ සහ නිකුතු ක්‍රියාකාරීත්වය

උපකරණය	2020				2021			
	නිකුත් කිරීම් (රු. බිලියන)	බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%)	සාමාන්‍ය පරිණත කාලය (වසර)	වෙන්දේසි ගණන	නිකුත් කිරීම් (රු. බිලියන)	බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%)	සාමාන්‍ය පරිණත කාලය (වසර)	වෙන්දේසි ගණන
භාණ්ඩාගාර බිල්පත් (අ)	2,590.5	5.82	0.60	52	3,821.4	6.09	0.48	53
භාණ්ඩාගාර බැඳුම්කර	1,332.1	7.39	5.27	15	1,762.0	8.70	5.12	22
	නිකුත් කිරීම් (එ.ජ.ඩො. මිලියන)	**බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) (ආ)**	**සාමාන්‍ය පරිණත කාලය (වසර)**	**වෙන්දේසි ගණන**	**නිකුත් කිරීම් (එ.ජ.ඩො. මිලියන)**	**බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) (ආ)**	**සාමාන්‍ය පරිණත කාලය (වසර)**	**වෙන්දේසි ගණන**
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	507.0	6.24 [4.22]	1.70	7	1,041.3	7.34	1.47	5

(අ) මහ බැංකුවට නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව දළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම්

(ආ) [ ] තුළ ඇති අගයන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල විචල්‍ය අනුපාතිකයන්හි බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතික ව්‍යාප්තිය පිළිබිඹු කෙරේ. 2021 වර්ෂයේ දී විචල්‍ය අනුපාතිකය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම් සිදු නොකරන ලදී.

24.3 රාජ්‍ය සුරැකුම්පත් හිමිකම් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය නිර්ලේඛිත සුරැකුම්පත් හිමිකම් ලේඛනය, මධ්‍යම තැන්පතු පද්ධතියෙහි වාර්තා වන අතර, එමගින් රජයේ සුරැකුම්පත්වල සුරක්ෂිතභාවය තහවුරු කෙරේ. 2021 දෙසැම්බර් මස අග දී නිර්ලේඛිත සුරැකුම්පත්වල මුළු හිමිකම් ප්‍රමාණයෙහි මුහුණත වටිනාකම රුපියල් බිලියන 9,238.6ක් විය. මෙය භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 2,270.7ක් සහ භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 6,967.9කින් සමන්විත විය. 2021 දෙසැම්බර් අවසානය වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ ලියාපදිංචි ගිණුම් හිමියන් සංඛ්‍යාව 96,825ක් ලෙස සටහන් විය.

මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට ඔවුන්ගේ හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් වශයෙන් වූ කාලීන ප්‍රකාශන යැවීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව සිදු විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ විද්‍යුත් තැපෑල මගින් විද්‍යුත් ප්‍රකාශන 1,458ක් සහ සාමාන්‍ය තැපෑල මගින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 15,270ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 35,452ක් සහ ගෙවීම් ප්‍රකාශන 14,320ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත යවන ලදී.

මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් සඳහා 2019 වසරේ දී හඳුන්වා දෙන ලද තත්කාලීන දැනුම් දීමේ පහසුකම මගින්, මධ්‍යම තැන්පතු පද්ධතියේ ලියාපදිංචි හා තත්කාලීන දැනුම් දීමේ පහසුකම ලබා ගත් ගිණුම් හිමියන් වෙත එක් එක් නිර්ලේඛිත සුරැකුම්පත් ගිණුම් හරහා සිදු කරනු ලබන සියලුම හර හා බැර වාර්තා වීම් කෙටි පණිවුඩ සහ/හෝ විද්‍යුත් තැපෑල මගින් තත්කාලීන දැනුම් දීම් වශයෙන් ලබා දෙන ලදී. මෙම වසර තුළ දී, ලංකාසෙක්‍යු පද්ධතිය විසින් විද්‍යුත් තැපැල් පණිවුඩ 147,744ක් සහ කෙටි පණිවුඩ 47,561ක් තත්කාලීන දැනුම් දීම් ලෙස යවා ඇති අතර, 2020 වසර දී එම අගයන් පිළිවෙළින් 129,941ක් සහ 40,063ක් විය.

මීට අමතරව, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා හඳුන්වාදෙනු ලැබූ ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට තම සුරැකුම්පත් ගිණුම්වල යාවත්කාලීන තොරතුරු අන්තර්ජාලය හරහා පරීක්ෂා කිරීමේ පහසුකම ද ලබා දී ඇත.

24.4 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර නඩත්තු කරනු ලබන ලංකාසෙක්‍යු පද්ධතිය, මධ්‍යම තැන්පතු පද්ධතියකින් හා නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතියකින් සමන්විත වේ. නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය මගින් රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සඳහා පියවීම් සේවා සපයනු ලබයි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවල ලංකාසෙක්‍යු පද්ධතියෙහි මෙහෙයුම් අඛණ්ඩව හා තත්කාලීනව සිදුවන බව සහතික කරමින්, රජයේ සුරැකුම්පත් ගනුදෙනුවල පියවීමේ කටයුතුවලට අදාළ පහසුකම් සැලසීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

2021 වසර අවසාන වන විට ලංකාසෙක්‍යු පද්ධතිය, තමන් වෙනුවෙන් සහ තමන්ගේ ගනුදෙනුකරුවන් වන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති ආයෝජකයින් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු අලෙවි සහභාගීකරුවන් 31 දෙනෙකු (බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 7ක්) සහ තමන් වෙනුවෙන් පමණක් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු සහභාගීකරුවන් 3 දෙනෙකුගෙන් (ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් වෙළඳපොළ සහ සේවක අර්ථසාධක අරමුදල) සමන්විත විය.

24.5 ණය කළමනාකරණ මූලපිරිම් සහ වෙළඳපොළ සංවර්ධනයන්

යෝග්‍ය මූලාශ්‍ර හරහා අවශ්‍ය සම්පත් සපුරාලන අතරම, කොවිඩ්-19 රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය කිරීමේ අරමුණින් එහි කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා 2021 වර්ෂය තුළ දී, පහත සඳහන් පියවර අනුගමනය කරන ලදී.

(අ) විචක්ෂණශීලී ණය කළමනාකරණ උපායමාර්ගය

ණය වගකීම් කාලානුරූපීව සේවාකරණය කරන අතරම කොවිඩ්-19 වසංගතය අතරතුර අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන්හි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම නිසා ඉහළ ගිය රජයේ මූල්‍ය ප්‍රවාහ අවශ්‍යතාවයට පහසුකම් සැලසීමට වසංගත කාල සීමාව තුළ භාණ්ඩාගාර බිල්පත් මත වැඩි වශයෙන් රඳා පැවතීමට සිදුවීම හේතුවෙන්, වර්ෂයක් තුළ කල් පිරෙන ණය ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 2021 වර්ෂයේ සුළු වශයෙන් ඉහළ ගිය අතර, ණය වගකීම් නියමිත කාලයේ දී සේවාකරණය කරන ලදී.

රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ රජයේ නියෝජිතයා ලෙස සිය වගකීම් ඉටු කිරීමේ දී, ණය සේවාකරණ ගෙවීම් සම්බන්ධයෙන් වැඩි වන අභියෝග පිළිබඳව, විශේෂයෙන්ම, මැදි කාලයේ දී විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම්, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළට ප්‍රවේශ වීමේදී ඇති වූ අහිතකර තත්ත්වයන්, සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සඳහා පවතින අඩු ද්‍රවශීලතාව, ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම සහ ශ්‍රී ලංකා රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ඉහළ යෑම යනාදිය සම්බන්ධව, රජය සහ ප්‍රතිපත්ති බලධාරීන් දැනුම්වත් කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගත් අතර, වෙළඳපොළ තත්ත්වයන් නැවත වැඩිදියුණු වන තුරු විශ්වාසය තැබිය හැකි පියවර සහ මූලාශ්‍ර පිළිබඳව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන බලධාරීන්ව නිරන්තරයෙන් දැනුම්වත් කරන ලදී.

2021 වර්ෂය තුළ දී දේශීය මූලාශ්‍රවලට සාපේක්ෂව විදේශ මූලාශ්‍රවලින් රජයේ මූල්‍යකරණ අවශ්‍යතා සපුරා ගැනීම කෙරෙහි අඩු නැඹුරුතාවයක් දැක්වීම හේතුවෙන්, 2020 වර්ෂය අවසානයට සාපේක්ෂව, 2021 වර්ෂය අවසානය වන විට විදේශ මුදල්වලින් නාමනය කරන ලද ණයවල පරිණතවීමේ සාමාන්‍ය කාලය ප්‍රශස්ත මට්ටමකට ළඟා විය. මෙමගින් 2021 වර්ෂයේ අභියෝගාත්මක තත්ත්වයන් පැවතියද, විදේශීය මුදල් ණය සඳහා වූ නිරාවරණය අඩු කර ගැනීමට හැකි විය.

(ආ) වෙළඳ වාර්තාකරණය හඳුන්වාදීම

රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ගණුදෙනුවලට අදාළ හුරු පුරුදු වැඩි දියුණු කර ශක්තිමත් කිරීම සහ ගනුදෙනුවල විශ්වසනීයත්වය වැඩිදියුණු කොට ආයෝජකයින්ගේ ආරක්ෂාව සහ විශ්වාසය ඉහළ නැංවීම සඳහා රජයේ සුරැකුම්පත්වල සියලුම ද්විතීයික වෙළඳපොළ වෙළඳාම් වෙළඳ දිනයේදීම වාර්තා කිරීමට පියවර ගන්නා ලදී.

ඒ අනුව, 2021 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීකරුවන් සියලුම ගනුදෙනු පිළිබඳ විස්තර වෙළඳ දිනයේදීම මහ බැංකුව වෙත වාර්තා කළ යුතුය.

(ඇ) භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල දී උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවීම

කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ දී ආර්ථික වර්ධනය නංවාලීම සඳහා අඩු පොලී අනුපාතිකයක් පවත්වාගෙන යන අතරතුර ණය ගැනීමේ පිරිවැය අවම කර ගනිමින් ආර්ථික වර්ධනය නංවාලීමට රජයට පහසුකම් සපයා දීම පිණිස, මුදල් මණ්ඩලයේ එකඟතාව ඇතිව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින්, 2020 මැයි 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල සියලුම පරිණත කාලයන් සඳහා උපරිම ඵලදා අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, ප්‍රාථමික වෙන්දේසිවල පොලී අනුපාතිකය ඉහළ මට්ටමක තිබුණද, පොලී අනුපාතික පහළ දැමීම සහ ලංසු අර්ධ වශයෙන් පිළිගැනීම සැලකිල්ලට ගනිමින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම 2021 සැප්තැම්බර් 22 සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ක්‍රමයෙන් අඩු කිරීමට සහ ධනාත්මක මූර්ත ආයෝජන ප්‍රතිලාභ සමඟ අරමුදල් සපයා ගැනීම සඳහා ද පියවර ගන්නා ලදී.

(ඈ) භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ දී තෙවන අදියරෙහි අනිවාර්ය වෙන් කිරීම් සිදු කිරීම සඳහා පළමු අදියරේ පිළිගතයුතු අවම බැඳුම්කර ප්‍රමාණය ඉහළ නැංවීම

භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම ආරම්භ වීමත් සමඟම, භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසිවල අදියර I සහ අදියර II අවසන් වීමෙන් පසුව ප්‍රාථමික වෙන්දේසියේ පිළිගත් බැඳුම්කර ප්‍රමාණයේ යම් අඩුපාඩුවක් වෙතොත් අනිවාර්ය පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසියේ තුන්වන අදියර ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී. උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීමත් සමඟ මෙය නැවත ක්‍රියාත්මක කරන ලද අතර, අදියර III ක්‍රියාත්මක කිරීම සඳහා අදියර I හි දී පිළිගත යුතු අවම බැඳුම්කර ප්‍රමාණය සියයට 70 සිට සියයට 80 දක්වා ඉහළ නංවන ලදී. ඉහත සඳහන් වැඩි වීමත් සමඟ, III අදියරේ දී ප්‍රාථමික අලෙවිකරුවන් අතර අනිවාර්ය බැඳුම්කර වෙන් කිරීම සඳහා වෙළඳපොළ මගින් තීරණය වූ මිලක්/ඵලදා අනුපාතිකයක් ස්ථාපිත කිරීම තවදුරටත් තහවුරු විය.

(ඉ) පරිණත කාලය උපරිම වසර 5ක් වන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පමණක් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසියක දී තෙවන අදියර ක්‍රියාත්මක කිරීම සීමා කිරීම

භාණ්ඩාගාර බැඳුම්කරවල ද්විතීයික වෙළඳපොළ තවදුරටත් ක්‍රියාකාරී හා ශක්තිමත් කිරීමේ අරමුණින්, භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසියක දී තෙවන අදියර ක්‍රියාත්මක කිරීම, පරිණත කාලය වසර 5 හෝ ඊට අඩු භාණ්ඩාගාර බැඳුම්කරවලට පමණක් සීමා කරන ලදී. මෙම හඳුන්වාදීම මගින්, දිගු කාලීන පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර වෙත ද්විතීයික වෙළඳපොළ තුළ ඉල්ලුම විතැන්ව පවතින අවස්ථාවක දී, III අදියරේ දී අනිවාර්ය පදනමින් වෙන් කරන ලද දිගුකාලීනව පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳාම් කිරීමට අවස්ථාව ලබා ගැනීම සම්බන්ධව වෙළඳපොළ සහභාගීවන්නන්ගේ පැවැති කැමැත්ත ඉටු කිරීමට ද අපේක්ෂා කරන ලදී. 2021 වසරේ පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවලදී අදියර III ක්‍රියාත්මක නොකරන ලදී.

(ඊ) භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා සෘජු නිකුතු කවුළුවක් හඳුන්වා දීම

මහා භාණ්ඩාගාරයේ මුදල් අවශ්‍යතා ප්‍රාථමික වෙන්දේසි තුළින්ම සපුරා ගැනීම තවදුරටත් තහවුරු කර ගැනීමේ අරමුණින්, භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා සෘජු නිකුතු කවුළු හඳුන්වා දෙන ලදී. 2021 වසරේ ජූලි 29 වන දින පැවති භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියේ සිට බලපැවැත්වෙන පරිදි භාණ්ඩාගාර වෙන්දේසියට ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩයක් අදියර I දී සම්පූර්ණයෙන්ම පිළිගන්නා විටක දී, අදියර I දී තීරණය කරන ලද බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය යටතේ එම භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය සඳහා සෘජු නිකුතු කවුළුවක් ක්‍රියාත්මක වේ. මෙම සෘජු නිකුතු කවුළුව හරහා නිකුත් කරනු ලබන වටිනාකම, වෙන්දේසියේ දී ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ සියල්ලම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රමාණයට අතිරේකව වන අතර, සෘජු නිකුතු කවුළුව තුළින් පිළිගත හැකි භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම අදාළ එක් එක් භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය යටතේ වෙනදේසියට ඉදිරිපත් කළ ප්‍රමාණයෙන් සියයට 20ක වටිනාකමට සීමා වේ. 2021 ජනවාරි මස 15 වන දින සිට 19 වන දින දක්වා පැවැත් වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන්දේසියේ සිට ක්‍රියාත්මක වන පරිදි, සෑම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන්දේසියකටම පසුව, වෙන්දේසියට ඉදිරිපත් කළ මුළු වටිනාකම දක්වා වෙන්දේසියේ දී එක් එක් පරිණත කාල සඳහා තීරණය වූ අදාල බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය අනුව සෘජු නිකුතු කවුළුවක් විවෘත කරන ලදී.

(උ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා ආයෝජන කවුළුවක් හඳුන්වා දීම

2021 දෙසැම්බර් 23 දින සිට භාණ්ඩ හා සේවා අපනයනයෙන් ආදායම් උපයන්නන් සහ විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් ද ඇතුළු විදේශ ව්‍යවහාර මුදල් හිමියන් සඳහා ආයෝජන කවුළුවක් හඳුන්වා දෙන ලදී. විදේශ මුදල් උපයන්නන් සඳහා ආයෝජන මාර්ග පුළුල් කිරීමට අමතරව,

දේශීය වෙළඳපොළ විදේශ විනිමය තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා රජය සහ මහ බැංකුව විසින් මෑත කාලීනව ගනු ලැබූ ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැලසීමද, මෙම ක්‍රියාමාර්ගය මගින් අපේක්ෂා කරනු ලැබේ.

(ඌ) භාණ්ඩාගාර මෙහෙයුම් කළමණාකරණ පද්ධතිය වෙනුවට සංචිත නොවන කළමණාකරණ පද්ධතිය හඳුන්වා දෙන ලදී

විදේශීය ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම සඳහා දැනට පවතින පද්ධතිය වෙනුවට සංචිත නොවන කළමණාකරණ පද්ධතිය යටතේ නව පද්ධතියක් ප්‍රතිස්ථාපනය කිරීම ආරම්භ කරන ලදී. මෙම පද්ධතියේ ප්‍රධාන අරමුණ වන්නේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීමයි. මෙය 2022 ජනවාරි 01 වෙනිදා සිට ක්‍රියාත්මක වේ.

(එ) ප්‍රාග්ධන වෙළඳපොළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

දැනට ක්‍රියාත්මක ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය (Capital Market Development Project) යටතේ, යෝජිත අති නවීන යටිතල පහසුකම් භාවිතය මගින්, මූල්‍ය වෙළඳපොළ ගනුදෙනු සිදු කිරීම සහ ඒවායේ පියවීම් ක්‍රියාවලියෙහි වෙනසක් ඇති කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ පවතින සමස්ත ආයෝජන හැසිරීම්, ජාත්‍යන්තරව පිළිගත් ඉහළ ප්‍රමිතීන් සමඟ ගැලපීමට අපේක්ෂා කෙරේ. එක්සත් රාජධානියේ ස්ථාපිත බී.ටී.ඒ. කන්සල්ටින්ග් ලිමිටඩ් ආයතනය විසින් ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සපයමින් සිටියි. නවීන විද්‍යුත් වෙළඳ පද්ධතියක්, මධ්‍යම ප්‍රතිපාර්ශව පද්ධතියකින් සමන්විත නිශ්කාෂණගාරයක්, වැඩිදියුණු කළ මධ්‍යම සුරැකුම්පත් පද්ධතියක් සහ වෙළඳපොළ ආවේක්ෂණ පද්ධතියක් මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ. 2021 වර්ෂය තුළ, යටිතල පහසුකම් ව්‍යුහයේ මෙහෙයුම් ආකෘතිය සහ එහි තාක්ෂණික පිරිවිතර සකස් කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නීති ප්‍රතිසංස්කරණ සකස් කිරීමද සිදු කෙරිණි.

24.6 ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ සමාලෝචන මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම

2021 වර්ෂයේ දී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල (ෆිච් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය, මූඩීස් ආයෝජක සේවාව, එස්. ඇන්ඩ් පී. ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය) ශ්‍රේණිගත කිරීමේ කටයුතුවලට අනුකූලව, ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම් සමාලෝචන සඳහා පහසුකම් සපයන ලදී. තවද, මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු හා මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව එම ශ්‍රේණිගත කිරීමේ නිවේදන සමාලෝචනයකට ලක් කරන ලද අතර, ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවන්ගෙන් පැන නගින අහිතකර බලපෑම් හුවා දක්වමින් වරින් වර මහජන නිවේදන ද නිකුත් කරන ලදී.

25. ප්‍රාදේශීය සංවර්ධන

කොවිඩ්-19 වසංගතය හමුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට 2021 වසර බොහෝ අභියෝගාත්මක කාලවකවානුවක් වුවත්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලැබූ විවිධ ණය යෝජනා ක්‍රමයන්ට අදාළව, ණය සහන ජනතාවට ලබා දුන් අතරතුරම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහන පොලී අනුපාත යටතේ ණය ලබා දීම් අඛණ්ඩව කරගෙන යන ලදී. තවද, මහජනතාව දැනුම්වත් කිරීමේ හා ධාරිතාවය ගොඩනැංවීමේ වැඩසටහන්ද 2021 වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

"උසස් ජීවන තත්ත්වයක් උදෙසා මූල්‍ය අන්තර්ගතභාවයක්" යන දැක්මෙන් යුතුව ශ්‍රී ලංකාව සඳහා වන මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රථම ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛයා ලෙස 2021 වසර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට සුවිශේෂී වසරක් විය.

මේ අතරම, රට තුළ තිරසාර වෙළඳපොළක් මත පදනම් වූ වටිනාකම් දාම සංකල්පය ස්ථාපිත කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලද අතර ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ලබා දෙනු ලැබූ ණය මුදල් වෙනුවෙන් වූ ඇප ආවරණ යෝජනා ක්‍රම හරහා ණය අවදානම බෙදා ගැනීම මගින් සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත අඛණ්ඩ සහයෝගයක් ලබා දෙන ලදී. තවද, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වසර තුළ ප්‍රතිමූල්‍යකරණ සහ පොලී සහනාධාර ක්‍රම යටතේ නව ණය යෝජනා ක්‍රම කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

පැවති වසංගත තත්ත්වය හමුවේ භෞතිකව පවත්වන රැස්වීම් සීමා කිරීමේ අරමුණින් මූල්‍ය අන්තර්ගතභාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ව්‍යාපෘති මූල්‍යකරණය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව මහජනතාව ඇතුළු පාර්ශ්වකරුවන් සමඟ වූ සන්නිවේදන කටයුතු සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් මාධ්‍ය භාවිතය වැඩි කරන ලදී.

25.1 සහනදායී ණය ක්‍රමවේද පුළුල් කිරීම

ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ අරමුදල් සපයනු ලබන ආයතන මගින් ලද අරමුදල් භාවිතයට ගෙන ප්‍රතිමූල්‍යකරණ, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 20ක් පමණ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රමවල සාරාංශයක් II-17 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම 14ක් සහ පොලී සහනාධාර ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 6ක් යටතේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ දී සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා ප්‍රතිලාභීන් 80,899 ආවරණය වන පරිදි රුපියල්

මිලියන 27,268.13ක් ලබා දෙන ලදී. මෙසේ ලබා දෙනු ලැබූ මුළු ණය මුදල්වලින් සියයට 57.6ක් ම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම තුළින් ආවරණය වූ අතර ඉතිරි සියයට 42.4 පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම තුළින් ආවරණය විය. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමවල අරමුදල් ප්‍රභවයන් සැලකිල්ලට ගැනීමේ දී සියයට 48.6 ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය මැදිහත් වී ක්‍රියාත්මක කළ යෝජනා ක්‍රම වන අතර පිළිවෙළින් ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් අරමුදල් සපයන ආයතන මගින් සියයට 49.4ක හා සියයට 2ක දායකත්වයක් ලබා දෙන ලදී.

II-17 සංඛ්‍යා සටහන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම

අරමුදල් මූලාශ්‍ර	ණය යෝජනා ක්‍රමයේ තොරතුරු/සහනදායී ණය යෝජනා ක්‍රම					
	ණය යෝජනා ක්‍රමය	අරමුණ	ප්‍රතිමූල්‍ය/පොලී සහනාධාරය	2021 දී මුදාහරින ලද අරමුදල් ප්‍රමාණය (රුපියල් මිලියන)	වසර අවසානයේ ණයකරු වෙත පැවරෙන වාර්ෂික පොලී අනුපාතය	වෙනත්
ශ්‍රී ලංකා රජය	දිළිඳුකම පිටුදැකීම සඳහා වූ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - චක්‍රීය අරමුදල (PAMP-RF)	ආදායම් උත්පාදන වැඩසටහන් හරහා දිළිඳුකම පිටුදැකීම ප්‍රවර්ධන සහ අඩු ආදායම්ලාභී ජන කොටස් විධිමත් බැංකු පද්ධති හා සම්බන්ධ කිරීම	ප්‍රතිමූල්‍ය	31.20	12.0%	
	'ස්වශක්ති' ණය යෝජනා ක්‍රමය	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වල නියුතු සහ නව ව්‍යවසායකයින් සඳහා රැකියා අවස්ථා බිහි කිරීම	ප්‍රතිමූල්‍ය	1,433.50	5.5%	
	ස්වයං රැකියා උත්පාදන ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය දෙවන අදියර (SEPI - Ph II)	පිළිගත් වෘත්තීය පුහුණු ආයතන හරහා පුහුණුව, තරුණ තරුණියන්ට ස්වයං රැකියා අවස්ථා උදාකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම	ප්‍රතිමූල්‍ය	5.35	7.0%	
	SAPP - RF ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය	කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම දුරලීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම, වාණිජමය නිෂ්පාදන සහ වාණිජ පද්ධති වල අගය ඉහළ නැංවීම	ප්‍රතිමූල්‍ය	34.64	6.5%	
	SAPP - RF කෘෂි ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය		ප්‍රතිමූල්‍ය	11.98	6.5%	
	SAPP - RF තුරුණු ණය යෝජනා ක්‍රමය		ප්‍රතිමූල්‍ය	132.26	6.5%	
	සැපයුම් දාම පුනර්ජීවන ණය යොජනා ක්‍රමය	තේ සැපයුම්කරුවන්ගේ අගයදාම ශක්තිමත් කරමින් ව්‍යාපාර යලි නඟා සිටුවීම	ප්‍රතිමූල්‍ය	39.00	3.5%	
	'සරුසාර' නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS)	වී සහ කෙටිකාලීන බෝග වගාවේ නියුතු ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ වගාකරුවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම	පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ	9,576.68	4.00%	සහභාගිත්ව මූල්‍ය ආයතන වල අරමුදල් සහ රජය මගින් ලබාදෙන පොලී සහනාධාර
	කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන (STaRR) පොලී සහනාධාර වැඩසටහන	නව වගාවන් හරහා නිෂ්පාදනය ජනනය වනතුරු කුඩා තේ හා රබර් වගාකරුවන්ට ස්වයං රැකියා උත්පාදනයට හෝ කෙටි කාලීන ආදායම් ජනනයකිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම.	පොලී සහනාධාර	107.82	6.5%	සහභාගිත්ව මූල්‍ය ආයතන වල අරමුදල් සහ රජය මගින් ලබාදෙන පොලී සහනාධාර
	ශ්‍රී ලංකාවේ ඉස්සන් ගොවිපල තීව්‍ර කිරීම සඳහා වන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය	ඉස්සන් වගාකරුවන්ගේ ගොවිපල පහසුකම් ඉහල නැංවීමට සහය ලබාදීම	පොලී සහනාධාර		පළමු මාස 18 තුල 4.5% ඊළඟ මාස 6 තුල 8.5%	සහභාගීත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ රජය මගින් ලබාදෙන පොලී සහනාධාර

ශ්‍රී ලංකා මහ බැංකුව	සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය	ස්වභාවික ආපදා හමුවේ හානියට පත් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නැවත ගොඩනැංවීම සහ දියුණු කිරීම සඳහා	ප්‍රතිමූල්‍ය	5,008.50	6.00%	
	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය (SCRF) අදියර I	කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර ආර්ථිකමය වශයෙන් නැවත නඟා සිටුවීම	ප්‍රතිමූල්‍ය	5,029.11	4.00%	
	SCRF අදියර II		ප්‍රතිමූල්‍ය	3,416.90	4.00%	
	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය (SCRF) අදියර III	කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර ආර්ථිකමය වශයෙන් නැවත නඟා සිටුවීම	පොලී සහනාධාර හා ණය ඇප ආවරණ	1,891.09	4.00%	
	SCRF අදියර IV	කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ රජය සතු ආයතනවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට සහ ව්‍යවස්ථාපිත බැඳීම් පියවීම සඳහා	ප්‍රතිමූල්‍ය		4.00%	
	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය	ණය යෝජනා ක්‍රමය යටතේ වී මිලදී ගැනීමට අරමුදල් සපයන සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ණය ඇප ආවරණ ලබාදීම	ණය ඇප ආවරණ		වෙළඳපොල පවතින පොලී අනුපාතිකය	ශ්‍රී ලංකා මහ බැංකුව - ණය ඇප ආවරණය සහභාගීත්ව මූල්‍ය ආයතන අරමුදල් සැපයීම
	දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය	දේශීය කෘෂිකර්මික අංශය සංවර්ධනය කිරීම සහ කෘෂිකාර්මික අපනයන ප්‍රවර්ධනය කිරීම	ප්‍රතිමූල්‍ය		රු. මිලියන 1<4% රු. මිලියන 1 සිට 25 දක්වා 5%	
ආධාර සපයන නියෝජිත ආයතන	SAPP - 4P කෘෂිව්‍යාපාර ණය යෝජනා ක්‍රමය	කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම පිටුදැකීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම, වාණිජමය පද්ධති වල අගය ඉහළ නැංවීම	ප්‍රතිමූල්‍ය	234.92	6.5%	කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මඟින් අරමුදල් සැපයේ.
	SAPP - 4P තුරුණු ණය යෝජනා ක්‍රමය		ප්‍රතිමූල්‍ය	256.33	6.5%	
	SAPP මූල්‍ය අතරමැදි තොග ණය		ප්‍රතිමූල්‍ය	58.85	6.5%	

25.1.1 රජයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රම

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, රජයේ නියෝජිතයෙකු ලෙස ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 4ක් සහ පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 7කින් සමන්විතව රජයේ අරමුදල් තුළින් යෝජනා ක්‍රම 11ක් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, මෙම ණය යෝජනා ක්‍රම මගින් 2021 වසර තුළ දී රුපියල් මිලියන 13,263.52 ප්‍රමාණයක් (මුළු ණය මුදාහැරීම් වලින් සියයට 48.6) ප්‍රතිලාභීන් 68,613ක් සඳහා මුදා හරින ලදී.

(අ) රජය විසින් සපයන ලද අරමුදල් භාවිතයට ගෙන ක්‍රියාත්මක කරන ලද පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම

පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් වන, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර) යටතේ මෙම වසර තුළ ගොවීන් 61,397ක් සඳහා කෙටි කාලීන භෝග වර්ග 34ක් ආවරණය වන පරිදි, කෙටි කාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ණය මුදල් ලබා දෙන ලදී. රජය විසින් අරමුදල් සපයන ලද යෝජනා ක්‍රම යටතේ සියයට 72.2ක ප්‍රමාණයක් නියෝජනය කරමින් සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් රුපියල් මිලියන 9,576.68ක මුදල් ප්‍රමාණයක් මෙම යෝජනා ක්‍රමය යටතේ මුදා හරින ලද අතර පොලී සහනාධාරය ආවරණය කිරීම සඳහා මෙම වසර තුළදී ද රජය විසින් රුපියල් මිලියන 207.9ක මුදලක් ලබාදෙන ලදී.

මේ අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමඟ සම්බන්ධ වී කුඩා පරිමාණ තේ සහ රබර් වතු හිමියන් සඳහා වන පුනර්ජීවන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නංවන ලද අතර, එමගින් ප්‍රතිලාභීන් 485ක් සඳහා රුපියල් මිලියන 107.87ක මුදලක් මුදාහරින ලදී. මෙම වැඩසටහන 2021 ඔක්තෝබර් මස 31 වන දින අවසන් වීමට නියමිතව තිබුණ ද, ණය යොජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රතිලාභීන්ට අත්වන ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන ව්‍යාපෘති කාලය තවත් වසරකින් දීර්ඝ කිරීමට පියවර ගන්නා ලදී.

තවද, ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව තීව්‍ර කිරීම සඳහා එහි නිෂ්පාදනය අනුක්‍රමිකව දෙගුණයක් දක්වා ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් නව පොලී සහනාධාර ක්‍රමයක් ද 2021 දෙසැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී.

(ආ) රජයේ අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිළිඳු බව පිටු දැකීම සඳහා වූ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයේ චක්‍රීය අරමුදල, ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා

ක්‍රමය - අදියර II, ස්වශක්ති ණය යෝජනා ක්‍රමය, සැපයුම් දාම නැවත සක්‍රීය කිරීමේ ණය යෝජනා ක්‍රමය, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ රජයේ අරමුදල් සංරචකය යටතේ ආදායම් උත්පාදන (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය, කෘෂි ව්‍යාපාර (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය, තුරුණු (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය, යන යෝජනා ක්‍රම 7, අඛණ්ඩව 2021 වසර තුළ ද ක්‍රියාත්මක කරන ලදී.

25.1.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් තුළින් ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රම

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය අවශ්‍යතා සපයා ගැනීමට අවශ්‍ය යාන්ත්‍රණය පුළුල් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසර තුළදී ද ණය යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ ශක්තිමත් ව්‍යාපාරික පරිසරයක් පවත්වා ගැනීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය සහන කාලයන් ලබා දෙන අතර සංචාරක කර්මාන්තය සඳහා ද විශේෂ අවධානයක් යොමු කරන ලදී.

2021 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 5,008.5ක ණය ප්‍රමාණයක්, ප්‍රතිලාභීන් 5,660ක් ආවරණය වන පරිදි ලබා දී ඇත. රජය සතු ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන ණය සැපයීමේ අරමුණින් රුපියල් මිලියන 10,000ක ප්‍රතිපාදන යටතේ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයේ IV වන අදියර හඳුන්වා දෙන ලදී. තවද, වී මෝල් හිමියන් වෙත ණය ලබා දීමේ දී සිදු විය හැකි ණය අවදානම අවම කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී නව ණය ඇප ආවරණ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රමයේ දී සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා සුදුසුකම් ලත් ණය අයදුම්කරුවන්ට වී මිලදී ගැනීමට අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට හැකියාව ලැබෙන අතර මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් ණය අයදුම්කරුවකු වීම සඳහා වාර්ෂික ආදායම රුපියල් මිලියන 750කට වඩා අඩු විය යුතුය.

වෙළඳපොළ මත පදනම් වූ වටිනාකම් අගය දාම ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා පවතින අවස්ථා සහ බාධක හඳුනා ගැනීම අරමුණු කරගෙන ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ එළවළු, කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ කුළුබඩු යන අගයදාම තුන ආවරණය වන අතර ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් මිලියන 1,000ක ප්‍රතිපාදන වෙන්කොට ඇත.

25.1.3 විදේශ ආයතන මගින් සපයන අරමුදල් භාවිතයට ගෙන ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම

විදේශීය ආයතන විසින් ලබා දෙනු ලැබූ අරමුදල් භාවිතයට ගෙන ක්‍රියාත්මක කරන ලද කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන 2021 වසරේදී ද ක්‍රියාත්මක විය. මෙම ණය යෝජනා ක්‍රමය සඳහා කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සපයන ලද අතර මේ යටතේ රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදක සහයෝගීත්ව කෘෂි ව්‍යාපාර යන ක්ෂේත්‍ර හතර ආවරණය වන පරිදි තරුණ ප්‍රජාව සඳහා ණය යෝජනා ක්‍රමය සහ තොග ණය යෝජනා ක්‍රමය යන යෝජනා ක්‍රම දෙකක් ක්‍රියාත්මක විය. මෙම ණය යෝජනා ක්‍රම හරහා රුපියල් මිලියන 550.1ක ණය මුදලක් ප්‍රතිලාභීන් 2,431 දෙනෙකු වෙත මෙම වසර තුළ දී ලබා දී ඇත.

ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන කෘෂිකාර්මික අගයදාම මූල්‍යනය වැඩසටහන මගින් ගොවීන්, ගොවි කණ්ඩායම් සහ තරුණ ව්‍යවසායකයින් කෘෂිකාර්මික අගය දාම සඳහා සහභාගි කර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රවේශය ලබා දීමට කටයුතු කෙරේ.

25.2 ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය

දරිද්‍රතාවයෙන් මිදීමට සහ ආර්ථික වර්ධන ක්‍රියාවලියට සක්‍රියව දායකවීමට පුද්ගලයින් සහ ආයතනයන් විසින් දරන ප්‍රයත්නයන්ට සහය වීම සඳහා, රජයේ බොහෝ මූල පිරීම් වල කේන්ද්‍රීය අංගයක් වී ඇත්තේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංකල්පයයි.

ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා වඩා විස්තීරණ හා සාමූහික ප්‍රයත්නයක ඇති කාලීන වැදගත්කම හඳුනාගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව 'උසස් ජීවන තත්ත්වයක් උදෙසා අන්තර්ගතභාවයක්' යන දැක්මෙන් යුතුව මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රථම ජාතික උපාය මාර්ගික සැලැස්ම සකස්කොට, 2021 මාර්තු මස 03 දින එළිදක්වන ලදී.

මෙම උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාකාරී ප්‍රධාන අංශ හතරක් ඔස්සේ එනම් ඩිජිටල් මූල්‍ය සහ ගෙවීම්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායි මූල්‍ය, පාරිභෝගික ආරක්ෂණය සහ මූල්‍ය සාක්ෂරතාව හා ධාරිතා වර්ධනය කේන්ද්‍ර කරගනිමින්, අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය ඇතිව ක්‍රියාත්මක වේ.

එහිදී, මූල්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ප්‍රමුඛ ලෙස හඳුනා ගැනීමත් සමඟ එහි ප්‍රධාන අංශ හඳුනා ගැනීම සඳහා 2021 වසර තුළ දීප ව්‍යාප්ත මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයක් සාර්ථකව නිම කිරීමට හැකිවිය. එම සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කර ගනිමින්, රටේ මූල්‍ය සාක්ෂරතා මට්ටම ඉහළ නැංවීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සැලසුම් කිරීමට අපේක්ෂා කෙරේ. තවද, 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා පාසල් විෂය මාලාවට මූල්‍ය අධ්‍යාපනය අනිවාර්ය විෂයක් ලෙස ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ අදාළ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව අධ්‍යාපන මොඩියුල සහ අනෙකුත් අධ්‍යාපනික මාධ්‍ය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි.

උපාය මාර්ගයේ ක්‍රියාකාරි සැලැස්මේ අඛණ්ඩ ප්‍රගතිය නිරීක්ෂණය කරමින්, මෙම සැලසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම අදාළ ආයතන සියල්ල අඛණ්ඩව සම්බන්ධීකරණය කිරීම හා සහය දැක්වීම සඳහා ලේකම් කාර්යාලයක් ශ්‍රී ලංකා

මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කරන ලදී. තවද, උපාය මාර්ගයට අදාළව අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම පිණිස ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ කවුන්සිලය, කළමනාකරණ කමිටුව සහ ක්‍රියාකාරී කමිටු සහිත ඉතා පැහැදිලි පාලන ව්‍යුහයක් මෙම ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මකව පවතී.

25.3 මූල්‍ය සාක්ෂරතාවය

ජනතාව අතර මූල්‍ය සාක්ෂරතාවය සහ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල විසින් 2021 වසරේ දී පුද්ගල සහ මාර්ගගත වශයෙන් මූල්‍ය සාක්ෂරතා සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ගණනාවක් අඛණ්ඩවම ක්‍රියාත්මක කරන ලදී.

එසේ සිදු කරන ලද වැඩසටහන් පිළිබඳ සාරාංශයක් II-18 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-18 සංඛ්‍යා සටහන

2021 වර්ෂයේ දී සිදු කරන ලද දැනුමවත් කිරීමේ සහ විශේෂ වැඩසටහන්

	වැඩසටහනේ ස්වභාවය	වැඩසටහන් ගණන
1.	මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය	334
2.	පුහුණුකරුවන් පුහුණු කිරීමේ සාකච්ඡාවන්	08
3.	ගුවන් විදුලි සහ රූපවාහිනි	17
4.	දැනුම හුවමාරු කරගැනීම	07
	එකතුව	366

25.4 ප්‍රාදේශීය මට්ටමේ නියෝජනය

ප්‍රාදේශීය කාර්යාල, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාදේශීය මට්ටමින් නියෝජනය කරන අතර එමගින් රටේ අඩු පහසුකම් සහිත ජන කොටස් හඳුනා ගැනීම, මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ව්‍යාපෘති කළමනාකරණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා දැනුම්වත් කිරීමේ සහ ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ණය කඳවුරු, සහ වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම වැනි බොහෝ අංශ සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය නියෝජනය තවදුරටත් පුළුල් කරලීමට කටයුතු කරන ලදී. 2021 වසර තුළ මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල හය මගින් සේවක අර්ථසාධක අරමුදලට අදාළ සාමාජිකයන් 86,800කට වඩා වැඩි ප්‍රමාණයකට සෘජුවම සේවය ලබා දී ඇති අතර විවිධ අංශයන්ට අදාළව මහජන පැමිණිලි 434ක් පමණ මෙහෙයවා ඇත. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු මගින් සිදු කරන ලද සමීක්ෂණ සඳහා දිවයිනේ විවිධ දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි සාම්පල් 731ක් සමීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට ද ප්‍රාදේශීය කාර්යාල සමත් විය. 2021 දෙසැම්බර් මාසය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විධිමත් ක්‍රමවේදයන් ඔස්සේ විදෙස් ශ්‍රමිකයන්ගේ මුදල් ප්‍රේෂණය කිරීම සඳහා විදෙස් ශ්‍රමිකයන් දිරිමත් කිරීමේ ක්‍රමෝපායක් ක්‍රියාත්මක කළ අතර එම ප්‍රයත්නයට සමගාමීව ක්‍රියාත්මක කරන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවට අදාළ වැඩසටහන් 27ක් සාර්ථකව නිම කරන ලද අතර ඒ සඳහා 3,000කට අධික පිරිසකගේ සහභාගිත්වය ලබා ගැනීමට සමත් විය.

25.5 අනෙකුත් හඳුන්වාදීම්

25.5.1 හරිත ගම්මාන වැඩසටහන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී හරිත ගම්මාන වැඩසටහන හඳුන්වා දෙන ලද්දේ 'හරිත ක්‍රමවේදයන්ට අනුගත වීම' යන සංකල්පය ඔස්සේ ස්වභාවික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීමට දිරිමත් කිරීමත්, පාරිසරික හානිය අවම කිරීමත්, හරිත නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගෘහස්ථයන් දිරිගැන්වීමත් ඒ තුළින් කුටුම්භවල ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් යන කරුණු අපේක්ෂා කරගෙනයි.

25.5.2 ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගිව කටයුතු කිරීම

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමටත් නව ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතාය වර්ධනය කර ගැනීමටත් අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය ඇතුළත් කිරීම සඳහා වූ සංවිධානය, ආසියානු ණය පරිපූරක ආයතන සම්මේලනය හා ආසියා පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකර්මාන්ත ණය සංගමය සමඟ ඉතා කිට්ටු සබඳතාවයකින් කටයුතු කරන ලදී. මේ තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය අතර දැනුම බෙදා ගැනීමත්, ජාත්‍යන්තර ආයතනවල ක්‍රියාත්මක වන ක්‍රමවේදයන් පිළිබඳ දැනුම ලබාගැනීමටත්, එම දැනුම ආයතනයේ ඉදිරි කටයුතු සඳහා යොදා ගැනීමටත් හැකියාව ලැබේ.

25.6 ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය ප්‍රකාශන තුළට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කටයුතු අන්තර්ග්‍රහණය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද නවීකරණ වැඩසටහන යටතේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කිරීම තුළින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2001 වසරේ දී පිහිටුවන ලදී. දශක දෙකකට වැඩි කාලයක් පුරා, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රට තුළ කලාපීය මට්ටමේ විෂමතා අවම කිරීම සහ රැකියා උත්පාදනය සඳහා සහාය වන අතරම, ස්වයං රැකියාලාභීන් ඇතුළු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ඔවුන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා බොහෝ ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කර පවත්වාගෙන යන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රජයේ අරමුදල් සහිත යෝජනා ක්‍රම පුළුල් ලෙස ක්‍රියාත්මක කළ අතර ඊට අදාළ ගිණුම් කටයුතු ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව තුළම පවත්වාගෙන යන ලදී. මෙසේ වෙන්ව පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති ගිණුම්

ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය ප්‍රකාශනවලට ඒකාබද්ධ කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, රජය සහ වෙනත් අංශ වෙත ගෙවිය යුතු හිමිකම් හැරුණු විට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වෙනම පවත්වාගෙන යනු ලබන අනෙකුත් සියලු අරමුදල් 2021 දෙසැම්බර් 31 දිනට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අන්තර්ග්‍රහණය කරන ලදී. එසේ ශ්‍රී ලංකා මහ බැංකු ගිණුම් වලට අන්තර්ග්‍රහණය කරන ලද ණය යෝජනා ක්‍රමවල සාරාංශයක් II-19 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-19 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අන්තර්ග්‍රහණය කරන ලද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශේෂයන්

මූලාශ්‍රය	මුදල (රුපියල් මිලියන)
ආයෝජන කළඹ	5,380
සහභාගිත්ව මූල්‍ය ආයතන වලින් ලැබිය යුතු ප්‍රතිමූල්‍ය නිකුතු	9,144
ශේෂයන්	1,954

1 ප්‍රතිමූල්‍ය ආපසු ලැබීම් ශේෂයේ බහුතර ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබන්නේ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දෙනු ලැබූ ප්‍රතිමූල්‍ය වන අතර එම ණය යෝජනා ක්‍රමය නිර්මාණය වී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කරන ලද වෙනත් ණය යෝජනා ක්‍රමවල ඉතිරි වී තිබූ ආයෝජන ආදායම් ශේෂයන්, පරිපාලන ගාස්තු සහ අනෙකුත් ශේෂයන් මාරු කිරීම තුළින්ය. ඒ අනුව, දෙවන බහු වාර්ෂික භෝග වගා ව්‍යාපෘතිය, සබරගමුව පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන චක්‍රීය ව්‍යාපෘතිය, මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය, වැවිලි අංශයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය, සුරතුර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය අරමුදල, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහකාර ව්‍යාපෘතිය, බස්රථ මිලදී ගැනීමේ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය, දෙවන බහු වාර්ෂික බෝග වගා ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල, තේ සංවර්ධන ව්‍යාපෘතිය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය, කුඩා වතු හිමියන්ගේ තේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය, තේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ ප්‍රතිචක්‍රීය අරමුදල, වියළි කලාපීය පරිභෝජනය ඉහළ නැංවීමේ ණය යෝජනා ක්‍රමය සහ හවුල් වැඩසටහන් ණය යෝජනා ක්‍රමය, වියළි කලාපීය ජීවනෝපාය ඉහළ නැංවීමේ සහ හවුල්කාරිත්ව වැඩසටහන යටතේ වූ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය, යුරෝපා ආයෝජන බැංකුව මගින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් B යටතේ ලබාදුන් ණය යෝජනා ක්‍රමය, මාතලේ ප්‍රාදේශීය ආර්ථික අභිවෘද්ධි ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය, කෘෂි නවෝද්‍යා කාලීන ණය වැඩසටහන, ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය, කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන, ප්‍රතිපත්ති උත්තේජක අරමුදල, උතුරු පළාත් ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමේ ණය යෝජනා ක්‍රමය සඳහා වූ චක්‍රීය අරමුදල, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ණය ලබා දීම සඳහා වූ චක්‍රීය අරමුදල, සබරගමුව ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති දෙවන අදියර සඳහා වූ ණය යෝජනා ක්‍රමය, ස්වයං රැකියා ප්‍රවර්ධනය සඳහා වූ ණය යෝජනා ක්‍රමය, පශ්චාත් සුනාමි වෙරළ පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ වැඩසටහන, පුබුදමු උතුර ණය යෝජනා ක්‍රමය - චක්‍රීය අරමුදල - II අදියර සහ උතුරු හා නැගෙනහිර හානියට පත් නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිචක්‍රීය ණය යෝජනා ක්‍රමය වැනි විවිධ වූ ණය යෝජනා ක්‍රම යටතේ පැවති ශේෂයන් මාරු කිරීම තුළින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ප්‍රතිමූල්‍ය සැපයීම පිණිස සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවන ලදී.

2 මුදල් මාරු කිරීම් : කෘෂි අංශය සඳහා වන විශේෂිත ණය යෝජනා ක්‍රමය (විස්කම්), උතුරු හා නැගෙනහිර පළාත්වල විනාශ වූ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ආරම්භ කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය, ප්‍රතිපත්ති උත්පාදක අරමුදල, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය, මැද රට බහුවාර්ෂික වගාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා වන ණය ඇප ආවරණ ව්‍යාපෘතිය, කෘෂිකර්ම පුනරුත්ථාපන ව්‍යාපෘතිය, කුඩා තේවතු හිමියන් සංවර්ධනය කිරීම සඳහා වන ඇප ආවරණ ව්‍යාපෘතිය, කුඩා හා මධ්‍ය පරිමාණ කාර්මික අංශය සඳහා ඇප ආවරණ යෝජනා ක්‍රමය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහන සැලසීම සඳහා වන ඇප ආවරණ ව්‍යාපෘතිය, බස්රථ මිල දී ගැනීම සඳහා වන ඇප ආවරණ ණය යෝජනා ක්‍රමය සහ උකස් අත්තිකාරම් සඳහා ඇප ආවරණ ණය යෝජනා ක්‍රමය ආදී ගිණුම්වල පැවති මුදල් ශේෂයන් මේ යටතට අයත් වේ.

26. නිරාකරණ හා බලගැන්වීම්

නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණක් වන මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා අරමුදල කාර්යක්ෂමව මෙහෙයවීමෙන් ද, 1988 අංක 30 දරන බැංකු පනතේ 83 ඇ වගන්තිය යටතේ තහනම් මූල්‍ය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමෙන් ද, අර්බුදයන්ට මුහුණ දුන් මූල්‍ය ආයතන සම්බන්ධ නිරාකරණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් පුළුල් නිරාකරණ ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමෙන් ද දායකත්වය සපයන ලදී.

ඒ අනුව 2021 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

26.1 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම.

2021 වසර තුළ දී ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට අදාළව රෙගුලාසීන් දෙකක් පහත පරිදි නිකුත් කරන ලදී.

I. 2021 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි නිකුත් කිරීම මගින් බලපත්‍රය අවලංගු කළ හෝ අත්හිටුවනු ලැබූ සාමාජික ආයතනයක රක්ෂණාවරණ හිමි තැන්පතුකරුවන්ට රුපියල් ලක්ෂ හයක් (රු. 600,000) වූ වන්දි මුදල රුපියල් ලක්ෂ එකොළහක් (රු. 1,100,000) දක්වා 2021.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩිකරන ලද අතර එම රක්ෂණාවරණය වැඩිවීම 2021.04.01 දිනට පෙර බලපත්‍ර අවලංගු කරන ලද හෝ තහනම් කරන ලද සියලුම බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වලට ද අදාළව සිදු කරන ලදී.

II. එතෙක් බලාත්මකව පැවති රෙගුලාසි අවලංගු කර 2021.08.06 දින සිට බලපැවැත්වෙන පරිදි 2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම නව රෙගුලාසියේ අරමුණ වූයේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් සහ කළමනාකරණ වැඩිදියුණු කිරීමයි. ඒ සඳහා අදාළ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලව සහ යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමේ දින සිට ක්‍රියාත්මක කිරීමෙන් ලබාගත් අත්දැකීම් මත පදනම්ව මෙම නව රෙගුලාසි ක්‍රියාත්මක කරන ලදී.

2021 වර්ෂය අවසාන දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන සංඛ්‍යාව 69ක් වූ අතර ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ අරමුදල් රුපියල් බිලියන 67.9 විය. එම අරමුදල පිළිබඳ විශේෂ මූල්‍ය තොරතුරු II-20 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

II-20 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මූල්‍ය තොරතුරු සාරාංශය

අයිතමය	අගය (රුපියල් මිලියන)	
	2020.12.31 දිනට	2021.12.31 දිනට
අරමුදලේ ප්‍රමාණය	51,322.1	67,887.3
මුළු ආදායම	20,814.0	19,298.9
මුළු වියදම	31,964.4	96.6
වාර්ෂික අතිරික්තය (බදුවලට පෙර)	(11,150.4)	19,202.3
මුළු වත්කම්	73,559.1	74,443.9
රජයේ සුරැකුම්පත්වල ආයෝජන	67,877.8	69,529.2
ණය සහ ලැබිය යුතු මුදල් (වෙන්කිරීම්වලට පසු)	682.1	381.9
අනෙකුත් විස්තීරණ ආදායම් සංචිත	7,778.2	(2,103.0)

26.2 අර්බුදයන්ට මුහුණ දුන් මුදල් සමාගම් වල තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීම.

අර්බුදයන්ට මුහුණ දුන් මුදල් සමාගම්වල තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීම ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමයට අදාල රෙගුලාසින්ට යටත්ව තවදුරටත් අඛණ්ඩව 2021 වර්ෂය තුළ දී ද සිදු කරන ලදී. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් සහ ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සහ ටී. කේ. එස්. ෆිනෑන්ස් ලිමිටඩ් හි තැන්පතුකරුවන් සඳහා වන්දි මුදල් ගෙවීම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අභ්‍යන්තර ගෙවීම් පටිපාටියට යටත්ව සෘජුව ම ද, ද ෆිනෑන්ස් කම්පැණි පී.එල්.සී., ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. හි තැන්පතුකරුවන් සඳහා වන්දි ගෙවීමේ කටයුතු නියෝජිත බැංකුව වන මහජන බැංකුව හරහා එකඟ වූ කොන්දේසි සහිත ගිවිසුමකට යටත්ව ද අඛණ්ඩව සිදු කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් බලපත්‍ර අවලංගු කරන ලද සහ අත්හිටුවන ලද මුදල් සමාගම් හයේ (06) තැන්පතුකරුවන් 70,827 දෙනෙකු සඳහා රුපියල් මිලියන 29.2ක මුදලක්, රක්ෂණ වන්දි වශයෙන් 2021.12.31 දින වන විට II -21 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි ගෙවා අවසන් කරන ලදී.

26.3 තහනම් යෝජනා ක්‍රම සම්බන්ධ විමර්ශන කටයුතු සිදු කිරීම

නිරාකරණ සහ බලගැන්වීමේ දෙපාර්තමේන්තුවට සැලකිය යුතු ප්‍රමාණයකින් තහනම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකරන ලෙස ඉල්ලීම් සමාජ මාධ්‍ය, ලිඛිත පැමිණිලි, මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගෙන් ලද අතර ඒ සම්බන්ධයෙන් මූලික පියවර වශයෙන් තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන බව කියන ආයතන හඳුනා ගැනීම සඳහා මූලික පරීක්ෂණ සිදුකිරීම ද ඉන් අනතුරුව පුළුල් ලෙස පරීක්ෂණ සිදුකිරීම ද 1988 අංක 30 දරන බැංකු පනතේ 83 ඇ වගන්තියේ විධිවිධානවලට අනුව සිදු කරන ලද අතර ස්ථාපිත මූලික පරීක්ෂණ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන ආරම්භ කරන ලදී.

තවද, නීතිමය පියවර ගැනීම සඳහා දැනටමත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද විමර්ශන පිළිබඳ සම්බන්ධීකරණය සහ පසු විපරම් කටයුතු නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සිදු කරන ලදී. නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණයෙන් සංවිධානය කළ අතර තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ආදී වංචනික ක්‍රියා සම්බන්ධයෙන් මහජනතාවට අවබෝධයක් ලබා දීම සහ ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම එම වැඩසටහන් මගින් අරමුණු කරන ලදී.

26.4 අර්බුදයන්ට මුහුණදුන් මූල්‍ය ආයතන සම්බන්ධයන් වූ නිරාකරණ ප්‍රතිපත්ති රාමුව සැකසීම

නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් පවත්නා නීති රාමුව තුළ අර්බුදයන්ට මුහුණ දුන් බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සම්බන්ධ නිරාකරණ කටයුතු සිදු කිරීමට අදාළ නිරාකරණ ප්‍රතිපත්ති රාමුව සැකසීම තවදුරටත් අඛණ්ඩව සිදු කරන ලදී.

II-21 සංඛ්‍යා සටහන

2021.12.31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් රක්ෂණ වන්දි ගෙවීම්

ආයතනයේ නම	රක්ෂණ මුදල් ගෙවූ තැන්පතුකරුවන් ගණන	ගෙවූ වන්දි මුදල (රුපියල් මිලියන)
සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පී.එල්.සී.	3,451	1,802.2
ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් පී.එල්.සී.	2,509	1,193.7
ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ්	1,788	964.5
ද ෆිනෑන්ස් කම්පැණි පී.එල්.සී.	34,192	12,029.8
ඊ.ටී.අයි ෆිනෑන්ස් ලිමිටඩ්	26,280	12,212.8
ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී.	2,607	1,048.6
එකතුව	**70,827**	**29,251.6**

27. අවදානම් කළමනාකරණ

සිය ප්‍රතිපත්තිමය අරමුණු ඉටු කර ගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවට මූල්‍යමය හා මූල්‍යමය නොවන විවිධ අවදානම් වලට මුහුණ දීමට සිදු වේ. මෙවැනි අවදානම් ඇති වීම තුළින්, බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට, බැංකුවේ මූල්‍ය තත්වයට හා කීර්තිනාමයට අහිතකර බලපෑමක් ඇතිවිය හැකි බැවින්, මනා ලෙස පිළියෙල කළ අවදානම් කළමනාකරණ රාමුවක් පැවතීම ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව පිළියෙල කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ (Risk Management Policy Statement)

දක්වා ඇති පරිදි, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මහ බැංකුවම ආවරණය කරමින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති සකස් කරයි. මෙම ක්‍රියාවලියේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පිළිගත් ප්‍රමිතීන්, මාර්ගෝපදේශ සහ අවදානම් කළමනාකරණය සඳහා නිසි භාවිතයන් අනුගමනය කරන අතර, අවදානම්වල හිමිකාරිත්වය සහ එහි කළමනාකරණය පිළිබඳව පැහැදිලි වගවීමක් අදාළ පාර්ශ්වකරුවන් වෙත පවරා දී ඇත.

27.1 මෙහෙයුම් අවදානම

අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය යාවත්කාලීනව තබා ගැනීම සහ මෙහෙයුම් සඳහා වන අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මෙහෙයුම් අවදානම් වර්ගීකරණය සමාලෝචනය කළ අතර, මේ සඳහා අවශ්‍ය පරිදි සංශෝධන ඇතුළත් කරන ලදී.

දෙපාර්තමේන්තු අවදානම් තක්සේරු කිරීම් සඳහා සපයනු ලබන පහසුකම් අඛණ්ඩව පවත්වා ගනිමින්, දෙපාර්තමේන්තු අවදානම් ලේඛන පිළියෙල කිරීමට සහාය වීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ සමීපව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව තුළ අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ අදහසින්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වසර මුළුල්ලේම ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පවතින අවදානම් සංස්කෘතිය සහ දැනට භාවිතා වන මෙහෙයුම් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පවතින අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳ දැනුවත් මට්ටම තීරණය කිරීම පිණිස, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් අවදානම් පිළිබඳ ද්විවාර්ෂික සමීක්ෂණය පවත්වන ලදී.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සිදුවීම් වාර්තාකරණ පද්ධතිය හරහා වාර්තා වූ සිදුවීම් අඛණ්ඩව අධීක්ෂණය කරමින්, සිදුවීම්වල කේන්ද්‍රීය ගබඩාවක් නිර්මාණය කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සිදුකරන ලදී. මෙම ක්‍රමය හරහා රැස්කරගත් තොරතුරු, අවදානම් ප්‍රවණතා හා අවදානම් සහිත කලාප හඳුනා ගැනීමට මෙන්ම, ඒ හා සම්බන්ධ අවදානම් ප්‍රතිකර්ම වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

27.2 මූල්‍ය අවදානම

දෙවන පෙළ ආරක්ෂක ක්‍රියාදාමය ලෙස, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්, මූල්‍ය අවදානම යටතේ ණය, වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් අධීක්ෂණය, විශ්ලේෂණය, ඇගයීම සහ වාර්තා කිරීම ස්වාධීනව සිදු කරනු ලැබේ. තවද, ජාත්‍යන්තර සංචිත (International Reserves), අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Funds) සහ රජය සඳහා නියෝජිතායතන කාර්යයක් ලෙස සිදු කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ (Employee's Provident Fund) අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වලට අදාළව, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වැඩිදියුණු කරන ලද, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලට අදාළ දෙපාර්තමේන්තුවල අනුකූලතාවය සහතික කිරීමද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර සංචිත සඳහා උපායමාර්ගික වත්කම් විභජනයන් (Strategic Asset Allocation), සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයන් (Investment Policy Statement), අභ්‍යන්තර ආයෝජන අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයෝජන මාර්ගෝපදේශයන් (Investment Guidelines) අවශ්‍ය පරිදි සංශෝධන ඇතුළත් කරමින් සංස්කරණය කරන ලදී. ණය අවදානම් කළමනාකරණය සඳහා වූ බාසල් III සම්මත ප්‍රවේශයට අනුව නිකුත් කරන්නන්ට හා ප්‍රති පාර්ශ්වයන් සඳහා නිරාවරණ සීමා ගණනයන්ට අදාළ වන්නා වූ නව ආකෘතියක් හඳුන්වා දීම මගින් ප්‍රති පාර්ශ්ව ණය අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශයන් (Counterparty Credit Risk Management Guidelines) යාවත්කාලීන කිරීමටත් එසේ යාවත්කාලීන කළ මාර්ගෝපදේශයන් අදාළ ආයෝජන මාර්ගෝපදේශයන් වෙත ඇතුළත් කිරීමටත් පියවර ගන්නා ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ අවදානම් සහ ණය අවදානම් දර්ශක විශ්ලේෂණය කිරීම නිරන්තරයෙන් සිදු කරනු ලබන අතර, ඉහත සඳහන් අරමුදල් සඳහා අදාළ උපායමාර්ගික වත්කම්, විභජනයන්, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයන් සහ ආයෝජන මාර්ගෝපදේශයන්හි දක්වා ඇති සීමා රාමු පිළිපැදීම නිරීක්ෂණය කරයි. මෙම සියලු අවදානම් තක්සේරු කිරීම් සහ අනුකූල නොවීම් අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු (Investment Oversight Committees) රැස්වීම්වල දී මාසිකව ඉදිරිපත් කරන ලදී.

2021 වර්ෂය තුළ දී ජාත්‍යන්තර සංචිත සඳහා නව සංචිත කළමනාකරණ පද්ධතියක් (Reserve Management System) ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ද සම්බන්ධ විය. එමගින් වෙළඳපොළ සහ ණය අවදානම් තක්සේරු කිරීම සඳහා සිදු කරනා අධීක්ෂණයන්ගෙන් යම් ප්‍රමාණයක් හා සංචිත කළමනාකරණ සඳහා වන අනුකූලතාවයන් අධීක්ෂණය, ස්වයංක්‍රීයව සිදුවන තත්වයට පත්කර ගැනීමට අවකාශ ලැබුණි.

මහ බැංකුවේ සියලුම මෙහෙයුම් සහ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම්, ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා කාර්තුමය වශයෙන්, මෙහෙයුම් අවදානම් පිළිබඳ වාර්තාවන්, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව (Non-Financial Risk Management Committee) වෙත වාර්තා කිරීම සහ සියලුම මෙහෙයුම් හා මූල්‍යමය අවදානම් පිළිබඳ වාර්තාවන් මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee) සහ මුදල් මණ්ඩලය වෙත දැනුම් දීම, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

28. ලේකම් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකක් වන ලේකම් දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරෙන කාර්යයන් අතරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත ආයතනික පරිපාලන කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන කළමනාකරණය, විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, විදේශ අධ්‍යයන කටයුතු හා විදේශ පුහුණු සංචාර සම්බන්ධයෙන් පහසුකම් සැලසීම, වත්කම් බැහැර කිරීම් කළමනාකරණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම සහ අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම ප්‍රධාන වේ.

(අ) සමස්ත ආයතනික පරිපාලනය

2021 වර්ෂය තුළදී ද, බැංකුවේ සමස්ත ආයතනික පරිපාලනය, පාලන රෙගුලාසි, වග විම, අවදානම් කළමනාකරණය සහ වෙනත් ප්‍රධාන යහපාලන ගුණාංගවලට අනුකූලව කරගෙන යන ලදී. පසුගිය වසර තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ දේපළ සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා ඇති විය හැකි අවදානම් හඳුනාගෙන බැංකුවේ සියලුම දේපල සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. තවද, ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැපැල් කළමනාකරණ සේවාව මගින් එන සහ යන ලිපි සම්බන්ධ අවශ්‍ය කටයුතු කිරීම ද, බැංකුවේ ලිපි ද්‍රව්‍ය ගබඩා කළමනාකරණය කාර්යක්ෂමව සහ පිරිමැසුම්දායක ලෙස කරගෙන යෑම ද, බැංකුව සම්බන්ධ විශේෂ උත්සව සංවිධානය කිරීම ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ ඉටු කරන ලද කාර්යභාරයන් විය. මීට අමතරව, වර්ෂය තුළ බැංකුව සඳහා සේවා සපයන ආයතන සමඟ මුදල් මණ්ඩලය වෙනුවෙන් මහ බැංකුවේ ලේකම් විසින් ගිවිසුම් වලට එළඹීමද සිදු කරන ලදී.

(ආ) ප්‍රසම්පාදන කළමනාකරණය

මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික අයවැය පදනම් කරගෙන 2021 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2021 වර්ෂය තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රසම්පාදන කටයුතු කරගෙන යන ලදී. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල ලෙස සකස් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතෙහි දක්වා ඇති ප්‍රසම්පාදන පටිපාටියට අනුව ටෙන්ඩර් පටිපාටිය මෙන්ම ටෙන්ඩර් නොවන ක්‍රමවේද යටතේ ද මෙකී භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී. ඊට අමතරව, ඉතා කෙටි කාල සීමාවක් තුළ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවාවන් ගණනාවක් ප්‍රසම්පාදනය කිරීමට ද ලේකම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. තවද, ලෝක බැංකුව විසින් ක්‍රියාත්මක කරන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය සඳහා ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී.

(ඇ) විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

දෙදහස් තුන්සිය දොළහක ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සඳහා මහ බැංකු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය යටතේ අදාළ ගෙවීම් කටයුතු කිරීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළදී ද අඛණ්ඩව කරගෙන යන ලදී. ඒ අනුව, විශ්‍රාම පාරිතෝෂික හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීම, අර්ථසාධක අරමුදල් මුදා හැරීම, මාසික විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු අරමුදල්, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් ගෙවීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතේ දක්වා ඇති නීතිරීති වලට අනුව ජීවන සහතික ලබා ගැනීමත්, විශ්‍රාම ප්‍රතිලාභීන්ගේ නොයෙකුත් අවශ්‍යතා ඉටුකර දීම සඳහා ඔවුන් සමඟ ලිපි ගනුදෙනු ගණනාවක් සිදු කිරීමත් වසර පුරා ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

(ඈ) විදේශ අධ්‍යයන කටයුතු හා පුහුණු සංචාර සඳහා පහසුකම් සැලසීම

මහ බැංකු සේවා නියුක්තයන්ගේ පශ්චාත් උපාධි කටයුතු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ රාජකාරි විදේශ ගමන් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ දී අඛණ්ඩව පහසුකම් සලසන ලදී. මේ යටතේ ලේකම් දෙපාර්තමේන්තුව විසින් විශ්ව විද්‍යාලවලට සහ ඉහත කටයුතු සඳහා විදේශගත වූ සේවා නියුක්තයන්ට අදාළ ගෙවීම් කටයුතු සිදු කරන ලද අතර, විදේශගත වන සේවා නියුක්තයන් සඳහා වීසා ලබා ගැනීමට හැකි වනු පිණිස වීසා ලිපි හා අර්ථසාධක අරමුදල් ශේෂය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම, ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සහ රක්ෂණ ආවරණ ලබා ගැනීම සඳහා සහාය වීම ද සිදු කරන ලදී. කෙසේ වුවද, පසුගිය වසරවලට සාපේක්ෂව මෙම වසර තුළ සිදු කළ විදෙස් සංචාර ප්‍රමාණය, පැවති COVID-19 වසංගතය හේතුවෙන් අඩු අගයක් ගනු ලැබීය.

(ඉ) සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම

සමීක්ෂණ මණ්ඩලය යනු මහ බැංකුව විසින් එහි ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා යොදා ගනු ලබන ක්‍රමවේදයයි. ඒ අනුව, 2021 වර්ෂය තුළ දී යල්පිනූ, හානි වූ, සේවාකරණය කළ නොහැකි සහ අලුත්වැඩියා කළ නොහැකි වත්කම් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

(ඊ) අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම

2021 සැප්තැම්බර් 23 වන දින අධිපති ලේකම් දෙපාර්තමේන්තුව පිහිටුවන තුරු මහ බැංකු අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය සහ සන්ධාන සේවා ලේකම් දේපාර්තමේන්තුවට අනුබද්ධිත අධිපති ලේකම් කාර්යාලය විසින් සපයන ලදී. ඒ අනුව, අධිපතිතුමාගේ නිල හමුවීම් සහ රැස්වීම් සංවිධානය දේශන හා ලිපි සඳහා කෙටුම්පත් සකස් කිරීම, අධිපතිතුමාගේ දේශීය නිල සංචාර සංවිධානය කිරීම, අධිපතිතුමාගේ නිල උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීම සහ මහ බැංකුවේ සහ අධිපතිතුමාගේ විශේෂිත ආරාධිත අමුත්තන් හට අවශ්‍ය සන්ධාන සේවා සැපයීම ඉටු කරන ලදී.

29. ආරක්ෂක සේවා

කොවිඩ්-19 වසංගත තත්ත්වය මත ඇති වූ විවිධ අභියෝග ජය ගනිමින් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ එහි අනෙකුත් ස්ථාපිත ආයතනයන් ද ඇතුළුව සේවකයින්, අමුත්තන්, දේපළ සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සැපයීමේ මෙහෙයුම් කටයුතුවල අඛණ්ඩව වසර පුරා නිරත වෙන ලදී. එසේම, හදිසි තත්ත්වයන් යටතේ මුදල් ප්‍රවාහන කටයුතුවල දී ශ්‍රී ලංකා පොලීසිය සමග සම්බන්ධීකරණය වෙමින් ඒ සඳහා විශේෂ ආරක්ෂාව සැපයීම ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සියළුම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී දායකත්වය සපයන ලදී.

(අ) පද්ධතිය වැඩිදියුණු කිරීම

වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සහ මහ බැංකු පරිශ්‍රයන්හි පිහිටුවා ඇති සියළුම ගිනි නිවීමේ උපකරණයන්හි මෙහෙයුම් යෝග්‍යතාවය නිරන්තරයෙන් පරීක්ෂා කරමින්, නඩත්තු කිරීම සහ ප්‍රතිස්ථාපනය සිදු කරන ලදී. ගමන් මලු පරීක්ෂණ යන්ත්‍ර, භාණ්ඩ පරීක්ෂා කිරීමේ යන්ත්‍රය ඇතුළු අනෙකුත් සියළුම ආරක්ෂක උපකරණ නඩත්තුව අදාළ සේවා සපයන්නන් සමග සේවා ගිවිසුම් ප්‍රකාරව වසර පුරා සිදු කරන ලදී. ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් නිසි බලධාරීන් සමග සම්බන්ධීකරණය වෙමින් ඒ සම්බන්ධව අඛණ්ඩව යාවත්කාලීන කරන ලදී.

(ආ) නිරීක්ෂණ කටයුතු

අදාළ වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව, මහ බැංකු මූලස්ථානයට පැමිණි අමුත්තන් 13,478 දෙනෙකුගේ සහ ප්‍රාදේශීය කාර්යාලවලට පැමිණි සියළුම අමුත්තන්ගේ ආරක්ෂාවන් තහවුරු කරන ලදී. වර්ෂය තුළ දී මුදල් පෙට්ටි හුවමාරු කිරීම් 28,309ක් නිරීක්ෂණය කිරීම් සඳහා පහසුකම් සලසා ඇත.

(ඉ) කොවිඩ්-19 වැළැක්වීම

සෞඛ්‍ය බලධාරීන් විසින් හඳුන්වාදුන් මාර්ගෝපදේශ ප්‍රකාරව, කොවිඩ්-19 වැළැක්වීම සඳහා මහ බැංකු පරිශ්‍රයට ඇතුළුවීමට පෙර කාර්ය මණ්ඩලයේ සහ අමුත්තන්ගේ ශරීර උෂ්ණත්වය මැනීම, දර්ශනගත කිරීම හා තොරතුරු ලේඛනගත කිරීම යනාදී විවිධ ක්‍රියාමාර්ග සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සේවය ලබා දිය නොහැකි කාර්ය මණ්ඩලය වෙත ලිපිලේඛන කළමනාකරණ කටයුතු සඳහා සහාය වන ලදී. එසේම වැඩිදුරටත් බැංකු පරිශ්‍රය තුළ කාර්ය මණ්ඩලය අතර සම්බන්ධතා අවම කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා නව රාජකාරී වාර්තා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.

(ඊ) ආරක්ෂක සේවා පාලනයේ ගුණාත්මකභාවය ඇගයීම

ආරක්ෂක සේවා කටයුතුවල ඇගයීම මත පදනම්ව ආරක්ෂක සැළැස්ම යාවත්කාලීන කළ අතර ඒ අනුව, බැංකු විදුපියස හා සේවක අර්ථසාධක අරමුදල යන දෙපාර්තමේන්තු සඳහා ගමන්මලු ස්කෑනර් යන්ත්‍ර දෙකක් සපයන ලදී. ඉහත ඇගයීම අනුව ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා ජංගම සන්නිවේදන පද්ධතිය ඇනලොග් සිට ඩිජිටල් දක්වා ප්‍රතිෂ්ඨාපනය කර ඇත. ඒ සමගම ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ජංගම පුපුරණ ද්‍රව්‍ය හඳුනාගැනීමේ යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී.

(එ) මානව සම්පත ශක්තිමත් කිරීම හා නිපුණතා ඉහළ නැංවීම

ඉහළ යන සේවා අවශ්‍යතා මත නව සහකාර ආරක්ෂක නිලධාරීන් බඳවා ගැනීම සඳහා ක්‍රියා කරමින් සිටින අතර නව තාක්ෂණය පිළිබඳ කුසලතා ඔප් නැංවීම සඳහා තෝරාගත් ආරක්ෂක නිලධාරීන් සඳහා ස්ථාපනය කරන ලද නව CCTV පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

30. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ

ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා කාර්යක්ෂම, සෞඛ්‍යසම්පන්න සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් සහතික කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ යහපැවැත්මට පහසුකම් සැලසීම කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. එබැවින් කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සුබසාධන පහසුකම් සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්ගේ යහපත් කායික හා මානසික සෞඛ්‍යය පෝෂණය කිරීම සඳහා වන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව තුල සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් ප්‍රවර්ධනය කරනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන් ලෙස කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්යමණ්ඩල සුබසාධන ණය ක්‍රමය යටතේ ණය ලබාදීම, සේව්‍යදායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම, වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් හා ආපනශාලා පහසුකම් සැපයීම යනාදිය දැක්විය හැකිය. කාර්යමණ්ඩලයේ නිවාස, වාහන, වෛද්‍ය සහ අනෙකුත් සුභසාධන අවශ්‍යතා ආවරණය වන මෙම සේවාවන් සේවකයින් ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වන අතර, ඉහළ මට්ටමේ කාර්යක්ෂමතාවකින් යුතුව වැඩ කළ හැකි අභියෝගාත්මක සහ අභිප්‍රේරණය වූ ශ්‍රම බලකායක් ඇතිකරනු ලබයි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ යැපෙන්නන්ගේ මෙන්ම විශ්‍රාමිකයන්ගේ වෛද්‍ය අවශ්‍යතා ද වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ආවරණය වනු ලැබේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයෙහි වුවද කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව සුබසාධන පහසුකම් ප්‍රතිලාභීන් වෙත ලබාදීම 2021 වර්ෂය තුළද අඛණ්ඩව සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව කාර්යමණ්ඩලයට අවශ්‍ය නව සේවාවන් සඳහා පහසුකම් සැලසීමට විශේෂ පියවර ගන්නා ලදී. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පුද්ගලික රෝහල්

තුනක සහයෝගය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී පී. සී. ආර්. පරීක්ෂණ සිදු කිරීමේ වැඩසටහන් අටක් 2021 වසර තුළ සංවිධානය කරන ලදී. මීට අමතරව, කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා වෙන්වූ එන්නත් මධ්‍යස්ථාන තුනක දී කොවිඩ් 19 සඳහා එන්නත් ලබා ගැනීමට සේවකයින්ට පහසුකම් සම්පාදනය කරන ලද අතර 2021 දෙසැම්බර් මස ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී බූස්ටර් එන්නත ලබා ගැනීම සඳහා වැඩසටහනක් සංවිධානය කරන ලදී. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව කාර්යමණ්ඩලය වෙත නිවාස සහ අනිකුත් සුබසාධන ණය පහසුකම් සැපයීම අඛන්ඩව සිදු කරන ලද අතර වසර තුළ වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සියලුම ප්‍රතිලාභීන් විසින් දරන ලද වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරන ලදී. 2021 වසර අවසාන වන විට සේවා නියුක්තියන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් සහ ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 10,837ක් පමණ විය. වෛද්‍ය මධ්‍යස්ථානය මගින් මහ බැංකු සේවා නියුක්තියන් වෙත කාර්යාල වේලාවන් තුළ දී වෛද්‍ය පහසුකම් සපයන ලද අතර සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් ලබා ගැනීමට පහසුකම් සලසන ලදී. 2021 අප්‍රේල් මාසයේ දී, වරලත් වාස්තු විද්‍යාඥ ඊ. ඒ. ටී. සුරේෂ් මහතා විසින් "ලස්සන නිවසක් සොදුරු කැදැල්ලක්" නමින් සේවා නියුක්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී.

කාර්යමණ්ඩලය වෙත කාර්යාල වේලාවන් තුළ දී ආපනශාලා පහසුකම් සැපයීම බාහිරින් ලබාගත් සේවා සපයන්නෙකු හරහා සිදු කරන ලදී. කාර්යමණ්ඩලයට සාධාරණ මිලකට ගුණාත්මක ආහාර පාන සැපයීම සහතික කිරීම සඳහා කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව ආපනශාලා කටයුතු නිරන්තරව අධීක්ෂණය කරන ලදී.

31. සංඛ්‍යාන

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේදී ද සිය මෙහෙයුම් කටයුතුවල ඵලදායී ලෙස නිරත වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු වන 'ආර්ථික සහ මිල ස්ථායීතාව' සහ 'මූල්‍ය පද්ධති ස්ථායීතාව' පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව දායකත්වය සපයන ලදී. වසංගත තත්ත්වය හේතු කොටගෙන පනවන ලද සංචරණ සීමා සහ වසර පුරා පැවති අභියෝගාත්මක සේවා පරිසරය මධ්‍යයේ වුව ද, සිය සේවා කටයුතු නවීන තාක්ෂණය භාවිත කරමින් සැලසුම් කළ පරිදි අඛණ්ඩව සිදු කිරීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවට හැකි විය.

31.1 සමීක්ෂණ පැවැත්වීම සහ දර්ශක සම්පාදනය කිරීම

(අ) ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණ

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක (PMI) පිළිබඳ සමීක්ෂණ, 2021 වසර තුළ දී ද මාසිකව සිදු කරන ලදී. මෙම සමීක්ෂණ නිෂ්පාදන, ඉදිකිරීම් සහ සේවා කටයුතු ආවරණය වන පරිදි ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාතේ කේන්ද්‍රගතව ඇති විශාල සමාගම් ඉලක්ක කොටගෙන සිදු කරනු ලබයි.

මෙම සමීක්ෂණ වලින් ලබාගන්නා තොරතුරු ආර්ථිකයේ අදාළ අංශයන්හි මාසික ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සඳහා මෙන්ම ආර්ථික වර්ධනය පුරෝකථනය කිරීමේ පූර්ව දර්ශක ලෙස ද භාවිත කරන ලදී. තවද, සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව කරන ලද විශ්ලේෂණ, ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියට යොදා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලදී. ආර්ථික විශ්ලේෂකයින්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ප්‍රයෝජනය සඳහා නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයන්හි ප්‍රතිඵල මාධ්‍ය නිවේදන මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සමීක්ෂණ ප්‍රතිඵල ව්‍යාපාර අංශයේ වෘත්තිකයන්, ආර්ථික විශ්ලේෂකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ඒ ඒ ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය සහ ආර්ථික තත්ත්වය තක්සේරු කිරීමේ දී බහුලව භාවිත කරනු ලැබේ.

ආර්ථිකයේ පවත්නා සහ අපේක්ෂිත ප්‍රවණතාවන් පිළිබඳව ආයතනික අංශයේ මතය විමසන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය (BOS) 2021 වසර තුළ දී ද කාර්තුමය වශයෙන් අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණය ආර්ථිකයේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා කටයුතු ආවරණය වන පරිදි මහා පරිමාණ ව්‍යවසායයන් ඉලක්ක කොට ගෙන සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණවල සමස්ත ප්‍රතිඵල සහ අනෙකුත් විශ්ලේෂණ මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලද අතර, සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංඛ්‍යාන ක්‍රමවේද භාවිත කරමින් ආර්ථික වර්ධනය පිළිබඳ පුරෝකථන සිදු කරන ලදී. තවද මෙම සමීක්ෂණයේ ප්‍රධාන දර්ශක සහ සාරාංශගත තොරතුරු, බාහිර පරිශීලකයින්ගේ දැන ගැනීම පිණිස කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

ණය වෙළඳපොලේ ඉල්ලුම් සහ සැපයුම් අංශවල ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින් ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය සහ ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය 2021 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය, ආර්ථිකයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක (SMEs) ඉලක්ක කර ගනිමින්, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සමඟ එක්ව වාර්ෂික සමීක්ෂණයක් ලෙස සිදු කරන ලදී. විශේෂයෙන් 2021 වසර තුළ පැවති වසංගත තත්ත්වය හමුවේ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක විසින් සිය මූල්‍යකරණ අවශ්‍යතා සපුරාගැනීමේ දී මුහුණ දුන් ගැටළු සහ අනෙකුත් ප්‍රවණතා හඳුනාගැනීම ද මෙම සමීක්ෂණය මගින් අපේක්ෂා කරන ලදී. මේ අතර, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂ බැංකු ආවරණය වන පරිදි ණය සැපයුම් වෙළඳපොළෙහි මෑත කාලීන ප්‍රවණතා සහ අනාගත අපේක්ෂා පිළිබඳව කාර්තුමය වශයෙන් අධ්‍යයනය කිරීමේ අරමුණින් ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය සිදු කරනු ලබයි. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ සහ ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන

ක්‍රියාවලියේ දී උපකාරී කරගන්නා ලද අතර, ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල බාහිර පරිශීලකයන්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සිල්ලර වෙළඳාම් අංශයේ ප්‍රවණතා කල්තියා හඳුනාගැනීමේ අරමුණින්, සාමාන්‍ය සිල්ලර වෙළඳාම් අංශය සඳහා 'සිල්ලර විකුණුම් පරිමා සමීක්ෂණය' මාසිකව ද, නවීන වෙළඳාම් අංශය සඳහා 'සුපිරි වෙළඳසැල්හි සිල්ලර වෙළඳ කටයුතු සමීක්ෂණය' කාර්තුමය වශයෙන් ද අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණ ප්‍රතිඵල අනුව සිල්ලර වෙළඳාම් අංශයේ විචලන කල්තියා හඳුනාගැනීමට හැකි විය. එමෙන්ම ප්‍රවාහන අංශයේ ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින්, ගොඩබිම් ප්‍රවාහන සේවා, ගුවන් ප්‍රවාහන සේවා, වරාය සේවා මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය හා ගබඩාකරණ සේවා ආවරණය කෙරෙන ප්‍රවාහන සේවා පිළිබඳ සමීක්ෂණය 2021 වසර තුළදී ද මාසික සමීක්ෂණයක් වශයෙන් අඛණ්ඩව සිදු කරන ලදී. තවද, තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (IT & BPM) අංශයට අදාළ 2021 වසරේ ප්‍රවණතා සහ 2022 වසර සඳහා වන අපේක්ෂා හඳුනා ගැනීමට ද සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම සමීක්ෂණවල ප්‍රතිඵල, විශේෂයෙන්ම ආර්ථික වර්ධනය පුරෝකථනය කිරීම ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර ආර්ථික විශ්ලේෂණ කටයුතු සඳහා භාවිත කරන ලදී.

කුටුම්භ අංශයේ, මාස හයකට පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව ආර්ථික තත්ත්වය, රැකියා ලබා ගැනීමේ හැකියාව, පවුලේ ආදායම, පවුලේ වියදම, ඉතුරුම් මට්ටම පිළිබඳ වත්මන් තත්ත්වය සහ එම විචල්‍ය පිළිබඳව ඉදිරි මාස හය සඳහා කුටුම්භ අංශයේ අපේක්ෂා අනාවරණය කර ගැනීම සඳහා මාර්ගගත සමීක්ෂණයක් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී ආරම්භ කරන ලදී. මහ බැංකුව විසින් පවත්වනු ලබන විවිධ මාර්ගගත වැඩසටහන් සඳහා ලියාපදිංචි වූවන්ගේ සංචිතයකින් අහඹු ලෙස තෝරා ගන්නා ලද නියැදියක් යොදා ගනිමින් සමීක්ෂණය සිදු කරන ලද අතර මාසිකව සමීක්ෂණ ප්‍රතිචාර 100 ක සාමාන්‍යයක් වාර්තා විය. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල භාවිත කරමින්, ජාත්‍යන්තර ක්‍රමවේදයකට අනුව, පාරිභෝගික විශ්වසනීයත්වය පිළිබඳ දර්ශකය (CCI) මාසිකව සම්පාදනය කරන ලද අතර, දර්ශකයේ සාරාංශගත වාර්තාවක් කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදී. ආර්ථිකය පිළිබඳ කුටුම්භ අංශයේ මතය කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිරියේ දී කාර්තුමය වශයෙන් වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

මූල්‍ය පද්ධති ස්ථායීතාවට අදාළ දර්ශක ලෙස, දේපල වෙළඳපොලේ වර්ධනයන් තක්සේරු කිරීම සඳහා 2021 වසරේ දී ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ඉඩම් තක්සේරු දර්ශකය (LVI) සම්පාදනය කිරීම සහ සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය (CMS) පැවැත්වීම අඛණ්ඩව සිදු කරන ලදී. කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් අර්ධ වාර්ෂික පදනමින් ඉඩම් තක්සේරු දර්ශකය (පදනම් කාලය: 2017 පළමු භාගය) සම්පාදනය කරන ලද අතර, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම් පර්චසයක් සඳහා ඇස්තමේන්තු කරන ලද අගයන් මත පදනම්ව, නේවාසික, වාණිජ සහ කාර්මික ඉඩම් වෙන් වෙන් වශයෙන් ආවරණය වන පරිදි සකස්කරනු ලබන උප දර්ශක තුනකින් මෙම ඉඩම් තක්සේරු දර්ශකය සමන්විත වේ. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මෙම අර්ධ වාර්ෂික, ඉඩම් තක්සේරු දර්ශකය පිළිබඳ තොරතුරු ඇතුළත් මාධ්‍ය නිවේදන දෙකක් මහජනතාවගේ දැනුවත් වීම උදෙසා 2021 වසරේ දී නිකුත් කරන ලදී.

සහාධිපත්‍ය අංශයේ වර්ධනයන් පිළිබඳ දත්ත එක්රැස් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද සහාධිපත්‍ය වෙළෙඳපොළ සමීක්ෂණය 2021 වසරේ දී කාර්තුමය පදනමින් අඛණ්ඩව පවත්වන ලදී. මෙම සමීක්ෂණය යටතේ ප්‍රධාන පෙලේ සහාධිපත්‍ය ඉදිකරන්නන්ගේ තථ්‍ය විකුණුම් මිල, ඉල්ලුම, මිල වෙනස්වීම් සඳහා හේතු, පවත්නා සහ ඉදිරියේ දී ඉදිවන නිවාස ඒකක සංඛ්‍යාව, එක් එක් ව්‍යාපෘතිවල දැනට වෙන් කරවාගෙන ඇති නිවාස ඒකක සංඛ්‍යාව සහ ගැණුම්කරුවන් පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. කොවිඩ්-19 වසංගතය සමඟ ඇතිවූ අහිතකර තත්ත්වයත් සමඟ, මූල්‍ය පද්ධති ස්ථායීතාව සම්බන්ධයෙන් මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම අංශයේ ඉදිරි පැවැත්ම පිළිබඳ තත්ත්වය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා සහාධිපත්‍ය ඉදිකරන්නන්ගේ ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු ද 2021 වසරේ දී රැස් කරන ලදී. 2020 වසරේ තුන්වන කාර්තුවේ සිට, මෙම සමීක්ෂණයේ ප්‍රතිඵලවල සාරාංශගත වාර්තාවක් මහ බැංකු නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණයේ තොරතුරු මත පදනම්ව, ප්‍රාථමික සහාධිපත්‍ය වෙළඳපොලේ මිල වෙනස්වීම් නිරීක්ෂණය කිරීම සඳහා කාර්තුමය දර්ශකයක් සම්පාදනය කරන ලදී. ඊට සමගාමීව, දේපළ වෙළඳාම් වෙබ් අඩවිවල දත්ත උපයෝගී කර ගනිමින් මාසික පදනමින් ද්විතීයික සහාධිපත්‍ය වෙළඳපොළ සඳහා දේපළ මිල දර්ශකයක් ද සම්පාදනය කරන ලදී. මීට අමතරව අන්තර්ජාල වෙළඳ දැන්වීම්වල දත්ත උපයෝගී කර ගනිමින් ඉඩම් සහ නිවාස සඳහා මිල දර්ශක සම්පාදනය කිරීම ද සිදු කරන ලදී. මෙම දර්ශක සම්පාදන ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා 2021 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහය ලබා ගැනීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

(ආ) උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

තෝරා ගත් ආර්ථික නියෝජිත කාණ්ඩ දෙකක, එනම් ආයතනික අංශයේ සහ කුටුම්භ අංශයේ, උද්ධමන අපේක්ෂා පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම සඳහා මාසිකව උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණය 2021 වසරේ දී ආයතනික අංශය සඳහා, විද්‍යුත් තැපෑල හරහා සිදු කළ අතර, කුටුම්භ අංශය සඳහා මාර්ගගත ක්‍රමයට අමතරව විද්‍යුත් තැපෑල හා දුරකථන මාර්ග හරහා සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතලේ, අනුරාධපුරය, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය සහ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශ තුළ පිහිටි තෝරාගත් රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන් පිරිසක් සම්බන්ධ කර ගනිමින් අදාළ ප්‍රාදේශීය කාර්යාලවල

සහය ද ඇතිව මෙම මාර්ගගත සමීක්ෂණ පවත්වන ලදී. තවද, උද්ධමනය සහ උද්ධමන අපේක්ෂාවන් පිළිබඳ කුටුම්භ අංශයේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සමීක්ෂණයට සහභාගීවූවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ ද පවත්වන ලදී. මීට අමතරව දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙලට අයත් ගුරු සමීක්ෂකවරුන්ගෙන් ද කුටුම්භ අංශය නියෝජනය කෙරෙන උද්ධමන අපේක්ෂා පිළිබඳ තොරතුරු මාසිකව එක් රැස් කරන ලදී. සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සලකා බැලීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

(ඇ) දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල

2021 වසරේ දී ද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල, ගුරු සමීක්ෂකවරු 53කගේ සහභාගිත්වයෙන් කොවිඩ්-19 වසංගත තත්ත්වය විසින් ඇතිකළ අභියෝග හමුවේ වුව ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ හරහා ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළ භාණ්ඩ පැසට සමාන භාණ්ඩ පැසක සිල්ලර මිල ගණන් මෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල නිෂ්පාදක මිල, අවිධිමත් අංශයේ සේවකයන්ගේ දෛනික වැටුප්, උද්ධමන අපේක්ෂා සහ තෝරා ගත් භාණ්ඩවල සිල්ලර විකිණුම් පරිමා පිළිබඳ දත්ත රැස් කළ අතර, එමගින් මහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා උපකාරී වන තත්කාලීන තොරතුරු ලබා දීමට හැකි විය. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළට අදාළ පරිගණක පද්ධතිය වැඩිදියුණු කරමින් වාර්තා ජනනය කිරීම සඳහා ටැබ්ලු (Tableau) මෘදුකාංගය දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ පරිගණක පද්ධතිය සමඟ සම්බන්ධ කරන ලද අතර දත්ත වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහය ඇතිව, ගුරු සමීක්ෂකවරුන් විසින් දත්ත එක්රැස් කිරීම පිළිබඳව එතැන් අධීක්ෂණ මෙන්ම දත්ත පිළිබඳව විතැන් අධීක්ෂණ සිදු කිරීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. තවද, ගුරු සමීක්ෂකවරුන්ගෙන් දත්ත රැස් කිරීමේ දී සිදු වන පොදු අඩුපාඩු පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම සහ දත්ත එකතු කිරීමේ ක්‍රියාවලියේ දී ඔවුන් මුහුණ දෙන ගැටළු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා පවත්වන වාර්ෂික සම්මන්ත්‍රණ, 2021 වසරේ දී මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. මීට අමතරව, පාරිභෝගික කටයුතු අධිකාරියේ ඉල්ලීම පරිදි, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ මිල දත්ත එක් රැස් කරනු ලබන අයිතම අතුරින් තෝරා ගත් අයිතමවල මිල ගණන් ඔවුන් වෙත සතිපතා ලබාදීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

මීට අමතරව ගුරුවරුන් නොවන දත්ත සමීක්ෂකවරුන් හරහා පිටකොටුව වෙළඳපොළ, මරදගහමුල සහල් වෙළඳපොළ, දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පැලියගොඩ මත්ස්‍ය වෙළඳසැල් වලින් තොග සහ සිල්ලර මිල ගණන්/තොරතුරු දෛනිකව එක් රැස් කරන ලදී. මෙම තොරතුරු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල වත්මන් මිල විචලන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකරණ තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා මෙන්ම උද්ධමනය පුරෝකථනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබයි. තවද, මෙම මිල දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව සාරාංශ වශයෙන් සකසනු ලබන වාර්තාවක් දෛනිකව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී. දත්තවල ගුණාත්මකබව සහ තත්කාලීනබව තහවුරු කරගැනීම සඳහා දත්ත සමීක්ෂකවරුන් විසින් දත්ත රැස්කරන ආකාරය පිළිබඳව එතැන් අධීක්ෂණ සිදු කිරීම මෙන්ම ඔවුන් විසින් එවනු ලබන දත්තවල නිරවද්‍යතාව පිළිබඳව නිරන්තර අධීක්ෂණයට ලක්කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මේ අයුරින් කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව පවත්වා ගැනීමට හැකිවිය.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සුපිරි වෙළඳසැල් තුනක වෙබ් අඩවි වලින් ලබාගත් ආහාර මිල ගණන් යොදා ගනිමින් පූර්ව දර්ශක (leading indicators), සකස් කළ අතර කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළ උද්ධමන පුරෝකථන වල නිරවද්‍යතාව වැඩි දියුණු කිරීමට එම දර්ශක යොදා ගන්නා ලදී. මෙහිදී කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අදාළ ආහාර පැසෙහි අඩංගු අයිතම වල මිල ගණන් දිනපතා අදාළ සුපිරි වෙළඳසැල්වල වෙබ් අඩවි වලින් ලබාගෙන ආහාර කාණ්ඩයේ සියලුම අයිතම සඳහා මාසික මිල වෙනස්වීම් ගණනය කරන ලද අතර, එය කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළව උද්ධමනය පුරෝකථනය කිරීම සඳහා පූර්ව දර්ශකයක් ලෙස භාවිත කරන ලදී.

(ඈ) රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය සහ ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු

රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ සියලුම ආයතන, එනම් මධ්‍යම රජය සහ පළාත් සභා යටතේ ඇති ආයතන ආවරණය වන පරිදි පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය 2021 වසරේ දී ද අඛණ්ඩව පවත්වන ලදී. මීට අමතරව, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව මෙන්ම අනෙකුත් දත්ත සපයන්නන්ගේ දත්ත සහ තොරතුරු මත පදනම්ව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රම බලකාය, සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණවලට අදාළව දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

තනතුර	ආයතනයේ නම	නිල නාමය/ තනතුර	පත් කිරීමේ ස්වභාවය (අදාළ පරිදි)	කාර්ය විශේෂීකරණය	පත් කිරීමේ දිනය (වර්ෂය/ මාසය/දිනය)	සේවා කාලය (වර්ෂය/ මාසය/දිනය සිට වර්ෂය/ මාසය/දිනය දක්වා)
පෙර තනතුර						
(i) අධ්‍යක්ෂභාවය						
(ii) වෙනත්						
වර්තමාන තනතුර						
(i) අධ්‍යක්ෂභාවය						
(ii) වෙනත්						

මේ හා සම්බන්ධව, බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ලේඛනමය සාක්ෂි පවත්වා ගෙන යා යුතු අතර, අධ්‍යක්ෂවරයාට අවශ්‍ය වූ විට එවැනි සාක්ෂි යොමු කළ යුතුය.

4 මුදල් ව්‍යාපාර පනත ප්‍රකාරව, 2021 අංක 05 දරන ආයතනික යහපාලන විධානය

5 බැංකුකරණය/ මූල්‍යය, ව්‍යාපාර/ පරිපාලනය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය/ විගණනය/ මුදල් විශ්ලේෂණය, ආයෝජනය කළමනාකරණය/ ප්‍රාග්ධන වෙළඳපොල, තොරතුරු තාක්ෂණය, ක්‍රමෝපායික සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය සහ නියාමනය සහ බලපත්‍රලාභී මුදල් සමාගමෙහි විධිනියෝගයට අනුව අලෙවිකරණය සහ නිශ්චිත සුදුසුකම්

5) ඉහත සඳහන් තොරතුරුවලට අමතරව, පහත දක්වා ඇති අමතර සුදුසුකම් මා සතු වග ප්‍රකාශ කර සිටිමි.

විශේෂ පැවරුම්/උපදේශක ධූරයන්	ආයතනයේ නම	විස්තරය	සේවා කාලය (වර්ෂය/ මාසය/දිනය) සිට (වර්ෂය/ මාසය/දිනය) දක්වා
(i)			
(ii)			
කැපී පෙනෙන දායකත්වයන් (ප්‍රකාශන, පවත්වන ලද සම්මන්ත්‍රණ, පර්යේෂණ ආදිය)			
පර්යේෂණයේ/ ප්‍රකාශනයේ මාතෘකාව		ආයතනය/ස්ථානය	වර්ෂය

6) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ එහි සම්බන්ධිත ආයතන (පාලිත[6], හවුල්කාර[6] සහ අනෙකුත් සමාගම්[7]), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ කොටස් හිමිකාරීත්වය දරන බව/ නොදරන බව ප්‍රකාශ කරමි.

ආයතනයේ/ ආයතනයන්හි නම	ඡන්දය අයිතිය ඇති/නැති	කොටස් ප්‍රමාණය		ප්‍රතිශතයක් ලෙස	
		සෘජු	වක්‍ර	සෘජු	වක්‍ර

7) ව්‍යාපාර ගනුදෙනු

7.1. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ එහි සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්) සහ වෙනත් සම්බන්ධිත පාර්ශවල බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ පත්වීමට පෙර ආසන්නතම වසර දෙක තුළ පහත සඳහන් ව්‍යාපාර ගනුදෙනු තවදුරටත් පවතින/ පවත්වාගෙන ගිය බව බව ප්‍රකාශ කරමි.

ආයතනයේ/ ආයතනයන්හි නම	ගනුදෙනුවේ දිනය (වර්ෂය/ මාසය/දිනය)	වර්ෂය/මාසය/දිනට මුදල් ප්‍රමාණය (රු. මිලි.)		වර්ගීකරණය (සක්‍රීය/ අක්‍රීය)	ඇප වර්ගය සහ වටිනාකම (රු. මිලි.)	බලපත්‍රලාභී මුදල් සමාගමේ මූලික ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස
		සීමාව	නොපියවූ ප්‍රමාණය			
ලබාගත් ණය						
(i) වර්තමාන						
(ii) පත්වීමට පෙර						
ආයෝජන[8]						
(i) වර්තමාන						
(ii) පත්වීමට පෙර						
තැන්පතු						
(i) වර්තමාන						
(ii) පත්වීමට පෙර						

8) සමීප ඥාතීන්ගේ පත්වීම්, කොටස් හිමිකාරීත්වයන් සහ ව්‍යාපාර ගනුදෙනු

8.1 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස වර්තමානයේ තනතුරු දරන සමීප ඥාතීන්ගේ පහත සඳහන් තොරතුරු ප්‍රකාශ කර සිටිමි.

සමීප ඥාතියාගේ නම	ආයතනයේ නම	දරන තනතුර

6. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය ප්‍රකාරව අනෙකුත් ආයතන සමඟ සෑහෙන සබඳතාවක් පවතින ආයතන වේ.
7. මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය ප්‍රකාරව වෙනත් සමාගම් කෙරෙහි සැලකිය යුතු උනන්දුවක් දක්වයි.
8 ණය උපකරණවල ආයෝජන

8.2 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ කිසියම් සමීප ඥාතියෙකු ඍජු හෝ වක්‍ර කොටස් හිමිකාරීත්වය පිළිබඳ පහත සඳහන් තොරතුරු ප්‍රකාශ කර සිටිමි.

සමීප ඥාතීයාගේ නම	ආයතනයේ/ ආයතනයන්හි නම	කොටස් ප්‍රමාණය		ප්‍රතිශතයක් ලෙස	
		ඍජු	වක්‍ර	ඍජු	වක්‍ර

8.3 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්) බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ පත්වීමට පෙර ආසන්නතම වසර දෙක තුළ පහත සඳහන් ව්‍යාපාර ගනුදෙනු මාගේ සමීප ඥාතීන් තවදුරටත් පවතින/ පවත්වාගෙන ගිය බව බව ප්‍රකාශ කරමි.

ආයතනයේ/ ආයතනයන්හි නම	ගනුදෙනුවේ දිනය (වර්ෂය/මාසය/දිනය)	වර්ෂය/මාසය/දිනට මුදල් ප්‍රමාණය (රු. මිලි.)		වර්ගීකරණය (සක්‍රීය/ අක්‍රීය)	ඇප වර්ගය සහ වටිනාකම (රු. මිලි.)	බලපත්‍රලාභී මුදල් සමාගමේ මූලික ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස
		සීමාව	නොපියවූ ප්‍රමාණය			
ලබාගත් ණය						
ආයෝජන[8]						

9) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක පොලීසියක, ඕනෑම නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක, වෘත්තිමය සංගමයක, විමර්ශන කොමිසමක, විනිශ්චය සභාවක හෝ නීතිය මඟින් ස්ථාපිත වෙනත් ආයතනයක වංචාවකට, රැවටීමකට, වංකභාවයකට හෝ ඒ හා සමාන අපරාධ කටයුත්තක් සම්බන්ධයෙන් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට මුහුණ දී සිටින බව/ මුහුණ දී නොසිටින බව ප්‍රකාශ කරමි.

10) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ඕනෑම අධිකරණයක, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක, වෘත්තිය සංගමයක, විමර්ශන කොමිසමක, විනිශ්චය සභාවක හෝ නීතිය මඟින් ස්ථාපිත වෙනත් ආයතනයක වංචාවකට, රැවටීමකට, වංකභාවයකට, නුසුදුසු හැසිරීමකට හෝ කිසියම් ව්‍යවස්ථාවකට හෝ රීතීන්ට, නියාමනයන්ට, විධානයන්ට හෝ නිර්ණායකයන්ට අනුකූල නොවීම ආදිය ඇතුළත් ඕනෑම ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදු කිරීම සම්බන්ධයෙන් පාර්ශවකරුවෙකු වූ බවට වැරදිකරුවෙකු වී ඇති බව/ නොමැති බව ප්‍රකාශ කරමි.

11) මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද අපරාධයක් හෝ දූරාචාරය සම්බන්ධ කිසියම් වරදක් සිදු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක අධිකරණයක වරදකරුවෙකු වී ඇති බව/ වී නොමැති බව ප්‍රකාශ කරමි.

12) මා නිදහස නොලත් බුන්වත්කරුවෙකු වන/ නොවන බවත්, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක බංකොලොත් ලෙසින් ප්‍රකාශ කර ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

13) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක දී, ඕනෑම මූල්‍ය වගකීම් සපුරාලීමට මා හට හැකියාව ඇති/නැති බව ප්‍රකාශ කරමි.

14) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක කිසියම් අධිකරණයක් විසින් ලබා දෙන ලද තීන්දුවක් හෝ නියෝගයක් සම්පූර්ණ කිරීමට අසමත් වී ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

15) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක කිසියම් නිසි අධිකරණ බලතල හිමි අධිකරණයක් විසින් මානසික ගැටලුවක් ඇති ලෙස ප්‍රකාශ කර ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

16) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත ආයතනයක අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී/ විධායක කාර්යයන් හි නියුතු නිලධාරියෙකු ලෙස කටයුතු කිරීම නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් විසින් අත්හිටුවීම හෝ වළක්වා ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

17) (i) බලපත්‍රය අත්හිටුවන ලද හෝ අවලංගු කරන ලද; හෝ

(ii) ගණන් බේරා වසන ලද හෝ ගණන් බේරා වසා දැමීමට නියමිත හෝ අනිවාර්යෙන් ඈවර කරන ලද;

ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ඕනෑම බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ වෙනත් ඕනෑම අධිකාරී තනතුරක් දරා ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

18) මාගේ තනතුරට අදාළව මුදල් ව්‍යාපාර පනතේ යෝග්‍යතාවය තක්සේරු කිරීමේ ප්‍රතිපාදනය පිළිබඳව මා දැනුවත් අතර, ඉහත තොරතුරු මාගේ දැනුම අනුව සත්‍ය සහ සම්පූර්ණ බව තහවුරු කරමි. ඉහත ලබා දී ඇති තොරතුරු හා සම්බන්ධ සියලුම පසු සිදුවීම්, හැකි විගසින් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත දන්වා සිටීමට ප්‍රතිඥා දෙමි.

19) මා, ඉහත තනතුර සඳහා පත් කිරීම කිසිඳු ලිඛිත නීතියකින් නොවළක්වන බව ප්‍රකාශ කර සිටිමි.

20) මා, මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රලාභී මුදල් සමාගමක ..... (තනතුර) සඳහා නම් කිරීමට, තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට යෝග්‍ය පුද්ගලයෙකු බව මාගේ උපරිම දැනුමට අනුව ප්‍රකාශ කරමි.

මෙහි ඇතුළත් සියලු ප්‍රකාශයන් (සන්තකකරු /ප්‍රකාශක) හට කියවා දීමෙන් ද, ඒවායේ අන්තර්ගත කරුණු ඔහු/ඇය විසින් වටහා ගැනීමෙන් සහ ඒවා සත්‍ය බව පිළිගැනීමෙන් ද අනතුරුව ..... (වර්ෂය, මාසය) ..... දින දී ..... හී දී අත්සන් තැබූ බව සහතික කරමි.

මා ඉදිරිපිට දී

....

අදාළ පරිදි මුද්දර අලවන්න

දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකාර

දෙවන කොටස - සමාගම් ලේකම් විසින් සම්පූර්ණ කළ යුතු වේ.

1. ආයතනික තොරතුරු

අධ්‍යක්ෂවරුන් සඳහා නාමයෝජනා කමිටුවේ/පත් කිරීමේ අධිකාරියේ නිර්දේශය	
තක්සේරු කිරීමේ නිර්ණායක නාමයෝජනා කමිටුව/ පත් කිරීමේ අධිකාරිය විසින් සලකා බලන ලද විශේෂිත දැනුම/ කුසලතා සඳහන් කරන්න.	
නිර්දේශ නාමයෝජනා කමිටුවේ/පත් කිරීමේ අධිකාරියේ සම්මත / තීරණය කිරීමේ වාර්තා අමුණන්න.	

2. අධ්‍යක්ෂ මණ්ඩලයේ සටහන්

(i) ඉහත සඳහන් තොරතුරු සම්බන්ධයෙන් වෙනත් පැහැදිලි කිරීමක්/ තොරතුරු.

(ii) බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලදී/ ..... (වර්ෂය/මාසය/දිනය) දින පැවැත්වුණු රැස්වීමේ දී, ඉහත සඳහන් නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම / යෝජිත නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

නම:

සමාගම් ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය:

බලපත්‍රලාභී මුදල් සමාගම් හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් විසින් යොමු කළ යුතු දිවුරුම් ප්‍රකාශය නිසි අයුරින් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම්හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයින් විසින් යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් සහ නිවැරදි තොරතුරු ලබා දීම තහවුරු කිරීම සඳහා මෙම උපදෙස් මාලාව නිකුත් කරන ලදී.

1. **දිවුරුම් ප්‍රකාශය ලබා ගැනීමේ අරමුණ**

(i) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම්හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයින්ගෙන් දිවුරුම් පෙත්සම් ලබා ගැනීමේ අරමුණ වනුයේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන ප්‍රකාරව ඔවුන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම වේ. ඒ අනුව, ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා

සුදුසුකම්, අත්දැකීම්, අවංකභාවය සහ මුදල් ව්‍යාපාර පනතේ නිශ්චය කර ඇති අනෙකුත් අවශ්‍යතා සමඟ අනුකූල වීම පරීක්ෂා කිරීම සඳහා සවිස්තරාත්මක තොරතුරු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය වේ. ගැටලුකාරී තත්ත්වයක දී මෙම දිවුරුම් ප්‍රකාශය නීත්‍යානුකූලව බලපැවැත්වෙන ලේඛනය වේ.

2. දිවුරුම් ප්‍රකාශය

(i) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද ආකෘතිය අනුව නව ලේඛනයක් ලෙස දිවුරුම් ප්‍රකාශය සකස් කිරීම වඩාත් සුදුසු වන අතර එමගින් අනවශ්‍ය වචන ඇතුළත් කිරීම වළක්වා ගත හැක. කෙසේ වුවද, ලබා දී ඇති ආකෘතිය සම්පූර්ණ කළේ නම්, සියලු වෙනස්කම්, මකා දැමීම් සහ පේළි අතර ලිවීම් ආදිය එකී සංශෝධනයන් කළ සැනින්, දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් අත්සන තැබිය යුතු වේ.

(ii) සියලුම හිස්තැන් නිසි අයුරින් සම්පූර්ණ කළ යුතු වේ.

(iii) නිලධාරියාගේ ආගම අනුව සුදුසු වචන භාවිත කළ යුතු වේ. නිලධාරියා විසින් ඔහුගේ/ඇයගේ ආගම හෙළි කිරීමෙන් වැළකී සිටින්නේ නම්/ විරෝධය පාන්නේ නම්,

අ) ඔහු/ඇය අදේව දෘශ්ටිකයෙකු බව හෝ දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් නොවන ආගමකට අයත් වන බව; හෝ

ආ) ඔහු/ඇය විසින් ආගම හෙළි කිරීමට විරෝධයක් දක්වන බව;

සඳහන් කරමින් අදාළ නිළධාරියා විසින් තහවුරු කිරීමක් යොමු කළ යුතු වේ.

(iv) අනවශය වචන(ය) කපා හරින්න. අනවශ්‍ය වචන කපා හැර ඇත්නම්, එවැනි සංශෝධනයක් කළ සැනින් දිවුරුම් කොමසාරිස්වරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් අත්සන තැබිය යුතු වේ.

(v) අදාළ පුද්ගලයා විදේශිකයෙකු සහ විදේශ රටක සිට දිවුරුම් ප්‍රකාශයට අත්සන් තැබුවේ නම්:

අ) ඔහු අත්සන තැබූ රටේ දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු හෝ ඒ හා සමාන බලතල හිමි තැනැත්තෙකු විසින් අදාළ පුද්ගලයාගේ අත්සන සහතික කළ යුතු වේ.

ආ) අදාළ ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා වාසය කරන රටේ ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික හෝ කොන්සියුලර් නිලධාරියෙකු ඉදිරිපිට දී හෝ එවැනි රටක ක්‍රියාත්මක වන නීති ප්‍රකාරව සහතික කිරීම කළ යුතු වේ.

(vi) අදාළ වේ නම්, දිවුරුම් ප්‍රකාශය අත්සන් කරන දිනට අදාළ වටිනාකම අනුව මුද්දරයක් ඇලවිය යුතු වේ.

(vii) 'මා ඉදිරිපිට දී' අදාළ පුද්ගලයා අත්සන තැබූ සැනින් දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කළ යුතු වේ.

(viii) දෙවන කොටස සමාගම් ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතු අතර, අදාළ පත්වීම සම්බන්ධයෙන් නාමයෝජනා කමිටුවේ/ පත් කිරීමේ අධිකාරියේ යෝජනාවේ/ තීරණයේ පිටපතක් අමුණන්න.

(ix) දෙවන දෙවන කොටසේ 2(1) අයිතමය සඳහා දැක්වීමට අදහස් නොමැති නම්, එහි, අදාළ නැත/ නැත/ කිසිවක් නැත ලෙස සඳහන් කරන්න.

සිව්වැනි කොටස

සිව්වැනි කොටස

2021 වසරේ දී සම්මත කරන ලද මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ ප්‍රධාන නීති අණපනත්[අ]

පිටුව

1.	2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත	1
2.	2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත	28
3.	2021 අංක 17 දරන 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත	28
4.	2021 අංක 18 දරන මුදල් පනත	31
5.	2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත	39
6.	2021 අංක 23 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත	106
7.	2021 අංක 26 දරන විසර්ජන (සංශෝධන) පනත	106
8.	2021 අංක 28 දරන සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත	107
9.	2021 අංක 29 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත	113
10.	2021 අංක 30 දරන විසර්ජන පනත	113

(අ) මහ බැංකු වාර්ෂික වාර්තාවේ සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලද පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙහි පාඨ බලපැවැත්විය යුතු ය.

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත

[සහතිකය සටහන් කළේ 2021 මැයි මස 27 වන දින]

විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ කලාපය තුළ සහ එහි සිට ව්‍යාපාර සහ වෙනත් ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා ලියාපදිංචි කිරීම, බලපත්‍ර දීම, බලය ලබාදීම සහ වෙනත් අනුමතයන් ලබා දීම සඳහා බලය ඇති කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; ඒ කලාපය තුළ ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම සඳහා ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නකු හඳුනා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඒ කලාපය තුළ ක්‍රමෝපායික වැදගත්කමක් ඇති ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් සහ වෙනත් නිදහස් කිරීම් නිශ්චය කොට ප්‍රදානය කිරීම සඳහා ද; විධිවිධාන සලස්වා ඇති ආකාරයට, ඒ කලාපය තුළ පිහිටා ඇති රජයේ අලෙවි කළ හැකි ඉඩම් සහ ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් සහ පරිශ්‍රයන් සහ සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් ගනුදෙනුවලට එළඹීමට ද; ඒ කලාපය තුළ ජාත්‍යන්තර වෙළඳාම, නාවික ප්‍රවර්ධන මෙහෙයුම්, අක්වෙරළ බැංකු කටයුතු සහ මූල්‍ය සේවාවන්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීම, සංස්ථාපිත මූලස්ථානයේ මෙහෙයුම්, කලාපීය බෙදාහැරීමේ මෙහෙයුම්, සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ වෙනත් සේවාවන් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා ද; ඒ කලාපය තුළ ජාත්‍යන්තර ආරාවුල් නිරාකරණය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ද; ඒ කලාපය තුළ නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම සහ නේවාසික ප්‍රජාවක් පදිංචි කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ජාතික යහපත පිණිස රජයේ සහ පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු සම්බන්ධීකරණය කරන අතරතුර, රජයේ සහ පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු මගින් රට සීඝ්‍රයෙන් සංවර්ධනය කිරීම සහතික කරනු ලැබිය යුතු බවට නියම කරන්නා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැබ්ව ඇති රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සාක්ෂාත් කර ගැනීම පිණිස, මූලික වශයෙන් ම සේවා ආර්ථිකය විවිධාංගීකරණය කිරීම උදෙසා පහසුකම් සැලසීම සඳහා ඒ කලාපය තුළට විදේශ විනිමය ගලා ඒම ප්‍රවර්ධනය කිරීම සඳහා කාර්මික, වෘත්තීමය සහ ව්‍යවසායකත්ව නිපුණතාව වර්ධනය කිරීමට පහසුකම් සලසන අතරම ඒ කලාපය තුළ නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම සම්බන්ධයෙන් සහ නේවාසික ප්‍රජාවක් පදිංචි කිරීම මගින් ඒ කලාපය තුළ නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් පහසුකම් සැලසීම පිණිස නව ආයෝජන ආකර්ෂණය කරගනු ලබන, ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ඇති, විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීමට අවශ්‍ය බව ශ්‍රී ලංකා රජය විසින් සැලකිල්ලට ගෙන ඇති හෙයින් ද;

ජාතික යහපත හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සැලකිල්ලට ගෙන, ජාත්‍යන්තර වෙළඳාම, නාවික ප්‍රවර්ධන මෙහෙයුම්, අක්වෙරළ බැංකු කටයුතු සහ මූල්‍ය සේවාවන්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීම, සංස්ථාපිත මූලස්ථානයේ මෙහෙයුම්, කලාපීය බෙදාහැරීම් මෙහෙයුම්, සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ වෙනත් සේවාවන් ඇතුළු ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා ඒ කලාපය තුළ විශේෂිත යටිතල පහසුකම් සහ වෙනත් පහසුකම් ඇති ජාත්‍යන්තර ව්‍යාපාර සහ සේවා කේන්ද්‍රස්ථානයක් වන "කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීමට අවශ්‍ය වී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සහ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පිහිටුවීම

2. (මෙහි මින්මතු "කොළඹ වරාය නගරය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවනු ලැබිය යුතු ය. මෙහි පිහිටුවනු ලබන කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය, මේ පනතේ I වන උපලේඛනයේ දක්වා ඇති මායිම්වලින් සමන්විත වන්නේ ය.

3. (1) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරන ව්‍යාපාර සහ වෙනත් මෙහෙයුම් හා සම්බන්ධ සියලු කාරණා මේ පනතේ දක්වා ඇති ආකාරයට පරිපාලනය කිරීම, නියාමනය කිරීම හා පාලනය කිරීම භාර (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය යටතේ එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවට, මේ පනතේ දක්වා ඇති අරමුණු ද බලතල, කාර්ය සහ කර්තව්‍ය ද ඇත්තේ ය.

(4) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන්නා වූ සියලු ප්‍රජා රීති පිළියෙල කිරීම, සැකසීම, සංශෝධනය කිරීම, යාවත්කාලීන කිරීම, පළ කිරීම සහ බලාත්මක කිරීම, සහ පහසුකම් සැලසීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වගකිව යුතු ය.

(5) කොමිෂන් සභාව විසින්, එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, යම් නියාමන අධිකාරියකට අදාළ වන ලිඛිත නීති මගින් එසේ කිරීමට නියම කර ඇති අවස්ථාවක, ඒ නියාමන අධිකාරිය සතු හෝ ඊට පවරනු ලැබ ඇති විෂයයන් සම්බන්ධයෙන් මේ පනතේ නිශ්චිතව විධිවිධාන සලස්වා ඇති තාක් දුරට ඒ අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ලබා ගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉල්ලා සිටිනු ලබන අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය, ඒ නියාමන අධිකාරියට අදාළ වන ලිඛිත නීති කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය ඇතුළත කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සීමා විය යුතු ය.

(6) කොමිෂන් සභාව විසින් ඒ එකඟත්වය ඉල්ලා සිටිනු ලබන්නේ යම් අදාළ නියාමන අධිකාරියකින් ද, ඒ අදාළ නියාමන අධිකාරිය විසින්, අවස්ථානුගත කරුණු අනුව ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, ප්‍රමුඛත්වය ලබා දිය යුතු කාරණයක් ලෙස සලකා, එහි තීරණය කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

4. (1) ජනාධිපතිවරයාගේ හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ප්‍රධාන සැලැස්ම, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සියලු කලාපකරණය සහ වෙනත් භෞතික සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු පදනම විය යුතු ය.

(2) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට කරගෙන යනු ලබන ව්‍යාපාරවල වැඩිදියුණුව සහතික කිරීම සඳහා, ව්‍යාපෘති සමාගම විමසා සහ ජනාධිපතිවරයාගේ හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කොමිෂන් සභාව විසින්, ජාතික යහපත හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස එහි ශක්‍යතාව අනුව ප්‍රධාන සැලැස්මට කිරීමට අවශ්‍ය යයි සලකනු ලබන යම් සංශෝධන වේ නම්, ඒ සංශෝධන හඳුනාගනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන සැලැස්ම සහ මේ පනත ප්‍රකාරව සාදනු ලැබිය යුතු සංවර්ධන පාලන නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීමේ වගකීම කොමිෂන් සභාවට පවරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දැක්වෙන වාර්ෂික ප්‍රගති වාර්තාවක් ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින්, ව්‍යාපෘති සමාගම විමසා ප්‍රධාන සැලැස්මට කරනු ලැබිය යුතු යම් ප්‍රතිශෝධනයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ, ඒ වාර්ෂික ප්‍රගති වාර්තාව සමඟ, ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) ජාතික යහපත හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීමට අවශ්‍ය වේ නම්, ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ සාමාන්‍ය හෝ විශේෂ විධාන කොමිෂන් සභාව වෙත ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි ය.

II වන කොටස

කොමිෂන් සභාවේ අරමුණු සහ බලතල, කාර්ය සහ කර්තව්‍ය

5. කොමිෂන් සභාවේ අරමුණු-

(අ) කොළඹ වරාය නගරය, කලාපයේ ප්‍රමුඛ විශේෂ ආර්ථික කලාපයක් සහ ආකර්ෂණීය ආයෝජන මධ්‍යස්ථානයක් බවට ප්‍රවර්ධනය කිරීම;

(ආ) රට තුළට සෘජු විදේශ ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම;

(ඇ) සුරක්ෂිත සහ හිතකර ව්‍යාපාරික පරිසරයක් ඇති කිරීම සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව සඳහා පහසුකම් සැලසීම සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළ ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය කලාපයේ වෙනත් ආකර්ෂණීය ආර්ථික කලාපවලට සමාන මට්ටමකින් පවත්වාගෙන යාමට වගබලා ගැනීම සඳහා ප්‍රයත්න දැරීම;

(ඈ) ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා එහි ව්‍යාපාරික මෙහෙයුම් සහ පරිපාලනය කාර්යක්ෂම ලෙස, විශ්වසනීය ලෙස සහ පාරදෘශ්‍ය ලෙස සිදු කිරීමේ පහසුව සහතික කිරීම;

(ඉ) ජාත්‍යන්තර වෙළඳාම, නාවික ප්‍රවර්ධන මෙහෙයුම්, අක්වෙරළ බැංකු කටයුතු සහ මූල්‍ය සේවාවන්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීම, සංස්ථාපිත මූලස්ථානයේ මෙහෙයුම්, කලාපීය බෙදාහැරීමේ මෙහෙයුම්, සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ වෙනත් සේවාවන් තුළ ගෝලීය සහ කලාපීය ආයෝජන සිදු කිරීම දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඊ) නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ වර්ධනය කිරීම;

(උ) තීරු බදු රහිත සාප්පු, විනෝදාත්මක කටයුතු සහ ඒ හා සමාන වෙනත් පහසුකම් සැලසීම මඟින් සංචාරක කටයුතු සහ ඒ හා සම්බන්ධ සේවාවන් ප්‍රවර්ධනය කිරීම;

(ඌ) රැකියා අවස්ථා ඇති කිරීම;

(එ) තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම; සහ

(ඒ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ නේවාසික ප්‍රජාවක් පදිංචි කරවීම මඟින් නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම,

විය යුත්තේ ය.

6. (1) කොමිෂන් සභාව විසින්, ජාතික යහපත හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා, පහත දක්වා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය:-

(අ) මේ පනත ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල යෙදීම සඳහා ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් සහ වෙනත් අනුමතයක් නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම සහ ව්‍යාපාර සහ ආයෝජන සඳහා පහසුකම් සැලසීම;

(ආ) අදාළ නියාමන අධිකාරීවල එකඟත්වය ඇතිව, මේ පනත ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරන සියලු ආයෝජන සහ ව්‍යාපාර සම්බන්ධයෙන් වන නියාමන අධීක්ෂණය සහ පාලනය සඳහා පහසුකම් සැලසීම සහ එය ක්‍රියාත්මක කිරීම:

එසේ වුව ද, අදාළ නියාමන අධිකාරියෙන් ඉල්ලා සිටිනු ලබන ඒ එකඟත්වය, ඒ අධිකාරියට අදාළ වන ලිඛිත නීති කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය ඇතුළත කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සීමා විය යුතු ය;

(ඇ) මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද රජයේ අලෙවි කළ හැකි ඉඩම් බද්දට දීම;

(ඈ) මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම්, ඒ ඉඩම්වලට අදාළ ප්‍රධාන බදු දරන්නා වූ ව්‍යාපෘති සමාගම සමඟ එක්ව බද්දට දීම;

(ඉ) මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද රජයේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස් අවස්ථාවෝචිත පරිදි, අදාළ ආයෝජකයා හෝ සංවර්ධකයා සමඟ එක්ව බදු දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම;

(ඊ) මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස් ඒ ඉඩම්වල ප්‍රධාන බදු දරන්නා වූ ව්‍යාපෘති සමාගම සමඟ එක්ව බදු දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම;

(උ) ආයෝජකයන් සඳහා වන එකම සම්බන්ධීකාරකයා වෙමින් ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නා ලෙස කටයුතු කිරීම සහ අදාළ නියාමන අධිකාරියට අදාළ වන ලිඛිත නීති මඟින් නියම කරනු ලබන අවස්ථාවක, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරවල නිරත වීම සඳහා අවශ්‍ය වන සියලු ලියාපදිංචි කිරීම්, බලපත්‍ර, බලය ලබාදීම් සහ වෙනත් අනුමතයන් ඉක්මණින් ලබා දීමට පහසුකම් සැලසීම සහ ඒවා ඉක්මණින් නිකුත් කිරීම මඟින් ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම:

(ඌ) ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නා ලෙස කටයුතු කරමින්, මේ පනතේ VI වන කොටස ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරවල නිරත වීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන යෝජනා ඇගයීම, ඒ සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, අනුමත කිරීම හෝ මේ පනතේ දක්වා ඇති පරිදි අනුමතයන් සඳහා පහසුකම් සැලසීම ;

(එ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සංවර්ධන කටයුතුවල නිරතවීම සඳහා ද ව්‍යාපාර, සාප්පු සවාරි, සුදු ක්‍රීඩා කටයුතු ඇතුළු විනෝදාස්වාද ක්‍රියා සහ වෙනත් යම් පහසුකම් ක්‍රියාත්මක කිරීම සඳහා ද වාණිජමය නේවාසික පහසුකම්වල භුක්තිය ලබා ගැනීම සඳහා ද අවශ්‍ය විය හැකි වෙනත් සියලු අවසරපත්‍ර, නිෂ්කාශන, වැඩ කිරීමේ අවසරපත්‍ර සහ වෙනත් යම් අනුමතයන් සැලසුම් කිරීම, නිකුත් කිරීම සහ ඊට අනුකූලව කටයුතු කර ඇත්ද යන්න අධීක්ෂණය කිරීම;

(ඒ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අවශ්‍ය විය හැකි පරිදි පාරිසරික ප්‍රමිතීන් සකස් කිරීම සහ අනුමත කිරීම සහ පාරිසරික සංවර්ධනයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම:

(ඔ) ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි යම් විධානවලට යටත්ව සහ ප්‍රධාන සැලැස්මට සහ නියම කරනු ලැබිය හැකි සංවර්ධන පාලන නියෝගවලට අනුකූලව, (මේ පනතේ Xවන කොටසේ විධිවිධානවලට අනුකූලව සහාධිපත්‍ය කොටස් ඉදිකිරීම ද ඇතුළුව) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු, ක්‍රියාකාරකම් සහ සේවාවන් සිදු කරන බවට වගබලා ගැනීම;

(ඕ) එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටුකිරීමේ දී අවශ්‍ය විය හැකි පරිදි, යම් තැනැත්තකු සමඟ ගිවිසුම්වලට එළඹීම;

(ක) එහි අරමුණු ඉටු කර ගැනීම සහ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සහ ව්‍යාපාර මධ්‍යස්ථාන, නියාමකයන් සහ වෙනත් මණ්ඩල, ආයතන, සංවිධාන සහ තැනැත්තන් සමඟ සහයෝගීව කටයුතු කිරීම සහ ඔවුන් සමඟ ගිවිසුම්වලට එළඹීම;

(ග) කොමිෂන් සභාව විසින් කෙළින්ම හෝ දේපළ කළමනාකරු මඟින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන උපකාරක සේවාවන් සහ පහසුකම් සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ගාස්තු අය කිරීම සහ වෙනත් අය කිරීම් සිදු කිරීම;

(ච) කොමිෂන් සභාව විසින් හෝ දේපළ කළමනාකරු මඟින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන යම් සේවාවක් හෝ පහසුකමක් සම්බන්ධයෙන් කොන්දේසි හෝ නියමයන් පැනවීම සහ විධාන නිකුත් කිරීම;

(ජ) නියම කරනු ලැබිය යුතු යම් අනුප්‍රමාණ මත, මේ පනතින් බලය දෙනු ලබන පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන දේශීය තක්සේරු වරිපනම් සහ වෙනත් අය බදු හඳුනා ගැනීම;

(ට) නියම කරනු ලැබිය හැකි නියම, කොන්දේසි සහ කාර්ය පටිපාටිවලට යටත්ව, බලයලත් තැනැත්තන් විසින්, නම් කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදලකින් වෙළඳ කටයුතු සිදු කිරීම සඳහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යම් ව්‍යාපාර වස්තු, වටිනා ලෝහ හෝ භාණ්ඩ හුවමාරුවක් හෝ වෙළඳපළක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ඩ) බලයලත් තැනැත්තකු ලෙස ලියාපදිංචි වීම සඳහා යම් සමාගමක් හෝ තැනැත්තකු විසින් කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි ලේඛන හෝ තොරතුරු ඉල්ලා සිටීම;

(ණ) බලයලත් තැනැත්තකුගේ ඉල්ලීම පරිදි යම් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් යම් අනුමතයක් සංශෝධනය කිරීම, මාරු කිරීම, පැවරීම, අලුත් කිරීම හෝ ආපසු භාර දීම පිළිගැනීම;

(ත) බලයලත් තැනැත්තකු විසින් සැලකිය යුතු පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද යම් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ අනුමතයක් සංශෝධනය කිරීම, අවලංගු කිරීම, අත්හිටුවීම හෝ අහෝසි කිරීම;

(ද) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වීම සඳහා, නියම කරනු ලැබිය හැකි සියලු ප්‍රජා රීති පිළියෙල කිරීම, සැකසීම, සංශෝධනය කිරීම, යාවත්කාලීන කිරීම, පළ කිරීම සහ බලාත්මක කිරීම සහ සංවර්ධන පාලන නියෝග බලාත්මක කිරීම;

(න) මේ පනත ප්‍රකාරව නියම කරනු ලැබිය යුතු යයි නියමිත කාරණා සම්බන්ධයෙන් නියෝග සම්පාදනය කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ප) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ විය යුතු, කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිසි පරිදි පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය විය හැකි මේ පනතේ දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් රීති සහ සංග්‍රහ සෑදීම සහ කාර්යපටිපාටි සහ ප්‍රමිති නිශ්චිතව දැක්වීම සහ විධාන සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(බ) මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි, බලයලත් තැනැත්තකු සම්බන්ධයෙන් වන යම් වාණිජ ආරවුලක් ඉක්මනින් විසඳා ගැනීම සඳහා පහසුකම් සැලසීම;

(ම) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සෑදීමට අදාළ නිර්දේශ ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ය) ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටින පරිදි, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළ යම් නිශ්චිත කාරණයක් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කිරීම;

(අඅ) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා, කොමිෂන් සභාවේ මෙහෙයුම්, ආදායම් සහ වියදම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත සහ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ආඅ) ජනාධිපතිවරයා හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විමසා, අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම, ඉවත් කිරීම සහ ඔහු සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ වැටුප් සහ වෙනත් යම් දීමනා ද ඇතුළු ඔහුගේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කොමිෂන් සභාවේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවීම;

(ඇඅ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඔවුන්ගේ වැටුප්, වේතන සහ වෙනත් යම් දීමනා ද ඇතුළු ඔවුන්ගේ සේවා නියම සහ කොන්දේසි නිශ්චය කිරීම;

(ඈඅ) ජනාධිපතිවරයා හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විමසා, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ ප්‍රමාණයට, කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි විශේෂඥයන් හෝ උපදේශකවරයන් සේවයේ යෙදවීම සහ කොමිෂන් සභාවේ අරමුදලෙන් ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම;

(ඉඅ) කොමිෂන් සභාවේ මෙහෙයුම් හෝ පරිපාලනමය කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් කාර්යාලයක් සහ වෙනත් ස්ථානයක් කොමිෂන් සභාවේ නමින් දැරීම, බද්දට හෝ කුලියට ගැනීම;

(ඊඅ) මේ පනත ප්‍රකාරව නියම කරනු ලැබිය හැකි නියෝගවලට යටත්ව, කොමිෂන් සභාවේ අරමුදල කළමනාකරණය කිරීම, ආයෝජන කිරීම, බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ අරමුදල් ණයට ගැනීම සහ කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය අනුමත කිරීම සහ කළමනාකරණය කිරීම;

(උඅ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිදු කරන සුදු ක්‍රීඩා කටයුතු නියාමනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවල ඒ කටයුතු කළමනාකරණය කිරීම සඳහා නියෝග සෑදීම;

(ඌඅ) සහාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ බද්ධ නිවාස අයිතිකම් යන විෂයයන් හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කර්තව්‍යයක් 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාර සංස්ථාගත කොට, මේ පනතේ 59 වන වගන්තිය ප්‍රකාර දේපළ කළමනාකරු යනුවෙන් නම් කරන ලද සමාගමට පැවරීම හෝ භාර කිරීම; සහ

(එඅ) සාමාන්‍යයෙන් මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු, කොමිෂන් සභාවට ලබා දෙන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් අනුභූතික වූ හෝ ආනුෂංගික වූ වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා කොළඹ වරාය නගරයට අදාළ ප්‍රවර්ධන කටයුතුවල නිරත වන විට දී, ඒ ප්‍රවර්ධන කටයුතුවලට අදාළ වාර්තා චිත්‍රපට සැකසීමේ දී, එහි අන්තර්ගතය පිළියෙල කිරීමේ දී, එය නිර්මාණය කිරීමේ දී සහ තොරතුරු තාක්ෂණ සහාය ලබා ගැනීමේ දී ඒ තුළ හැකිතාක් දුරට දේශීය අන්තර්ගතයක් ඇති බවට ද දේශීය කුසලතාවල සහ නිපුණතාවල සහභාගීත්වයක් ඇති බවට ද කොමිෂන් සභාව විසින් වගබලා ගත යුතු ය.

III වන කොටස

කොමිෂන් සභාවේ සංයුතිය සහ එහි කටයුතු පරිපාලනය සහ කළමනාකරණය

7. (1) කොමිෂන් සභාව, කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුළුව බහුතරය ශ්‍රී ලාංකිකයන් වන බවට සහතික වෙමින්, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පස් දෙනෙකුට නොඅඩු වූ ද හත් දෙනෙකුට නොවැඩි වූ ද සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය. ඒ පත්වීම් සිදු කිරීමේ දී, ඒ සාමාජිකයන් සතුව, ආයෝජනය, මූල්‍ය, නීතිය, තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපාර හෝ ගිණුම්කරණය යන ක්ෂේත්‍රවල අදාළ දැනුම, නිපුණත්වය සහ පළපුරුද්ද සහ ජාතික හෝ ජාත්‍යන්තර පිළිගැනීම ඇති බවට වගබලා ගැනීම සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කරනු ලැබිය යුතු ය. ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීමේ දී, කොමිෂන් සභාවේ සංයුතියෙන්, අදාළ දැනුම, නිපුණත්වය සහ පළපුරුද්ද සහ ජාතික හෝ ජාත්‍යන්තර පිළිගැනීම නියෝජනය වන බවට වගබලා ගැනීම සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කරනු ලැබිය යුතු ය.

8. කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් මියයාම, ඉල්ලා අස්වීම හෝ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ඉවත් කිරීම හේතුවෙන් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, ඔවුන් පත් කරනු ලබන දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු ය.

9. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයන් මෙහි (3) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කර ඇත්නම් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(2) කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයකු විසින් තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිඛිත සන්නිවේදනයක් මඟින් සිය ධුරයෙන් ඉල්ලා අස් වනු ලැබිය හැකි අතර, ජනාධිපතිවරයා විසින් හෝ ඒ අමාත්‍යවරයා විසින් ඒ ඉල්ලා අස්වීම භාර ගනු ලැබීමෙන් පසු ඒ ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින්-

(අ) රෝගාතුර වීම හේතුවෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු සිය ධුරයේ කාර්ය ඵලදායක ලෙස ඉටු කිරීමට නොහැකි වන්නේ නම්, ලිඛිත දැන්වීමක් මඟින්;

(ආ) සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු එසේ පත් කරනු ලැබූ දින සිට නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වස්තුභංගත්වයට පත්ව ඇති බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් හෝ අපරාධ වරදක් සඳහා වරදකරුවකු කරනු ලැබ ඇත්නම්, වහාම ක්‍රියාත්මක වන පරිදි; හෝ

(ඇ) කරන ලද කරුණු ඉදිරිපත් කිරීම් පිළිබඳ සලකා බැලීමෙන් පසුව, සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු වංචාව, බරපතළ විෂමාචාරය හෝ දැඩි නොසැලකිල්ල සම්බන්ධයෙන් වරදකරුවකු වන බවට ද ඒ හේතුවෙන් ඔහු වහාම ක්‍රියාත්මක වන පරිදි ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු බවට ද තමා සෑහීමට පත් වේ නම්,

ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ සාමාජිකයකු ධුරය හිස් කරනු ලැබූ විට, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ජනාධිපතිවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා එකී ධුරය හිස් කරනු ලැබූ සභාපතිවරයා හෝ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතුය.

(5) රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයකු සැලකිය යුතු කාලයක් සිය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා නොපැමිණෙන කාලය තුළ ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා ලෙස කටයුතු කිරීමට ජනාධිපතිවරයා විසින් වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

10. (1) කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකු විය යුතු ය. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් එහි රැස්වීම්වල මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා කොමිෂන් සභාවේ යම් රැස්වීමකට නොපැමිණ ඇති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු ප්‍රශ්න එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ රැස්වීමක්-

(අ) ඒ රැස්වීම සඳහා නියම කර ගත් ස්ථානයේ, දිනයේ සහ වේලාවේ රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ, ඊට සහභාගී වන ගණපූරණය සංයුක්ත කරන සියලුම සාමාජිකයන්ට ඊට සහභාගී වන එක් එක් සාමාජිකයා එකවර දැකිය හැකි සහ ඒ එක් එක් සාමාජිකයාට සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මඟින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් වන රීති ද, කොමිෂන් සභාවට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිය දෛනික කටයුතු සම්බන්ධයෙන් මඟපෙන්වීම සඳහා අවශ්‍ය වන ප්‍රජා රීති ද සාදනු ලැබිය හැකි ය.

11. කොමිෂන් සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් අවලංගු නොවිය යුතු ය; නැතහොත් අවලංගු යයි සලකනු නොලැබිය යුතු ය.

12. කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ එහි අනෙකුත් සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ජනාධිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

13. (1) යම් බලයලත් තැනැත්තකු සම්බන්ධයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් සබඳතාවක් ඇති කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු විසින් වහාම ඒ සබඳතාවේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. ඉන්පසු, ඒ සබඳතාවට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් අදාළ වන යම් තීරණයකට ඒ සාමාජිකයා සහභාගී වනු හෝ ඊට ඡන්දය ප්‍රකාශ කරනු නොලැබිය යුතු ය.

(2) යම් බලයලත් තැනැත්තකු සම්බන්ධයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් සබඳතාවක් ඇති කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු යම් තීරණයකට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් සහභාගී වුවහොත්, ඒ තීරණය බලරහිත කළ හැකි වන්නේ ය.

14. (1) කොමිෂන් සභාව, එහි කටයුතු සම්බන්ධයෙන් වන මූල්‍ය කළමනාකරණය සහ මේ පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද අරමුදල නිසි පරිදි මෙහෙයවීම සහ කළමනාකරණය භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වන කර්තව්‍ය ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි සහ නියම කරනු ලැබිය හැකි නියෝගවලට යටත්ව, ආයෝජන කිරීම, බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ අරමුදල් ණයට ගැනීම සහ කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය අනුමත කිරීම සහ කළමනාකරණය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

15. (1) කොමිෂන් සභාවේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය. මේ වගන්තියේ කාර්ය සඳහා, එසේ පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයා ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් විය හැකි ය.

(2) අවසාන විගණන වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබීම සඳහා, ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

16. (1) කොමිෂන් සභාව විසින්, අදාළ වන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව, පොත්, ලේඛන සහ සටහන්, ගිණුම්, මුදල් සුරැකුම්, වවුචරපත් සහ වෙනත් ලේඛනවල වාර්තා පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශයක් පිළියෙළ කළ යුතු ය. එසේ ම, කොමිෂන් සභාව විසින් වාර්ෂිකව, ස්වකීය මූල්‍ය ප්‍රකාශය විගණනය කොට ඒ පිළිබඳව වාර්තා කිරීමට ද එසේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයෙන්, සිය මතය අනුව, කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දැක්මක් පෙන්නුම් කෙරෙන්නේ ද යන්න ප්‍රකාශ කිරීමට ද ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් පත් කරනු ලැබිය යුතු ය.

17. කොමිෂන් සභාව විසින්, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි තොරතුරු සහ වාර්තා අවශ්‍ය අවස්ථාවල දී කැඳවනු ලැබිය හැකි ය.

18. කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ වන සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය අතරින් කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පරිදි වන බලතල, කාර්ය සහ කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට, කොමිෂන් සභාවේ යම් නිලධරයකුට හෝ කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන යම් වගකීම් සහගත තනතුරක් දරන තැනැත්තකුට පවරා දෙනු ලැබිය හැකි අතර,

ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොමිෂන් සභාවේ නිලධරයා හෝ කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන වගකීම් සහගත තනතුරක් දරන තැනැත්තා විසින් කොමිෂන් සභාවේ විධානයට සහ අධීක්ෂණයට යටත්ව, එසේ පවරා දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

19. (1) කොමිෂන් සභාව විසින්, මේ පනත ප්‍රකාරව වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අවශ්‍ය විය හැකි යම් පරිපාලන ඒකක සංඛ්‍යාවක් කොමිෂන් සභාව තුළ පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය අතරින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි බලතල, කාර්ය සහ කර්තව්‍ය යම් පරිපාලන ඒකකයකට හෝ කොමිෂන් සභාවේ සේවානියුක්තයකුට, කලින් කල ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, ඒ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය පවරනු ලැබ ඇති ඒ පරිපාලන ඒකකය හෝ සේවානියුක්තයා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු අතර, කොමිෂන් සභාවේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානයට සහ අධීක්ෂණයට යටත්ව ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

20. මේ පනත යටතේ කොමිෂන් සභාව, එහි නිලධරයන් සහ සේවානියුක්තයන් විසින් සිය බලතල, කාර්ය හෝ කර්තව්‍ය සද්භාවයෙන් ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව, ඒ නිලධරයන් සහ සේවානියුක්තයන් වගකියනු නොලැබිය යුතු ය. එසේ වුව ද, ඒ මුක්තිය-

(අ) තත් කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ අපරාධමය වරදක් සඳහා වූ වගකීම දක්වා;

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට පටහැනිව කරනු ලබන යම් ක්‍රියාවක් දක්වා,

දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

21. යම් අධිකරණයක් හෝ මේ පනත ප්‍රකාරව පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය හෝ වෙනත් යම් ආයතනයක් ඉදිරියේ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව ගෙන එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුකරයක දී කොමිෂන් සභාව විසින් දරනු ලබන යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, ඒ සිවිල් හෝ අපරාධ නඩුකරයේ දී කොමිෂන් සභාවට ගෙවන ලද හෝ කොමිෂන් සභාව විසින් ප්‍රතිපූරණය කරගනු ලැබූ යම් පිරිවැයක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

22. යම් අධිකරණයක් හෝ මේ පනත ප්‍රකාරව පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය හෝ වෙනත් යම් ආයතනයක් ඉදිරියේ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් මේ පනත ප්‍රකාරව හෝ කොමිෂන් සභාවේ විධානය මත හෝ කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට එරෙහිව ගෙන එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුකරයක දී ඒ තැනැත්තා විසින් දරනු ලබන යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, ඒ යම් සිවිල් හෝ අපරාධ නඩුකරයක දී කොමිෂන් සභාවට ගෙවන ලද හෝ කොමිෂන් සභාව විසින් ප්‍රතිපූරණය කර ගන්නා ලද යම් පිරිවැයක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ ක්‍රියාව සද්භාවයෙන් නොකරන ලද බවට ඒ අධිකරණය හෝ ජාත්‍යන්තර වාණිජ ආරවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය හෝ ආයතනය තීරණය කරයි නම්, කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවන ලද ඒ වියදම ඒ තැනැත්තාගෙන් ආපසු අය කරගෙන කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

IV වන කොටස

කොමිෂන් සභාවේ අරමුදල

23. (1) කොමිෂන් සභාව සතුව අරමුදලක් තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ අරමුදලට පහත සඳහන් මුදල් ප්‍රමාණ ගෙවනු ලැබිය යුතු ය:-

(අ) මේ පනත ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් දරනු ලැබිය හැකි, කොළඹ වරාය නගරයේ සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රවර්ධන වියදම් සහ වෙනත් යම් වියදම් ද ඇතුළුව, කොමිෂන් සභාවේ ආරම්භක පිහිටුවීමේ සහ මෙහෙයුම් වියදම් පියවීම සඳහා කොමිෂන් සභාව විසින් භාවිත කරනු ලැබිය යුතු මුදල් ප්‍රමාණයක් වන්නා වූ, වෙනත් කරුණු අතර, කොමිෂන් සභාව විසින් කොළඹ වරාය නගරයේ ආයෝජන පහසුකම් සලසන්නාගේ කර්තව්‍ය ඉටු කිරීම හේතුවෙන් මූලික දායක මුදල වශයෙන්, ව්‍යාපෘති සමාගම විසින් කොමිෂන් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ශ්‍රී ලංකා රුපියල් මිලියන හාරසියයක් වන මුදලක්;

(ආ) මේ පනත ආරම්භ වන දින සිට 2028 ජූනි මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි අලෙවි කළ හැකි ඉඩම් සම්බන්ධයෙන්, වෙනත් කරුණු අතර, කොමිෂන් සභාව විසින් ආයෝජන පහසුකම් සලසන්නාගේ කර්තව්‍ය ඉටු කිරීම වෙනුවෙන් ඉහත (අ) ඡේදය ප්‍රකාරව ව්‍යාපෘති සමාගම විසින් යොදවන ලද ආරම්භක දායක මුදල සහ ඒ මත ගෙවිය යුතු යම් බදු මුදල් අඩු කිරීමෙන් පසු, මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් දරන ලද (අ) ඡේදයේ දක්වා ඇති වියදම පියවීම සඳහා කොමිෂන් සභාව විසින් භාවිත කරනු ලැබිය යුතු මුදල් ප්‍රමාණය වන්නා වූ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් බදු දීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන සියලු මුදල් ප්‍රමාණ (කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් හා සම්බන්ධ බදුකර ලියා අත්සන් කිරීමට සමගාමීව එසේ ලැබුණු මුදල්වල සමස්ත ශේෂය ව්‍යාපෘති සමාගම වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය);

(ඇ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති, රජයේ අලෙවි කළ හැකි යම් ඉඩම් බද්දට දීමෙන් 2023 ජූලි මස 1 වන දින සිට 2028 ජුනි මස 30 වන දින දක්වා වන කාලසීමාව තුළ ලැබෙන කොළඹ වරාය නගරයේ සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රවර්ධන වියදම් වෙනුවෙන් කොමිෂන් සභාව විසින් දරන ලද වියදම් පියවීමට සේවා ගාස්තුවක් ලෙස කොමිෂන් සභාව විසින් රඳවා ගනු ලැබූ සියලු මුදල්වලින් සියයට එකක ප්‍රතිශතයකට සමාන සියලු මුදල් ප්‍රමාණ (අදාළ බදු ගිවිසුම් ලියා අත්සන් කිරීමට සමගාමීව කොමිෂන් සභාව විසින් එසේ ලැබුණු සියලු මුදල් ප්‍රමාණවල සම්පූර්ණ ශේෂය ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, එවිට එය රජයේ ආදායමේ කොටසක් වන්නේ ය.);

(ඈ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ, මේ පනත යටතේ නියම කර ඇති නිශ්චිත අනුප්‍රමාණයන්ගෙන් කොමිෂන් සභාව විසින් අයකර ගනු ලබන දේශීය තක්සේරු වරිපණම් සහ පනවනු ලබන වෙනත් යම් අයබදු වශයෙන් කොමිෂන් සභාව වෙත ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ (ඒ මුදල් ප්‍රමාණ කාර්තු පදනමක් මත ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, එය රජයේ ආදායමේ කොටසක් වන්නේ ය.);

(ඉ) මේ පනත ප්‍රකාරව, කොමිෂන් සභාව හෝ දේපළ කළමනාකරු වෙත පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන සියලු සේවාවන් හෝ පහසුකම් සඳහා කොමිෂන් සභාව හෝ දේපළ කළමනාකරු විසින් පනවනු ලැබිය හැකි ගාස්තු හෝ අයකිරීම් ලෙස කොමිෂන් සභාවට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ඊ) දේශීය හෝ විදේශීය යම් නීත්‍යනුකූල ප්‍රභවයකින් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා කොමිෂන් සභාවට ලැබෙන සියලු ප්‍රදාන, පරිත්‍යාග, ත්‍යාග හෝ රික්තවරණ;

(උ) තත් කාර්යය සඳහා සාදනු ලැබිය යුතු නියෝගවලට අනුකූලව කොමිෂන් සභාව විසින් ණයට ගනු ලබන සියලු මුදල් ප්‍රමාණ; සහ

(ඌ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව වෙත උපචිත වන වෙනත් යම් මුදල් ප්‍රමාණ.

(3) කොමිෂන් සභාව විසින්-

(අ) කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහසම්බන්ධ වූ ජාත්‍යන්තර ප්‍රවර්ධන කටයුතු, (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ දක්වා ඇති අදාළ සීමා කිරීමට අනුකූල වන බවට ද;

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ව්‍යාපෘති සමාගම වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ශේෂය එසේ ප්‍රේෂණය කරනු ලබන බවට ද; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු සියලු මුදල් එසේ බැර කරනු ලබන බවට ද,

තහවුරු කරන අතරතුර, මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ප්‍රමාණ කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ අරමුදල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය. මේ වගන්තියේ කාර්ය සඳහා එසේ පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයා ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් විය හැකි ය.

(5) අවසාන විගණන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබීම සඳහා, ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) 2028 ජූලි මස 1 වන දින වන විට ස්වයං අරමුදල් සම්පාදනය සඳහා කොමිෂන් සභාව ඉලක්ක කළ යුතු බවට මෙයින් සඳහන් කරනු ලැබේ.

(7) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රවර්ධන කටයුතු කරගෙන යාමේ දී සහ ඒ සම්බන්ධ වියදම් දැරීමේ දී, ජාත්‍යන්තර සහ දේශීය විශේෂඥතාව සහ දක්ෂතා යන දෙකම යොදා ගැනීමට කොමිෂන් සභාව වගබලා ගත යුතු ය.

V වන කොටස

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

24. (1) කොමිෂන් සභාව විසින්, ජනාධිපතිවරයා විමසා සහ ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, යම් සුදුසුකම් සහ පළපුරුද්ද ද දේශීය හෝ ජාත්‍යන්තර අත්දැකීම් ද සතු (මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විමසා සහ ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් නියම සහ කොන්දේසි මත, පත් කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාරව ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලබන්නේ ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොමිෂන් සභාවේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, කොමිෂන් සභාවේ සියලු කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(5) ජනාධිපතිවරයා විමසා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමික අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

(6) ජනාධිපතිවරයා විමසා සහ ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, කොමිෂන් සභාව විසින්, හේතු දක්වා අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) ජනාධිපතිවරයා වෙත සහ කොමිෂන් සභාව වෙත ඒ සම්බන්ධයෙන් කරනු ලබන ලිඛිත සන්නිවේදනයක් මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් භාරගත් විට බලාත්මක විය යුතු ය.

(8) මේ පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉවත් කිරීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

25. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත පරිදි විය යුතු ය:-

(අ) කොමිෂන් සභාව සඳහා වෙනම ලේකම් කාර්යාලයක් පිහිටුවීම සහ කළමනාකරණය සහ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා ආධාර කිරීම සහ සහාය වීම;

(ආ) කොමිෂන් සභාවේ වැඩකටයුතුවල දෛනික කළමනාකරණය සහ පරිපාලනය සිදු කිරීම;

(ඇ) කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැකි හෝ අභිනියෝජනය කරනු ලැබිය හැකි පරිදි, මානව සම්පත් හා අදාළ සේවා කළමනාකරණය කිරීම;

(ඈ) කොමිෂන් සභාව විමසා එහි වාර්ෂික අයවැය සකස් කිරීම සහ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා ඒ අයවැය, ජනාධිපතිවරයාගේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම;

(ඉ) අවශ්‍ය විය හැකි පරිදි, ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක්, අවසර පත්‍රයක්, සහතික පත්‍රයක් සහ වෙනත් යම් අනුමතයක් නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම ද ඇතුළුව, කොමිෂන් සභාව විසින් සපයනු ලබන සේවාවන් සහ පහසුකම් සඳහා පැනවිය යුතු ගාස්තු සහ වෙනත් අයකිරීම් කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ඊ) මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද යම් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක්, අවසර පත්‍රයක්, සහතික පත්‍රයක් සහ වෙනත් යම් අනුමතයක් අලුත් කිරීම, තාවකාලිකව අත්හිටුවීම, ඉවත් කිරීම, අවලංගු කිරීම හෝ අවසන් කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(උ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී අවශ්‍ය විය හැකි පරිදි, යම් ක්‍රියාවක් සිදු කිරීම; සහ

(ඌ) කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැකි හෝ අභිනියෝජනය කරනු ලැබිය හැකි ආකාරයේ වෙනත් යම් කර්තව්‍ය ඉටු කිරීම.

VI වන කොටස

බලයලත් තැනැත්තකු වීම සඳහා ඉල්ලුම් කිරීම සහ බලයලත් තැනැත්තකු ලෙස අනුමතය දීම, අත්සන් කරනු ලැබිය යුතු ගිවිසුම, ඒකීය අවස්ථා ආයෝජන පහසුකම, ව්‍යාපාරවල, සේවා නියුක්තිවල හෝ දේපළ මිල දී ගැනීම්වල, බද්දට ලබාදීම්වල හෝ කුලියට දීම්වල නිරතව සිටින හෝ පහසුකම් හෝ සේවාවන් උපයෝජනය කරන ශ්‍රී ලාංකික පුරවැසියන්

26. (1) මේ පනත ප්‍රකාරව බලයලත් තැනැත්තකුට හැර වෙනත් කිසිදු තැනැත්තකුට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර ලබා නොදිය යුතු ය.

(2) යම් තැනැත්තකු, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ යම් ඉල්ලුම්කරුවකුට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා බලයලත් තැනැත්තකු ලෙස සුදුසුකම් ලැබීම සහ අවසර දෙනු ලැබීම පිණිස, මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් අවශ්‍ය විය යුතු ය.

(3) සමාගමක්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ යම් ඉල්ලුම්කරුවකුට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා බලයලත් තැනැත්තකු ලෙස සුදුසුකම් ලැබීම සහ අවසර දෙනු ලැබීම පිණිස-

(අ) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක්; සහ

(ආ) මේ පනතේ VII වන කොටස යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක්,

අවශ්‍ය විය යුතු ය.

(4) සමාගමක්, අක්වෙරළ බැංකු ව්‍යාපාරයක නිරත වීමට අදහස් කරන අවස්ථාවක දී, ඒ යම් ඉල්ලුම්කරුවකුට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාරයේ නිරත වීම සඳහා බලයලත් තැනැත්තකු ලෙස සුදුසුකම් ලැබීම සහ අවසර ලබා දෙනු ලැබීම පිණිස-

(අ) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක්;

(ආ) මේ පනතේ VII වන කොටස යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක්; සහ

(ඇ) මේ පනතේ VIII වන කොටස යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක්,

අවශ්‍ය විය යුතු ය.

27. (1) මේ පනත ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා අවශ්‍ය විය හැකි ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් සඳහා වන ඉල්ලීමක් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සහ ආකාරයට සහ ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් යම් අනුමතයක් ලබා ගැනීම සම්බන්ධයෙන් නියම කරනු ලැබිය යුතු ගාස්තුව ද ගෙවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඒ සෑම ඉල්ලීමක් ම, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයේ තොරතුරු, ලේඛන සහ ආපසු ගෙවනු නොලබන පිරිසැකසුම් ගාස්තුවක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ සෑම ඉල්ලීමක ම ශ්‍රී ලංකා රුපියල්වලින් හැර යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් කරනු ලැබිය යුතු යෝජිත ඍජු විදේශ ආයෝජනයේ සමස්ත වටිනාකම නිශ්චිතව දැක්විය යුතු අතර, එය මේ පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව සහ බලයලත් තැනැත්තා විසින් අත්සන් කිරීමට නියමිත අදාළ ගිවිසුමේ ද දක්වනු ලැබිය යුතු ය.

(4) බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන ගිණුමක ඇති කිසිදු විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවක් සහ ඒ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකින් ගනු ලැබූ විදේශ ව්‍යවහාර ණය මුදලක් හරහා රැස් කර ගන්නා ලද කිසිදු විදේශ ව්‍යවහාර මුදලක්, ඒ ආයෝජනයේ කාර්යය සඳහා බලයලත් තැනැත්තකු විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ යොදා ගනු නොලැබිය යුතු ය. එපරිද්දෙන්, මේ පනතේ මේ වගන්තියේ (5) වන උපවගන්තියේ සහ 39 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා කරනු ලබන සියලුම ආයෝජන ජාතික ආර්ථිකයේ යහපත පිණිස ශ්‍රී ලංකාවෙන් පිටතින් සම්පාදනය කරනු ලැබිය යුතු ය.

(5) 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ නිශ්චිතව දක්වා ඇති සීමා කිරීම් අදාළ නොවන යම් තැනැත්තකු හෝ සමාගමක් සහ මේ පනතේ 38 වන වගන්තිය හෝ 39 වන වගන්තිය ප්‍රකාරව අවසර දී ඇති පරිදි ඉඩම් බදු දී ඇති තැනැත්තකු හෝ සමාගමක් විසින්, එසේ බදු දී ඇති ඉඩමේ වටිනාකම මඟින් ඒ ආයෝජනයේ කොටසක් සාදනු ලැබීමේ පදනම මත, ශ්‍රී ලංකා රුපියල්වලින් හැර යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාරයක නිරත වීම සඳහා ආයෝජකයකු හෝ ආයෝජකයන් සමූහයක් සමඟ එක්ව අයදුම් කළ හැකිය. නියම කරනු ලැබිය හැකි වෙනත් කොන්දේසිවලට යටත්ව, ඒ ආයෝජනය මත වන ලාභාංශය හෝ වෙනත් යම් මූල්‍ය ප්‍රතිලාභයක් ශ්‍රී ලංකා රුපියල්වලින් හැර නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් සිදු කරනු ලැබිය යුතු ය යන පදනම මත කොමිෂන් සභාව විසින් ඒ අනුමතය ප්‍රදානය කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ පනතේ 39 වන වගන්තිය යටතේ අදාළ බදුදීම වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් තුළ ඒ තැනැත්තාට හෝ සමාගමට ලාභාංශයක් හෝ වෙනත් යම් මූල්‍ය ප්‍රතිලාභයක් උපචිත වන අවස්ථාවක, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාවේ, 39 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රුපියල්වලින් ඒ බදු දීම වෙනුවෙන් ගෙවීම කරනු ලැබූ තැනැත්තාගේ හෝ සමාගමේ නමින් ක්‍රියාත්මක කොට පවත්වාගෙන යනු ලබන නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට ඒ ලාභාංශය හෝ වෙනත් යම් මූල්‍ය ප්‍රතිලාභය ප්‍රේෂණය කිරීමට ඒ තැනැත්තා වෙත නියම කරනු ලැබිය යුතු ය.

28. (1) කොමිෂන් සභාව විසින්, 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වැඩිදුර තොරතුරු සහ ලේඛන ඉල්ලා සිටිය හැකි අතර, ඉල්ලුම්කරු විසින් ඒ තොරතුරු සහ ලේඛන, කොමිෂන් සභාව නිශ්චය කර ඉල්ලුම්කරු වෙත සන්නිවේදනය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන සෑම ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් අනුමතයක්-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියකින් විය යුතු ය;

(ආ) වෙනත් කරුණු අතර, ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබා දීම හෝ වෙනත් අනුමතය ප්‍රදානය කරනු ලබන ව්‍යාපාරයේ වර්ගය පිළිබඳව සැලකිල්ල යොමු කරමින් කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක ගාස්තුව ගෙවීම මත ප්‍රදානය කරනු ලැබිය යුතු ය;

(ඇ) ඒ ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබා දීම හෝ වෙනත් අනුමතය සඳහා යම් වලංගු කාලසීමාවක් ඇත්නම්, ඒ වලංගු කාලසීමාව එහි නිශ්චිතව දැක්විය යුතු ය;

(ඈ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට බලයලත් තැනැත්තකු විසින් නිරත වීමට අපේක්ෂිත ව්‍යාපාරය නිශ්චිතව දැක්විය යුතු ය; සහ

(ඉ) ඒ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබා දීම හෝ වෙනත් අනුමතය ලබාදීම සම්බන්ධ යම් කොන්දේසි වේ නම්, ඒවා නිශ්චිතව දැක්විය යුතු ය.

(3) (අ) ඉල්ලුම්කරුවකු බලයලත් තැනැත්තකු ලෙස අනුමත කිරීම;

(ආ) බලයලත් තැනැත්තකුගේ ඉල්ලීම මත ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් සංශෝධනය කිරීම, ආපසු හාර දීම, මාරු කිරීම, පැවරීම හෝ අලුත් කිරීම; සහ

(ඇ) යම් බලයලත් තැනැත්තකු විසින් සැලකිය යුතු පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් කළ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ බලයලත් තැනැත්තාට ඒ සඳහා හේතු ලිඛිතව දැනුම් දීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් අනුමතයක්, සාධාරණ හේතුවක් මත තාවකාලිකව අත්හිටුවීම, අහෝසි කිරීම හෝ අවලංගු කිරීම,

පිළිබඳ කාර්ය පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) සියලුම බලයලත් තැනැත්තන්ගේ විස්තර සහ ඒ එක් එක් තැනැත්තාට නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද ලියාපදිංචියේ, බලපත්‍රයේ, බලය ලබා දීමේ හෝ වෙනත් අනුමතයේ වර්ගය ඇතුළත් විය යුතු රෙජිස්ටරයක් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියෙන් සහ ආකාරයෙන් කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

29. කවර හෝ ඉල්ලුම්කරුවකු විසින්-

(අ) මේ පනතේ මේ කොටස ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන්; හෝ

(ආ) මේ පනත ප්‍රකාරව ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු යයි නියමිත යම් තොරතුරු හෝ විස්තර සම්බන්ධයෙන්,

වූ යම් වැදගත් කරුණක් පිළිබඳව සාවද්‍ය යයි හෝ නොමඟ යවන සුලු යයි තමා දන්නා යම් නියෝජනයක් හෝ ප්‍රකාශයක් කරනු නොලැබිය යුතු ය. මේ වගන්තියේ විධිවිධාන කඩ කරනු ලබන යම් තැනැත්තකු මේ පනත ප්‍රකාරව වරදක් සිදු කරන්නේ ය.

30. (1) මේ පනතේ VII වන කොටසට, VIII වන කොටසට සහ 33 වන වගන්තියට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ව්‍යාපාරවල නිරත වීමට, ආයෝජනය කිරීමට, පදිංචි වීමට හෝ සේවා නියුක්ත වීමට ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් සඳහා කොමිෂන් සභාව වෙත කරනු ලබන යම් ඉල්ලීමක් පිළිගන්නේ ද නැතහොත් සාධාරණ හේතුවක් මත ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න කඩිනමින් සහ සම්බන්ධිත ආකාරයෙන් සලකා බලා තීරණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නා කොමිෂන් සභාව විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නාගේ තත්ත්වයෙන්, මේ පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ලැබුණු යම් ඉල්ලීමක් පිළිගන්නේ ද නැතහොත් ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න නිශ්චය කරනු ලැබිය යුතු ය. යම් ඉල්ලීමක් පිළිගත හැකි බව පෙනී යන්නේ නම්, කොමිෂන් සභාව විසින් ඒ ඉල්ලුම්කරුට සිය තීරණය ලිඛිතව දැනුම් දිය යුතු ය. ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් සිය තීරණයට හේතු ද සමඟ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඒ ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(3) කොමිෂන් සභාව විසින් ඒ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය ලබා දීමේ ක්‍රියාවලියේ දී, අදාළ නියාමන අධිකාරියට අදාළ වන ලිඛිත නීති මඟින් ඒ අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ලබා ගත යුතු යයි නියම කරන අවස්ථාවක දී, ඒ අධිකාරිය සතු හෝ ඒ අධිකාරිය වෙත පවරනු ලැබ ඇති විෂයයන් සම්බන්ධයෙන් සහ මේ පනතේ විශේෂයෙන් විධිවිධාන සලසා ඇති ප්‍රමාණය තෙක්, ඒ අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ලබා ගත යුතු ය:

එසේ වුව ද, ඉල්ලා සිටිනු ලබන අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය, ඒ අධිකාරියට අදාළ වන ලිඛිත නීති කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය ඇතුළත කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සීමා විය යුතු ය:

එසේම තවදුරටත්, කොමිෂන් සභාව විසින් ඒ එකඟත්වය ඉල්ලා සිටිනු ලබන්නේ යම් නියාමන අධිකාරියකින් ද, ඒ අදාළ නියාමන අධිකාරිය විසින්, අවස්ථානුගත කරුණු අනුව, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, ප්‍රමුඛත්වය ලබා දිය යුතු කාරණයක් ලෙස සලකා, එහි තීරණය කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවට යොමු කරන ලද ඉල්ලීම් පිරිසැකසීම සහ එහි තීරණය ලබාදීම කඩිනමින් සිදු වන බවට සහතික කිරීමේ කාර්යය සඳහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කාර්යාලයක් ක්‍රියාත්මක කරන ලෙස කොමිෂන් සභාව විසින් යම් අදාළ නියාමන අධිකාරියක් වෙත නියම කළ යුතු ය. ඒ ඉල්ලීම් කඩිනමින් පිරිසැකසීම සහතික කිරීම සහ එහි තීරණය කඩිනමින් ලබාදීම සඳහා ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨත්වයක් සහ අධිකාරී බලයක් ඇති නිලධරයන් විසින් ඒ කාර්යාලය කළමනාකරණය කරනු ලබන බවට අදාළ නියාමන අධිකාරිය සහතික විය යුතු ය.

31. (1) කොමිෂන් සභාව විසින් මේ පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව ලැබුණු යම් ඉල්ලීමක් ඇගයීමෙන් පසුව, ඒ ඉල්ලීම ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස පිළිගනු ලැබිය යුතු යයි සලකනු ලබන අවස්ථාවක දී, ඉල්ලා ඇති ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය නිකුත් කිරීම හෝ ප්‍රදානය කිරීම සඳහා කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) එසේ නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් නියම හෝ කොන්දේසිවලට යටත් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් එසේ නිකුත් කරන ලද හෝ ප්‍රදානය කරන ලද අවස්ථාවක දී, ඒ යම් ලේඛනයක පටහැනිව යම් කොන්දේසියක් නිශ්චිතව දක්වා ඇත්නම් මිස, අදාළ එක් එක් නියාමන අධිකාරියට අදාළ වන ලිඛිත නීති මඟින් ඒ අදාළ නියාමන අධිකාරියේ එකඟත්වය ලබා ගත යුතු යයි නියම කරන අවස්ථාවක දී, අදාළ නියාමන අධිකාරියේ නිසි එකඟත්වය ලබා ගැනීමෙන් පසුව, අදාළ ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය සම්බන්ධයෙන් වූ සියලු නීතිමය සහ නියාමන අවශ්‍යතා නිසි ලෙස අනුගමනය කොට ඇති බව තහවුරු කර සෑහීමට පත් වීම, කොමිෂන් සභාවේ වගකීම විය යුතු ය.

32. කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිදු කිරීමට නියමිත ආයෝජනයට අදාළව, වෙනත් කරුණු අතර, යම් නියම, කොන්දේසි, අදාළ සීමා කිරීම්, (39 වන වගන්තිය ප්‍රකාරව ගෙවනු ලැබූ යම් මුදලක් ද ඇතුළුව) සිදු කිරීමට සැලසුම් කර ඇති ඍජු විදේශ ආයෝජනයේ මුළු වටිනාකම සහ යම් සහන හෝ නිදහස් කිරීම් සහ මේ පනත යටතේ ඒවා ප්‍රදානය කරනු ලබන කාලසීමාව දක්වමින්, කොමිෂන් සභාව විසින් සෑම බලයලත් තැනැත්තකු සමඟ ම ගිවිසුමකට ඇතුළත් වනු ලැබිය යුතු ය. ඒ සෑම ගිවිසුමක ම, එයට සම්බන්ධ හෝ එයින් උද්ගත වන යම් ආරවුලක් මේ පනතේ XIII වන කොටස ප්‍රකාරව බේරුම් කිරීම මඟින් නිරවුල් කර ගැනීමට පාර්ශ්වයන් එකඟ වන්නා වූ විධිවිධානයක් අඩංගු විය යුතු ය. 27 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි කරන ලද යම් හිමිකාරත්ව දායක මුදලක් ද එහි වෙනම නිරූපණය කරනු ලැබිය යුතු ය.

33. (1) කොමිෂන් සභාව, ඒකීය අවස්ථා ආයෝජන පහසුකම් සලසන්නා වශයෙන්, බලයලත් තැනැත්තකුට, බලයලත් තැනැත්තකුගේ යම් උපදේශකයකුට හෝ බලයලත් තැනැත්තකු විසින් විශේෂයෙන් බලය ලබාදෙන ලද යම් තැනැත්තකුට හෝ බලයලත් තැනැත්තකුගේ සේවා නියුක්තයකුට, සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ව්‍යාපාරවල නිරත වීමට, ආයෝජනය කිරීමට, පදිංචි වීමට හෝ සේවා නියුක්ත වීමට අදහස් කරන තැනැත්තකුට අවශ්‍ය විය හැකි වීසා බලපත්‍රයක්, ඇතුළුවීමේ අවසර පත්‍රයක් හෝ වැඩ කිරීමේ අවසර පත්‍රයක් සහ වෙනත් අනුමතයන් සඳහා වන ඉල්ලීමක් භාරගැනීම සහ ඒවා පිරිසැකසීම සඳහා පහසුකම් සැලසීම අවශ්‍ය විය හැකි පරිදි කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ යම් ඉල්ලීමක් ඇගැයීමෙන් පසුව, ඒ ඉල්ලීම ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස භාරගත යුතු යයි සලකනු ලබන අවස්ථාවක, ඒ කරුණ ආගමන සහ විගමන පාලකවරයාට දැනුම් දෙනු ලැබිය හැකි අතර, ඒ වීසා බලපත්‍රය, ඇතුළුවීමේ අවසර පත්‍රය හෝ වැඩ කිරීමේ අවසරපත්‍රය හෝ වෙනත් අනුමතය ප්‍රමුඛතා පදනමක් මත ප්‍රදානය කිරීමට නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, ආගමන සහ විගමන පාලකවරයාගේ තීරණය පදනම් කොට ගනිමින්, ඒ ඉල්ලීම ආගමන සහ විගමන පාලකවරයා විසින් පිළිගනු ලබන්නේ නම් ඒ බව ඒ ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ වීසා බලපත්‍රය, ඇතුළුවීමේ අවසර පත්‍රය හෝ වැඩ කිරීමේ අවසර පත්‍රය හෝ වෙනත් අනුමතය නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසිය යුතු අතර, ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඒ බව, ආගමන සහ විගමන පාලකවරයා විසින් දැනුම් දී ඇති පරිදි ඒ සඳහා වන හේතු ද සමඟ ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. ආගමන සහ විගමන පාලකවරයාගේ ඒ තීරණය අවසානාත්මක වන්නේ ය.

34. කොමිෂන් සභාව විසින්-

(අ) 31 වන වගන්තිය ප්‍රකාරව යම් ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් අනුමතයක්; හෝ

(ආ) 33 වන වගන්තියේ දක්වා ඇති පරිදි, යම් වීසා බලපත්‍රයක්, ඇතුළුවීමේ අවසර පත්‍රයක් හෝ වැඩ කිරීමේ අවසර පත්‍රයක් හෝ වෙනත් අනුමතයක්,

සම්බන්ධයෙන් පහසුකම් සැලසීමෙන් සහ නිකුත් කිරීමෙන් හෝ ප්‍රදානය කිරීමෙන් අනතුරුව, ආගමන සහ විගමන පාලකවරයා විසින් අවශ්‍ය යයි සලකන පරිදි ඒවා තාවකාලිකව අත්හිටුවීමට, ඉවත් කිරීමට හෝ අවලංගු කිරීමට ආගමන සහ විගමන පාලකවරයා වෙත නිර්දේශ කිරීමට කොමිෂන් සභාවට සිදුවන හේතුවක් දැන ගැනීමට ලැබුණු අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, ඒ පිළිබඳව ආගමන සහ විගමන පාලකවරයාට සහ බලයලත් තැනැත්තාට දැනුම් දිය යුතු ය. එවිට ආගමන සහ විගමන පාලකවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය තාවකාලිකව අත්හිටුවීමට, ඉවත් කිරීමට හෝ අවලංගු කිරීමට කටයුතු කළ යුතු ය. ආගමන සහ විගමන පාලකවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබා දීම හෝ වෙනත් අනුමතය තාවකාලිකව අත්හිටුවීමට, ඉවත් කිරීමට හෝ අවලංගු කිරීමට කටයුතු කිරීමෙන් පසුව ඒ පිළිබඳව කොමිෂන් සභාවට දැනුම් දිය යුතු අතර, කොමිෂන් සභාව විසින් ඉන් ඉක්බිතිව ම අදාළ බලයලත් තැනැත්තා වෙත ඒ පිළිබඳව දැනුම් දිය යුතු ය. ආගමන සහ විගමන පාලකවරයාගේ ඒ තීරණය අවසානාත්මක වන්නේ ය.

35. කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර ලැබී ඇති බලයලත් තැනැත්තකු විසින් වාසික හෝ නිර්වාසික යම් තැනැත්තකු සේවයේ නියුක්ත කළ හැකි අතර, ඒ සේවානියුක්තයාට ශ්‍රී ලංකා රුපියල් නොවන නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය. තව ද-

(අ) එසේ ලැබුණු වාසික සේවා නියුක්තයකුගේ සේවානියුක්ති ආදායම, ආදායම් බද්දෙන් නිදහස් විය යුතු අතර, ඒ මුදල් ඒ වාසික සේවානියුක්තයාගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කිරීමට අවසර ඇති සේ සලකනු ලැබිය යුතු ය;

(ආ) එසේ ලැබුණු නිර්වාසික සේවා නියුක්තයකුගේ සේවා නියුක්ති ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඒ නිර්වාසික සේවානියුක්තයා ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයා ගත් යම් ආදායමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී ආදායම් බද්දට යටත් නොවිය යුතු ය.

36. කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වන යම් බලයලත් තැනැත්තකු විසින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකුට හෝ වාසිකයකුට ඒ බලයලත් තැනැත්තා සපයනු ලබන යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් ලබා ගත හැකි ය. ඒ බලයලත් තැනැත්තා විසින් එසේ ලබා ගන්නා ශ්‍රී ලංකා රුපියල් නියම කරනු ලැබිය යුතු ආකාරයට සහ නියම කරනු ලැබිය යුතු යම් කොන්දේසිවලට යටත්ව, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

37. (1) බලයලත් තැනැත්තකු විසින්, තත් කාලයේ බලපවත්නා සියලු ලිඛිත නීති සහ මේ පනත යටතේ සාදනු ලැබිය හැකි නියෝග අදාළ වීමට යටත්ව, ජාතික යහපත පිණිස සහ දේශීය ආර්ථිකයේ යහපත ආරක්ෂා කිරීම පිණිස ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතුවල නිරත ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු සමඟ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා ඉල්ලීමක් කොමිෂන් සභාව වෙත කළ හැකි ය.

(2) ඒ ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස සහ දේශීය ආර්ථිකයේ යහපත සහතික කරමින්, නියම කරනු ලැබිය යුතු ආකාරයට සහ නියම කරනු ලැබිය යුතු යම් කොන්දේසිවලට යටත්ව ඒ සඳහා බලය ලබා දීම සිදු කළ හැකි ය.

(3) ශ්‍රී ලංකාව තුළ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතුවල නිරත වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු සමඟ ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා (1) වන උපවගන්තිය යටතේ බලයලත් තැනැත්තකුට කොමිෂන් සභාව විසින් බලය ලබා දීමක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී ඒ බලයලත් තැනැත්තා කොළඹ වරාය නගරයේ බල

ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු සමඟ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතුවල නිරතවීමට අදාළව මේ පනතේ IX වන කොටසේ හෝ මේ පනතේ වෙනත් යම් කොටසක් යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි යම් නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ඉල්ලා සිටීමට හෝ එම නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ලබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

38. කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධානවලට, 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ විධිවිධානවලට සහ වෙනත් අදාළ ලිඛිත නීතිවලට යටත්ව, යම් තැනැත්තකුට-

(අ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද රජයේ අලෙවි කළ හැකි ඉඩම් බද්දට දීම;

(ආ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම්, ඒ ඉඩම්වලට අදාළ ඒවායේ ප්‍රධාන බද්ද දරන්නා වූ ව්‍යාපෘති සමාගම සමඟ හවුලේ බද්දට දීම;

(ඇ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද රජයේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස්, අවස්ථාවෝචිත පරිදි, අදාළ ආයෝජකයා හෝ සංවර්ධකයා සමඟ ඒකාබද්ධව බදු දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම;

(ඈ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇත්තා වූ ද මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව සතු වන්නා වූ ද ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස් ඒ ඉඩම්වල ප්‍රධාන බදු දරන්නා වූ ව්‍යාපෘති සමාගම සමඟ ඒකාබද්ධව බදු දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම,

සිදු කළ හැකි අතර, ඒ සඳහා වන ගෙවීම ශ්‍රී ලංකා රුපියල් නොවන යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ගෙවනු ලැබිය යුතු ය.

39. 38 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, කොමිෂන් සභාව විසින්, 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ නිශ්චිතව දක්වා ඇති සීමාවන් අදාළ නොවන යම් තැනැත්තකුට හෝ සමාගමකට රජයේ අලෙවි කළ හැකි ඉඩම් හෝ ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් බද්දට දීම හෝ රජයේ අලෙවි කළ හැකි ඉඩම් මත හෝ ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම් මත පිහිටා ඇති යම් සහාධිපත්‍ය කොටස් බද්දට දීම හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට අනුව, ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ දක්වා ඇති සීමාවන් අදාළ නොවන්නා වූ ද ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් සිදුකර ඇත්තා වූ ද ඒ තැනැත්තා හෝ සමාගම විසින්, ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම කරනු ලැබ ඇති ඒ ගනුදෙනුව සිදු කිරීමේ දින සිට අවුරුදු පහක කාලයක් ඇතුළත ආපසු ඒ දේපළ, ශ්‍රී ලංකා රුපියල් නොවන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් සිදු කරනු ලබන ගෙවීමක් මත තුන්වන පාර්ශ්වයට පවරන්නේ නම්, බද්දට දෙනු ලබන්නේ නම් හෝ කුලියට දෙනු ලබන්නේ නම්, ශ්‍රී ලංකා රුපියල් නොවන යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එසේ ලැබුණු මුදල් ප්‍රමාණය ඉහත කී තැනැත්තාගේ හෝ සමාගමේ නමින්, ශ්‍රී ලංකාව තුළ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ක්‍රියාත්මක කරන සහ පවත්වා ගෙන යන යම් නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට, නියම කරනු ලබන ආකාරයකට ප්‍රේෂණය කරනු ලැබීමට නියම කළ යුතු ය.

40. (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු විසින් අදාළ ගෙවීම් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමෙන් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති භෝජනාගාර, සිනමාහල්, විනෝදාත්මක පහසුකම්, සාප්පු සවාරි පහසුකම් හෝ වාහන ගාල් කිරීමේ පහසුකම් වැනි යම් සිල්ලර වෙළඳ පහසුකම් හෝ සේවාවන් භාවිත කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි සිල්ලර වෙළඳ පහසුකමකින් මිල දී ගෙන, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටතට රැගෙන යනු ලබන භාණ්ඩ මත ගෙවීමට නියම කරනු ලැබිය හැකි යම් අයබදු, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි යම් සිල්ලර වෙළඳ පහසුකම් හෝ සේවාවන් භාවිත කිරීමේ දී යම් බලයලත් තැනැත්තකුට ලැබෙන මුදල් ප්‍රමාණයන්, නියම කරනු ලබන ආකාරයට සහ නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව, ඒ බලයලත් තැනැත්තා විසින්, නම් කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

VII වන කොටස

කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන අක්වෙරළ සමාගම්

41. (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ XI වන කොටසේ විධිවිධාන නොතකා, මේ පනතේ මේ කොටසේ විධිවිධාන කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම පිණිස සංස්ථාගත කරන ලද අක්වෙරළ සමාගම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) මේ පනතේ මේ කොටස යටතේ අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබීම පිණිස සමාගමකින් ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, කොමිෂන් සභාව විසින්, ඒ ඉල්ලුම්පත්‍රය කොමිෂන් සභාවට පිළිගත හැකි නම්, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස, ඒ සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ XI වන කොටස ප්‍රකාරව අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි

සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසරය ඇති අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ ඉල්ලුම්කාර සමාගමට නිකුත් කරන ලෙස සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(3) අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කරනු ලැබීම පිණිස කොමිෂන් සභාව වෙත යොමු කරන ඉල්ලුම්පත්‍රයක් පහත දැ සමඟ එවනු ලැබිය යුතු ය:-

(අ) සමාගම සංස්ථාපිත කරන හෝ සංස්ථාපිත කිරීම අර්ථ නිරූපනය කරන අධිකාරපත්‍රයේ, ව්‍යවස්ථාවේ හෝ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ වෙනත් යම් සාධනපත්‍රයක සහතික කරන ලද පිටපතක් සහ ඒ සාධනපත්‍රය රාජ්‍ය භාෂාවකින් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නොවන අවස්ථාවක, ඒ සාධනපත්‍රයේ ඉංග්‍රීසි පරිවර්තනයක්;

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරු හෝ එහි කටයුතු කළමනාකරණය කරන තැනැත්තන්ගේ සම්පූර්ණ නම්, ලිපින, රැකියා සහ ඔවුන් සමාගමේ දරන තනතුරු ඇතුළත් ලැයිස්තුවක්;

(ඇ) විදේශයක සංස්ථාගත කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වන විට දී, සමාගම නියෝජනය කිරීමට බලයලත් තැනැත්තන් වන ශ්‍රී ලංකාවේ වාසික සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන, එක් අයෙකු හෝ වැඩි ගණනකගේ නම් සහ ලිපින;

(ඈ) විදේශයක සංස්ථාගත කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වන විට දී-

(i) සංස්ථාගත කළ රටේ සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ හෝ ප්‍රධාන කාර්යාලයේ සම්පූර්ණ ලිපිනය සහ සමාගමේ ශ්‍රී ලංකාවේ කාර්යාලයේ සම්පූර්ණ ලිපිනය අඩංගු ප්‍රකාශයක්; සහ

(ii) ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමට දින තිහකට පෙරාතුව, නිකුත් කරනු ලබන අධිකාරිය විසින් සහතික කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපතක්;

(ඉ) ඒ සමාගමට අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ලියාපදිංචි වීමට ඒ සමාගම සංස්ථාගත කළ රටේ කිසිදු නීතිමය බාධාවක් නොමැති බවට ඒ සමාගම විසින් නිසි පරිදි සත්‍යායනය කොට නිකුත් කරන ලද ප්‍රකාශයක්; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන, ආපසු ගෙවනු නොලබන, ඉල්ලුම්පත්‍රය පිරිසැකසුම් කිරීමේ ගාස්තුවග-

(4) ඉල්ලුම්කරු විසින්, එසේ ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති තොරතුරුවල යම් වෙනසක් හෝ සුළු වෙනසක් සිදු වූ අවස්ථාවක, වහාම ඒ වෙනස හෝ සුළු වෙනස සම්බන්ධයෙන් කොමිෂන් සභාවට දැනුම් දිය යුතු අතර, කොමිෂන් සභාව විසින් අවශ්‍ය විය හැකි පරිදි ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර ගැනීම සඳහා ඒ පිළිබඳව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ මේ කොටස ප්‍රකාරව අක්වෙරළ සමාගමක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුවකුගේ නමින් නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබුවේ යම් සමාගමක් වෙත ද, ඒ සමාගම සමාගම් පනතේ විධිවිධාන සමඟ අනුකූලව කටයුතු කිරීමෙන් නිදහස් කිරීමක් ලෙසට සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධාන ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර ලබා දෙමින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කොට ඇත්තේ යම් සමාගමකට ද, ඒ සමාගම 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා නිර්වාසික සමාගමක් ලෙස සලකනු ලැබිය යුතුය.

(7) මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලා ඇති සමාගම, ඒ සමාගම සංස්ථාගත කරන ලද රට තුළ නියාමනය කරනු ලබන්නේ ය යන පදනම මත, මෙහි දී සංස්ථාගත කරන ලද අක්වෙරළ සමාගම්වලට අදාළ විය යුතු පරිදි මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා යම් නියෝග සාදනු ලැබිය හැකි ය.

(8) මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කරන ලද අක්වෙරළ සමාගමක්, කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන පරිදි, මේ පනත ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට පමණක් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබිය හැකි ය.

(9) මේ පනත ප්‍රකාරව අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතු ඉදිරියට කරගෙන යාමට අදහස් කරන අක්වෙරළ සමාගමක්, ඒ වර්ෂය ආරම්භයේ දී සහ පසුව එළඹෙන සෑම වර්ෂයක ම ජනවාරි මස තිස් එක් වන දිනයට පෙරාතුව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු මුදලක වාර්ෂික ගාස්තුවක් ගෙවීම පිළිබඳ සාක්ෂ්‍ය, නිශ්චිතව දක්වනු ලබන ආකාරයට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(10) එසේ ලියාපදිංචි කරන ලද අක්වෙරළ සමාගමක්, කොමිෂන් සභාව වෙත ලිඛිතව දෙනු ලබන දැන්වීමක් මඟින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ සමාගමක් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කිරීම පිළිබඳ සිය අදහස කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය හැකි ය. කොමිෂන් සභාව විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(11) කොමිෂන් සභාව විසින්, නිකුත් කරන ලද යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් යම් සාධාරණ හේතුවක් මත අවලංගු කරන මෙන්, ඒ සඳහා හේතු සඳහන් කරමින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට නිර්දේශ කළ හැකි අතර, එවිට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරනු ලැබිය යුතු ය. එසේ අවලංගු කිරීමෙන් පසුව ඒ අක්වෙරළ සමාගම මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ආනුෂංගිකව ප්‍රදානය කරන ලද වරප්‍රසාද සහ ප්‍රතිලාභ භුක්ති විඳීම අවසන් කළ යුතු ය. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒ අවලංගු කිරීම සිදු කළ විට, කොමිෂන් සභාව විසින් ඒ සඳහා හේතු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම්කරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

VIII වන කොටස

කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට කරනු ලබන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු

42. (1) බැංකු පනතේ IV වන කොටසේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සම්බන්ධයෙන් මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) බැංකු පනත ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට බලපත්‍රලාභී සමාගමක් හෝ වෙනත් යම් රටක නීතියක්, අධිකාරපත්‍රයක්, ව්‍යවස්ථාවක්, සාංගමික ව්‍යවස්ථාවලියක් හෝ සමාගම සංස්ථාපිත කරන හෝ ඒ සංස්ථාපිත කිරීම අර්ථ නිරූපණය කරන වෙනත් සාධනපත්‍රයක් යටතේ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රලාභී සමාගමක්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අදහස් කරන්නේ නම්, මේ පනත ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, ඒ ඉල්ලුම්පත්‍රය කොමිෂන් සභාවට පිළිගත හැකි නම්, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස, ජනාධිපතිවරයාගේ හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මේ පනතේ විෂය පථය තුළ දක්වා ඇති සීමාවන් තුළ පනවනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බැංකු පනත යටතේ බලපත්‍රයක් ලබා දීමට කටයුතු කරන ලෙස මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතුය.

(4) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින්, මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව, මේ පනතේ දක්වා ඇති නියමයන් සම්බන්ධයෙන් සෑහීමට පත් වීමෙන් අනතුරුව, බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

43. මේ පනතේ මේ කොටස ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට නිකුත් කරන ලද බලපත්‍රයක්, එසේ නිරත වන ඒ ව්‍යාපාර කටයුතු ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස නොවන බව හෝ කරගෙන යනු ලබන ඒ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල විචක්ෂණශීලී කළමනාකරණ ඌණතාවක් ඇති බව සහ දෘශ්‍යමාන අස්ථාවරත්වයක් ඇති බව පෙනී යන බව, බලපත්‍රලාභියාට ඔහුගේ නිදහසට කරුණු කියා සිටීමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව ඔප්පු වේ නම්, කොමිෂන් සභාව විසින්, මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව ඒ බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීම, ඉවත් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

44. ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, මේ පනතේ විෂය පථය බලාත්මක කිරීම සඳහා සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමේ දී විචක්ෂණශීලී කළමනාකරණය සහ විශ්වසනීයත්වය පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අවශ්‍ය විය හැකි නියෝග, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා සහ මුදල් මණ්ඩලය විමසා, කලින් කලට සාදනු ලැබිය හැකි ය.

45. මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව, අනෙකුත් කාරණා අතර, බලපත්‍ර ප්‍රදානය කිරීම, තාවකාලිකව අත්හිටුවීම සහ අවලංගු කිරීම, අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු, සංචිත සහ ප්‍රාග්ධන අවශ්‍යතා, සංචිත අරමුදල්, ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යාම, මූල්‍යමය සහ ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය, මේ පනතේ VII වන කොටස ප්‍රකාරව අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති සමාගමක ශ්‍රේණිගත කිරීම තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව, වැරදි ක්‍රියාවක් සාධාරණ ලෙස ඔප්පු කරන ලද අවස්ථාවක හෝ කරගෙන යනු ලබන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල දෘශ්‍යමාන අස්ථාවරභාවයක් ඇති අවස්ථාවක අදාළ වන සීමා කිරීම් හා දණ්ඩන සහ අදාළ වෙනත් කාරණා පිළිබඳව විධිවිධාන සැලැස්වීමට නියෝග සාදනු ලැබිය හැකි ය:-

46. කොමිෂන් සභාව විසින්, ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස, ජනාධිපතිවරයාගේ හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අක්වෙරළ බැංකු ව්‍යාපාරයේ නිරත යම් සමාගමකට පහත සඳහන් සියලු හෝ ඇතැම් ව්‍යාපාර කරගෙන යාමට බලය දෙන ලෙස මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබිය හැකි ය:

(අ) යම් බලයලත් තැනැත්තකුගෙන් හෝ නිර්වාසික තැනැත්තකුගෙන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඉතිරි කිරීමේ තැන්පතු, කාලීන තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු භාර ගැනීම;

(ආ) යම් නිර්වාසික තැනැත්තකුගෙන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම;

(ඇ) යම් නිර්වාසික තැනැත්තකුට යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් මූල්‍ය පහසුකමක් ලබා දීම;

(ඈ) යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වෙනත් යම් අක්වෙරළ ඒකකයක් සමඟ යම් ගනුදෙනුවක නිරත වීම;

(ඉ) යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් නිර්වාසික තැනැත්තකු සමඟ වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම;

(ඊ) මේ පනත යටතේ අදහස් කරන වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම; හෝ

(උ) මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම.

47. මේ පනතේ මේ කොටස ප්‍රකාරව අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට බලපත්‍රයක් නිකුත් කොට ඇති සෑම සමාගමක් විසින් ම, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශයක් වාර්ෂිකව පිළියෙළ කරනු ලැබිය යුතුය.

48. (1) මේ පනතේ මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සෑම අක්වෙරළ සමාගමක් විසින් ම, 47 වන වගන්තියේ සඳහන් සිය මූල්‍ය ප්‍රකාශය විගණනය කොට ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා වාර්ෂිකව ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයක් පත් කරනු ලැබිය යුතු අතර, ඒ ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනය විසින් ඒ වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද, එසේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශය මඟින් ඒ අක්වෙරළ සමාගමේ අක්වෙරළ බැංකු ව්‍යාපාරය සම්බන්ධයෙන් සත්‍ය සහ සාධාරණ දැක්මක් සපයන්නේ ද යන්න සහ ඒ සමාගම අඛණ්ඩ පැවැත්මක් ඇති සමාගමක් ලෙස පවතින්නේ ද යන්න ද අනෙකුත් කාරණා අතර එහි සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) ඒ විගණන වාර්තාවේ සහතික කළ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව සිය කාර්ය ඉටු කර නොමැති බව කොමිෂන් සභාවේ අදහස වන්නේ නම්, කොමිෂන් සභාව විසින් ඒ හා සමාන තත්ත්වයක් සහ කීර්තිනාමයක් ඇති වෙනත් ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනයකින් අලුත් විගණන වාර්තාවක් ඉල්ලා සිටිය හැකි ය.

49. (1) (අ) ජාත්‍යන්තර ගණකාධිකාරීවරයන්ගේ ආයතනය විසින් විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපොහොසත්ව ඇති බව;

(ආ) ඉහත සඳහන් කරන ලද විගණන වාර්තාවෙහි යම් අප්‍රමාණවත් තත්ත්වයක් ඇති බව;

(ඇ) අදාළ සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳව සැක කිරීමට හෝ ඒ සමාගම වංචනික, අනාරක්ෂිත හෝ නුසුදුසු බැංකු පරිචයන්වල නිරත වන බවට සැක කිරීමට සාධාරණ හේතු ඇති බව; හෝ

(ඈ) අදාළ සමාගම, සිය අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී, මේ පනතේ මේ කොටස යටතේ ඇති නියමයන්ට අනුකූලව වීම පැහැර හැර ඇති බව,

පෙනී යන්නේ නම්, මේ පනතේ මේ කොටස ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කොට ඇති යම් අක්වෙරළ සමාගමක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් නිසි තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව පරීක්ෂණයක් අවසන් කර වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව, අක්වෙරළ බැංකු ව්‍යාපාරයේ නිරත ඒ බලයලත් තැනැත්තා, වංචනික, අනාරක්ෂිත හෝ නුසුදුසු බැංකු පරිචයන්වල නිරත වන බවට හෝ එහි මූල්‍ය ස්ථාවරත්වය සැක සහිත බව තහවුරු වුවහොත්, කොමිෂන් සභාව විසින්, මුදල් මණ්ඩලයේ එකඟත්වය ඇතිව, අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් යම් සීමා කිරීම් පැනවීම හෝ දණ්ඩනයක් පැනවීම හෝ සුදුසු යයි සලකනු ලබන වෙනත් කොන්දේසි පැනවීම සිදු කරනු ලැබිය හැකි ය.

50. මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කර ඇති සෑම සමාගමක් විසින් ම, අදාළ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පොත්, සටහන්, ගිණුම්, මුදල් බැඳුම්කර, වවුචර් පත්‍ර, වෙනත් ලේඛන සහ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

51. මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට යටත්ව, මුදල් මණ්ඩලය විසින්, කලින් කලට, කොමිෂන් සභාව හරහා, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා අවශ්‍ය යයි එය සලකන තොරතුරු සහ වාර්තා කැඳවිය හැකි ය.

IX වන කොටස

ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර නිශ්චය කිරීම සහ ඒ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම

52. (1) වෙනත් යම් නීතියක ඇතුළත් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ මේ කොටස යටතේ අනුමත කරනු ලැබිය හැකි ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් කරගෙන යන යම් බලයලත් තැනැත්තකුට මේ පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, කොමිෂන් සභාව විසින්, ජනාධිපතිවරයා හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විමසා, ජාතික යහපත සැලකිල්ලට ගෙන හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස, කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ අරමුණුවල සාර්ථකත්වය සාක්ෂාත් කර ගැනීම සහතික කරන්නා වූ "ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර" යනුවෙන් නම් කරනු ලැබිය හැකි ව්‍යාපාර හඳුනා ගනු ලැබිය හැකි ය.

(3) යම් ව්‍යාපාරයක් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනා ගැනීමෙන් පසුව, ඒ ව්‍යාපාරයට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ස්වකීය කටයුතු කිරීමට අදාළ වන තාක් දුරට නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මේ පනතේ මේ කොටසේ විධිවිධාන සලස්වා ඇති පරිදි, මේ පනත යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූලව ප්‍රදානය කරනු ලැබිය හැකි ය. බදු හා සම්බන්ධ නිදහස් කිරීම් සම්බන්ධයෙන් වන විට, ඒ නිදහස් කිරීම් II වන උපලේඛනයේ දක්වා ඇති සියලුම හෝ යම් නීතිවලින් සහ මුළුමනින් ම හෝ කොටසක් වශයෙන් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්, මේ පනතේ 32 වන වගන්තියේ සඳහන් කොමිෂන් සභාව සහ බලයලත් තැනැත්තා විසින් හෝ අතර හෝ අත්සන් කරනු ලැබිය යුතු ගිවිසුමේ ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ මේ කොටසේ විධිවිධාන සලස්වා ඇති පරිදි, නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, කොළඹ වරාය නගරයට ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීම සඳහා දිරිගැන්වීම් ලෙස අවශ්‍ය විය හැකි වෙනත් සහාය හෝ පහසුකම් ද සලසා දෙනු ලැබිය හැකි ය.

(7) මේ වගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරන ලද ඒ නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලසීමාව, අවුරුදු හතළිහ නො ඉක්මවිය යුතු ය.

53. (1) ව්‍යාපාරයක්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනා ගැනීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් මේ පනතේ 52 වන වගන්තිය ප්‍රකාරව ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමට සහ යම් නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමට අදාළ නිර්දේශ ජනාධිපතිවරයා වෙත හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, ඒ නිර්දේශ සලකා බලා ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, මේ පනතේ 52 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ඒ ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමට සහ ඒ ව්‍යාපාරයට නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතය ලබා ගැනීම සඳහා-

(අ) ඒ ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු;

(ආ) මේ පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් අතරින්, ඒ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට යෝජනා කරන නිශ්චිත නිදහස් කිරීම් කවරේ ද යන්න සහ වෙනත් යම් දිරිගැන්වීම්;

(ඇ) ඒ නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ආරම්භ කිරීමට යෝජිත දිනය සහ ඒ ආරම්භ වන දින සිට අවුරුදු හතළිහක් නොඉක්ම විය යුතු, ඒ නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් ක්‍රියාත්මක වීම අවසන් විය යුතු දිනය;

(ඈ) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනා ගනිමින් සිටින ව්‍යාපාරයේ ඉල්ලුම්කරුගේ නම,

පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට දැනුම් දීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(3) අමාත්‍ය මණ්ඩලය විසින්, ව්‍යාපාරයක්, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කරනු ලැබූ සහ අනුමත කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින්-

(අ) ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු;

(ආ) මේ පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් අතරින් ඒ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ වන නිශ්චිත නිදහස් කිරීම් කවරේද යන්න සහ ප්‍රදානය කරන ලද වෙනත් යම් දිරිගැන්වීම්;

(ඇ) ඒ නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් ආරම්භ වන දිනය සහ ඒවා ක්‍රියාත්මක වීම අවසන් වන දිනය; සහ

(ඈ) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස හඳුනා ගනු ලැබූ ව්‍යාපාරයේ ඉල්ලුම්කරුගේ නම,

නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වන නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට දින තිහක් ඉක්ම වූ පසු, නිවේදනයේ දක්වා ඇති නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මේ පනතේ IX වන කොටසේ විධිවිධානවලට අනුකූල වන බව තහවුරු කරමින් කොමිෂන් සභාවේ අත්සන යටතේ නිකුත් කරන ලද ලිඛිත තහවුරු කිරීමක් සමඟ ඒ නියමය දැන ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, "ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය" යන්නෙන්, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස, රටට ආර්ථික සහ සමාජයීය ප්‍රතිලාභ ගෙන ඒමට හැකියාව ඇත්තා වූ ද, නැතහොත් කොළඹ වරාය නගරයේ භූමි දර්ශනය වෙනස් කිරීමට හැකියාව ඇත්තා වූ ද, නැතහොත් මූලික වශයෙන් ම-

(අ) යෝජිත ව්‍යාපාරය හා බැඳුනු ක්‍රමෝපාය වැදගත්කම;

(ආ) ඒ ව්‍යාපාරය වෙතට හෝ ඒ ව්‍යාපාරය හරහා ජනනය කිරීමට අපේක්ෂිත ඍජු විදේශ ආයෝජනයක් ලෙස, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළට විදේශ විනිමය ගලා ඒම;

(ඇ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සේවා නියුක්තයන්ට ශ්‍රී ලංකා රුපියල්වලින් හැර නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් ආදායම් ඉපයීමේ අවස්ථා ඇති කරනු ලබන සේවානියුක්තීන් ඇති කිරීම;

(ඈ) සේවාවන් ප්‍රවර්ධනය කිරීම හෝ තොරතුරු තාක්ෂණය ඇතුළු තාක්ෂණය දියුණු කිරීම හෝ භාවිත කිරීම ප්‍රකාරව, අපේක්ෂිත දැනුම් පරිවර්තනය;

(ඉ) සංචාරක ව්‍යාපාරය, විනෝදාත්මක කටයුතු සහ සාප්පු සවාරි ක්‍රියාකාරකම් හෝ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ නේවාසික ප්‍රජාවක් පදිංචි කරවීම මඟින් නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම හරහා ශ්‍රී ලංකාව වෙතට වූ අපේක්ෂිත ගමනාන්ත ප්‍රවර්ධනය; සහ

(ඊ) යම් සංස්ථාපිත මූලස්ථාන මෙහෙයුම් සහ කලාපීය බෙදා හැරීම් මෙහෙයුම් ස්ථාපිත කිරීම මඟින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සේවාවන් ප්‍රවර්ධනය කිරීම හරහා අපේක්ෂිත ගාමක බලය ඇති කිරීම,

මඟින් ගෝලීය හෝ කලාපීය ව්‍යාපාර හෝ සේවා සම්බන්ධීකරණයන් ඇති කිරීමේ හැකියාව ඇත්තා වූ ද, කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම ඉලක්ක කරනු ලබන ව්‍යාපාරයක් අදහස් වේ.

X වන කොටස

සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත සහ බද්ධ නිවාස අයිතිකම් පනත අදාළ වීම

54. (1) මේ පනත ආරම්භ වන දින සිට හෝ ඉන්පසුව, මෙහි ඊට පටහැනිව අන්‍යාකාරයෙන් සඳහන් කරනු ලැබ ඇත්තේ නම් මිස, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත සහ බද්ධ නිවාස අයිතිකම් පනත, මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, (2) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයට සහ වෙනස් කිරීම්වලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ බලපැවැත්විය යුතු ය:

එසේ වුව ද, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත හෝ බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ සාදන ලද සහ මේ පනත ආරම්භ වන දිනයේ දී බලාත්මකව පවතින නියෝග ද මේ පනත යටතේ නියෝග සාදනු ලබන තෙක් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

එසේම තවදුරටත්, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත හෝ බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ සාදන ලද සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන යම් නියෝගයක්, මේ පනතේ මේ කොටස ප්‍රකාරව ඊට අනුරූප නියෝගයක් සෑදීමෙන් පසුව මේ පනත යටතේ සාදන ලද ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට බලාත්මක වන පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වීම නතර විය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දින සිට හෝ ඉන් පසුව, කොමිෂන් සභාව විසින්, එකී සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත සහ බද්ධ නිවාස අයිතිකම් පනත කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන යම් අවස්ථාවක දී, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය සතු වන හෝ ඊට පවරන ලද සියලු හෝ යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය එකී සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ සහ එකී බද්ධ නිවාස අයිතිකම් පනතේ-

(අ) "සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය" ට කරන ලද සඳහනක්, මේ පනත යටතේ පිහිටුවන ලද "කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව" ට කරන ලද සඳහනක්; සහ

(ආ) "අමාත්‍යවරයා" ට කරන ලද සඳහනක්, "ජනාධිපතිවරයා" ට හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ "අමාත්‍යවරයා" ට කරන ලද සඳහනක්,

පරිද්දෙන්, ඒ හා සමාන ආකාරයකින්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

55. (1) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින් මේ පනතේ නිශ්චිතව විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියේ එකඟත්වය ලබා ගත යුතු ය.

(2) සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් අවස්ථානුගත කරුණු අනුව ප්‍රමුඛතා කාරණයක් ලෙස සලකා, එහි තීරණය කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහාධිපත්‍ය දේපළ ඉදි කිරීම කඩිනම් ආකාරයෙන් සිදු කරනු ලබන බවට සහතික වීම සඳහා, කොමිෂන් සභාව විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කාර්යාලයක් පවත්වාගෙන යන ලෙසට සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරියට නියම කරනු ලැබිය හැකි ය. සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ සහ බද්ධ නිවාස අයිතිකම් පනතේ විධිවිධාන කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨතාවක් සහ අධිකාරී බලයක් සහිත නිලධරයන් විසින් ඒ කාර්යාලය කළමනාකරණය කරනු ලබන බවට සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් සහතික විය යුතු ය.

XI වන කොටස

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අදාළ වීම

56. (1) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සහ ඒ පනත යටතේ සාදනු ලබන නියෝගවල විධිවිධාන ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ මෙහෙයවනු ලබන යම් ව්‍යාපාර වස්තු හුවමාරුවක් හෝ වෙළඳපොළක් විසින් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ නිකුත් කිරීම විධිමත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා "සුරැකුම්පත්" යන්නෙන්, යම් ආණ්ඩුවක් විසින් හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් මණ්ඩලයක් විසින් හෝ නිකුත් කරන ලද නැතහොත් නිකුත් කිරීමට යෝජිත යම් අයිතිවාසිකමක්, වරණයක් හෝ (ඒකක වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විස්තර කරන ලද්දේ වුව ද) එහි හෝ ඒ පිළිබඳ වූ සම්බන්ධතාවයක් ද ඇතුළුව ණයකර, ව්‍යාපාර වස්තු, කොටස්, අරමුදල්, බැඳුම්කර, පාදක කරගනු ලබන වත්කමේ ගති ලක්ෂණ, වරණයන් සහ ස්වභාවය කුමක් වුව ද, ව්‍යුත්පන්න හෝ නෝට්ටු හෝ සුරැකුම්පත් යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන වෙනත් යම් සාධනපත්‍ර අදහස් වන අතර, එහෙත්, විනිමය බිල්පත් හෝ පොරොන්දු නෝට්ටු හෝ බැංකුවක් විසින් නිකුත් කරන ලද තැන්පතු සහතික ඊට ඇතුළත් නොවේ.

57. (1) මේ පනත ආරම්භ වන දින සිට හෝ ඉන්පසුව, මෙහි ඊට පටහැනිව අන්‍යාකාරයෙන් සඳහන් කරනු ලැබ ඇත්තේ නම් මිස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත, මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, (2) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයට සහ වෙනස් කිරීම්වලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ බලපැවැත්විය යුතු ය:

එසේ වුව ද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ සාදන ලද සහ මේ පනත ආරම්භ වන දිනයේ දී බලාත්මකව පවතින යම් නියෝගයක් ද, මේ පනතේ මේ කොටස යටතේ නියෝග සාදනු ලබන තෙක් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ සාදන ලද සහ ඉහත කී පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන යම් නියෝගයක්, මේ පනතේ මේ කොටස ප්‍රකාරව ඊට අනුරූප නියෝගයක් සෑදීමෙන් පසුව, මේ පනත යටතේ ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට බලාත්මක වන පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වීම නතර විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, මේ පනතේ මේ කොටස ප්‍රකාරව නිශ්චිතව විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට, සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ප්‍රකාරව එසේ කිරීම අවශ්‍ය යයි නියම කරනු ලබන අවස්ථාවක දී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතු වන හෝ ඊට පවරන ලද විෂයයන් සම්බන්ධයෙන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟත්වය ලබා ගත යුතු ය.

(3) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ඒ එකඟත්වය, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට සීමා කරනු ලැබිය යුතු අතර, එකී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන තේරුම් ගැනීමේ දී, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා අවශ්‍ය වන තාක් දුරට-

(අ) "සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" ට කරන ලද සඳහනක් මේ පනත යටතේ පිහිටුවන ලද "කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව" ට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය; සහ

(ආ) "අමාත්‍යවරයා" ට කරන ලද සඳහනක් "ජනාධිපතිවරයා" ට හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ "අමාත්‍යවරයා" ට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

58. (1) කොමිෂන් සභාව විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් එකඟත්වය ඉල්ලා සිටින අවස්ථාවක, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අවස්ථානුගත කරුණු අනුව, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, ප්‍රමුඛත්වය ලබාදිය යුතු කාරණයක් ලෙස සලකා, එහි තීරණය කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ව්‍යාපාර වස්තු හුවමාරු හෝ වෙළඳපළ මෙහෙයුම් කඩිනම් ආකාරයෙන් සිදු කරනු ලබන බවට සහතික වීම සඳහා කොමිෂන් සභාව විසින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කාර්යාලයක් පවත්වාගෙන යන ලෙසට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නියම කරනු ලැබිය හැකි ය. ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨතාවක් සහ අධිකාරී බලයක් සහිත නිලධරයන් විසින් ඒ කාර්යාලය කළමනාකරණය කරනු ලබන බවට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සහතික විය යුතු ය:-

XII වන කොටස

දේපළ කළමනාකරු සහ සාමාන්‍ය සේවාවන් සැපයීම

59. කොමිෂන් සභාව විසින් කලින් කලට පවරනු ලැබිය හැකි වෙනත් සේවාවන් ද ඇතුළුව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ මෙහි පහත දක්වා ඇති සේවාවන් සැපයීම සඳහා, 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කරන ලද්දා වූ ද දේපළ කළමනාකරු ලෙස නම් කරනු ලැබිය යුතු වූ ද සමාගමක් තිබිය යුතු ය.

60. දේපළ කළමනාකරු කොමිෂන් සභාවේ විධානය සහ අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබිය යුතු අතර, පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය:-

(අ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිටින බලයලත් තැනැත්තන්ට, වාසිකයන්ට, පදිංචිකරුවන්ට සහ ආගන්තුකයන්ට ගෑස්, ජලය, විදුලිය, අන්තර්ජාල සහ සන්නිවේදන පහසුකම්, මලාපවහනය සහ ජලාපවහනය, අපද්‍රව්‍ය හා කැළිකසළ බැහැර කිරීම වැනි උපයෝගීතා සේවාවන් සහ එවැනි වෙනත් පහසුකම් සැලසීමේ දී සේවා සපයන්නන්ට සහාය වීම;

(ආ) වීථි ආලෝකකරණය සහ එවැනි වෙනත් පහසුකම් පවත්වාගෙන යාම ඇතුළු සියලු පොදු ප්‍රදේශ කළමනාකරණය සහ පවත්වා ගෙන යාම;

(ඇ) මේ පනත මඟින් බලය දී ඇති පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කොමිෂන් සභාව විසින් පනවන ලද, ප්‍රදේශවලට අදාළ වරිපනම් සහ අය කිරීම් එකතු කිරීමට පහසුකම් සැලසීම සහ කළමනාකරණ ගාස්තු, උපයෝගීතා අයකිරීම්, වාහන ගාල් කිරීමේ අයකිරීම්, භාවිත කිරීමේ ගාස්තු සහ එවැනි වෙනත් ගාස්තු හෝ අයකිරීම් ඇතුළු කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන සේවාවන් සඳහා වන ගාස්තු සහ අයකිරීම්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිටින බලයලත් තැනැත්තන්ගෙන්, බලයලත් තැනැත්තන්ගේ සේවා නියුක්තයන්ගෙන්, වාසිකයන්ගෙන්, පදිංචිකරුවන්ගෙන් සහ ආගන්තුකයන්ගෙන් එකතු කිරීම;

(ඈ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ වාහන ගාල් කිරීමේ ස්ථාන වැනි පොදු භාවිත පහසුකම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම;

(ඉ) කොළඹ වරාය නගරයේ අක්වෙරළ දියකඩනය සහ වෙරළවල් අතර ඇති ජලතීරයන්, අභ්‍යන්තර ඇළ මාර්ග සහ එවැනි වෙනත් ප්‍රදේශ පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම සඳහා වගකිව යුතු වීම;

(ඊ) කොමිෂන් සභාව විසින් පනවනු ලබන සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළට අදාළ දේශීය වරිපනම්, අය කිරීම් සහ එවැනි වෙනත් ගාස්තු කොමිෂන් සභාව වෙනුවෙන් එකතු කිරීම සහ එසේ එකතු කරන ලද මුළු මුදල් ප්‍රමාණය, කොමිෂන් සභාව විසින් විධාන කරනු ලබන පරිදි බැංකු ගිණුමකට බැර කිරීම;

(උ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සපයනු ලබන සේවාවන් හි කොටසක් වන, අවශ්‍ය විය හැකි පරිදි, නැව් ජැටිගත කිරීමේ ගාස්තු අය කිරීම;

(ඌ) සංවර්ධන පාලන නියෝගවලට අනුකූලවීමට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ බලයලත් තැනැත්තන්ගේ, බලයලත් තැනැත්තන්ගේ සේවා නියුක්තයන්ගේ, නේවාසිකයන්ගේ, පදිංචිකරුවන්ගේ සහ ආගන්තුකයන්ගේ සියලු ආකාරයේ කැළිකසළ දිනපතා එකතු කිරීම, වෙන් කිරීම සහ ඉවත් කිරීම සහ බැහැර කිරීම සහතික කරනු ලබන අතරතුර, කාර්යක්ෂම සහ ඵලදායී කැළිකසළ එකතු කිරීමේ සහ බැහැර කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු වීම සහ අවශ්‍ය අවස්ථාවල දී බාහිර ප්‍රභවයන්ට ලබා දීමේ ගිවිසුම් ඇතුළු යම් තෙවන පාර්ශ්වයක් සමග යම් අදාළ ගිවිසුම්වලට ඇතුළත් වීම;

(එ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති මාර්ග හෝ ප්‍රවේශ මාර්ග සම්බන්ධයෙන් වන සියලු කාරණා අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීම සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිටින බලයලත් තැනැත්තන්, බලයලත් තැනැත්තන්ගේ සේවානියුක්තයන්, වාසිකයන්, පදිංචිකරුවන් සහ ආගන්තුකයන්ගේ පහසුකම් සහ සුභසාධනය සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම; සහ

(ඒ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිටින බලයලත් තැනැත්තන්, බලයලත් තැනැත්තන්ගේ සේවානියුක්තයන්, වාසිකයන්, පදිංචිකරුවන් සහ ආගන්තුකයන් වඩාත් හොඳින් කළමනාකරණය කිරීම සහ ඔවුන්ගේ සුභසාධනය උදෙසා කොමිෂන් සභාව විසින් විධානය කරනු ලැබිය හැකි වෙනත් දේ කිරීම.

61. දේපළ කළමනාකරු බලයලත් තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත ප්‍රකාරව නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තකුගේ සියලු ප්‍රතිලාභ සහ වරප්‍රසාදවලට ඔහු හිමිකම් ලබන්නේ ය.

XIII වන කොටස

ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය

62. (1) සමාදාන කිරීම, සමථකරණය, විනිශ්චය කිරීම, බේරුම් කිරීම සහ වෙනත් යම් විකල්ප ආරාවුල් නිරවුල් කිරීමේ සේවාවන් සැපයීමේ කාර්ය සඳහා, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස සංස්ථාපිත කරනු ලැබිය යුතු හා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ස්ථානගත කළ යුතු ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට කොමිෂන් සභාව විසින් පහසුකම් සලසනු ලැබිය යුතුය.

(2) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ-

(අ) කොමිෂන් සභාව සහ බලයලත් තැනැත්තකු හෝ අදාළ වන අවස්ථාවක, බලයලත් තැනැත්තකුගේ සේවා නියුක්තයකු අතර; සහ

(ආ) කොමිෂන් සභාව සහ වාසිකයකු හෝ පදිංචිකරුවකු අතර යම් ගිවිසුමක් හෝ වෙනත් නීතිමය බැඳීමක් ඇති ලේඛනයක් ඇත්නම්, කොමිෂන් සභාව සහ ඒ වාසිකයා හෝ පදිංචිකරු අතර,

ඇතිවිය හැකි යම් ආරාවුලක් (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන බේරුම්කරණය මාර්ගයෙන් විසඳා ගනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව යම් බලයලත් තැනැත්තකු විසින් එළඹෙන ලද සියලුම ගිවිසුම්වල, ඒ ගිවිසුම් යටතේ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇතිවිය හැකි යම් ආරාවුලක් මේ වගන්තිය ප්‍රකාරව අනිවාර්යයෙන් ම බේරුම්කරණය සඳහා යොමු කළ යුතු බවට නියම කෙරෙන විධිවිධානයක් ඇතුළත් විය යුතු බවට සෑම බලයලත් තැනැත්තකු විසින් ම වග බලා ගනු ලැබිය යුතු ය.

(4) සමාදාන කිරීම, සමථකරණය, විනිශ්චය කිරීම, බේරුම් කිරීම සහ ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයෙන් ප්‍රදානය කරනු ලබන වෙනත් යම් විකල්ප ආරාවුල් නිරවුල් කිරීමේ සේවාවන් සඳහා කාර්ය පටිපාටිමය රීති සෑදීමට හෝ යොදා ගැනීමට ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයට හිමිකම ඇත්තේ ය.

(5) මේ පනත යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානය මඟින් කරනු ලබන යම් බේරුම්කරණ ප්‍රදානයක් 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනතේ විධිවිධානවලට අනුව බලාත්මක කිරීම හෝ අවලංගු කිරීම සිදු කරනු ලැබිය යුතුය.

(6) ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු විසින් (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර වාණිජ ආරාවුල් නිරවුල් කිරීමේ මධ්‍යස්ථානයේ කටයුතු හෝ යම් ක්‍රියාකාරකම්වල කවර හෝ තත්ත්වයකින් සේවය කරනු ලැබිය හැකි අතර, ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් වෘත්තිකයකුට ද එසේ සම්බන්ධ විය හැකි ය.

XIV වන කොටස

නඩු කටයුතු විභාග කිරීමේ පූර්වතාව

63. ජාතික යහපත පිණිස හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස ව්‍යාපාර කටයුතු පහසු කිරීමේ දී සහ ගිවිසුම් බලාත්මක කිරීමේ දී ජාත්‍යන්තර විශ්වාසය වර්ධනය කිරීම පිණිස, නඩු නිමිත්ත කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ උද්ගත වන හෝ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් උද්ගත වන අවස්ථාවක දී, යම් සිවිල් හා වාණිජ කාරණා සම්බන්ධයෙන් පවරන ලද යම් නඩු කටයුතුවලට අදාළව, අධිකරණය විසින් වාර්තා කරනු ලැබිය යුතු හේතු මත, නඩු විභාගය ආරම්භ කිරීම හෝ නඩු විභාගය පවත්වාගෙන යාම කල් දැමීම විශේෂ අවස්ථානුගත කරුණු හේතුවෙන් සුදුසු බව අධිකරණයේ මතය වන්නේ නම් මිස, ඒ නඩු කටයුතු දෛනික පදනමෙන් වේගවත්ව විභාග කිරීම සඳහා අධිකරණය විසින් පූර්වතාවක් ලබා දිය යුතු ය.

XV වන කොටස

අන්තර්කාලීන විධිවිධාන සහ ආයෝජන ආරක්ෂාව

64. (1) කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවල දී, අන්තර්කාලීන පියවරක් ලෙස, මේ පනත ආරම්භ වන දින සිට අවුරුදු පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා, ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ශ්‍රී ලංකාවේ යම් නම් කරනු ලබන ස්ථානයක සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට, යම් බලයලත් තැනැත්තකුට අවසර දෙනු ලැබිය හැකි ය. ඒ ව්‍යාපාරය විසින් ඒ අවුරුදු පහක කාලසීමාව සඳහා, දෙනු ලබන සියලු වරප්‍රසාදවලට හිමිකම් ලැබිය යුතු අතර, සියලු කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ව්‍යාපාරයක් ලෙස සහ ඒ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරතවන ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත, ශ්‍රී ලංකාවේ යම් නම් කරනු ලබන ස්ථානයක සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට යම් බලයලත් තැනැත්තකුට අවසර දී ඇති අවස්ථාවක, ඒ ව්‍යාපාරය, මේ පනතේ විධිවිධානවලට සහ මේ යටතේ සාදන ලද යම් නියෝගවලට යටත් විය යුතු ය.

65. (1) මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන්පසුව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අයත් වන සියලු ඉඩම්, (3) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය විසින්, මේ පනත ආරම්භ වීමට පෙරාතුව, යම් පැවරුම් ඔප්පුවක්, බදු ඔප්පුවක්, ගිවිසුමක් හෝ එවැනි වෙනත් සමාන ලේඛනයක් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති යම් ඉඩමක් සම්බන්ධයෙන් ලියා අත්සන් කර ඇති අවස්ථාවක, ඒ පැවරුම් ඔප්පුව, බදු ඔප්පුව, ගිවිසුම හෝ වෙනත් සමාන ලේඛනය, මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන්පසුව සියලු කාර්ය සඳහා, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ලියා අත්සන් කරනු ලැබූ ලේඛනයක් ලෙස සැලකිය යුතු අතර, එය මේ යටතේ ලියා අත්සන් කරනු ලැබුවාක් මෙන් වලංගු හා බලාත්මක විය යුත්තේ ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව ජනාධිපතිවරයා විසින්, මේ පනතේ I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය සමන්විත වන සියලු ඉඩම් සම්බන්ධයෙන්, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනත යටතේ කොමිෂන් සභාව නමට ඉඩම් ප්‍රදානයක් කරනු ලැබිය හැකි බවට සැක දුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් සඳහන් කරනු ලැබේ.

66. මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩලය පනත සහ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන ආයෝජනයකට අදාළව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් යම් ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවක සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන ආයෝජනයකට අදාළව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව ගැසට් පත්‍රයේ නියමයක් පළ කරනු ලැබ ඇති අවස්ථාවක, මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, සියලු කාර්ය සඳහා, පිළිවෙලින්, මේ පනතේ 32 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් එළඹෙන ලද ගිවිසුමක් ලෙස සහ මේ පනතේ IX වන කොටස යටතේ පළ කරන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එය මේ යටතේ ක්‍රියාත්මක වූ ලෙස වලංගු හා බලාත්මක විය යුත්තේ ය.

67. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත ප්‍රකාරව ප්‍රදානය කරන ලද කිසිදු ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක්, අවසර පත්‍රයක් හෝ වෙනත් යම් අනුමතයක්, හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් පැවරුම් ඔප්පුවක්, බදු ඔප්පුවක් හෝ ගිවිසුමක් ඒ ලියාපදිංචි කිරීමේ, බලපත්‍රයේ, බලය ලබාදීමේ, අවසර පත්‍රයේ හෝ වෙනත් අනුමතයේ, හෝ ඒ පැවරුම් ඔප්පුවේ, බදු ඔප්පුවේ හෝ ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති කාලපරිච්ඡේදය හෝ කාලසීමාව ඉකුත් වීමෙන් හෝ අවසන් වීමෙන් පසුව හැර, අදාළ ආයෝජකයාගේ යහපතට අගතිදායක වන යම් ආකාරයකට අවසන් කිරීම හෝ සංශෝධනය කිරීම සිදු නොකළ යුතු ය:

එසේ වුව ද-

(අ) අදාළ පාර්ශ්ව අතර ඇති වන ගිවිසුමක් මත;

(ආ) අදාළ ලේඛනයේ අන්තර්ගත නියමයක් හෝ කොන්දේසියක් කඩ කිරීමේ හේතුවෙන්; හෝ

(ඇ) මේ පනතේ ඇතුළත්, අවසන් කිරීම සඳහා විධිවිධාන සලසා ඇති යම් ප්‍රකාශිත විධිවිධානයක් හේතුවෙන්,

කලින් අවසන් කිරීම හෝ සංශෝධනය කිරීම සිදුවිය හැකි ය.

XVI වන කොටස

විවිධ විධිවිධාන

68. (1) වෙනත් යම් නීතියක අන්තර්ගත විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ-

(අ) මේ පනත ප්‍රකාරව, පිහිටුවීම, ආරම්භ කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් යම් අනුමතයක් අවශ්‍ය වන යම් ව්‍යාපාරයක්, එවැන්නක් ලබා නොගෙන පිහිටුවන, ආරම්භ කරන හෝ ක්‍රියාත්මක කරන;

(ආ) මේ පනත ප්‍රකාරව ප්‍රදානය කරන ලද යම් ලියාපදිංචි කිරීමක, බලපත්‍රයක, බලය ලබා දීමක හෝ වෙනත් යම් අනුමතයක ඇති යම් විධිවිධානයක් කඩ කරමින් බලයලත් තැනැත්තකු ලෙස ව්‍යාපාර කටයුතුවල නිරත වන;

(ඇ) මේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලුම් පත්‍රයක, යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් සාවද්‍ය හෝ නොමඟ යවනසුලු බවට තමා දන්නා යම් නියෝජනයක් හෝ ප්‍රකාශයක් කරනු ලබන;

(ඈ) මේ පනත ප්‍රකාරව හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක් ප්‍රකාරව, යම් තොරතුරක්, ලේඛන හෝ විස්තර ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට නියම කරනු ලබන විට, සාවද්‍ය තොරතුරු, ලේඛන හෝ විස්තර ඉදිරිපත් කරනු ලබන; හෝ

(ඉ) මේ පනත ප්‍රකාරව සාදනු ලබන යම් නියෝගයක් කඩකරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන,

යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියන එකකට අඩු නොවන සහ රුපියල් මිලියන පහකට වැඩි නොවන දඩයකට හෝ මාස තුනකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. තව ද, ඒ දඩයේ ප්‍රමාණය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව තීරණය කිරීමේ දී, කරන ලද වරදේ බරපතළ ස්වභාවය අධිකරණය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් සිය අභිමතය මත, ඒ තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, නියමිත ලියාපදිංචි කිරීම, බලපත්‍රය, බලය ලබා දීම හෝ ඒ වෙනත් අනුමතය ලබා නොගෙන නිරතව සිටියා වූ ද දැනට නිරත වීම තහනම් කොට ඇත්තා වූ ද ඒ ව්‍යාපාරය, ඔහු විසින් නියමිත ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් අනුමතයක් ලබා ගන්නා තෙක්, නිශ්චිතව දක්වනු ලැබිය යුතු කාලසීමාවක් සඳහා වහාම බලාත්මක වන පරිදි නිරත වීමෙන් වළකින ලෙසට වූ අතිරේක නියමයක් කරනු ලැබිය හැකි ය.

(3) (අ) වෙනත් යම් නීතියක අන්තර්ගත විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක විධිවිධානයක් කඩකරන හෝ ඊට අනුකූල වීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහකට අඩු නොවන සහ රුපියල් මිලියන එකකට වැඩි නොවන දඩයකට හෝ මාස තුනකට අඩු නොවන සහ අවුරුදු එකක් නොඉක්මවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(ආ) අධිකරණය විසින් ඊට අමතරව, ඒ දඩය නොගෙවා පවතින එක් එක් දිනය සඳහා රුපියල් ලක්ෂ පහක් නො ඉක්මවන නොකඩවා අය වන දඩයක් පැනවිය හැකි ය.

69. බලයලත් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් මේ පනත ප්‍රකාරව යම් වරදක් කරනු ලබන අවස්ථාවක-

(අ) ඒ බලයලත් තැනැත්තා හෝ තැනැත්තන් සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු ම;

(ආ) ඒ බලයලත් තැනැත්තා හෝ තැනැත්තන්, හවුල් ව්‍යාපාරයක් නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ඒ බලයලත් තැනැත්තා හෝ තැනැත්තන්, හවුල් ව්‍යාපාරයක් නොවන, සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම්, ඒ මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම,

ඒ වරද සිදු කර ඇති බවට සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ හවුල් ව්‍යාපාරයේ බලයලත් තැනැත්තා හෝ තැනැත්තන් හෝ ඒ සංස්ථාගත නොකළ මණ්ඩලයේ සාමාජිකයා විසින්, ඒ වරද සිය දැනුම නොමැතිව සිදු කළ බව හෝ ඔහු ඒ වරද සිදුවීම වැළැක්වීම සඳහා නිසි උද්යෝගයෙන් කටයුතු කළ බව ඔප්පු කරන්නේ නම්, ඔහු ඒ වරද සිදුකර ඇති බවට සලකනු නොලැබිය යුතු ය.

70. (1) යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාව ඔහු වෙත පනවන ලද යම් අධිභාරයක් හෝ දණ්ඩනයක් ගෙවීම පැහැර හරින අවස්ථාවක, නියම කරනු ලබන පරිදි කොමිෂන් සභාව විසින් සිය අත්සන යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) ඒ සහතිකයේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර සහ පැහැර හරින ලද තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළත් විය යුතු ය.

(3) ඒ සහතිකයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, ඒ සහතිකය තැපැල් කිරීමෙන් දින දහහතරක් ඇතුළත, ඒ සහතිකය අවලංගු කරන ලෙස හෝ වෙනස් කරන ලෙස ඉල්ලීමක් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව යම් ඉල්ලීමක් කර නැත්නම්, එසේ සහතික කරන ලද මුදල් ප්‍රමාණය, ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවට ගෙවිය යුතු ණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එය කොමිෂන් සභාව විසින් දිසා අධිකරණය වෙත සහතිකයක් නිකුත් කිරීම මඟින් අය කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය ප්‍රකාරව වූ ඉල්ලීමකට (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ විය යුතු ය.

71. (1) ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකුට පවරනු ලබන අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාව සහ යම් අදාළ නියාමන අධිකාරියක් විමසා, නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු බවට මේ පනතින් නියමිත හෝ නියෝග සාදනු ලැබීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත දක්වා ඇති සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් ද නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ වන සංවර්ධන පාලන නියෝග නියම කිරීම;

(ආ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ජ) ඡේදයේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ විය යුතු, දේශීය තක්සේරු වරිපනම් සහ වෙනත් අයබදු කාණ්ඩ සහ වරිපනම් සහ වෙනත් අයබදු වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණ හඳුනා ගැනීම;

(ඇ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ට) ඡේදයේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර වස්තු, වටිනා ලෝහ හෝ භාණ්ඩ හුවමාරු හෝ වෙළඳපොළවල් පිහිටුවීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සහ ඒවා අලෙවි කිරීමේ දී බලයලත් තැනැත්තන්ට අදාළ වන නියම සහ කොන්දේසි නිශ්චිතව දැක්වීම;

(ඈ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (උඅ) ඡේදයේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සූදු ක්‍රීඩා කටයුතු සඳහා ඇති ස්ථානවල අංග ලක්ෂණ හඳුනා ගැනීම, සූදු ක්‍රීඩා කටයුතු කරගෙන යා යුතු හෝ ක්‍රියාත්මක කළ යුතු ආකාරය නිශ්චිතව දැක්වීම සහ අවශ්‍ය විය හැකි පරිදි, බලපත්‍රයක් ලබා ගැනීමේ කාර්ය පටිපාටිය සහ ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු, රාජ්‍යභාග සහ අදාළ වෙනත් කාරණා නිශ්චිතව දැක්වීම;

(ඉ) 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌඅ) ඡේදය ප්‍රකාරව, සහාධිපත්‍ය දේපළ කළමනාකරණය සහ බද්ධ නිවාස අයිතිකම් යන විෂයයන් සම්බන්ධයෙන් දේපළ කළමනාකරුට පවරනු ලැබිය හැකි හෝ භාර කරනු ලැබිය හැකි කර්තව්‍ය හෝ ඒ වගන්තියේ කාර්යය සඳහා අමතර වශයෙන් නියම කරනු ලැබිය හැකි කර්තව්‍ය නිශ්චිතව දැක්වීම;

(ඊ) 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයේ ආකෘතිය සහ ඉල්ලීමක් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(උ) 27 වන වගන්තියේ (5) වන උපවගන්තියේ කාර්ය සඳහා, අදාළ විය හැකි කොන්දේසි නිශ්චිතව දැක්වීම;

(ඌ) 28 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා සහ ඒ ඡේදය ප්‍රකාරව නිරත වන ව්‍යාපාරයේ ස්වභාවය සැලකිල්ලට ගෙන අදාළ ලියාපදිංචිය, බලපත්‍රය, බලය ලබාදීම හෝ වෙනත් අනුමතය ප්‍රදානය කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු නිශ්චිතව දැක්වීම;

(එ) 36 වන වගන්තියේ කාර්ය සඳහා, ඒ ශ්‍රී ලංකා රුපියල්, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කිරීමේ දී අදාළ වන කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(ඒ) 37 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු සමඟ ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ව්‍යාපාර කටයුතු කිරීමට අදහස් කරන බලයලත් තැනැත්තකුට අදාළ වන නියම සහ කොන්දේසි සහ දේශීය ආර්ථිකයේ යහපත පිණිස ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත තැනැත්තකුට හෝ සමාගමකට සපයනු ලැබිය නොහැකි හෝ සලසනු ලැබිය නොහැකි භාණ්ඩ හෝ සේවා නිශ්චිතව දැක්වීම;

(ඔ) 39 වන වගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකා රුපියල් නොවන, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ලැබුණු මුදල් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සහ පවත්වාගෙන යනු ලබන නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට ප්‍රේෂණය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(ඕ) 40 වන වගන්තියේ කාර්ය සඳහා, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සිල්ලර වෙළඳ පහසුකම්වලින් මිලදී ගනු ලැබූ භාණ්ඩ සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු හෝ වාසිකයකු විසින් ගෙවනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය හැකි යම් අය කිරීමක් සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ඇති භෝජනාගාර, සිනමාහල්, විනෝදාත්මක පහසුකම්, සාප්පු සවාරි පහසුකම් හෝ වාහන ගාල් කිරීමේ පහසුකම් හා සම්බන්ධ සිල්ලර වෙළඳ පහසුකම් හා සේවාවන් භාවිත කිරීමේ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් හෝ වාසිකයකු විසින් කරනු ලබන ගෙවීම් වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කිරීමේ දී අදාළ වන කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම;

(ක) 41 වන වගන්තියේ (6) වන උපවගන්තියේ කාර්ය සඳහා, මේ පනත යටතේ අක්වෙරළ සමාගම් සම්බන්ධයෙන් අදාළ විය යුතු කාර්යපටිපාටිය, නියම සහ කොන්දේසි නිශ්චිතව දැක්වීම;

(ග) 44 වන වගන්තියෙන් නියම කොට ඇති පරිදි, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට කරනු ලබන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල විචක්ෂණශීලී කළමනාකරණය සහ විශ්වසනීයත්වය පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා වන මාර්ගෝපදේශ නිශ්චිතව දැක්වීම;

(ච) 45 වන වගන්තියේ කාර්ය සඳහා, අක්වෙරළ බැංකු කටයුතුවල නිරත තැනැත්තන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම, ඒවා තාවකාලිකව අත්හිටුවීම සහ අවලංගු කිරීම, ප්‍රාග්ධන අවශ්‍යතා, සංචිත අරමුදල්, ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යාම, මූල්‍යමය සහ ක්‍රියාකාරී අවදානම් කළමනාකරණය, සමාගමේ ශ්‍රේණිගත කිරීම තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව සහ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සීමා කිරීම් සහ දණ්ඩන නිශ්චිතව දැක්වීම;

(ජ) 52 වන වගන්තියේ කාර්ය සඳහා ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම හා සම්බන්ධ මාර්ගෝපදේශ නිශ්චිතව දැක්වීම;

(ට) මේ පනතේ X වන කොටස ප්‍රකාරව, බදු දීම සඳහා හෝ නිදහසේ භුක්ති විඳිය හැකි පදනම මත පැවරීම සඳහා සහාධිපත්‍ය කොටස් ඉදිකිරීමට අදාළ කාර්යපටිපාටිය සහ වෙනත් අදාළ කාරණා නිශ්චිතව දැක්වීම;

(ඩ) මේ පනතේ XI වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු කාරණා නිශ්චිතව දැක්වීම;

(ණ) 64 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාව තුළ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත, ව්‍යාපාර කටයුතුවල නිරත වීමට බලයලත් තැනැත්තකුට අවසර දී ඇති අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය සහ අදාළ වන යම් සීමා කිරීම් නිශ්චිතව දැක්වීම; සහ

(ත) 70 වන වගන්තිය ප්‍රකාරව, යම් තැනැත්තකු විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ, අධිභාරයක් හෝ දණ්ඩනයක් ලෙස කොමිෂන් සභාවට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් නියම කිරීම.

(3) මේ පනත යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ පනත යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක කාලසීමාවක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව රැස් නොවීම හේතු කොටගෙන ඒ නියෝගය එසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වළක්වනු ලැබුවහොත්, පසුව එළඹෙන මුල් අවස්ථාවේ දී ම එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ නියෝගය යටතේ ඊට පෙරාතුව කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

72. මේ පනත යටතේ සාදනු ලබන සියලු රීති, ඒ රීති සකස් කිරීමේ සිට මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

73. මේ පනතේ III වන උපලේඛනයේ ලැයිස්තුගත කොට ඇති පනත්, ඒ පනත්වලට විෂයය වන කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනතේ විධිවිධාන සලසා ඇති බැවින් හෝ විකල්ප නීතිමය වැඩපිළිවෙළ මේ පනතේ නිශ්චිතව දක්වා ඇති බැවින් හෝ ඒ පනත් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළට අදාළ නොවන සහ අදාළ වීම අවශ්‍ය නොවන බැවින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ නොවිය යුතු ය.

74. මේ පනතේ අන්‍යාකාරයකින් නිශ්චිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනතේ සඳහන් කිසිවක් මඟින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළව යම් ලිඛිත නීතියක් මඟින් යම් නියාමන අධිකාරියක් වෙත පවරනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය කවර හෝ ආකාරයකින් පරිසීමා කරනු ලබන ලෙස සලකනු නොලැබිය යුතු ය.

75. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ

"බද්ධ නිවාස අයිතිකම් පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත අදහස් වේ;

"අදාළ ලිඛිත නීතිය" යන්නෙන්, මේ පනතේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව දක්වා ඇත්නම් මිස, ශ්‍රී ලංකාවේ සියලු ලිඛිත නීති අදහස් වේ;

"බලයලත් තැනැත්තා" යන්නෙන්, කොමිෂන් සභාව විසින්, සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, මේ පනත ප්‍රකාරව අවශ්‍ය වන ලියාපදිංචියක්, බලපත්‍රයක්, බලය ලබා දීමක් හෝ වෙනත් යම් අනුමතයක් නිකුත් කරනු ලැබ හෝ ප්‍රදානය කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"බැංකු පනත" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ;

"ආයෝජන මණ්ඩල පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත අදහස් වේ;

"ආයෝජන මණ්ඩලය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ;

"ව්‍යාපාරය" යන්නෙන්, මේ පනතින් අවසර දෙනු ලබන පරිදි, මූල්‍යමය සේවා හෝ මූල්‍යමය නොවන සේවා සපයන ව්‍යාපාරයක් සහ අක්වෙරළ ව්‍යාපාරයක් ද ඇතුළුව ඕනෑම ආකාරයක නීත්‍යනුකූල ව්‍යාපාරයක් අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්නෙන්, (451 වන අධිකාරය වූ) පුරවැසි පනතේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ පුරවැසියකු අදහස් වේ;

"පොදු ප්‍රදේශ" යන්නෙන්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති-

(අ) ඇලවල් සහ කළපු;

(ආ) උද්‍යාන සහ ප්‍රජා පහසුකම් සහිත ප්‍රදේශ; සහ

(ඇ) වෙරළ සහ භූමි දර්ශනය,

සහ පොදු ප්‍රදේශයක් ලෙස කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් යම් ප්‍රදේශයක් අදහස් වේ;

"ප්‍රජා රීති" යන්නෙන්, සහජීවනය පවත්වා ගෙන යාම තහවුරු කිරීමේ සහ සුසංයෝගී ජීවන පරිසරයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සභාධිපත්‍ය කොටස් හෝ පරිශ්‍රවල හිමිකරුවන් සහ පදිංචිකරුවන් විසින් අනුගමනය කරනු ලැබිය යුතු වූ, කොමිෂන් සභාව විසින් කලින් කල සකස් කරනු ලබන මාර්ගෝපදේශ සහ උපදෙස් නිශ්චිතව සඳහන් කරන රීති අදහස් වේ;

"සමාගම" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද යම් සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් හෝ යම් නීතියක්, අධිකාර පත්‍රයක්, ව්‍යවස්ථාවක් හෝ සමාගමක් සංස්ථාපනය කරන හෝ එසේ සංස්ථාපනය කිරීම අර්ථ දක්වන යම් සාධනපත්‍රයක් යටතේ වෙනත් යම් අධිකරණ බලප්‍රදේශයක සංස්ථාගත කරන ලද සමාගමක් ඇතුළත් වේ;

"සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත අදහස් වේ;

"සහාධිපත්‍ය කොටස" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන ජාතික රාජ්‍ය සභාවේ බද්ධ නිවාස අයිතිකම් පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"නම් කරන ලද විදේශ ව්‍යාවහාර මුදල" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ 25 වන වගන්තියේ කාර්ය සඳහා මුදල් මණ්ඩලය විසින් "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලක්" ලෙස නිශ්චය කරනු ලබන විදේශ ව්‍යවහාර මුදලක් අදහස් වේ;

"සංවර්ධන පාලන නියෝග" යන්නෙන්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයට අදාළ වන්නා වූ සහ කොළඹ වරාය නගරයේ ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ සංවර්ධන අරමුණු සහ රාමුව ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා, කොමිෂන් සභාව විමසා ජනාධිපතිවරයා විසින් හෝ කොළඹ වරාය නගරය විෂයය අමාත්‍යවරයකු වෙත පවරනු ලැබ ඇති අවස්ථාවක දී ඒ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන සංවර්ධන පාලන නියෝග අදහස් වේ;

"රජයේ අලෙවි කළ හැකි ඉඩම්" යන්නෙන්, රජය විසින් නේවාසික, වාණිජමය, විනෝදාත්මක, අධ්‍යාපනික, සංස්කෘතික, ප්‍රජා පාදක සංවර්ධන කටයුතු සහ ඒ හා සමාන සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ලබා දෙන කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි ගොඩකරන ලද ඉඩම් ප්‍රමාණය අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන්, මුදල් මණ්ඩලය විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, 1988 අංක 30 දරන බැංකු පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ;

"ප්‍රධාන සැලැස්ම" යන්නෙන්, කොළඹ වරාය නගරයේ අනාගත සංවර්ධනය මාර්ගෝපදේශනය කිරීම සඳහා සංකල්පනාත්මක සැකැස්ම සපයන කොළඹ වරාය නගරයේ සැලැස්ම අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"නිර්වාසිකයා" යන්නෙන්, වාසික තැනැත්තකු නොවන තැනැත්තකු අදහස් වේ;

"අක්වෙරළ බැංකු ව්‍යාපාරය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන සලසා ඇති හෝ නියම කරනු ලැබිය හැකි පරිදි මිස, ශ්‍රී ලංකා රුපියල්වලින් හැර යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ගෙවනු ලබන, මේ පනත යටතේ අවසර දී ඇති පරිදි යම් බලයලත් තැනැත්තකු විසින් බැංකු හෝ මූල්‍යමය සේවාවන් සැපයීම අදහස් වේ;

"අක්වෙරළ ව්‍යාපාරය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි හෝ නියම කරනු ලැබිය හැකි පරිදි මිස, ශ්‍රී ලංකා රුපියල්වලින් හැර වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි, මේ පනත ප්‍රකාරව විධිවිධාන සලසා ඇති පරිදි බලයලත් තැනැත්තකු විසින් මූල්‍යමය සේවා ඇතුළු සේවා සැපයීම අදහස් වේ;

"තැනැත්තා" යන්නට, ස්වාභාවික තැනැත්තකු, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් අධිකරණ බලප්‍රදේශයක නීති යටතේ වලංගු ලෙස පිහිටුවා ඇති සමාගමක්, හවුල් ව්‍යාපාරයක්, සීමාසහිත හවුල් ව්‍යාපාරයක් සහ පදනමක් ඇතුළත් වේ;

"ව්‍යාපෘති සමාගම" යන්නෙන්, කොළඹ වරාය නගරය සංවර්ධනය කරන්නා අදහස් වේ;

"ව්‍යාපෘති සමාගමේ අලෙවි කළ හැකි ඉඩම්" යන්නෙන්, ව්‍යාපෘති සමාගම විසින් නේවාසික, වාණිජමය, විනෝදාත්මක සහ විවේකය පදනම් වූ සංවර්ධන කටයුතු සහ ඒ හා සමාන සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා, නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද ප්‍රධාන බදු ගිවිසුම් මඟින් ව්‍යාපෘති සමාගම වෙත ලබා දෙන ලද කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ පිහිටි, ගොඩ කරන ලද ඉඩම් ප්‍රමාණය අදහස් වේ;

"නියාමන අධිකාරිය" යන්නට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආගමන සහ විගමන පාලක ජනරාල්වරයා, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ මේ පනතින් ආවරණය වන විෂයයන් වන්නා වූ ද, යම් අදාළ ලිඛිත නීතියක් යටතේ ඒ විෂයයන් හා සම්බන්ධ බලතල, කාර්ය සහ කර්තව්‍ය පවරනු ලැබ ඇත්තා වූ හෝ භාර කොට ඇත්තා වූ ද වෙනත් යම් නියාමන අධිකාරියක් හෝ අනුමත කිරීමේ අධිකාරියක් ඇතුළත් වේ;

"සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව, සමාගම් ලියාපදිංචි කිරීමේ කර්තව්‍යය ක්‍රියාත්මක කරන, කරන හෝ ඉටු කරන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ වෙනත් යම් නිලධරයකු අදහස් වේ;

"වාසිකයා" යන්නට-

(අ) ශ්‍රී ලංකාවේ වාසය කරන ශ්‍රී ලංකාවේ පුරවැසියකු;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන, එහෙත් අවම වශයෙන් මාස හයක් ශ්‍රී ලංකාවේ සිටින සහ ශ්‍රී ලංකාවේ නොකඩවා සිටීමට අදහස් කරන පුද්ගලයකු;

(ඇ) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ සමාගමක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද සංස්ථාපිත මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකාව තුළ ඇති ව්‍යාපාර ආයතනයක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් සංවිධානයක්;

(ඈ) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන, යම් විදේශීය රටක නීති යටතේ පිහිටුවන ලද සමාගමක ශාඛාවක්, පාලිත සමාගමක්, අනුබද්ධිත සමාගමක්, ඒ සමාගමේ දිගුවක්, කාර්යාලයක් හෝ වෙනත් ඒකකයක් හෝ වෙනත් නෛතික තැනැත්තකු,

ඇතුළත් වේ;

"සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත" යන්නෙන්, 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත අදහස් වේ; සහ

"නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.

76. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

I වන උපලේඛනය

කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපයේ බල ප්‍රදේශයේ මායිම්

මැතුම්පති විසින් පිළියෙළ කරන ලද 2019.06.11 දිනැති අංක CO/DSO/2019/370 දරන අනුරේඛනයේ නිරූපණය කර ඇති, බස්නාහිර පළාතේ, කොළඹ, මෙහි පහත දැක්වෙන සම්බන්ධ කිරීමේ ලක්ෂ්‍යයන්හි පිහිටා ඇති සහ කැබලි අංක 2 සිට කැබලි අංක 7 ලෙස සලකුණු කොට ඇති හෙක්ටයාර් 446.6153කින් සමන්විත "කොළඹ වරාය නගරය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය පහත දැක්වෙන පරිදි මායිම් වී ඇත:-

සම්බන්ධ වන ලක්ෂ්‍යය - කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම්	නැගෙනහිර බණ්ඩාංක	උතුරු බණ්ඩාංක
උතුරින් සම්බන්ධ වන ලක්ෂ්‍යය	396913.476	492847.764
දකුණින් සම්බන්ධ වන ලක්ෂ්‍යය	397077.037	492290.222

1. **කැබලි අංක 2 : ප්‍රමාණය : හෙක්. 155.8376**

උතුරට	:	කැබලි අංක 6 සහ 1, කොළඹ වරාය සහ චෛත්‍යය පාර;
නැගෙනහිරට	:	කැබලි අංක 1, කොළඹ වරාය, චෛත්‍යය පාර, ඉන්දියානු සාගරය සහ කැබලි අංක 7;
දකුණට	:	ඉන්දියානු සාගරය, කැබලි අංක 7, 6 සහ 3;
බස්නාහිරට	:	කැබලි අංක 6. 3 සහ 6.

2. **කැබලි අංක 3 : ප්‍රමාණය : හෙක්. 15.0933**

උතුරට	:	කැබලි අංක 2;
නැගෙනහිරට	:	කැබලි අංක 2 සහ 6;
දකුණට	:	කැබලි අංක 6 සහ 4;
බස්නාහිරට	:	කැබලි අංක 4 සහ 6.

3. **කැබලි අංක 4 : ප්‍රමාණය : හෙක්. 113.5311**

උතුරට	:	කැබලි අංක 6 සහ 3;
නැගෙනහිරට	:	කැබලි අංක 3 සහ 6;
දකුණට	:	කැබලි අංක 6, 5 සහ 6;
බස්නාහිරට	:	කැබලි අංක 6, 5 සහ 6.

4. **කැබලි අංක 5 : ප්‍රමාණය : හෙක්. 14.7856**

උතුරට	:	කැබලි අංක 6 සහ 4;
නැගෙනහිරට	:	කැබලි අංක 6, සහ 4;
දකුණට	:	කැබලි අංක 6;
බස්නාහිරට	:	කැබලි අංක 6.

5. **කැබලි අංක 6 : ප්‍රමාණය : හෙක්. 101.1038**

උතුරට	:	කැබලි අංක 7, 1, 2, 3, 4, 5, 4, 3 සහ 2;
නැගෙනහිරට	:	කැබලි අංක 1, 2, 3, 4, 5, 2 සහ 7;
දකුණට	:	කැබලි අංක 2 සහ 7;
බස්නාහිරට	:	කැබලි අංක 2 සහ 7.

6. **කැබලි අංක 7 : ප්‍රමාණය : හෙක්. 46.2639**

උතුරට	:	ඉන්දියානු සාගරය, කැබලි අංක 1, 6 සහ 2;
නැගෙනහිරට	:	කැබලි අංක 1, 6 සහ 2 සහ ඉන්දියානු සාගරය;
දකුණට	:	ඉන්දියානු සාගරය;
බස්නාහිරට	:	ඉන්දියානු සාගරය.

II වන උපලේඛනය

නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කරනු ලැබිය හැකි පනත්

1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත
2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත
3. 2002 අංක 11 දරන මුදල් පනත
4. 2005 අංක 5 දරන මුදල් පනත
5. 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත
6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත
7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත
8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත
9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත
10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
11. (267 වන අධිකාරය වූ) විනෝද බදු පනත
12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත
13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත

III වන උපලේඛනය

කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ අදාළ නොවන පනත්

1. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත
2. (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනත
3. 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත
4. (269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත
5. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත
6. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත
7. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත

2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2021 ජූනි මස 14 වන දින]

2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2021 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

   (අ) එම වගන්තියේ (ඉ) ඡේදයේ "සියයට දහයක්" යන වචන ඉවත් කර ඒ වෙනුවට "සියයට පහළොවක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

   (ආ) එම වගන්තියේ (ඊ) ඡේදයේ "2020 ජනවාරි මස 1 වන දිනයෙන්", යන වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට "2030 ජනවාරි මස 1 වන දිනයෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2021 අංක 17 දරන 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2021 අගෝස්තු මස 23 වන දින]

කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් නියම කරනු ලැබ ඇති කාලසීමාවන් තුළ ඉටු කිරීමට නීතිය මඟින් නියම කරන ලද ඇතැම් ක්‍රියාවන් ඉටු කිරීමට පුද්ගලයන්හට නොහැකි වූ අවස්ථාවන් සම්බන්ධයෙන් ද; කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් යම් අධිකරණයකට එහි කටයුතු සිදු කරගෙන යාමට නොහැකි වන අවස්ථාවක දී විකල්ප අධිකරණයක් නියම කිරීම සඳහා ද; 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) පාලනය කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කරගෙන යාම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා තාවකාලික විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. (1) මේ පනත 2021 අංක 17 දරන 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ පනතේ විධිවිධාන 2020 මාර්තු මස 1 වන දිනෙන් ආරම්භ වන අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක විය යුතු ය.

   (2) අමාත්‍යවරයා විසින්, මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව ඉකුත්වීමට එක් මාසයකට පෙර ඕනෑම අවස්ථාවක දී, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, පනත ක්‍රියාත්මක වීම වැඩිදුර කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය:

   එසේ වුව ද, යම් දීර්ඝ කිරීමක සමස්ත කාලසීමාව, එම දීර්ඝ කිරීමේ දින සිට අවුරුදු දෙකක් නොඉක්මවිය යුතු ය.

I වන කොටස

නියම කරනු ලැබ ඇති කාලසීමාවන්ට අනුකූල වීමට නොහැකි වීම සඳහා වන සහනය

2. (1) යම් කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන්, යම් තැනැත්තකු-

   (අ) එම කාර්යය සඳහා නීතිය මඟින් නියම කරනු ලැබ ඇති කාලසීමාව ඇතුළත යම් නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක් හෝ වෙනත් නීති කෘත්‍යයක් පැවරීමෙන් හෝ ගොනු කිරීමෙන්; හෝ

   (ආ) නියම කරනු ලැබ ඇති කාලසීමාවක් ඇතුළත කිරීමට හෝ ඉටු කිරීමට නීතිය මඟින් නියම කරන ලද යම් ක්‍රියාවක් ඉටු කිරීමෙන්,

   වළක්වනු ලැබූ බවට යම් අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ යම් නීතියක් මඟින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවනු ලැබ ඇති වෙනත් යම් අධිකාරියක් විසින් සෑහීමට පත් වනු ලබන අවස්ථාවක දී, එම කාර්යය සඳහා නීතිය මඟින් නියම කරන ලද කාලසීමාව ඉකුත්වීම නොතකා, (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් කරන ලද නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක්, වෙනත් නීති

කෘත්‍යයක් හෝ ක්‍රියාවක් සඳහා අවසර ලබාදීමට, පිළිගැනීමට හෝ භාරගැනීමට එම අධිකරණයට, විනිශ්චය සභාවට හෝ යම් නීතියක් මඟින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් යම් අධිකාරියට බලය තිබිය යුතු අතර, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම තැනැත්තා එම කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයට යටත්ව සිටින ලද කාලසීමාව, එකී නියම කරන ලද කාලසීමාව ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද යම් සහනයක්,-

(අ) පහත සඳහන් රීති අදාළ වන්නා වූ-

(i) 2020 මැයි මස 6 වන දිනැති අංක 2174/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2020 ශ්‍රේෂ්ඨාධිකරණ (තාවකාලික විධිවිධාන) රීති;

(ii) 2021 ජනවාරි මස 21 වන දිනැති අංක 2211/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 ශ්‍රේෂ්ඨාධිකරණ (තාවකාලික විධිවිධාන) රීති;

(iii) 2020 මැයි මස 12 වන දිනැති අංක 2175/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2020 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) (තාවකාලික විධිවිධාන) රීති; හෝ

(iv) 2021 ජනවාරි මස 21 වන දිනැති අංක 2211/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) (තාවකාලික විධිවිධාන) රීති;

(ආ) යම් කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයකට අදාළව වූ සහනයක් වශයෙන් යම් කාලසීමාවක් බැහැර කිරීමක් ලබා දෙමින්, මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබිය හැකි යම් ශ්‍රේෂ්ඨාධිකරණ රීතියක් හෝ අභියාචනාධිකරණ රීතියක් අදාළ වන්නා වූ,

යම් ඉල්ලීමක් හෝ අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

II වන කොටස

විකල්ප අධිකරණ නම් කිරීම

3. (1) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 46 වන සහ 47 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, යම් කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන් යම් මුල් අවස්ථා අධිකරණයක කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරගෙන යාමට බාධාවක් සිදුවන අවස්ථාවක දී, එම කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වය පවත්නා කාලසීමාව සඳහා, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින්, එම අධිකරණය වෙනුවට වූ විකල්ප අධිකරණය වශයෙන් සමගාමී අධිකරණ බලයක් සහිත ආසන්නත ම අධිකරණය නම් කරනු ලැබිය හැකි ය. එම මුල් අවස්ථා අධිකරණයේ ගොනු කරන ලද හෝ එම මුල් අවස්ථා අධිකරණය මඟින් සලකා බලන ලද යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් හෝ ගොනු කරන ලද යම් අලුත් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්, එසේ නම් කරන ලද අධිකරණය මඟින් සලකා බැලීම හෝ විභාග කිරීම සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ සඳහන් කරන ලද නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්-

(අ) එවැනි යම් මුල් අවස්ථා අධිකරණයක් මඟින් එම නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය, තීන්දුවක්, ආඥාවක් හෝ වෙනත් ප්‍රකාශ කිරීමක් සඳහා වෙන් කරනු ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ආ) එම නඩුවේ, අපරාධ නඩුවේ, නඩු කටයුත්තේ හෝ කාරණයේ සියලු විභාග කිරීම් එම මුල් අවස්ථා අධිකරණය ඉදිරියේ දී සිදු කර අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක දී,

මාරු කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විකල්ප අධිකරණයක ගොනු කරන ලද හෝ විකල්ප අධිකරණයක් විසින් සලකා බලන ලද යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් පසුව, එම නඩුවට අදාළව කලින් අධිකරණ බලය ක්‍රියාත්මක කරන ලද මුල් අවස්ථා අධිකරණයේ සාමාන්‍ය කටයුතු නැවත ආරම්භ කිරීමෙන් අනතුරුව එම විකල්ප අධිකරණයේ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් එම මුල් අධිකරණය වෙත මාරු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ සඳහන් කරන ලද නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්-

(අ) විකල්ප අධිකරණය විසින් නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය, තීන්දුවක්, ආඥාවක් හෝ වෙනත් ප්‍රකාශ කිරීමක් සඳහා වෙන් කරනු ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ආ) එම නඩුවේ, අපරාධ නඩුවේ, නඩු කටයුත්තේ හෝ කාරණයේ සියලු විභාග කිරීම් එම මුල් අවස්ථා අධිකරණය ඉදිරියේ දී සිදු කර අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක දී,

මාරු කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

III වන කොටස

දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කිරීම

4. (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මුල් අවස්ථා අධිකරණයක් ඉදිරියේ වන යම් නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුත්තක දී, කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන්-

(අ) යම් තැනැත්තකුට අධිකරණයේ පෙනී සිටීමට නොහැකි වන අවස්ථාවක දී; හෝ

(ආ) සාමාන්‍ය ක්‍රියා පටිපාටිය යටතේ අධිකරණයේ කටයුතු සිදු කරගෙන යාමට නොහැකි වන අවස්ථාවක දී,

එම අධිකරණයේ පවතින එම නඩුව, ඉල්ලීම, අභියාචනය හෝ නඩු කටයුත්ත, දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් නිර්මාණය කරනු ලබන සජීවී වීඩියෝ හෝ සජීවී රූපවාහිනී සබැඳියක් මඟින් සිදු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් මුල් අවස්ථා අධිකරණයක් ඉදිරියේ සිදු කරනු ලබන යම් නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුත්තක දී-

(අ) 2021 ජනවාරි මස 29 වන දිනැති අංක 2212/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 ශ්‍රේෂ්ඨාධිකරණ (ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සහ හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාග) (විශේෂ විධිවිධාන) රීතිවල;

(ආ) 2021 පෙබරවාරි මස 23 වන දිනැති අංක 2216/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අභියාචනාධිකරණ (ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සහ හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාග) (විශේෂ විධිවිධාන) රීතිවල; සහ

(ඇ) දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන්, මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබිය හැකි වෙනත් යම් ශ්‍රේෂ්ඨාධිකරණ රීතියක හෝ අභියාචනාධිකරණ රීතියක,

විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, හැකිතාක් දුරට අදාළ කරගනු ලැබිය යුතු ය.

IV වන කොටස

සාමාන්‍ය

5. මේ පනතේ 2 වන වගන්තිය යටතේ සහනයක් ලෙස බැහැර කරන ලද යම් කාලසීමාවක් මාස දොළහක කාලසීමාවක් ඉක්මවනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, එසේ සිදු කිරීම සාධාරණ සහ යුක්තිසහගත බවට අධිකරණය, විනිශ්චය සභාව හෝ යම් නීතියක් මඟින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් යම් අධිකාරියක් සෑහීමට පත්වන අවස්ථාවක දී, මාස දොළහක් ඉක්මවන කාලසීමාවක් සහනයක් ලෙස බැහැර කරනු ලැබිය හැකි අතර, එසේ බැහැර කරන ලද කාලසීමාව වැඩිදුර මාස හයක කාලසීමාවක් නොඉක්මවිය යුතු ය:

එසේම තවදුරටත්, සහනයක් වශයෙන් බැහැර කරන ලද කාල සීමාව සමස්තයක් වශයෙන් ගත් විට මාස දහඅටක් නොඉක්මවිය යුතු ය.

6. 2 වන වගන්තියේ කාර්යය සඳහා නියම කරන ලද කාලසීමාවන්ට අනුකූල වීමට නොහැකි වීම යම් කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන් සිදු වූ බව ඔප්පු කිරීමේ භාරය, ඒ වගන්තිය යටතේ සහනය සඳහා ඉල්ලීමක් කරනු ලබන පාර්ශ්වය කෙරෙහි විය යුතු ය.

7. (1) යම් කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයක් පිළිබඳව රජය විසින් සාදන ලද, මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් වන යම් මාර්ගෝපදේශයක්, විධානයක්, චක්‍රලේඛයක්, දැන්වීමක් හෝ තීරණයක් මේ පනත යටතේ පවරන ලද යම් නඩුවක දී, ඉල්ලීමක දී, අභියාචනයක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී තවදුරටත් ඔප්පු කිරීමකින් තොරව බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(2) ඒ නඩුවේ, ඉල්ලීමේ, අභියාචනයේ හෝ වෙනත් නඩු කටයුත්තේ පාර්ශ්වයක් විසින් ඒ මාර්ගෝපදේශයේ, විධානයේ, චක්‍රලේඛයේ, දැන්වීමේ හෝ තීරණයේ ආවේශ්‍යතාව අභියෝගයට ලක් කරන අවස්ථාවක දී එය ඔප්පු කිරීමේ භාරය එහි ආවේශ්‍යතාව අභියෝගයට ලක් කරන පාර්ශ්වය වෙත විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "රජය" යන්නෙන්, (222 වන අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ කොවිඩ්-19 රෝගය සම්බන්ධයෙන් සාදන ලද යම් නියෝගයක අර්ථ නිරූපනය කර ඇති පරිදි වන යම් නිසි බලධරයකු අදහස් වේ.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"කොවිඩ්-19" යන්නෙන් (222 වන අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ 2020 මාර්තු මස 20 වන දින අංක 2167/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මඟින් නිරෝධායනීය රෝගයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) අදහස් වේ;

"කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වය" යන්නට-

(අ) කොවිඩ්-19; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් තත්ත්වයන්ගෙන් පැන නගින හෝ ඊට ආනුෂංගික වෙනත් යම් තත්ත්වයක්,

ඇතුළත් වේ; සහ

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මේ පනත පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2021 අංක 18 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2021 සැප්තැම්බර් මස 15 වන දින]

ඇතැම් නීති යටතේ හෙළිදරව් කිරීමට නියම කරන ලද හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳ ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීමට තැනැත්තන්ට ඉඩ ලබාදීම සඳහා ද; එසේ හෙළිදරව් කළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් සම්බන්ධයෙන් බද්දක් පැනවීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති නීති යටතේ විමර්ශනය කිරීමෙන්, නඩු පැවරීමෙන් සහ දණ්ඩනයන්ගෙන් වන බැඳීම සම්බන්ධයෙන් එකී යම් බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම ස්වේච්ඡාවෙන් හෙළිදරව් කරන තැනැත්තන් වගකීමෙන් මුක්ත කිරීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති නීති යටතේ දැනටමත් බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳ හෙළිදරව් කර ඇති තැනැත්තන් වෙත ඇතැම් සහන ප්‍රදානය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක 18 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද පැනවීම

2. (1) (මේ කොටසේ මින්මතු "හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ හෙළිදරව් කිරීමට නියම කරන ලද බදු අයකළ හැකි සැපයුමෙහි, ආදායමෙහි හෝ වත්කමෙහි යම් ප්‍රමාණයක්, 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බද්දට යටත් කාල සීමාවක් සඳහා එකතු කළ අගය මත බදු වාර්තාවක හෝ 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන ආදායම් බදු වාර්තාවක හෙළිදරව් කර නොමැති යම් තැනැත්තකුට (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ කොටසේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) (අ) හෙළිදරව් නොකළ යම් බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් සම්බන්ධයෙන් II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ විමර්ශන හෝ විභාග වෙමින් පවතින නඩු කටයුතු පවතින්නේ යම් තැනැත්තකු සම්බන්ධව ද, එවැනි යම් තැනැත්තකුට;

(ආ) හෙළිදරව් නොකළ යම් බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් සම්බන්ධයෙන් II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට; හෝ

(ඇ) I වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් අදාළ නීතියක විධිවිධාන යටතේ තක්සේරුවක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු විසින් දරනු ලබන හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමක, ආදායමක හෝ වත්කමක යම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද එවැනි යම් ප්‍රමාණයකට,

මේ කොටසේ විධිවිධාන අදාළ නොවන්නේ ය:

එසේ වුව ද, (ඇ) ඡේදයේ විධිවිධාන, එම ඡේදයේ සඳහන් තක්සේරුව සිදුකිරීමේ දී සැලකිල්ලට ගෙන නොමැති, හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් පිළිබඳ යම් ප්‍රමාණයකට අදාළ නොවන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදයන් හි සඳහන් තැනැත්තකු නොවන, (1) වන උපවගන්තියේ සඳහන් සෑම තැනැත්තකුට ම, මේ කොටසේ මින්මතු "මේ කොටස අදාළ වන තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන්නේ ය.

3. (1) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට සමාන මුදල් ප්‍රමාණයක් (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ආයෝජනය කිරීම හෝ තැන්පත් කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින් හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට සමාන මුදලක් ආයෝජනය කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, ඔහු විසින්-

(අ) එම මුදල් ප්‍රමාණය වහාම ආයෝජනය කිරීමට හැකි අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ එදිනට පසුව, නමුත් 2022 මාර්තු මස 31 වන දිනට පෙරාතුව-

(i) යම් වාසික සමාගමක් විසින් නිකුත් කරන ලද කොටස්;

(ii) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර;

(iii) ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක් විසින් නිකුත් කරන ලද යම් නිල ලැයිස්තුගත ණය සුරැකුම්පත්; හෝ

(iv) ශ්‍රී ලංකාවේ යම් චංචල හෝ නිශ්චල දේපළක්,

මිල දී ගනු ලැබිය යුතු ය; හෝ

(ආ) එම මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ විදේශ ව්‍යවහාර මුදල්වලින් පවතින අවස්ථාවක දී වහාම ආයෝජනය කිරීමට නොහැකි වන අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ එදිනට පසුව, නමුත් 2022 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ඔහු විසින් එම මුදල බැංකු ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව-

(අ) හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට සමාන මුදල් ප්‍රමාණයක් -

(i) යම් වාසික සමාගමක් විසින් නිකුත් කරන ලද කොටස්;

(ii) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර;

(iii) ශ්‍රී ලංකාවේ යම් වාසික සමාගමක් විසින් නිකුත් කරන ලද යම් නිල ලැයිස්තුගත ණය සුරැකුම්පත්; හෝ

(iv) යම් චංචල හෝ නිශ්චල දේපළක්,

මිල දී ගැනීම සඳහා යොදවා ඇති; හෝ

(ආ) හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට සමාන මුදල් ප්‍රමාණයක් බැංකු ගිණුමක තැන්පත් කර ඇති,

මේ කොටස අදාළ වන යම් තැනැත්තකුට, (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

4. (1) 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කිරීමට පෙරාතුව, මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, "ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බද්දක් (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයාට ගෙවීමට යටත් වන්නේ ය.

(2) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්-

(අ) 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයේ, නිශ්චල හෝ චංචල දේපළ හැර හෙළිදරව් නොකළ යම් බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් පිළිබඳ හෙළිදරව් කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක, එම මුදල් ප්‍රමාණයෙන් හෝ ආදායමෙන් හෝ 3 වන වගන්තිය යටතේ වත්කම ආයෝජනය කිරීම හෝ තැන්පත් කිරීම සඳහා වැය කළ මුදල් ප්‍රමාණයෙන් සියයට එකක අනුප්‍රමාණයකින් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවීමට යටත් විය යුතු ය; හෝ

(ආ) 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයේ යම් නිශ්චල හෝ චංචල දේපළක් පිළිබඳ හෙළිදරව් කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක, ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන දිනයේ දී ඒ දේපළෙහි වෙළෙඳ වටිනාකමින් සියයට එකක අනුප්‍රමාණයකින් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවීමට යටත් විය යුතු ය.

(3) මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින් ගෙවන ලද යම් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බදු මුදලක්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව බදු බැර මුදලක් හෝ වියදමක් ලෙස සලකනු නොලැබිය යුතු අතර, එය ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

5. (1) (මේ කොටසේ මින්මතු "ප්‍රකාශ කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමක්, ආදායමක් හෝ වත්කමක් 3 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ආයෝජනය කර ඇති හෝ තැන්පත් කර ඇති සහ ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගෙවා ඇති මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට යටත්ව, මෙහි V වන උපලේඛනයේ I වන කොටසේ හෝ II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති අදාළ ආකෘතියට සාරානුකූලව යම් හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුමකට, ආදායමකට හෝ වත්කමකට අදාළව ප්‍රකාශයක්, වත්කමේ අයිතිය, අත්කර ගත් දිනය සහ වැය කළ මුදල හෝ වෙළෙඳපොළ වටිනාකම සනාථ කිරීම සඳහා ලේඛන ද සමඟ, 2022 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා, කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට සති එකක් ඇතුළත ප්‍රකාශය ගොනු කරනු ලබන ආකාරය හා ගෙවීම සිදු කරනු ලබන ආකරය නිශ්චිතව දක්වමින් අවශ්‍ය මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (අ) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ප්‍රකාශයක් ලැබුණු විට, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම ප්‍රකාශය මේ පනතට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව සනාථ කරගනු ලැබිය යුතු ය.

(ආ) එම ප්‍රකාශය මේ පනතට අනුකූල වන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම ප්‍රකාශය පිළිගනු ලැබිය යුතු අතර, එම පිළිගැනීම ප්‍රකාශය ලැබුණු දිනයේ සිට දින තිහක් ඇතුළත ප්‍රකාශ කරන්නා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(ඇ) එම ප්‍රකාශය මේ පනතේ විධිවිධාන හා අනුකූල නොවන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු අතර, එම ප්‍රකාශය ලැබුණු දිනයේ සිට දින තිහක් ඇතුළත එම ප්‍රතික්ෂේප කිරීමට හේතු ප්‍රකාශ කරන්නා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(ඈ) (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති පරිදි දින තිහක් ඇතුළත ප්‍රකාශ කරන්නා වෙත දැනුම් දීම සිදු කිරීමට කොමසාරිස් ජනරාල්වරයා අපොහොසත් වන අවස්ථාවක දී එම ප්‍රකාශය ඔහු විසින් පිළිගනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් ප්‍රකාශයක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තේ යම් ප්‍රකාශ කරන්නකු සම්බන්ධයෙන් ද, එම ප්‍රකාශ කරන්නාට කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය ලැබීමෙන් දින තිහක් ඇතුළත (3) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණයේ නිශ්චිතව සඳහන් යම් දෝෂ නිවැරදි කරමින් අළුත් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ අසත්‍ය හෝ වැරදි තොරතුරු සපයන යම් ප්‍රකාශ කරන්නකු, (3) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් එම ප්‍රකාශය පිළිගනු ලැබීම නොතකා, 6 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද මුක්තියට හිමිකම් නොලබන්නේ ය.

6. (1) 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශය පිළිගනු ලැබ ඇති සහ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවනු ලැබ ඇති, යම් ප්‍රකාශ කරන්නකුට-

(අ) 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයකට අදාළව සහ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ හෙළිදරව් කළ ආදායමට හෝ වත්කමට අදාළව 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හැර මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ;

(ආ) එම ප්‍රකාශ කරන්නා විසින් එකතු කළ අගය මත බද්ද එකතු කර ඇත්නම් මිස, 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ප්‍රකාශයෙහි හෙළිදරව් කරන ලද බදු අයකළ හැකි සැපයුමක් පිළිබඳ යම් මුදල් ප්‍රමාණයකට අදාළව 2020 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙරාතුව අවසන් වන යම් කාල සීමාවක යම් වර්ෂයකට අදාළව 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන යටතේ,

යම් බද්දක්, දණ්ඩනයක් හෝ පොලියක් ගෙවීමට ඇති වගකීමෙන් හෝ යම් විමර්ශනයකට හෝ නඩු පැවරීමකට යටත් වීමෙන් සම්පූර්ණ මුක්තිය භුක්ති විඳීමට හිමිකම් ඇත්තේ ය.

(2) 5 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඉහත නිශ්චිතව දක්වා ඇති සම්පූර්ණ මුක්තිය (1) වන උපවගන්තියේ සඳහන් යම් ප්‍රකාශ කරන්නකු වෙත ප්‍රදානය කරනු ලබන බවට වගබලා ගත යුතු ය.

7. (1) මේ පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ප්‍රකාශයක අන්තර්ගත යම් කාරණයක් හෝ දෙයක් පිළිබඳව සහ ප්‍රකාශ කරන්නාගේ අනන්‍යතාව පිළිබඳව, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් නිල රහස්‍යතාවය ආරක්ෂා කරනු ලැබිය යුතු හා ආරක්ෂා කිරීමට සහාය දෙනු ලැබිය යුතු ය.

(2) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 100 වන වගන්තිය යටතේ, නිල රහස්‍යතාවය කඩ කිරීම සඳහා දඬුවම් ද ඇතුළුව, නිල රහස්‍යතාවය ආරක්ෂා කිරීමට අදාළව ඒ පනතේ ඇති සියලු විධිවිධාන, මේ පනත යටතේ කරන ප්‍රකාශ සම්බන්ධව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

8. මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, මෙහි I වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ නීතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට ඔහු යටත් වන්නේ ය.

9. සැක දුරු කිරීම සඳහා, 2004 අංක 10 දරන දේශීය ආදායම් (සමාව දීම විධිමත් කිරීමේ) පනතේ විධිවිධාන යටතේ සිදුකරන ලද යමක් හෝ ප්‍රදානය කරන ලද යම් සමාවක් නොතකා, මේ කොටසේ විධිවිධාන මේ කොටස අදාළ වන යම් තැනැත්තකුට අදාළ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

II වන කොටස

ඇතැම් නීති යටතේ හිඟ බදු මුදල් කපා හැරීම සඳහා විධිවිධාන

10. මේ කොටසේ විධිවිධාන, (මේ කොටසේ මින්මතු "බදු ගෙවන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) 2020 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ 2020 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා, I වන උපලේඛනයේ, III වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම්

නීතියක විධිවිධාන යටතේ යම් හිඟ බදු මුදල් ගෙවීමට යටත් වන හෝ, එවැනි යම් නීතියක විධිවිධාන යටතේ පනවනු ලබන යම් දණ්ඩනයක් ගෙවීමට යටත් වන යම් තැනැත්තකුට අදාළ විය යුතු ය.

11. මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක හෝ, යම් නීතියක යම් විධිවිධානයක හෝ, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි හෝ, පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා කොමසාරිස් ජනරාල්වරයා විසින්, 14 වන සහ 15 වන වගන්තිවලට යටත්ව, යම් බදු ගෙවන්නකු සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙරාතුව අවසන් වන යම් කාලසීමාවකට අදාළව මෙහි, III වන උපලේඛනයේ "අ" කොටසෙහි දක්වා ඇති යම් නීතියක් යටතේ වන හෝ මෙහි III වන උපලේඛනයේ "ආ" කොටසෙහි නිශ්චිතව දක්වා ඇති 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ නිශ්චිත විධිවිධාන යටතේ වන යම් හිඟ බදු මුදල් කපා හරිනු ලැබිය යුතු ය.

12. කොමසාරිස් ජනරාල්වරයා විසින්, 14 වන සහ 15 වන වගන්තිවලට යටත්ව, 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරන ලද තක්සේරු කළ හැකි ආදායම රුපියල් මිලියන තුන නොඉක්මවන යම් පුද්ගලයකු විසින්, 2020 දෙසැම්බර් මස 31 වන දින වන විට 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හැර I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ ගෙවිය යුතු යම් හිඟ බදු මුදලක් කපා හරිනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන පහත දැක්වෙන අවස්ථානුගත කරුණු යටතේ, එවැනි යම් පුද්ගලයකුට අදාළ නොවිය යුතු ය:-

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව, හිලව් නොකළ පාඩුවක් ඇතුළු යම් පාඩුවක් අඩු කිරීමෙන් තොරව, අදාළ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායම රුපියල් මිලියන තුනක් ඉක්මවන අවස්ථාවක දී;

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව, අදාළ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරන ලද අවසාන රඳවා ගැනීමේ ගෙවීම්, ලැබීම් සහ ලාභ සමඟ එකතු කළ විට රුපියල් මිලියන තුනක් ඉක්මවන අවස්ථාවක දී;

(ඇ) අදාළ පුද්ගලයකු හවුල්කරුවකු වන ව්‍යාපාරයක හෝ හවුල් ව්‍යාපාරයක, 2020 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා වාර්ෂික දළ පිරිවැටුම රුපියල් මිලියන පන්සියයකට නොඅඩු වන අවස්ථාවක දී; හෝ

(ඈ) අදාළ පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමට ඔට්ටු ඇල්ලීමේ සහ සූදු ව්‍යාපාරයක් හෝ මත්පැන් සම්බන්ධ යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමෙන් උපයා ගනු ලබන ආදායමක් ඇතුළත් වන නමුත් වෙනත් ව්‍යාපාරයකට හුදෙක් ආනුෂංගික වන්නා වූ එවැනි යම් ආදායමක් ඇතුළත් නොවන්නා වූ අවස්ථාවක දී.

13. (1) යම් බදු ගෙවන්නකු විසින් මෙහි I වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ ගෙවිය යුතු බදු මුදලේ ගෙවීමට ඉතිරිව ඇති මුදල, 2022 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ගෙවනු ලබන්නේ නම්, ඒ බදු ගෙවන්නාට අදාළව, 2020 දෙසැම්බර් මස 31 වන දින හෝ එම දිනයට පෙර යම් දිනයක ගෙවිය යුතු වූ එම නීතිවල විධිවිධාන ප්‍රකාරව ගණනය කරන ලද යම් දණ්ඩනයක් හෝ පොලියක් කොමසාරිස් ජනරාල්වරයා විසින් කපා හරිනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන මගින්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව හෝ මෙම පනතේ 11 වන හෝ 12 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කපා හරින ලද හිඟ බදු මුදල් සම්බන්ධයෙන් යම් බදු ගෙවන්නකු මත යම් බද්දක්, පොලියක් හෝ දණ්ඩනයක් ගෙවීම සඳහා වගකීමක් ඇති වන බවට කියවා තේරුම් ගනු නොලැබිය යුතු ය.

14. යම් බදු ගෙවන්නකු සම්බන්ධයෙන් සිදු කරන ලද තක්සේරුවක් මත, මෙහි I වන උපලේඛනයේ හෝ III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් අදාළ නීතියක විධිවිධාන යටතේ, මෙම පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව, බදු අභියාචනා කොමිෂන් සභාව හෝ යම් අධිකරණයක් ඉදිරියේ තීරණය සඳහා විභාග වෙමින් පවතින හෝ තීරණයක් ලබා දී ඇති, 11 වන හෝ 12 වන වගන්තියේ සඳහන් කරන ලද යම් හිඟ බදු මුදල් සම්බන්ධයෙන් යම් ආරාවුලක් පවතින අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 11 වන හා 12 වන වගන්තියේ විධිවිධාන යටතේ එම හිඟ බදු මුදල් කපා හරිනු නොලැබිය යුතු ය.

15. 2020 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව අවසන් වන යම් කාලසීමාවක් සඳහා, මෙහි I වන උපලේඛනයේ, III වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක විධිවිධාන යටතේ, යම් බදු ගෙවන්නකු විසින් යථා පරිදි ඉල්ලා සිටින ලද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ගෙවීමට තිබෙන යම් බදු ආපසු ගෙවීමක් 11 වන හෝ 12 වන වගන්තිවල විධිවිධාන යටතේ කපා හරිනු ලබන යම් හිඟ බදු මුදල්වලට හිලව් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන, ආපසු ගෙවීම ලැබිය යුතු කාලසීමාවෙන් පසු යම් කාලසීමාවක් සඳහා නීතිය මගින් පනවනු ලබන යම් දණ්ඩනයක් සම්බන්ධව අදාළ නොවිය යුතු ය.

16. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින්, සෑම බදු ගෙවන්නකු වෙතම, 15 වන වගන්තිය ප්‍රකාරව හිඟ බදු මුදල්වලට හිලව් කරනු ලැබිය යුතු ආපසු ගෙවීමේ මුදල් ප්‍රමාණය, ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) එවැනි තැනැත්තකු එසේ කපා හරින ලද හිඟ බදු මුදල්වලට හිලව් කරනු ලැබිය යුතු ආපසු ගෙවීමේ මුදල් ප්‍රමාණ පිළිබඳ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔහු විසින්, කොමසාරිස් ජනරාල්වරයා විසින් එම දැනුම් දීම සිදුකරන ලද දින සිට දින දාහතරක කාලයක් ඇතුළත, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වන ලද පරිදි හිඟ බදු මුදල්වලට ආපසු ගෙවීම් හිලව් නොකරන ලෙසට ලිඛිත ඉල්ලීමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලැබිය යුතු අතර, 2022 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර සම්පූර්ණ හිඟ බදු මුදල් ප්‍රමාණය පියවනු ලැබිය යුතු ය.

(3) (අ) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ බදු ගෙවන්නකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, (2) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීම සමඟ ඉදිරිපත් කරනු ලබන යම් සුදුසු ගෙවීමේ සැලැස්මකට අනුකූලව,

2022 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර (1) වන උපවගන්තියේ සඳහන් හිඟ බදු මුදල් පියවීම සඳහා එම බදු ගෙවන්නා වෙත අනුමතය ලබා දිය හැකි ය.

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින්, එම ගෙවීමේ සැලැස්ම මගින් අනුමත කරන ලද දිනයට හෝ දිනයන්ට පෙරාතුව බදු ගෙවන්නා විසින් (අ) ඡේදය යටතේ අනුමත කරන ලද ගෙවීමේ සැලැස්මකට අනුකූලව ක්‍රියා කර ඇත්නම්, එම හිඟ බදු මුදල් මත වන යම් පොලී හෝ දණ්ඩන කපා හරිනු ලැබිය යුතු ය.

(4) බදු ගෙවන්නා විසින්, (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් නොකරන අවස්ථාවක දී හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පිළිගනු ලැබූ ගෙවීමේ සැලැස්මට අනුව හිඟ බදු මුදල් නොපියවන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ දැනුම් දීම මගින් නිශ්චිතව දක්වන ලද පරිදි හිඟ බදු මුදල්වලට ආපසු ගෙවීම් හිලව් කිරීමට කටයුතු සිදු කරනු ලැබිය යුතු ය.

17. කොමසාරිස් ජනරාල්වරයා විසින් 11 වන, 12 වන සහ 13 වන වගන්තිවල විධිවිධාන යටතේ කපා හරින ලද හිඟ බදු මුදල් සහ දණ්ඩන සම්බන්ධව නිසි වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

18. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"වත්කම" යන්නට, බැංකු ශේෂයන්, මූල්‍ය සාධන පත්‍ර, කොටස්, ව්‍යුත්පන්න, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු, කාලීන තැන්පතු, බැඳුම්කර හෝ වෙනත් ආකාරවල තැන්පතු, සුරැකුම් හෝ ණය ආකාරයෙන් දෙනු ලබන මුදල්, අතැති මුදල්, මැණික් හෝ රත්රන්, වෙනත් යම් මූල්‍ය අයිතියක් ඇතුළත් වන්නා වූ මුදල් හෝ නිශ්චල දේපළ හෝ චංචල දේපළ අදහස් වන නමුත් යම් අස්පර්ශනීය වත්කමක් බදු ගෙවන්නා විසින් වෙනත් යම් තැනැත්තකුගෙන් මිලදී ගෙන ඇත්නම් මිස, ඊට ඇතුළත් නොවේ;

"බැංකු ගිණුම" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක ප්‍රකාශ කරන්නා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන යම් බැංකු ගිණුමක් අදහස් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීතිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"අවසාන රඳවා ගැනීමේ ගෙවීම්" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 88 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ඒ ගෙවීම්වලට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"නිශ්චල දේපළ" යන්නට, ඉදිකරන ලද හෝ ඉදිකරමින් පවතින ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ඇති යම් ගොඩනැගිල්ලක් ඇතුළත් වේ;

"ආදායම" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක යම් ප්‍රභවයකින් උපයනු ලබන යම් ලැබීමක් හෝ ලාභයක් හෝ ලද මුදල් ප්‍රමාණයක් අදහස් වේ;

"පාඩුව" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 19 වන වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මුදල්" යන්නට, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක රඳවා තබා ගනු ලබන දේශීය ව්‍යවහාර මුදල් සහ විදේශීය ව්‍යවහාර මුදල් ඇතුළත් වේ;

"චංචල දේපළ" යන්නට, රත්රන් ඇතුළුව ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පවතින සියලු ආකාරවල චංචල දේපළ ඇතුළත් වන නමුත් මුදල් ඇතුළත් නොවේ;

"තැනැත්තා" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"වාර්තාව" යන්නෙන්, වාර්තාව සමඟ සැපයීමට නියම කරන ලද යම් සහතිකයක්, ප්‍රකාශනයක් හෝ වෙනත් යම් ඇමුණුමක් ඇතුළුව, I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ නීතිය ප්‍රකාරව යම් තැනැත්තකු හට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගොනු ගත කිරීමට නියම කෙරෙන ආදායම් වාර්තාවක් හෝ එකතු කළ අගය මත බදු වාර්තාවක් අදහස් වේ;

"වාසික සමාගම" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 69 වන වගන්තියේ (4) වන උපවගන්තියේ අර්ථානුකූලව යම් සමාගමක් අදහස් වේ;

II වන කොටසේ "බද්ද" යන්නට, I වන උපලේඛනයේ, III වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ නීතිය යටතේ ගෙවිය යුතු හෝ අය කරනු ලබන යම් බද්දක්, අධිභාරයක්, අය බද්දක්, තීරු බද්දක්, අය කිරීමක් හෝ දායකත්වයක් ඇතුළත් විය යුතු ය;

"බදු අයකළ හැකි සැපයුම" යන්නට, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 83 වන වගන්තිය යටතේ එම යෙදුමට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"හිඟ බදු මුදල්" යන්නෙන්, අදාළ නීතියට අනුකූලව ගෙවිය යුතු දිනයට පසුව ගෙවීම සිදු නොකර පවතින බද්දක් අදහස් වන අතර, එයට කොමසාරිස් ජනරාල්වරයාගේ වාර්තාවලට අනුව නොගෙවා පවතින, ගෙවීම පැහැර හරින ලද බදු හෝ එවැනි යම් නීතියක් යටතේ පනවනු ලබන වෙනත් දණ්ඩනයක් සහ රඳවා ගැනීමේ බදු හෝ සේවායෝජකයකු විසින් සේවා නියුක්ති ආදායම මත අඩු කරනු ලබන බදු ඇතුළත් වේ;

"බදු අභියාචනා කොමිෂන් සභාව" යන්නෙන්, 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව අදහස් වේ;

"හිලව් නොකළ පාඩු" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 19 වන වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"තක්සේරු වර්ෂය" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20 වන වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

I වන උපලේඛනය

(2, 6, 8, 10, 12, 13, 14 හා 15 වන වගන්ති)

1. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත
2. 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත
3. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
4. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත
5. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත

II වන උපලේඛනය

(2 වන වගන්තිය)

1. 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
2. 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත
3. අල්ලස් පනත (26 වන අධිකාරය)
4. 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත

III වන උපලේඛනය

(10, 11, 14 හා 15 වන වගන්ති)

අ කොටස

1. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ පනවන ලද ධන බද්ද හා ත්‍යාග බද්ද
2. 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත
3. 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත
4. 1989 අංක 8 දරන ධන බදු අධිභාර පනත
5. 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාර පනත
6. 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාර පනත
7. 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත
8. 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත
9. 1996 අංක 5 දරන ජාතිය රැකගැනීමේ දායක මුදල් පනත
10. 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත
11. 2001 අංක 6 දරන ආදායම් බදු අධිභාර පනත
12. 2002 අංක 16 දරන හරබදු පනත
13. 2005 අංක 5 දරන මුදල් පනත යටතේ පනවන ලද සමාජ වගකීම් බද්ද
14. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත
15. 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත
16. 2004 අංක 11 දරන මුදල් පනත යටතේ පනවන ලද ආර්ථික සේවා ගාස්තුව

ආ කොටස

1. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඌ වගන්තිය යටතේ පනවන ලද වෛකල්පිත එකතු කළ අගය මත බද්ද
2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26අ වගන්තිය යටතේ අඩු කරනු ලබන එකතු කළ අගය මත බදු අත්තිකාරම්

IV වන උපලේඛනය

(2, 8, 10, 13 සහ 15 වන වගන්ති)

1. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත
2. 2002 අංක 11 දරන මුදල් පනත
3. 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත
4. 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

V වන උපලේඛනය

I වන කොටස

(5 වන වගන්තිය)

ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද
2021 අංක 18 දරන මුදල් පනත
5 වන වගන්තිය යටතේ ප්‍රකාශය
පුද්ගලයකු විසින් සපයනු ලැබිය යුතු ය

ජාතික හැඳුනුම්පත් අංකයඃ .....

ගමන් බලපත්‍ර අංකයඃ .....

1. ..... (ලිපිනය) යන ලිපිනයෙහි පදිංචි ජා. හැ. අංක/ ගමන් බලපත්‍ර අංක ..... දරන .... (සම්පූර්ණ නම) පූජ්‍ය/ මයා/ මිය/මෙය වන මම, 2021 අංක 18 දරන මුදල් පනතේ 1 වන කොටස ප්‍රකාරව බදු අය කළ හැකි සැපයුමට, ආදායමට හෝ වත්කමට අදාළව ප්‍රකාශය සිදු කරමි.

2. 2020 මාර්තු 31 වන දින වන විට ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක මා විසින් දරන ලද පහත දැක්වෙන බදු අය කළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම මා මෙයින් ප්‍රකාශ කරමි.

අනුක්‍රමික අංකය	*බදු අය කළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් වර්ගය*	*බදු අය කළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් දැරූ ස්ථානය/ ආයෝජනය කළ අස්ථිත්වය/ බැංකුව*	*ප්‍රමාණය/ගිණුම් අංකය*	*මුදල් ප්‍රමාණය/වෙළෙඳපොළ වටිනාකම*
	මුළු මුදල් ප්‍රමාණය/වෙළෙඳපොළ වටිනාකම			

3. ඉහත ප්‍රකාශ කරන ලද මුදල්-

   (i) (අ) ---------- (දිනය) වන දින රුපියල් ---------- ක මුදල් ප්‍රමාණයක් ---------- (සමාගමේ නම) හි කොටස්/ ණය සුරැකුම්පත් ---------- (ප්‍රමාණය) ක ආයෝජනය කර ඇත.

   (ආ) ---------- (දිනය) වන දින රුපියල් ----------ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල/භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇත.

   (ඇ) ---------- (දිනය) වන දින රුපියල්---------- ක මුදලක් ශ්‍රී ලංකාවේ---------- හි (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, රත්‍රන් යනාදි චංචල හෝ නිශ්චල දේපළ කරුණාකර සඳහන් කරන්න) ආයෝජනය කර ඇත.

   (ii) ---------- (දිනය) වන දින---------- බැංකුවේ----------ශාඛාවේ ගිණුම් අංක---------- දරන මාගේ---------- ගිණුමේ තැන්පත් කර ඇත.

4. 2 වන ඡේදයේ සඳහන් කරන ලද සමස්ත මුදල් ප්‍රමාණය/වෙළෙඳපොළ වටිනාකම මත, 2021 අංක 18 දරන මුදල් පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව 1% අනුප්‍රමාණයකින්, යොමු අංක----------යටතේ, ----------(මුදල් ගෙවූ දිනය) වන දින, රුපියල්---------- ක මුදලක්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ ගිණුම වෙත මා විසින් බදු වශයෙන් ගෙවා ඇත.

5. ප්‍රකාශයට පත් කරන ලද බදු අයකළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් ප්‍රමාණය සම්බන්ධයෙන්-

(අ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ හෝ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන යටතේ කිසිදු විමර්ශනයක් හෝ අධිකරණයක විභාග වෙමින් පවතින නඩු හෝ වරදකට වරදකරු වී නොමැත; හෝ

(ආ) 2021 අංක 18 දරන මුදල් පනතේ I වන උපලේඛනයේ හෝ IV වන උපලේඛනයේ සඳහන් යම් නීතියක් යටතේ කිසිදු තක්සේරුවක් සිදුකර නොමැත.

මෙහිදී මා විසින් සපයන ලද ඉහත තොරතුරු මාගේ දැනීම සහ විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි වන බවට මම ගාම්භීරතා පූර්වකව ද අවංකව ද ප්‍රකාශ කරමි.

දිනය: ප්‍රකාශ කරන්නාගේ අත්සන

සටහන: මෙම ආකෘති පත්‍රයේ සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී, ප්‍රකාශ කරන්නා විසින් වෙනම කඩදාසියක් භාවිත කොට එහි අත්සන් කළ යුතු ය.

(ප්‍රකාශය 2022 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.)

II වන කොටස

(5 වන වගන්තිය)

ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද

2021 අංක 18 දරන මුදල් පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

අස්ථිත්වය (*සමාගම, හවුල් ව්‍යාපාරය, අරමුදල, සමාජය, රාජ්‍ය නොවන සංවිධානය ආදිය) විසින් සපයනු ලැබිය යුතු ය

බදු ගෙවන්නාගේ හඳුනාගැනීමේ අංකය: ----------

අස්ථිත්වයේ වර්ගය : ----------

අස්ථිත්වයේ ලියාපදිංචි කිරීමේ අංකය: ----------

1. ---------- (අස්ථිත්වයේ නම) හි ---------- (තනතුර) වන ---------- (ලිපිනය) යන ලිපිනයෙහි පදිංචි ජා. හැ. අංක---------- දරන ---------- (සම්පූර්ණ නම) මයා/මිය/මෙය වන මම, 2021 අංක 18 දරන මුදල් පනතේ 1 වන කොටස ප්‍රකාරව ඉහත ----------(අස්ථිත්වයේ වර්ගය) හි බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට බලයලත් තැනැත්තා වෙමි.

2. 2020 මාර්තු මස 31 වන දින වන විට, ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක ----------(අස්ථිත්වයේ නම) විසින් දරන ලද පහත දැක්වෙන බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම මෙයින් ප්‍රකාශ කරමි.

අනුක්‍රමික අංකය	*බදු අය කළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් වර්ගය*	*බදු අය කළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් දැරූ ස්ථානය/ආයෝජනය කළ අස්ථිත්වය/බැංකුව*	*ප්‍රමාණය/ගිණුම් අංකය*	*මුදල් ප්‍රමාණය/වෙළෙඳපොළ වටිනාකම*
	මුළු මුදල් ප්‍රමාණය/වෙළෙඳපොළ වටිනාකම			

3. ඉහත ප්‍රකාශ කරන ලද මුදල්-

(i) (අ) ---------- (දිනය) වන දින රුපියල් ---------- ක මුදල් ප්‍රමාණයක් ---------- (සමාගමේ නම) හි කොටස්/ණය සුරැකුම්පත් ----------(ප්‍රමාණය) ක ආයෝජනය කර ඇත.

(ආ) ---------- (දිනය) වන දින රුපියල් ---------- ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල/භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇත.

(ඇ) ---------- (දිනය) වන දින රුපියල් ---------- ක මුදලක් ශ්‍රී ලංකාවේ ---------- හි (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, රත්රන් යනාදි චංචල හෝ නිශ්චල දේපළ කරුණාකර සඳහන් කරන්න) ආයෝජනය කර ඇත.

(ii) ---------- (දිනය) වන දින ---------- බැංකුවේ ---------- ශාඛාවේ ගිණුම් අංක ----- ---------- දරන (අස්ථිත්වයේ වර්ගය) ---------- ගිණුමේ තැන්පත් කර ඇත.

4. ---------- වෙනුවෙන්, 2 වන ඡේදයේ සඳහන් කරන ලද සමස්ත මුදල් ප්‍රමාණය/වෙළෙඳපොළ වටිනාකම මත, 2021 අංක 18 දරන මුදල් පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව 1% අනුප්‍රමාණයකින්, ---------- (මුදල් ගෙවූ දිනය) වන දින, යොමු අංක ---------- යටතේ, රුපියල්---------- ක මුදලක්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ ගිණුම වෙත මා විසින් බදු වශයෙන් ගෙවා ඇත.

5. ප්‍රකාශයට පත් කරන ලද බදු අයකළ හැකි සැපයුම්, ආදායම් හෝ වත්කම් ප්‍රමාණය සම්බන්ධයෙන්-

(අ) ---------- (සමාගම, හවුල් ව්‍යාපාරය, අරමුදල, සමාජය, රාජ්‍ය නොවන සංවිධානය ආදියේ නම) ට, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනතේ, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ හෝ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන යටතේ කිසිදු විමර්ශනයක් හෝ අධිකරණයක විභාග වෙමින් පවතින නඩු නොමැත හෝ -------- (සමාගම, හවුල් ව්‍යාපාරය, අරමුදල, සමාජය, රාජ්‍ය නොවන සංවිධානය ආදියේ නම) වරදකට වරදකරු වී නොමැත; හෝ

(ආ) 2021 අංක 18 දරන මුදල් පනතේ I වන උපලේඛනය හෝ IV වන උපලේඛනයේ සඳහන් යම් නීතියක් යටතේ කිසිදු තක්සේරුවක් සිදුකර නොමැත.

මෙහි දී ---------- (තනතුර) මට්ටමෙන් ---------- (අස්ථිත්වයේ නම) වෙනුවෙන් මා විසින් සපයන ලද ඉහත තොරතුරු මාගේ දැනීම සහ විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි වන බවට මම ගාම්භීරතා පූර්වකව ද අවංකව ද ප්‍රකාශ කරමි.

දිනය:

ආයතන ප්‍රධානි/කළමනාකාර අධ්‍යක්ෂ/
හවුල්කරු/ සභාපතිගේ අත්සන

සටහන: මෙම ආකෘති පත්‍රයේ සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී, ප්‍රකාශ කරන්නා විසින් වෙනම කඩදාසියක් භාවිත කොට එහි අත්සන් කළ යුතු ය.

(ප්‍රකාශය 2022 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.)

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත

[සහතිකය සටහන් කළේ 2021 සැප්තැම්බර් මස 21 වන දින]

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද; වෙළෙඳපොළ ආයතන, ඇතැම් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණ, වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කිරීම සඳහා දත ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා සහ බලාත්මක කිරීමේ පියවර සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; වෙළෙඳපොළ විෂමාචාරය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ද; සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමකයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග මැඩපැවැත්වීම සඳහා සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

1 වන පරිච්ඡේදය

මූලික

2. මේ පනතේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනත සුරැකුම්පත්, සුරැකුම්පත් වෙළෙඳපොළවල් සහ ඒ හා සම්බන්ධ කරුණු සඳහා අදාළ වන්නේ ය.

3. මේ පනතේ පරමාර්ථය සහ අරමුණ:-

(අ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම;

(ආ) සාධාරණ, විධිමත්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීම, පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම;

(ඇ) දේශීය සහ විදේශීය ආයෝජකයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම; සහ

(ඈ) සුරැකුම්පත් වෙළෙඳපොළවල්වලට අදාළව සපයනු ලබන සේවාවන්හි උසස් වෘත්තීයමය ප්‍රමිතීන් පවත්වාගෙන යන බවට වගබලා ගැනීම,

විය යුතු ය.

2 වන පරිච්ඡේදය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

4. (1) මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සඳහා, (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

5. (1) කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) කොමිෂන් සභාවේ බහුවිධ අංශ පිළිබිඹු කිරීම සඳහා (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, සුරැකුම්පත් වෙළෙඳපොළට අදාළ කරුණු සම්බන්ධයෙන් වෘත්තීයමය ප්‍රවීණතාවක් සහ කීර්තියක් ඇත්තා වූ ද නීතිය, මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව, බැංකුකරණය හෝ ව්‍යාපාර යන ක්ෂේත්‍රවල විශේෂ දැනුමක් හෝ පෘථුල පළපුරුද්දක් ඇත්තා වූ ද නිපුණතාව පෙන්නුම් කර ඇත්තා වූ ද, යටත් පිරිසෙයින් තැනැත්තන් පස්දෙනෙකු පෞද්ගලික අංශයේ සිටින තැනැත්තන් වන්නා වූ ද, තැනැත්තන් හයදෙනෙකුගෙන්;

(ආ) නම් කළ සාමාජිකයන් දෙදෙනෙකුගෙන්, එනම්,-

(i) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරන ලද භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයකුගෙන්; සහ

(ii) ශ්‍රී ලංකා මුදල් මණ්ඩලය විසින් නම් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය මහ බැංකු අධිපතිවරයකුගෙන්; සහ

(ඇ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් දෙදෙනකුගෙන්:-

(i) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පත් කරන ලද සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන්; සහ

(ii) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපතිවරයාගෙන්.

(2) කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයන් අතරින්, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස එක් සාමාජිකයකු නම් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තැනැත්තන් පත් කිරීමේ දී, අමාත්‍යවරයා විසින්-

(අ) ඒ තැනැත්තාගේ විශ්වසනීයත්වය සහ කීර්තිය; සහ

(ආ) කොමිෂන් සභාවේ සම්බන්ධතා සහ ඒ තැනැත්තාට ඇති හෝ ඒ තැනැත්තා නියෝජනය කරන යම් සම්බන්ධතා අතර යම් ගැටුමක් ඇතිවීමේ ඉඩකඩ,

සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

6. කොමිෂන් සභාවේ සෑම පත් කළ හෝ නම් කළ සාමාජිකයකු විසින් ම, තමා පත් කරනු ලැබූ විට දී, තමා පත් කරනු ලැබූ අවස්ථාවේ දී තමාට තිබිය හැකි යම් සම්බන්ධතා අතර ගැටුමක් පිළිබඳව අමාත්‍යවරයා වෙත ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

7. කොමිෂන් සභාවේ පත් කළ හෝ නම් කළ සෑම සාමාජිකයකු ම මියයාමෙන්, නීතියක් ක්‍රියාත්මකවීමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර උපරිම වශයෙන් අනුගාමී වන හෝ අන්‍යාකාරයෙන් වන යම් ධුර කාල දෙකක කාලසීමාවකට යටත්ව නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

8. (1) කොමිෂන් සභාවේ යම් පත් කළ හෝ නම් කළ සාමාජිකයකුට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඕනෑම විටක දී, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර අමාත්‍යවරයා විසින් එය පිළිගනු ලැබීමෙන් පසුව එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) නිල බලයෙන් පත් වන සාමාජිකයකු හැර වෙනත් යම් සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ (4) වන හෝ (5) වන උපවගන්තිවල විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් ධුරය හිස් කරන අවස්ථාවක, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින්, වෙනත් තැනැත්තකු, ඔහු අනුප්‍රාප්ත වන්නා වූ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලසීමාව සඳහා ධුරය දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා හැර කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකුට, රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස තුනකට වැඩි කාලයක් ඔහුගේ ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වී ඇති අවස්ථාවක, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරයා විසින්, එම කාලසීමාව තුළ ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණ නොමැති කොමිෂන් සභාවේ පත් කළ හෝ නම් කළ සාමාජිකයකු ඔහුගේ ධුරය හිස් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණ නොමැති සභාපතිවරයා වන්නා වූ කොමිෂන් සභාවේ සාමාජිකයකු ඔහුගේ ධුරය හිස් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

9. (1) යම් තැනැත්තකු,-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) කොමිෂන් සභාව බලපත්‍ර දෙන ලද හෝ ලියාපදිංචි කරන ලද ආස්ථිත්‍යයක අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු හෝ සේවා නියුක්තකයකු වේ නම් හෝ වුවහොත්;

(ඇ) සිහිවිකල් හෝ තම කාර්ය ඉටු කිරීමට නොහැකි තැනැත්තකු වේ නම් හෝ වුවහොත්;

(ඈ) නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වේ නම් හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත්ව ඇත්නම්;

(ඉ) චරිත දූෂණය සම්බන්ධයෙන් වූ වරදක් සඳහා වරදකරුවකු කරනු ලැබී නම් හෝ ලැබ ඇත්නම්; හෝ

(ඊ) කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම්,

එම තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ නම් කිරීමට හෝ දිගටම කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු දිගටම ධුරයේ කටයුතු කිරීම කොමිෂන් සභාවේ යහපතට අනර්ථදායක වන්නේ නම්, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඔහු සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කිරීමෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

10. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් එම රැස්වීමේ මුලසුන දැරීමට ඔවුන් අතුරින් එක් අයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වූ කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සෑම ප්‍රශ්නයක් ම, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක, මුලසුන දරන සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

11. මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, කොමිෂන් සභාවේ අරමුදලින් කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

12. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයාට, රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් තාවකාලිකව ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට කටයුතු කිරීමට කොමිෂන් සභාවේ වෙනත් සාමාජිකයකු නම් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයාට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඕනෑම විටක දී ඉල්ලා අස්විය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

13. කොමිෂන් සභාව විසින් යම් කරුණක් පිළිබඳව ගනු ලබන යම් තීරණයක් සම්බන්ධයෙන් කෙලින් ම හෝ වක්‍රාකාරයෙන් යම් සම්බන්ධතාවක් දක්වන සාමාජිකයකු විසින් එම තීරණය ගනු ලබන්නා වූ කොමිෂන් සභාවේ රැස්වීමේ දී, එම සම්බන්ධතාවයේ

ස්වභාවය හෙළිදරව් කරනු ලැබිය යුතු අතර එම හෙළිදරව් කිරීම කොමිෂන් සභාවේ රැස්වීම්වල සටහන්වල වාර්තා කරනු ලැබිය යුතු ය. තව ද එම කරුණ සම්බන්ධයෙන් වන කොමිෂන් සභාවේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට එම සාමාජිකයා සහභාගී නොවිය යුතු අතර, එම සාකච්ඡාව පැවැත්වෙන හෝ එම තීරණය ගැනීම කෙරීගෙන යන අතරතුර දී එම සාමාජිකයා එම රැස්වීමෙන් ඉවත්ව සිටිය යුතු ය.

14. කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාපටිපාටියක්, ක්‍රියාවක් හෝ තීරණයක් බලරහිත නොවිය යුතු ය.

15. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු සහ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට දී හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා පැමිණ නොමැති අවස්ථාවක දී, කොමිෂන් සභාවේ යම් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටින බවට සාක්ෂියක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුතු ය.

3 වන පරිච්ඡේදය

කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

16. කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍යඃ-

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම සහ සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් සහ වැඩසටහන් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට සහාය වීම;

(ආ) ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොළවල් සම්බන්ධයෙන් වන පර්යේෂණ සහ පුහුණු කිරීම් ඇතුළුව ශ්‍රී ලංකාව තුළ සුරැකුම්පත් වෙළෙඳපොළවල් සංවර්ධනය කිරීම දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඇ) වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන්, ලියාපදිංචි තැනැත්තන්, නිෂ්කාශන සාමාජිකයන්, වෙළෙඳ සහභාගිකයන්, තැන්පතුගාර සහභාගිකයන්, නිකුත්කරන්නන්, ආයෝජකයන් හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවන් හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙත කලින් කලට මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සාමාන්‍ය හෝ විශේෂ විධාන හෝ උපදෙස් ලබාදීම;

(ඈ) වෙළෙඳ ආයතනවල, වෙළෙඳපොළ අතරමැදියන්ගේ, සාමූහික ආයෝජන යෝජනාක්‍රමවල හෝ ලැයිස්තුගත පොදු සමාගම්වල අතිරේක සේවා සැපයුම්කරුවන්ට කලින් කලට සාමාන්‍ය හෝ විශේෂ විධාන හෝ උපදෙස් ලබා දීම;

(ඉ) වෙළෙඳපොළ ආයතනයක් ලෙස ක්‍රියාත්මකවීමට සංස්ථාවකට බලපත්‍රයක් ප්‍රදානය කිරීම සහ එය නිසි පරිදි කටයුතු කරන බවට වගබලා ගැනීම;

(ඊ) වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ක්‍රියාත්මකවීමට යම් තැනැත්තකුට බලපත්‍රයක් ප්‍රදානය කිරීම සහ එය නිසි පරිදි කටයුතු කරන බවට වගබලා ගැනීම;

(උ) ලියාපදිංචි තැනැත්තකු ලෙස, වෙළෙඳපොළ අතරමැදියකු සඳහා සහ එය වෙනුවෙන් සුරැකුම්පත් විකිණීමට හෝ මිල දී ගැනීමට සේවාදායකයන්ට උපදෙස් ලබා දෙන්නා වූ තැනැත්තෙක් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමේ දී ඔවුන් කටයුතු කරන ආකාරය නියාමනය කිරීම;

(ඌ) යම් තැනැත්තකු වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම;

(එ) ලැයිස්තුගත පොදු සමාගම්වලට හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයන්ට කලින් කලට සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීම;

(ඒ) අත්කරගන්නකුට, අර්පණදායියකුට හෝ අර්පණදායියකු හෝ අර්පණලාභියකු හා එක්ව ක්‍රියාකිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන්ට හෝ ලැයිස්තුගත පොදු සමාගමක් අත්කර ගැනීමට හෝ ඒකාබද්ධ වීමකට අදාළ වන්නා වූ ඉලක්ක සමාගමකට සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීම;

(ඔ) මේ පනත, නියෝග හෝ රීතිවල ආසන්න කඩවීම් වැළැක්වීමට සහ කඩවීම් මැඩපැවැත්වීමට යම් තැනැත්තකුට විශේෂ විධාන නිකුත් කිරීම;

(ඕ) විනිමය ස්ථානයක දී සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම නියාමනය කිරීම;

(ක) සුරැකුම්පත් නිකුත් කිරීම නියාමනය කිරීම;

(ග) යම් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම තහනම් කිරීම හෝ අත්හිටුවීම හෝ ලැයිස්තුගත කළ සුරැකුම්පත් අපලේඛනගත කිරීම හෝ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම තහනම් කිරීම හෝ අත්හිටුවීම හෝ ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ සාධාරණ සහ විධිමත් සුරැකුම්පත් වෙළෙඳපොළක් සහතික කිරීම සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි සලකනු ලබන යම් පියවර ගැනීම;

(ච) කොමිෂන් සභාවේ පරමාර්ථ සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි යම් නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරවීම සහ එම නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැටුප් සහ වේතන හෝ අනෙකුත් පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ තීරණය කිරීම;

(ජ) යම් නිශ්චල හෝ චංචල දේපළක් කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ට) ලැයිස්තුගත පොදු සමාගමක් අත්කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම හෝ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු නියාමනය කිරීම;

(ඩ) වෙළෙඳපොළ ආයතනයක, වෙළෙඳපොළ අතරමැදියකුගේ, ලියාපදිංචි තැනැත්තකුගේ, ලැයිස්තුගත පොදු සමාගමක හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයක යම් කටයුත්තක් පිළිබඳව විභාග කිරීම සහ විමර්ශන පැවැත්වීම;

(ණ) යම් තැනැත්තකු විසින් කරන ලදැයි කියනු ලබන මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් රීතියක් හෝ විධානයක් හෝ ලබා දෙන ලද යම් උපදෙසක් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති බලාත්මක කිරීමේ පියවර ගැනීම;

(ත) මේ පනතේ විෂය පථය තුළට ගැනෙන්නා වූ යම් කාරණාවකට අදාළව යම් සංවිධානයක් හෝ විදේශීය නියාමන අධිකාරියක් සමඟ ගිවිසුම්වලට හෝ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම;

(ද) යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු, අතිරේක සේවා සපයන්නකු, යම් ලැයිස්තුගත පොදු සමාගමක් හෝ යම් ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයක් විසින් සිදු කරන ලද නීති විරෝධි චර්යා පිළිබඳ තීරණ ප්‍රකාශයට පත් කිරීම;

(න) සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳ ආවේක්ෂණ සිදු කිරීම;

(ප) කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද යම් සේවාවන් සඳහා ගාස්තු හෝ අයකිරීම් අයකර ගැනීම;

(බ) මූල්‍ය පද්ධතියට ඇති සංස්ථානික අවදානම අවම කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි පරිදි යම් පියවර ගැනීම;

(ම) සුරැකුම්පත්වලට දායකවීම සඳහා මහජනයාට අර්පණයක් සිදු කර ඇති සමාගම්වලට විශේෂ හෝ සාමාන්‍ය විධාන ලබා දීම;

(ය) ඇතැම් මහජන අර්පණ හෝ නිකුත් කිරීම් මේ පනතේ විධිවිධානවලින් නිදහස් කිරීම;

(අඅ) මේ පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් යෝග්‍ය යැයි සළකනු ලබන විශේෂඥයන් පත් කිරීම; සහ

(ආඅ) මේ පනත යටතේ වන කොමිෂන් සභාවේ පරමාර්ථ, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය යැයි, ආනුෂංගික සහ උපසේවී යැයි සලකනු ලැබිය හැකි වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම,

විය යුතු ය.

17. 16 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති බලතලවලට අමතරව, කොමිෂන් සභාවට පහත දැක්වෙන බලතල ද තිබිය යුතු ය:-

(අ) වෙළෙඳපොළ ආයතන හෝ වෙළෙඳපොළ අතරමැදියන් හෝ ලියාපදිංචි තැනැත්තන් හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවල භාරකරුවන් මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූලව කටයුතු කරනු ලබන්නේ ද යන්න නිශ්චය කර ගැනීමට සහ තීරණය කිරීම පිණිස ඔවුන්ගේ කටයුතු පිළිබඳ අධීක්ෂණ සහ පරීක්ෂණ සිදු කිරීම සහ, අවස්ථාවෝචිත පරිදි, එම වෙළෙඳපොළ ආයතනවලින්, වෙළෙඳපොළ අතරමැදියන්ගෙන්, ලියාපදිංචි තැනැත්තන්ගෙන් හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවල භාරකරුවන්ගෙන් එම පරීක්ෂණ සිදු කිරීමේ දී දරන ලද වියදම් අයකර ගැනීම;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලද ආකෘතියට හා ආකාරයට අනුකූලව සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරනු ලැබූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ අතුරු මූල්‍ය ප්‍රකාශ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස වෙළෙඳපොළ ආයතන හෝ වෙළෙඳපොළ අතරමැදියන්ට නියම කිරීම; සහ

(ඇ) සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක බලපත්‍රලත් කළමනාකරණ සමාගමට, සෑම වසරක් සඳහා ම වන වාර්තා සහ යටත් පිරිසෙයින්, ඒ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ ඒ වසරේ කටයුතු පිළිබඳ වාර්තා දෙකක්වත් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස නියම කිරීම. කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි යම් විස්තර එකී සෑම වාර්තාවකම ඇතුළත් විය යුතු ය. පළමු වාර්තාව ඒ වසරේ සැප්තැම්බර් මස තිස් වන දිනට පසු නොවන දිනක දී ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර දෙවන වාර්තාව එළඹෙන වසරේ මාර්තු මස තිස් එක් වන දිනට පසු නොවන දිනක දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

18. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින්, නීතිඥවරයකු වන කොමිෂන් සභාවේ යම් නිලධරයකුට හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පවරන ලද හෝ කොමිෂන් සභාවට විරුද්ධව පවරන ලද යම් නඩු කටයුත්තකට හෝ කොමිෂන් සභාවට සැලකිය යුතු සබඳතාවක් ඇති යම් නඩු කටයුත්තකට පෙනී සිටීමට බලය දෙනු ලැබිය හැකි ය.

4 වන පරිච්ඡේදය

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

19. (1) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු අතර එකී අධ්‍යක්ෂ ජනරාල්වරයා එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික ඇතුළු සේවා නියුක්තියේ කොන්දේසි කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු-

(අ) අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් බරපතළ විෂමාචාරයකට වරදකරු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ නියාමන ආයතනයක් හෝ පෙර සේවායෝජකයකු විසින් ගන්නා ලද විනය ක්‍රියාමාර්ගයකට යටත්ව ඇත්නම්;

(ආ) කලින් ධුරයෙන් පහකර ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් සිදු කර ඇත්නම්,

කොමිෂන් සභාව විසින් එම තැනැත්තා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කිරීම සඳහා නිර්දේශ කරනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කොමිෂන් සභාවේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ එහි බලතල, කර්තව්‍ය සිදු කිරීම සහ කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, එසේ කිරීමට අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන කවර හෝ විටක දී, මේ පනතින් ඔහුට පිරිනමන ලද හෝ පවරන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් යම් නිලධරයකුට හෝ සේවකයකුට පවරනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව, එම නිලධරයා හෝ සේවකයා විසින්, එම බලය, කර්තව්‍යය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා දිගටම සිය ධුරයේ කටයුතු කිරීම කොමිෂන් සභාවේ යහපතට අනර්ථදායක වන්නේ නම්, ඔහුව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එසේ ඉවත් කිරීමට පෙරාතුව කොමිෂන් සභාව විසින්, එම අධ්‍යක්ෂ ජනරාල්වරයාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය.

20. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන යටතේ වන එහි කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීමේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින්, එහි කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි එය විසින් සලකනු ලබන පරිදි සේවක සංඛ්‍යාවට අදාළ තනතුරු පිහිටුවා නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරවනු ලැබිය හැකි අතර, එම සේවකයන්ගේ සහ නිලධරයන්ගේ වැටුප් සහ වේතන හෝ අනෙකුත් පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ විශ්‍රාම වැටුප් තීරණය කරනු ලැබිය හැකි ය.

(2) මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කොමිෂන් සභාව විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ සහ එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා නියාමනය කරනු ලැබිය හැකි අතර එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, තාක්ෂණික සේවක පිරිසට සුරැකුම්පත් වෙළෙඳපොළවල්, මුදල්, නීතිය, මුදල් ආර්ථික විද්‍යාව යන විෂයයන් සහ අනෙකුත් විෂයයන් පිළිබඳ පුහුණුව ලබාදීම ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම සිදු කරනු ලැබිය යුතු අතර, මේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යෝග්‍යතාව පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශීය රටක දී නිරත වනු ලබන අධ්‍යයනයන්ට අදාළ වියදම් පියවීමට කොමිෂන් සභාවට බලය හිමි විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් චර්යා ධර්ම සංග්‍රහයක් පිහිටුවනු ලැබිය යුතු අතර එය කොමිෂන් සභාවේ නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ විය යුතු ය.

(5) යම් තැනැත්තකු-

(අ) අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් බරපතළ විෂමාචාරයකට වරදකරු බවට කලින් තීරණය කරනු ලැබ ඇත්නම් හෝ නියාමන ආයතනයක් විසින් යම් විනය ක්‍රියාමාර්ගයකට යටත් කර ඇත්නම්;

(ආ) කලින් ධුරයෙන් පහ කර ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් සිදු කර ඇත්නම්,

කොමිෂන් සභාව විසින් එම තැනැත්තා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කැමැත්ත ම ඇතිව, එම කාර්යය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(7) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයා සඳහා සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(8) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයා සඳහා සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(9) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීමට ගිවිසගෙන ඇති යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයේ යොදවන අවස්ථාවක, එම තැනැත්තා විසින් කොමිෂන් සභාවේ සේවය කරනු ලබන යම් කාලසීමාවක්, එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) කොමිෂන් සභාව විසින් එහි නිලධරයන් හෝ සේවකයන්, එම නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ කැමැත්ත ඇතිව, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටක වෙනත් රාජ්‍ය ආයතනවලට හෝ නියාමන අධිකාරිවලට, එම ආයතනය හෝ අධිකාරිය සහ කොමිෂන් සභාව අතර ගිවිසුමක් මත අවුරුදු තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා අනුයුක්ත කිරීමට යෝජනා කරනු ලැබිය හැකි ය. එසේ අනුයුක්ත කරන කාලසීමාව කොමිෂන් සභාවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

21. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු එම නිලධරයාගේ හෝ සේවකයාගේ සහ එම සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, විශ්‍රාම වැටුප් හෝ සේවක අර්ථසාධක අරමුදල්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව, කොමිෂන් සභාව විසින් සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් ගිවිස ගනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ තාවකාලිකව නැතහොත් ස්ථිරව ම කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක දී ඔහු කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

22. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ ඒවායේ කාර්ය සඳහා කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

23. (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය.

II වන කොටස

වෙළෙඳපොළවල් සහ වෙළෙඳපොළ ආයතන

24. මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ විය යුත්තේ:-

(අ) වෙළෙඳපොළ ආයතන පිහිටුවීම මගින් ශ්‍රී ලංකාව තුළ සාධාරණ, විධිමත්, විනිවිදභාවයෙන් යුත් සහ කාර්යක්ෂම සුරැකුම්පත් වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම;

(ආ) සුරැකුම්පත් වෙළෙඳපොළක ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම; සහ

(ඇ) සුරැකුම්පත් වෙළෙඳපොළවල් හා සම්බන්ධ සංස්ථානික අවදානම් අවම කිරීම,

විය යුතු ය.

1 වන පරිච්ඡේදය

විනිමය ස්ථාන

25. (1) කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රයක අධිකාරී බලය මත හැර යම් තැනැත්තකු විසින්, විනිමය ස්ථානයක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

26. (1) විනිමය ස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති මගින් දක්වනු ලැබිය හැකි යම් ආකාරයකින් සහ ආකෘතියකින් සහ යම් ලේඛන සහ නියම කරනු ලැබිය හැකි යම් ගාස්තු ද සමඟ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, සංස්ථාවක් විසින් පමණක් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව-

(අ) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරුට හැකියාව ඇති බවට;

(ආ) එහි ව්‍යාපාරයට සහ මෙහෙයුම්වලට සම්බන්ධ යම් අවදානම් විචක්ෂණශීලි ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඉල්ලුම්කරු සතු වන බවට;

(ඇ) (අ) ඡේදය යටතේ වන එහි බැඳීම් ඉටු කිරීමේ දී, විනිමය ස්ථානය විසින් මහජන සුබසිද්ධියට පටහැනිව ක්‍රියා නොකරන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය පාලනකරණ ව්‍යුහයන් ඉල්ලුම්කරු සතු වන බවට;

(ඈ) ඉල්ලුම්කරුට-

(i) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක්;

(ii) එහි ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රමාණවත් සහ නිසි ලෙස සූදානම් කර ඇති පරිශ්‍රයක්;

(iii) එහි ව්‍යාපාර කටයුතු සඳහා දක්ෂ සේවක පිරිසක්; සහ

(iv) අවදානම් කළමනාකරණය කිරීම සඳහා සහ හදිසි අවස්ථාවලට මුහුණදීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවක්, ආරක්ෂක සැලසුම් සහ පහසුකම් සහිත ස්වයංක්‍රීය පද්ධතීන්,

සැපයීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍යමය සම්පත්, මානව සම්පත්, ස්වයංක්‍රීය පද්ධතීන් සහ අනෙකුත් සම්පත් ඇති බවට;

(ඉ) ඉල්ලුම්කරු විසින්, රීති මගින්-

(i) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක්;

(ii) වෙළෙඳපොළ සහභාගිකයන් ඇතුළත් කර ගැනීම සඳහා;

(iii) ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කරන විට දී එහි වෙළෙඳ සහභාගිකයන්ගේ ව්‍යාපාර කටයුතු නිසි පරිදි නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(iv) යහපත් චරිතයකින් සහ උසස් ව්‍යාපාරික විශ්වසනීයත්වයකින් යුතු නොවන තැනැත්තන් වෙළෙඳ සහභාගිකයන් ලෙස පිළිගැනීමෙන් බැහැර කිරීම;

(v) ව්‍යාපාර කටයුතු කිරීමේ දී සාධාරණ සහ යුක්තිසහගත මූලධර්මවලට අනනුකූල ලෙස කටයුතු කිරීම හෝ විනිමය ස්ථානයේ රීති හෝ මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීම හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් යම් වෙළෙඳ සහභාගිකයකු හෝ එම වෙළෙඳ සහභාගිකයා වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු සඳහා දඩ නියම කිරීම ඇතුළුව එම වෙළෙඳ සහභාගිකයා හෝ තැනැත්තා ඉවත් කිරීම, ඔවුන්ගේ කටයුතු අත්හිටුවීම හෝ ඔවුන් විනය පාලනයට යටත් කිරීම;

(vi) සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම හෝ අපලේඛනගත කිරීම සිදු කළ හැකි කොන්දේසි;

(vii) එම ලැයිස්තුගත සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම පාලනය වන කොන්දේසි සහ විනිමය ස්ථානයේ තම සුරැකුම්පත් ලැයිස්තුගත කර ඇති සමාගම් හෝ වෙනත් ආස්ථිත්‍යයන් විසින් අනුගමනය කරනු ලැබිය යුතු රීති;

(viii) එහි පහසුකම් තුළ ගනුදෙනු කළ හැකි හෝ වෙළෙඳාම් කළ හැකි සුරැකුම්පත් පන්තිය හෝ පන්ති;

(ix) වෙළෙඳපොළ විෂමාචාරය තහනම් කිරීම සහ විමර්ශන සිදු කරන ආකාරය;

(x) එහි වෙළෙඳ සහභාගිකයන්ගේ ව්‍යාපාර කටයුතු කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ හෝ විමර්ශන පැවැත්වීම;

(xi) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ විධිමත් සහ සාධාරණ වෙළෙඳාමක් පවත්වා ගැනීම සඳහා යම් නිශ්චිත සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම අත්හිටුවීම;

(xii) සාමාජිකයන්ගෙන් බහුතරය වෙළෙඳ සහභාගිකයන්ගෙන් හෝ විනිමය ස්ථානයෙන් ස්වාධීන තැනැත්තන් වන්නා වූ විනය කමිටුවක්-

(අ) වෙළඳ සහභාගිකයන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර;

(ආ) වෙළෙඳ සහභාගිකයන් අතර;

(ඇ) වෙළෙඳ සහභාගිකයන් සහ විනිමය ස්ථානයක්, මධ්‍යම තැන්පතුගාරය හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් අතර;

(ඈ) විනිමය ස්ථානයේ ලැයිස්තුගත ආස්ථිත්‍යයන් සහ විනිමය ස්ථානය අතර,

වන ආරාවුල් සම්බන්ධයෙන් විභාග කර තීරණය කිරීම සඳහා පත් කිරීම;

(xiii) සාමාන්‍යයෙන්, ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ නිසි සැලකිල්ල දක්වමින් විනිමය ස්ථානයේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම,

සඳහා විධිවිධාන සලස්වන බවට; සහ

(ඊ) මහජනයාගේ සුබසිද්ධීන් හෝ වෙළෙඳපොළ මනා ලෙස නියාමනය කිරීම බලපත්‍රය ප්‍රදානය මගින් ඉටු වන බවට,

කොමිෂන් සභාව සෑහීමට පත් වන විට දී, කොමිෂන් සභාව විසින්, විනිමය ස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා එම ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන යම් ඉල්ලුම්කරුවකු විසින්, ඉල්ලුම් පත්‍රයට අදාළව කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි නියම කරනු ලැබිය හැකි යම් අතිරේක තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි ලෙස නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු බවට කොමිෂන් සභාව සෑහීමට පත් වුවහොත්, කොමිෂන් සභාව විසින්, නියම කරන ලද නියම හෝ කොන්දේසි සංශෝධනය කිරීම, අහෝසි කිරීම හෝ අතිරේක නියම හෝ කොන්දේසි පැනවීම හෝ කරනු ලැබිය හැකි ය.

27. (1) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත් සඳහා විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් සහතික කිරීම විනිමය ස්ථානයක කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එහි කාර්යය ඉටු කිරීමේ දී, විනිමය ස්ථානය විසින්-

(අ) ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම;

(ආ) සමාගම්වලට අදාළ යම් නීතියක් යටතේ සැලසිය යුතු යම් සුබසිද්ධියක්, (අ) ඡේදයේ සඳහන් සුබසිද්ධිය සමඟ ගැටෙන විට දී, (අ) ඡේදයේ සඳහන් සුබසිද්ධිය බලපැවැත්වෙන බවට වගබලා ගැනීම; සහ

(ඇ) එහි ව්‍යාපාරය සහ මෙහෙයුම් හා සම්බන්ධ යම් අවදානමක් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් සෑම විට දී ම මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම විනිමය ස්ථානයක අධ්‍යක්ෂවරයකුගේ කාර්යය විය යුතු අතර මේ පනත යටතේ වන කාර්යය සහ වෙනත් යම් නීතියක් යටතේ වන අධ්‍යක්ෂවරයකුගේ කාර්යය අතර ගැටුමක් ඇති වූ විට මේ පනත යටතේ වන කාර්යය බලපැවැත්විය යුතු ය.

(4) එහි රීතිවලට අනුකූලව කටයුතු කිරීම අධීක්ෂණය කිරීමේ හෝ සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා එහි රීති යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගැනීම විනිමය ස්ථානයේ කාර්යය විය යුතු ය.

(5) යම් විනිමය ස්ථානයකට-

(අ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි අවම මූල්‍යමය නියමයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා යම් වෙළෙඳ සහභාගිකයකු සතු හැකියාව ඇතුළුව එහි බලපත්‍රලත් ව්‍යාපාරය සම්බන්ධයෙන් වන බැඳීම් ඉටු කිරීම සඳහා යම් වෙළෙඳ සහභාගිකයකු සතු හැකියාවට අහිතකර ලෙස බලපානු ලබන හෝ අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් කරුණක්; හෝ

(ආ) විනිමය ස්ථානයේ මතය අනුව, යම් වෙළෙඳ සහභාගිකයකුගේ හෝ අදාළ වෙළෙඳ සහභාගිකයාගේ ප්‍රධාන විධායක නිලධරයාගේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ මූල්‍යමය තත්ත්වයට හෝ මූල්‍යමය ඒකාග්‍රතාවට බොහෝ දුරට බලපෑ හැකි බවට පෙන්නුම් කරනු ලබන හෝ පෙන්නුම් කරනු ලැබිය හැකි යම් අවිධිමත් ක්‍රියාවක්, මේ පනතේ යම් විධිවිධානයක්, නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකිරීමක් හෝ වෙනත් යම් කරුණක්,

පිළිබඳව දැන ගැනීමට ලැබුණහොත් එම විනිමය ස්ථානය විසින් වහාම ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) විනිමය ස්ථානයක් විසින්, (5) වන උපවගන්තියේ සඳහන් කටයුතු සිදුවීම මත එහි වෙළෙඳ සහභාගිකයන් කිසිවකුට එරෙහිව අවවාදයක් ලබා දෙනු ලබන, දඩයක් නියම කරනු ලබන, ඔහුගේ කටයුතු අත්හිටුවනු ලබන, ඔහු ඉවත් කරනු ලබන හෝ ඔහුට එරෙහිව වෙනත් යම් විනය පියවරක් පනවනු ලබන අවස්ථාවක, එම විනිමය ස්ථානය විසින් දින හතක් ඇතුළත පහත දැක්වෙන තොරතුරු ලිඛිතව කොමිෂන් සභාව වෙත ලබා දෙනු ලැබිය යුතු ය:-

(අ) වෙළෙඳ සහභාගිකයාගේ ව්‍යාපාරයේ නම සහ ලිපිනය;

(ආ) ගන්නා ලද ක්‍රියාමාර්ගය සඳහා වූ හේතුව සහ එම ක්‍රියාමාර්ගයේ ස්වභාවය;

(ඇ) වෙළෙඳ සහභාගිකයාගේ කටයුතු අත්හිටුවනු ලබන හෝ වෙළෙඳ සහභාගිකයාට එරෙහිව දඩයක් පනවා ඇත්නම්, එසේ ඔහුගේ කටයුතු අත්හිටුවන ලද කාලසීමාව සහ නියම කරන ලද දඩයේ ප්‍රමාණය; සහ

(ඈ) ගන්නා ලද වෙනත් යම් විනය පියවරක්.

28. (1) කොමිෂන් සභාව විසින්,-

(අ) ලිඛිත දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි, මේ පනතේ 26 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම; හෝ

(ආ) ලිඛිත දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි, යම් පහසුකම් සැපයීම හෝ මෙහෙයවීම නතර කරන ලෙස හෝ යම් සේවාවන් සැපයීම නතර කරන ලෙස හෝ එම විනිමය ස්ථානය වෙත විධාන කිරීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(2) පහත දැක්වෙන අවස්ථානුගත කරුණු කිසිවක් උද්ගත වන අවස්ථාවක, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන සුබසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි පරිදි නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වුවහොත් මිස, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම සිදු කරනු නොලැබිය යුතු ය:-

(අ) විනිමය ස්ථානය විසින් සිය සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම නතර කරනු ලැබීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී විනිමය ස්ථානය ගණන් බේරා වසා දමනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හරිනු ලැබීම;

(ඇ) විනිමය ස්ථානය විසින් එහි බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් කඩකර තිබීම හෝ මේ පනත යටතේ වන යම් වරදකට චෝදනා ලැබීම;

(ඈ) විනිමය ස්ථානය විසින්, මේ පනත යටතේ නිකුත් කරන ලද එහි බලපත්‍රයේ හෝ විධානයේ නියමයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්ව තිබීම හෝ මේ පනත යටතේ වන යම් විධිවිධානයකට හෝ අවශ්‍යතාවයකට අනුකූලව කටයුතු කිරීමට අන්‍යාකාරයකින් අපොහොසත් වීම;

(ඉ) 26 වන වගන්තියේ කාර්ය සඳහා ලබා දෙන ලද යම් තොරතුරක වැදගත් කරුණක් අසත්‍ය ලෙස හෝ නොමඟ යවන සුලු ලෙස ලබා දී තිබීම හෝ එමගින් වැදගත් තොරතුරක් ලබා දීම පැහැර හැර තිබීම;

(ඊ) විනිමය ස්ථානයට එරෙහිව වන යම් විනිශ්චිත ණයක මුළු මුදල ම හෝ ඉන් කොටසක් ගෙවා තෘප්ත කර නොතිබීම;

(උ) විනිමය ස්ථානයේ යම් දේපළකට අදාළව හෝ යම් දේපළක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් භාර ගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඈවරකරුවකු හෝ ඒ හා සමාන යම් තැනැත්තකු පත් කර තිබීම;

(ඌ) විනිමය ස්ථානය විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී එහි ණය හිමියන් සමඟ, සමථයකට හෝ සමථ යෝජනා ක්‍රමයකට එළඹ ඒවා ඉටුකර නොතිබීම; හෝ

(එ) විනිමය ස්ථානය විසින් එහි මෙහෙයවීම යටතේ, විනිමය ස්ථානයක් වශයෙන් වන එහි බලපත්‍රය අවලංගු කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබීම සහ එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සිතන්නේ නම්.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා, යම් විනිමය ස්ථානයක් විසින්, කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන සති දෙකක් ඉක්ම වූ කාලසීමාවකට එම සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම නතර කර ඇති අවස්ථාවක, එම විනිමය ස්ථානය විසින් එහි සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම නතර කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් සිදු වුව ද, එය නොතකා-

(අ) විනිමය ස්ථානයේ මෙහෙයුම් නවතා දැමීමේ හෝ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති සේවාවන් සැපයීම නතර කිරීමේ කාර්යය සඳහා;

(ආ) ආයෝජකයන්ගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා; හෝ

(ඇ) මහජන සුබසිද්ධිය සඳහා,

කොමිෂන් සභාව විසින් දැන්වීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එම අවලංගු කිරීමෙන් හෝ විධානයෙන් බලපෑමට ලක් වූ යම් ක්‍රියාකාරකම්, එම අවලංගු කිරීම හෝ විධානය බලාත්මක වන දින සිට හෝ ඉන් පසුව දිගටම කරගෙන යාමට කොමිෂන් සභාව විසින් එම විනිමය ස්ථානයට අවසර දෙනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් යම් විනිමය ස්ථානයකට දිගටම කටයුතු කරගෙන යාම සඳහා අවසර ලබා දී ඇති අවස්ථාවක, එම අවසරයට අනුකූලව එහි කටයුතු කරගෙන යාම හේතුවෙන් එම විනිමය ස්ථානය විසින් (1) වන උපවගන්තිය කඩකර ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කටයුතු කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳ අමාත්‍යවරයා වෙත දැන්වීමක් ලබා දී, ආයෝජකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා හෝ මහජනයාගේ සුබසිද්ධිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන යම් පියවර ගනු ලැබිය හැකි ය.

(7) කරුණු ඉදිරිපත් කිරීම සඳහා විනිමය ස්ථානයට අවස්ථාවක් ලබා නොදී, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් යම් විනිමය ස්ථානයක් විසින් එකී දැන්වීම ලැබුණු දින සිට දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කරනු ලැබ ඇති වුව ද, එය නොතකා, අමාත්‍යවරයාගේ තීරණය ලබා දෙන තෙක්, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් දිගටම බලාත්මක විය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කරනු ලැබූ විට දී, අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ සහ විනිමය ස්ථානයේ කරුණු ඉදිරිපත් කිරීම්වලට සවන් දීමෙන් පසු, එම අභියාචනය ලැබීමෙන් මාස තුනක කාලසීමාවක් ඇතුළත-

(අ) එම අභියාචනයට අවසර දී එම බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය අහෝසි කරන ලෙස කොමිෂන් සභාවට විධාන කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම අභියාචනයට අවසර නොදෙනු ලැබිය හැකි ය.

(11) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ තීරණය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(12) (11) වන උපවගන්තියට යටත්ව, කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ සිදුකරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

29. 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ යම් විධානයක් නිකුත් කිරීමක්-

(අ) එම විනිමය ස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වැඩපිළිවෙළකට එළඹෙන ලද්දේ 28 වන වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානය නිකුත් කිරීමට පෙරාතුව වුව ද, 28 වන වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වන විට දී, බලපත්‍රය අවලංගු කළ හෝ විධානය නිකුත් කළ පසුව වුව ද එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ වළක්වන පරිදි හෝ ඊට බලපෑම් කරන පරිදි; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ යටතේ පැන නගින යම් අයිතිවාසිකමකට, බැඳීමකට හෝ වගකීමකට බලපෑම් කරන පරිදි,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

30. (1) (අ) ශ්‍රී ලංකාව තුළ යම් හදිසි අවස්ථාවක් හෝ ස්වභාවික ආපදාවක් ඇතිවීම; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ආර්ථික හෝ මූල්‍යමය අර්බුදයක් හෝ ඒ හා සමාන වෙනත් යම් අවස්ථානුගත කරුණක් පැවතීම,

හේතුවෙන් සුරැකුම්පත් වෙළෙඳපොළෙහි සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම සඳහා විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් පැවතීම වැළැක්වෙමින් පවතින බව හෝ වැළැක්වීමට ඉඩ ඇති බව කොමිෂන් සභාවේ මතය වන විට, විනිමය ස්ථානය විමසීමෙන් පසු, කොමිෂන් සභාව විසින්, එහි සුරැකුම්පත් වෙළෙඳපොළ ව්‍යාපාරික දින පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වසා දමන ලෙස විනිමය ස්ථානයට විධාන කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ වන සුරැකුම්පත් වෙළෙඳපොළ වසා දැමීම තවත් යම් කාලසීමාවක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි අතර එම එක් එක් කාලසීමාව වරක දී ව්‍යාපාරික දින පහක් නොඉක්මවනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද විධානයක, එම වසා දැමීම සඳහා වූ හේතු සහ (2) වන උපවගන්තිය යටතේ වන යම් වසා දැමීම දීර්ඝ කිරීමක්, එම දීර්ඝ කිරීම සඳහා වූ හේතු නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, විනිමය ස්ථානය වෙත (1) වන උපවගන්තිය යටතේ වන විධානයක හෝ (2) වන උපවගන්තිය යටතේ වන දීර්ඝ කිරීමක පිටපතක් ලබා දෙනු ලැබිය යුතු අතර, (1) වන උපවගන්තිය යටතේ වන විධානය හෝ (2) වන උපවගන්තිය යටතේ වන දීර්ඝ කිරීම බලාත්මකව පවතින තෙක් එම විධානය හෝ දීර්ඝ කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා එම විනිමය ස්ථානය විසින් සාධාරණ ලෙස ඉටු කරනු ලැබිය හැකි සියලු දේ කරන ලෙස එම විනිමය ස්ථානයට විධාන කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් මේ වගන්තිය යටතේ එහි බලය ක්‍රියාත්මක කරනු ලබන විට දී, මේ වගන්තිය යටතේ වන බලය ක්‍රියාත්මක කිරීම සඳහා වන හේතු දක්වමින් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත දැනුම්දීමක් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ-

"ව්‍යාපාරික දිනය" යන්නෙන්, වසා දැමීම සිදු නොවූයේ නම් විනිමය ස්ථානය තුළ නිල වශයෙන් වෙළෙඳාමක් පවතින යම් දිනයක් අදහස් වේ;

"සාධාරණ වෙළෙඳපොළ" යන්නට, සැපයුම් සහ ඉල්ලුම් බලවේග පෙන්නුම් කරනු ලබන වෙළෙඳපොළක් ඇතුළත් වේ.

31. (1) යම් විනිමය ස්ථානයක් විසින් එහි සුරැකුම්පත් එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමට තීරණය කරනු ලබන විට දී, එම විනිමය ස්ථානය විසින් ඒ සඳහා කොමිෂන් සභාවේ සහ මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(2) යම් විනිමය ස්ථානයක් විසින් එම විනිමය ස්ථානයේ අවශ්‍ය සියලු ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කර ඇති බවට සෑහීමට පත් වන විට දී, කොමිෂන් සභාව විසින්, එම විනිමය ස්ථානයට එහි සුරැකුම්පත් එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීම සඳහා අනුමතය ලබා දෙනු ලැබිය යුතු ය.

(3) එකී අනුමතය ලබාදුන් විට දී, එම විනිමය ස්ථානය විසින්-

(අ) එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමෙන් ඇති විය හැකි සම්බන්ධතා අතර ගැටුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා;

(ආ) එම විනිමය ස්ථානයේ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීමේ විශ්වසනීයත්වය සහතික කිරීමේ කාර්යය සඳහා; සහ

(ඇ) එම විනිමය ස්ථානය ලැයිස්තුගත සමාගමක් බවට පත් වුවහොත් ලැයිස්තුගත සමාගමක් ලෙස වන බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීම සඳහා,

කොමිෂන් සභාව විසින් අවශ්‍ය කරනු ලැබිය හැකි පරිදි යම් වැඩපිළිවෙළකට එළඹී එම අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන් මගින්-

(අ) එම විනිමය ස්ථානයේ නිල ලැයිස්තුවට එම විනිමය ස්ථානය ඇතුළත් කර ගැනීමට හෝ ඉන් එම විනිමය ස්ථානය ඉවත් කිරීමට;

(ආ) එම විනිමය ස්ථානයේ සුරැකුම්පත් එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීම හෝ වෙළෙඳාම් කිරීම නැවැත්වීමට හෝ අත්හිටුවීමට; හෝ

(ඇ) ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන් හෝ (1) වන උපවගන්තියේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් යෝග්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කරුණු පවත්වාගෙන යාමට,

අදාළව එම විනිමය ස්ථානය විසින් තීරණ ගැනීම සහ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට ඒ සඳහා කොමිෂන් සභාවට ඉඩ දෙනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ වන යම් වැඩපිළිවෙළක් මගින්, එම වැඩපිළිවෙළ යටතේ හෝ අන්‍යාකාරයකින් කොමිෂන් සභාව විසින් සපයනු ලබන සේවාවන් සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තු විනිමය ස්ථානය විසින් කොමිෂන් සභාවට ගෙවනු ලැබීම සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(6) යම් විනිමය ස්ථානයක රීති අනුමත කිරීම සඳහා හෝ සංශෝධනය කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතලවලට අගතියක් නොමැතිව, කොමිෂන් සභාව විසින්, ලිඛිත දැන්වීමක් මගින්-

(අ) එම විනිමය ස්ථානයේ සුරැකුම්පත් ලැයිස්තුගත කිරීමක් සඳහා හෝ වෙළෙඳාම් කිරීමක් සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය සඳහා එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන් මඳ වශයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) යම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයකින් එම විනිමය ස්ථානය නිදහස් කරනු ලැබිය හැකි ය.

2 වන පරිච්ඡේදය

නිෂ්කාශනාගාරය

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පරිච්ඡේදයේ-

"මධ්‍යම ප්‍රතිපාර්ශ්වය" යන්නෙන්, එක් එක් වෙළෙඳාම සඳහා ඇපවීම මගින් සෑම විකුණුම්කරුවකුට ම ගැනුම්කරු වීමෙන් ද සෑම ගැනුම්කරුවකුටම විකුණුම්කරුවීමෙන් ද සුරැකුම්පත් වෙළෙඳපොළෙන් වෙළෙඳාම් නිෂ්කාශනය කිරීමෙහි සහ නිරවුල් කිරීමෙහි නිරත නෛතික තැනැත්තකු අදහස් වේ;

"පැහැර හැරීමේ නඩු කටයුතු" යන්නෙන්, නිෂ්කාශනාගාරයක් විසින් එහි පැහැර හැරීමේ රීති යටතේ පවරන ලද යම් නඩු කටයුතු හෝ ගන්නා ලද වෙනත් ක්‍රියාමාර්ග අදහස් වේ;

"පැහැර හැරීමේ රීති" යන්නෙන්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් සම්බන්ධයෙන් වන විට, යම් නිෂ්කාශන සාමාජිකයකු තමා පාර්ශ්වයක් වන්නා වූ යම් නිරවුල් නොකළ වෙළෙඳපොළ ගිවිසුම් සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් වන තම බැඳීම් ඉටු කිරීමට අපොහොසත්ව ඇත්නම්, පැහැර හැරීමේ නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබන යම් නිෂ්කාශනාගාරයක රීති අදහස් වේ;

"පැහැරහරින්නා" යන්නෙන්, යම් පැහැර හැරීමේ නඩු කටයුත්තකට යටත් වන්නා වූ නිෂ්කාශන සාමාජිකයකු අදහස් වේ;

"වෙළෙඳපොළ ගාස්තුව" යන්නෙන්-

(අ) යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් දරනු ලබන හෝ යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක තැන්පත් කළ, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවල නිශ්චිතව දක්වා ඇති යම් දේපළක් සම්බන්ධයෙන්; සහ

(ආ) වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීම සහතික කිරීම සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරය සම්බන්ධයෙන් ඍජුව ම පැන නගින වගකීම් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා,

බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද ස්ථාවර හෝ චල ගාස්තුවක් අදහස් වේ;

"වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපය" යන්නෙන්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක වෙළෙඳපොළ ගිවිසුම් ඉටු කිරීම සහතික කිරීම සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් සම්බන්ධයෙන් ඍජුවම පැන නගින වගකීම් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් එම බලපත්‍රය දරනු ලබන හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක තැන්පත් කරන ලද බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවල නිශ්චිතව දක්වා ඇති පරිදි වෙනත් යම් ආකාරයක සමපාර්ශ්වීය ඇපයක් ලෙස ලබා දෙන ලද යම් දේපළක් හෝ ඇපයක් අදහස් වේ;

"වෙළෙඳපොළ ගිවිසුම" යන්නෙන්,-

(අ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීතිවලට යටත් වන්නා වූ ද, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක නිෂ්කාශන පහසුකම භාවිත කරමින් ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ සහ නිරවුල් කිරීමේ කාර්යය සඳහා නවීකරණයක් ප්‍රකාරව එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන සාමාජිකයකු සමඟ එළඹෙන ලද්දා වූ ද ගිවිසුමක් අදහස් වේ; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් නවීකරණයක් සිදු වුව ද නොවූව ද බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක නිෂ්කාශන පහසුකම භාවිත කරමින් නිෂ්කාශනය කරනු ලබන හෝ නිෂ්කාශනය කරනු ලැබිය යුතු හෝ නිරවුල් කරනු ලබන හෝ නිරවුල් කරනු ලැබිය යුතු ගනුදෙනුවක් අදහස් වේ;

"අදාළ ධුර දරන්නා" යන්නෙන්

(අ) යම් සමාගමකට අදාළව, එහි ඇවරකරු, තාවකාලික ඇවරකරු, භාර ගැනුම්කරු හෝ කළමනාකරු හෝ ඒ හා සමාන තැනැත්තකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකු; හෝ

(ආ) වස්තුභංගත්වයකට අදාළ නඩු කටයුතු ප්‍රකාරව පත් කරන ලද යම් තැනැත්තකු,

අදහස් වේ.

33. විනිමය ස්ථානයක සිදුවන සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීම සහ නිරවුල් කිරීම සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් පිහිටුවනු ලැබිය හැකි ය.

34. (1) මේ පරිච්ඡේදය යටතේ නිෂ්කාශනාගාරයක් පිහිටුවීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් එම තැනැත්තා වෙත බලපත්‍රයක් ප්‍රදානය කර ඇත්නම් නම් මිස යම් තැනැත්තකු විසින් බලපත්‍රලත් විනිමය ස්ථානයක හෝ වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ හෝ නිරවුල් කිරීමේ කාර්යය සඳහා නිෂ්කාශන පහසුකමක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ නිදහස් කරන ලද සුරැකුම්පත් සඳහා නිෂ්කාශන පහසුකම් සපයනු ලබන යම් තැනැත්තකු හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනන්‍ය වශයෙන් සපයනු ලබන යම් නිෂ්කාශන පහසුකමක් හෝ මේ පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි සුරැකුම්පත් නිරවුල් කිරීම සහ නිෂ්කාශනය කිරීම සඳහා විධිවිධාන සලස්වන ඒකාබද්ධ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක් ලෙස කටයුතු කරන නිෂ්කාශන පහසුකමක් සහ ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

35. (1) කොමිෂන් සභාව විසින්, එම බලපත්‍රයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව, නිෂ්කාශනාගාරයක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලුම්කරුවකුට බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් නිසි පරිදි නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත් වන්නේ නම්, කොමිෂන් සභාව විසින් පනවන ලද නියම සහ කොන්දේසි සංශෝධනය කිරීම, අහෝසි කිරීම හෝ බලපත්‍රයට අලුත් නියම සහ කොන්දේසි පැනවීම සිදු කරනු ලැබිය හැකි ය.

36. (1) බලපත්‍රලත් විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ සුරැකුම්පත් නිෂ්කාශනය කිරීම සහ නිරවුල් කිරීම සහතික කිරීම සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක් ලෙස හෝ අන්‍යාකාරයකින් ක්‍රියාකරන නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ද සමඟ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට සහ ආකෘතියකට අනුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් සංස්ථාවක් විසින් පමණක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේ දී, මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝගවල හෝ රීතිවල අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ එම ඉල්ලුම්කරු විසින් තහවුරු කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත් කිරීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු යම් ඉල්ලුම්කරුවකු විසින් සපයනු ලැබිය යුතු ය.

(4) (මෙහි මින් මතු "නිෂ්කාශන රීති" යනුවෙන් සඳහන් කරනු ලබන) එම නිෂ්කාශනාගාරයේ රීති මගින්-

(අ) එහි නිෂ්කාශන පහසුකම් මගින් නිෂ්කාශනය කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව කාර්යක්ෂම ලෙස නිෂ්කාශන පහසුකම් සැපයීම;

(ආ) නිෂ්කාශන සාමාජිකයන් විසින් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීති මගින් බැඳීමට එකඟ වනු ලබන්නේ යම් ගිවිසුම් යටතේ ද නිෂ්කාශන සාමාජිකයන් සමඟ එම ගිවිසුම්වලට එළඹීමේ අවශ්‍යතාව;

(ඇ) එසේ ඇතුළත් කර ගැනීම සඳහා වන විනිවිදභාවයෙන් යුත් සහ වෙනස් ලෙස නොසලකන සුලු උපමාන ඇතුළුව නිෂ්කාශනාගාරයකට නිෂ්කාශන සාමාජිකයන් ඇතුළත් කර ගැනීම;

(ඈ) එහි නිෂ්කාශන පහසුකම් භාවිත කරන නිෂ්කාශන සාමාජිකයන් සඵලදායී ලෙස නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඉ) නිෂ්කාශන සාමාජිකයන්ගෙන් ඇප හෝ සමපාර්ශ්වීය ඇප භාර ගැනීමට අදාළ කොන්දේසි සහ එම ඇප හෝ සමපාර්ශ්වීය ඇප කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම;

(ඊ) නිරවුල් කිරීමේ ඇප අරමුදලක් පිහිටුවීම සහ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම;

(උ) නිෂ්කාශන සාමාජිකයන්ගේ බැඳීම් සහ ප්‍රාග්ධනය, අභ්‍යන්තර විගණනය සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වන අවම අවශ්‍යතා;

(ඌ) (i) නිෂ්කාශනාගාරය සහ එහි නිෂ්කාශන සාමාජිකයන් අතර වන; සහ

(ii) නිෂ්කාශන සාමාජිකයන් අතර වන,

ආරාවුල් සාධාරණ ලෙස සහ කාර්යක්ෂම ලෙස නිරවුල් කිරීම;

(එ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් නිෂ්කාශන සාමාජිකයන් හට දඩ පැනවීම සඳහා වන බලතල හෝ අධිකාරි බලය ඇතුළුව නිෂ්කාශන සාමාජිකයන් ඉවත් කිරීම, ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම, සහ ඔවුන් විනය පාලනයට යටත් කිරීම;

(ඒ) එහි පහසුකම් භාවිත කර නිෂ්කාශනය කළ හැකි හෝ නිරවුල් කළ හැකි සුරැකුම්පත් පන්තිය හෝ සුරැකුම්පත් පන්ති නිශ්චිතව දැක්වීම;

(ඔ) (i) නිෂ්කාශන රීති යටතේ වන සිය බැඳීම් ඉටු කිරීමට නිෂ්කාශන සාමාජිකයකු අපොහොසත්ව ඇත්තේ නම්, පැහැර හැරීමේ නඩු කටයුතු ආරම්භ කිරීම සහ සිය බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට හෝ නොහැකි වීමට ඉඩ ඇති බවට පෙනී යන නිෂ්කාශන සාමාජිකයකු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන අවදානම් කළමනාකරණ කාර්යපටිපාටි;

(ii) පැහැර හරින නිෂ්කාශන සාමාජිකයකු පැහැර හැරීමක් සිදු කළ හෝ වස්තුභංගත්වයට පත්වූ අවස්ථාවක, එම සාමාජිකයා විසින් ලබා දෙන ලද ඇප හෝ සමපාර්ශ්වීය ඇප තැන්පත් කිරීම සහ ඒවා කාර්යක්ෂම ලෙස නිර්මාණය කිරීම සහ උපලබ්ධි කිරීම ඇතුළුව සමපාර්ශ්වීය ඇපය පාලනය කිරීම;

(iii) ඉහත (i) වන සහ (ii) වන අනුඡේදවලට අදාළ අවස්ථානුගත කරුණු යටතේ හෝ නිෂ්කාශනාගාරයක නුබුන්වත්භාවයට තර්ජනයක් ඇති කරනු ලබන වෙනත් යම් අවස්ථානුගත කරුණක් යටතේ නිෂ්කාශනාගාරයේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම,

සඳහා පහසුකම් සැලසීම සඳහා පැහැර හැරීමේ රීති ඇතුළත් කිරීම;

(ඕ) නිරවුල් කිරීමේ නියෝග නිරවුල් කිරීමේ පද්ධතියට ඇතුළත් කරන අවස්ථාව සහ එම නියෝග අවසානාත්මක සහ අනහෝසිකර වන අවස්ථාව;

(ක) ප්‍රතිපාර්ශ්වය ආදේශ කිරීම සිදුවන අවස්ථාව;

(ග) ලාභ ලබා ගැනීමේ වැඩපිළිවෙළවල්, නිරවුල් කිරීම් අවසානතාව සහ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයක් ලෙස කටයුතු කරන බලපත්‍රලත් නිෂ්කාශනාගාරයකට අදාළ වෙනත් යම් බැඳීම් හෝ අන්‍යාකාරව

සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

37. (1) 35 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කර ඇති නිෂ්කාශනාගාරයක් විසින්-

(අ) සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ හෝ නිරවුල් කිරීමේ කාර්ය සඳහා, ආරක්ෂිත, කාර්යක්ෂම සහ ඵලදායී නිෂ්කාශන පහසුකමක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය;

(ආ) එහි ව්‍යාපාර සහ මෙහෙයුම් හා සම්බන්ධ යම් අවදානම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කරනු ලැබිය යුතු ය;

(ඇ) එහි සේවාවන් භාවිත කර නිෂ්කාශනය කළ යුතු හෝ නිරවුල් කළ යුතු සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් භාර ගන්නා ලද මූල්‍යමය අවදානම්වලට අනුව ප්‍රමාණවත් මට්ටමක ප්‍රාග්ධනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඈ) එහි රීතිවල තහවුරු කරන ලද සීමා ඇතුළත සහ ආන්තික, ගාස්තු සහ සමපාර්ශ්වීය ඇප යන ආකාරයෙන් සහ එහි නිෂ්කාශන සාමාජිකයන්ගෙන් ලබා ගත යුතු ඇප සැලැස්ම ඇතුළත මූල්‍යමය වගකීම භාර ගනු ලැබිය යුතු ය;

(ඉ) දත්ත සැකසීමේ යටිතල පහසුකමක් සහ අවදානම් කළමනාකරණය සඳහා වන අභ්‍යන්තර විගණන ක්‍රම ඇතුළු වෙනත් අභ්‍යන්තර පාලනයන් පිහිටුවීම සහ පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ඊ) ගිණුම්හිමියන්ගේ ඇප සහ වත්කම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ වත්කම්වලින් වෙන්ව තබා ගනු ලැබිය යුතු ය;

(උ) එහි නිෂ්කාශන සාමාජිකයන්ගෙන් ලබා ගත් ඇප හෝ වත්කම් තැන්පත් කරන ලද්දේ යම් කාර්ය සඳහා ද එම කාර්ය හැර වෙනත් කාර්ය සඳහා එම ඇප හෝ වත්කම් භාවිත කරනු නොලැබිය යුතු ය; සහ

(ඌ) ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සංස්ථානික අවදානම අවම කිරීම පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වමින් සෑමවිට දී ම මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක අධ්‍යක්ෂවරයකුගේ කාර්යය විය යුතු අතර, මේ පනත යටතේ වන කාර්යය සහ වෙනත් යම් නීතියක් යටතේ වන අධ්‍යක්ෂවරයකුගේ කාර්ය අතර ඝට්ටනයක් ඇති වූ අවස්ථාවක, මේ පනත යටතේ වන කාර්යය බලපැවැත්විය යුතු ය.

(3) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් සෑමවිටදී ම-

(අ) නිසි පරිදි විස්තර කරන ලද, විනිවිදභාවයෙන් යුක්ත වූ සහ ස්ථිර වගකීම් රේඛා සහිත පැහැදිලි සංවිධානාත්මක ව්‍යුහයක් ඇතුළත් ශක්තිමත් පාලන වැඩපිළිවෙළ, එයට මූණපාන්නට සිදුවන හෝ සිදුවිය හැකි අවදානම් හඳුනාගැනීමට, කළමනාකරණය කිරීමට, අධීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග සහ මනා පරිපාලන සහ ගිණුම් කාර්යපටිපාටිය ඇතුළු ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ යෙදීම;

(ආ) මේ පනතට සහ ඒ යටතේ සාදන ලද නියෝග, රීතී හෝ විධානවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත්ව ඵලදායී වන ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි යොදා ගැනීම;

(ඇ) එහි සේවාවන් සහ කටයුතු සිදු කිරීමෙහි අඛණ්ඩතාව සහ විධිමත් ක්‍රියාකාරිත්වය සහතික කරනු ලබන සංවිධානාත්මක ව්‍යුහයක් පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා සුදුසු සහ සමානුපාතික ක්‍රම, සම්පත් සහ කාර්යපටිපාටි යොදා ගැනීම;

(ඈ) අවදානම් කළමනාකරණය සඳහා වන වාර්තාකරණ පරිපාටිය සහ නිෂ්කාශනාගාරයේ අනෙකුත් මෙහෙයුම් සඳහා වන වාර්තාකරණ පරිපාටි අතර පැහැදිලි වෙන් කිරීමක් පවත්වාගෙන යාම;

(ඉ) පවත්වාගෙන යනු ලබන තොරතුරුවල විශ්වසනීයත්වය සහ රහස්‍යභාවය සහතික කිරීම සඳහා ඉහළ ප්‍රමිතීන්වල ආරක්ෂාවක් සහතික කිරීම සඳහා සිදු කරනු ලබන සේවාවන්වල සහ ක්‍රියාකාරකම්වල සංකීර්ණත්වය, විවිධත්වය සහ වර්ගය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් වන තොරතුරු තාක්ෂණ පද්ධති පවත්වාගෙන යාම; සහ

(ඊ) එහි පාලන වැඩපිළිවෙළ බලපත්‍රලත් නිෂ්කාශනාගාරය පාලනය වන රීතී සහ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීමේ උපමාන මහජනයාට නොමිලේ ලබා ගැනීමට සැලැස්වීම,

සිදු කරනු ලැබිය යුතු ය.

38. මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පිරිනමන ලද බලතල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, එකී බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද රීති සහ එකී බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ නියම සහ කොන්දේසිවලට අනුකූලව එහි කර්තව්‍ය භාරගෙන යන බවට කොමිෂන් සභාව සෑහීමට පත්වීම පිණිස යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් නියාමනය කිරීමට සහ අධීක්ෂණය කිරීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

39. (1) කොමිෂන් සභාව විසින්, ලිඛිත දැන්වීමක් මගින්-

(අ) එකී දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි 35 වන වගන්තිය යටතේ නිෂ්කාශනාගාරයකට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම; හෝ

(ආ) එකී දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි යම් පහසුකම් සැපයීම හෝ මෙහෙයවීම නතර කරන ලෙස හෝ යම් සේවාවන් සැපයීම නතර කරන ලෙස හෝ එකී බලපත්‍රලත් නිෂ්කාශනාගාරයකට විධාන කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) පහත දැක්වෙන අවස්ථානුගත කරුණු කිසිවක් උද්ගත වන අවස්ථාවක, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන සුබසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය සහ නිරවුල් කිරීම නිසි පරිදි නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම් මිස, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම සිදු කරනු නොලැබිය යුතු ය:-

(අ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන පහසුකම් සැපයීම නතර කරනු ලැබීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත බලපත්‍රලත් නිෂ්කාශනාගාරය ගණන් බේරා වසා දමනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හරිනු ලැබීම;

(ඇ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් එහි බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් කඩකර තිබීම හෝ මේ පනත යටතේ වන යම් වරදකට චෝදනා ලැබීම;

(ඈ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින්, මේ පනත යටතේ නිකුත් කරන ලද එහි බලපත්‍රයේ අවශ්‍යතාවයේ හෝ විධානයේ යම් නියමයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්ව තිබීම හෝ මේ පනත යටතේ වන යම් විධිවිධානයකට හෝ අවශ්‍යතාවයකට අනුකූලව කටයුතු කිරීමට අන්‍යාකාරයකින් අපොහොසත් වීම;

(ඉ) 36 වන වගන්තියේ කාර්ය සඳහා සපයන ලද යම් තොරතුරක වැදගත් කරුණක් අසත්‍ය ලෙස හෝ නොමඟ යවන සුලු ලෙස ලබා දී තිබීම හෝ එමගින් වැදගත් තොරතුරක් ලබාදීම පැහැර හැර තිබීම;

(ඊ) නිෂ්කාශනාගාරයට එරෙහිව වන යම් විනිශ්චිත ණයක මුළු මුදල හෝ ඉන් කොටසක් ගෙවා තෘප්ත කර නොමැති වීම;

(උ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ යම් දේපළකට අදාළව හෝ ඒ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව තුළ හෝ පිටත, භාර ගැනුම්කරුවකු, භාරගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඈවරකරුවකු හෝ ඒ හා සමාන යම් තැනැත්තකු පත් කර තිබීම;

(ඌ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත එහි ණයහිමියන් සමඟ සමථයකට හෝ සමථ යෝජනා ක්‍රමයකට එළඹී තිබීම; හෝ

(එ) බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින්, එහි මෙහෙයවීම යටතේ, එය වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබීම.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා නිෂ්කාශනාගාරය විසින්, එසේ කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබානොගෙන සති දෙකක් ඉක්ම වූ කාලසීමාවකට එහි නිෂ්කාශන පහසුකම් සැපයීම නතර කර ඇති අවස්ථාවක, එම නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන පහසුකම් සැපයීම නතර කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් සිදු වුව ද, එය නොතකා-

(අ) නිෂ්කාශනාගාරයේ මෙහෙයුම් නවතා දැමීමේ හෝ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති සේවාවන් සැපයීම නතර කිරීමේ; හෝ

(ආ) ආයෝජකයන් හෝ මහජන සුබසිද්ධිය ආරක්ෂා කිරීමේ,

කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින් දැන්වීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එම අවලංගු කිරීමෙන් හෝ විධානයෙන් බලපෑමට ලක් වූ යම් ක්‍රියාකාරකම්, එම අවලංගු කිරීම හෝ විධානය බලාත්මක වන දින සිට හෝ එම දිනට පසුව දිගටම කරගෙන යාමට කොමිෂන් සභාව විසින් එම නිෂ්කාශනාගාරයට අවසර දෙනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ කටයුතු කරනු ලබන අවස්ථාවක, එය විසින් එසේ කිරීම අවශ්‍ය යැයි සලකනු ලබන විට දී, කොමිෂන් සභාව විසින්, අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරනු ලබන තෙක්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා මාස හයක කාලසීමාවකට අතුරු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකි අතර, එකී කාලසීමාව වසරක කාලයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(6) කරුණු ඉදිරිපත් කිරීම සඳහා නිෂ්කාශනාගාරයට අවස්ථාවක් ලබානොදී, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

40. (1) 39 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයෙන් අතෘප්තියට පත් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින්, එම තීරණය පිළිබඳව නිෂ්කාශනාගාරයට දැනුම්දුන් දිනෙන් පසු දින දාහතරක් ඇතුළත, අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ගොනු කර ඇති වුව ද, එය නොතකා, අමාත්‍යවරයාගේ තීරණය ලබා දෙන තෙක් මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් දිගටම බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කරනු ලැබූ විට දී, අමාත්‍යවරයා විසින්-

(අ) එම අභියාචනයට අවසර දී බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය අහෝසි කරන ලෙස කොමිෂන් සභාවට විධාන කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම අභියාචනයට අවසර නොදෙනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාව විසින් (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගන්නා ලද තීරණය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියට යටත්ව, කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ සිදු කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

41. 39 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක්-

(අ) එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරය මාර්ගයෙන් යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වැඩපිළිවෙළකට එළඹෙන ලද්දේ 39 වන වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානය නිකුත් කිරීමට පෙරාතුව වුව ද, 39 වන වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වනවිට දී බලපත්‍රය අවලංගු කළ හෝ විධානය නිකුත් කළ පසුව වුව ද, එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ වළක්වන පරිදි හෝ ඊට බලපෑම් කරන පරිදි; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ යටතේ පැන නඟින යම් අයිතිවාසිකමකට, බැඳීමකට හෝ වගකීමකට බලපෑම් කරන පරිදි,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

42. (1) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින්, අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා, නිෂ්කාශන සාමාජිකයකුට තමා පාර්ශ්වයක් වන්නා වූ යම් නිරවුල් නොකළ වෙළෙඳපොළ ගිවිසුම් සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් වන බැඳීම් ඉටුකිරීමට නොහැකි වන්නේ නම් හෝ නොහැකි වීමට ඉඩ ඇත්නම්, පැහැර හැරීමේ රීති යටතේ පැහැර හැරීමේ නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය:-

(2) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් යම් පැහැර හැරීමේ නඩු කටයුත්තක් ආරම්භ කරනු ලබන අවස්ථාවක එම පැහැර හරින්නා පාර්ශ්වයක් වන්නා වූ වෙළෙඳපොළ ගිවිසුම් නිරවුල් කිරීමේ කාර්ය සඳහා එහි නිෂ්කාශන රීති යටතේ ගන්නා ලද සියලු තදනන්තර නඩු කටයුතු හෝ වෙනත් ක්‍රියාමාර්ග එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ පැහැර හැරීමේ රීති යටතේ සිදුකර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

43. (1) බුන්වත්භාවයට, වස්තුභංගත්වයට හෝ ගණන් බේරා වසා දැමීමට යටත් තැනැත්තකුගේ වත්කම්වලට හෝ භාරුනුම්කරුවකු, භාරගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඈවරකරුවකු හෝ ඒ හා සමාන තත්ත්වයක තැනැත්තකුට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධාන සමඟ අනනුකූලතාවයක් තිබීම පමණින් පහත දැක්වෙන කිසිවක් නීතියෙහිලා කිසිම ප්‍රමාණයකට අවලංගු නොවිය යුතු ය:

(අ) වෙළෙඳපොළ ගිවිසුමක්;

(ආ) වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමට අදාළ නිෂ්කාශනාගාරයක රීති;

(ඇ) වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමට අදාළ නිෂ්කාශනාගාරයක රීති යටතේ ගන්නා ලද යම් නඩු කටයුත්තක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක්;

(ඈ) වෙළෙඳපොළ ගාස්තුවක්;

(ඉ) වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක්;

(ඊ) නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීති; හෝ

(උ) යම් පැහැර හැරීමේ නඩු කටයුත්තක්.

(2) (1) වන උපවගන්තියට යටත්ව, එම තනතුරේ කටයුතු කිරීමේ දී අදාළ ධුර දරන්නකු සතු බලතල සහ බුන්වත්භාවයට අදාළ නීතිය හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යම් අධිකරණයක් සතු බලතල

(අ) නිෂ්කාශනාගාරයක රීතිවලට අනුකූලව වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීම; හෝ

(ආ) යම් පැහැර හැරීමේ නඩු කටයුත්තක්,

වළක්වන හෝ එයට බාධා කරන ආකාරයකින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

44. 2007 අංක 7 දරන සමාගම් පනතේ ඇති කිසිවක් මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් එකී බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් යම් වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක් උපලබ්ධි කිරීම සහ බැහැර කිරීම සඳහා පවරන ලද පැහැර හැරීමේ නඩු කටයුතු වැළැක්වීම හෝ ඒවාට බාධා කිරීම කරනු නොලැබිය යුතු ය.

45. (1) යම් පැහැර හැරීමේ නඩු කටයුත්තක් අවසන් වූ පසු, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා හෝ ආස්ථිත්‍යය වෙත එක් එක් පැහැරහරින්නා සම්බන්ධයෙන් වන වාර්තාවක් සපයනු ලැබිය යුතු ය:-

(අ) පැහැරහරින්නා විසින් හෝ පැහැර හරින්නාට ගෙවිය යුතු බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් සහතික කරන ලද යම් ශුද්ධ මුදලක් ඇත්නම්, එම ශුද්ධ මුදල;

(ආ) කිසිදු මුදලක් එසේ පැහැරහරින්නාට නොගෙවිය යුතු බව; සහ

(ඇ) එය විසින් සුදුසු යැයි සිතනු ලබන පරිදි එම පැහැර හැරීමේ නඩු කටයුත්ත සම්බන්ධයෙන් වන වෙනත් යම් විස්තර.

(2) (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද වාර්තාවේ සහතික කළ පිටපතක් වහාම-

(අ) කොමිෂන් සභාවට;

(ආ) වාර්තාව අදාළ වන පැහැර හරින්නාට හෝ වාර්තාව අදාළ වන පැහැරහරින්නා වෙනුවෙන් කටයුතු කරනු ලබන අදාළ ධුර දරන්නාට හෝ එම පැහැරහරින්නාගේ බූදලය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නාට; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් යම් තැනැත්තකුට,

සපයනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාරව බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් වාර්තාවක් පිළියෙල කර ඇති අවස්ථාවක, එම පැහැරහරින්නාගේ අදාළ ධුර දරන්නා විසින්, එම වාර්තාව අදාළ වන පැහැරහරින්නාගේ ණය හිමියන්ගේ අවධානය එය වෙත යොමුවීම පිණිස ඒ බවට දැන්වීමක් පළකරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය ප්‍රකාරව අදාළ ධුර දරන්නා වෙත හෝ පැහැරහරින්නා වෙත වාර්තාවක් ලද අවස්ථාවක, ඔහු විසින්, ඔහුගේ යම් ණය හිමියකුගේ ඉල්ලීම මත-

(අ) එම ඉල්ලීම ලැබීමෙන් දින දෙකක් ඇතුළත ණය හිමියාගේ පිරික්සුම සඳහා එම වාර්තාව ලබා ගැනීමට සැලැස්විය යුතු ය; හෝ

(ආ) අදාළ ධුර දරන්නා හෝ පැහැරහරින්නා විසින් තීරණය කරනු ලබන පරිදි අදාළ ගාස්තුවක් ගෙවීමෙන් පසු, ඉල්ලීම් කරන ලද පරිදි ණය හිමියාට එම වාර්තාවේ සහතික කළ පිටපතක් හෝ ඉන් කොටසක් සපයනු ලැබිය යුතු ය.

46. (1) පැහැර හැරීමේ නඩු කටයුතු අවසන් වූ පසු, 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් සහතික කරන ලද ශුද්ධ මුදල පැහැරහරින්නා විසින් හෝ පැහැරහරින්නා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, භාර ගැනුම්කරුවකු සඳහා හෝ ගණන් බේරා වසාදැමීමක් සඳහා නියෝගයක් සිදු කර ඇති අවස්ථාවක හෝ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමක් සඳහා යෝජනාවක් සම්මත කර ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියේ සඳහන් ශුද්ධ මුදල 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ වන ගණන් බේරා වසා දැමීමේ නඩු කටයුතුවලට අදාළව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

47. (1) නිෂ්කාශන සාමාජිකයකු විසින් ("පළමුවන නිෂ්කාශන සාමාජිකයා") (3) වන උපවගන්තියේ විස්තර කරන ලද අවස්ථානුගත කරුණු යටතේ වෙනත් නිෂ්කාශන සාමාජිකයකුට ("දෙවන නිෂ්කාශන සාමාජිකයා") අධි අගයකට සුරැකුම්පත් විකුණන්නේ නම්, හෝ එම සාමාජිකයාගෙන් අඩු අගයකට සුරැකුම්පත් මිල දී ගන්නේ නම් සහ ඉන්පසු අදාළ ධුර දරන්නකු විසින්-

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයා;

(ආ) විකිණීමේ දී හෝ මිල දී ගැනීමේ දී දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා; හෝ

(ඇ) දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ හෝ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තාගේ බූදලය,

වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, අධිකරණයක් විසින් අන්‍යාකාරයකින් නියෝග කරනු ලැබුවහොත් මිස, අදාළ ධුර දරන්නා විසින්, පළමුවන නිෂ්කාශන සාමාජිකයාගෙන් හෝ පළමුවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාගෙන්, පළමුවන නිෂ්කාශන සාමාජිකයා හෝ පළමුවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් සිදු කරන ලද විකිණීම හෝ මිල දී ගැනීම මගින් ලබා ගන්නා ලද හඳුනාගන්නා ලද ලාභයට සමාන මුදල් ප්‍රමාණයක් අය කර ගනු ලැබිය හැකි ය.

(2) විකිණීම හෝ මිල දී ගැනීම නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුව ඉටු කරනු ලැබ එය වෙළෙඳපොළ ගිවිසුමක් මගින් ප්‍රතියෝජනය කරනු ලැබ තිබුණ ද හඳුනාගත් ලාභයට සමාන මුදල් ප්‍රමාණය අයකර ගනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් විකිණීමක් හෝ මිල දී ගැනීමක් සඳහා වන අවස්ථානුගත කරුණු විය යුත්තේ-

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට අදාළව හඳුනාගන්නා ලද සිදුවීමක් සිදුවී ඇති අවස්ථාවක්; සහ

(ආ) (i) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට අදාළව හඳුනාගන්නා ලද සිදුවීමක් ඇතිවීමට ඉඩ තිබූ බව පළමුවන නිෂ්කාශන සාමාජිකයා දැන සිටි හෝ සාධාරණව දැන සිටීමට හැකිව තිබූ අවස්ථාවක්; හෝ

(ii) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට හඳුනාගන්නා ලද සිදුවීමක් සිදුවීමට ඉඩ තිබූ බව පළමුවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් දැන සිටියා වූ හෝ සාධාරණව දැන සිටීමට හැකිව තිබුණා වූ ද, විකිණීම හෝ මිල දී ගැනීමට එළඹෙන ලද දිනයට ඉක්බිතිව ම එළඹෙන මාස හයක කාලසීමාව ඇතුළත හඳුනාගන්නා ලද සිදුවීම සිදු වී ඇත්තා වූ අවස්ථාවක් යන අවස්ථා දෙකෙන් එක් අවස්ථාවක්,

වන්නේ ය.

(4) මේ වගන්තියේ-

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයකුට හෝ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විකිණීමක් හෝ මිල දී ගැනීමක් සම්බන්ධයෙන් වන හෝ සම්බන්ධයෙන් වූ තැනැත්තකුට අදාළව, "හඳුනාගන්නා ලද සිදුවීමක්" යන්නෙන්-

(i) අවස්ථාවෝචිත පරිදි, දෙවන නිෂ්කාශන සාමාජිකයා හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් සිදු කරන ලද වස්තුභංගත්ව ක්‍රියාවක්;

(ii) 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි, දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට අදාළව කැඳවන ලද ණය හිමියන්ගේ රැස්වීමක්; හෝ

(iii) දෙවන නිෂ්කාශන සාමාජිකයා හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා ගණන් බේරා වසා දැමීම සඳහා අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීම,

අදහස් වේ;

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විකිණීමකට හෝ මිල දී ගැනීමකට අදාළව "හඳුනාගන්නා ලද ලාභය" යන්නෙන්-

(i) විකිණීමේ හෝ මිල දී ගැනීමේ විෂයය වන්නා වූ සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගයේ; සහ

(ii) විකිණීම හෝ මිල දී ගැනීමට එළඹුණු අවස්ථාවේ දී විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වන ප්‍රතිෂ්ටාවේ අගය,

අතර වෙනස අදහස් වේ.

48. වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, වෙළෙඳපොළ ගිවිසුමක් ඇතුළුව බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් සමඟ යම් ගනුදෙනුවකට එළඹෙන නිෂ්කාශන සාමාජිකයකු ඔහු එම ගිවිසුමට අනුයෝජිතයකු ලෙස පාර්ශ්වයක් වන්නේ ය යන්න නොතකා, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් හෝ එයට එරෙහිව වන සිවිල් නඩු කටයුත්තක්, හිමිකම්පෑමක් හෝ ඉල්ලීමක් ඇතුළු සියලු කාර්ය සඳහා, එම ගනුදෙනුව සඳහා අනුයෝජිතයකු ලෙස නොව ප්‍රධානයකු ලෙස පාර්ශ්වයක් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

49. වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව නිෂ්කාශන සාමාජිකයකු විසින් වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීම සඳහා හෝ වෙළෙඳපොළ ගාස්තුවක් යටතේ හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයකට වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක් ලබා දෙන ලද අවස්ථාවක දී, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයකට ලබා දෙන ලද එම වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයේ යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් සම්බන්ධයෙන් වන කිසිම සිවිල් නඩු කටයුත්තක්, හිමිකම්පෑමක් හෝ ඉල්ලීමක් එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයට එරෙහිව ගෙන ඒමට අවසර දෙනු නොලැබිය යුතු ය.

50. බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීතිවල නිශ්චිතව දක්වන ලද කාර්යපටිපාටියට අනුකූලව වෙළෙඳපොළ ගිවිසුමකට හෝ වෙළෙඳපොළ ගාස්තුවකට යටත් සමපාර්ශ්වීය ඇපය ක්‍රියාවෙහි යෙදවීමට බලපත්‍රලත් නිෂ්කාශනාගාරය හිමිකම් ලැබිය යුතු ය.

51. (1) අදාළ උපදෙස එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමේ හෝ වෙළෙඳපොළ ගිවිසුමක් සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් කටයුතු කිරීමේ කාර්ය සඳහා වන්නේ නම්, මධ්‍යම තැන්පතුගාරයක් විසින්, ගිණුම්හිමියකුගේ සුරැකුම්පත් ගිණුමක් තුළට හෝ ඉන් පිටතට සුරැකුම්පත් මාරුකිරීම සඳහා යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් ලබා දෙන ලද උපදෙසක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින්, (1) වන උපවගන්තිය යටතේ වෙළෙඳපොළ ගිවිසුමකට පාර්ශ්වයක් වන ගිණුම්හිමියකුට අදාළ වන හෝ නිෂ්කාශන සාමාජිකයෙක් පාර්ශ්වයක් බවට පත් වී ඇති වෙළෙඳපොළ ගිවිසුමක් ඇති කරනු ලබන වෙළෙඳාමක් සිදු කිරීමට නිෂ්කාශන සාමාජිකයකුට උපදෙස් ලබා දී ඇති ගිණුම්හිමියකුට අදාළ වන සුරැකුම්පත් ගිණුමකට අදාළව පමණක් (1) වන උපවගන්තිය යටතේ වන උපදෙසක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) මධ්‍යම තැන්පතුගාරය විසින්, (1) වන උපවගන්තිය ප්‍රකාරව ගිණුම් හිමියකුගේ සුරැකුම්පත් ගිණුමක් තුළට හෝ එම ගිණුමෙන් පිටතට වෙළෙඳපොළ ගිවිසුමක් ප්‍රකාරව යම් සුරැකුම්පත් මාරු කිරීමක් සිදු කරන ලද අවස්ථාවක, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීති යටතේ විධිවිධාන සලසා ඇති පරිදි මිස, එම සුරැකුම්පත්හි කිසිදු හිමිකමක් ගිණුම්හිමියකුට මාරු නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය ප්‍රකාරව ගිණුම්හිමියකුගේ සුරැකුම්පත් ගිණුමක් තුළට හෝ එම ගිණුමෙන් පිටතට සුරැකුම්පත් මාරු කිරීමක් සිදුකර ඇති අවස්ථාවක, ඒ ගිණුම්හිමියා විසින් ගෙන එන ලද නඩුකරයකට හෝ හිමිකම් පෑමකට හෝ ඒ ගිණුම් හිමියාට හානි වන්දි ගෙවීමට මධ්‍යම තැන්පතුගාරය යටත් නොවිය යුතු ය.

52. (1) අවස්ථාවෝචිත පරිදි, එම විකිණීම හෝ මිල දී ගැනීම යම් වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමේ හෝ පැහැර හැරීමේ නඩු කටයුතු සඳහා පහසුකම් සැලසීමේ හෝ යම් වෙළෙඳපොළ ගාස්තුවක අඩංගු වන යම් වත්කමක් හෝ වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක් ලෙස සපයා ඇති යම් වත්කමක් උපලබ්ධි කිරීමට එම නිෂ්කාශනාගාරයට ඉඩ ලබාදීමේ කාර්ය සඳහා සිදු කරනු ලබන්නේ නම්, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරය වෙනුවෙන් සුරැකුම්පත් විකිණීමක් හෝ මිලට ගැනීමක් සිදු කරන ලෙස යම් බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් යම් විනිමය ස්ථානයකට නියම කරනු ලැබිය හැකි අතර එම විනිමය ස්ථානය විසින් එම උපදෙස ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව විනිමය ස්ථානයක් විසින්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් වෙනුවෙන් සුරැකුම්පත් විකිණීමක් හෝ මිලට ගැනීමක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, යම් තැනැත්තකු විසින් ගෙන එන ලද යම් නඩුකරයකට හෝ හිමිකම් පෑමකට හෝ විනිමය ස්ථානය යටත් නොවිය යුතු ය. තව ද, යම් තැනැත්තකුට හානි වන්දි ගෙවීමට ද යටත් නොවිය යුතු ය.

(3) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් සිදු කරන ලද යම් සුරැකුම්පත් නිෂ්කාශන කිරීමේ හෝ නිරවුල් කිරීමේ ගනුදෙනුවක් හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් වෙත සිදු කරන ලද යම් ගෙවීමක්, එම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයේ නිෂ්කාශනය කිරීමේ සහ නිරවුල් කිරීමේ රීතිවලට අනුකූලව මිස ප්‍රතිනමනය කරනු, නිෂ්ප්‍රභ කිරීම කරනු හෝ අවලංගු කිරීම කරනු නොලැබිය යුතු ය.

53. (1) යම් තැනැත්තකු විසින් පැහැර හැරීමේ නඩු කටයුත්තක දී සිදු කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් වන අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක දී, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීති යටතේ වන බලතල පැවරීම ප්‍රකාරව තම කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් හෝ ඒ බැඳීම ඉටු කිරීම හෝ කරන ලදැයි කියනු ලබන එම බැඳීම් ඉටු කිරීම අතරතුර හෝ ඒ හා සම්බන්ධයෙන් සියලු සාධාරණ සැලකිල්ල දක්වනු ලැබූ බව ද සද්භාවයෙන් ක්‍රියා කරනු ලැබූ බව ද ඔප්පු කිරීම විත්ති වාචකයක් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා යන්නට-

(අ) එම තැනැත්තාගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු; සහ

(ආ) එම තැනැත්තා විසින් පිහිටුවන ලද යම් කමිටුවක යම් සාමාජිකයකු,

ඇතුළත් විය යුතු ය.

(3) බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු යම් පැහැරහරින්නකුගේ යම් දේපළකට අදාළව යම් අදාළ ධුර දරන්නකු විසින් යම් ක්‍රියාමාර්ගයක් ගනු ලබන්නා වූ ද, ඔහු එම ක්‍රියාමාර්ගය ගැනීමට හිමිකම් ලබන බවට අදාළ ධුර දරන්නා විසින්, සාධාරණව විශ්වාස කරනු ලබන්නා වූ හෝ එසේ විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු ඇත්තාවූ ද අවස්ථාවක, එකී අලාභය හෝ හානිය අදාළ ධුර දරන්නාගේ නොසැලකිල්ල හේතුවෙන් සිදු වූයේ නම් මිස, අදාළ ධුර දරන්නා විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් හේතුවෙන් ඇතිවන යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් අදාළ ධුර දරන්නා විසින් යම් තැනැත්තකුට වගකියනු නොලැබිය යුතු ය.

3 වන පරිච්ඡේදය

මධ්‍යම තැන්පතුගාරය

54. (1) යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම සුරැකුම්පත් යම් විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති වුව ද, නැති වුව ද, යම් සුරැකුම්පත් හැසිරවීම සඳහා මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු, වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීමට යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය-

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ පිහිටුවනු ලබන මධ්‍යම තැන්පතුගාරයක්;

(ආ) ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන මධ්‍යම තැන්පතුගාරයක්; හෝ

(ඇ) කොමිෂන් සභාව විසින් නිදහස් කර ඇති යම් සුරැකුම්පත් නිකුත් කිරීමක් සඳහා මධ්‍යම තැන්පතුගාරයක් සපයන යම් තැනැත්තකු,

සඳහා අදාළ නොවිය යුතු ය.

55. (1) මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ද සමඟ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට සහ ආකෘතියකට අනුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් සංස්ථාවක් විසින් පමණක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මධ්‍යම තැන්පතුගාරය විසින්-

(අ) සුරැකුම්පත් තැන්පත් කිරීම, දැරීම, ඉවත් කර ගැනීම, මාරුකිරීම සහ සුරැකුම්පත් ලේඛනයේ සටහන් කිරීම කරනු ලැබිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද, එම කොන්දේසි;

(ආ) තැන්පත් කරන ලද සුරැකුම්පත් ගනුදෙනු කිරීම් සැකසුම් කිරීම;

(ඇ) තැන්පත් කරන ලද සුරැකුම්පත් නිරවුල් කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ඈ) ගිණුම්හිමියන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සහ තැන්පත් කරන ලද සුරැකුම්පත් පිළිබඳ තොරතුරු සහ ඒවායේ ගනුදෙනු කිරීම්වල ආරක්ෂාව සහ පාලනය;

(ඉ) තැන්පතුගාර සහභාගිකයන් ඇතුළත් කර ගැනීම සඳහා වන විනිවිදභාවයෙන් යුක්ත සහ වෙනස් ලෙස නොසලකන සුලු උපමාන සහ තැන්පතුගාර සහභාගික වර්ග;

(ඊ) තැන්පතුගාර සහභාගිකයන් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ ඉල්ලුම්කාර සමාගමේ රීති බලාත්මක කිරීම;

(උ) මධ්‍යම තැන්පතුගාරයේ රීතිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් තැන්පතුගාර සහභාගිකයන් ඉවත් කිරීම, ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම, ඔවුන්ට දණ්ඩන නියම කිරීම හෝ ඔවුන් විනය පාලනයට යටත් කිරීම;

(ඌ) මධ්‍යම තැන්පතුගාරය සහ තැන්පතුගාර සහභාගිකයන් අතර සහ තැන්පතුගාර සහභාගිකයන් අතර වන ආරාවුල් නිරවුල් කිරීම; සහ

(එ) ආයෝජකයන්ට අයත් සුරැකුම්පත් තැන්පතුගාර සහභාගිකයන්ට අයත් සුරැකුම්පත්වලින් වෙන්ව තබා ගැනීම සහතික කිරීම,

සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන ඇති රීති සාදනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලුම්කරුවකු විසින්, ඉල්ලීමට අදාළව අවශ්‍ය වන්නේ යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(5) සෑමවිට දී ම යෝජිත මධ්‍යම තැන්පතුගාරය සතුව-

(අ) එහි ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රමාණවත් සහ නිසි පරිදි සූදානම් කර ඇති පරිශ්‍රයක්;

(ආ) එහි ව්‍යාපාර කටයුතු සඳහා දක්ෂ සේවක පිරිසක්; සහ

(ඇ) අවදානම් අවම කිරීම සඳහා සහ හදිසි අවස්ථාවලට මුහුණදීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවක්, ආරක්ෂක සැලසුම් සහ පහසුකම් සහිත ස්වයංක්‍රීය පද්ධතීන්,

සැපයීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍යමය, මානව සහ අනෙකුත් සම්පත් තිබිය යුතු ය.

(6) මහජන සුබසිද්ධිය උදෙසා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි පරිදි නියාමනය කිරීම සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, එය විසින් සුදුසු යැයි සිතනු ලබන නියම හෝ කොන්දේසිවලට යටත්ව මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා, කොමිෂන් සභාව විසින් ඉල්ලුම්කරුට බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(7) (6) වන උපවගන්තියේ සඳහන් බලපත්‍රයට අදාළ නියම සහ කොන්දේසිවල ව්‍යාප්තිය සීමා නොකොට, කොමිෂන් සභාව විසින්, ආයෝජකයන්ගේ සුබසිද්ධිය උදෙසා හෝ මධ්‍යම තැන්පතුගාරයක් නිසි පරිදි නියාමනය කිරීම සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම්, කොමිෂන් සභාව විසින්, පනවන ලද යම් නියම සහ කොන්දේසි සංශෝධනය කිරීම, අහෝසි කිරීම හෝ අලුත් නියම සහ කොන්දේසි පැනවීම සිදු කරනු ලැබිය හැකි ය.

56. (1) මධ්‍යම තැන්පතුගාරයක් විසින්-

(අ) සුරැකුම්පත් හැසිරවීම සඳහා සුරක්ෂිත, ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම;

(ආ) එහි ව්‍යාපාර සහ මෙහෙයුම් හා සම්බන්ධ යම් අවදානම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම; සහ

(ඇ) ගිණුම්හිමියන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම,

කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ගිණුම්හිමියන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුබසිද්ධිය උදෙසා සෑමවිට දී ම කටයුතු කිරීම මධ්‍යම තැන්පතුගාරයක අධ්‍යක්ෂවරයකුගේ කාර්යය විය යුතු අතර එම කාර්යය සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ වන අධ්‍යක්ෂවරයකුගේ කාර්ය අතර සම්මතයක් ඇති වන අවස්ථාවක, මේ පනත යටතේ වන කාර්යය බලපැවැත්විය යුතු ය.

57. (1) කොමිෂන් සභාව විසින්, ලිඛිත දැන්වීමක් මගින්-

(අ) එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි 55 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම; හෝ

(ආ) එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති යම් පහසුකම් සැපයීම හෝ මෙහෙයවීම නතර කරන ලෙස හෝ යම් සේවාවන් සැපයීම නතර කරන ලෙස මධ්‍යම තැන්පතුගාරයට විධාන කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) පහත දැක්වෙන අවස්ථානුගත කරුණු කිසිවක් උද්ගත වන අවස්ථාවක, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන සුබසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි පරිදි නියාමනය කිරීම සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වුවහොත් මිස, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම කරනු නොලැබිය යුතු ය:

(අ) මධ්‍යම තැන්පතුගාරය විසින් සුරැකුම්පත්වල මධ්‍යම හැසිරවීම සඳහා වන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම නතර කරනු ලැබීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත මධ්‍යම තැන්පතුගාරය ගණන් බේරා වසා දමනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හරිනු ලැබීම;

(ඇ) මධ්‍යම තැන්පතුගාරය විසින්, එහි බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් කඩකර තිබීම හෝ මේ පනත යටතේ වන යම් වරදකට චෝදනා ලැබීම;

(ඈ) මේ පනත යටතේ නිකුත් කරන ලද කොන්දේසියකට, නියමයකට හෝ විධානයකට අනුකූලව කටයුතු කිරීමට මධ්‍යම තැන්පතුගාරය අපොහොසත් වීම;

(ඉ) 55 වන වගන්තියේ කාර්ය සඳහා ලබාදෙන ලද යම් තොරතුරක වැදගත් කරුණක් අසත්‍ය ලෙස හෝ නොමඟ යවනසුලු ලෙස ලබා දී තිබීම හෝ එමගින් වැදගත් තොරතුරක් ලබාදීම පැහැර හැර තිබීම;

(ඊ) මධ්‍යම තැන්පතුගාරයට එරෙහිව වන යම් විනිශ්චිත ණයක මුළු මුදල හෝ ඉන් කොටසක් ගෙවා තෘප්ත කර නොතිබීම;

(උ) මධ්‍යම තැන්පතුගාරයේ යම් දේපළකට අදාළ හෝ යම් දේපළක් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී, භාර ගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඇවරකරුවකු හෝ ඒ හා සමාන තැනැත්තකු පත්කර තිබීම;

(උ1) මධ්‍යම තැන්පතුගාරය විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී, එහි ණය හිමියන් සමඟ සමථයකට හෝ සමථ යෝජනා ක්‍රමයකට එළඹී තිබීම; හෝ

(එ) මධ්‍යම තැන්පතුගාරය විසින් එහි සිය මෙහෙයවීම යටතේ, එයට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබීම සහ එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සිතීම.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා, මධ්‍යම තැන්පතුගාරය විසින් කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන, සති දෙකක් ඉක්ම වූ කාලසීමාවකට සුරැකුම්පත්වල මධ්‍යම හැසිරවීම සඳහා වන ක්‍රමය ක්‍රියාත්මක කිරීම නතර කර ඇති අවස්ථාවක, මධ්‍යම තැන්පතුගාරය විසින් සුරැකුම්පත්වල මධ්‍යම හැසිරවීම සඳහා වන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම නතර කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් සිදු වුව ද, එය නොතකා-

(අ) මධ්‍යම තැන්පතුගාරයේ මෙහෙයුම් නවතා දැමීමේ හෝ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති සේවාවන් සැපයීම නතර කිරීමේ කාර්යය සඳහා;

(ආ) තැන්පතුකරුවන් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා; හෝ

(ඇ) මහජන සුබසිද්ධිය සඳහා,

දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එම අවලංගු කිරීම හෝ විධානය මගින් බලපෑමට ලක් වී ඇති යම් ක්‍රියාකාරකම්, එම අවලංගු කිරීම හෝ විධානය බලාත්මක වන දින සිට හෝ එම දිනට පසු දිගටම කරගෙන යාමට කොමිෂන් සභාව විසින් මධ්‍යම තැන්පතුගාරයට අවසර දෙනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ කටයුතු කරනු ලබන අවස්ථාවක, එය විසින්, එසේ කිරීම අවශ්‍ය යැයි සලකනු ලබන විට දී, කොමිෂන් සභාව විසින් අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරනු ලබන තෙක් මධ්‍යම තැන්පතුගාරයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා මාස හයක කාලසීමාවකට අතුරු අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකි අතර, එකී කාලසීමාව වසරක කාලයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දිගටම කටයුතු කරගෙන යාමට මධ්‍යම තැන්පතුගාරයට අවසරය ප්‍රදානය කර ඇති අවස්ථාවක, එම අවසරය අනුව එහි කටයුතු කරගෙන යාම හේතුවෙන්, මධ්‍යම තැන්පතුගාරය විසින්, (1) වන උපවගන්තිය කඩකර ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) මධ්‍යම තැන්පතුගාරයට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නොදී, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණයකින් අතෘප්තියට පත් මධ්‍යම තැන්පතුගාරයක් විසින්, එම තීරණය පිළිබඳව එම මධ්‍යම තැන්පතුගාරයට දැනුම් දුන් දිනෙන් පසු දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ගොනු කර ඇති වුව ද, එය නොතකා, අමාත්‍යවරයාගේ තීරණය ලබාදෙන තෙක්, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් දිගටම බලාත්මක විය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් කරනු ලැබූ විට දී අමාත්‍යවරයා විසින්-

(අ) එම අභියාචනයට අවසර දී එම බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය අහෝසි කරන ලෙස කොමිෂන් සභාවට විධාන කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම අභියාචනයට අවසර නොදෙනු ලැබිය හැකි ය.

(11) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ තීරණය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(12) (11) වන උපවගන්තියට යටත්ව කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ සිදු කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

58. 57 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක්-

(අ) මධ්‍යම තැන්පතුගාරය විසින් යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වැඩපිළිවෙළකට එළඹෙන ලද්දේ 57 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානය නිකුත් කිරීමට පෙරාතුව වුව ද, 57 වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක, බලපත්‍රය අවලංගු කළ හෝ විධානය නිකුත් කළ පසුව වුව ද, එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ වළක්වන පරිදි හෝ ඊට බලපෑම් කරන පරිදි; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ යටතේ පැනනගින යම් අයිතිවාසිකමකට, බැඳීමකට හෝ වගකීමකට බලපෑම් කරන පරිදි,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

59. මධ්‍යම තැන්පතුගාරයක් විසින් විවිධ වර්ගයන්හි සුරැකුම්පත් ගිණුම් පිහිටුවනු ලැබිය හැකි අතර, මධ්‍යම තැන්පතුගාරයේ විවෘත කරන ලද එවැනි සෑම සුරැකුම්පත් ගිණුමක්ම තැන්පත් කරන ලද සුරැකුම්පත්හි අර්ථලාභී හිමිකරුගේ නමින් හෝ නාමිකයකුගේ නමින් තිබිය යුතු ය. සුරැකුම්පත් ගිණුමක් නාමිකයකුගේ නමින් විවෘත කරනු ලබන විට දී, එම ගිණුම විවෘත කරන තැනැත්තා විසින් එහි අර්ථලාභී හිමිකරුගේ නම මධ්‍යම තැන්පතුගාරයට හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

60. මධ්‍යම තැන්පතුගාරය විසින් දරනු ලබන සියලු සුරැකුම්පත් සම්බන්ධයෙන් වන ගනුදෙනු, කොටස්පත්‍ර භෞතිකව භාර නොදී, මධ්‍යම තැන්පතුගාරයේ ගිණුම්වල පොත් සටහන් යෙදීම මගින් සිදු කරනු ලැබිය යුතු ය.

61. මධ්‍යම තැන්පතුගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමක යොදන ලද සටහනක් එම කාරණයේ සත්‍යතාව සම්බන්ධයෙන් වන බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

62. (1) මධ්‍යම තැන්පතුගාරය විසින් එහි සුරැකුම්පත් දරන්නන් වෙනුවෙන් භාරයක් ලෙස සුරැකුම්පත් දරනු ලබන අවස්ථාවක, එම සුරැකුම්පත් භාරයක් ලෙස දරනු ලබන්නේ යම් තැනැත්තකුගේ අර්ථලාභය සඳහා ද, එම තැනැත්තා-

(අ) එකී සුරැකුම්පත් දරන්නා ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) ඔහු එම සුරැකුම්පත් දරන්නා වූවාක් මෙන්, අවස්ථාවෝචිත පරිදි, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ එම සුරැකුම්පත් සම්බන්ධයෙන් වන සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාදයන් භුක්ති විඳිය යුතු අතර, එම සුරැකුම්පත් සම්බන්ධයෙන් වන හෝ එම සුරැකුම්පත් මගින් පැන නගින සියලු වගකීම් සහ බැඳීම්වලට යටත් විය යුතු ය.

(2) නාමිකයකු විසින් දරනු ලබන මධ්‍යම තැන්පතුගාරයේ ගිණුම්වල පවත්වාගෙන යනු ලබන සුරැකුම්පත්වලට අදාළ අයිතිවාසිකම් සහ වගකීම්, මධ්‍යම තැන්පතුගාරයේ අදාළ ගිණුමෙහි හඳුනාගෙන ඇති අර්ථලාභී හිමිකරු විසින් ඔහු එම සුරැකුම්පත් දරන්නා වූවාක් මෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) තැන්පතුගාර සහභාගිකයකුගේ යම් බුන්වත්භාවය හෝ වස්තුභංගත්වයක් සම්බන්ධයෙන් වන නඩු කටයුත්තකට අදාළව භාර ගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු, ඇවරකරුවකු හෝ ඒ හා සමාන තැනැත්තකු පත්කිරීම මගින් මධ්‍යම තැන්පතුගාරය විසින් භාරයක් ලෙස දරන එම තැන්පතුගාර සහභාගිකයාගේ සුරැකුම්පත් දරන්නන්ගේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුතු ය.

63. මේ පනත පැනවීමට පෙරාතුව මධ්‍යම තැන්පතුගාරය විසින් සිදු කරන ලද යම් සුරැකුම්පත් ලියාපදිංචි කිරීමක්, මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූල නොවන ලෙස සිදු කර තිබීම යන හේතුව මත පමණක් අවලංගු නොවිය යුතු ය.

4 වන පරිච්ඡේදය

සාමාන්‍ය විධිවිධාන

64. (1) වෙළෙඳපොළ ආයතනයක රීති, කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරන ලද රීති-

(අ) වෙළෙඳපොළ ආයතනය සහ එක් එක් සුරැකුම්පත් නිකුත් කරන්නා;

(ආ) වෙළෙඳපොළ ආයතනය සහ අවස්ථාවෝචිත පරිදි, එක් එක් වෙළෙඳ සහභාගිකයා, නිෂ්කාශන සාමාජිකයා හෝ තැන්පතුගාර සහභාගිකයා අතර;

(ඇ) එක් එක් සුරැකුම්පත් නිකුත්කරන්නකු සහ එක් එක් වෙළෙඳ සහභාගිකයා අතර; සහ

(ඇ) වෙළෙඳ සහභාගිකයන්, නිෂ්කාශන සාමාජිකයන් හෝ තැන්පතුගාර සහභාගිකයන් අතර,

වන අනුගම්‍ය ගිවිසුමක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

(2) පිළිවෙළින් වෙළෙඳපොළ ආයතනය, එක් එක් සුරැකුම්පත් නිකුත්කරන්නා, එක් එක් වෙළෙඳ සහභාගිකයා, නිෂ්කාශන සාමාජිකයා සහ තැන්පතුගාර සහභාගිකයා විසින් එම රීතිවල විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි, එම වෙළෙඳපොළ ආයතනයට, සුරැකුම්පත් නිකුත්කරන්නාට, වෙළෙඳ සහභාගිකයාට, නිෂ්කාශන සාමාජිකයාට හෝ තැන්පතුගාර සහභාගිකයාට අදාළ වන තාක් දුරට එම රීතිවල විධිවිධාන යටතේ වන එම බැඳීම් පිළිපැදීම හෝ ඉටු කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති තාක් දුරට, වෙළෙඳපොළ ආයතනයක රීතී, කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොමැතිව සංශෝධනය කරනු, වෙනස් කරනු හෝ පරිච්ඡින්න කරනු නොලැබිය යුතු ය.

(4) වෙළෙඳපොළ ආයතනයක් විසින් එහි රීතී සංශෝධනය කිරීමට යෝජනා කරනු ලබන අවස්ථාවක, එම වෙළෙඳපොළ ආයතනය විසින් එම යෝජිත සංශෝධනය කොමිෂන් සභාව වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් එම වෙළෙඳපොළ ආයතනයට සවන් දීමෙන් පසු, යෝජිත සංශෝධනය ලැබී දින අනූවක් ඇතුළත, එම රීතිවලට කරනු ලබන සංශෝධන සඳහා-

(අ) අවසර දෙන්නේ ද;

(ආ) අවසර නොදෙන්නේ ද; හෝ

(ඇ) සංශෝධන, වෙනස් කිරීම් හෝ මඳ වශයෙන් වෙනස් කිරීම් සහිතව අවසර දෙන්නේ ද,

යන්න පිළිබඳව එම වෙළෙඳපොළ ආයතනය වෙත ලිඛිත දැන්වීමක් ලබා දෙනු ලැබිය යුතු ය.

(6) යෝජිත සංශෝධනය සඳහා ඉඩ ලබා නොදෙන විට, කොමිෂන් සභාව විසින්, එකී අනනුමතය සඳහා හේතු ලබා දෙනු ලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින් දින අනූවක් ඇතුළත වෙළෙඳපොළ ආයතනය වෙත ප්‍රත්‍යාවර්තනය කිරීමට අපොහොසත් වන අවස්ථාවක එකී දින අනූව අවසන් වූ වහාම (4) වන උපවගන්තිය යටතේ එකී රීතිවලට කරනු ලබන යෝජිත සංශෝධන බලාත්මක විය යුතු ය.

(8) (5) වන උපවගන්තිය යටතේ වන දැන්වීම ලැබුණු පසු, වෙළෙඳපොළ ආයතනය විසින් වහාම එකී රීතිය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(9) (5) වන සහ (8) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් ඕනෑම විටක දී යම් වෙළෙඳපොළ ආයතනයක රීතී සංශෝධනය කරනු ලැබිය හැකි අතර එකී රීති වහාම බලාත්මක වන පරිදි ක්‍රියාත්මක විය යුතු ය. නැතහොත් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් දිනක සිට බලාත්මක විය යුතු ය.

65. (1) වෙළෙඳපොළ ආයතනයක රීතින්වලට අනුකූල කටයුතු කිරීම, එම රීති පිළිපැදීම, බලාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමකට යටත් යම් තැනැත්තකු එසේ කිරීමට අපොහොසත් වන අවස්ථාවක, එම වෙළෙඳපොළ ආයතනය විසින් එම කරුණ කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබූ පසු, කොමිෂන් සභාව විසින්, එම රීතිවලට අනුකූලව කටයුතු කරන ලෙස හෝ එසේ කිරීමට අපොහොසත්වීම සඳහා හේතු දක්වන ලෙස හෝ එම තැනැත්තාට විධාන කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් දක්වනු ලැබූ හේතු පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවන අවස්ථාවක, එම රීතිවලට සහ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන්නා වූ ද කොමිෂන් සභාව විසින් ලබාදෙනු ලබන්නා වූ ද වෙනත් යම් විධානයකට අනුකූලව කටයුතු කරන ලෙස කොමිෂන් සභාව විසින් එම තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද කොමිෂන් සභාවේ විධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධානයකට අනුකූලව කටයුතු කිරීමට යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, (2) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ඉදිරියට කටයුතු කිරීම හෝ (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලීමක් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) අධිකරණය විසින්, වෙළෙඳපොළ ආයතනයක රීතිවලට අනුකූලව කටයුතු කරන ලෙස, එම රීති පිළිපදින ලෙස, බලාත්මක කරන ලෙස හෝ ක්‍රියාත්මක කරන ලෙස ප්‍රථමයෙන් සඳහන් තැනැත්තාට විධාන කර ආඥාවක් කරනු ලැබිය හැකි ය.

66. (1) රජයේ නියෝජිතයකු නොවන යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන, තනිව හෝ ඔහු සමඟ එක්ව ක්‍රියා කිරීමට සම්මුතියකට එළඹී ක්‍රියා කරනු ලබන වෙනත් යම් තැනැත්තකු සමඟ හෝ යම් වෙළෙඳපොළ ආයතනයක මුළු ඡන්දබලය හිමි කොටස්වල එකතුවෙන් සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවන, යම් ඡන්දබලය හිමි කොටස් ප්‍රමාණයක් ලබාගැනීම සඳහා යම් ගිවිසුමකට හෝ සැලසුමකට එළඹෙනු නොලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නිශ්චිත සම්බන්ධතාවක් නියෝජනය කරනු ලබන තැනැත්තන් කණ්ඩායමක් විසින් ඍජුව හෝ වක්‍රව දරනු ලැබිය හැකි උපරිම ඡන්දබලය හිමි කොටස් සමානුපාතිකය පිළිබඳව කොමිෂන් සභාව විසින් සීමා පනවනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් ඕනෑම විටක දී ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කිරීම මගින් සුරැකුම්පත් වෙළෙඳපොළ වර්ධනයේ අදියර හෝ මහජන සුබසිද්ධිය පිළිබඳ සැලකිල්ලට ගැනීමෙන් පසු, (1) වන උපවගන්තියේ සඳහන් සීමාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන අනුමතය ලබා ගැනීමේ කාර්යය සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, මෙහි සඳහන් ඡන්දබලය හිමි කොටස් අත්කර ගැනීමට අදහස් කරන තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියකින් සහ ආකාරයකින් කොමිෂන් සභාව වෙත එම ඉල්ලුම් පත්‍රය යවනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින්-

(අ) ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබා දෙන ලෙස; සහ

(ආ) ඉල්ලුම් පත්‍රයක් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් ඉල්ලුම්කරුගේ වියදමින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට අනුව සහ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් තැනැත්තන් මගින් සත්‍යායනය කරන ලෙස,

ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, පැනවීමට සුදුසු යැයි එය අදහස් කරන යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, එහි අනුමතය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

67. (1) යම් තැනැත්තකු විසින් 66 වන වගන්තියේ විධිවිධාන කඩකරනු ලැබ ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, යම් කොටස්වලට අදාළව, එම කඩකිරීමේ අවස්ථානුගත කරුණු අනුව අදාළ විය හැකි හෝ සුදුසු විය හැකි පහත දැක්වෙන තහනම් කිරීම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පනවමින් විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය:-

(අ) එකී ඡන්දබලය හිමි කොටස් මිල දී ගැනීම හෝ මිල දී ගැනීම සඳහා වන ගිවිසුමක් හෝ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම හෝ නිකුත් නොකළ කොටස් සම්බන්ධයෙන් වන විට, නිකුත් නොකළ කොටස් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම මිල දී ගැනීම සඳහා වන ගිවිසුමක් හෝ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම හෝ එම අයිතිවාසිකම මිල දී ගැනීම තහනම් කිරීම;

(ආ) එකී කොටස්වලට අදාළව යම් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම තහනම් කිරීම;

(ඇ) එකී කොටස්වල අයිතිවාසිකම් අනුව හෝ එම කොටස් දරන්නන් වෙත සිදුකරනු ලැබූ යම් අර්පණයක් ප්‍රකාරව යම් වැඩිදුර කොටස් නිකුත් කිරීම තහනම් කිරීම; හෝ

(ඈ) ඈවර කිරීමේ දී හැර, ප්‍රාග්ධනය හෝ ලාභාංශ සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් එම කොටස් සඳහා, වෙළෙඳපොළ ආයතනය විසින් ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම තහනම් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන විධානයක්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් (1) වන උපවගන්තිය කඩකරන ලද තැනැත්තා වෙත භාර දෙනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් සුදුසු යැයි අදහස් කරන ආකාරයකින් එය ප්‍රසිද්ධ කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන විධානයක් (1) වන උපවගන්තිය කඩකරන තැනැත්තකු, ඒ නියෝගය අදාළ වන ඡන්දහිමි කොටස් තත්කාලයේ දරන යම් තැනැත්තකු සහ එම විධානයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් තැනැත්තකු සඳහා අනුගම්‍ය විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කර ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද, එම තැනැත්තා විසින් හෝ එම විධානයේ අගතිගාමීව බලපෑමට ලක්වූ වෙනත් යම් තැනැත්තෙක් විසින්, එම විධානය භාර දී නිකුත් කරනු ලැබූ දින සිට දින දාහතරක් ඇතුළත, එම විධානය නිකුත් කර ඇත්තේ යම් විධිවිධානවලට අදාළව ද, එම විධිවිධාන තමා විසින් කඩ නොකළේය යන හේතුව මත එම විධානය අවලංගු කරන ලෙස හෝ එකී අභියාචනයේ නිශ්චිතව දක්වන හේතු මත එම විධානය වෙනස් කිරීම සාධාරණ සහ යෝග්‍ය වන්නේය යන හේතුවෙන් එම විධානය වෙනස් කරන ලෙස ඉල්ලා කොමිෂන් සභාව වෙත ලිඛිතව අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින්, (4) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක් ලැබුණු දින සිට දින හතලිස් පහක් ඇතුළත, එම ඉල්ලීම මගින් කරන ලද අභියාචනය සලකා බැලීමෙන් පසු, එම විධානය ස්ථිර කිරීම, අවලංගු කිරීම, හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානය ස්ථිර කරන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම විධානය අදාළ වන කොටස් දරන්නාට එම කොටස් බැහැර කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

(7) කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින්, ලබා දෙන ලද යම් තීරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ එම තීරණයට ආනුෂංගික, උපසේවී හෝ ආනුෂංගික විය හැකි යම් උපදෙසක් හෝ විධානයක් වෙළෙඳපොළ ආයතනයේ අධ්‍යක්ෂවරුන්ට හෝ නිලධරයන් වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(8) කොමිෂන් සභාව විසින් (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයක් හෝ ලබාදෙන ලද යම් තීරණයක් හෝ (7) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද යම් උපදෙසක් හෝ නිකුත් කරන ලද යම් විධානයක් කඩකරන්නා වූ යම් කොටස්වලට අදාළ ගිවිසුමක් හෝ සැලැසුමක් ඇතුළු යම් ගනුදෙනුවක් නීතිය අනුව බලරහිත වන්නේ ය.

(9) (5) වන උපවගන්තිය යටතේ ලබාදුන් යම් විධානයක් හෝ තීරණයක් හෝ (7) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද යම් උපදෙසක් හෝ නිකුත් කරන ලද යම් විධානයක් කඩකරන යම් තැනැත්තකු, වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

68. (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ඇතිව මිස, යම් තැනැත්තකු විසින්, වෙළෙඳපොළ ආයතනයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු ලෙස කරන ලද පත්කිරීමක්, නැවත පත් කිරීමක්, තෝරා පත්කර ගැනීමක් හෝ නැවත තෝරා පත්කර ගැනීමක් භාර ගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ අනුමතය අවශ්‍ය වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි-

(අ) යම් යෝජිත අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නිදහස් නොකළ වස්තුභංගත්වයට පත්වූවකු නම්;

(ආ) යෝජිත අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායක නිලධරයාට හෝ ප්‍රධාන නියාමන නිලධරයාට එරෙහිව වන යම් විනිශ්චිත ණයක මුළු මුදල හෝ ඉන් කොටසක් ගෙවා තෘප්ත කර නොමැති නම්ත

(ඇ) යෝජිත අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක නිලධරයා හෝ ප්‍රධාන නියාමන නිලධරයා-

(i) ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී වංචාවක් හෝ වංකභාවයක් සම්බන්ධයෙන් වන වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම් හෝ එම වරදකට වරදකරු කරනු ලැබීමට ඔහු වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියාකර ඇති බවට වූ තීරණයක් ඇතුළත්ව ඇත්නම්;

(ii) මේ පනත යටතේ වන වරදකට වරදකරුවකු කරනු ලැබ ඇත්නම්;

(iii) එකී පත් කිරීමට පෙරාතුව ම වූ අවුරුදු තුනක කාල සීමාව ඇතුළත, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් පරිපාලනමය දණ්ඩනයකට යටත්ව ඇත්නම්;

(iv) චරිත දූෂණය සම්බන්ධයෙන් වූ වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම්; හෝ

(v) සම්බන්ධතා අතර ගැටුමක් ඇති වීමට ඉඩ ඇත්නම්.

69. යම් වෙළෙඳපොළ ආයතනයක් විසින් එහි සාංගමික ව්‍යවස්ථාවලිය හෝ ඒ වන විට සපයා ඇති වෙනත් යම් වැදගත් තොරතුරු වෙනස් කිරීමට යෝජනා කරනු ලබන්නා වූ හෝ ඉල්ලුම් පත්‍රයෙහි හෝ බලපත්‍රය අලුත් කිරීමෙහි නිශ්චිතව දක්වා ඇති තත්ත්වයේ වෙනසක් සිදු කරනු ලබන්නා වූ හෝ වෙනසක් සිදු කිරීමට අදහස් කරනු ලබන්නා වූ අවස්ථාවක, එම වෙනස් කිරීම හෝ වෙනස සිදු කිරීමට පෙරාතුව එම වෙළෙඳපොළ ආයතනය විසින් ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

70. ගිවිසුම්වලට අදාළ යම් ලිඛිත නීතියක සඳහන් කිසිවක් මගින්, එය මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ රීතිවලට අනනුකූල වන තාක්දුරට-

(අ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග, රීති හෝ විධාන යටතේ සුරැකුම්පත්වලට අදාළව විනිමය ස්ථානයක් හෝ නිෂ්කාශනාගාරයක් වෙත පැවරෙන යම් අයිතිවාසිකම්;

(ආ) අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ, ඒ යටතේ සාදනු ලබන යම් නියෝග, රීති හෝ විධාන යටතේ හෝ විනිමය ස්ථානයක හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක හෝ බලපත්‍රලත් මධ්‍යම තැන්පතුගාරයක රීති යටතේ විනිමය ස්ථානයක් විසින් එළඹෙන ලද සුරැකුම්පත් ගනුදෙනුවක පාර්ශ්වයක් වෙත පැවරෙන යම් අයිතිවාසිකම්; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග, රීති හෝ විධාන යටතේ විනිමය ස්ථානයක් විසින් හෝ බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් විසින් හෝ බලපත්‍රලත් මධ්‍යම තැන්පතුගාරයක් විසින් එළඹෙනු ලැබූ සුරැකුම්පත් ගනුදෙනුවක් යටතේ හෝ ඊට අදාළව කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක්,

සඳහා බලපෑමක් නොවිය යුතු ය.

71. (අ) විනිමය ස්ථානයක් විසින්; හෝ

(ආ) (i) විනිමය ස්ථානයක යම් අධ්‍යක්ෂවරයෙක්; හෝ

(ii) විනිමය ස්ථානයක් විසින් පිහිටුවනු ලැබූ යම් කමිටුවක යම් සාමාජිකයෙක්,

ඇතුළුව විනිමය ස්ථානයක් වෙනුවෙන් ක්‍රියාකරන යම් තැනැත්තෙක් විසින්,

සිදු කරන ලද හෝ නොකරන හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් වන අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක දී, එම විනිමය ස්ථානය විසින් හෝ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තා විසින් මේ පනත යටතේ, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ හෝ එකී විනිමය ස්ථානයේ රීති යටතේ වන එහි බැඳීම් ඉටුකිරීම අතරතුර හෝ ඒ හා සම්බන්ධයෙන් සියලු සාධාරණ සැලකිල්ල දක්වනු ලැබූ බව ද, සද්භාවයෙන් ක්‍රියා කරනු ලැබූ බව ද ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

72. (1) වෙළෙඳපොළ ආයතනයක් විසින්, කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව වෙනුවෙන් කටයුතු කරන තැනැත්තකුට හෝ කොමිෂන් සභාවේ අධිකාරි බලය සහිත තැනැත්තකුට, මේ පනතේ මනා පරිපාලනය උදෙසා කොමිෂන් සභාවට හෝ එකී තැනැත්තාට අවශ්‍ය විය හැකි වෙළෙඳපොළ ආයතනයේ මෙහෙයුම්වලට අදාළ යම් වාර්තා ඉදිරිපත් කිරීම සහ යම් තොරතුරු සැපයීම ඇතුළුව කොමිෂන් සභාවට හෝ එකී තැනැත්තාට සාධාරණව අවශ්‍ය යම් සහායක් ලබා දෙනු ලැබිය යුතු යඃ

(2) කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තකු හෝ කොමිෂන් සභාව විසින් බලය ලබාදෙනු ලැබූ තැනැත්තකු මේ පනතේ යම් කාර්යයක් සඳහා විනිමය ස්ථානයක ව්‍යාපාර පහසුකමට සියලු සාධාරණ වේලාවන් හි දී සම්පූර්ණ ලෙස සහ නිදහස් ලෙස ප්‍රවේශවීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) නීත්‍යනුකූල අවසරයක් නොමැතිව කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියා කරන හෝ කොමිෂන් සභාව විසින් බලය ලබාදෙනු ලැබූ තැනැත්තකුට (2) වන උපවගන්තියට අනුකූලව විනිමය ස්ථානයක ව්‍යාපාර වෙළෙඳ පහසුකමට, ප්‍රවේශවීමට, ඉඩලබාදීම ප්‍රතික්ෂේප කරන හෝ එසේ කිරීමට අපොහොසත් වන තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

73. (1) වෙළෙඳපොළ ආයතනයක් විසින්, එහි ශේෂ පත්‍රයේ දිනයේ සිට මාස පහක් ඇතුළත පහත සඳහන් කරුණු ඇතුළත් වාර්ෂික වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:-

(අ) වෙළෙඳපොළ ආයතනයේ සංස්ථාමය පාලන ප්‍රතිපත්ති පිළිබඳ වාර්තාවක් සහ කොමිෂන් සභාව විසින් නියම කරන ලද වෙනත් යම් තොරතුරක්;

(ආ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සාදන ලද විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ රීතිවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි එවැනි වෙනත් අවශ්‍යතාවන්; සහ

(ඇ) සුදුසු විට දී, වෙළෙඳපොළ ආයතනය පාලක සමාගමක් හෝ පාලිත සමාගමක් වන අවස්ථාවක දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්ෂික වාර්තාවක ඇතුළත් විය යුතු මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව විගණනය කරනු ලැබිය යුතු ය.

(3) බලයලත් නිෂ්කාශනාගාරයක සහ මධ්‍යම තැන්පතුගාරයක වාර්ෂික වාර්තාවට අවධානම් කළමනාකරණ කාර්යපටිපාටිය සහ ඒවා අදාළ කරගැනීම, සහ කොමිෂන් සභාව විසින් නියම කරන ලද වෙනත් යම් තොරතුරු ද ඇතුළත් විය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ වාර්ෂික වාර්තාවකට ඇතුළත් කරනු ලැබිය යුතු තොරතුරු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නියම කරන ලද තොරතුරුවලට අමතරව විය යුතු ය.

74. (1) වෙළෙඳපොළ ආයතනයක විගණකවරයකුට ඔහුගේ කාර්ය සාමාන්‍ය පරිදි ඉටු කිරීමේ දී

(අ) ඔහුගේ මතයට අනුව, වෙළෙඳපොළ ආයතනයේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු ප්‍රමාණයකට අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපෑ හැකි යම් කරුණක්;

(ආ) ඔහුගේ මතයට අනුව, මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් සංයුක්ත වන හෝ කඩකිරීමක් සංයුක්ත විය හැකි, ලැබිය හැකි හෝ සැලකිය යුතු ප්‍රමාණයකට වෙළෙඳපොළ ආයතනයේ මූල්‍ය ස්ථායීතාවට බලපාන වංචාව හෝ වංචනිකභාවය හා සම්බන්ධ වූ යම් වරදක් සංයුක්ත වන හෝ සංයුක්ත විය හැකි යම් කරුණක්; හෝ

(ඇ) සුරැකුම්පත්වල ආයෝජකයන්ගේ අරමුදල් හෝ දේපළවලට අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපෑ හැකි යම් අක්‍රමිකතාවක් ඇතුළුව වෙළෙඳපොළ ආයතනයක ගිණුම්වලට සැලකිය යුතු බලපෑමක් ඇති හෝ ඇති විය හැකි යම් අක්‍රමිකතාවක්,

පිළිබඳ දැනගැනීමට ලැබුණු විට, එම විගණකවරයා විසින් වහාම එම කාරණය පිළිබඳ හෝ අක්‍රමිකතාව පිළිබඳ ලිඛිත වාර්තාවක්, කොමිෂන් සභාවට පිටපතක් සහිතව, අධ්‍යක්ෂ මණ්ඩලයට නොපමාව යවනු ලැබිය යුතු ය.

(2) වෙළෙඳපොළ ආයතනයක විගණකවරයෙක්, සද්භාවයෙන් ක්‍රියාකරනු ලැබ ඇත්නම්, එම විගණකවරයා (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ වාර්තාව තුළ සිදු කරන ලද යම් ප්‍රකාශයකට අදාළව යම් තැනැත්තෙක් විසින් පවරනු ලබන යම් සිවිල් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතනයක විගණකවරයා වෙත පහත දැක්වෙන කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් නියම කරනු ලැබිය හැකි ය:-

(අ) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන විගණකවරයාගේ විගණනයට අදාළ යම් අමතර තොරතුරු සහ වාර්තා ඉදිරිපත් කිරීමේ කාර්යය;

(ආ) වෙළෙඳපොළ ආයතනයේ ව්‍යාපාර සහ කටයුතු සම්බන්ධයෙන් වන ඔහුගේ විගණනයේ විෂයපථය විශාලනය කිරීමේ, දීර්ඝ කිරීමේ හෝ වෙනස් කිරීමේ කාර්යය;

(ඇ) යම් විශේෂ අවස්ථාවක දී වෙනත් යම් විභාගයක් ක්‍රියාවට නැංවීමේ හෝ යම් කාර්යපටිපාටියක් පිහිටුවීමේ කාර්යය; හෝ

(ඈ) (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන්, ඔහුගේ විගණනය, විභාගය හෝ කාර්යපටිපාටිය පිහිටුවීමෙන් පැන නගින යම් කරුණක් සම්බන්ධයෙන් වාර්තාවක් ලබාදීමේ කාර්යය සහ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ස්වාධීන මතයක් නිකුත් කිරීම සඳහා වන ඔහුගේ සාමාන්‍ය විගණන විෂය පථය දීර්ඝ කිරීමක් ලෙස විගණකවරයා විසින් එකී කාර්ය ක්‍රියාවට නංවනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් ඔහු විසින් ඉටුකිරීමට අදාළව, කොමිෂන් සභාව විසින් පළකරනු ලබන ගාස්තු උපලේඛනය ප්‍රකාරව, වෙළෙඳපොළ ආයතනය විසින් විගණකවරයාට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර වැඩිදුර විමර්ශනයක් සිදු කිරීම අවශ්‍ය වන අවස්ථානුගත කරුණුවල දී කොමිෂන් සභාවේ අරමුදලින් විගණකවරුන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

75. වෙළෙඳපොළ ආයතනයක් විසින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකෘතියකට, ආකාරයකට සහ වාර ගණනකට අනුව කළමනාකරණ විගණනයක් ඇතුළු යම් වාර්තා කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද, කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කරනු ලබන විධාන, මේ පනතේ විධිවිධාන, රීති හා නියෝග සම්බන්ධයෙන් අනුකූල වීම නිශ්චය කර ගැනීම සඳහා, කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතනය, සුපරීක්ෂාවට සහ වාර්ෂික විගණනයට යටත් කළ යුතු ය.

76. වෙළෙඳපොළ ආයතනයක් විසින්, නියම කරනු ලැබිය හැකි යම් වාර්ෂික ගාස්තුවක් කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතු ය.

77. (1) යම් තැනැත්තකු විසින් කොටස් විනිමය ස්ථානයක්, ව්‍යුත්පන්න විනිමය ස්ථානයක්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් ලෙස පෙනී සිටිනු නොලැබිය යුතු අතර "කොටස් විනිමය ස්ථානය", "ව්‍යුත්පන්න විනිමය ස්ථානය", "අනාගතයන් විනිමය ස්ථානය", "කොටස් වෙළෙඳපොළ", "ව්‍යුත්පන්න වෙළෙඳපොළ", "අනාගතයන් වෙළෙඳපොළ", "බලපත්‍රලත් නිෂ්කාශනාගාරය", "නිෂ්කාශන පහසුකම", "මධ්‍යම තැන්පතුගාරය", "සුරැකුම්පත් ව්‍යාපාර වෙළෙඳපොළ", "ව්‍යුත්පන්න ව්‍යාපාර වෙළෙඳපොළ" හෝ "අනාගතයන් ව්‍යාපාර වෙළෙඳපොළ" යන නාමය, ශීර්ෂය හෝ විස්තරය ලබාගැනීම හෝ භාවිත කිරීම හෝ සඳහනකින් යොදාගැනීම කරනු නොලැබිය යුතු අතර, එම තැනැත්තා, කොටස් විනිමය ස්ථානයක්, ව්‍යුත්පන්න විනිමය ස්ථානයක්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් වන්නේය යන අදහස අඟවන හෝ එම අදහස ඇති කිරීමට නැඹුරු කරවන යම් නාමයක්, ශීර්ෂයක් හෝ විස්තරයක්, ලබාගැනීම හෝ භාවිත කිරීම හෝ යම් ස්ථානයක ඇලවීම හෝ ප්‍රදර්ශනය කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

78. (1) කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඔහුට එම තීරණය පිළිබඳ දැනුම් දුන් දිනෙන් පසු දින තිහක් ඇතුළත එම තීරණය සමාලෝචනය කරන ලෙස කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) එම ඉල්ලීම ලැබුණු දින සිට දින අනූවක් නොඉක්මවන කාලසීමාවක දී කොමිෂන් සභාව විසින් එහි තීරණය ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

III වන කොටස

සුරැකුම්පත් නිකුත් කිරීම

79. මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ-

(අ) මහජන අර්පණ මගින් සුරැකුම්පත් නිකුත් කිරීම නියාමනය කිරීම;

(ආ) ලැයිස්තුගත පොදු සමාගම් විසින් මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සහතික කිරීම;

(ඇ) ලැයිස්තුගත පොදු සමාගම්වල මූල්‍ය අක්‍රමිකතා හෙළිදරව් කරන ලෙස විගණකවරුන්ට නියම කිරීම;

(ඈ) වෙළෙඳපොළ අතරමැදියන්ට බලපත්‍ර ලබාදීම සහ ඔවුන්ගේ නියෝජිතයන් ලියාපදිංචි කිරීම; සහ

(ඉ) සේවාලාභීන්ගේ වත්කම් ආරක්ෂා කිරීම,

විය යුතු ය.

1 වන පරිච්ඡේදය

සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණය

80. කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැනැත්තකු විසින් එය අනුමත කර ඇත්නම් මිස, විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමක් ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇති පොදු සමාගමක් විසින් හෝ වෙනත් ලැයිස්තුගත පොදු සමාගමක් විසින් මහජනයාගෙන් අරමුදල් ඉල්ලීමේ කාර්යය සඳහා සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් මගින් හෝ අන්‍යාකාරයකින් කෙළින්ම හෝ තුන්වන පාර්ශ්වයක් මගින් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද, සුරැකුම්පත් ප්‍රමාණය, සුරැකුම්පත් පන්තිය, ආයෝජකයන් සංඛ්‍යාව සහ වර්ගය, නිකුත් කරන්නාගේ ස්වභාවය හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ ස්වභාවය සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින්, ලැයිස්තුගත නොකළ සමාගම්වල ඇතැම් මහජන අර්පණ වර්ගවලට පෙර කොමිෂන් සභාවේ අනුමතය ලබා ගන්නා ලෙස, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලැබිය හැකි ය.

81. (1) ලැයිස්තුගත පොදු සමාගමක් විසින්-

(අ) යම් නව නිකුත් කිරීමක් හෝ විකිණීම සඳහා වන අර්පණයක් මහජන අර්පණයක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ වුව ද, එම නව නිකුත් කිරීම් හෝ මහජනයා වෙත සුරැකුම්පත් විකිණීම සඳහා අර්පණ;

(ආ) සුරැකුම්පත් පිළිබඳ පෞද්ගලික ස්ථානගත කිරීම්;

(ඇ) සුරැකුම්පත් පිළිබඳ හිමිකම් නිකුත් කිරීම්;

(ඈ) සුරැකුම්පත් පිළිබඳ ප්‍රසාද නිකුත් කිරීම්; හෝ

(ඉ) සකස් කිරීම පිළිබඳ යෝජනා ක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම, අත්කර ගැනීමේ යෝජනා ක්‍රම, කොටස් මනාප යෝජනා ක්‍රම සහ සුරැකුම්පත් නිකුත් කිරීම මගින් වත්කම් අත් කර ගැනීම,

සම්බන්ධයෙන්, කොමිෂන් සභාවේ අනුමතය හෝ එම අනුමතය ලබා දීම සඳහා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ අනුමතය හෝ ලබා ගනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමක් ඉල්ලා සිටින ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයක් විසින්, සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කිරීමට අනුමතය ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(3) සෑම ලැයිස්තුගත පොදු සමාගමකම සහ සෑම ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයකම අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එම සමාගම හෝ ආස්ථිත්‍යය ලැයිස්තුගත කර ඇත්තේ යම් විනිමය ස්ථානයක ද එම විනිමය ස්ථානයේ එය ලැයිස්තුගතව සිටන තාක් කල්, සෑම විට දී ම එම විනිමය ස්ථානයේ රීති සහ නියමයන්ට අනුකූලව එම සමාගම හෝ ආස්ථිත්‍යය විසින් කටයුතු කරනු ලබන බවට වගබලා ගනු ලැබිය යුතු ය.

82. (1) මහජනයාට අර්පණයක් සිදු කරන තැනැත්තකු විසින් සාදනු ලබන සංස්ථා ප්‍රකාශය හෝ ඒ හා සමාන ලේඛනය, 2007 අංක 7 දරන සමාගම් පනතේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට සහ කොමිෂන් සභාව විසින් සහ විනිමය ස්ථානයක රීතිවල නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් නියමයන්ට අනුකූල විය යුතු ය.

(2) මහජනයාට සුරැකුම්පත් නිකුත් කිරීමක් සිදු කරන තැනැත්තකු විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නියම කර ඇති පරිදි සංස්ථා ප්‍රකාශය ලියාපදිංචි කිරීමට පෙරාතුව, එම සංස්ථා ප්‍රකාශයේ හෝ ඒ හා සමාන ලේඛනයක පිටපතක් කොමිෂන් සභාව වෙත හෝ තත්කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මහජනයාගෙන් අරමුදල් ඉල්ලීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කරනු ලබන විට දී කොමිෂන් සභාව විසින් යම් සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

83. (1) (අ) එහි ලැයිස්තුගත කිරීමේ රීති යටතේ හෝ 80 වන වගන්තිය යටතට ගැනෙන මහජන අර්පණවලට අදාළව බලපත්‍රලත් කොටස් විනිමය ස්ථානයක් වෙත ඉදිරිපත් කරන ලද සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ හෝ විනිමය ස්ථානයේ රීතිවලට අනුකූල නොවන බව හෝ ඊට අනුකූලව පිළියෙල කර නොමැති බව;

(ආ) සංස්ථා ප්‍රකාශයක හෝ ඒ හා සමාන ලේඛනයක අසත්‍ය හෝ නොමඟ යවන සුලු හෝ වැදගත් කරුණක් සැපයීම පැහැර හැර ඇති යම් ප්‍රකාශයක් හෝ තොරතුරක් අන්තර්ගත වන බවත හෝ

(ඇ) නිකුත් කරන්නකු විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකර ඇති බව හෝ මේ පනත යටතේ පනවන ලද අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇති බව,

කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, තවදුරටත් මහජන අර්පණවලට අදාළ සුරැකුම්පත් විභජනය කිරීම, නිකුත් කිරීම, අර්පණය කිරීම හෝ දායකත්වය සඳහා ආරාධනාවක් කිරීම හෝ මිල දී ගැනීම හෝ සිදු නොකරන ලෙස නිකුත් කරන්නා වෙත නියමයක් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතු ද යන්න සම්බන්ධයෙන් යම් බලපෑමකට ලක්වූ තැනැත්තකුට කරුණු දැක්වීමට සාධාරණ අවස්ථාවක් කොමිෂන් සභාව විසින් ලබා දී ඇත්නම් මිස, කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(3) කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීම මගින්, (1) වන උපවගන්තිය යටතේ වන නියෝගයක් නිකුත් කිරීමේ දී යම් ප්‍රමාදයක් ඇති වීම ආයෝජකයන්ගේ සුබසිද්ධියට අගතිගාමී වන බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නේ නම්, කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා නොදී, කොමිෂන් සභාව විසින් අතුරු නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අතුරු නියෝගයක්, කලින් ප්‍රත්‍යාදිෂ්ට කර ඇත්නම් මිස, එම අතුරු නියෝගය නිකුත් කරන ලද දිනය හෝ (2) වන උපවගන්තිය යටතේ වන කරුණු ඉදිරිපත් කිරීම අවසන් වන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන කවර හෝ දිනෙන් පසු දින විසිඑකක් අවසන් වන තෙක් බලාත්මක විය යුතු ය.

(5) එම නියෝගය නිකුත් කිරීමට හේතු වූ අවස්ථානුගත කරුණු තවදුරටත් නොපවතින බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයක් හෝ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අතුරු නියෝගයක් විධානයක් මගින් කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(6) සංස්ථා ප්‍රකාශය හෝ ඒ හා සමාන ලේඛනය අදාළ වන සුරැකුම්පත් සඳහා දායකත්වය ලබා ගැනීම හෝ එම සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍ර (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් නිකුත් කිරීමට පෙරාතුව,-

(අ) එහෙත් ඉල්ලුම්කරුවන් වෙත එම සුරැකුම්පත් නිකුත් කිරීමට පෙර නිකුත් කර ඇති අවස්ථාවක, එම ඉල්ලුම් පත්‍ර ඉල්ලා අස්කරගෙන ඇති ලෙස සහ අවලංගු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, නිකුත් කරන්නා හෝ මුදල් ලබා ගත් වෙනත් යම් තැනැත්තකු විසින් ඉල්ලුම්කරුවන්ගෙන් ලබාගත් සියලු මුදල් පොලී රහිතව වහාම ආපසු ගෙවනු ලැබිය යුතු ය. එම නියෝගය නිකුත් කළ දින සිට දින දාහතරක් ඇතුළත එම මුදල් ආපසු ගෙවනු නොලැබුවහොත්, එම කාලසීමාව අවසන් වූ පසු කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පොලියක් ද සමඟ එම මුදල් ආපසු ගෙවීමට නිකුත්කරන්නා යටත් විය යුතු ය; හෝ

(ආ) ඉල්ලුම්කරුවන් වෙත එම සුරැකුම්පත් විභජනය කර ඇති අවස්ථාවක, එම සුරැකුම්පත් විභජනය කිරීම බල රහිත ලෙස සලකනු ලැබිය යුතු අතර, නිකුත්කරන්නා හෝ මුදල් ලබාගත් වෙනත් යම් තැනැත්තකු විසින් ඉල්ලුම්කරුවන්ගෙන් ලබාගත් සියලු මුදල් පොලී රහිතව වහාම ආපසු ගෙවනු ලැබිය යුතු ය. එම බාර දුන් දින සිට දින දාහතරක් ඇතුළත එම මුදල් ආපසු ගෙවනු නොලැබුවහොත්, එම කාලසීමා අවසන් වූ පසු කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අනුප්‍රමාණයක පොලියක් ද සමඟ එම මුදල් ආපසු ගෙවීමට නිකුත්කරන්නා යටත් විය යුතු ය.

(7) සංස්ථා පත්‍රය හෝ ඒ හා සමාන ලේඛනය අදාළ වන සුරැකුම්පත්වලින් කිසිවක් විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඒවායේ වෙළෙඳාම ආරම්භ කර ඇත්නම් මේ වගන්තියේ විධිවිධාන යම් නිකුත්කරන්නකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

84. (1) විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ සමාගමක සුරැකුම්පත් දරන තැනැත්තකු විසින් එම බලපත්‍රලත් විනිමය ස්ථානය විසින් යොදාගනු ලැබූ වෙළෙඳ කාර්යපටිපාටියට අනුකූලව එම සුරැකුම්පත් මිල දී ගැනීම, විකිණීම, තෑගි දීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම විනිමය ස්ථානය විසින් කිසිම නිශ්චිත වෙළෙඳ කාර්යපටිපාටියක් යොදා ගෙන නොමැති විට දී, ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් යෝජිත ත්‍යාගයට අදාළ විස්තර පිළිබඳ කොමිෂන් සභාවට සහ බලපත්‍රලත් විනිමය ස්ථානයට පූර්ව දැන්වීමක් ලබා දෙනු ලැබුවහොත්, එම තැනැත්තා විසින් එම වෙළෙඳ කාර්යපටිපාටියට අනුකූල නොවන වෙනත් යම් ආකාරයකින් ඥාතියකුට එවැනි සුරැකුම්පත් තෑගි කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ "ඥාතියා" යන්නෙන්, ඒ තැනැත්තාගේ මව හෝ පියා, කලත්‍රයෙක්, සුළු දරුවකු ඇතුළු දරුවකු, සුළු සහෝදරයකු හෝ සුළු සහෝදරියක ඇතුළු සහෝදරයකු හෝ සහෝදරියක හෝ ඒ දරුවකුගේ කලත්‍රයකු අදහස් වේ.

85. (1) මහජනයාට කරන ලද හෙළිදරව් කිරීම්වලින්-

(අ) ලැයිස්තුගත පොදු සමාගමක ව්‍යාපාර කටයුතු-

(i) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති, විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක රීති කඩ වන ආකාරයකින්; හෝ

(ii) ආයෝජකයන්ගේ සුබසිද්ධියට අගතිගාමී ආකාරයකින්,

සිදු කර ඇති බවට වූ අවස්ථානුගත කරුණු පවතින බව;

(ආ) වංචාකාරී හෝ නීතිවිරෝධී කටයුත්තක් සඳහා සමාගමක් ලැයිස්තුගත කරන ලද බවට අවස්ථානුගත කරුණු පවතින බව;

(ඇ) සමාගමක් ලැයිස්තුගත කිරීමට හෝ ලැයිස්තුගත කිරීමට අදාළ කටයුතු කළමනාකරණයට සම්බන්ධ තැනැත්තන්, වංචාවකට, නීතිවිරෝධී චර්යාවකට හෝ වෙනත් විෂමාචාරයකට වරදකරු වී ඇති බවට අවස්ථානුගත කරුණු පවතින බව; හෝ

(ඈ) ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරයා හෝ කළමනාකාරීත්වය, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ සැපයීමට නියම කරන ලද හෝ මහජනයාට සාධාරණ ලෙස මුදාහැරිය යුතු බවට අපේක්ෂා කළ හැකි සමාගමේ කටයුතු සම්බන්ධයෙන් වන තොරතුරු සිතාමතාම යටපත් කර ඇති බවට අවස්ථානුගත කරුණු පවතින බව,

කොමිෂන් සභාවට පෙනී යන විට දී, කොමිෂන් සභාව විසින්, ඉහතින් වූ විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පැවැත්වීම පිණිස, නිශ්චිත වෙලාවක දී සහ ස්ථානයක දී එකී විධානයේ නිශ්චිතව දක්වා ඇති ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් තොරතුරු ඉදිරිපත් කරන ලෙස නියම කරමින් එම ලැයිස්තුගත පොදු සමාගමට විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් තොරතුරු ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ එය සතු අධිකාරි බලය පවරනු ලැබිය හැකි ය.

(3) පරීක්ෂණයක හෝ විමර්ශනයක විෂයවස්තුව වන්නා වූ ලැයිස්තුගත පොදු සමාගමට අදාළ යම් ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා සන්තකයේ ඇති යම් තැනැත්තකුට එම ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ඉදිරිපත් කරන ලෙස ද කොමිෂන් සභාව හෝ බලයලත් තැනැත්තකු විසින් නියම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා ඉදිරිපත් කරනු ලැබූ විට, කොමිෂන් සභාව හෝ බලයලත් තැනැත්තා විසින් -

(අ) එම ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස එම තැනැත්තාට හෝ එම ලැයිස්තුගත පොදු සමාගමේ වර්තමාන හෝ අතීත නිලධරයකු වන හෝ එම ලැයිස්තුගත පොදු සමාගම විසින් යම් කාලයක දී සේවයේ යොදවන ලද වෙනත් තැනැත්තකුට නියම කරන ලෙස;

(ආ) එම වාර්තා සහ ලේඛන සහ ඉලෙක්ට්‍රොනික වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඒවා ඉදිරිපත් කිරීමට නියම කරන ලද තැනැත්තාට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම පිළිබඳව හේතු දක්වන ලෙස; හෝ

(ඇ) එම ලේඛන හා ඉලෙක්ට්‍රොනික වාර්තා ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඒවා ඉදිරිපත් කිරීමට නියම කරන ලද තැනැත්තාට ඔහුගේ දැනුමට හා අවබෝධයට අනුව ඒවා ඇති ස්ථානය හෙළිදරව් කරන ලෙස,

එම ලැයිස්තුගත පොදු සමාගමට නියම කරනු ලැබිය යුතු ය.

(5) යම් ලැයිස්තුගත පොදු සමාගමක් මේ වගන්තියට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක, මේ පනතේ 86 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් එම ලැයිස්තුගත පොදු සමාගමට විධානයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

86. නිසි පරීක්ෂණයකින් හෝ විමර්ශණයකින් පසු, යම් ලැයිස්තුගත පොදු සමාගමක් විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකර ඇති බවට හෝ ඒවාට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බවට හෝ අසත්‍ය, වැරදි හෝ නොමඟ යවනසුලු තොරතුරු කොමිෂන් සභාවට සපයා ඇති බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක කොමිෂන් සභාව විසින්, සුදුසු යැයි සලකනු ලබන පරිදි මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති යම් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

87. (1) මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ කොමිෂන් සභාවට තොරතුරු සපයන හෝ තොරතුරු සැපයීමට කටයුතු සලස්වන යම් තැනැත්තකු විසින්, එම තොරතුරුවල යම් වැදගත් කරුණක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු ලෙස සපයා නොමැති බවට වගබලා ගැනීමට ඒ පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(2) (අ) කොමිෂන් සභාවේ ගොනු කර තබා ඇති යම් ලේඛනයක් අත්සන් කරන; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් ඔහුට පවරන ලද යම් හඳුනාගැනීමේ හෝ වෙනත් සහතික කිරීමේ ක්‍රමයක් හෝ කාර්යපටිපාටියක් යොදාගෙන ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික මාර්ගයකින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන,

යම් තැනැත්තකු විසින් එම ලේඛනයේ යම් වැදගත් කරුණක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු ලෙස සපයා නොමැති බවට වගබලා ගැනීමට ඒ පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්ති කඩකරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

88. රැවටීමේ අදහසින්, මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ ලැයිස්තුගත පොදු සමාගමක් විසින් සැපයිය යුතු යම් තොරතුරකට අදාළව, මේ පනත යටතේ බලපත්‍ර දෙන ලද වෙළෙඳපොළ ආයතනයකට යම් නොමඟ යවනසුලු ප්‍රකාශයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන හෝ සපයන හෝ දැන දැනම සහ හිතාමතාම එවැනි ප්‍රකාශයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීමට හෝ සැපයීමට බලය දෙන හෝ අවසර දෙන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

89. (1) සෑම ලැයිස්තුගත පොදු සමාගමකම අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එම සමාගම එය ලැයිස්තුගත කර ඇති විනිමය ස්ථානයේ ලැයිස්තුගතව සිටින තාක් කල් එහි අධ්‍යක්ෂවරුන් විසින් එම විනිමය ස්ථානයේ රීති සහ නියමයන්ට අනුකූලව අඛණ්ඩව කටයුතු කරන බවට වගබලා ගනු ලැබිය යුතු ය.

(2) ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින්, රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලද හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විනිමය ස්ථානයේ රීතිවල නිශ්චිතව දක්වන ලද නිසි සහ සුදුසු උපමානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

90. (1) ස්වකීය කාර්ය සාමාන්‍ය පරිදි ඉටු කිරීමේ දී ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයකුට-

(අ) මේ පනතේ යම් නියමයක් හෝ විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකිරීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකිරීමක් හෝ විනිමය ස්ථානයක යම් රීතියක් කඩකිරීමක් හෝ වංචාව හෝ වංකභාවය හා සම්බන්ධ යම් වරදක්; හෝ

(ආ) ඔහුගේ මතය අනුව ලැයිස්තුගත පොදු සමාගමේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු මට්ටමකට අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් කරුණක්; හෝ

(ඇ) යම් සුරැකුම්පත්හි ආයෝජකයකුගේ අරමුදල්වලට හෝ දේපළවලට බලපාන හෝ එම අරමුදල් හෝ දේපළ අනතුරට හෙළන හෝ එම අරමුදල්වලට හෝ දේපළවලට බලපෑ හැකි හෝ ඒවා අනතුරට හෙළිය හැකි යම් අක්‍රමිකතාවක් ඇතුළු ලැයිස්තුගත පොදු සමාගමක ගිණුම් සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරන හෝ සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි යම් අක්‍රමිකතාවක්,

පිළිබඳව දැන ගැනීමට ලැබුණ අවස්ථාවක, එම විගණකවරයා විසින් වහාම (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් එම කරුණු නිවැරදි කිරීම සඳහා ඒවා පිළිබඳව විගණන කමිටුව වෙත ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු අතර, එතැන් සිට සති දෙකක් ඇතුළත කිසිම නිවැරදි කිරීමේ පියවරක් ගෙන නොමැති නම්, එම කරුණු නිවැරදි කිරීම සඳහා හෝ කඩකිරීමක් තවමත් සිදු වී නොමැති අවස්ථාවක එම කඩකිරීම සිදුවීම වැළැක්වීම සඳහා හෝ එම කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිඛිතව යොමු කරනු ලැබිය යුතු ය.

(2) සති දෙකක් ඇතුළත (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් එම කරුණු නිවැරදි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ කිසිම පියවරක් ගෙන නොමැති නම්, විගණකවරයා විසින්, වහාම එම කරුණු පිළිබඳ ලිඛිත වාර්තාවක් -

(අ) මේ පනතේ යම් නියමයක් හෝ විධිවිධානයක් හෝ ඒ යටතේ නිකුත් කරනු ලබන යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකිරීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකිරීමක් හෝ වංචාව හෝ වංකභාවය සම්බන්ධ යම් වරදක් සම්බන්ධයෙන් වන විට, කොමිෂන් සභාව වෙත; හෝ

(ආ) යම් විනිමය ස්ථානයක රීති කඩකිරීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකිරීමක් සම්බන්ධයෙන් වන විට, අදාළ විනිමය ස්ථානය සහ කොමිෂන් සභාව වෙත,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එකී විගණකවරයා විසින් මේ වගන්තිය යටතේ එකී විගණකවරයාට නියම කරන ලද යම් කාර්යයක් ඉටු කිරීමේ දී සද්භාවයෙන් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් කිසිම විගණකවරයකු යම් අධිකරණයක නඩු පැවරීමකට යටත් නොවිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, විගණනයක් අතරතුර හෝ විගණනයකින් පසු ඕනෑම විටක දී-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ඔහුගේ විගණනයට අදාළව යම් අමතර තොරතුරු ඉදිරිපත් කරන ලෙස;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකින් හෝ යම් ප්‍රමාණයකින් ලැයිස්තුගත පොදු සමාගමේ ව්‍යාපාර සහ කටයුතු සම්බන්ධයෙන් වන ඔහුගේ විගණනයේ විෂයපථය විශාලනය කරන ලෙස හෝ වැඩි කරන ලෙස;

(ඇ) යම් විශේෂිත අවස්ථාවක දී යම් නිශ්චිත විභාගයක් ක්‍රියාවට නංවන ලෙස හෝ යම් කාර්යපටිපාටියක් පිහිටුවන ලෙස; හෝ

(ඈ) (අ) සිට (ඇ) දක්වා ඡේදවල සඳහන් යම් කරුණක් පිළිබඳ අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස,

ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයකුට, නියම කරනු ලැබිය හැකි අතර එකී විගණකවරයා විසින් එකී නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු කාලසීමාව කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(5) විගණකවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයකට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු අතර, මේ වගන්තිය යටතේ ඔහු විසින් ඉටුකරනු ලබන සියලු අමතර කාර්යයන්ට අදාළව කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන අනුප්‍රමාණ අනුව ලැයිස්තුගත පොදු සමාගම විසින් විගණකවරයාට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(6) ලැයිස්තුගත පොදු සමාගම විසින්, මේ වගන්තිය යටතේ විගණකවරයා විසින් ඉටුකරනු ලබන සියලු අමතර කාර්යයන්ට අදාළව විගණකවරයාට අවශ්‍ය වන යම් තොරතුරු සහ එම තොරතුරු සඳහා ප්‍රවේශය ලබා දෙනු ලැබිය යුතු ය.

91. (1) යම් තැනැත්තකු විසින්-

(අ) ලැයිස්තුගත පොදු සමාගමක හෝ එහි සම්බන්ධිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ සැදීමේ; හෝ

(ආ) ලැයිස්තුගත පොදු සමාගමක හෝ එහි සම්බන්ධිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ,

නිරත වන යම් තැනැත්තකුට මූල්‍ය ප්‍රකාශ හෝ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශවල වැදගත් කරුණක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු වීමට හේතු විය හැකි බවට ඔහු දන්නා හෝ සාධාරණ ලෙස දැනගත හැකි විය යුතු වූ යම් දෙයක් කිරීම සඳහා එම තැනැත්තාට බලපෑම් කිරීම, බල කිරීම, එම තැනැත්තා නොමඟ යැවීම හෝ එම තැනැත්තාට බලය පැවරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

2 වන පරිච්ඡේදය

වෙළෙඳපොළ අතරමැදියන්

92. (1) කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව තැනැත්තකු විසින් වෙළෙඳපොළ අතරමැදියකු ලෙස පෙනී සිටිනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

93. (1) වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් තැනැත්තකු විසින්, තත්කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට දී රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

94. (1) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් ලබාගැනීමේ හෝ මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අලුත් කිරීමේ කාර්ය සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකෘතියකට අනුව සහ යම් ලේඛන සහ නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ද සමඟ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සපයන ලෙස; සහ

(ආ) ඉල්ලුම් පත්‍රයේ කරුණු තහවුරු කිරීමට ඉදිරිපත් කරන ලද යම් තොරතුරු, ඉල්ලුම්කරුගේ වියදමින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට අනුව සහ යම් තැනැත්තන් මගින් නිවැරදි දැයි පරීක්ෂා කරන ලෙස,

ඉල්ලුම්කරුවකුට නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, බලපත්‍රයේ වලංගු කාලය ඉකුත්වීමට මාස තුනකට පෙරාතුව නියම කරනු ලැබිය හැකි අලුත් කිරීමේ ගාස්තුවක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රයේ වලංගු කාලය ඉකුත්වීමෙන් පසු බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, බලපත්‍රය අලුත් කිරීම සිදු කරනු ලබන තෙක් ප්‍රමාද වන සෑම දිනයක් සඳහා ම නියම කරනු ලැබිය හැකි බලපත්‍ර දීමේ ගාස්තුවෙන් සියයට පහකට නොවැඩි, ප්‍රමාද ගාස්තුවක් බලපත්‍රය අලුත් කිරීමේ ගාස්තුවට අමතරව පනවනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන යම් කොන්දේසි හෝ පරිසීමාවලට යටත්ව, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම කරනු ලැබිය හැකි ය.

95. (1) වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍රයක් ලබා ගැනීම හෝ එවැනි බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන හේතු කිසිවක් මත එම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය:

(අ) මේ පරිච්ඡේදයට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර නොමැති වීම;

(ආ) ඉල්ලුම්කරු මේ පරිච්ඡේදයේ යම් නියමයකට හෝ ඒ යටතේ සාදන ලද නියෝග සහ රීතිවලට අනුකූලව ක්‍රියාකිරීමට අපොහොසත් වී තිබීම;

(ඇ) ඉල්ලුම්කරු විසින් කොමිෂන් සභාවට සපයන ලද යම් තොරතුරක් හෝ ලේඛනයක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු වීම හෝ ඉන් යම් වැදගත් කරුණක් සැපයීම පැහැර හැර තිබීම;

(ඈ) ඉල්ලුම්කරු ගණන් බේරා වසා දැමීමේ හෝ අන්‍යාකාරයකින් විසුරුවා හැරීමේ ක්‍රියාවලියක පැවතීම හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වීම;

(ඉ) විනිශ්චිත ණයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට එරෙහිව නිකුත් කරන ලද ඇස්කීසි නියෝගයක් අනුව එම ණය සම්පූර්ණයෙන් හෝ එම ණයෙන් කොටසක් ගෙවා තෘප්ත කර ගැනීමට නොහැකිව එය ආපසු එවා තිබීම;

(ඊ) ඉල්ලුම්කරුගේ යම් දේපළකට අදාළව ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඈවරකරුවකු හෝ භාර ගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු හෝ ඒ හා සමාන තැනැත්තකු පත් කරනු ලැබ තිබීම;

(උ) ඉල්ලුම්කරු එහි ණය හිමියන් සමඟ දැනට ක්‍රියාත්මක වන සමථයකට හෝ සමථ යෝජනා ක්‍රමයකට ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී හෝ එළඹ තිබීම;

(ඌ) ඉල්ලුම්කරු හෝ එහි යම් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා, කළමනාකරුවන් හෝ පාලකවරයා-

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වංචාව හෝ වංකභාවය සම්බන්ධයෙන් වන වරදකට වරදකරු කරනු ලැබ තිබීම හෝ එකී වරදට වරදකරු කරනු ලැබීමට ඔහු වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියාකර ඇති බවට වූ තීරණයක් ඇතුළත්ව තිබීම;

(ii) මේ පනත යටතේ යම් පරිපාලනමය දණ්ඩනයකට යටත් වී තිබීම;

(iii) මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සුරැකුම්පත් පාලනය වන නීති යටතේ ඔහු චෝදනා ලැබ ඇත්තේ යම් වරදකට ද එම වරදට වරදකරු කරනු ලැබ තිබීම හෝ එම වරද සම්බන්ධයෙන් සමථයකට පත්ව තිබීම;

(iv) මූල්‍ය සේවාවන් සැපයීමේ හෝ සමාගම් කළමනාකරණයේ නියුතු තැනැත්තන්ගේ වංකභාවය, අශක්නුතාව හෝ අයථා ක්‍රියා හේතුවෙන් ඇති වන මූල්‍ය පාඩුවලින් හෝ නිදහස් කළ හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තන් හේතුවෙන් ඇති වන මූල්‍ය පාඩුවලින් මහජනයා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ පනවන ලද යම් නීතියක් යටතේ සාදන ලද යම් විධිවිධානයක් කඩකර තිබීම; හෝ

(v) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වීම;

(එ) ඉල්ලුම්කරුගේ හෝ එහි යම් අධ්‍යක්ෂවරයකුගේ, ප්‍රධාන විධායක නිලධරයාගේ හෝ පාලකවරයාගේ කීර්තිය, චරිතය, මූල්‍යමය විශ්වසනීයත්වය සහ විශ්වාස කළ හැකි බව සැලකිල්ලට ගැනීමේ දී ඔවුන්ට ගනුදෙනුකරුවන්ගේ උපරිම යහපත උදෙසා ක්‍රියා කිරීමට නොහැකි විය හැකි බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු තිබීම;

(ඒ) ඉල්ලුම්කරුගේ මූල්‍ය තත්ත්වය හෝ ඉල්ලුම්කරුගේ ව්‍යාපාරය සිදු කිරීමට නියමිත ආකාරය පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම;

(ඔ) බලපත්‍රය දැරීමට අදාළව ඉල්ලුම්කරු විසින් කරගෙන යනු ලැබිය හැකි ව්‍යාපාරයේ ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී, ඉල්ලුම්කරුගේ පසුගිය කාර්යසාධන වාර්තාව හෝ විශේෂඥතාව පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම, සහ-

(i) ඉල්ලුම්කරු විසින් හෝ එහි යම් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ පාලකවරයා විසින් අනුචිත ලෙස ව්‍යාපාර කටයුතු සිදු කිරීමට හේතු වීමට; හෝ

(ii) ඉල්ලුම්කරු විසින් ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන ආකාරය පිළිබඳව අවිශ්වාසයක් පිළිබිඹු කිරීමට,

ඉඩ ඇති අවස්ථානුගත කරුණු පැවතීම; හෝ

(ඕ) බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ආයෝජකයන්ගේ සුබසිද්ධීන්ට පටහැනි වන බව කොමිෂන් සභාවේ මතය වීම.

(2) ඉල්ලුම්කරුට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා නොදී, කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

96. යම් වෙළෙඳපොළ අතරමැදියකු කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි හෝ විනිමය ස්ථානයක රීති මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි අවම මූල්‍ය අවශ්‍යතා සපුරා නොමැති නම්, එම වෙළෙඳපොළ අතරමැදියා විසින් කොමිෂන් සභාවේ ලිඛිත කැමැත්ත නොමැතිව මේ පරිච්ඡේදය යටතේ එයට බලපත්‍ර දී ඇත්තේ යම් ව්‍යාපාරයක් කරගෙන යාමට ද එම ව්‍යාපාරය කරගෙන යනු නොලැබිය යුතු ය.

97. (1) කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ අතරමැදියකු සඳහා හෝ වෙළෙඳපොළ අතරමැදියකු වෙනුවෙන් ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කරන්නා වූ යම් තැනැත්තකුට කොමිෂන් සභාවේ ලියාපදිංචි වන ලෙස රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා එම තැනැත්තා ලියාපදිංචි තැනැත්තකු ලෙස හඳුන්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිය බලාපොරොත්තු වීමේ කාර්ය සඳහා, යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් (මෙහි මින් මතු "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා වෙනුවෙන් කොමිෂන් සභාව වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

98. (1) 97 වන වගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස ලියාපදිංචි වී හෝ ලියාපදිංචිය අලුත් කිරීමේ කාර්යය සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, කොමිෂන් සභාව විසින්, රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියකින් සහ යම් ලේඛන සහ නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ද සමඟ කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සපයන ලෙස; සහ

(ආ) ඉල්ලුම් පත්‍රයේ කරුණු තහවුරු කිරීමට ඉදිරිපත් කරන ලද යම් තොරතුරු ඉල්ලුම්කරුගේ වියදමින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයකින් සහ යම් තැනැත්තන් මගින් නිවැරදි දැයි පරීක්ෂා කරන ලෙස,

ඉල්ලුම්කරුවකුට නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචිය අවලංගු වීමට මාස තුනකට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එහි ලියාපදිංචියේ වලංගු කාලය ඉකුත් වීමෙන් පසුව, ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, අලුත් කිරීමේ ගාස්තුවට අමතරව, කොමිෂන් සභාව විසින්, ලියාපදිංචිය අලුත් කිරීම සිදු කරනු ලබන තෙක් ප්‍රමාද වන්නා වූ සෑම දිනයක් සඳහා ම නියම කරනු ලැබිය හැකි ලියාපදිංචි කිරීමේ ගාස්තුවෙන් සියයට පහක් නොඉක්මවන ප්‍රමාද ගාස්තුවක් පනවනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන යම් කොන්දේසි හෝ පරිසීමාවලට යටත්ව, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් ලියාපදිංචියක් ප්‍රදානය කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම කරනු ලැබිය හැකි ය.

99. (1) මේ කොටස යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස ලියාපදිංචිය ප්‍රදානය කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන යම් හේතු කිසිවක් මත එම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි යඃ-

(අ) 98 වන වගන්තියට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර නොතිබීම;

(ආ) ඉල්ලුම්කරු, 98 වන වගන්තියේ යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වී තිබීම;

(ඇ) ඉල්ලුම්කරු විසින් කොමිෂන් සභාවට සපයන ලද යම් තොරතුරක් හෝ ලේඛනයක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු වීම හෝ ඉන් යම් වැදගත් කරුණක් සැපයීම පැහැර හැර තිබීම;

(ඈ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නිදහස් නොකළ බුන්වත් තැනැත්තකු හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තකු වීම;

(ඉ) විනිශ්චිත ණයක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට එරෙහිව නිකුත් කරන ලද ඇස්කීසි නියෝගයක් අනුව එම ණය සම්පූර්ණයෙන් හෝ එම ණයෙන් කොටසක් ගෙවා තෘප්ත කර ගැනීමට නොහැකිව එය ආපසු එවා තිබීම;

(ඊ) ඉල්ලුම්කරු-

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වංචාව හෝ වංකභාවය සම්බන්ධයෙන් වන වරදකට වරදකරු කරනු ලැබ තිබීම හෝ ඔහු වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියාකර ඇති බවට වූ තීරණයක් එකී වරදකරු කරනු ලැබීමට ඇතුළත් වන යම් වරදකට වරදකරු කරනු ලැබ තිබීම;

(ii) මේ පනත යටතේ යම් පරිපාලනමය දණ්ඩනයකට යටත් වී තිබීම;

(iii) මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සුරැකුම්පත් පාලනය වන නීති යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ තිබීම හෝ සමථයකට පැමිණ තිබීම; හෝ

(iv) මූල්‍ය සේවාවන් සැපයීමේ හෝ සමාගම් කළමනාකරණයේ නියුතු තැනැත්තන්ගේ වංකභාවය, අශක්නුතාව හෝ අයථා ක්‍රියා හේතුවෙන් ඇති වන මූල්‍ය පාඩුවලින් හෝ නිදහස් කළ හෝ නිදහස් නොකළ වස්තුභංගත්වයට පත් තැනැත්තන් හේතුවෙන් ඇති වන මූල්‍ය පාඩුවලින් මහජනයා ආරක්ෂා කිරීම සඳහා පනවනු ලැබූ බවට කොමිෂන් සභාවට පෙනී යන්නා වූ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ලිඛිත නීතියක් යටතේ සාදන ලද යම් විධිවිධානයක් කඩකර තිබීම;

(උ) වෙළෙඳපොළ අතරමැදියා සඳහා සහ වෙළෙඳපොළ අතරමැදියා වෙනුවෙන් ඉටු කරනු ලැබිය යුතු කාර්යයන්හි ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී ඉල්ලුම්කරුගේ අධ්‍යාපනික හෝ වෙනත් සුදුසුකම් හෝ පළපුරුද්ද සම්බන්ධයෙන් කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම;

(ඌ) කීර්තිය, චරිතය, මූල්‍යමය විශ්වසනීයත්වය සහ විශ්වාස කළ හැකි බව සැලකිල්ලට ගැනීමේ දී ඉල්ලුම්කරුට ගනුදෙනුකරුවන්ගේ උපරිම යහපත උදෙසා ක්‍රියා කිරීමට නොහැකි විය හැකි බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු තිබීම;

(එ) වෙළෙඳපොළ අතරමැදියා සඳහා සහ වෙළෙඳපොළ අතරමැදියා වෙනුවෙන් ඉටු කරනු ලැබිය යුතු කාර්යයන්ගේ ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී, ඉල්ලුම්කරුගේ අතීත කාර්යසාධන වාර්තාව හෝ විශේෂඥතාව පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම;

(ඒ) ඉල්ලුම්කරු විසින් අවංක ලෙස හෝ සාධාරණ ලෙස කටයුතු කර නොමැති බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු තිබීම; හෝ

(ඔ) ලියාපදිංචිය ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ආයෝජකයන්ගේ සුබසිද්ධීන්ට පටහැනි වන බව කොමිෂන් සභාවේ මතය වීම.

(2) කොමිෂන් සභාව විසින්, කරුණු දැක්වීම සඳහා ඉල්ලුම්කරුට අවස්ථාවක් ලබා දීමෙන් තොරව, ලියාපදිංචිය ප්‍රදානය කිරීම අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

100. කොමිෂන් සභාව විසින්, ඕනෑම අවස්ථාවක දී වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලියාපදිංචි තැනැත්තකුට ලිඛිත දැන්වීමක් ඉදිරිපත් කිරීම මගින් ආයෝජකයින්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය යැයි එය විසින් සලකනු ලබන යම් කොන්දේසියක් හෝ පරිසීමාවක් වෙනස් කිරීම හෝ යම් වැඩිදුර කොන්දේසියක් හෝ පරිසීමාවක් පැනවීම කරනු ලැබිය හැකි ය.

101. (1) මේ කොටස යටතේ ප්‍රදානය කරනු ලැබූ බලපත්‍රයක් එකී බලපත්‍රය නිකුත් කළ දිනයේ සිට මාස දොළහක කාලසීමාවක් දක්වා වලංගු විය යුතු ය.

(2) එම අලුත් කිරීම සිදු නොවූයේ නම්, එම බලපත්‍රයේ කාලය ඉකුත් වන්නා වූ දිනයෙන් ආරම්භ වී මාස දොළහක වැඩිදුර කාලසීමාවක් දක්වා හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දැක්විය හැකි යම් පසු දිනයක් දක්වා මේ කොටස යටතේ අලුත් කරනු ලැබූ යම් බලපත්‍රයක් දිගටම බලාත්මකව පැවතිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව, මාස දොළහකට වැඩි කාලසීමාවක් සඳහා යම් බලපත්‍රයක් අලුත් කරනු ලබන අවස්ථාවක, වෙළෙඳපොළ අතරමැදියා විසින් නියමිත බලපත්‍ර ගාස්තුව කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) සිට (3) දක්වා වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ කොටස යටතේ ලියාපදිංචි තැනැත්තකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචියේ කාලසීමාව සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

102. (1) මේ කොටස යටතේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින්-

(අ) අසත්‍ය හෝ නොමඟ යවන සුලු බව දන්නා හෝ දන්නා බවට සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි යම් ප්‍රකාශයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම හෝ එසේ ඉදිරිපත් කිරීමට සැලැස්වීම; හෝ

(ආ) යම් කරුණක් කොමිෂන් සභාවට ප්‍රකාශ කිරීම පැහැර හැරීම හේතුවෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශය යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් නොමඟ යවන සුලු වන බව දන්නා හෝ දන්නා බවට සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි අවස්ථාවක කොමිෂන් සභාවට එම කරුණ ප්‍රකාශ කිරීම පැහැර හැරීම,

කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩකරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

103. (1) යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක දැනටමත් සපයා ඇති වැදගත් විස්තර වෙනස් කිරීමට යෝජනා කරනු ලබන හෝ එහි නිශ්චිතව දක්වා ඇති විස්තර වෙනස් කරනු ලබන හෝ වෙනස් කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එකී වෙනස් කිරීම හෝ මාරු කිරීම සිදු කිරීමට පෙරාතුව ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දන්වා එහි පූර්ව කැමැත්ත ලබා ගැනීම එකී වෙළෙඳපොළ අතරමැදියාගේ කාර්යය විය යුතු ය.

(2) ලියාපදිංචි තැනැත්තකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක දැනටමත් සපයා ඇති යම් විස්තර වෙනස් කිරීමට යම් ලියාපදිංචි තැනැත්තකු විසින් යෝජනා කරනු ලබන හෝ එහි නිශ්චිතව දක්වා ඇති තත්ත්වය මාරු කිරීමට හෝ වෙනස් කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එකී වෙනස් කිරීම හෝ මාරු කිරීම පිළිබඳව කොමිෂන් සභාව වෙත වහාම දැනුම් දීම එකී ලියාපදිංචි තැනැත්තාගේ සහ එකී ලියාපදිංචි තැනැත්තා ක්‍රියා කරන්නේ හෝ සේවය කරන්නේ යම් වෙළෙඳපොළ අතරමැදියකු සඳහා ද එකී වෙළෙඳපොළ අතරමැදියාගේ කාර්යය විය යුතු ය.

104. කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් එකී තැනැත්තාට එම කටයුත්ත කරගෙන යාමට නිසි ලෙස බලය පවරනු ලැබ ඇත්නම් මිස, යම් තැනැත්තකු විසින් බලපත්‍රලත් වෙළෙඳපොළ අතරමැදියකුගේ ව්‍යාපාරයක් කරගෙන යාමේ දී අනුයෝජිතයකු වශයෙන් කටයුතු කිරීම හෝ තමා විසින් එසේ කටයුතු කරන මෙන් පෙනී සිටීම සිදු කරනු නොලැබිය යුතු ය.

105. (1) (අ) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ යම් ඉල්ලුම් පත්‍රයක් කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි යම් හේතුවක් පවතින බවට;

(ආ) වෙළෙඳපොළ අතරමැදියාගේ බලපත්‍රය සම්බන්ධයෙන් වන යම් කොන්දේසියක් හෝ පරිසීමාවක් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් එකී තැනැත්තාට නිකුත් කරන ලද යම් විධානයක් වෙළෙඳපොළ අතරමැදියා විසින් කඩකර ඇති බවට; හෝ

(ඇ) වෙළෙඳපොළ අතරමැදියා විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඔහුට අනුගම්‍ය වන යම් රීතියක් කඩකර ඇති බවට,

කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, මේ කොටස යටතේ යම් වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව, වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට පෙර, එකී වෙළෙඳපොළ අතරමැදියාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරන ලද අවස්ථාවක, තම බලපත්‍රය වහාම කොමිෂන් සභාව වෙත භාර දීම එම වෙළෙඳපොළ අතරමැදියාගේ කාර්යය විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමෙන්, මේ පනත යටතේ එකී වෙළෙඳපොළ අතරමැදියාට එරෙහිව යම් නඩුවක් පැවරීම හෝ නඩුවක් පවත්වාගෙන යාමට බලපෑමක් හෝ එයට අගතියක් සිදු නොවිය යුතු ය.

(5) පහත දැක්වෙන හේතු මත මේ කොටස යටතේ ලියාපදිංචි තැනැත්තකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචියක් අත්හිටුවීම හෝ අවලංගු කිරීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය:-

(අ) ඔහුගේ ලියාපදිංචිය අහිමි කිරීම සඳහා යම් හේතුවක් පවතින බව පෙනී යාම;

(ආ) ඔහුගේ ලියාපදිංචිය සම්බන්ධයෙන් වන යම් කොන්දේසියක් හෝ පරිසීමාවක් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ඔහු වෙත නිකුත් කරන ලද යම් විධානයක් ලියාපදිංචි තැනැත්තා විසින් කඩකර තිබීම; හෝ

(ඇ) ලියාපදිංචි තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඔහුට අනුගම්‍ය වන යම් රීතියක් කඩකර තිබීම.

(6) මේ වගන්තියේ (2) සිට (4) දක්වා වන උපවගන්තිවල විධිවිධාන මේ කොටස යටතේ ලියාපදිංචි තැනැත්තකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචියක්, අවස්ථාවෝචිත පරිදි, අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් සඳහා සහ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

106. යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින්-

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොමැතිව, තමා වෙළෙඳ සහභාගිකයකු වන්නා වූ විනිමය ස්ථානයෙන් බාහිරව සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම හෝ අන්‍යකාරයකින් ගනුදෙනු කිරීම;

(ආ) කොමිෂන් සභාවේ රීති හෝ වෙළෙඳපොළ ආයතනයක රීති කඩ වන ආකාරයට සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම;

(ඇ) තමා වෙළෙඳ සහභාගිකයකු වන්නා වූ වෙළෙඳපොළ ආයතනයක් විසින් දක්වා ඇති නියමයන්ට පටහැනි ආකාරයට ආන්තික ගිණුමක යම් ගනුදෙනු සිදු කිරීම; හෝ

(ඈ) යම් සුරැකුම්පත් මිලට ගැනීමට හෝ විකිණීමට පෙලඹවීම පිණිස හෝ පෙලඹවීමට තැත් කිරීම පිණිස යම් වංචාකාරී, රවටනසුලු හෝ වෙනත් යම් වංචනික උපක්‍රමයක් නැතහොත් ප්‍රයෝගයක් මගින් යම් ගනුදෙනුවක් සිදු කිරීම,

කරනු නොලැබිය යුතු ය.

107. වෙළෙඳපොළ අතරමැදියකු විසින් ගනුදෙනුකරුගේ ලිඛිත කැමැත්ත නොමැතිව එකී ගනුදෙනුකරුගේ ගිණුමෙහි පවතින යම් සුරැකුම්පත් ණයට දීම හෝ ණයට දීමට කටයුතු සැලැස්වීම කරනු නොලැබිය යුතු අතර, එකී ගනුදෙනුකරුගේ ලිඛිත කැමැත්ත නොමැතිව සමපාර්ශ්වීය ඇපය ලෙස යම් ගනුදෙනුකරුවකුගේ ගිණුමෙහි පවතින සුරැකුම්පත් භාවිතයෙන් ණයට ගැනීම හෝ ණයට ගැනීමට කටයුතු සැලැස්වීම කරනු නොලැබිය යුතු ය.

108. (1) විගණකවරයකු ලෙස ස්වකීය කාර්යය සාමාන්‍ය පරිදි ඉටු කිරීමේ දී මේ පනතේ යම් විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් හෝ ඒවාට අනුකූලව කටයුතු නොකිරීමක් හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක් කඩකිරීමක් හෝ වෙළෙඳපොළ අතරමැදියාගේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු ප්‍රමාණයකට අහිතකර ලෙස බලපානු ලැබිය හැකි යම් කරුණක් පවතින බව වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයකුගේ මතය වේ නම්, එම විගණකවරයා විසින් වෘත්තීය මතයක් දරන්නේ නම් විගණකවරයා විසින් අදාළ කරුණ පිළිබඳ ලිඛිත වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී ලිඛිත වාර්තාවේ පිටපතක්-

(අ) මේ පනතේ යම් විධිවිධානයක්, ඒ යටතේ සාදන ලද නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකරනු ලැබීමක් හෝ ඒවාට අනුකූලව කටයුතු නොකිරීමක් සම්බන්ධයෙන් වන විට හෝ වංචනික බව හෝ වංකභාවය ඇතුළත් වරදක් සම්බන්ධයෙන් වන එම කොමිෂන් සභාවට;

(ආ) වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක් කඩකරනු ලැබීමක් හෝ ඊට අනුකූලව කටයුතු නොකිරීමක් සම්බන්ධයෙන් වන විට, අදාළ වෙළෙඳපොළ ආයතනයට සහ කොමිෂන් සභාවට; හෝ

(ඇ) වෙළෙඳපොළ අතරමැදියාගේ මූල්‍ය තත්ත්වයට සැලකිය යුතු ප්‍රමාණයකට අහිතකර ලෙස බලපානු ලබන වෙනත් යම් අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට අදාළ වෙළඳපොළ ආයතනයට සහ කොමිෂන් සභාවට,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කිසිම විගණකවරයකු, එකී විගණකවරයා විසින් මේ වගන්තිය යටතේ ඔහු වෙත නියම කරන ලද යම් කාර්යයක් ඉටු කිරීමට අදහස් කිරීමේ දී සද්භාවයෙන් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක නඩු පැවරීමකට යටත් නොවිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, විගණනයක් අතරතුර දී හෝ ඉන් පසුව ඕනෑම අවස්ථාවක දී-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි ඔහුගේ විගණනය සම්බන්ධයෙන් යම් අතිරේක තොරතුරු ඉදිරිපත් කරන ලෙස;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකින් හෝ යම් ප්‍රමාණයකින් වෙළෙඳපොළ අතරමැදියාගේ ව්‍යාපාරය සහ කටයුතු සම්බන්ධයෙන් වන ස්වකීය විගණනයේ විෂයපථය විශාලනය කරන ලෙස හෝ දීර්ඝ කරන ලෙස;

(ඇ) යම් නිශ්චිත අවස්ථාවක දී, යම් නිශ්චිත පරීක්ෂණයක් සිදු කරන ලෙස හෝ යම් කාර්ය පටිපාටියක් පිහිටුවන ලෙස; හෝ

(ඈ) (අ) සිට (ඇ) දක්වා වූ ඡේදවල සඳහන් යම් කරුණක් පිළිබඳව අවස්ථාවෝචිත පරිදි, වාර්තාවක් හෝ අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස,

යම් වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයකුට නියම කරනු ලැබිය හැකි අතර, විගණකවරයා විසින් එකී නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු කාලය කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(4) විගණකවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයකට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු අතර, වෙළෙඳපොළ අතරමැදියා විසින් මේ වගන්තිය යටතේ විගණකවරයා විසින් ඉටු කරනු ලබන්නා වූ සියලු අතිරේක කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන අනුප්‍රමාණවලින් විගණකවරයා වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(5) වෙළෙඳපොළ අතරමැදියා විසින්, මේ වගන්තිය යටතේ විගණකවරයකු විසින් ඉටු කරනු ලබන්නා වූ සියලු අතිරේක කාර්ය සම්බන්ධයෙන් විගණකවරයාට අවශ්‍ය වන්නා වූ යම් තොරතුරු සපයනු ලැබීම සහ එම තොරතුරුවලට ප්‍රවේශ වීම සඳහා ඉඩ සලසනු ලැබීම සිදු කරනු ලැබිය යුතු ය.

3 වන පරිච්ඡේදය

ගනුදෙනුකරුවන්ගේ වත්කම් ආරක්ෂා කිරීම

109. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා,-

"ගනුදෙනුකරු" යන්නෙන්, වෙළෙඳපොළ අතරමැදියකු සම්බන්ධයෙන් වන විට, වෙළෙඳපොළ අතරමැදියා වෙළෙඳාම් කරන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද එම තැනැත්තා හෝ සුරැකුම්පත් ගනුදෙනු කිරීම සඳහා වෙළෙඳපොළ අතරමැදියා විසින් උපදෙස් ගනු ලබන්නේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තා අදහස් වේ.

"මුදල් හෝ වෙනත් වත්කම්" යන්නෙන්, වෙළෙඳපොළ අතරමැදියකු විසින් ඒ වෙනුවෙන් එහි ගනුදෙනුකරුට වගකීමට යටත් වන්නා වූ ද එය විසින් එම ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී භාර ගනු ලබන්නා වූ හෝ රඳවා තබා ගනු ලබන්නා වූ මුදල් හෝ එහි තැන්පත් කරනු ලබන්නා වූ වෙනත් යම් වත්කමක් ද ඉන් උපචය වන යම් මුදල් හෝ වෙනත් වත්කම් ද අදහස් වේ.

110. (1) යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් ගනුදෙනුකරුවකුගේ ගිණුමෙන් හෝ ගිණුමට මුදල් හෝ වෙනත් වත්කම් භාරගනු ලබන තාක්දුරට එම වෙළෙඳපොළ අතරමැදියා විසින්-

(අ) එම මුදල් හෝ වෙනත් වත්කම් භාර ගන්නා විට හෝ භාර ගැනීමට පෙර ගනුදෙනුකරු විසින් එකඟ වනු ලැබිය හැකි යම් කාර්යයක් සඳහා පමණක් එම මුදල් හෝ වෙනත් වත්කම් යොදා ගනු ලැබිය යුතු බවට වන පදනමින් එය සිදු කරනු ලැබිය යුතු ය;

(ආ) ගනුදෙනුකරුවකු ගනුදෙනුකරුගේ ගිණුමට භාරගත් මුදල් හෝ වෙනත් වත්කම් එම අර්ථලාභය සඳහා භාරයක් ලෙස දරනු ලැබිය යුතු ය;

(ඇ) ගනුදෙනුකරුවකුගේ ගිණුමට භාරගත් මුදල්, එහි අරමුදල් සමඟ සම්මිශ්‍රණය කිරීම හෝ ගනුදෙනුකරු නොවන වෙනත් යම් තැනැත්තකුගේ යම් ගනුදෙනුවක් සුරක්ෂිත කිරීම සඳහා හෝ එම තැනැත්තාගේ ණය දීර්ඝ කිරීම සඳහා ආන්තිකයක් හෝ ඇපයක් ලෙස එම මුදල් භාවිත කිරීම කරනු නොලැබිය යුතු ය; සහ

(ඈ) මේ කොටසේ විධිවිධානවලට හෝ (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් රීතිවලට අනුකූලව එම ගනුදෙනුකරුගේ මුදල් හෝ වෙනත් වත්කම්වලට අදාළව එක් එක් ගනුදෙනුකරුවකු සඳහා වෙන වෙනම පොත් සටහනක් වාර්තා කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් සිදු කරනු ලබන මුදල් හෝ වෙනත් වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීම ඇතුළුව, (1) වන උපවගන්තියේ වන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ හෝ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතිවල හෝ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලින් හෝ ගිණුම්වලට භාරගත් හෝ වෙළෙඳපොළ අතරමැදියකු වෙත තැන්පත් කරන ලද සියලු මුදල් හෝ වෙනත් වත්කම්-

(අ) එකී වෙළෙඳපොළ අතරමැදියාගේ ණය පියවීම සඳහා යොදවා ගැනීමට සලස්වනු නොලැබිය යුතු ය; සහ

(ආ) එකී වෙළෙඳපොළ අතරමැදියාගේ යම් ණයකට අදාළ යම් අධිකරණ නියෝගයක් හෝ ක්‍රියාවලියක් යටතේ ගෙවනු ලැබීමට හෝ ඇස්කීසි කර ලබා ගැනීමට යටත් වනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය, (3) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් රීතියක් කඩ කරනු ලබන යම් වෙළෙඳපොළ අතරමැදියකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

111. (1) කොමිෂන් සභාව විසින්, ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහ වෙළෙඳපොළ අතරමැදියකුගේ සහ ලියාපදිංචි තැනැත්තකුගේ වෘත්තීය ප්‍රමිතීන් ඉහළ නැංවීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන පරිදි, වෙළෙඳපොළ අතරමැදියකුගේ හෝ ලියාපදිංචි තැනැත්තකුගේ ව්‍යාපාර කටයුතු නියාමනය කිරීම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති කඩකරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

112. (1) යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් එකී ගනුදෙනුකරුට එකී නිර්දේශය ඉදිරිපත් කිරීම සඳහා වෙළෙඳපොළ අතරමැදියාට හෝ ලියාපදිංචි තැනැත්තාට සාධාරණ පදනමක් නොමැති නම්, එකී නිර්දේශය පිළිබඳව විශ්වාසය තබන බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි යම් ගනුදෙනුකරුවකුට සුරැකුම්පත් සම්බන්ධයෙන් යම් නිර්දේශයක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

(2) (අ) ඔහු විසින්, එම නිර්දේශය සුදුසු බවට නිශ්චය කර ගැනීමේ කාර්ය සඳහා, ගනුදෙනුකරුගේ ආයෝජන අරමුණු, මූල්‍ය තත්ත්වය සහ විශේෂ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, සියලු අවස්ථානුගත කරුණුවල දී සාධාරණ වන්නා වූ පරිදි එම නිර්දේශයේ විෂය කරුණ පිළිබඳව සලකා බලා ඒ පිළිබඳව විශ්ලේෂණ හෝ විමර්ශන සිදු කර ඇත්නම්; සහ

(ආ) ඔහු විසින් (අ) ඡේදයේ සඳහන් සලකා බැලීම, විශ්ලේෂණය හෝ විමර්ශනය මත පදනම්ව එම නිර්දේශ කර ඇත්නම්,

මිස, (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, ගනුදෙනුකරුවකුට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලියාපදිංචි තැනැත්තකුට සාධාරණ පදනමක් නොමැත්තේ ය.

113. (1) වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් යම් සුරැකුම්පත් පිළිබඳ නිර්දේශයක් ඉදිරිපත් කරමින් චක්‍රලේඛයක් හෝ ඒ හා සමාන වෙනත් යම් ලිඛිත සන්නිවේදනයක් යවනු ලබන අවස්ථාවක, එකී චක්‍රලේඛය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනය යවනු ලැබූ දිනය වන විට ඔහුට හෝ ඔහුට සම්බන්ධයක් ඇති හෝ ඔහුට බැඳීමක් ඇති යම් තැනැත්තකුට එම සුරැකුම්පත් පිළිබඳව ඇති යම් සම්බන්ධතාවක හෝ එම සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳව ඇති යම් සම්බන්ධතාවක ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක්, ඔහු විසින්, එම චක්‍රලේඛයේ හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයේ ඉතිරි කොටසේ භාවිත කර ඇති අකුරුවලට වඩා අපැහැදිලි නොවන අයුරින් මුද්‍රණය කර චක්‍රලේඛයට හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු (1) වන උපවගන්තිය කඩකිරීමක් සම්බන්ධයෙන් වන වරදකට චෝදනා ලැබූ අවස්ථාවක, එකී චක්‍රලේඛය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනය යවනු ලැබූ අවස්ථාව වන විට-

(අ) ඔහුට සුරැකුම්පත් පිළිබඳ සම්බන්ධතාවක් හෝ සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳ සම්බන්ධතාවක් තිබූ බව; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, සුරැකුම්පත් පිළිබඳ හෝ සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳ සම්බන්ධතාව ඔහුට සම්බන්ධයක් ඇති හෝ ඔහුට බැඳී ඇති තැනැත්තාට තිබූ බව,

ඔහු විසින් නොදැන සිටි බව සහ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ නොහැකි බව ඔප්පු කිරීම එකී වෙළෙඳපොළ අතරමැදියාට හෝ ලියාපදිංචි තැනැත්තාට විත්තිවාචකයක් විය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල කාර්ය සඳහා-

(අ) සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳව යම් තැනැත්තකුට ඇති සම්බන්ධතාව යන්නට, එම සුරැකුම්පත් අත්කර ගැනීමෙන් හෝ බැහැර කිරීමෙන් පසු හෝ එමගින් යම් තැනැත්තකුට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් උපචය වන්නා වූ හෝ උපචය විය හැකි යම් මූල්‍යමය අර්ථලාභයක් හෝ වාසියක් ඇතුළත් වේ;

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තිය සීමා කිරීමක් නොකර, යම් සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකුට එම සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම පිළිබඳව යම් සම්බන්ධතාවක් ඇති බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ඇ) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය නොතකා චක්‍රලේඛය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනය යැවීමට අදාළව, එකී තැනැත්තා සහ වෙනත් තැනැත්තා හවුලේ ක්‍රියා කරන්නේ නම් හෝ අන්‍යාකාරයකින් ඔවුන් දෙදෙනා අතර ඇති කර ගන්නා ලද වැඩපිළිවෙළක් යටතේ හෝ එයට අනුකූලව ක්‍රියා කරන්නේ නම් මිස, යම් තැනැත්තකු වෙනත් තැනැත්තකු සමඟ බැඳීමක් නොමැති විය යුතු ය; නැතහොත් සම්බන්ධයක් නොමැති විය යුතු ය.

(4) වෙළෙඳපොළ අතරමැදියකු විසින් (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ යම් චක්‍රලේඛයක් හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයක් යම් තැනැත්තකුට යවනු ලබන අවස්ථාවක, එකී වෙළෙඳපොළ අතරමැදියා විසින් එකී චක්‍රලේඛයේ හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයේ පිටපතක් එකී චක්‍රලේඛය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනය යැවූ දින සිට අවුරුදු හයක් දක්වා ආරක්ෂා කර තබා ගනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකුට යවන ලද චක්‍රලේඛයක් හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදනයක්, වෙළෙඳපොළ අතරමැදියකුගේ නිලධරයකු විසින් අත්සන් කර ඇත්තේ නම්, එය වෙළෙඳපොළ අතරමැදියා විසින් යවනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය කඩකරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

114. යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින්, මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූලව එම වෙළෙඳපොළ අතරමැදියා හෝ එහි සේවානියුක්තයන් කටයුතු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීමේ කාර්ය සඳහා එහි ව්‍යාපාරයකට ඇති අවදානම අධීක්ෂණය කිරීමට එකී වෙළෙඳපොළ අතරමැදියාට ඉඩ සලස්වන්නා වූ කාර්යපටිපාටි සහ ක්‍රියාවලි පිහිටුවා පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

115. (1) කොමිෂන් සභාව විසින්, වෙළෙඳපොළ අතරමැදියන්ගේ සහ ලියාපදිංචි තැනැත්තන්ගේ නාමලේඛනයක් එය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් හා ආකාරයකින් තබා ගනු ලැබිය යුතු අතර, එය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් එම නාමලේඛනය මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා ඉඩ සලස්වනු ලැබිය යුතු ය.

(2) නාමලේඛනය ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් විය යුතු අතර කොමිෂන් සභාව විසින් සෑම විට දීම එම නාමලේඛනය යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

(3) වෙළෙඳපොළ අතරමැදියා සහ ලියාපදිංචි තැනැත්තා සඳහා වන නාමලේඛනයෙහි-

(අ) වෙළෙඳපොළ අතරමැදියාගේ හෝ ලියාපදිංචි තැනැත්තාගේ නම;

(ආ) වෙළෙඳපොළ අතරමැදියාගේ හෝ ලියාපදිංචි තැනැත්තාගේ ව්‍යාපාරයේ ලිපිනය;

(ඇ) වෙළෙඳපොළ අතරමැදියා විසින් දරනු ලබන බලපත්‍ර වර්ගය හෝ ලියාපදිංචි තැනැත්තා විසින් දරනු ලබන ලියාපදිංචියේ වර්ගය;

(ඈ) වෙළෙඳපොළ අතරමැදියාට බලපත්‍රය ප්‍රදානය කරන ලද දිනය හෝ ලියාපදිංචි තැනැත්තාට ලියාපදිංචිය ප්‍රදානය කරන ලද දිනය;

(ඉ) වෙළෙඳපොළ අතරමැදියා වෙනුවෙන් ක්‍රියාකරන හෝ වෙළෙඳපොළ අතරමැදියා විසින් සේවයෙහි යොදවනු ලබන ලියාපදිංචි තැනැත්තන්ගේ නම්; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් යම් කරුණක්,

අඩංගු විය යුතු ය.

(4) මේ පනත යටතේ වෙළෙඳපොළ අතරමැදියකු විසින් දරනු ලබන බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ අවස්ථාවක හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් දරනු ලබන ලියාපදිංචියක් අවලංගු කරනු ලැබූ හෝ අත්හිටුවනු ලැබූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචි තැනැත්තා සම්බන්ධයෙන් එම නාමලේඛනයට අවශ්‍ය සංශෝධන කරනු ලැබිය හැකි ය.

IV වන කොටස

ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම

116. මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ:-

(අ) දේශීය සහ විදේශීය ආයෝජකයන්ට, ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විනිවිදභාවයෙන් යුතු ආකාරයකින් විකිණීම සහ මිල දී ගැනීම සඳහා පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු මාර්ගයෙන් වේදිකාවක් සැපයීම; සහ

(ආ) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු මාර්ගයෙන් විනිවිදභාවයෙන් යුතු ආකාරයකින් ලැයිස්තුගත නොකළ සුරැකුම්පත්වලට අදාළ තොරතුරු දේශීය සහ විදේශීය ආයෝජකයන්ට හෙළිදරව් කිරීම සඳහා පහසුකම් සැලසීම,

විය යුතු ය.

1 වන පරිච්ඡේදය

පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු පිහිටුවීම

117. එකී තැනැත්තා කොමිෂන් සභාවෙහි ලියාපදිංචි වී ඇත්නම් හෝ කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කිරීමෙන් එකී තැනැත්තා නිදහස් කර ඇත්නම් මිස, යම් තැනැත්තකු වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලෙස කටයුතු කරනු නොලැබිය යුතු ය.

118. (1) 117 වන වගන්තියේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින්, යම් තැනැත්තකු විසින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් නියම සහ කොන්දේසිවලට යටත් ව එම තැනැත්තා පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම හෝ එසේ ලියාපදිංචි කිරීමෙන් එකී තැනැත්තා නිදහස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, 119 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති උපමාන සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු 117 වන වගන්තිය යටතේ වන ලියාපදිංචි කිරීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද යම් නියම සහ කොන්දේසි, කොමිෂන් සභාව විසින්, කලින් කල, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබූව ද, එය නොතකා ආයෝජකයන්ගේ සුබසිද්ධිය උදෙසා එසේ කිරීම අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන විට දී, කොමිෂන් සභාව විසින් එම නිදහස් කිරීම ඉවත් කර එම තැනැත්තාට ලියාපදිංචි වන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

119. (1) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ලේඛන සහ තොරතුරු ද සමඟ රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකෘතියකින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා එකී තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මගින් කොමිෂන් සභාව සෑහීමට පත් වන පරිදි වේදිකාවක් මත සිදු කරන වෙළෙඳාම් පිළිබඳව එකී තැනැත්තාට අත්දැකීම් ඇති බව ඔප්පු කරන ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචිය සඳහා එකී තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මගින් කොමිෂන් සභාව සෑහීමට පත් වන පරිදි එම වේදිකාව මත සිදු කරනු ලබන වෙළෙඳාම් නිෂ්කාශනය කිරීම සහ නිරවුල් කිරීම සඳහා එම වේදිකාව මගින් වැඩපිළිවෙළ යොදා ඇති බව ඔප්පු කරන ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2 වන පරිච්ඡේදය

පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කාර්යභාරය

120. පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කර්තව්‍ය සහ කාර්ය-

(අ) ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීම සහ මිල දී ගැනීම සඳහා වේදිකාවක් සැපයීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධ තොරතුරු දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රජාවට සැපයීම;

(ඇ) එහි වෙළෙඳ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සඳහා සහ නියාමනය කිරීම සඳහා වූ උපමාන සැපයීම;

(ඈ) කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ ස්වභාවයකින් වන යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම; සහ

(ඉ) කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභාවේ අධිකාරි බලය මත ක්‍රියාකරන තැනැත්තකුට, කොමිෂන් සභාවට හෝ එකී තැනැත්තාට සාධාරණව අවශ්‍ය වන යම් සහායක් ලබා දීම,

විය යුතු ය.

121. වේදිකාවක් මත සුරැකුම්පත් මිල දී ගැනීම සහ විකිණීම සිදු කරන යම් තැනැත්තකු එකී වේදිකාව විසින් ඇතුළත් කරගනු ලැබූ වෙළෙඳ සාමාජිකයන් මාර්ගයෙන් ඔවුන්ගේ ඇණවුම් සිදු කරනු ලැබිය යුතු ය.

122. කොමිෂන් සභාව විසින්,-

(අ) වේදිකාවක් මත වෙළෙඳාම් කළ හැකි ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වර්ගය නිශ්චය කිරීම;

(ආ) වෙළෙඳාම් කිරීම පිළිබඳව වේදිකාවකට වාර්තා කළ හැකි නිකුත්කරන්නන් වර්ගය නිශ්චය කිරීම;

(ඇ) වේදිකාව මත වෙළෙඳාම් කළ හැකි ආයෝජකයන් වර්ගය නිශ්චය කිරීම;

(ඈ) වේදිකාව මත වෙළෙඳාම් කළ හැකි වෙළෙඳපොළ සාමාජිකයන් වර්ගය නිශ්චය කිරීම;

(ඉ) වේදිකාවට වෙළෙඳ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම;

(ඊ) වේදිකාව විසින් කරනු ලැබිය යුතු හෙළිදරව් කිරීම් මට්ටම නිශ්චය කිරීම; සහ

(උ) ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වන ව්‍යාපාර කටයුතු පිළිබඳ ප්‍රමිතිය නිශ්චය කිරීම,

සඳහා රීති සෑදීම හෝ කොමිෂන් සභාවේ අනුමතයට යටත්ව එවැනි රීති සාදන ලෙස වෙළෙඳපොළ මෙහෙයුම්කරුට නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

123. (1) (3) වන උපවගන්තියට යටත්ව, ආයෝජකයන්ගේ සුබසිද්ධිය සඳහා හෝ විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් පවත්වාගෙන යාම සඳහා එසේ කිරීම සුදුසු යයි කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එකී දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයක සිට බලාත්මක වන පරිදි, ලිඛිත දැන්වීමක් මගින්, පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීමෙහි එකී ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා වූ හේතු සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කිරීමක් සිදු වුව ද, එය නොතකා,-

(අ) ලියාපදිංචිය අවලංගු කිරීම අදාළ වන පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුගේ මෙහෙයුම් නවතා දැමීමේ; හෝ

(ආ) ආයෝජකයන්ගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීමේ,

කාර්යය සඳහා හෝ කොමිෂන් සභාව විසින් දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි එම ලියාපදිංචිය අවලංගු කිරීමෙන් බලපෑමට ලක් වූ යම් ක්‍රියාකාරකම් එම ලියාපදිංචිය අවලංගු කිරීම බලාත්මක වන දින සිට හෝ ඉන්පසුව අඛණ්ඩව කරගෙන යාමට කොමිෂන් සභාව විසින් එම තැනැත්තාට අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට අවසර ලබා දී ඇති අවස්ථාවක, එම අවසරයට අනුකූලව එහි තම කටයුතු කරගෙන යාම හේතුවෙන්, එම තැනැත්තා මේ පනතේ යම් විධිවිධානයක් කඩ කර ඇති බවට සලකනු නොලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් එකී පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දී ඇත්නම් මිස, කොමිෂන් සභාව විසින්, පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුට අදාළව (1) වන උපවගන්තිය යටතේ වූ එහි බලය ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ කරන ලද යම් ලියාපදිංචිය අවලංගු කිරීමක්-

(අ) එම පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරු විසින් යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වැඩපිළිවෙළකට එළඹෙන ලද්දේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කිරීමට පෙරාතුව වුව ද, (3) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක, ඉන්පසුව වුව ද, එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ වළක්වන පරිදි හෝ ඊට බලපෑම් කරන පරිදි; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ වැඩපිළිවෙළ යටතේ පැන නඟින යම් අයිතිවාසිකමකට, බැඳීමකට හෝ වගකීමකට බලපෑම් කරන පරිදි,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

124. (1) කොමිෂන් සභාව විසින්, කලින් කල, මේ කොටස යටතේ වන පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කාර්ය සාධනය සමාලෝචනය කරනු ලැබිය හැකි ය.

(2) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකුගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමේ දී කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය හැකි ය:-

(අ) වේදිකාවට ආවේණික සංස්ථානික අවදානම;

(ආ) මහජන සුබසිද්ධිය;

(ඇ) වේදිකාවේ ප්‍රමාණය සහ ව්‍යුහය;

(ඈ) වේදිකාව මත වෙළෙඳාම් කරන ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් පන්තිය; සහ

(ඉ) වේදිකාව භාවිත කරන ආයෝජකයන්ගේ සහ සහභාගිකයන්ගේ ස්වභාවය.

(3) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නොදී කොමිෂන් සභාව විසින් (1) වන වගන්තිය යටතේ වන එහි බලතල ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

125. මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරු විසින් සාදනු ලබන යම් වෙළෙඳ වේදිකාවකට අදාළ වන ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධයෙන් වන රීති, ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධයෙන් වන වෙනත් යම් රීති අභිබවා බලපැවැත්විය යුතු ය.

V වන කොටස

වෙළෙඳපොළ විෂමාචාරය

126. මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ විය යුත්තේ, සාධාරණ, විධිමත් සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීමේ අදහස ඇතිව-

(අ) ව්‍යාජ වෙළෙඳාම් කිරීම, වෙළෙඳපොළ මිල ගණන් කෘත්‍රිම ලෙස උස් පහත් කිරීම් සහ සුරැකුම්පත් වංචා ඇතුළු සියලු ආකාරයේ වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම්; සහ

(ආ) අභ්‍යන්තරික තැනැත්තන් විසින් ගනුදෙනු කිරීම,

අධෛර්යමත් කිරීම සහ ඊට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම වන්නේ ය.

127. එහි අන්‍යාකාරයකින් නිශ්චිතව දක්වා ඇත්නම් මිස, මේ කොටස-

(අ) සුරැකුම්පත් සම්බන්ධයෙන් වන විට-

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද හෝ ව්‍යාපාර කටයුතු කරගෙන යන 80 වන වගන්තියට අනුකූලව සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කර ඇති යම් ලැයිස්තුගත පොදු සමාගමක හෝ යම් ලැයිස්තුගත නොකළ සමාගමක සුරැකුම්පත්වලට අදාළව ශ්‍රී ලංකාව තුළ සිදු වන ක්‍රියා හෝ නොකර හැරීම් සඳහා;

(ii) 80 වන වගන්තියට අනුකූලව සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදුකර ඇති ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද හෝ ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් ලැයිස්තුගත පොදු සමාගමක හෝ යම් ලැයිස්තුගත නොකළ සමාගමක සුරැකුම්පත්වලට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන ක්‍රියා හෝ නොකර හැරීම් සඳහා;

(iii) ශ්‍රී ලංකාවෙන් පිටත යම් රජයක් විසින් නිකුත් කරනු ලබන්නා වූ ද, කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක පහසුකම් භාවිත කර වෙළෙඳාම් කරනු ලබන්නා වූ ද, සුරැකුම්පත්වලට අදාළව සිදුවන ක්‍රියා හෝ නොකර හැරීම් සඳහා;

(iv) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවට වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් ඇතිවන ක්‍රියා හෝ නොකර හැරීම සඳහා; සහ

(ආ) ව්‍යුත්පන්න සම්බන්ධයෙන් වන විට-

(i) කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක් මත වෙළෙඳාම් කරන ව්‍යුත්පන්නවලට අදාළව ශ්‍රී ලංකාව තුළ සිදුවන ක්‍රියා; සහ

(ii) කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක් මත වෙළෙඳාම් කරන ව්‍යුත්පන්නවලට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන ක්‍රියා,

සඳහා අදාළ විය යුතු ය.

1 වන පරිච්ඡේදය

තහනම් හැසිරීම්

128. (1) යම් තැනැත්තකු විසින්-

(අ) කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක් මත හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක් මත වෙළෙඳාම් කරන සුරැකුම්පත් සම්බන්ධයෙන් සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදුවන බවට ව්‍යාජ හෝ නොමඟ යවනසුලු පෙනුමක්; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් සුරැකුම්පත් සඳහා වන වෙළෙඳපොළ හෝ එම සුරැකුම්පත්වල මිල සම්බන්ධයෙන් ව්‍යාජ හෝ නොමඟ යවනසුලු පෙනුමක්,

ඇති කිරීම හෝ ඇති කිරීමට සැලැස්වීම හෝ ඇති කිරීමේ අදහසින් වූ යම් දෙයක් කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින්-

(අ) එකී සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් ඇති නොකරන යම් සුරැකුම්පතක් මිල දී ගැනීම හෝ විකිණීම මගින්; හෝ

(ආ) යම් ව්‍යාජ ගනුදෙනුවක් හෝ උපක්‍රමයක් මගින්,

යම් සුරැකුම්පත්වල වෙළෙඳපොළ මිල පවත්වාගෙන යාම, ඉහළ දැමීම හෝ පහත හෙළීම හෝ ඉහළ දැමීමට සැලැස්වීම කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව-

(අ) එකී සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් ඇති නොකරන්නා වූ යම් සුරැකුම්පත් විකිණීමක් හෝ මිල දී ගැනීමක් පිළිබඳ ගනුදෙනුවක් ඍජුවම හෝ අන්‍යාකාරයකින් සිදු කරන, ඊට සහභාගී වන හෝ ඒ හා සම්බන්ධ වන හෝ එම ගනුදෙනුව සිදු කරන; හෝ

(ආ) පෙර සඳහන් මිලට සැලකිය යුතු ලෙස සමාන මිලකට, එම සුරැකුම්පත් එම ප්‍රමාණයම හෝ එම ප්‍රමාණයට සැලකිය යුතු ලෙස සමාන ප්‍රමාණයක් හෝ මිල දී ගැනීම සඳහා අර්පණයක් සිදු කිරීමට ඔහු විසින් වෙනත් තැනැත්තකු සමඟ දුස්සන්ධානගත වී හෝ වෙනත් තැනැත්තකු සමඟ එවැනි දුස්සන්ධානයක් ඇති කර ගැනීමට කටයුතු සලස්වා හෝ ඔහු හා සම්බන්ධ තැනැත්තකු එවැනි අර්පණයක් ඔහු සමඟ සිදු කර ඇති බව හෝ ඔහු සමඟ සිදු කිරීමට කටයුතු සලස්වා ඇති බව දැන දැනම, යම් සුරැකුම්පත් ප්‍රමාණයක් යම් නිශ්චිත මිලකට මිල දී ගැනීම හෝ විකිණීම සඳහා අර්පණයක් සිදු කරන හෝ සිදු කිරීමට කටයුතු සලස්වන,

යම් තැනැත්තකු එම සුරැකුම්පත් සම්බන්ධයෙන් සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදු වන බවට ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඇති කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය කඩ කිරීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී, ඔහු විසින් එම සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ අරමුණ හෝ අරමුණු වූයේ එම සුරැකුම්පත් සඳහා වන වෙළඳපොළ හෝ එම සුරැකුම්පත්වල මිල සම්බන්ධයෙන් ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඇති කිරීමේ අරමුණ නොවූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එය ඔහුට විත්තිවාචකයක් වන්නේ ය.

(5) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකු විසින්-

(අ) ඔහු එම ක්‍රියාව සිදු කළ අරමුණු වූයේ විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක් මත සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදුවන බවට ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඇති කිරීමේ අරමුණ නොවූ බව හෝ ඔහු එම ක්‍රියාව සිදු කළ අරමුණට විනිමය ස්ථානයක සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදුවන බවට ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඇති කිරීමේ අරමුණ ඇතුළත් නොවූ බව; සහ

(ආ) විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක් මත සක්‍රීය වෙළෙඳාම් කිරීමක් සිදු වන බවට ව්‍යාජ හෝ නොමඟ යවන සුලු පෙනුමක් ඔහු විසින් ඇති කරනු ලැබුව ද, නොලැබුව ද, ඔහු නොසැලකිලිවන්තව ක්‍රියා නොකළ බව,

ඔප්පු කිරීම ඔහුට විත්තිවාචකයක් වන්නේ ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකුට හෝ ඔහු හා සම්බන්ධ යම් තැනැත්තකුට එම මිල දී ගැනීමට හෝ විකිණීමට පෙර එම සුරැකුම්පත් පිළිබඳව සම්බන්ධතාවක් තිබුණි නම් ද, එම මිල දී ගැනීමෙන් හෝ විකිණීමෙන් පසුව ද එම සුරැකුම්පත් පිළිබඳව සම්බන්ධතාවක් දිගටම තිබේ නම් ද, එවැනි යම් සුරැකුම්පත් මිල දී ගැනීමක් හෝ විකිණීමක් මගින් එම සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් ඇති නොවන්නේ ය.

(7) (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සුරැකුම්පත් විකිණීමක් හෝ මිල දී ගැනීමක් පිළිබඳ ගනුදෙනුවකට කර ඇති සඳහනට-

(අ) සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වූ අර්පණයක් කිරීම; සහ

(ආ) සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා අර්පණය කරන ලෙස ප්‍රකාශිතව හෝ ව්‍යංගව යම් තැනැත්තකුට ආරාධනය කරන්නා වූ, යම් ආරාධනයක් සිදු කිරීම,

ඇතුළත් වන්නේ ය.

129. (1) එකී සමාගමේ හෝ සම්බන්ධිත සමාගමක සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ බැහැර කිරීමට එකී තැනැත්තා සැබැවින්ම පෙලඹවුණ ද නොවුණ ද වෙනත් යම් තැනැත්තන් ඒ සඳහා පෙලඹවීමේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක වෙළෙඳාම් කරන, එම සමාගමේ සුරැකුම්පත්වල මිල හෝ ප්‍රමාණය කෘත්‍රිම ලෙස-

(අ) ඉහළ නැංවීමේ;

(ආ) අඩු කිරීමේ; හෝ

(ඇ) සවි කිරීමේ, නියම කිරීමේ, පවත්වාගෙන යාමේ හෝ ස්ථාවර කිරීමේ,

බලපෑම ඇති හෝ එම බලපෑම ඇති කිරීමට ඉඩ ඇති ගනුදෙනු වන්නා වූ, යම් සමාගමක සුරැකුම්පත් පිළිබඳ එක් ගනුදෙනුවක් හෝ ඊට වැඩි ගනුදෙනු සංඛ්‍යාවක් යම් තැනැත්තකු විසින් ඍජුව සිදු කිරීම හෝ සිදු කිරීමට, සම්බන්ධ වීම කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක වෙළෙඳාම් කරන, යම් සමාගමක සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවකට කර ඇති සඳහනකට-

(අ) එම සමාගමේ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වූ අර්පණයක් කිරීම; සහ

(ආ) එම සමාගමේ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා අර්පණය කරන ලෙස ප්‍රකාශිතව හෝ ව්‍යංගව යම් තැනැත්තකුට ආරාධනයක් කරන්නා වූ, යම් ආරාධනයක් කිරීම, ඇතුළත් වන්නේ ය.

130. යම් තැනැත්තකු විසින්-

(අ) එකී ප්‍රකාශයේ හෝ තොරතුරේ නිරවද්‍යභාවය පිළිබඳව පරීක්ෂා කිරීමට සාධාරණ සැලකිල්ලක් නොදක්වා; හෝ

(ආ) එකී ප්‍රකාශය හෝ තොරතුර යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවනසුලු බව ඔහු දන්නේ නම් හෝ දැනගත යුතුව තිබූ බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්,

යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවනසුලු වන්නා වූ ද කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක වෙළෙඳාම් කරන සුරැකුම්පත්වල වෙළෙඳපොළ මිල හෝ ප්‍රමාණය ඉහළ නැංවීමේ, අඩු කිරීමේ, පවත්වාගෙන යාමේ හෝ ස්ථාවර කිරීමේ බලපෑම ඇති කිරීමට ඉඩ ඇත්තා වූ ද ප්‍රකාශයක් කිරීම හෝ එවැනි තොරතුරක් බෙදා හැරීම කරනු නොලැබිය යුතු ය.

131. (1) යම් තැනැත්තකු විසින්-

(අ) නොමඟ යවනසුලු, අසත්‍ය හෝ රැවටිලි සහගත බවට තමන් දන්නා ප්‍රකාශයක් කිරීම හෝ පළ කිරීම මගින් හෝ එවැනි අනාවැකියක් සිදු කිරීම මගින්;

(ආ) යම් වැදගත් කරුණු වංක ලෙස සැඟවීමක් මගින්;

(ඇ) නොමඟ යවනසුලු, අසත්‍ය හෝ රැවටිලි සහගත යම් ප්‍රකාශයක් හෝ අනාවැකියක් වංක ලෙස හෝ අන්‍යාකාරයකින් නොසැලකිලිමත්ව කිරීම හෝ පළකිරීම මගින්; හෝ

(ඈ) යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවන සුලු බවට තමන් දන්නා යම් තොරතුරක් යාන්ත්‍රික, විද්‍යුත් හෝ වෙනත් උපකරණයක් මගින් වාර්තාගත කිරීම හෝ ගබඩා කිරීම මගින්,

කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක වෙළෙඳාම් කරන සුරැකුම්පත් වෙළෙඳාම් කිරීමට වෙනත් යම් තැනැත්තකු පෙලඹවීම හෝ පෙලඹවීමට තැත් කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කාර්ය සඳහා, එහි සඳහන් තැනැත්තා විසින්, අදාළ තොරතුර වාර්තාගත කළ හෝ ගබඩා කළ අවස්ථාවේ දී, වෙනත් යම් තැනැත්තකුට එම තොරතුර ලබාගත හැකි බවට විශ්වාස කිරීමට එම තැනැත්තාට කිසිම සාධාරණ හේතුවක් නොතිබුණ බව ඔප්පු කරනු ලැබුවහොත්, එය ඔහුට විත්තිවාචකයක් වන්නේ ය.

132. යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක වෙළෙඳාම් කරන සුරැකුම්පත්වලට දායක වීම, එම සුරැකුම්පත් මිල දී ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් කෙලින්ම හෝ අන්‍යාකාරයකින්-

(අ) වංචා කිරීම සඳහා යම් උපක්‍රමයක්, යෝජනා ක්‍රමයක් හෝ ප්‍රයෝගයක් භාවිත කිරීම;

(ආ) යම් තැනැත්තකුට වංචාවක් හෝ රැවටීමක් සිදු කිරීමක් ලෙස ක්‍රියාත්මක වන හෝ ක්‍රියාත්මක වනු ඇති යම් ක්‍රියාවක, පරිචයක හෝ ව්‍යාපාර කටයුත්තක යෙදීම; හෝ

(ඇ) එකී ප්‍රකාශයේ අසත්‍ය හෝ නොමඟ යවන සුලු ප්‍රකාශයක් බවට පත් කිරීමට හේතු වන්නා වූ වැදගත් කරුණක් සම්බන්ධයෙන් යම් අසත්‍ය ප්‍රකාශයක් කිරීම හෝ යම් ප්‍රකාශයක් තුළ වැදගත් කරුණක් පිළිබඳ හෙළිදරව් කිරීම පැහැර හැරීම,

කරනු නොලැබිය යුතු ය.

2 වන පරිච්ඡේදය

අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම

133. අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පරිච්ඡේදයේ, "තොරතුරු" යන්නට-

(අ) මහජනතාවට දැනගැනීමට සැලැස්වීමට සුදුසු වන තරම් ප්‍රමාණවත් නිශ්චිතභාවයකින් යුතු නොවන්නා වූ, ලැයිස්තුගත පොදු සමාගම්වලට අදාළ තොරතුරු;

(ආ) යම් තැනැත්තකු විසින් ගන්නා ලදැයි කියනු ලබන තීරණවලට අදාළ කරුණු;

(ඇ) (i) වාණිජමය ගනුදෙනු; හෝ

(ii) සුරැකුම්පත් ගනුදෙනු;

සම්බන්ධයෙන් වන සාකච්ඡාවලට හෝ යෝජනාවලට අදාළ කරුණු;

(ඈ) සමාගමක මූල්‍ය කාර්ය සාධනයට අදාළ තොරතුරු;

(ඉ) යම් තැනැත්තකු විසින් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට එළඹීමට යෝජනා කරනු ලබන බවට හෝ එළඹ ඇති බවට හෝ එම සුරැකුම්පත්වලට අදාළව ප්‍රකාශයක් නිකුත් කිරීමට සූදානම්ව ඇති බවට හෝ නිකුත් කිරීමට යෝජනා කරනු ලබන බවට වූ තොරතුරු; සහ

(ඊ) අනාගතයේ දී ක්‍රියාත්මක කළ යුතු බවට තීරණය කර ඇති ලැයිස්තුගත පොදු සමාගමට අදාළ කරුණු,

ඇතුළත් වේ.

134. (1) මේ පරිච්ඡේදයේ, සාමාන්‍යයෙන් ලබාගත හැකි තොරතුරු යන්නෙන්-

(අ) එම තොරතුරු මගින් එහි මිලට හෝ වටිනාකමට බලපෑමක් විය හැකි ආකාරයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන හෝ වෙළෙඳාම් කරන සාධාරණ තැනැත්තකුගේ අවධානය යොමුවන හෝ අවධානය යොමු වීමට නැඹුරු වන ආකාරයකින් පළ කර ඇති හෝ දැනගැනීමට සලස්වා ඇති; සහ

(ආ) එම තොරතුරු දැන ගැනීමට සැලැස්වූ දින සිට එම තොරතුරු යම් තැනැත්තන් අතර බෙදා හැරීම සඳහා සාධාරණ කාලසීමාවක් ගත වී ඇති,

යම් තොරතුරු අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරුවලට එම තොරතුරුවලින් සිදු කරන ලද හෝ ලබාගත් නිගමන හෝ තීරණවලින් සමන්විත වන තොරතුරු ඇතුළත් වේ.

135. මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා, සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති තොරතුරු යන්නෙන්, එකී තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත් වූ විට, සුරැකුම්පත්වල ආයෝජනය කරන සාධාරණ තැනැත්තකුට එකී සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම සිදු කළ යුතු ද නැද්ද යන්න නැතහොත් එම සුරැකුම්පත් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහසින් ගිවිසුමකට එළඹිය යුතු ද නැද්ද යන්න පිළිබඳව තීරණය කිරීම සඳහා බලපෑම් කරන යම් තොරතුරු අදහස් වේ.

136. 137 වන වගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකු විසින් යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදු කිරීමට හෝ නොකර හැරීමට වෙනත් යම් තැනැත්තකු පොලඹවන්නේ නම්, උපදෙස් දෙන්නේ නම්, කැමති කරවා ගන්නේ නම්, දිරිමත් කරන්නේ නම් හෝ මඟපෙන්වන්නේ නම්, එකී මුලින් සඳහන් කරන ලද තැනැත්තා විසින් එකී අනෙක් තැනැත්තා ලවා එකී ක්‍රියාව හෝ නොකර හැරීම සිදු කිරීමට කටයුතු සලස්වනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

137. (1) මේ කොටසේ කාර්යය සඳහා, "අභ්‍යන්තරික තැනැත්තා" යන්නෙන්, එකී තැනැත්තා අදාළ සමාගමට සම්බන්ධ වුව ද සම්බන්ධ නොවුව ද-

(අ) සාමාන්‍යයෙන් ලබා ගත නොහැකි වන්නා වූ ද සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත් වූ විට, එමගින් සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුවන බවට යම් සාධාරණ තැනැත්තකු අපේක්ෂා කරන්නා වූ ද තොරතුරු තම සන්තකයේ ඇති; සහ

(ආ) එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත නොහැකි බව දන්නා හෝ ඒ බව දන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි,

යම් තැනැත්තකු අදහස් වේ.

(2) අභ්‍යන්තරික තැනැත්තකු විසින්, (1) වන උපවගන්තියේ තොරතුරු අදාළ වන යම් සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රධානයා හෝ අනුයෝජිතයා ලෙස-

(අ) එම සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම හෝ එම සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා ගිවිසුමකට හෝ ගනුදෙනුවකට එළඹීම; හෝ

(ආ) එම සුරැකුම්පත් අත් කර ගැනීම හෝ බැහැර කිරීම හෝ එම සුරැකුම්පත් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට හෝ ගනුදෙනුවකට එළඹීම සඳහා ඍජුව හෝ වක්‍රව හෝ කටයුතු සැලැස්වීම,

කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ තොරතුරු අදාළ වන සුරැකුම්පත් යම් විනිමය ස්ථානයක සුරැකුම්පත් වෙළෙඳපොළක හෝ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක වෙළෙඳාම් කිරීම සඳහා අවසර දී ඇති අවස්ථාවක, එකී අනෙක් තැනැත්තා විසින්-

(අ) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු අදාළ වන යම් සුරැකුම්පත් අත් කරගනු, බැහැර කරනු හෝ එම සුරැකුම්පත් අත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට එළඹෙනු ඇති බව හෝ එසේ කිරීමට නැඹුරු වනු ඇති බව; හෝ

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු අදාළ වන යම් සුරැකුම්පත් තුන්වන පාර්ශ්වයක් ලවා අත්කර ගැනීමට, බැහැර කිරීමට හෝ එම සුරැකුම්පත් අත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට එළඹීමට කටයුතු සලස්වනු ඇති බව හෝ එසේ කිරීමට එම තුන්වන පාර්ශ්වයට මඟ පෙන්වනු ඇති බව හෝ එසේ කටයුතු සැලැස්වීමට හෝ මඟ පෙන්වීමට නැඹුරු වනු ඇති බව, එම අභ්‍යන්තරික තැනැත්තා දන්නේ නම් හෝ ඔහු ඒ බව දන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්, එම අභ්‍යන්තරික තැනැත්තා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු ඍජුව හෝ වක්‍රව හෝ වෙනත් යම් තැනැත්තකුට සන්නිවේදනය කිරීම හෝ සන්නිවේදනය කිරීමට සැලැස්වීම කරනු නොලැබිය යුතු ය.

138. (1) මේ පරිච්ඡේදයේ-

(අ) එම සමාගමේ නිලධරයකු-

(i) සන්තකයේ දරා සිටින්නා වූ සහ එම සමාගමේ නිලධරයකු වශයෙන් තම කාර්ය ඉටු කරන අතරතුර දී තම සන්තකයට පත් වූ; හෝ

(ii) ඔහු එම සමාගමේ නිලධරයකු වීම හේතුවෙන් දැන සිටින හෝ දැන සිටිනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි;

(ආ) එම සමාගමේ නිලධරයකු විසින් සන්තකයේ දරා සිටින්නා වූ සහ පළමුවෙන් සඳහන් කළ සමාගමේ සම්බන්ධිත සමාගමක නිලධරයකු වශයෙන් තම කාර්ය ඉටු කරන අතරතුර දී-

(i) එම තොරතුරු සන්තකයේ තබා ගැනීමේ හේතුව මත එම නිලධරයා අභ්‍යන්තරික තැනැත්තකු වන;

(ii) පළමුවෙන් සඳහන් කළ සමාගම විසින් කරනු ලබන සුරැකුම්පත් අත් කර ගැනීම හෝ බැහැර කිරීම සඳහා වන තීරණවලට, ගනුදෙනුවලට හෝ ගිවිසුම්වලට එළඹීමට අදාළ නිලධරයා සම්බන්ධ වී ඇති සහ එම නිලධරයා ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තරික තැනැත්තකු වන හෝ එම සුරැකුම්පත් අත් කර ගැනීම හෝ බැහැර කිරීම සඳහා යම් ගිවිසුමකට එළඹෙන, නැතහොත් 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් අවස්ථානුගත කරුණුවල දී එම සුරැකුම්පත් අත් කර ගැනීම හෝ බැහැර කිරීමට හෝ එසේ කිරීම සඳහා වන ගිවිසුමකට එළඹීමට වෙනත් යම් තැනැත්තකු ලවා කටයුතු සලස්වනු ලබන නැතහොත් එම තොරතුරු සන්නිවේදනය කරනු ලබන; හෝ

(iii) එම තොරතුරු ඇත්ත වශයෙන්ම සන්නිවේදනය නොකළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එම නිලධරයා විසින් එසේ තම තනතුරේ කටයුතු කිරීමේ දී පළමුවෙන් සඳහන් කළ සමාගමේ තවත් නිලධරයකුට එම තොරතුරු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කිරීම සාධාරණ වන අවස්ථාවක තම සන්තකයට පත් වූ,

යම් තොරතුරු යම් සමාගමක් විසින් සන්තකයේ දරනු ලබන ලෙස සලකනු ලබන්නේ ය.

(2) මේ වගන්තියේ "තොරතුරු" යන්නෙන්, සමාගමක් විසින් සන්තකයේ දරනු ලබන ලෙස සලකනු ලබන තොරතුරු අදහස් වන අතර, "අභ්‍යන්තරික තැනැත්තා" යන්නෙන්, එම තොරතුරු සන්තකයෙහි ඇති තැනැත්තකු අදහස් වේ.

(3) ගනුදෙනුවකට හෝ ගිවිසුමකට එළඹීම මගින් 137 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්ති කඩ කළ බවට චෝදනා ලැබූ සමාගමක් විසින්-

(අ) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා වූ තීරණය එම තොරතුරු සන්තකයේ ඇති සමාගමේ නිලධරයකු නොවන වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සමාගම වෙනුවෙන් ගනු ලැබූ බව;

(ආ) එම අවස්ථාවේ දී-

(i) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණය ගැනීමට සම්බන්ධ වූ හෝ එම තීරණය ගනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ගෙන් එක් අයෙකුට එම තොරතුරු සන්නිවේදනය නොකළ බවට;

(ii) එම තොරතුරු සන්තකයේ තිබූ තැනැත්තා විසින් එම තැනැත්තාට එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණය සම්බන්ධයෙන් කිසිදු උපදෙසක් නොදුන් බවට; හෝ

(iii) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණය ගැනීමට එම තොරතුරු සන්තකයේ තිබූ තැනැත්තා සම්බන්ධ නොවන බවට, වගබලා ගන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි වැඩපිළිවෙළවල් එම සමාගම තුළ ක්‍රියාත්මකව තිබුණු බව; සහ

(ඇ) එම තොරතුරු සන්නිවේදනය නොකළ බව, එවැනි කිසිම උපදෙසක් ලබා නොදුන් බව සහ එම තොරතුරු සන්තකයේ දරන තැනැත්තා එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වන තීරණයට සම්බන්ධ නොවූ බව,

ඔප්පු කරනු ලැබුවහොත්, එය එම සමාගමට විත්තිවාචකයක් වන්නේ ය.

139. (1) මේ පරිච්ඡේදයේ-

(අ) එකී හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකුගේ සන්තකයෙහි එම තොරතුරු තිබුණේ නම් සහ එම තොරතුරු එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු වීමේ තත්ත්වය හේතු කොටගෙන වෙනත් හවුල්කරුවකු සන්තකයට පත් වූයේ නම්;

(ආ) එම හවුල් ව්‍යාපාරයේ සේවානියුක්තයකුගේ සන්තකයේ එම තොරතුරු තිබුණේ නම් සහ එම කාර්ය ඉටු කරන අතරතුර දී එම තොරතුරු එම සේවානියුක්තයා සන්තකයට පත් වූයේ නම්; හෝ

(ඇ) එම තොරතුර දන්නා හෝ සන්තකයේ ඇති වෙනත් යම් හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු හේතුවෙන් එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු යම් කරුණක් හෝ දෙයක් දැන සිටින්නේ නම් හෝ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්, පටහැනිව ඔප්පු කළහොත් මිස, එම කරුණ හෝ දෙය එම හවුල් ව්‍යාපාරයේ සියලු හවුල්කරුවන් දන්නා බව හෝ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි බවට උපකල්පනය කරනු ලැබිය හැකි නම්,

එවැනි යම් තොරතුරු හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් සන්තකයේ දරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 137 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්ති කඩ කරමින් ගනුදෙනුවකට එළඹෙනු ලැබූ බවට චෝදනා ලැබූ හවුල් ව්‍යාපාරයක් විසින්-

(අ) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා වූ තීරණය-

(i) එම තොරතුරු සන්තකයේ නොතිබුණු හවුල්කරුවකු; හෝ

(ii) එම තොරතුරු සන්තකයේ නොතිබුණු, එම හවුල් ව්‍යාපාරයේ සේවානියුක්තයකු,

විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ගනු ලැබූ බව;

(ආ) එම අවස්ථාවේ දී-

(i) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා වූ තීරණය ගැනීමට සම්බන්ධ වූ හෝ එම තීරණය ගනු ලැබූ හවුල්කරු හෝ සේවානියුක්තයාට එම තොරතුරු සන්නිවේදනය නොකරන ලද බවට;

(ii) එම තොරතුරු සන්තකයේ තිබූ හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු විසින් එම හවුල්කරුට හෝ සේවානියුක්තයාට එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා වූ තීරණය සම්බන්ධයෙන් කිසිදු උපදෙසක් නොදුන් බවට; හෝ

(iii) එම තොරතුරු සන්තකයේ ඇති හවුල්කරු හෝ සේවානියුක්තයා එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම සඳහා හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණයට සම්බන්ධ නොවන බවට,

වගබලා ගන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි ගිවිසුම් එම හවුල් ව්‍යාපාරය තුළ පැවතුණ බව; සහ

(ඇ) එම තොරතුරු සන්නිවේදනය නොකළ බව, එවැනි කිසිම උපදෙසක් ලබා නොදුන් බව සහ එම තොරතුරු සන්තකයේ දරන හවුල්කරු හෝ සේවානියුක්තයා එම ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම හෝ ඊට සම්බන්ධ වීම සඳහා වූ තීරණය ගැනීමට සම්බන්ධ නොවූ බව,

ඔප්පු කිරීම එම හවුල් ව්‍යාපාරයට විත්තිවාචකයක් වන්නේ ය.

(3) හුදෙක්ම එකී හවුල් ව්‍යාපාරයේ වෙනත් යම් හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු සන්තකයේ ඇති තොරතුරු එකී හවුල්කරු විසින් සන්තකයේ දරනු ලබන බවට සලකනු ලැබීම හේතුවෙන්ම පමණක් එකී හවුල් ව්‍යාපාරය වෙනුවෙන් නොවන ආකාරයකින් එකී උපවගන්තියේ සඳහන් ගනුදෙනුවට හෝ ගිවිසුමට එළඹීම මගින් යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(4) මේ වගන්තියේ "තොරතුරු" යන්නෙන්, එම තොරතුරු සන්තකයේ ඇති එකී හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු හෝ සේවානියුක්තයකු අභ්‍යන්තරික තැනැත්තකු වන අවස්ථාවක දී හවුල් ව්‍යාපාරයක් විසින් සන්තකය දරනු ලබන ලෙස සලකනු ලබන තොරතුරු අදහස් වේ.

140. (1) 137 වන වගන්තියේ (2) උපවගන්තිය-

(අ) ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උපප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත් වීම සම්බන්ධයෙන්; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් ගිවිසුමක තත්කාර්ය සඳහා වූ බැඳීමක් යටතේ සුරැකුම්පත් අත්කර ගැනීම සම්බන්ධයෙන්,

අදාළ නොවිය යුතු ය.

(2) 137 වන වගන්තියේ (3) වන උපවගන්තිය, එකී තැනැත්තා ලවා, හුදෙක්ම-

(අ) එම සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උපප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත් වීමට; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් ගිවිසුමක තත්කාර්ය සඳහා වූ බැඳීමක් යටතේ එම සුරැකුම්පත් අත්පත් කර ගැනීමට,

කටයුතු සැලැස්වීමේ කාර්ය සඳහා පමණක් යම් තැනැත්තකුට යම් සුරැකුම්පත්වලට අදාළ තොරතුරු සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

141. (1) සකස් කිරීම පිළිබඳ යෝජනා ක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම සහ සමාගම් අත්කර ගැනීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සිදු කරනු ලබන සුරැකුම්පත් අත්කර ගැනීමක් හෝ බැහැර කිරීමක් නැතහොත් තොරතුරු සන්නිවේදනය කිරීමක් සඳහා 137 වන වගන්තිය අදාළ නොවිය යුතු ය.

(2) එකී සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීතිවලට අනුකූලව සිදු කරනු ලබන අවස්ථාවක වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමේ කාර්ය සඳහා හෝ වෙළෙඳපොළ ගිවිසුමක් නිරවුල් කිරීමට අදාළව යම් නඩු කටයුත්තකට හෝ වෙනත් යම් ක්‍රියාමාර්ගයකට අදාළව සුරැකුම්පත් අත්කර ගන්නා හෝ බැහැර කරන නිෂ්කාශනාගාරයක් සඳහා 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(3) එකී විනිමය ස්ථානය හෝ මධ්‍යම තැන්පතුගාරය විසින්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක උපදෙසක් මත ක්‍රියාකරන අවස්ථාවක, සුරැකුම්පත් විකිණීමට හෝ මිල දී ගැනීමකට අදාළව එවැනි යම් විනිමය ස්ථානයක් හෝ මධ්‍යම සඳහා 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

142. (1) හුදෙක්ම එම සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට එය විසින් ඇතුළත් වීමට යෝජනා කරනු ලබන බව හෝ එය විසින් කලින් ඇතුළත් වී ඇති බව එකී සමාගම දැනසිටීම හේතුවෙන්ම පමණක්, එකී සමාගමේ සුරැකුම්පත් නොවන වෙනත් යම් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් යම් සමාගමක් විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(2) (3) වන උපවගන්තියට යටත්ව, හුදෙක්ම එම සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඇතුළත් වීමට එකී සමාගම යෝජනා කරන බව හෝ එකී සමාගම කලින් ඇතුළත් වී ඇති බව එකී සමාගමේ නිලධරයකු දැන සිටීම හේතුවෙන්ම පමණක් එකී සමාගමේ සුරැකුම්පත් නොවන වෙනත් යම් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් යම් සමාගමක් විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(3) එකී උපවගන්තියේ සඳහන් කරුණ පිළිබඳව එම සමාගමේ නිලධරයාට ඔහුගේ කාර්ය කරන අතරතුර දී දැන ගැනීමට ලැබුණේ නම් මිස (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(4) (5) වන උපවගන්තියට යටත්ව, හුදෙක්ම එකී සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඇතුළත් වීමට එකී සමාගම යෝජනා කරන බව නැතහොත් එකී සමාගම කලින් ඇතුළත් වී ඇති බව එකී තැනැත්තා දැන සිටීම හේතුවෙන්ම පමණක් යම් සමාගමක සුරැකුම්පත් නොවන වෙනත් යම් සුරැකුම්පත්වලට අදාළව යම් සමාගමක් වෙනුවෙන් ගනුදෙනුවකට හෝ ගිවිසුමට ඇතුළත් වීම මගින් යම් තැනැත්තකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(5) එකී උපවගන්තියේ සඳහන් කරුණු පිළිබඳව එම තැනැත්තාට පළමුව සඳහන් සමාගමේ නිලධරයකු වශයෙන් තම කාර්ය කරන අතරතුර දී නැතහොත් පළමුව සඳහන් සමාගමේ අනුයෝජිතයකු වශයෙන් ක්‍රියා කිරීමේ දී දැන ගැනීමට ලැබුණේ නම් මිස, (4) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

143. හුදෙක්ම එකී, සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඇතුළත් වීමට තමා යෝජනා කරන බව හෝ තමා කලින් ඇතුළත් වී ඇති බව එම පුද්ගලයා දැන සිටීම හේතුවෙන්ම පමණක් එම සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් යම් පුද්ගලයකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

144. (1) (අ) එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වූයේ එකී අනෙක් තැනැත්තාගේ නිශ්චිත උපදෙසක් යටතේ නම් සහ එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වන ලෙස සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය කරගෙන යන එකී වෙළෙඳපොළ අතරමැදියා විසින් හෝ එහි නියෝජිතයා විසින් ඉල්ලා සිටිනු නොලැබුණි නම්; හෝ

(ආ) සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය කරගෙන යන එකී වෙළෙඳපොළ අතරමැදියා හෝ එහි නියෝජිතයා විසින් එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට අදාළව එකී අනෙක් තැනැත්තාට යම් උපදෙසක් ලබා දී නැත්නම් හෝ අන්‍යාකාරයකින් එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වීම සඳහා එකී අනෙක් තැනැත්තාගෙන් උපදෙස් ඉල්ලා නොමැති නම්; සහ

(ඇ) සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය කරගෙන යන එකී වෙළෙඳපොළ අතරමැදියා සමඟ හෝ ඔහුගේ නියෝජිතයා සමඟ එකී අනෙක් තැනැත්තා සම්බන්ධ වී නොමැති නම්,

විනිමය ස්ථානයක සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් ඇතුළත් වූ ගනුදෙනුවක් හෝ ගිවිසුමක් වන්නා වූ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් අනුයෝජිතයකු වශයෙන් ඇතුළත් වීම මගින් ආයෝජකයන් වෙනුවෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය කරගෙන යන යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ එහි නියෝජිතයකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(2) ප්‍රධානයා වශයෙන් ස්වකීය තත්ත්වයෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ වගන්තියේ (1) වන උපවගන්තියට අදාළ වෙළෙඳපොළ අතරමැදියකුගේ වගකීම්වලට මේ වගන්තියේ සඳහන් කිසිවකින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

145. පාදක වූ වත්කම්වල වටිනාකමින් සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ ඒකක අදාළ වන්නා වූ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ බැරකම් අඩු කිරීමෙන් පසු සහ එම සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ ඒකක මිල දී ගැනීම සඳහා වන සාධාරණ ගාස්තුවක් අඩු කිරීමෙන් පසු ඉතිරි වටිනාකම අනුව ප්‍රායෝගිකව හැකි තාක් දුරට සාධාරණ ලෙස ගණනය කළ යුතු බවට භාර ඔප්පුව මගින් නියම කර ඇති මිලකට භාර ඔප්පුවේ අන්තර්ගත හෝ අන්තර්ගත බවට සලකනු ලබන නැවත මිල දී ගැනීමේ ප්‍රතිඥා භාරයකට අනුකූලව සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයකට අදාළ වන භාර ඔප්පුවක් යටතේ භාරකරුවකු විසින් සිදු කරනු ලබන නිදහස් කිරීමක් සම්බන්ධයෙන් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

146. (1) (අ) එම ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත්වීමට පෙර එම තොරතුරු පිළිබඳව එම ගනුදෙනුවට හෝ ගිවිසුමට අදාළ අනෙක් පාර්ශ්වය දැන සිටියේ නම් හෝ සාධාරණ ලෙස දැන සිටිය හැකි වූයේ නම්; සහ

(ආ) (i) එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත් වූ විට ඉන් ඇති වීමට ඉඩ ඇති බලපෑම හේතුවෙන් තමාට හෝ වෙනත් යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම සම්බන්ධයෙන් වන උපලබ්ධි නොවූ ලාභ හෝ උපලබ්ධි නොවූ පාඩු මඟහැරීම ඇතුළු එවැනි යම් ලාභයක් ඔහු ලබා නොගන්නා වූ හෝ එවැනි යම් පාඩුවක් මඟ නොහරින්නා වූ; සහ

(ii) එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත් වූ විට ඉන් ඇති වීමට ඉඩ ඇති බලපෑම හේතුවෙන් තමාට හෝ වෙනත් යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි, යම් ලාභයක් ලබා ගැනීමේ හෝ පාඩුවක් මඟ හැරීමේ යම් අරමුණක් එම සුරැකුම්පත් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අරමුණට ඇතුළත් නොවන්නා වූ,

යම් නියම මත සහ යම් අවස්ථානුගත කරුණු යටතේ එම තැනැත්තා විසින් එම සුරැකුම්පත් අත්කරගනු ලබන්නේ නම් හෝ බැහැර කරනු ලබන්නේ නම්,

එවැනි යම් තැනැත්තකු විසින් 137 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කරනු නොලබන්නේ ය.

(2) 137 වන වගන්තියේ (3) වන උපවගන්තිය කඩ කිරීමකට චෝදනා ලැබූ තැනැත්තකු විසින්-

(අ) හුදෙක්ම 134 වන වගන්තිය ප්‍රකාරව එකී තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි බවට පත්වන ආකාරයකට දැනගැනීමට සැලැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස පමණක් එම තොරතුරු සන්නිවේදනය කරන තැනැත්තාගේ සන්තකයට එම තොරතුරු පත් වූ බව; හෝ

(ආ) එම තොරතුරු සන්නිවේදනය කිරීමට පෙර අනෙක් පාර්ශ්වය එම තොරතුරු දැන සිටි බව හෝ දැන සිටිය යුතු වූ බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි බව,

ඔප්පු කිරීම එම තැනැත්තාට විත්තිවාචකයක් වන්නේ ය.

147. (1) 128 වන, 129 වන, 130 වන, 131 වන, 132 වන හෝ 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩ කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, ඒ සඳහා වරදකරු කරනු ලැබූ විට දී රුපියල් මිලියන දහයකට නොඅඩු දඩයකට හෝ වසර දහයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන වරදක් සිදු කිරීමට අනුබල දෙන හෝ ඒ සඳහා කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්ම එම තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය.

148. මේ කොටස යටතේ සිදු කරන ලද සෑම වරදක් ම මහාධිකරණය විසින් අධිචෝදනා පත්‍රයක් නිකුත් කරනු ලැබූ පසු නඩු විභාග කරනු ලැබිය යුතු ය.

149. මේ කොටස යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන සෑම අපරාධ නඩු කටයුත්තක්ම නීතිපතිවරයා විසින් පවරා මෙහෙයවනු ලැබිය යුතු ය.

150. 137 වන වගන්තිය යටතේ වන වරදක් සඳහා යම් තැනැත්තකුට එරෙහිව 152 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවරනු ලැබූ යම් අපරාධ නඩු කටයුත්තක දී හෝ නඩුකරයක දී, පැවතුණි නම්, 138 වන, 139 වන, 140 වන, 141 වන, 142 වන, 143 වන, 144 වන, 145 වන සහ 146 වන වගන්ති ප්‍රකාරව එකී ක්‍රියාව මගින් 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩකිරීමක් සංස්ථාපනය වීම වළක්වනු ලබනු ඇති වන්නා වූ යම් සිද්ධිමය කරුණු හෝ අවස්ථානුගත කරුණු නොපවතින බව චෝදක පක්ෂය විසින් හෝ කොමිෂන් සභාව විසින් ඔප්පු කිරීමට අවශ්‍ය නොවන්නේ ය.

151. (1) මේ කොටස යටතේ වන 128 වන, 129 වන, 130 වන, 131 වන, 132 වන වගන්ති හෝ 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩ කර ඇති වෙනත් යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය හේතුවෙන් හෝ ඒ මත විශ්වාසය තැබීමෙන් පාඩුවක් හෝ හානියක් විඳින යම් තැනැත්තකු විසින්, එකී අනෙක් තැනැත්තා එම කඩකිරීම සම්බන්ධයෙන් වන වරදකට චෝදනා ලැබ තිබුණ ද නොතිබුණ ද නැතහොත් අපරාධ නඩු කටයුත්තක දී එවැනි කඩ කිරීමක් ඔප්පු කර ඇති වුව ද නැති වුව ද එකී අනෙක් තැනැත්තාට එරෙහිව අධිකරණයක නඩුකරයක් පැවරීම මගින් එම පාඩුවේ හෝ හානියේ වටිනාකමට අදාළ මුදල ආපසු අයකර ගනු ලැබිය හැකි ය.

(2) එම කඩකිරීම සංස්ථාපනය වන ක්‍රියා කලාපය සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක් යටතේ වන යම් වගකීමකට මේ වගන්තිය මගින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

152. (1) යම් තැනැත්තකු විසින් 128 වන, 129 වන, 130 වන, 131 වන, 132 වන වගන්ති හෝ 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩකර ඇති බව කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක සහ එම කඩ කිරීමේ ස්වභාවය සහ ආකාරය, ඉන් වෙළෙඳපොළට ඇතිවන බලපෑම සහ යම් ආයෝජකයකුට ඇති වූ පාඩුවේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන එසේ කිරීමට අවශ්‍ය යැයි කොමිෂන් සභාව සලකන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක සිවිල් නඩුකටයුත්තක් පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවරන ලද නඩු කටයුත්තක දී, එකී තැනැත්තා විසින් 128 වන, 129 වන, 130 වන, 131 වන, 132 වන වගන්ති හෝ 137 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති කඩකර ඇති බවට සම්භව්‍යතා වැඩි බර අනුව අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින්-

(අ) එම තැනැත්තා ලබා ගත් මූල්‍ය ලාභයේ හෝ මඟ හැරි පාඩුවේ දළ වටිනාකම මෙන් තුන් ගුණයකට සමාන මුදලක් කොමිෂන් සභාවට ගෙවන ලෙස; හෝ

(ආ) කඩ කිරීමේ බරපතළකම හෝ බැරෑරුම්කම සැලකිල්ලට ගෙන අධිකරණය විසින් උචිත යයි සලකනු ලබන පරිදි රුපියල් මිලියන දහයකට නොඅඩු වූ ද රුපියල් මිලියන සියයකට නොවැඩි වූ ද මුදලක සිවිල් දඩයක් ගෙවන ලෙස,

එම තැනැත්තාට එරෙහිව ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, (2) වන උපවගන්තියේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අධිකරණය විසින් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ වන නඩු කටයුතු කොමිෂන් සභාව විසින් පැමිණිලිපතක් මගින් පවරනු ලැබිය යුතු වන අතර, පැමිණිලිපතක් ගොනු කිරීම මගින් පවරනු ලබන සාමාන්‍ය නඩුකර සම්බන්ධයෙන් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ අඩංගු විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සඳහා අදාළ විය යුතු ය.

(4) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින්, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි එකී තැනැත්තා ලබාගත් මූල්‍ය ලාභයේ හෝ මඟ හැරි පාඩුවේ දළ වටිනාකම මෙන් තුන්ගුණයකට සමාන මුදලක්, වගකීම පිළිගෙන හෝ නොගෙන, ගෙවීම සඳහා යම් තැනැත්තකු සමඟ කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹීම වළක්වන බවට තේරුම් ගනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වන නඩුකරයක දී හෝ (4) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ආපසු අයකර ගන්නා ලද යම් මුදලක එක් එක් තුනෙන් එකක ප්‍රමාණය-

(අ) එම කඩකිරීම සම්බන්ධයෙන් වන විමර්ශනය සහ නඩු කටයුත්තකට අදාළ සියලු ගාස්තු කොමිෂන් සභාවට ප්‍රතිපූරණය කිරීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය;

(ආ) එම කඩකිරීමේ ප්‍රතිඵලයක් ලෙස පාඩු හෝ හානි විඳ ඇති තැනැත්තන්ට වන්දි ගෙවීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය; සහ

(ඇ) වන්දි අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, එකී එක් එක් තැනැත්තාට බෙදා හැරිය යුතු මුදල හෝ වන්දි ගෙවීමට සුදුසු තැනැත්තන් නිශ්චය කර ගැනීමට හෝ ඔවුන්ට ඒ පිළිබඳ දැනුම් දීමට ඇති අපහසුතාව පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී (ආ) ඡේදයේ සඳහන් තැනැත්තන්ට වන්දි ගෙවීම ප්‍රායෝගික නැති බවට කොමිෂන් සභාව සලකනු ලබන්නේ නම්, කොමිෂන් සභාව විසින්, (ආ) ඡේදයේ සඳහන් තැනැත්තන්ට එම මුදල් බෙදා නොහැරීමට තීරණය කර එම මුදල් කොමිෂන් සභාවේ වන්දි අරමුදලට බැර කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තියේ සඳහන් අධිකරණය විසින් කරන ලද ආඥාවේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත තමා වෙත නියම කරන ලද සිවිල් දඩය හෝ (4) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම ප්‍රකාරව ගෙවිය යුතු මුදල ගෙවීමට එකී තැනැත්තා අපොහොසත් වුවහොත්, කොමිෂන් සභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, එම සිවිල් දණ්ඩනය හෝ මුදල කොමිෂන් සභාවට අයවිය යුතු විනිශ්චිත ණයක් මෙන් සලකා ආපසු අයකර ගනු ලැබිය හැකි ය.

153. 152 වන වගන්තිය යටතේ වන නඩුකරයක් මේ කොටසේ යම් විධිවිධානයක් කඩ කළ දින සිට වසර හයක් ඉකුත් වීමෙන් පසු ආරම්භ කරනු නොලැබිය යුතු ය.

VI වන කොටස

මුදල්

154. මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ:-

(අ) කොමිෂන් සභාවේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා විවිධ අරමුදල් පිහිටුවීම; සහ

(ආ) වෙනත් කිසිම ප්‍රතිකර්මයක් නොමැති ආයෝජකයන්ට සීමිත වන්දි සැපයීමට අරමුදලක් පිහිටුවීම,

විය යුතු ය.

1 වන පරිච්ඡේදය

කොමිෂන් සභාවේ අරමුදල්

155. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව වූ සෙස් බද්දක්, විනිමය ස්ථානයක වාර්තාගත හෝ එහි රීති යටතේ එවැනි ගැනුම්කරුවකු සහ විකුණුම්කරුවකු යන දෙදෙනාම විසින් ඊට දන්වන ලද හෝ සුරැකුම්පත් පිළිබඳ සෑම මිල දී ගැනීමක් හෝ විකිණීමක් සම්බන්ධයෙන් නියම කිරීම, අය කිරීම සහ ගෙවීම කරනු ලැබිය යුතු ය. එකිනෙකට වෙනස් පන්තිවලට අයත් සුරැකුම්පත් සඳහා එකිනෙකට වෙනස් අනුප්‍රමාණ නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ පනවනු ලබන සෙස් බද්ද, වෙනත් යම් නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතු ය.

156. (1) කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන, "සෙස් බදු අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, 155 වන වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් පහත දැක්වෙන කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු ය:-

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම;

(ආ) මේ කොටස යටතේ පිහිටුවනු ලබන වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම;

(ඇ) එහි කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියවා ගැනීම;

(ඈ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාස, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහන යන කාර්ය සඳහා ණය ලබා දීම;

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යෝග්‍යතාව පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවකයන් විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශීය රටක දී නිරත වනු ලබන අධ්‍යයනයන්ට අදාළ වියදම් පියවීම.

(3) සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

157. (1) කොමිෂන් සභාවට, සභාවේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ඒ අරමුදලට,-

(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ වන සියලු පරීක්ෂණ සිදු කිරීමේ දී දරන ලද වියදම් වශයෙන් අය කරගනු ලැබිය හැකි හෝ මේ පනතේ විධිවිධාන යටතේ ගාස්තු වශයෙන් ගෙවන ලද සියලු මුදල් ප්‍රමාණයන්;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ වන කඩකිරීම් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමේ දී හෝ නඩු කටයුතු පැවරීමේ දී දරන ලද වියදම් සඳහා ප්‍රතිපූරණ ලෙස ආපසු අයකර ගනු ලබන යම් මුදල් ප්‍රමාණයන්;

(ඈ) ඒකාබද්ධ අරමුදලෙන්, රජයෙන් හෝ විදේශීය රජයකින්, රජයේ නියෝජ්‍යායතනවලින් සහ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය නියෝජ්‍යායතනවලින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඉ) සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) එහි බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

2 වන පරිච්ඡේදය

ආයෝජකයින්ට වන්දි ලබා දීම සඳහා වන අරමුදල

158. (1) යම් බලපත්‍රලත් කොටස් තැරැව්කරුවකුට හෝ කොටස් වෙළෙන්දකුට තම ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින්, "වන්දි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එම වන්දි අරමුදල-

(අ) පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්,

සමන්විත විය යුතු ය.

(3) වන්දි අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකි ය.

159. (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ සාමාජිකයින් අතරින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ වන්දි කමිටුව සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කමිටුව 162 වන වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම සහ ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු කිරීමක් හෝ ප්‍රදානයක් සම්බන්ධයෙන් කමිටුව විසින් ලබා දෙනු ලබන තීරණයක් මේ පනතේ කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

160. (1) එකී ආයෝජකයා කෙරෙහි වූ ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට යම් බලපත්‍රලත් කොටස් තැරැව්කරුවකුට හෝ කොටස් වෙළෙන්දකුට නොහැකි බවට තීරණය කිරීම හේතු කොටගෙන මූල්‍යමය පාඩුවක් සිදු වී ඇති යම් ආයෝජකයකු විසින්, වන්දි අරමුදලින් වන්දි ලබාදෙන ලෙස ඉල්ලා නියමිත ආකෘතිය අනුව කමිටුව වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) එකී ඉල්ලුම්කරු විසින් වන්දි ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම සනාථ කරනු පිණිස යම් ලේඛනයක් හෝ වෙනත් සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් කලින් කලට යම් ඉල්ලුම්කරුවකුගෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. එම ඉල්ලීමට අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක, කමිටුව විසින් එම ඉල්ලුම්කරුගේ ඉල්ලීම සඳහා අවසර නොදෙනු ලැබිය හැකි ය.

(3) ඕනෑම විටක දී, එසේ කිරීමට අවශ්‍ය යැයි කමිටුව සලකනු ලැබුවහොත්, කමිටුව විසින්, ඉල්ලුම්කරුගේ ඉල්ලීම පිළිබඳව පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි අතර ලිඛිත දැන්වීමක් මගින්, එහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් දිනයක දී හා යම් වේලාවක දී එහි නිශ්චිත සඳහන් යම් ස්ථානයකට පැමිණෙන ලෙස ඉල්ලුම්කරු වෙත දන්වනු ලැබිය යුතු ය. දැන්වීමෙහි සඳහන් දිනයේ දී එකී පරීක්ෂණය සඳහා පෙනී සිටීමට ඒ ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක, කමිටුව විසින්, එම ඉල්ලුම්කරුගේ ඉල්ලීමට අවසර නොදෙනු ලැබිය හැකි ය.

161. (1) ඉල්ලුම්කරුවකු විසින් තම ඉල්ලීම සනාථ කරනු පිණිස ඉදිරිපත් කරන ලද ලේඛන හෝ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව හෝ පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවක දී, එම පරීක්ෂණය අවසන් වූ පසු, කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීම සඳහා අවසර දීම හෝ අවසර නොදීම කරනු ලැබිය හැකි ය.

(2) කමිටුව විසින් යම් ඉල්ලීමකට අවසර දෙනු ලබන අවස්ථාවක, කමිටුව විසින්, ගෙවිය යුතු සීමිත වන්දි ප්‍රමාණය පිළිබඳ තක්සේරුවක් කර ඊට අදාළව ප්‍රදානයක් කරනු ලැබිය යුතු ය. එකී ප්‍රදානය පිළිබඳ දැන්වීම ඉල්ලුම්කරු වෙත ලිඛිතව ලබා දෙනු ලැබිය යුතු ය.

3 වන පරිච්ඡේදය

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

162. එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනෙන් ආරම්භ වන මාස දොළහක කාලසීමාව කොමිෂන් සභාවේ මුදල් වර්ෂය විය යුතු ය.

163. (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

VII වන කොටස

සාමාන්‍ය

164. මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ ලේඛන ඉදිරිපත් කිරීම, තොරතුරු හෙළිදරව් කිරීම, පැමිණිලි නිරාකරණ කමිටුවක් පිහිටුවීම, පරීක්ෂණ සහ විමර්ශන පැවැත්වීම, තොරතුරු බෙදා ගැනීම සහ ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීමට අදාළ මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම වන්නේ ය.

1 වන පරිච්ඡේදය

ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන

165. (1) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තකු විසින්, ලිඛිත දැන්වීමක් මගින්, එකී ලිඛිත දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත යම් බද්දක් පැනවීමට සහ අය කර ගැනීමට අදාළ යම් නීතියක් යටතේ හෙළිදරව් කිරීම හෝ ඉදිරිපත් කිරීම තහනම් කර ඇති යම් තොරතුරක් හෝ ලේඛනයක් හැර එකී දැන්වීමේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද මේ පනත යටතේ එහි බලතල නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හෝ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නා වූ ද යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස හෝ යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත එම දැන්වීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු යම් තැනැත්තකුගේ කාර්යය විය යුතු අතර, එම දැන්වීමට අනුකූලව කටයුතු කිරීමේ දී එම තැනැත්තා විසින් යම් නීතියක් යටතේ ඔහු විසින් එසේ සිදු කිරීම තහනම් වන්නා වූ යම් තොරතුරක් හෙළිදරව් කරන හෝ යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ඉදිරිපත් කරන අවස්ථාවක, එම නීතියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එම හෙළිදරව් කිරීම හෝ ඉදිරිපත් කිරීම එම නීතියේ විධිවිධාන කඩ කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ නිකුත් කළ දැන්වීමකට අනුකූලව කටයුතු කිරීමේ දී සපයන ලද යම් තොරතුරක් හෝ ඉදිරිපත් කරන ලද ලේඛනයක හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක අන්තර්ගතයන්-

(අ) අධිකරණ ආඥාවක් මත;

(ආ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කරන අතුරතුර දී; හෝ

(ඇ) එකී තොරතුර, ලේඛනය හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාව සපයන තැනැත්තාගේ කැමැත්ත ඇතිව,

හැර වෙනත් යම් තැනැත්තකු වෙත පළ කිරීම හෝ සන්නිවේදනය කිරීම කරනු නොලැබිය යුතු ය.

(4) එම තොරතුර, ලේඛනය හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාව සපයන තැනැත්තා මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් විමර්ශනයට භාජනය වෙමින් සිටින අවස්ථාවක (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වූ කැමැත්ත අවශ්‍ය නොවන්නේ ය.

166. (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකු විසින්, මේ පනත යටතේ වූ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණ පැවැත්වීම හෝ විමර්ශන සිදු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (අ) යම් තැනැත්තකු විසින් ආයෝජකයන්ට හෝ සුරැකුම්පත් වෙළෙඳපොළට අහිතකර ආකාරයකින් සුරැකුම්පත් ගනුදෙනු සිදු කරනු ලබන බවට; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ විධානයක් යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ආයෝජකයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කඩ කර තිබෙන බවට,

විශ්වාස කිරීමට කොමිෂන් සභාව සතුව සාධාරණ හේතු පවතින අවස්ථාවක (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තකු විසින්, සාක්ෂි ලබා දීමට හෝ එම විමර්ශනයේ හෝ පරීක්ෂණයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ එම තැනැත්තා සන්තකයේ හෝ ඔහුගේ පාලනයේ ඇති යම් පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට කොමිෂන් සභාව ඉදිරියෙහි හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැනැත්තා ඉදිරියෙහි පෙනී සිටින ලෙස සිතාසි යැවීම සහ කැඳවීම හෝ සිදු කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව ඉදිරියෙහි හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු ඉදිරියෙහි පෙනී සිටින ලෙස සිතාසි නිකුත් කරනු ලැබූ හෝ කැඳවනු ලැබූ යම් තැනැත්තකුගෙන් වාචිකව ප්‍රශ්න අසනු ලැබිය හැකි අතර, එසේ ප්‍රශ්න ඇසීමට ලක් වූ තැනැත්තා විසින් කරනු ලබන යම් ප්‍රකාශයක් ලේඛනගත කරනු ලැබිය හැකි ය. එසේ ලේඛනගත කළ සෑම ප්‍රකාශයක් ම එසේ ප්‍රශ්න ඇසීමට ලක් වූ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එසේ වුව ද, ඊට අත්සන් කිරීමට පෙර, එම ප්‍රකාශය එම තැනැත්තා විසින් කියවනු ලැබිය යුතු අතර, ඔහුට එම ප්‍රකාශය ලියා ඇති භාෂාව තේරුම් ගත නොහැකි නම් ඔහුට තේරුම් ගත හැකි භාෂාවකින් ඔහු වෙත එම ප්‍රකාශය තේරුම් කර දිය යුතු වන අතර ඔහුට එම ප්‍රකාශය පැහැදිලි කිරීමට හෝ ඊට යමක් එකතු කිරීමට නිදහස තිබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබූ තැනැත්තා ඉදිරියේ පෙනී සිටීමට නියම කර ඇති අවස්ථාවක, එසේ කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම හෝ කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් ඔහු වෙත යොමු කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරන ලද තැනැත්තකු විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබූ විට දී, ඔහු සතුව හෝ ඔහුගේ පාලනය යටතේ පවතින යම් පොතක්, ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ඉදිරිපත් කිරීම හෝ කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකුට ඒවායෙහි පිටපත් ලබා ගැනීමට ඉඩදීම ප්‍රතික්ෂේප කරන හෝ කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් අසනු ලබන යම් ප්‍රශ්නයකට දැන දැන ම අසත්‍ය පිළිතුරු ලබා දෙන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(5) (අ) (1) වන උපවගන්තිය යටතේ වන පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින්, අවශ්‍ය පරිදි, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යටතේ පිළිගත් යම් නිලධරයකුට සහ යම් විශේෂඥයකුට, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ එම ව්‍යාපාරයට අදාළව තබා ගැනීමට නියම කර ඇති යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් පරීක්ෂා කර ඒවායේ පිටපත් ලබා ගැනීම සඳහා හෝ එවැනි යම් ඉලෙක්ට්‍රොනික උපකරණයක් තම සන්තකයට ගැනීම සඳහා ද මේ පනත යටතේ වන එහි කාර්ය ඉටු කිරීම සඳහා එම තොරතුරු අවශ්‍ය විය හැකි යැයි විශ්වාස කිරීමට කොමිෂන් සභාවට සාධාරණ හේතු ඇති විට දී, සාක්ෂි රැස් කිරීම සඳහා ඔවුන්ගේ පරිගණක පද්ධතිවලට ප්‍රවේශ වීම සඳහා ද දවසේ සියලු සාධාරණ හෝරාවන්හි දී වෙළෙඳපොළ ආයතනයක හෝ වෙළෙඳපොළ අතරමැදියකුගේ හෝ ලැයිස්තුගත පොදු සමාගමක යම් පරිශ්‍රයකට ඇතුළු වීමට ලිඛිතව බලය දෙනු ලැබිය හැකි ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ වන පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සිදු කිරීමේ කාර්යය සඳහා, එකී බලයලත් තැනැත්තන් විසින් එය (1) වන උපවගන්තිය යටතේ වන සාර්ථක විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සඳහා වන වැදගත් සාක්ෂියක් ලෙස සලකනු ලබන්නේ නම්, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් නිකුත් කරන ලද ආඥාවක් මත, (අ) ඡේදයේ නිශ්චිතව දක්වා නොමැති වෙනත් යම් පරිශ්‍රයකට ප්‍රවේශ වී යම් දේපළක්, පොතක්, ලේඛනයක්, ද්‍රව්‍යයක්, දෙයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ උපකරණයක් හෝ වෙනත් කවර හෝ ආකාරයක දෙයක් පරීක්ෂා කිරීම සහ එම පොතේ, ලේඛනයේ, ද්‍රව්‍යයේ, දෙයෙහි හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවේ හෝ වෙනත් කවර හෝ ආකාරයක දෙයක පිටපත් තහනමට ගැනීම හෝ ඒවා තම සන්තකයට ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

(6) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, (1) වන උපවගන්තිය යටතේ බලයලත් සෑම නිලධරයකු ම සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවලට හෝ ලේඛනවලට අදාළ මේ පනතේ වෙනත් යම් වගන්තියක් යටතේ යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සිදු කිරීම සම්බන්ධයෙන් 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය.

(8) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අවස්ථාවෝචිත පරිදි, විමර්ශනයක් හෝ පරීක්ෂණයක් අතරතුර හෝ පරීක්ෂණයක් සහ විමර්ශනයක් යන දෙකම අතරතුර හෝ රැස් කර ගන්නා ලද තොරතුරු පිළිබඳ සලකා බැලීමේ දී, යම් තැනැත්තකු විසින් V වන කොටස යටතේ වන වරදක් හැර මේ පනත යටතේ වන වෙනත් යම් වරදක් සිදු කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුතු පැවරීමට හෝ මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි වෙනත් යම් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගයක් ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය දෙනු ලැබිය හැකි ය.

(9) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නේ නම්, කොමිෂන් සභාව විසින්, මේ කොටස යටතේ රැස් කරගත් සහ ලබාගත් තොරතුරු වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සුදුසු යම් ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා නීතිපතිවරයාට හෝ වෙනත් යම් අධිකාරියකට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

167. (1) මේ පනතේ, යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් පිළිබඳව ඇති සාධාරණ සැකයක් මත, 165 වන වගන්තිය ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කරමින් පවතින හෝ යම් තැනැත්තකු විමර්ශනයට ලක් කරමින් පවතින ඕනෑම අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්,-

(අ) යම් තැනැත්තකු විසින් පරීක්ෂණයකට හෝ විමර්ශනයකට යටත්වන එම තැනැත්තාගේ වත්කම් හෝ එහි යම් කොටසක් බැහැර කිරීම තහනම් කරමින්; හෝ

(ආ) යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ගනුදෙනුවකට හෝ ගනුදෙනු පන්තියකට එළඹීම තහනම් කරමින්,

(මෙහි මින් මතු "අවුරා තැබීමේ නියෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අවුරා තැබීමේ නියෝගයක්, එම නියෝගය නිකුත් කළ දින සිට වෙළෙඳපොළ දින හතක් ඉක්මවන කාලසීමාවක් දක්වා බල නොපැවැත්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අවුරා තැබීමේ නියෝගයක් නිකුත් කිරීමෙන් පසුව ද, එම අවුරා තැබීමේ නියෝගය බලාත්මකව පවතින කාලසීමාව ඇතුළත ද, කොමිෂන් සභාව විසින්, එම අවුරා තැබීමේ නියෝගය ස්ථිර කරන ලෙස ඉල්ලා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, අවස්ථානුගත කරුණු අනුව එසේ කිරීමට අවශ්‍ය නම්, අගතියට පත් තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු අවශ්‍ය පරිදි, එම නියෝගය දීර්ඝ කරන ලෙස ද ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(4) එම අවුරා තැබීමේ නියෝගය නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, අධිකරණය විසින්, එම අවුරා තැබීමේ නියෝගය ස්ථිර කරනු ලැබිය හැකි අතර, එය දීර්ඝ කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් උචිත යැයි සලකනු ලබන යම් කාලසීමා දක්වා, අධිකරණය විසින්, එම නියෝගය දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(5) (3) වන උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, අධිකරණය විසින්, යම් අවුරා තැබීමේ නියෝගයක් යටතේ ඇති වත්කම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සුදුසු ආඥාවක් කරනු ලැබිය යුතු ය.

168. (1) යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලියාපදිංචි තැනැත්තකු හෝ කොමිෂන් සභාවේ නියාමන විෂයපථය යටතට ගැනෙන වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද වෘත්තීමය විෂමාචාරයකට හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ නිකුත් කරන ලද විධාන කඩකිරීමකට හෝ අදාළව, යම් තැනැත්තකු විසින් සිදු කරන ලද පැමිණිලි විභාග කිරීමට කොමිෂන් සභාව විසින් පැමිණිලි නිරාකරණ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් යථා පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ වන කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යැයි එය හෝ ඔහු විසින් සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණ පවත්වනු ලැබිය හැකි අතර, එම කාර්ය සඳහා, සාක්ෂි දීමට හෝ එම පරීක්ෂණවල කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඔහුගේ සන්තකයේ පවතින හෝ ඔහුගේ පාලනය යටතේ පවතින යම් පොත් හෝ ලේඛන ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකුට පැමිණිලි නිරාකරණ කමිටුව ඉදිරියේ පෙනී සිටින ලෙස සිතාසි යැවීම හෝ කැඳවීම හෝ සිදු කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, එම පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ඊට අදාළ වන සියලු කාරණා සඳහා රීති මගින් සුදුසු ක්‍රියාවලි සහ කාර්යපටිපාටි පිහිටුවනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් ලිඛිත පැමිණිල්ලක් පැමිණිලි නිරාකරණ කමිටුව වෙත ලැබුණ විට දී, පැමිණිලි නිරාකරණ කමිටුව විසින්, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීති කඩකර ඇත් ද යන්න තීරණය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සාක්ෂි පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(5) මේ පනත යටතේ ඇති යම් විධිවිධානයක්, ඒ යටතේ නිකුත් කරන ලද නියෝගයක්, රීතියක් හෝ විධානයක් හෝ යම් වෙළෙඳපොළ ආයතනයක රීති, යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් කඩ කර ඇති බවට පැමිණිලි නිරාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, පැමිණිලි නිරාකරණ කමිටුව විසින්, නිර්දේශයක් ද සමග එම තීරණය කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට හෝ එය විසින් යෝග්‍ය යැයි සලකනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට කොමිෂන් සභාවට අභිමතානුසාරී බලය තිබිය යුතු ය.

(6) කොමිෂන් සභාව විසින්, එම වෙළෙඳපොළ ආයතනයට, වෙළෙඳපොළ අතරමැදියාට, ලැයිස්තුගත පොදු සමාගමට හෝ ලියාපදිංචි තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් තොරව මේ වගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

169. (1) යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු හෝ 81 වන වගන්තියට අනුකූලව සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදුකර ඇති ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලැයිස්තුගත නොකළ සමාගමක් සම්බන්ධයෙන් සිදුකරන වෘත්තීමය සේවාවලට අදාළව අතිරේක සේවා සපයන්නන්ගෙන් තොරතුරු, පැහැදිලි කිරීම් හෝ විස්තර කිරීම් ලබා ගැනීමට කොමිෂන් සභාව හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව සපයන ලද සේවාවන් මගින් ආයෝජකයින්ගේ සුබසිද්ධියට හානියක් ඇති වීමට ඉඩ ඇති බවට කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලෙස එම අතිරේක සේවා සපයන්නාට විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) එසේ කිරීම අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, අතිරේක සේවා සපයන්නන්ගේ කාර්ය සහ බැඳීම් සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා මාර්ගෝපදේශ හෝ රීති සාදනු ලැබිය හැකි ය.

170. කොමිෂන් සභාව විසින්, සුරැකුම්පත් වෙළෙඳපොළවල්වල සුරැකුම්පත්වලට සහ ආයෝජකයන්ට අදාළ නියාමන කර්තව්‍ය පිළිබඳ තොරතුරු බෙදා ගැනීම සම්බන්ධයෙන් වෙනත් යම් සංවිධාන සමග ගිවිසුම්වලට හෝ අවබෝධතා ගිවිසුම්වලට එළඹෙනු ලැබිය හැකි ය.

171. (1) කොමිෂන් සභාව විසින්, ස්වකීය මෙහෙයවීමෙන් හෝ නිසි අධිකරණයක් විසින් නිකුත් කරන ලද ආඥාවක් මත-

(අ) මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද, කොමිෂන් සභාව විසින් තහනමට ගන්නා ලද, රඳවා තබා ගන්නා ලද හෝ තම සන්තකයට ගන්නා ලද යම් දේපළක්, පොතක්, ලේඛනයක්, ද්‍රව්‍යයක්, දෙයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් කවර හෝ ආකාරයකින් වන යම් දෙයක් වෙත ප්‍රවේශ වීම සඳහා සහ ඒවා පරීක්ෂා කිරීම සඳහා යම් පොලිස් නිලධරයකුට හෝ රාජ්‍ය නිලධරයකුට අවසර දෙනු ලැබිය හැකි ය; හෝ

(ආ) එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් තම කාර්ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් සිදු කරන ලද යම් පරීක්ෂණයක් අතරතුර දී, විමර්ශන නිලධරයකු විසින් හෝ කොමිෂන් සභාව විසින් හෝ තහනමට ගන්නා ලද, රඳවා තබා ගන්නා ලද හෝ තම සන්තකයට ගන්නා ලද යම් පොතක, ලේඛනයක හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක හෝ වෙනත් කවර හෝ ආකාරයකින් වන යම් දෙයක පිටපතක් පොලිස් නිලධරයකුට හෝ යම් රාජ්‍ය නිලධරයකුට ලබා දෙනු ලැබිය හැකි ය.

(2) එසේ කිරීම අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින්, සලකනු ලබන විට දී, කොමිෂන් සභාව විසින්-

(අ) යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරියකින් යම් තොරතුරක් හෝ ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ලබා ගැනීම; සහ

(ආ) යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරියක් සමඟ යම් තොරතුරක් හෝ ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් බෙදාගැනීම,

ඇතුළත් විය හැකි යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරියක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා වන නියාමන වැඩපිළිවෙළවල්වලට එළඹෙනු ලැබිය හැකි ය.

(3) එකී විදේශීය අධීක්ෂණ අධිකාරිය විසින් බලාත්මක කරන හෝ පරිපාලනය කරන යම් නියාමන කරුණක් සම්බන්ධයෙන් සහාය ලබා දෙන ලෙස යම් විදේශීය අධීක්ෂණ අධිකාරියක් විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් ලැබුණ විට දී, කොමිෂන් සභාව විසින්, ඒ කාර්ය සඳහා සුදුසු යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් සහායක් එම විදේශීය අධීක්ෂණ අධිකාරිය වෙත ලබා දෙනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ සහාය දිය යුතු ද යන්න තීරණය කිරීමේ දී, කොමිෂන් සභාව විසින්-

(අ) එම විදේශීය අධීක්ෂණ අධිකාරිය වෙත එම සහාය ලබා දීමේ දී දරනු ලබන යම් ගාස්තු සහ වියදම් එම විදේශීය අධීක්ෂණ අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත ගෙවනු ලබන්නේ ද යන්න; සහ

(ආ) කොමිෂන් සභාව විසින් සහාය ලබා ගැනීම සඳහා සිදුකරනු ලබන ඒ හා සමාන ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අන්‍යෝන්‍ය සහායක් ලබා දීමට එම විදේශීය අධීක්ෂණ අධිකාරියට හැකියාව සහ කැමැත්ත තිබේ ද යන්න,

පිළිබඳව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ-

"දේශීය අධීක්ෂණ අධිකාරිය" යන්නෙන්, මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පත්කරනු ලැබූ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, පොලිසිය සහ යම් ලිඛිත නීතියක් යටතේ වන වෙනත් යම් නියාමන අධිකාරියක් අදහස් වේ;

"විදේශීය අධීක්ෂණ අධිකාරිය" යන්නෙන්, මහජන සුබසිද්ධිය උදෙසා එවැනි වැඩපිළිවෙළකට එළඹීම හෝ එවැනි සහායක් ලබා දීම සුදුසු සහ අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නා වූ මේ පනත යටතේ වන කොමිෂන් සභාවේ කර්තව්‍යවලට අනුරූපී කාර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබන යම් විදේශීය අධිකාරියක් හෝ නියාමන කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු හෝ ජාත්‍යන්තර සංවිධානයක් අදහස් වේ; සහ

"රාජ්‍ය නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව මගින් එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

172. (1) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග, රීති හෝ විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක් කඩකිරීම් හෝ සිදු වීමට ඉඩ ඇති කඩකිරීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත තොරතුරු සපයනු ලැබීම හේතුවෙන්, සේවායෝජකයකු විසින්, සේවයේ නියුක්ත යම් තැනැත්තකු සේවයෙන් අස්කිරීම, ඔහුගේ සේවය අවසන් කිරීම, ඔහු තනතුරින් පහතට දැමීම හෝ ඔහුට හිරිහැර සිදු කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත තොරතුරු සැපයීම හේතුවෙන් යම් තැනැත්තකුට එරෙහිව ප්‍රතිහිංසා කරනු ලබන යම් සේවායෝජකයකු, එම සේවායෝජකයාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමෙන් පසු, රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පරිපාලන දණ්ඩනයකට යටත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා, "සේවයේ නියුක්ත යම් තැනැත්තකු" යන්නට, අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු, ප්‍රධාන විධායක නිලධරයකු, ප්‍රධාන මූල්‍ය නිලධරයකු, සමාගම් ලේකම්වරයකු, අභ්‍යන්තර විගණකවරයකු හෝ වෙනත් යම් සේවානියුක්තකයකු ඇතුළත් වන්නේ ය.

(4) මේ පනතේ විධිවිධාන කඩකිරීමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව කොමිෂන් සභාව විසින් සාර්ථක අපරාධ නඩු කටයුත්තක් සිදු කිරීමට හෝ වෙනත් දණ්ඩනයක් දෙනු ලැබීමට හේතු වන යම් තොරතුරක් මුලින්ම සපයනු ලබන යම් ආයතනවල අකටයුතුකම් දැනුම්දෙන්නකු වෙත ඒ සම්බන්ධයෙන් සාදනු ලබන නීති ප්‍රකාරව කොමිෂන් සභාව විසින් යම් ත්‍යාගයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

173. අමාත්‍යවරයා විසින්, කලින් කලට, ඔහු විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකට අනුව, වාර්තා, ගිණුම් සහ කොමිෂන් සභාවේ වැඩකටයුතු සම්බන්ධයෙන් වන වෙනත් තොරතුරු තමා වෙත සපයන ලෙස කොමිෂන් සභාව වෙත ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව විසින්, එකී තොරතුරු සැපයීම මගින්-

(අ) පනත යටතේ සිදු කරමින් පවතින විමර්ශනයකට දැඩි අගතියක් සිදු වනු ඇති බවට;

(ආ) පනත යටතේ වන යම් වරදක් වැළැක්වීමට හෝ හඳුනාගැනීමට දැඩි අගතියක් සිදු වනු ඇති බවට; හෝ

(ඇ) පනත යටතේ කොමිෂන් සභාව විසින් සිදු කරමින් පවතින යම් පරීක්ෂණ හෝ විමර්ශනවලට අදාළ යම් රහසිගත තොරතුරු මූලාශ්‍රයක අනන්‍යතාව හෙළි වනු ඇති බවට,

වූ හේතු මත කොමිෂන් සභාව විසින් රහසිගත යැයි සලකනු ලබන යම් තොරතුරු හැර එකී අනෙකුත් තොරතුරු අමාත්‍යවරයා වෙත සපයනු ලැබිය හැකි ය.

174. (1) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානයක් මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් වෙනුවෙන් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට එරෙහිව හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකුට එරෙහිව හෝ කිසිදු සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව ගෙන එන ලද ඕනෑම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කොමිෂන් සභාව වෙත ගෙවනු ලබන හෝ කොමිෂන් සභාව විසින් ආපසු අය කර ගනු ලබන වියදම් කොමිෂන් සභාවේ අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානයක් මත සිදු කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට එරෙහිව ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඔහු විසින් දරනු ලබන වියදම්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, එම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තේ දී එම වියදම් ඔහු විසින් ආපසු අය කර ගනු ලැබ ඇත්නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

2 වන පරිච්ඡේදය

දඬුවම් සහ බලාත්මක කිරීමේ යාන්ත්‍රණවලට අදාළ විධිවිධාන

175. (1) V වන කොටස යටතේ වන වැරදි හැර-

(අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනතේ විධිවිධාන යටතේ නියම කරනු ලබන යම් නියමයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ විධානයක් කඩ කරනු ලබන;

(ආ) මේ පනතේ හෝ මේ පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් රීතියක් හෝ විධානයක් යටතේ නියම කරන ලද යම් නියමයක කාර්ය සඳහා, ඔහු දන්නා තරමට අසත්‍ය, වැරදි හෝ නොමඟ යවන සුලු කරුණු ඇතුළත් යම් තොරතුරක් හෝ යම් වාර්තාවක්, ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ ප්‍රකාශයක් සපයනු ලබන හෝ ඉදිරිපත් කරනු ලබන;

(ඇ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට හෝ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වන ස්වකීය කාර්ය ඉටු කරන අතරතුර දී කොමිෂන් සභාව විසින් යම් ගිවිසුමකට එළඹ ඇත්තේ යම් තැනැත්තකු සමඟ ද එම තැනැත්තාට තර්ජනය කරනු ලබන හෝ ඔහු බිය ගන්වනු ලබන හෝ ඔහුට හිතාමතාම බාධා කරනු ලබන හෝ ඔහු අපකීර්තියට පත් කිරීමේ හෝ ඔහුට අපහාස කිරීමේ අදහස ඇතිව අවනම්බු සහගත ප්‍රකාශ සිදු කරනු ලබන සහ යම් ප්‍රකාශයක් පළ කරනු ලබන;

(ඈ) වෙළෙඳපොළ ආයතනයක, වෙළෙඳපොළ අතරමැදියකුගේ හෝ ලැයිස්තුගත පොදු සමාගමක හෝ එහි යම් සම්බන්ධිත සමාගමක ව්‍යාපාර කටයුතුවලට අදාළ යම් තොරතුරක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් යම් ආකාරයකින් වංචනික ලෙස වෙනස් කරනු ලබන හෝ එවැනි යම් පොතක හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක නොමඟ යවන සුලු හෝ අසත්‍ය තොරතුරු ගබඩා කරනු ලබන; හෝ

(ඉ) යම් තැනැත්තකුට වංචා කිරීමේ හෝ මේ පනත යටතේ වන යම් බලයක් ක්‍රියාත්මක කිරීම වැළැක්වීමේ, ප්‍රමාද කිරීමේ හෝ ඊට බාධා කිරීමේ අදහස ඇතිව මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ තබා ගැනීමට හෝ පවත්වාගෙන යාමට නියම කරනු ලැබ ඇති යම් පොතක් හෝ ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ ගිණුම් විනාශ කරනු ලබන, සඟවනු ලබන, විකෘති කරනු ලබන, වෙනස් කරනු ලබන, යවනු ලබන හෝ යැවීමට තැත් කරනු ලබන හෝ එහි පරිශ්‍රයෙන් ඉවත් කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීමට වෙනත් යම් තැනැත්තකු සමඟ කුමන්ත්‍රණ කරනු ලබන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) මෙහි (1) වන උපවගන්තියේ සඳහන් වරදක් සිදු කිරීමට අනුබල දෙන හෝ කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, එම වරදට (1) වන උපවගන්තිය යටතේ වන වරදකට දඬුවම් කරනු ලබන ආකාරයෙන් ම ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

(3) V වන කොටසේ වැරදි හැර මේ පනත යටතේ වන අනෙකුත් සියලු වැරදි මහෙස්ත්‍රාත් අධිකරණයක දී නඩු විභාග කරනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ කිසිදු දණ්ඩනයක් ප්‍රකාශිතව සලස්වා නොමැති මේ පනත යටතේ වන වරදකට වරදකරු වූ යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයකට නොඅඩු වූ ද රුපියල් මිලියන සියයකට නොවැඩි වූ ද දඩයකට හෝ වසර දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) මේ පනත යටතේ වන යම් වරදක් සංස්ථාවක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක, එම වරද ඔහුගේ දැනීමෙන් හෝ වරදට ඉඩ හැරීමෙන් තොරව සිදු කළ බව හෝ ඔහුගේ කාර්යයන්හි ස්වභාවය සහ එම සිද්ධියේ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ඔහු විසින් ක්‍රියා කරනු ලැබිය යුතුව තිබූ පරිදි ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය සියලු නිසි උද්යෝගයෙන් ඔහු විසින් කටයුතු කරනු ලැබූ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, එම වරද සිදුකළ අවස්ථාවේ දී එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ඒ හා සමාන වෙනත් යම් නිලධරයකු වන යම් තැනැත්තකු එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

176. (1) මේ පනත යටතේ සිදු කරනු ලබන සියලු අපරාධ නඩු කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ විය යුතු අතර, V වන කොටස යටතේ වන වැරදි සම්බන්ධයෙන් හැර, කොමිෂන් සභාව වෙනුවෙන් වන නඩු කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වන අපරාධ නඩු කටයුතු සහ සිවිල් නඩු කටයුතුවල දී, ඉලෙක්ට්‍රොනික වාර්තාවල හෝ අනෙකුත් ලේඛනවල සාක්ෂි අවශ්‍යතාව සඳහා සහ ඒ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

177. මේ පනතේ V වන කොටසේ ලැයිස්තුගත කර ඇති වැරදි හැර, කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ වන වරද සිදු කරන ලද අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, එවැනි වරදකට නියම කරනු ලැබිය හැකි උපරිම දඩයෙන් භාගයක් නොඉක්මවන මුදලකට එම වරද සමථයකට පත් කරනු ලැබිය හැකි අතර, මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීමේ දී කොමිෂන් සභාව වෙත ලැබෙන සියලු මුදල් කොමිෂන් සභාවේ චන්දි අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

178. (1) V වන කොටස යටතේ වන වැරදි සම්බන්ධයෙන් හැර, යම් තැනැත්තකු විසින්-

(අ) මේ පනතේ යම් විධිවිධානයක් කඩ කරනු ලැබුවහොත් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ නීති උල්ලංඝනය කිරීමක් සිදු කරනු ලැබුවහොත්;

(ආ) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක ලියාපදිංචියක යම් නියමයක් හෝ පරිසීමාවක් කඩ කරනු ලැබුවහොත් හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්;

(ඇ) වෙළෙඳපොළ ආයතනයක රීතිවල යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්; හෝ

(ඈ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් ලිඛිත දැන්වීමකට, මාර්ගෝපදේශයකට, විධානයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්,

(1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් කඩ කිරීමේ, අනුකූලව කටයුතු නොකිරීමේ හෝ උල්ලංඝනය කිරීමේ ස්වභාවය සහ ආකාරය සහ එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය කිරීම මගින් වෙළෙඳපොළට ඇති වන බලපෑම සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින්, පහත දැක්වෙන පරිපාලනමය ක්‍රියාමාර්ග එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගනු ලැබිය හැකි ය:-

(i) එම කඩ කිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට එම විධිවිධාන, නියෝග, රීති, ලිඛිත දැන්වීම, කොන්දේසිය, විධානය හෝ මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කිරීම, ඒවා අනුගමනය කිරීම, බලාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කරන ලෙස විධාන කිරීම;

(ii) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට එම කඩකිරීමේ, අනුකූලව කටයුතු නොකිරීමේ හෝ උල්ලංඝනයේ බරපතළකම හෝ බැරෑරුම්කමට අනුපාතික වන පරිදි එහෙත් කිසිදු අවස්ථාවක දී රුපියල් මිලියන පනහක් නොඉක්මවන දඩයක් නියම කිරීම;

(iii) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට තරයේ අවවාද කිරීම;

(iv) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට, එම කඩකිරීමෙන්, අනුකූලව කටයුතු නොකිරීමෙන් හෝ උල්ලංඝනයෙන්, අගතියට පත් වෙනත් යම් තැනැත්තකුට ප්‍රතිෂ්ඨාපනයක් සිදු කිරීම ඇතුළුව එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනයට පිළියම් යෙදීම සඳහා හෝ එම කඩ කිරීමේ, අනුකූලව කටයුතු නොකිරීමේ හෝ උල්ලංඝනයේ බලපෑම අවම කිරීම සඳහා කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබිය හැකි යම් පියවර ගන්නා ලෙස නියම කිරීම;

(v) ලැයිස්තුගත පොදු සමාගමක ප්‍රවර්ධකයෙක් හෝ අධ්‍යක්ෂවරයෙක් සම්බන්ධයෙන් වන විට, (i) සිට (iv) දක්වා වූ ඡේද යටතේ ගත හැකි ක්‍රියාමාර්ගවලට අමතරව, කොමිෂන් සභාව විසින්, ප්‍රවර්ධකයා හෝ අධ්‍යක්ෂවරයා හෝ ප්‍රවර්ධකයා හෝ අධ්‍යක්ෂවරයා හා සම්බන්ධ යම් තැනැත්තකු විසින්, ලැයිස්තුගත පොදු සමාගමේ සුරැකුම්පත් හෝ කොමිෂන් සභාව විසින් යෝග්‍ය යයි සිතනු ලබන වෙනත් යම් සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම හෝ ගනුදෙනු කිරීම සඳහා විලම්භන කාලයක් නියම කිරීම හෝ තහනම් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් තොරව, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (iv) වන ඡේදයේ කාර්ය සඳහා කඩකිරීමක්, අනුකූලව කටයුතු නොකිරීමක් හෝ උල්ලංඝනයක් කළ තැනැත්තකු විසින් ප්‍රතිෂ්ඨාපනයක් සිදු කළ යුතු ද නැද්ද යන්න තීරණය කිරීමේ දී, කොමිෂන් සභාව විසින්,-

(අ) එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තා වෙත උපචිත වී ඇති ලාභ; හෝ

(ආ) එම කඩකිරීමේ, අනුකූලව කටයුතු නොකිරීමේ හෝ උල්ලංඝනයේ ප්‍රතිඵලයක් ලෙස එක් තැනැත්තකුට හෝ ඊට වැඩි තැනැත්තන් ප්‍රමාණයකට පාඩුවක් සිදු වී හෝ අන්‍යාකාරයකින් අහිතකර ලෙස බලපෑමට ලක්වී ඇත් ද යන්න,

සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(4) වෙළෙඳපොළ ආයතනයක රීති යටතේ යම් තැනැත්තකුට එරෙහිව කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු ලබන අවස්ථාවක දී, එය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගය පිළිබඳව, කොමිෂන් සභාව විසින්, එම වෙළෙඳපොළ ආයතනය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින්, කොමිෂන් සභාව විසින්-

(අ) දඩයක් නියම කිරීම ඇතුළුව, වෙළෙඳපොළ ආයතනයේ රීති කඩකිරීම, ඊට අනුකූලව කටයුතු නොකිරීම, එම රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් එහි වෙළෙඳ සහභාගිකයන්ට, නිෂ්කාශන සාමාජිකයන්ට හෝ තැන්පතුගාර සහභාගිකයන්ට, ලැයිස්තුගත පොදු සමාගමකට සහ ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරයකුට එරෙහිව යම් විනය ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස යම් වෙළෙඳපොළ ආයතනයකට විධාන කරනු ලැබීම; හෝ

(ආ) කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තාට එරෙහිව මේ පනත යටතේ ගැනීමට බලය ලබා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබීම,

වළක්වනු නොලැබිය යුතු ය.

(6) (අ) (1) වන උපවගන්තියේ (ii) වන ඡේදය යටතේ වන යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එකී තීරණය ලැබීමෙන් පසු දින දහහතරක් ඇතුළත, අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) වන ඡේදය යටතේ අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම නොතකා, කොමිෂන් සභාව විසින් පනවන ලද පරිපාලන දණ්ඩනයක් අමාත්‍යවරයා සිය තීරණය කරනු ලබන තෙක් වලංගුව පැවතිය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ අභියාචනයක් කර ඇති අවස්ථාවක අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව සහ (අ) ඡේදය යටතේ අභියාචනය ඉදිරිපත් කර ඇති තැනැත්තා විමසා, එම අභියාචනය ලැබී මසක් ඇතුළත-

(i) අභියාචනයට අවසර ලබා දී දණ්ඩනය අඩු කිරීම; හෝ

(ii) අභියාචනයට අවසර ලබා නොදීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(ඈ) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ තීරණය බලාත්මක කරනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නියම කරන ලද දඩයක් ගෙවීමට යම් තැනැත්තකු අපොහොසත්ව ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් මත, එම මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්ම වුව ද, එය නොතකා, එම දඩය වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් නියම කරන ලද දඩයක් ලෙස, එවැනිම ආකාරයකින් ආපසු අයකර ගනු ලැබිය හැකි අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ ආපසු අයකරගනු ලබන මුදල් ප්‍රමාණය කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතු ය.

(8) වෙනත් යම් ප්‍රතිකර්මයකට අගතියක් නොමැතිව, (1) වන උපවගන්තියේ (iv) වන ඡේදය යටතේ වන පරිපාලනමය දණ්ඩනයක් අනුව, කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තා විසින් මුදල් ගෙවීමක ආකාරයෙන් ප්‍රතිෂ්ඨාපනයක් සිදු කරනු ලැබිය යුතු බවට නියම කර ඇත්තා වූ ද එම කඩකිරීම, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය සිදු කළ තැනැත්තා විසින් එම ප්‍රතිෂ්ඨාපනය සිදු කිරීමට අපොහොසත් වන්නා වූ ද අවස්ථාවක, කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් මත, එම මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්ම වුව ද, එය නොතකා, එම මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් නියම කරන ලද දඩයක් ලෙස, එවැනිම ආකාරයකින් ආපසු අයකර ගනු ලැබිය හැකි අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ ආපසු අයකරගනු ලබන මුදල් ප්‍රමාණය කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතු ය.

(9) (1) වන උපවගන්තිය යටතේ ලබාගන්නා ලද මුදල් අගතියට පත් තැනැත්තන් නිශ්චය කර ගැනීමේ හා එම තැනැත්තන් වෙත ඒ පිළිබඳ දැනුම් දීමේ අපහසුතාව හේතුවෙන් බෙදා දී නොමැති අවස්ථාවක, එම මුදල්-

(අ) VI වන කොටස යටතේ පවත්වාගෙන යනු ලබන කොමිෂන් සභාවේ වන්දි අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනය කිරීම සඳහා වන වියදම් පියවීම සඳහා කොමිෂන් සභාව විසින් රඳවා තබා ගනු ලැබිය යුතු ය.

179. (1) ගනුදෙනුකරුවන්ගේ මුදල් හෝ වත්කම් හසුරුවන හෝ ඒවා භාරව සිටින වෙළෙඳපොළ අතරමැදියකු විසින්, එහි ව්‍යාපාරය කරගෙන යන අතරතුර දී මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් කඩකරනු ලබන හෝ තවදුරටත් යෝග්‍ය සහ සුදුසු නොවන්නා වූ ද ආයෝජකයන්ගේ, වෙළෙඳපොළ අතරමැදියකුගේ, ගනුදෙනුකරුවන්ගේ හෝ සාමූහික ආයෝජන යෝජනාක්‍රමවල ඒකක දරන්නන්ගේ සම්බන්ධතා අනතුරට පත්වීමට ඉඩ ඇති බව හෝ අනතුරට පත්වන බව කොමිෂන් සභාවේ අදහස වන්නා වූ ද අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ගවලින් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගනු ලැබිය හැකි ය:-

(අ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සිතනු ලබන යම් ආකාරයකට අනුව යම් ආයෝජකයකුගේ හෝ එහි ගනුදෙනුකරුවන්ගේ මුදල් සහ දේපළ හෝ එම මුදල් සහ දේපළ සම්බන්ධයෙන් කටයුතු නොකරන ලෙස හෝ එම ආයෝජකයන්ගේ හෝ එහි ගනුදෙනුකරුවන්ගේ මුදල් හෝ දේපළවලට අදාළ යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වෙනත් යම් තැනැත්තකු වෙත පවරන ලෙස වෙළෙඳපොළ අතරමැදියාට විධාන කිරීම;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි, වෙනත් යම් තැනැත්තකුට මුදල් හෝ දේපළවලට අදාළ යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් පවරන ලෙස භාරකරුවකුට විධාන කිරීම;

(ඇ) වෙළෙඳපොළ අතරමැදියා විසින් ගනුදෙනුවලට එළඹීම, තැනැත්තන්ගෙන් ව්‍යාපාර කටයුතු ඉල්ලා සිටීම තහනම් කිරීම හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ආකාරයකට අනුව, ව්‍යාපාරයෙහි යෙදෙන ලෙස වෙළෙඳපොළ අතරමැදියාට හෝ භාරකරුට නියම කිරීම; හෝ

(ඈ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පරිදි, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දේපළ පවත්වාගෙන යන ලෙස වෙළෙඳපොළ අතරමැදියකුට හෝ භාරකරුවකුට නියම කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර එම වෙළෙඳපොළ අතරමැදියාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදීමෙන් තොරව, කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගැනීම ප්‍රමාද වීම, ආයෝජකයන්ගේ සුබසිද්ධියට, වෙළෙඳපොළ අතරමැදියාගේ ගනුදෙනුකරුවන්ගේ සුබසිද්ධියට හෝ මහජන සුබසිද්ධියට අගතිදායක වියහැකි බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නේ නම්, (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය

180. (1) කොමිෂන් සභාව විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, යම් තැනැත්තකු විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් කඩකර ඇති බවට හෝ කඩකිරීමට ඉඩ ඇති බවට හෝ යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්ව ඇති බවට හෝ අපොහොසත් වීමට ඉඩ ඇති බවට වූ සාධාරණ ඉඩක් ඇති බවට අධිකරණය සෑහීමට පත්වන විට දී, අධිකරණය විසින්-

(අ) කඩකිරීම වළක්වාලමින් හෝ කඩකිරීම නතර කරන ලෙස නියම කරමින්;

(ආ) යම් තැනැත්තකු විසින් එම ආඥාවේ සඳහන් යම් සුරැකුම්පත් පන්තියක් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම හෝ වෙළෙඳාම් කිරීම වළක්වාලමින්;

(ඇ) සුරැකුම්පත් ගනුදෙනුවක් බලරහිත බව ප්‍රකාශයට පත් කරමින්;

(ඈ) එම තැනැත්තා විසින් අත්කර ගැනීමට, බැහැර කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීමට සාධාරණ ඉඩක් ඇති බවට අධිකරණය සෑහීමට පත්වන විට දී වත්කම් අත්කර ගැනීමෙන් බැහැර කිරීමෙන් හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීමෙන් යම් තැනැත්තකු වළක්වාලමින්;

(ඉ) ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පත් බැහැර කරන ලෙස විධාන කරමින්;

(ඊ) ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පත්වලට අදාළ ඡන්දය දීමේ හෝ වෙනත් අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම වළක්වාලමින්;

(උ) යම් තැනැත්තකු විසින් ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පත් ලබා ගැනීමට සැලැස්වීම හෝ එම සුරැකුම්පත් සඳහා දායක වීමට හෝ එම සුරැකුම්පත් මිල දී ගැනීමට අර්පණය කිරීම හෝ එම සුරැකුම්පත් සඳහා දායක වීමට හෝ එම සුරැකුම්පත් මිල දී ගැනීමට ආරාධනයන් නිකුත් කිරීම හෝ එම සුරැකුම්පත් විභජනය කිරීම වළක්වාලමින්;

(ඌ) වෙළෙඳපොළ අතරමැදියකුගේ දේපළ සම්බන්ධයෙන් හෝ යම් තැනැත්තකු විසින් භාරයක් ලෙස හෝ අන්‍යාකාරයකින් වෙනත් තැනැත්තකු වෙනුවෙන් දරනු ලබන දේපළ සම්බන්ධයෙන් භාර ගැනුම්කරුවකු හෝ ඇවරකරුවකු පත්කරමින්;

(එ) ආඥාවේ නිශ්චිතව සඳහන් සුරැකුම්පත් හෝ අනෙකුත් දේපළ අධිකරණය විසින් පත් කරන ලද භාරකරුවකු වෙත පවරමින්;

(ඒ) යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ එම තැනැත්තා විසින් කරනු ලැබිය යුතු යම් ක්‍රියාවක් කිරීමට හෝ යම් විධානයකට අනුකූලව කටයුතු කිරීමට ප්‍රතික්ෂේප කරන ලද හෝ අපොහොසත් වූ හෝ ප්‍රතික්ෂේප කරමින් සිටින හෝ අපොහොසත් වෙමින් සිටින හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ අපොහොසත් වීමට යෝජනා කරමින් සිටින අවස්ථාවක දී, එකී ක්‍රියාව කරන ලෙස හෝ එකී විධානයට අනුකූලව කටයුතු කරන ලෙස එකී තැනැත්තාට නියම කරමින්;

(ඔ) කඩකිරීමට දැන දැනම සම්බන්ධවී ඇති බව පෙනී යන යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු වෙත, එකී කඩකිරීමෙන් අගතියට පත් වෙනත් යම් තැනැත්තකුට ප්‍රතිෂ්ඨාපනයක් සිදු කිරීම ඇතුළුව එයට පිළියම් යෙදීම සඳහා හෝ එහි බලපෑම අවම කිරීම සඳහා අධිකරණය විසින් නියම කරනු ලබන යම් පියවර ගන්නා ලෙස නියම කරමින්;

(ඕ) මේ වගන්තිය යටතේ වන වෙනත් යම් ආඥාවකට අනුකූලව කටයුතු කිරීම තහවුරු කිරීමේ කාර්යය සඳහා යම් නිශ්චිත ක්‍රියාවක් කරන ලෙස හෝ කිරීමෙන් වළකින ලෙස යම් තැනැත්තකුට විධාන කරමින්;

(ක) කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධානයකට අනුකූලව කටයුතු කරන ලෙස යම් තැනැත්තකුට විධාන කරමින්;

(ග) මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් යටතේ ආඥාවක් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සුදුසු බවට සලකන යම් අනුයාත කරුණක් සම්බන්ධයෙන්,

ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන ආඥාවක් සඳහා අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ විට, අධිකරණය විසින්, එම ඉල්ලීම පිළිබඳ අවසන් තීරණය ලබා දෙන තෙක්, ඒකපාර්ශ්වීය අතුරු ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමට පෙර, අධිකරණය විසින්, සුදුසු යැයි සිතනු ලබන යම් තැනැත්තන්ට එම ඉල්ලීම පිළිබඳ දැන්වීමක් ලබා දෙන ලෙස විධාන කිරීම හෝ අධිකරණය විසින් සුදුසු යැයි සිතනු ලබන යම් ආකාරයකට අනුව එම ඉල්ලීම පිළිබඳ දැන්වීම පළ කරන ලෙස විධාන කිරීම හෝ ඒ දෙකම සිදු කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන ආඥාවක් සඳහා කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් නිසි ලෙස බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට දී, එම ආඥාව ලබා දීමේ කොන්දේසියක් වශයෙන්, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් හානි වන්දි පිළිබඳ යම් ප්‍රතිඥාවක් ලබාදෙන ලෙස, අධිකරණය විසින්, නියම කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වන අධිකරණ ආඥාවක් මගින් වෙළෙඳපොළ අතරමැදියකුගේ දේපළවල භාර ගැනුම්කරුවකු ලෙස පත්කරන ලද තැනැත්තකු-

(අ) විසින් තමා භාර ගැනුම්කරු ලෙස පත් කරන ලද යම් දේපළක් තමා වෙත ලබා දෙන ලෙස හෝ සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි එම දේපළ සම්බන්ධයෙන් වන සියලු තොරතුරු තමා වෙත ලබා දෙන ලෙස වෙළෙඳපොළ අතරමැදියාට නියම කරනු ලැබිය හැකි ය;

(ආ) විසින්, තමා භාර ගැනුම්කරු ලෙස පත් කරන ලද යම් දේපළක් අත්කර ගැනීම සහ එය තම සන්තකයට ගැනීම කරනු ලැබිය හැකි ය;

(ඇ) විසින්, තමා අත්කරගන්නා ලද හෝ තම සන්තකයට ගන්නා ලද යම් දේපළක් සම්බන්ධයෙන්, එම දේපළ දරන්නා විසින් නීත්‍යානුකූල ලෙස එම දේපළ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබනු ඇති යම් ආකාරයකින් කටයුතු කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) සතුව, අධිකරණය විසින් එම ආඥාවේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම දේපළ සම්බන්ධයෙන් වෙනත් බලතල තිබෙන්නේ ය.

(6) මේ වගන්තියේ, වෙළෙඳපොළ අතරමැදියකු සම්බන්ධයෙන් වන විට ''දේපළ'' යන්නට වෙළෙඳපොළ අතරමැදියා විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් වෙළෙඳපොළ අතරමැදියාගේ ව්‍යාපාරය අතරතුර හෝ ඒ හා සම්බන්ධව වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් භාර ගත් හෝ ලබාගත් මුදල්, සුරැකුම්පත් හෝ වෙනත් දේපළ සහ සුරැකුම්පත්වල හිමිකම් ලේඛන හෝ වෙනත් දේපළ ඇතුළත් වේ.

(7) මේ වගන්තිය යටතේ අධිකරණයේ ආඥාවකින් පත්කරනු ලබන භාරකරුවකු-

(අ) විසින්, ආඥාවේ නිශ්චිතව සඳහන් යම් සුරැකුම්පතක් හෝ වෙනත් යම් දේපළක් භාරකරුට භාර දෙන ලෙස හෝ සාධාරණ ලෙස අවශ්‍ය වියහැකි සුරැකුම්පත් සම්බන්ධ සියලු තොරතුරු භාරකරුට ලබා දෙන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය;

(ආ) විසින්, සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ අත්කරගැනීම සහ එය තම සන්තකයට ගැනීම කරනු ලැබිය හැකි ය;

(ඇ) විසින්, ඔහු විසින් සුදුසු යැයි සිතනු ලබන යම් ආකාරයකට සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) වෙත, අධිකරණය විසින් ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ සම්බන්ධයෙන් වන වෙනත් යම් බලතල තිබිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබෙන මුදල් අධිකරණයට ගෙවනු ලැබිය යුතු අතර, එකී මුළු මුදලට ම හෝ ඉන් යම් කොටසකට අර්ථලාභීව හිමිකම් ලබන බවට කියා සිටින යම් තැනැත්තකු විසින්, එකී ගෙවීම අධිකරණයට සිදු කළ දින සිට දින තිහක් ඇතුළත එම ගනුදෙනුවෙන් හෝ බැහැර කිරීමෙන් ලබා ගත් මුදලින් ඔහුට අය විය යුතු මුදල් ගෙවන ලෙස අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(9) එම ආඥාවෙන් අතෘප්තියට පත් යම් පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට දී, එකී අතෘප්තියට පත් පාර්ශ්වය විසින් කරන ලද ඉල්ලීම පිළිබඳව කොමිෂන් සභාව වෙත පූර්ව දැන්වීමක් සිදු කර, අධිකරණය විසින්, මේ වගන්තිය යටතේ කරන ලද ආඥාවක් පරිච්ඡින්න කිරීම, වෙනස් කිරීම හෝ නිදහස් කිරීම හෝ එකී ආඥාව ක්‍රියාත්මක වීම අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.

181. මහජන සුභසිද්ධිය උදෙසා හෝ ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සිතනු ලබන විට දී, කොමිෂන් සභාව විසින්, මේ පනත, නියෝග, රීති හෝ විධාන යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් තීරණයක් හෝ කරන ලද යම් ක්‍රියාවක් හා සම්බන්ධ යම් තොරතුරු කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සිතනු ලබන යම් ආකෘතියකට හෝ ආකාරයකට අනුව පළ කරනු ලැබිය හැකි ය.

182. (1) කොමිෂන් සභාවේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින්, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යැයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ අන්තර්ගත විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්,-

(අ) වෙළෙඳපොළ ආයතනයකට බලපත්‍ර ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා සපුරාලිය යුතු ගාස්තු නියම සහ කොන්දේසි;

(ආ) ශ්‍රී ලංකාව තුළ විදේශීය ආස්ථිත්‍යයක් ලැයිස්තුගත කිරීම හෝ තොරතුරු බෙදා ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව සහ එහි විදේශීය සම ආයතනය හෝ වෙනත් යම් සංවිධානයක් අතර ඇති යම් අවබෝධතා ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම; සහ

(ඇ) සුරැකුම්පත් ලෙස වර්ගීකරණය නොකළ නිෂ්පාදනයක් හෝ නිෂ්පාදන පංතියක්,

සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළකරන ලද දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

183. (1) කොමිෂන් සභාව විසින්, පහත දැක්වෙන කාරණා ඇතුළුව එහෙත් එම කාරණාවලට සීමා නොවී මේ පනත යටතේ රීති සෑදීමට බලය දී ඇති හෝ මේ පනත යටතේ රීති සෑදිය යුතු යැයි සඳහන් කර ඇති හෝ නියම කර ඇති යම් කාරණාවක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යඃ-

(අ) විනිමය ස්ථානයක සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම සහ ලැයිස්තුගත පොදු සමාගමක් විසින් අයිතිවාසිකම් හෝ ප්‍රසාද වශයෙන් හෝ අන්‍යාකාරයකින් යම් අතිරේක සුරැකුම්පත් පසුව නිකුත් කිරීම හෝ එම සමාගම් උපලේඛනගත කිරීම;

(ආ) විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම සහ ඉන් පැනනගින ඒ හා සම්බන්ධ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ලැයිස්තුගත විදේශීය ආස්ථිත්වයක් නියාමනය කිරීම;

(ඇ) සුරැකුම්පත් අත්කරගන්නා ලද හෝ බැහැර කරන ලද තැනැත්තන් විසින් සිදු කරන සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව වෙළෙඳපොළ අතරමැදියන් විසින් සිදු කරනු ලබන හෙළිදරව් කිරීම් සහ සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව විනිමය ස්ථානයක් විසින් සිදු කරනු ලබන හෙළිදරව් කිරීම්;

(ඈ) වෙළෙඳපොළ ආයතනයක් සහ වෙළෙඳපොළ අතරමැදියකු විසින් පොත්, වාර්තා, ගිණුම් සහ විගණන නිසි පරිදි පවත්වාගෙන යාම සහ එකී වෙළෙඳපොළ ආයතනය සහ වෙළෙඳපොළ අතරමැදියා විසින් තම කටයුතු පිළිබඳව කොමිෂන් සභාව වෙත නිරතුරුව ම වාර්තා කිරීම;

(ඉ) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ ප්‍රදානය කරන ලද ලියාපදිංචියක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය;

(ඊ) වෙළෙඳපොළ ආයතනයක් සහ වෙළෙඳපොළ අතරමැදියකු විසින් පොත්, වාර්තා, ගිණුම් වාර්ෂිකව විගණනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම;

(උ) යම් අත්කර ගැනීමක හෝ ඒකාබද්ධ කිරීමක ඉලක්කය ලැයිස්තුගත පොදු සමාගමක් වන විට දී, එම අත්කර ගැනීම් හෝ ඒකාබද්ධ කිරීම් නියාමනය කිරීම;

(ඌ) සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක භාරකරු සහ සුරැකුම්පත් නිකුත්කරන්නකු සහ කළමනාකරණ සමාගමක් විසින් පිළිපැදිය යුතු චර්යා ධර්ම සංග්‍රහයක් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ අනුමත කිරීම පිළිබඳ සංග්‍රහයක්;

(එ) මේ පනතින් රීති සෑදිය යුතු යැයි නියම කර ඇති යම් කාරණා;

(ඒ) වෙළෙඳපොළ ආයතනයක් සහ වෙළෙඳපොළ අතරමැදියකු විසින් අනුගමනය කරනු ලැබිය යුතු විචක්ෂණශීලී නියමයන්, යෝග්‍ය සහ සුදුසු උපමාන, වාර්තා තබාගැනීම සහ අනෙකුත් ප්‍රලේඛන ක්‍රම;

(ඔ) ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලැයිස්තුගත කිරීමක් සඳහා ඉල්ලුම්කර ඇති පොදු සමාගමක් හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යයක් විසින් නිකුත් කිරීමට යෝජිත සංස්ථා ප්‍රකාශයේ ආකෘතිය සහ අන්තර්ගතයන්;

(ඕ) කොටස් තැරැව්කරුවකු හෝ ආන්තික සපයන්නකු විසින් ආන්තික ගිණුමක සුරැකුම්පත් මෙහෙයවීම;

(ක) ලැයිස්තුගත සුරැකුම්පත් සහ විනිමය ස්ථානයක් හරහා වෙළෙඳාම් කරන ව්‍යුත්පන්නවලට අදාළ වෙළෙඳපොළ ආයතනයක සහ වෙළෙඳපොළ අතරමැදියන්ගේ ව්‍යාපාර කටයුතු සහ කාර්ය;

(ග) මේ පනතේ විෂයපථය තුළට ගැනෙන ලැයිස්තුගත පොදු සමාගම්, ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යය, සහ අනෙකුත් ලැයිස්තුගත නොකළ සමාගම් විසින් තොරතුරු හෙළිදරව් කිරීම, වාර්තා කිරීම සහ සැපයීම;

(ච) විනිමය ස්ථානයකට ලැයිස්තුගත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම සහ විනිමය ස්ථානයක් විසින් ලැයිස්තුගත කිරීම අත්හිටුවීම සහ අවලංගු කිරීම;

(ජ) බලපත්‍රලත් ව්‍යුත්පන්න විනිමය ස්ථානයක පහසුකම් භාවිත කර සිදු කරන ව්‍යුත්පන්න ගිවිසුම්වල වෙළෙඳාම් සම්බන්ධයෙන්;

(ට) වෙළෙඳපොළ සාදන්නන්ගේ, කොටස් ණයට දෙන්නන්ගේ සහ කොටස් ණයට ගන්නන්ගේ ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ හිඟ වෙළෙඳාම නියාමනය කිරීම පිළිබඳව;

(ඩ) විනිමය ස්ථානයක් සඳහා සත්‍යානුරූපී අරමුදලක් හෝ වන්දි අරමුදලක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම; සහ

(ණ) ගනුදෙනුකරු සහ වෙළෙඳපොළ අතරමැදියා අතර සහ අදාළ සහභාගිකයන් හෝ සාමාජිකයන් සහ වෙළෙඳපොළ ආයතන අතර ආරවුල් නිරවුල් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එකී පළකරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

184. වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, විනිමය ස්ථානයක් හරහා වෙළෙඳාම් කරන ව්‍යුත්පන්න ගිවිසුමක් සූදු හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

185. මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ බලපත්‍රලත් ක්‍රියාකාරකමට අදාළ කර්තව්‍ය කර ගෙන යාමේ දී වෙළෙඳපොළ අතරමැදියකු ලෙස බලපත්‍රලත් වෙළෙඳපොළ සාදන්නකු විසින් මේ පනතේ 128 වන හෝ 129 වන වගන්ති යටතේ වරදක් සිදු කරනු ලබන ලෙස සලකනු නොලැබිය යුතු ය.

186. කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ පිරිනමන ලද අභියාචනාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

187. (1) (මෙහි මින් මතු "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කරනු ලැබුව ද-

(අ) (i) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවා ඇත්තා වූ ද මේ පනත 1 වන කොටස ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියාත්මක වන්නා වූ ද කොමිෂන් සභාව මේ පනතේ 1 වන කොටස යටතේ අලුත් කොමිෂන් සභාවක් පිහිටුවනු ලබන තෙක්, මේ පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව ලෙස සලකනු ලැබිය යුතු අතර එය ඒ අනුව දිගටම ක්‍රියාත්මක විය යුතු ය;

(ii) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන පත් කළ සාමාජිකයන් මේ පනත යටතේ පත් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔවුන්ගේ ධුර කාලය අවසන් වන තෙක් හෝ මේ පනත යටතේ අලුත් සාමාජිකයන් පත් කරනු ලබන තෙක් එම සාමාජිකයන් දිගටම ධුර දරනු ලැබිය යුතු ය;

(ආ) යම් විනිමය ස්ථානයකට, කොටස් තැරැව්කරුවකුට හෝ කොටස් වෙළෙන්දකුට හෝ ඒකක භාරයක් මෙහෙයවීමේ කාර්ය සඳහා කළමනාකාර සමාගමකට ඉවත් කරන ලද පනත යටතේ නිකුත් කරනු ලැබ ඇත්තා වූ ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද සෑම බලපත්‍රයක් ම, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ යම් නිෂ්කාශනාගාරයකට හෝ යම් වෙළෙඳපොළ අතරමැදියකුට නිකුත් කරනු ලැබ ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද සෑම ලියාපදිංචි සහතිකයක් ම මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද, මේ පනතේ විධිවිධාන හා අනනුකූල නොවන්නා වූ ද, ඉවත් කරන ලද පනත යටතේ සාදනු ලැබූ සියලු නියෝග, රීති සහ විධාන, ප්‍රදානය කරන ලද අනුමතයන් සහ ගන්නා ලද වෙනත් යම් ක්‍රියා මාර්ගයක් හෝ නිකුත් කරන ලද දැන්වීම් මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියෝග, රීති සහ විධාන, ප්‍රදානය කරන ලද අනුමතයන් සහ ගන්නා ලද වෙනත් යම් ක්‍රියාමාර්ගයක් හෝ නිකුත් කරන ලද දැන්වීම් ලෙස සලකනු ලැබිය යුතු අතර, දිගටම වලංගු විය යුතු ය;

(ඉ) ඉවත් කරන ලද පනත යටතේ එළඹුනා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පවතින්නා වූ ද සියලු කොන්ත්‍රාත්තු, ගිවිසුම් සහ අනෙකුත් සාධන පත්‍ර මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් එළඹෙන ලද කොන්ත්‍රාත්තු, ගිවිසුම් හෝ අනෙකුත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඊ) ඉවත් කරන ලද පනත යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබ ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින්නා වූ ද සියලු නඩු කටයුතු, නඩුකර සහ අනෙකුත් නඩු කටයුතු කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට එරෙහිව පවරන ලද සියලු නඩු කටයුතු, නඩුකර සහ අනෙකුත් නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු ය;

(උ) ඉවත් කරන ලද පනත යටතේ සාදනු ලැබ ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක ව පවතින්නා වූ ද, මේ පනතේ විධිවිධාන හා අනනුකූල නොවන්නා වූ ද වෙළෙඳපොළ ආයතනයක සියලු රීති මේ පනත යටතේ එකී වෙළෙඳපොළ ආයතන විසින් අලුත් රීති සාදනු ලබන තෙක්, මේ පනත යටතේ එකී වෙළෙඳපොළ ආයතන විසින් සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය;

(උ) ඉවත් කරන ලද පනත යටතේ ඉදිරිපත් කරන ලද බලපත්‍ර සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක් ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය;

(එ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතුව ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවතියා වූ ද සියලු චංචල සහ නිශ්චල දේපළ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි, කොමිෂන් සභාව සතු විය යුතු ය;

(ඒ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුදල්වලට බැරව ඇත්තා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ ද සියලු මුදල්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි, මේ පනතේ VI වන කොටස යටතේ පිහිටුවනු ලැබූ කොමිෂන් සභාවේ අරමුදල්වලට බැර විය යුතු ය;

(ඔ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව, ඉවත් කරන ලද පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ සිදු කරනු ලැබූ සියලු වැරදි හෝ පවරනු ලැබූ සියලු නඩු කටයුතු ඉවත් කරන ලද පනත යටතේ සිදු කරන ලද වැරදි හෝ පවරන ලද නඩු කටයුතු විය යුතු අතර, ඒ අනුව ඒවා නඩු විභාග කරනු ලැබිය යුතු ය;

(ඕ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතු සියලු අයිතීන්, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි කොමිෂන් සභාවේ අයිතීන්, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ක) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ධුර දරන ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, සියලු නිලධරයන් සහ සේවකයන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි, ඉවත් කරන ලද පනත යටතේ ඔවුන් හිමිකම් ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා වාසිදායක බවින් අඩු නොවන නියම මත, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, නිලධරයන් සහ සේවකයන් ලෙස පත්වන බවට සලකනු ලැබිය යුතු ය.

(3) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කරනු ලැබූව ද-

(අ) වෙනත් යම් ලිඛිත නීතියක 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට කරන ලද සෑම සඳහනක් ම මේ පනතට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය; සහ

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට කරන ලද සෑම සඳහනක් ම මේ පනතේ අන්තර්ගත අනුරූපී විධිවිධානවලට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

188. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"ප්‍රතීත ආයෝජකයා" යන්නට,-

(අ) (i) ප්‍රාථමික නේවාසික දේපළ හැර ස්වකීය ශුද්ධ පුද්ගලික වත්කම් ප්‍රමාණයේ වටිනාකම රුපියල් මිලියන දෙසියයක් හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ ඊට වැඩි යම් වටිනාකමක් ඉක්මවනු ලබන; හෝ

(ii) ඉහතින් වූ වර්ෂ තුන තුළ දී ස්වකීය සාමාන්‍ය වාර්ෂික ආදායම රුපියල් මිලියන තිහකට හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ ඊට වැඩි යම් අගයකට නොඅඩු; සහ

(iii) ආයෝජන අවදානම බාර ගැනීමට ඇති ස්වකීය පළපුරුද්ද, හැකියාව සහ විදග්ධතාවය පිළිබඳව ප්‍රකාශයක් කරනු ලබන,

යම් තැනැත්තකු;

(ආ) (i) එකී ආස්ථිත්‍යයේ වඩාත්ම මෑතකාලීන විගණනය කරන ලද ශේෂ පත්‍රය මගින්; හෝ

(ii) විගණනය කරන ලද ශේෂ පත්‍රයක් නොමැති අවස්ථාවක දී, ඉහතින් වූ මාස දොළහක කාලසීමාවක් ඇතුළත වූ යම් දිනයක් වන්නා වූ යම් ශේෂ පත්‍ර දිනයක දී එකී ආස්ථිත්‍යයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබාදෙන බවට එකී ආස්ථිත්‍යය විසින් සහතික කරන ලද එකී සංස්ථාමය ආස්ථිත්‍යයේ වඩාත්ම මෑතකාලීන ශේෂ පත්‍රය මගින්,

තීරණය කරනු ලබන පරිදි, වටිනාකම රුපියල් මිලියන එක් දහසක් ඉක්මවන ශුද්ධ වත්කම් සහිත සංස්ථාමය ආස්ථිත්‍යයක්;

(ඇ) එම තත්ත්වයෙන් ක්‍රියා කිරීමේ දී, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් භාරයක භාරකරු; හෝ

(ඈ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් ආස්ථිත්‍යයක් හෝ රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ආයතනයක් හෝ ආස්ථිත්‍යයක්,

ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"මධ්‍යම තැන්පතුගාරය" යන්නෙන්,-

(අ) එකී සුරැකුම්පත් ගනුදෙනු කිරීමේ කාර්යය සඳහා තැන්පතුකරුගේ හෝ ගිණුම් හිමියාගේ හෝ ඔහුගේ හෝ එහි නාමිකයකුගේ නමින් සියලු සුරැකුම්පත් තැන්පත් කර භාරයේ දරනු ලබන හෝ ලියාපදිංචි කරන ලද සහ එම සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු, කොටස්පත්‍ර භෞතිකව භාර නොදී සුරැකුම්පත් ගිණුම්වල සටහන් තැබීම මගින් සිදුකරනු ලබන්නා වූ;

(ආ) කොටස්පත්‍ර භෞතිකව භාර නොදී, සුරැකුම්පත් ගනුදෙනු හෝ සුරැකුම්පත් ගනුදෙනු කිරීම් නිරවුල් කිරීම සඳහා ඉඩ දෙනු ලබන්නා වූ හෝ පහසුකම් සලස්වනු ලබන්නා වූ; සහ

(ඇ) ඊට ආනුෂංගික වන්නා වූ වෙනත් පහසුකම් සහ සේවා සැපයීම සඳහා වූ,

යම් විනිමය ස්ථානයක් සුරැකුම්පත් මධ්‍යම ලෙස හැසිරවීම සඳහා වූ ක්‍රමයක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් සංස්ථාවක් අදහස් වන නමුත් ඊට-

(i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ පිහිටුවනු ලබන මධ්‍යම තැන්පතුගාරයක්;

(ii) ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන හෝ පිහිටුවන මධ්‍යම තැන්පතුගාරයක්; හෝ

(iii) නිදහස් කරන ලද සුරැකුම්පත් සඳහා මධ්‍යම තැන්පතුගාරයක් සපයනු ලබන හෝ සපයනු ලබන ලෙස පෙනී සිටින යම් තැනැත්තකු,

ඇතුළත් නොවේ;

"නිෂ්කාශන පහසුකම" යන්නෙන්, සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීම සඳහා හෝ නිරවුල් කිරීම සඳහා වූ යම් පහසුකමක් අදහස් වේ;

"නිෂ්කාශනය කිරීම හෝ නිරවුල් කිරීම" යන්නට, යම් නිෂ්කාශන පහසුකමක් සම්බන්ධයෙන් වන විට, ගනුදෙනු සපයනු ලබන යම් යාන්ත්‍රණයක් හෝ සේවාවක්,-

(අ) එම ගනුදෙනු තහවුරු කිරීමේ අදහස ඇතිව එකී තැනැත්තා විසින් එම සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ නියම සම්බන්ධයෙන් වූ තොරතුරු සත්‍යායනය කරනු ලබන්නා වූ;

(ආ) නවීකරණය මගින් හෝ අන්‍යාකාරයකින්, එම සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ පාර්ශ්ව විසින් එම තැනැත්තාගේ බැරකම් එම පාර්ශ්වයන්ගේ බැරකම් වෙනුවට ආදේශ කරනු ලබන්නා වූ;

(ඇ) එම ගණනය කිරීම්වලට බහුපාර්ශ්වික ලාභ ලබාගැනීමේ වැඩපිළිවෙළවල් අන්තර්ගත වුව ද, නොවුව ද, එම සුරැකුම්පත් ගනුදෙනු යටතේ වන පාර්ශ්වවල බැඳීම් ගණනය කරනු ලබන්නා වූ; හෝ

(ඈ) එම පාර්ශ්ව අතර සුරැකුම්පත් භාරදීම හෝ අරමුදල් පැවරීම හෝ සුරැකුම්පත් සඳහා වන හිමිකම් පැවරීම සඳහා වූ බැඳීම් ඇතුළු එම ගනුදෙනු යටතේ වන ස්වකීය වගකීම් එම සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ පාර්ශ්ව විසින් සපුරාලන ලබන්නා වූ-

සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් සපයනු ලබන යම් වැඩපිළිවෙළක්, ක්‍රියාවලියක්, යාන්ත්‍රණයක් හෝ සේවාවක් ඇතුළත් වන නමුත් ඊට-

(i) ඉහත සඳහන් සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ යම් පාර්ශ්වයක පසුපෙළ මෙහෙයුම් කටයුතු;

(ii) එම සේවාවන් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු නිරවුල් කිරීම සඳහා හුදෙක්ම ආනුෂංගික වන අවස්ථාවක දී, (මෙහි මින් මතු "ගනුදෙනුකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකු සමඟ වන වැඩපිළිවෙළක් යටතේ එම ගනුදෙනුකරුගේ සුරැකුම්පත්වල සන්තකය හෝ පාලනය දරනු ලබන්නා වූ යම් තැනැත්තකු විසින් සපයනු ලබන සේවාවන්; හෝ

(iii) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් සේවාවන්,

ඇතුළත් නොවේ;

"නිෂ්කාශන සාමාජිකයා" යන්නෙන්, බලපත්‍රලත් නිෂ්කාශනාගාරයක රීති යටතේ තමා වෙනුවෙන් හෝ අනෙක් අය වෙනුවෙන් සුරැකුම්පත් නිෂ්කාශනය කිරීම සහ නිරවුල් කිරීම සඳහා බලපත්‍රලත් නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන සාමාජිකයකු ලෙස ඇතුළත් කර ගෙන ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"සාමූහික ආයෝජන යෝජනා ක්‍රමය" යන්නට-

(අ) කවර නමකින් හෝ හඳුන්වනු ලබන, ආයෝජකයන් විසින් සිදු කරනු ලබන දායකත්වයක් හෝ ගෙවීම් හුදෙක්ම එකී යෝජනා ක්‍රමයේ හෝ වැඩපිළිවෙලේ කාර්ය සඳහා පමණක් රැස්කරනු ලබන සහ උපයෝගී කරගනු ලබන;

(ආ) එම යෝජනා ක්‍රමයෙන් හෝ වැඩපිළිවෙලින් ලාභ, ආදායම්, නිෂ්පාදන හෝ චංචල හෝ නිශ්චල දේපළ ලබා ගැනීමේ අදහස ඇතිව ආයෝජකයන් විසින් එම යෝජනා ක්‍රමයට හෝ වැඩපිළිවෙළට දායකත්වයන් හෝ ගෙවීම් සිදු කරනු ලබන;

(ඇ) ආයෝජකයන් විසින්, යම් යෝජනා ක්‍රමයක ආයෝජනාවලිය මත වූ ස්වකීය සහභාගීත්ව සම්බන්ධතාවයට ප්‍රමාණුකූලව හෝ ඔවුන් විසින් තීරණය කරනු ලබන වෙනත් පදනමක් මත ආයෝජනයේ අවදානම සහ ප්‍රතිලාභය බෙදා ගනු ලබන;

(ඈ) හඳුනාගත හැකි වූ හෝ නොහැකි වූ, එම යෝජනා ක්‍රමයේ හෝ වැඩපිළිවෙලේ කොටසක් වන්නා වූ යම් දේපළක්, දායකත්වයක් හෝ ආයෝජනයක් ආයෝජකයන් වෙනුවෙන් කළමනාකරණය කරනු ලබන; සහ

(ඉ) එම යෝජනා ක්‍රමයේ හෝ වැඩපිළිවෙලේ කළමනාකරණය සහ මෙහෙයවීම සම්බන්ධයෙන් ආයෝජකයන්ට එදිනෙදා පාලනයක් නොමැති,

සමාගමක් විසින් මහජනයාට යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩපිළිවෙලක් නිකුත් කරන්නේ හෝ අර්පණය කරන්නේ යම් කොන්දේසි යටතේ ද එම කොන්දේසි සපුරාලනු ලබන යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩපිළිවෙලක් ඇතුළත් වන නමුත් ඊට-

(i) තනිපුද්ගල ආයෝජන කළමනාකරණ වැඩපිළිවෙළවල්වලට;

(ii) ව්‍යවසායකත්ව ආරම්භක යෝජනා ක්‍රමවලට;

(iii) ශුද්ධ තැන්පතු පාදක වූ යෝජනා ක්‍රමවලට;

(iv) ව්‍යාපාර ආකාරයෙන් ක්‍රියාත්මක නොවන යෝජනා ක්‍රමවලට;

(v) ඍණපත්‍ර, බැඳුම්කර සහ ණය කොටස් වැනි ණය නිකුත් කිරීම්වලට;

(vi) සේවා නියුක්තයන්ගේ කොටස් යෝජනා ක්‍රමවලට;

(vii) පූර්ණ සාමාජිකත්ව වැඩපිළිවෙළවල්වලට;

(viii) කාල කොටස් යෝජනා ක්‍රමවලට;

(ix) නිෂ්කාශන සේවා සැපයීම්වලට;

(x) රක්ෂණ ගිවිසුම්වලට;

(xi) තනි පුද්ගල විශ්‍රාම වැටුප් ගිණුම්වලට;

(xii) වෘත්තීය සහ පුද්ගල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවලට;

(xiii) ගොඩනැගීම් සමිති, සමූපකාර සමිති, කාර්මික සහ අර්ථසාධක සමිති සහ ලියාපදිංචි මිත්‍රත්ව සමිති ඇතුළු ඇතැම් සංස්ථාවලට; හෝ

(xiv) ඉහත කී යෝජනා ක්‍රම හා සමාන වූ යම් වැඩපිළිවෙලකට,

අදාළ වන අරමුදල් සංචිත ඇතුළත් නොවේ;

"පාලකවරයා" යන්නෙන්-

(අ) එම දරන්නාගේ ඡන්දහිමි කොටස්වලට අදාළ ඡන්ද ප්‍රමාණයෙන් සියයට විස්සකට නොඅඩු ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම සඳහා හිමිකම් ඇත්තා වූ; හෝ

(ආ) දරන්නාගේ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් පත් කිරීම සඳහා හෝ පත් කිරීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා වූ; හෝ

(ඇ) වෙළෙඳපොළ ආයතනයේ, සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ සහ වෙළෙඳපොළ අතරමැදියාගේ ව්‍යාපාරය හෝ පරිපාලනය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා හෝ තීරණ ගැනීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා වූ ද එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා වූ ද,

යම් තැනැත්තකු අදහස් වේ;

''අධිකරණය'' යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පළාතක් සඳහා පිහිටුවනු ලැබුවා වූ ද, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින් එම මහාධිකරණය පිහිටුවනු ලැබුවේ යම් පළාතක් සඳහා ද එම පළාත ඇතුළත සිවිල් අධිකරණ බලය ඇත්තා වූ ද යම් මහාධිකරණයක් හෝ යම් පළාතක් සඳහා එවැනි සිවිල් අධිකරණ බලයක් පැවරුණු මහාධිකරණයක් පිහිටුවනු ලැබ නොමැති විටක බස්නාහිර පළාත සඳහා පිහිටුවනු ලැබූ මහාධිකරණය අදහස් වේ;

"අපලේඛනගත කිරීම" යන්නෙන්, විනිමය ස්ථානයක නිල ලැයිස්තුවෙන් ලැයිස්තුගත සුරැකුම්පත් ඉවත් කිරීම අදහස් වේ;

"තැන්පතුගාර සහභාගිකයා" යන්නෙන්, මධ්‍යම තැන්පතුගාරයක පහසුකම් සඳහා ප්‍රවේශ විය හැකි සහ මධ්‍යම තැන්පතුගාරයක රීති යටතේ තැන්පතුගාර සහභාගිකයකු ලෙස ඇතුළත් කරගෙන ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"ව්‍යුත්පන්න" යන්නට, ගැළපීම් ගිවිසුමක්, අනාගතයන්, මනාප සහ යෝග්‍ය විනිමය ස්ථාන වෙළෙඳ විකල්පයක් හෝ කොමිෂන් සභාව විසින් ව්‍යුත්පන්න ලෙස නිශ්චිතව දක්වනු ලබන යම් ගිවිසුම් පන්තියක වෙනත් යම් ගිවිසුමක් සංයුක්ත වන අනාගතයන් පිළිබඳ ගිවිසුම් ඇතුළත් වන නමුත් යම් ව්‍යුත්පන්න විනිමය ස්ථානයක අනාගතයන් වෙළෙඳපොළේ වෙළෙඳාම් කරනු නොලබන ව්‍යුත්පන්න ගිවිසුමක් ලෙස නිශ්චිතව දක්වනු ලබන යම් ගිවිසුමක් ඉන් බැහැර කරනු ලැබිය යුතු ය;

"ව්‍යුත්පන්න විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ ව්‍යුත්පන්න විනිමය ස්ථානයක් ලෙස බලපත්‍රලත් යම් සංස්ථාවක් අදහස් වේ;

"ඉලෙක්ට්‍රොනික වාර්තාව" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් නිර්මාණය කරන ලද, ගබඩා කරන ලද, උත්පාදනය කරන ලද, ලැබුණු හෝ සන්නිවේදනය කරනු ලබන ලිඛිත ලේඛනයක් හෝ වෙනත් යම් වාර්තාවක් අදහස් වේ;

"විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ බලපත්‍ර දෙන ලද කොටස් විනිමය ස්ථානයක් හෝ ව්‍යුත්පන්න විනිමය ස්ථානයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව" යන්නෙන්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදහස් වේ;

"නිකුත්කරන්නා" යන්නෙන්, මහජන අර්පණයක් මගින් විකිණීම සඳහා සුරැකුම්පත් නිකුත් කරනු ලබන හෝ නිකුත් කිරීමට යෝජනා කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"බලපත්‍රලත් නිෂ්කාශනාගාරය" යන්නෙන්, මේ පනත යටතේ බලපත්‍ර දෙන ලද්දා වූ ද එහි කටයුතුවලට හෝ පරමාර්ථවලට නිෂ්කාශන පහසුකම් සැපයීම ඇතුළත් වන්නා වූ ද යම් සංස්ථාවක් අදහස් වේ;

"ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍යය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර නොමැත්තා වූ ද, ද්විතියික ලැයිස්තුගත කිරීමක් මගින්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක නිල ලැයිස්තුවකට ඇතුළත් කර ගනු ලැබ ඇත්තා වූ ද යම් ආස්ථිත්‍යයක් අදහස් වේ;

"ලැයිස්තුගත පොදු සමාගම" යන්නෙන්, එහි සුරැකුම්පත් යම් කොටස් විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇත්තා වූ යම් සමාගමක් අදහස් වන අතර, ඊට මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද ස්ථානයක එහි සුරැකුම්පත් ලැයිස්තුගත කර ඇත්තා වූ රාජ්‍ය සංස්ථාවක් ද ඇතුළත් වේ;

"ලැයිස්තුගත සුරැකුම්පත්" යන්නෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් විනිමය ස්ථානයක ලැයිස්තුගතකර ඇත්තා වූ සුරැකුම්පත් අදහස් වේ;

"කළමනාකරු" යන්නෙන්, සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට එහි ව්‍යාපාරයෙන් යම් කොටසක් කළමනාකරණය කිරීම සඳහා එකී සංස්ථාව විසින් පත්කර ඇති තැනැත්තකු අදහස් වන අතර, ඊට යම් අධ්‍යක්ෂවරයකුගේ හෝ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයාගේ ආසන්නතම අධිකාරි බලය යටතේ කළමනාකරණ කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබන හෝ එකී සංස්ථාවේ ගිණුම් හෝ අනෙකුත් වාර්තා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් වගකිවයුතු (ප්‍රධාන විධායක නිලධරයා නොවන) සංස්ථාවේ යම් සේවානියුක්තයකු ඇතුළත් වේ;

"ආන්තික ගිණුම" යන්නෙන්, ආයෝජකයකුට ලැයිස්තුගත සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට ඉඩ සලසන, ලැයිස්තුගත සුරැකුම්පත් ණයට මිල දී ගැනීම සඳහා යම් පාර්ශ්වික ගිණුමක් ලෙස සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගැනෙන තැරැව්කාර ගිණුමක් අදහස් වේ;

"වෙළෙඳපොළ ආයතනය" යන්නෙන්, මේ පනතේ II වන කොටස යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් විනිමය ස්ථානයක්, නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් අදහස් වේ;

"වෙළෙඳපොළ අතරමැදියා" යන්නට, ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක්, සංස්ථාමය මූල්‍ය උපදේශකවරයකු, ව්‍යුත්පන්න තැරැව්කරුවකු, ව්‍යුත්පන්න වෙළෙන්දකු, ආයෝජන කළමනාකරුවකු, කළමනාකාර සමාගමක්, ආන්තික සපයන්නකු, වෙළෙඳපොළ සාදන්නකු, කොටස් තැරැව්කරුවකු, කොටස් වෙළෙන්දකු, ප්‍රතිරක්ෂිතයකු ලෙස බලපත්‍රලත් යම් තැනැත්තකු හෝ ඒ හා සමාන ක්‍රියාකාරකම් භාරගෙන ඉටු කරනු ලබන්නා වූ ද කොමිෂන් සභාව විසින් එකී බලපත්‍රය නිකුත් කිරීමේ කාර්යය සඳහා රීති මගින් විස්තර කර ඇත්තා වූ ද වෙනත් යම් තැනැත්තකු ඇතුළත් වේ.

මේ අර්ථ නිරූපණයේ කාර්ය සඳහා-

(අ) "සංස්ථාමය මූල්‍ය උපදේශකවරයා" යන්නෙන්, යම් ගාස්තුවකට හෝ කොමිස් මුදලකට-

(i) මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අරමුදල් රැස් කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම හෝ අරමුදල් රැස් කිරීම සම්බන්ධයෙන්;

(ii) මේ පනත යටතේ බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම;

(iii) මූල්‍ය නිෂ්පාදන ව්‍යුහගත කිරීම; හෝ

(iv) ලැයිස්තුගත පොදු සමාගමක සකස් කිරීම පිළිබඳ යෝජනාක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනාක්‍රම හෝ අත්කර ගැනීමේ යෝජනාක්‍රම,

පිළිබඳ උපදෙස් සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වන නමුත්, ඊට-

(අ) හුදෙක්ම ස්වකීය වෘත්තියෙහි පරිචයට ආනුෂංගික වන්නා වූ ඉහත සඳහන් කරුණු කිසිවකට අදාළ උපදෙස් ලබාදීමෙහි යෙදී සිටින නීතිඥවරයකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකු;

(ආ) හුදෙක්ම ස්වකීය වෘත්තියෙහි පරිචයට ආනුෂංගික වන්නා වූ සංස්ථාමය මූල්‍ය උපදෙස් ලබාදීමෙහි යෙදී සිටින ගණකාධිකාරිවරයකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකු; හෝ

(ඇ) හුදෙක්ම එහි ප්‍රතිලාභය සඳහා හෝ එහි සම්බන්ධිත සමාගම් කිසිවක් සඳහා සංස්ථාමය මූල්‍ය උපදෙස් ලබාදීමෙහි යෙදී සිටින යම් සමාගමක්,

ඇතුළත් නොවේ;

(ආ) "ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනය" යන්නෙන්, යම් නිකුත්කරන්නකුගේ හෝ යම් නිශ්චිත සුරැකුම්පත් නිකුත් කිරීමක ණය පිළිබඳ සුදුසුකම් තක්සේරු කිරීමේ සහ ඇගයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් සංස්ථාවක් අදහස් වේ;

(ඇ) "ව්‍යුත්පන්න තැරැව්කරු" යන්නෙන්, කොමිස් මුදල් පෙරළා ලබා ගනිමින් ආයෝජකයන් වෙනුවෙන් ව්‍යුත්පන්න මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඈ) "ව්‍යුත්පන්න වෙළෙන්දා" යන්නෙන්, තමාගේම ගිණුම මත ව්‍යුත්පන්න ගිවිසුම්වල වෙළෙඳාම් කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු සඳහන් වේ;

(ඉ) "ආයෝජන කළමනාකරු" යන්නට, යම් ගාස්තුවක් හෝ කොමිස් මුදලක් සඳහා ආයෝජකයකු වෙනුවෙන් සුරැකුම්පත් ආයෝජනාවලියක් කළමනාකරණය කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු ඇතුළත් වන නමුත් ඊට යම් සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක කළමනාකරු ඇතුළත් නොවේ;

(ඊ) "කළමනාකාර සමාගම" යන්නෙන්, ඒකක භාර යෝජනා ක්‍රමයක, නිශ්චල දේපළ ආයෝජන භාරයක, විනිමය ස්ථානයක වෙළෙඳාම් කිරීමේ අරමුදලක හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක ඒකකයක්-

(i) නිකුත් කර හෝ දායකවීම සඳහා අර්පණය කර ඇති හෝ නිකුත් කිරීමට හෝ දායකවීම සඳහා අර්පණය කිරීමට යෝජනා කරනු ලබන; හෝ

(ii) දායකවීම හෝ මිල දී ගැනීමට ආරාධනාවක් කර ඇති යම් සමාගමක් අදහස් වන අතර, ඊට තත්කාලයෙහි කළමනාකරණ සමාගමක කර්තව්‍ය ඉටුකරන,

යම් තැනැත්තකු ඇතුළත් වේ;

(උ) "ආන්තික සපයන්නා" යන්නෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා ආයෝජකයන්ට ණය මුදල් සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඌ) "වෙළෙඳපොළ සාදන්නා" යන්නෙන්, එකී විනිමය ස්ථානය විසින් දක්වා ඇති නියමයන් මත හෝ රීති මත පදනම්ව නිශ්චිත සුරැකුම්පතක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද විනිමය ස්ථානයක ස්වයංක්‍රීය වෙළෙඳ පද්ධතියක පවත්වාගෙන යනු ලබන ඇණවුම් පොතක ලංසු සහ අර්පණ මිල ගණන් ඇතුළත් කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

(එ) "කොටස් තැරැව්කරු" යන්නෙන්, කොමිස් මුදලක් පෙරළා ලබා ගනිමින් ආයෝජකයන් වෙනුවෙන් ව්‍යුත්පන්න නොවන සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඒ) "කොටස් වෙළෙන්දා" යන්නෙන්, තමාගේම ගිණුමට ව්‍යුත්පන්න නොවන සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් සංස්ථාවක් අදහස් වේ;

(ඔ) "ප්‍රතිරක්ෂිතයා" යන්නෙන්, යම් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සම්බන්ධයෙන්, එම සුරැකුම්පත්වල දායක නොවුණු කොටස ගාස්තුවක් හෝ කොමිස් මුදලක් සඳහා මිලදී ගැනීමට ඇපවන්නා වූ හෝ එම අර්පණය සඳහා සම්පූර්ණයෙන් ම දායක වී නොමැති අවස්ථාවක එම සුරැකුම්පත් මිල දී ගැනීමට සුරැකුම්පත් නිකුත් කරන්නකු සමඟ සාකච්ඡා කරන්නා වූ යම් සංස්ථාවක් අදහස් වේ;

"වෙළෙඳපොළ මෙහෙයුම්කරු" යන්නෙන්, IV වන කොටසේ විධිවිධාන සලස්වා ඇති පරිදි ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම, නිෂ්කාශනය කිරීම හෝ නිරවුල් කිරීම සඳහා පහසුකම් සලස්වනු ලබන වෙළෙඳපොළ යටිතල පහසුකම් පිහිටුවනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථා යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විෂයය පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ශ්‍රී ලංකා මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"අර්පණය" හෝ "අර්පණය කිරීම" යන්නට, සංස්ථා ප්‍රකාශයක් මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් යම් සුරැකුම්පත් හෝ එම සුරැකුම්පත්වල සම්බන්ධතාව යම් වටිනාකමකට මහජනයාට විකිණීම හෝ බැහැර කිරීම සඳහා කරනු ලබන යම් උත්සාහයක් ඇතුළත් වන නමුත් ඊට එකී සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත් වන ලෙස යම් තැනැත්තකු වෙත කරනු ලබන සද්භාවී ආරාධනාවක් ඇතුළත් නොවේ;

"පෞද්ගලික ස්ථානගත කිරීම" යන්නෙන්, තථ්‍ය කොටස් හිමියන් සඳහා ඔවුන්ගේ කොටස් ප්‍රමාණයට සමානුපාතිකව ඉදිරිපත් කරනු ලබන අයිතිවාසිකම් නිකුතුවක් හෝ දායකවීම සඳහා මහජනයාට කරනු ලබන සාමාන්‍ය අර්පණයක් මාර්ගයෙන් හැර, හඳුනාගනු ලැබූ ආයෝජකයකු හෝ ආයෝජකයන් කාණ්ඩයක් වෙත සුරැකුම්පත් නිකුත් කිරීමක් අදහස් වේ;

"එක්ව ක්‍රියා කිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන්" යන්නෙන්, යම් විධිමත් හෝ අවිධිමත් ගිවිසුමක් හෝ අවබෝධතාවක් ප්‍රකාරව, සමාගමක හෝ වෙනත් යම් සමාගමක කොටස්වල යම් සම්බන්ධතාවක් ඔවුන් අතරින් කිසිවකු විසින් අත්කර ගැනීම මගින් සහයෝගීව කටයුතු කරනු ලබන හෝ සමාගමක් සඳහා වූ අර්පණයක සාර්ථක ප්‍රතිඵලය ව්‍යාර්ථ කරනු ලබන තැනැත්තන් අදහස් වේ. මේ අර්ථ නිරූපණයේ සාමාන්‍ය අදාළවීමට අගතියක් නොමැතිව, කොමිෂන් සභාව සෑහීමට පත්වන පරිදි ඊට පටහැනිව යම් දෙයක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, පහත දැක්වෙන තැනැත්තන් එකිනෙකා සමඟ එක්ව ක්‍රියා කිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන් බවට පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය:-

(අ) සියල්ලන්ම එකිනෙකා සමඟ කටයුතු කරන යම් සමාගමක්, එහි මව් සමාගම, පාලිත සමාගම් සහ හවුල්කාර පාලිත සමාගම් සහ ඒවායේ ආශ්‍රිත සමාගම් සහ ඡන්ද අයිතිවාසිකම් මිල දී ගැනීම සඳහා ඉහත සඳහන් තැනැත්තන් කිසිවකුට (බලපත්‍රලාභී බැංකුවක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කරන ලද මූල්‍ය සමාගමක් විසින් එහි සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යන අතරතුර දී හැර) මූල්‍ය සහාය ලබා දී ඇති යම් තැනැත්තකු;

මේ ඡේදයේ කාර්ය සඳහා "ආශ්‍රිත සමාගමක්" යනු 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ සාදන ලද ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති ප්‍රකාරව අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ සමාගමක් වේ;

(ආ) එහි අධ්‍යක්ෂවරුන් කිසිවකු සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්, එම අධ්‍යක්ෂවරුන් කිසිවකු විසින් පාලනය කරනු ලබන සම්බන්ධිත භාර මෙන්ම සමාගම්, ඔවුන්ගේ ළඟම ඥාතීන් සහ සම්බන්ධිත භාර සමඟ සමාගමක්;

(ඇ) එහි විශ්‍රාම වැටුප් අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ කොටස් යෝජනා ක්‍රම සමඟ සමාගමක්;

(ඈ) යම් ආයෝජන සමාගමක්, ඒකක භාරයක් හෝ එකී ආයෝජන කළමනාකරු කළමනාකරණය කරන්නේ යම් තැනැත්තකුගේ ආයෝජන ද එම තැනැත්තා සමඟ අරමුදල් කළමනාකරුවකු; සහ

(ඉ) සියල්ලන්ම එකිනෙක සමඟ කටයුතු කරන තැනැත්තකු, එම තැනැත්තාගේ ඥාතීන් සහ ඔවුන් කිසිවකුගේ සම්බන්ධිත භාරයක්;

මේ ඡේදයේ කාර්ය සඳහා, "ඥාතියා" යන්නෙන්, එම තැනැත්තාගේ මව හෝ පියා, කලත්‍රයා, සුළු දරුවන් ඇතුළු දරුවකු, සුළු සහෝදරයා හෝ සුළු සහෝදරිය ඇතුළු සහෝදරයකු හෝ සහෝදරියක හෝ එම තැනැත්තාගේ දරුවකුගේ කලත්‍රයා අදහස් වේ;

"සංස්ථා ප්‍රකාශය" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රසිද්ධ දැන්වීම" යන්නෙන්, යටත් පිරිසෙයින්, එක් ගැසට් පත්‍රයකවත්, සහ යටත් පිරිසෙයින්, ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් වූ එක් දිනපතා පුවත්පතකවත්, එම කරුණ පිළිබඳ දැන්වීමක් පළකිරීම මගින් ලබාදිය යුතු වන්නා වූ මේ පනත යටතේ ලබා දීමට නියමිත යම් කරුණක් පිළිබඳ දැන්වීමක් අදහස් වේ;

"ලියාපදිංචි තැනැත්තා" යන්නෙන්, වෙළෙඳපොළ අතරමැදියකු සඳහා සහ ඔහු වෙනුවෙන් ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කරනු ලබන්නා වූ ද මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කරන ලද්දා වූ ද යම් තැනැත්තකු අදහස් වේ;

"සම්බන්ධිත සමාගම" යන්නෙන්, යම් සංස්ථාවක පාලක සමාගමක්, ආශ්‍රිත සමාගමක් හෝ පාලක සමාගමක් හෝ පාලක සමාගමේ පාලිත සමාගමක් අදහස් වේ;

"අයිතිවාසිකම් නිකුත් කිරීම" යන්නෙන්, එම නිකුත් කිරීම විස්තර කරනු ලබන්නේ හෝ සඳහන් කරනු ලබන්නේ කවරාකාරයකින් වුව ද, ලැයිස්තුගත පොදු සමාගමක පවත්නා යම් කොටසක් හෝ අනාගතයේ දී නිකුත් කරනු ලබන කොටස් ප්‍රතිෂ්ඨාවක් සඳහා සහ එම අර්පණය සිදු කරන දිනයේ දී එම සමාගමේ ඔවුන් විසින් දරනු ලබන සුරැකුම්පත් පන්තියට අනුපාතිකව එම සමාගමේ දැනට සිටින කොටස්හිමියන්ට නිකුත් කිරීමක් අදහස් වේ;

"සුරැකුම්පත්" යන්නට-

(අ) ඍණපත්‍ර, ව්‍යාපාර වස්තු, කොටස්, අරමුදල්, බැඳුම්කර, සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක, ඒකක හෝ එහි යම් අයිතිවාසිකමක්, මනාප හෝ සම්බන්ධතා; හෝ

(ආ) විශ්වාසය තබා ඇති පාදක වූ වත්කමේ ස්වභාවය කවරක් වුව ද, අනාගතයන් සහ මනාප ඇතුළුව ව්‍යුත්පන්න; හෝ

(ඇ) රජයක් විසින් හෝ වෙනත් යම් සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් විසින් නිකුත් කරන ලද හෝ නිකුත් කිරීමට යෝජිත නෝට්ටු,

ඇතුළත් වන නමුත්, ඊට බැංකුවක් විසින් නිකුත් කරන ලද විනිමය බිල්පත් හෝ පොරොන්දු නෝට්ටු හෝ තැන්පතු සහතික, ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් හෝ 18 වන වගන්තිය යටතේ සුරැකුම්පත් නොවන බවට නියම කර ඇති වෙනත් යම් නිෂ්පාදනයක් හෝ නිෂ්පාදන පන්තියක් ඇතුළත් නොවේ;

"සුරැකුම්පත් වෙළඳපොළ" යන්නෙන්-

(අ) සුරැකුම්පත් විකිණීම, මිල දී ගැනීම හෝ හුවමාරු කිරීම සඳහා වන අර්පණ සිදු කිරීමට හෝ ප්‍රතිග්‍රහණය කිරීම නිතිපතා සිදු කරනු ලබන;

(ආ) සුරැකුම්පත් විකිණීම, මිල දී ගැනීම හෝ හුවමාරු කිරීමට ඍජුව හෝ වක්‍රව හේතුවීම අරමුණු කර ගත් හෝ එසේ කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි අර්පණ හෝ ආරාධනා නිතිපතා සිදු කරනු ලබන; හෝ

(ඇ) යම් නිශ්චිත තැනැත්තන් හෝ නිශ්චිත තැනැත්තන් පන්ති විසින් සුරැකුම්පත් විකිණීමට, මිල දී ගැනීමට හෝ හුවමාරු කිරීමට යෝජනා කරනු ලබන හෝ එසේ කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කිරීම සඳහා වන මිල ගණන් හෝ ප්‍රතිෂ්ඨාව පිළිබඳ තොරතුරු නිතිපතා සපයනු ලබන, යම් වෙළෙඳපොළක් හෝ වෙනත් ස්ථානයක් හෝ පහසුකමක් අදහස් වන නමුත්, ඊට මේ පනතේ කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇතුළත් නොවේ;

"කොටස" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඊට ලබා දී ඇති අර්ථය ම හෝ එහි නීති යටතේ වෙනත් යම් අධිකරණ කලාපයක පිළිගනු ලබන කොටසකට දී ඇති අර්ථය ම තිබිය යුත්තේ ය;

"කොටස් ණයට ගන්නා" යන්නෙන්, සුරැකුම්පත් ණයට ගැනීමේ ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තකු අදහස් වේ;

"කොටස් විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් කොටස් විනිමය ස්ථානයක් ලෙස බලපත්‍ර දෙන ලද යම් සංස්ථාවක් අදහස් වේ;

"අතිරේක සේවා සපයන්නා" යන්නට, යම් සංඛ්‍යාන න්‍යාය පිළිබඳ විශේෂඥයකු, විගණකවරයකු, රක්ෂකයකු, භාරකරුවකු, තක්සේරුකරුවකු හෝ යම් වෙළෙඳපොළ ආයතනයකට, වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලැයිස්තුගත පොදු සමාගමකට හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයකට වෘත්තීමය සේවා සපයනු ලබන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් තැනැත්තකු ඇතුළත් වේ;

"වෙළෙඳ සහභාගිකයා" යන්නෙන්, යම් විනිමය ස්ථානයක, පහසුකම් සඳහා ප්‍රවේශය ඇත්තා වූ ද මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර දෙන ලද යම් විනිමය ස්ථානයක රීති යටතේ වෙළෙඳ සහභාගිකයකු ලෙස ඇතුළත් කරගෙන ඇත්තා වූ ද යම් තැනැත්තකු අදහස් වේ;

"ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නා" යන්නෙන්, මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක් උල්ලංඝනය කිරීමක් හෝ සිදුවීමට ඉඩ ඇති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් තොරතුරු සපයනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් අදහස් වේ.

189. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2021 අංක 23 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2021 ඔක්තෝබර් මස 13 වන දින]

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක 23 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

2. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "සේවා නියුක්තයා" යන අර්ථ නිරූපණයේ "ඒ තැනැත්තා ද ඇතුළත් වේ" යන වචන වෙනුවට "ඒ තැනැත්තා ද ඇතුළත් වන අතර, සමාජ ආරක්ෂණ ගිවිසුමක නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා, එම සමාජ ආරක්ෂණ ගිවිසුම අදාළ වන යම් වියුක්ත සේවකයකු ඇතුළත් නොවේ." යන වචන ආදේශ කිරීමෙන්;

(2) "ආවරණ සේවා නියුක්තිය" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"වියුක්ත සේවකයා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ ආවරණ සේවා නියුක්තිය තුළ තාවකාලික පැවරුමක් මත සිටින, තමා පුරවැසියකු වන රටෙහි සමාජ ආරක්ෂණ වැඩසටහනක් සඳහා දායක වන්නා වූ ද, සමාජ ආරක්ෂණ ගිවිසුමක් ප්‍රකාරව යම් කාලසීමාවක් සඳහා මේ පනත යටතේ යම් දායක මුදලක් ගෙවීමෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ ද, ජාත්‍යන්තර සේවකයකු අදහස් වේ";

(3) "සේවායෝජකයා" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"ජාත්‍යන්තර සේවකයා" යන්නෙන්, ශ්‍රී ලංකාව හැර වෙනත් රටක පුරවැසියකු වන සේවා නියුක්තයකු අදහස් වේ";

(4) "නියෝග" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"සමාජ ආරක්ෂණ ගිවිසුම" යන්නෙන්, ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන සහ වියුක්ත සේවකයකු වශයෙන් තාවකාලික පැවරුමක් මත වෙනත් යම් රටක සේවය කරන යම් රටක පුරවැසියකු වෙත එම වෙනත් රටේ සමාජ ආරක්ෂණ වැඩසටහනක් සඳහා දායක වීමෙන් නිදහස් කිරීමක් ලබාදෙන ද්විපාර්ශ්වික ගිවිසුමක් අදහස් වේ;".

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2021 අංක 26 දරන විසර්ජන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2021 නොවැම්බර් මස 12 වන දින]

2020 අංක 7 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක 26 දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2020 අංක 7 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "රුපියල් දෙදහස් නවසිය අනූහත් බිලියනයක්" යන වචන වෙනුවට "රුපියල් තුන්දහස් තුන්සිය අනූහත් බිලියනයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2021 අංක 28 දරන සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත

[සහතිකය සටහන් කළේ 2021 නොවැම්බර් මස 17 වන දින]

2020 අංක 7 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

සේවායෝජකයකු විසින් යම් සේවකයකු විශ්‍රාම යවනු ලැබිය හැකි විශ්‍රාම යාමේ අවම වයස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක 28 දරන සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

විශ්‍රාම යාමේ අවම වයස

2. වෙනත් යම් ලිඛිත නීතියක, සේවා ගිවිසුමක, සාමූහික ගිවිසුමක හෝ වෙනත් යම් ආකාරයක සේවා ගිවිසුමක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී වයස අවුරුදු පනස් දෙක එළඹ නොමැති හෝ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පසුව සේවයට බඳවා ගන්නා ලද සේවකයෙකුගේ විශ්‍රාම යාමේ අවම වයස (මෙහි මින්මතු "විශ්‍රාම යාමේ අවම වයස" යනුවෙන් සඳහන් කරනු ලබන) එම සේවකයා වයස අවුරුදු හැට එළඹෙන විට දී විය යුතු ය:

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී වයස අවුරුදු පනස් දෙක හෝ ඊට වැඩි වයසකට එළඹ ඇති සේවකයෙකුගේ විශ්‍රාම යාමේ අවම වයස I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වයස ලෙස සලකනු ලැබිය යුතු ය.

3. (1) සේවකයන් පහළොවක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කරවන යම් සේවායෝජකයකු විසින්, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සේවකයෙකු හෝ වැඩෙහි ස්වභාවය අනුව, කලින් කල, නියෝග මගින් නියම කරනු ලබන යම් කර්මාන්තයක හෝ වෘත්තියක නිරත සේවකයෙකු නොවන යම් සේවකයෙකු එකී සේවකයා විශ්‍රාම යාමේ අවම වයසට එළඹෙන තෙක් විශ්‍රාම යවනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, යම් සේවායෝජකයකු විසින්, සේවා ගිවිසුමක හෝ සාමූහික ගිවිසුමක විධිවිධාන ප්‍රකාර යම් සේවකයෙකු පහත දැක්වෙන හේතු මත නියමිත වයසට පෙර විශ්‍රාම යවනු ලැබිය හැකි ය:-

(අ) යම් සේවකයකු යම් රෝගී තත්ත්වයක් හේතුවෙන් ස්ථිර වශයෙන් ම වැඩෙහි නිරතවීමට නොහැකි බවට, (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් සහතික කරනු ලැබ ඇති අවස්ථාවක;

(ආ) යම් විනය පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන් යම් සේවකයකුගේ සේවය අවසන් කරනු ලැබ ඇති සහ එම සේවය අවසන් කිරීමේ තීරණය නීතිය මගින් ප්‍රතිශෝධනය කරනු ලැබ නොමැති අවස්ථාවක;

(ඇ) යම් ස්වාභාවික හේතුවක් මත සේවා ස්ථානය වසා දැමීම හෝ විනාශ වීම මත; හෝ

(ඈ) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, යම් සේවකයෙකු විශ්‍රාම ගැනීමට පෙරාතුව වූ මාස දොළහ ඇතුළත සේවකයන් පහළොවක් හෝ ඊට අඩු සංඛ්‍යාවක සාමාන්‍යයක් ලෙස සේවයේ නියුක්ත කරවන ලද යම් සේවායෝජකයකු සඳහා අදාළ නොවිය යුතු ය.

(3) විශ්‍රාම යාමේ අවම වයසට පෙරාතුව තමා විසින් ම, තම රැකියාව අත් හැරීමට අපේක්ෂා කරන යම් සේවකයෙකුට තමා විසින් ම එසේ තම රැකියාව අත් හරිනු ලැබිය හැකි ය.

4. මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙර හෝ එදින හෝ එදිනට පසු එළඹෙන ලද සේවා ගිවිසුමක, සාමූහික ගිවිසුමක හෝ වෙනත් යම් ආකාරයක සේවා ගිවිසුමක නිශ්චිතව දක්වා ඇති විශ්‍රාම යාමේ අවම වයසට අඩු වන්නා වූ යම් විශ්‍රාම යාමේ වයසක් 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව බලරහිත ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් මේ පනතේ නිශ්චිතව දක්වා ඇති විශ්‍රාම යාමේ අවම වයස අදාළ විය යුතු ය.

II වන කොටස

පැමිණිලි සහ පරීක්ෂණ

5. (1) සේවායෝජකයා විසින්, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හැර නියමිත වයසට පෙර විශ්‍රාම යවන ලද යම් සේවකයෙකු විසින්, එකී විශ්‍රාම යැවූ දින සිට මාස දෙකක් ඇතුළත එකී විශ්‍රාම යැවීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) යම් සේවකයෙකු විසින් (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පැමිණිල්ලක් කර ඇති අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු අතර, එම පැමිණිල්ල ලැබුණු දින සිට මාස දෙකක් ඇතුළත එම පැමිණිල්ල සම්බන්ධයෙන් සිය අවසන් තීරණය ලබා දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන පරීක්ෂණයකින් පසු-

(අ) සේවකයා විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල ආධාරක සාක්ෂි මගින් සනාථ කර නොමැති හෝ එම නියමිත වයසට පෙර විශ්‍රාම යැවීම 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, එම පැමිණිල්ල නිෂ්ප්‍රභ කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) සිය සේවායෝජකයා විසින් මේ පනතේ විධිවිධානවලට පටහැනිව සේවකයා නියමිත වයසට පෙර විශ්‍රාම යවා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් සේවායෝජකයාට නිකුත් කරනු ලබන දැන්වීමක් මගින්,-

(i) එම දැන්වීමේ දින සිට එසේ විශ්‍රාම යැවීමට පෙරාතුව එම සේවකයා සේවයේ නියුක්තව සිටි තත්ත්වයෙන්ම නැවත සේවයේ පිහිටුවා එම විශ්‍රාම යැවීමේ දින සිට ඔහුගේ වේතන සහ අනෙකුත් සියලු ප්‍රතිලාභ ඔහුට ගෙවන ලෙස; හෝ

(ii) එම සේවකයා සේවයේ නියුක්තව සිටි සේවා ස්ථානය වසා දැමීම හෝ එම සේවා ස්ථානය සම්බන්ධයෙන් ඈවර කිරීමේ නඩු කටයුතු ආරම්භවීම හේතුවෙන් එම සේවකයා නැවත සේවයේ පිහිටුවීම ප්‍රායෝගික නොවන බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, නැවත සේවයේ පිහිටුවීම වෙනුවට, අවස්ථාවෝචිත පරිදි, එම සේවා ස්ථානය වසා දැමූ දින හෝ එම සේවා ස්ථානය සම්බන්ධයෙන් ඈවර කිරීමේ නඩු කටයුතු ආරම්භ වූ දින දක්වා එම සේවකයාට ගෙවන ලද අවසාන වේතන මත පදනම්ව, 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 6ඈ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන සූත්‍රය ප්‍රකාර එම සේවකයාට වන්දි ගෙවන ලෙස

සේවායෝජකයාට විධාන කරනු ලැබිය යුතු ය.

(4) යම් සේවකයෙකු විසින්, මේ පනත ක්‍රියාත්මකවීමට පෙරාතුව නියමිත කාලයට පෙර විශ්‍රාම යැවීමට විරුද්ධව (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත හෝ 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාර කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චයාධිකාරයක්, බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත්තා වූ ද, කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චයාධිකාරය, බේරුම්කරු හෝ කාර්මික අධිකරණය විසින් එම පැමිණිල්ල සම්බන්ධයෙන් අවසන් තීරණයක් ලබා දී නොමැත්තා වූ ද, අවස්ථාවක, මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස් ජනරාල්වරයාට බලයක් නොමැත්තේ ය:

එසේ වුව ද, සේවකයා විසින් නියමිත කාලයට පෙර විශ්‍රාම යැවීමට විරුද්ධව (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත හෝ 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාර පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති නම්, ඒ සේවකයාට මේ පනත යටතේ පැමිණිල්ලක් කිරීමට හිමිකමක් නොමැති විය යුතු ය.

6. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් 5 වන වගන්තිය යටතේ ලබා දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් සේවායෝජකයකු විසින්, එම තීරණයට එරෙහිව රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටිමින් අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කරන සේවායෝජකයකු විසින්, එම ඉල්ලීමෙහි විෂයය කරුණ වන ආඥාව මගින්-

(අ) සේවකයාට යම් මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක මුදල් ඇපයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) සේවකයාට යම් මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද, ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙස ද විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන වූ ද, ඔහුගේ සේවා ගිවිසුම අවසන් කරන ලද අවස්ථාවේ දී එම සේවකයාගේ මාසික වැටුප හෝ වේතනය මෙන් දොළොස් ගුණයක් වූ ද මුදලක මුදල් ඇපයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. දෛනික වැටුප් ලබන සේවකයෙකු සම්බන්ධයෙන් වන විට, මාසික වැටුප හෝ වේතනය එම සේවකයාගේ දෛනික වේතනය මෙන් විසිහය ගුණයක් විය යුතු ය.

(2) ඉල්ලුම්කරු විසින් මුදල් ඇපය ඉදිරිපත් කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් සමග ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කරන ලෙස කරන ලද ඉල්ලීමක් අභියාචනාධිකරණය විසින් භාර ගනු නොලැබිය යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ වගන්තිය යටතේ ඇප ලෙස ඉදිරිපත් කරන ලද සියලු මුදල් ශ්‍රී ලංකාව තුළ අනුමත කරන ලද යම් බැංකුවක පොළී දරන ගිණුමක තැන්පත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසන් තීරණය ප්‍රකාර අදාළ පාර්ශ්ව වෙත ඇපය නිදහස් කරනු ලැබිය යුතු ය.

III වන කොටස

පනත පරිපාලනය කිරීම සහ කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල

7. කම්කරු කොමසාරිස් ජනරාල්වරයා පනත පරිපාලනය කිරීම භාරව කටයුතු කරනු ලැබිය යුතු අතර, ඔහු විසින්, මේ පනත යටතේ වන ඔහුගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ඔහු විසින් බලය දෙන ලද කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

8. (1) 5 වන වගන්තිය යටතේ කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් වන යම් පරීක්ෂණයක කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයාට පහත දැක්වෙන දිසා අධිකරණයක් සතු බලතල තිබිය යුතු ය:-

(අ) සාක්ෂිකරුවන්ට පැමිණෙන ලෙස සිතාසි නිකුත් කිරීම හෝ බල කිරීම;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීම; හෝ

(ඇ) යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත ලබා දෙන ලෙස නියම කිරීම හෝ තත්කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු මගින් සෑම සාක්ෂිකරුවකු විසින් ම දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ලබා දීමට කටයුතු සැලැස්වීම.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්, යම් සේවායෝජකයකු වෙත භාර දෙනු ලබන ලිඛිත දැන්වීමකින් කරනු ලබන විධානයක් මගින්, එම විධානයේ නිශ්චිතව දක්වා ඇති දිනට පෙර පහත දැක්වෙන දේ තමා වෙත ඉදිරිපත් කරන ලෙස එම සේවායෝජකයාට විධාන කරනු ලැබිය හැකි ය:-

(අ) ඔහුගේ සියලු සේවකයන් හෝ සේවක පන්තියකට හෝ වර්ගයකට අදාළ වාර්තාවක් සහ මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් විස්තර;

(ආ) එම සේවායෝජකයා විසින් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක දක්වා ඇති යම් විස්තර සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක්; හෝ

(ඇ) එම සේවායෝජකයා විසින් පවත්වාගෙන යනු ලබන යම් සම්පූර්ණ ලේඛනයක හෝ වාර්තාවක හෝ එවැනි යම් ලේඛනයක හෝ වාර්තාවක යම් කොටසක සහතික කළ සත්‍ය පිටපතක්.

(3) (අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන සිතාසිවල සඳහන් වේලාවට සහ එම ස්ථානයේ දී කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියෙහි පෙනී සිටීම පැහැර හරිනු ලබන; හෝ

(ආ) කොමසාරිස් ජනරාල්වරයා හෝ තත් කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය ලබා දෙන ලද වෙනත් යම් නිලධරයකු ඉදිරියේ සාක්ෂිකරුවකු ලෙස දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ලබා දීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) ඇතුළුවීම හෝ පරීක්ෂා කිරීම හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය වන්නා වූ සහාය ලබා දීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ඈ) කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයාට බාධා කරන හෝ අවහිර කරන; හෝ

(ඉ) කොමසාරිස් ජනරාල්වරයා විසින් තමා වෙත පැවරී ඇති බලතල යටතේ ඉදිරිපත් කරන ලෙස හෝ ලබා දෙන ලෙස නියම කරනු ලබන චේතන සම්බන්ධ යම් කිසි ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීම හෝ යම් තොරතුරක් ලබා දීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ඊ) චේතන සම්බන්ධ යම් වැදගත් තොරතුරක් අසත්‍ය වන්නා වූ යම් ලේඛනයක් හෝ වාර්තාවක් සාදන හෝ සෑදීමට කටයුතු සලස්වන හෝ අසත්‍ය බව දැන දැනම එවැනි යම් ලේඛනයක් හෝ වාර්තාවක්, තමා වෙත පැවරී ඇති බලතල යටතේ කටයුතු කරන කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වන හෝ දැන දැනම ඉදිරිපත් කිරීමට ඉඩ දෙන; හෝ

(උ) යම් තොරතුරක් අසත්‍ය බව දැන දැනම, තමා වෙත පැවරී ඇති බලතල යටතේ කටයුතු කරන කොමසාරිස් ජනරාල්වරයා වෙත එම තොරතුර ඉදිරිපත් කරන; හෝ

(ඌ) (i) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද යම් සිතාසියක සඳහන් වේලාවේ දී සහ දිනයේ දී කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පෙනී සිටීම හේතුවක් නොමැතිව පැහැර හරින හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව සාධාරණ නොවන්නා වූ හේතුවක් මත පැහැර හරින;

(ii) තමා සන්තකයෙහි හෝ පාලනයෙහි ඇත්තා වූ ද කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂණය කරනු ලබන කරුණුවල සත්‍යතාව පිළිබඳ තීරණය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ද, යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම හෝ කොමසාරිස් ජනරාල්වරයාට පෙන්වීම හේතුවක් නොමැතිව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව සාධාරණ නොවන්නා වූ හේතුවක් මත ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින; හෝ

(iii) කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ සාක්ෂිකරුවකු ලෙස ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් ලබා දීම ප්‍රතික්ෂේප කරන; හෝ

(iv) කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙනු ලබන යම් විධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට දී දැන දැනම අසත්‍ය වාර්තාවක් හෝ යම් අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර්තාවක් සාදන හෝ ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වන,

සෑම තැනැත්තකු ම මේ වගන්තිය යටතේ වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාග යකින් පසු ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් වන්නේ ය.

9. මේ පනත මගින් යම් තැනැත්තකුට භාර දිය යුතු හෝ ලබා දිය යුතු යැයි නියම කරන ලද යම් දැන්වීමක් එම තැනැත්තාට පුද්ගලිකවම භාර දෙනු හෝ ලබා දෙනු නොලැබුව ද, එම තැනැත්තා සාමාන්‍යයෙන් පදිංචිව සිටි හෝ ව්‍යාපාරික කටයුතු සිදු කරන ලද හෝ අවසන්වරට පදිංචිව සිටි ස්ථානයට ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් යවනු ලැබුවහොත්, එම දැන්වීම ඒ තැනැත්තාට යථා පරිදි භාර දෙනු ලැබූ හෝ ලබා දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

10. (1) මේ පනතින් නියම කරනු ලැබිය යුතු යයි සඳහන් කරන ලද හෝ නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනතින් නියෝග සාදනු ලැබීමට නියමිත හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරන ලද දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

IV වන කොටස

වැරදි සහ දණ්ඩන

11. 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් සේවායෝජකයකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

12. (1) 5 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන දැන්වීමේ නිශ්චිතව සඳහන් විධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන යම් සේවායෝජකයකු වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොඅඩු දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) සේවායෝජකයා විසින් 5 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන දැන්වීමේ සඳහන් විධානවලට අනුකූලව කටයුතු කර ඇති බව ඔප්පු කිරීමේ භාරය එම සේවායෝජකයා වෙත පැවරිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ පසු, එම සේවායෝජකයා විසින්-

(අ) (1) වන උපවගන්තිය යටතේ එම සේවායෝජකයා විසින් ගෙවීමට යටත් දඩයට අමතරව, වරදකරු කරනු ලැබීමෙන් පසු ඔහු විසින් එම විධානයට අනුකූලව කටයුතු කිරීම දිගටම පැහැර හරිනු ලබන එක් එක් දිනයක් සඳහා රුපියල් සියයක අතිරේක දඩයක්;

(ආ) 5 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයෙන් ආරම්භ වී එම සේවායෝජකයා වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, එම සේවකයා විශ්‍රාම යවනු නොලැබ සේවයේ නියුක්ත කරනු ලැබ සිටියේ නම් එම සේවකයාට ගෙවිය යුතුව තිබූ 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වන වේතන, ප්‍රතිලාභ හෝ වන්දි;

(ඇ) ඒ සේවායෝජකයා වරදකට වරදකරු කිරීමේ දිනයට පෙර සේවකයා විශ්‍රාම යාමේ අවම වයසට එළඹෙනු ලබන අවස්ථාවක දී, ඒ සේවකයා විශ්‍රාම යාමේ අවම වයසට එළඹෙන දිනය වන තෙක් වේතන, ප්‍රතිලාභ හෝ වන්දි,

ගෙවනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ යම් සේවායෝජකයකු විසින් ගෙවනු ලැබිය යුතු වන යම් මුදලක්, එම සේවායෝජකයා වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් විසින් ද, එම අධිකරණය මගින් එම සේවායෝජකයා වෙත පනවනු ලැබූ දඩයක් මෙන් එම අධිකරණයේ ආඥාවක් මගින් අයකර ගනු ලැබිය හැකි අතර, එසේ අයකර ගනු ලබන මුදල සේවකයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

13. මේ පනත යටතේ වන යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක, එම පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම හෝ නිලධරයකු ම;

(ආ) හවුල් ව්‍යාපාරයක් නම්, හවුල් ව්‍යාපාරයේ සෑම හවුල් කරුවෙකු ම;

(ඇ) වෘත්තීය සමිතියක් නම්, ඒ වෘත්තීය සමිතියේ සෑම නිලධරයකු ම; හෝ

(ඈ) හවුල් ව්‍යාපාරයක් හෝ වෘත්තීය සමිතියක් නොවන්නා වූ ද, සංස්ථාපිත නොවන්නා වූ ද, පුද්ගල මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ සභාපතිවරයා, කළමනාකරු, ලේකම්වරයා සහ සෑම නිලධරයකු ම,

ඒ වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකු ඔහුගේ දැනීමෙන් තොරව එම වරද සිදු කළ බවට හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා සියලු නිසි උද්යෝගයෙන් ඔහු ක්‍රියාකළ බවට ඔප්පු කරනු ලබන්නේ නම් එවැනි කිසිම තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

